බුද්ධජයන්තීත්‍රිපිටකග්‍රන්ථමාලා: 50

# අභිධර්මපිටකයෙහි

06 වන ග්‍රන්ථය

## කථාවත්ථුප්‍රකරණය

තෘතීය භාගය

ලඞ්කා බෞද්ධමණ්ඩලයේ ආරාධනයෙන්

අහංගම විද්‍යාචන්ද්‍ර පරිවෙණාධිපති

පණ්ඩිත කෝදාගොඩ ඤාණාලෝක

නායක ස්ථවිරයන් වහන්සේ

විසින් කරන ලද

සිංහල පරිවර්තනයෙන් යුක්ත යි.

---

බු: ව: 2557

ක්‍රි: ව: 2013

Buddha Jayanti Tripitaka Series, Volume 50

The Sixth Book in the

**Abhidhamma-Pitaka**

**6**

# KATHĀVASTUPRAKARANA (III)

With the Sinhala translation by

**The Venerable Pandita Kodāgoda Nānāloka Thera**

Chief High Priest of Southern Ceylon

Principal of Vidyachandra Privena, Ahangama

**Published by**

**Dharma Chakkra Child Foundation**

Rerukana Road, Veedagama, Bandaragama -12530, Sri Lanka

Tel: +94 38 2291771, Fax: +94 38 2291253, website: http:// www.samadhi-buddha.org /

**Co-published, printed and donated by**

**The Corporate Body of the Buddha Educational Foundation**

11F, 55 Hang Chow South Rd. Section 1, Taipei, Taiwan, R.O.C.

Tel: +886 2 23951198, Fax: +886 2 23913415

Email: overseas@budaedu.org; Website: http: // www.budaedu.org/

**B.E. 2557**

**C.E. 2013**

# සම්බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලාව නැවත මුද්‍රණය කිරීම.

බුදු රජාණන් වහන්සේගේ ඉගැන්වීම හැඳින්වීම සඳහා අනාදිමත් කාලයක සිට විවිධ යෙදුම් යොදා ගෙන ඇත. ධම්ම, ධම්ම-විනය, බුද්ධ වචන, පාවචන බුද්ධානුසාසන ආදිය මින් සමහරකි. දම්ම - විනය වැනි යෙදුම් බුදුරජාණන් වහන්සේ විසින්ම යොදාගෙන ඇත. මේ ධම්ම විනය අඩංගු වී ඇත්තේ ත්‍රිපිටකයෙහිය. පිටක යන්න කූඩය, භාජනය යන අරුත්වල පාලි හා සංස්කෘත යන භාෂාවන් හි යෙදේ. සංස්කෘත භාෂාවෙන් ත්‍රිපිටක නැතහොත් පාලි භාෂාවෙන් තෙපිටක යන්නෙන් අදහස් කෙරෙන්නේ එවන් පිටක තුනකින් සමන්විත එකතුවකි. පාලි ත්‍රිපිටකය බුදු රජාණන් වහන්සේ ගේ ඉගැන්වීම් අඩංගු පැරණිතම මූලාශ්‍රය වශයෙන් ථෙරවාද සම්ප්‍රදාය මගින් පිළිගනු ලැබේ.

චිරාගත ථෙරවාද සම්ප්‍රදාය වන්නේ ත්‍රිපිටකය බුද්ධ පරිනිර්වාණයෙන් තෙමසක් ගතවුණු පසුව මහා කස්සප මහා රහතන් වහන්සේගේ ප්‍රධානත්වයෙන් අජාතශත්‍රු මහරජතුමන්ගේ ප්‍රධාන දායකත්වයෙන් රජගහ නුවර වේභාර පර්වත අසබඩ සප්තපර්ණී ගුහාවෙහි පන්සියයක් මහරහතන් වහන්සේගේ සහභාගීත්වයෙන් පැවැත්වුණු ප්‍රථම ධර්ම සංගායනාවේ දී සජ්ඣායනය කොට අනුමත කෙරුණු බවය. මෙම ත්‍රිපිටකය සමන්විත වන්නේ විනය පිටකය, සුත්ත පිටකය හා අභිධම්ම පිටකය යන පිටකත්‍රයෙනි.

මෙසේ ප්‍රථම සංගායනාවේදී ඊට සහභාගී වුණු මහා රහතන් පන්සියයක් දෙනා වහන්සේලා විසින්ම ඒකමතිකව පිළිගනු ලැබුණු ත්‍රිපිටකය එතැන් පටන් රහතන් වහන්සේලා කණ්ඩායම් මගින් මුඛ පරම්පරාවෙන් පවත්වාගෙන එනු ලැබුණු අතර, ඉන් වසර සියයකට පසු කාලාශෝක රජු දවස විශාලා මහනුවර පැවැත්වුණු දෙවන ධර්ම සංගායනාවේ දී හා ඉන් අනතුරුව ධර්මාශෝක රජු සමයේ දී පාටලී පුත්‍ර නගරයේ දී පැවැත්වුණු තුන්වන සංගායනාවේ දී ද සජ්ඣායන කොට අනුමත කරනු ලැබිණි.

මිහිඳු මහා රහතන් වහන්සේ ප්‍රමුඛව ධර්ම දූතයන් වහන්සේලා විසින් ශ්‍රී ලංකාවට ගෙන එනු ලැබුනේ මෙලෙස සංගීති තුනකදී සජ්ඣායනා කරනු ලැබ, අනුමතව කෙරුණු ත්‍රිපිටකයය. ශ්‍රී ලංකාවේ දී ද අඛණ්ඩව මුඛ පරම්පරාවෙන් පවත්වාගෙන එනු ලැබුණු සම්මා සම්බුද්ධ දේශනාව අඩංගු ත්‍රිපිටකය ක්‍රි.පූ. පළමුවන සියවසේ අගභාගයේ දී පමණ වළගම්බා රජු දවස මාතලේ අළුවිහාරයේ දී ග්‍රන්ථාරූඪ කෙරුණු බව වංස කථාවල දැක්වේ. දැනට භාවිතයේ පවතින පාලි ත්‍රිපිටකයට පාදක වී ඇත්තේ මෙලෙස මහා සංඝරත්නය විසින් ජීවිත පූජාවෙන් ඇප කැපවී නිර්මලව සුරක්ෂිත කොට ගෙන ආ මේ ත්‍රිපිටකයය.

ත්‍රිපිටකයේ විනය පිටකයට මහා විභංග හා භික්ෂුණී විභංග යන දෙකොටස අඩංගු සුත්ත විභංගය ද, මහා වග්ග හා චුල්ලවග්ග යන දෙකොටස අඩංගු ඛන්දකයන් ද පරිවාර නම් කොටස ද ඇතුළත් ය. විනය පිටකයේ ගොනු කොට ඇත්තේ භික්ෂු-භික්ෂුණී චරියාව සකසා ගැනීමට අදාල නීති මාලාවන්ය.

ධර්මය අතින් ඉතා වැදගත් වන්නේ සූත්‍ර පිටකයය. මෙයට දීඝනිකාය, මජ්ඣිමනිකාය, අංගුත්තර නිකාය සහ ඛුද්දක නිකාය අයත් ය.

සුත්ත පිටකයේ අඩංගු ධර්මයේ සාරය ඉතා ක්‍රමවත්ව ඉදිරිපත් කරමින්, විශ්ලේෂණය කොට අර්ථකථන ඉදිරිපත් කෙරෙන්නේ අභිධර්ම පිටකයෙනි. ඊට ධම්මසංගීති, විභංග, ධාතු කථා, පුග්ගලපඤ්ඤත්ති, කථාවත්ථු, යමක, පට්ඨාන යන ග්‍රන්ථ හත ඇතුළත් ය.

මෙම සම්පූර්ණ ත්‍රිපිටකය අද අපට ඉතිරිව ඇත්තේ පුරාණයේ වැඩ විසූ මහා සංඝරත්නය අප්‍රතිහත ධෛර්යයෙන් හා ඉමහත් කැපවීමෙන් එය සුරක්ෂිත කොටගෙන, ඉමහත් වෙහෙස දරා පුස්කොළ පොත්වල

ලේඛන ගතකොට ප්‍රචලිත කිරීමේ හේතුවෙනි. විනයධර - ධර්මධර පුරාණ මහා සංඝයා වහන්සේලා අනුව යමින් වත්මන් මහා සංඝපීතෘවරයන් වහන්සේලා ද ත්‍රිපිටකය ආරක්ෂා කොට ප්‍රචලිත කිරීමේ කාර්යභාරයට උරදුන් හේතුවෙන් ත්‍රිපිටකයෙහි පාලි පෙළ හා එහි සිංහල අනුවාද සකස් කොට පළ කිරීමට අවස්ථාව උදාවීම ධර්මලැදි සැමගේම භාග්‍යයක් බව අමුතුවෙන් කිවයුතු නැත. බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා නම් ශීර්ෂය යටතේ ශ්‍රී ලංකා රජය මගින් මුද්‍රණය කොට පළ කරන්නට යෙදුණු සිංහල අනුවාදය සහිත මෙම ත්‍රිපිටක ග්‍රන්ථමාලාව පිටපත් අවසන් වී දැන් බොහෝ කලක් ගත වී ඇත.

මෙම ත්‍රිපිටක ග්‍රන්ථ ලබා ගැනීමට ඉමහත් ආශාවෙන් විශාල පිරිසක් සිටින බව අපට දැනගන්නට ලැබුණි. ත්‍රිපිටකය චිරාත් කාලයක් පවත්වාගෙන යාමට කටයුතු යෙදීමත්, දහම් ලැදි සැදැහැවත් ගිහි පැවිදි දෙපිරිසගේම ධර්මාවබෝධය සහ ධර්මසංවේගය සඳහා ත්‍රිපිටකය ප්‍රචලිත කොට සුලභ කිරීමත් වර්තමාන මහා සංඝයාවහන්සේ මත අනිවාර්යයෙන් ම පැවරෙන භාරදූර වගකීමකි. වත්මන් සමාජය දෙස බලන විට මෙවන් කර්තව්‍යයක අවශ්‍යතාව වඩා ඉස්මතු වී පෙනන බව කාහටත් පැහැදිලි වනු ඇත.

නොයෙකුත් විද්වත් බෞද්ධ පිරිස් සමග කතා බහ කිරීමේදී අපට ඒත්තු ගියේ මෙම අවශ්‍යතාව සපුරාලීමට ගතයුතු ඉතා ඵලදායී ක්‍රියාමාර්ගය නම්, දැනට ලබා ගැනීමට නොහැකි බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලාව නැවත මුද්‍රණද්වාරයෙන් පළ කිරීම බවයි. මෙම අති විශාල කර්තව්‍යය සඳහා මාගේ කාරුණික ඉල්ලීම අනුව තායිවානයේ එක්සත් සමූහ බෞද්ධ අධ්‍යාපන පදනම ඉදිරිපත් වීම සැදැහැවත් සිංහල පාඨකයින්ගේ මහත් භාග්‍යයක් බව අපේ හැඟීමයි.

මෙම ත්‍රිපිටක ග්‍රන්ථ උනන්දුවෙන් පරිශීලනය කිරීම මගින් ධර්මඥානය වර්ධනය කර ගැනීමට මෙන්ම ධාර්මික ජීවිත සකසා ගැනීමට ද සැදැහැවත් ඔබ සැම උත්සුක වනු ඇතැයි සිතමි.

*තෙරුවන් සරණයි.*

**බෝදාගම චන්දිම නායක ස්ථවිර**

**තායිවානයේ ප්‍රධාන සංඝනායක තායිපේ ශ්‍රී රතනජෝති ථේරවාදී බෞද්ධ මධ්‍යස්ථානාධිපති**
**බණ්ඩාරගම ශ්‍රී ලංකා ධර්මචක්‍ර ළමා පදනමේ නිර්මාතෘ රත්මලාන ශ්‍රී විජයාරාම විහාර වාසී**

ශ්‍රී ලංකා ධර්මචක්‍ර ළමා පදනම,
විදාගම,
බණ්ඩාරගම.

2557 / 2013

බුද්ධ ජයන්ති ත්‍රිපිඨක ග්‍රන්ථ මාලාව නැවත මුද්‍රණය කොට නොමිලේ

බෙදා හැරීමේ මහා පුණ්‍ය කර්මය

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ කථානායක

වි.ජ.මු ලොකුබණ්ඩාර මැතිතුමාගේ ඉල්ලීම පරිදි

තායිවානයේ ප්‍රධාන සංඝනායක

## ආචාර්ය බෝදාගම චන්දිම නාහිමියන්ගේ අනුශාසනා පරිදි

## තායිවානයේ එක්සත් සමූහ බෞද්ධ අධ්‍යාපන පදනම

මඟින් බුද්ධ වර්ෂ 2549 (ක්‍රි. ව. 2005) දී ආරම්භ කරන ලදි.

**මෙම මහා පුණ්‍ය කර්මයේ දී ඉත සිතින් කටයුතු කළ පහත සඳහන් මහා සංඝරත්නය හා උපකාරක පිංවතුන් විශේෂයෙන් සිහිපත් කරමු.**

- පූජ්‍ය අත්තුඩාවේ ඤාණානන්ද නාහිමි
- පූජ්‍ය කන්ඩක්කුලමේ ධම්මකිත්ති නාහිමි
- ආචාර්ය පූජ්‍ය පල්ලේවෙල සාරද හිමි
- ශාස්ත්‍රවේදී පූජ්‍ය කුඹුක්වැවේ පඤ්ඤාකිත්ති හිමි
- දර්ශනපති පූජ්‍ය කරගහැල්පත සුගතනන්ද හිමි
- ශාස්ත්‍රපති පූජ්‍ය නාගොඩ අමරවංශ නාහිමි
- ශාස්ත්‍රපති පූජ්‍ය මඩපාත ධම්මසාර නාහිමි
- පූජ්‍ය බබරැන්දේ ධම්මසිරි හිමි
- පූජ්‍ය පානදුරේ පසන්න හිමි
- මිලිනා සුමතිපාල මැතිණිය
- ජගත් සුමතිපාල මැතිතුමා
- ආචාර්ය ප්‍රණීත් අබේසුන්දර මහත්මා
- දොස්තර අරුණ රබෙල් මහත්මා
- සුජිත් මොහොට්ටි මහත්මා
- රංජිත් අමරසිංහ මහත්මා
- ගාමිණී කාරියවසම් මහත්මා
- අධිනීතිඥ චන්ද්‍රදාස සූරියාරච්චි මහත්මා
- ආචාර්ය සෙනරත් විජේසුන්දර මහත්මා
- මහාචාර්ය චන්ද්‍ර වික්‍රමගමගේ මහතා
- සිරිසේන හේරත් මැතිතුමා
- විල්ප්‍රඩ් අබේවර්ධන මැතිතුමා

*සියලු දෙනාට රත්නත්‍රයේ ආශිර්වාදයෙන් ධර්මාවබෝධය පහලවේවායි ප්‍රාර්ථනා කරමු.*

අභිධම්මපිටකෙ

# කථාවත්ථුප්පකරණං

තතියො භාගො

අභිධර්මපිටකයෙහි

# කථාවස්තුප්‍රකරණය

තෘතීය භාගය

"තථාගතපපවෙදිතො භිකඛවෙ ධමමවිනයො විවටො විරොචති නො පටිචඡනෙනා"

"මහණෙනි, තථාගතයන් වහන්සේ විසින් දේශනා කරණ ලද ධර්මය හා විනය විවෘත වූයේ බබලයි. වැසුනේ නො බබලයි."

(අඞගුතතරනිකාය, තිකනිපාත - භරණඩුවගග, 9 සූත්‍රය.)

# පටුන

# CONTENTS


පාළිහෝඩිය — PALI ALPHABET ... ... ... XXI

සංකේත නිරූපණය — ABBREVIATIONS ... ... XXIII

විෂයසූචි ... ... ... ... ... XXV

පෙළ හා පරිවර්තනය .. ... ... ... 2-519

I ආකර සුත්තන්තානුක්කමණිකා ... ... ... 523

II සඤ්ඤානාමානුක්කමණිකා ... ... ... 526

III ගාථාදිපාදානුක්කමණිකා ... ... ... 527

IV විසෙසපදානුක්කමණිකා ... ... ... 530

# THE PALI ALPHABET

### IN SINHALA CHARACTERS.

## VOWELS

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| අ a | ආ ā | ඉ i | ඊ ī | උ u | ඌ ū | එ e | ඔ o |

## CONSONANTS

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | ක ka | ඛ kha | ග ga | ඝ gha | ඞ ṅa | | |
| | ච ca | ඡ cha | ජ ja | ඣ jha | ඤ ña | | |
| | ට ṭa | ඨ ṭha | ඩ ḍa | ඪ ḍha | ණ ṇa | | |
| | ත ta | ථ tha | ද da | ධ dha | න na | | |
| | ප pa | ඵ pha | බ ba | භ bha | ම ma | | |
| ය ya | ර ra | ල la | ව va | ස sa | හ ha | ළ ḷa | අං ṃ |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ක ka | කා kā | කි ki | කී kī | කු ku | කූ kū | කෙ kē | කො kō |
| ඛ kha | ඛා khā | ඛි khi | ඛී khī | ඛු khu | ඛූ khū | ඛෙ khē | ඛො khō |
| ග ga | ගා gā | ගි gi | ගී gī | ගු gu | ගූ gū | ගෙ gē | ගො gō |

## Conjunct - Consonants

| | | | |
|---|---|---|---|
| ක්ක kka | ඤ්ඤ ñña | ත්‍ර tra | ම්ඵ mpha |
| ක්ඛ kkha | ණ්හ ṇha | ද්ද dda | ම්බ mba |
| ක්‍ය kya | ඤ්ච ñca | ද්ධ ddha | ම්භ mbha |
| ක්‍රි kri | ඤ්ඡ ñcha | ද්‍ර dra | ම්ම mma |
| ක්ව kva | ඤ්ජ ñja | ද්ව dva | ම්හ mha |
| ඛ්‍ය khya | ඤ්ඣ ñjha | ධ්ව dhva | ය්‍ය yya |
| ඛ්ව khva | ට්ට ṭṭa | න්ත nta | ය්හ yha |
| ග්ග gga | ට්ඨ ṭṭha | න්ථ ntha | ල්ල lla |
| ග්ඝ ggha | ඩ්ඩ ḍḍa | න්ද nda | ල්‍ය lya |
| ඞ්ක ṅka | ඩ්ඪ ḍḍha | න්ධ ndha | ල්හ lha |
| ග්‍ර gra | ණ්ණ ṇṇa | න්න nna | ව්හ wha |
| ඞ්ඛ ṅkha | ණ්ට ṇṭa | න්හ nha | ස්ස ssa |
| ඞ්ග ṅga | ණ්ඨ ṇṭha | ප්ප ppa | ස්ම sma |
| ඞ්ඝ ṅgha | ණ්ඩ ṇḍa | ප්ඵ ppha | ස්ව sva |
| ච්ච cca | ණ්හ ṇha | බ්බ bba | හ්ම hma |
| ච්ඡ ccha | ත්ත tta | බ්භ bbha | හ්ව hva |
| ජ්ජ jja | ත්ථ ttha | බ්‍ර bra | ළ්හ ḷha |
| ජ්ඣ jjha | ත්ව tva | ම්ප mpa | |

ා ā   ි i   ී ī   ු u   ූ ū   ෙ e   ො o

# සඞ්කේත නිරූපණය

## ABBREVIATIONS

### [ග්‍රන්ථයෙහි යෙදී ඇති සඞ්කේත]

| | | |
|---|---|---|
| ස. පු: | ... | සකවාදී පුච්ඡා, |
| ප. පටිඤ්ඤා: | ... | පරවාදී පටිඤ්ඤා, |
| ස. අනු: | ... | සකවාදී අනුයොගො, |
| ප. පටි: | ... | පරවාදී පටික්ඛෙපො, |
| ප. පු: | ... | පරවාදී පුච්ඡා, |
| ස. පටිඤ්ඤා: | ... | සකවාදී පටිඤ්ඤා: |
| ප. අනු: | ... | පරවාදී අනුයොගො, |
| ස. පටි: | ... | සකවාදී පටික්ඛෙපො, |
| අනු. ඨ: | ... | අනුලොම ඨපනා, |
| අනු. පා: | ... | අනුලොම පාපනා, |
| අනු. ආ: | ... | අනුලොම ආරොපනා, |
| පටි. ඨ: | ... | පටිලොම ඨපනා, |
| පටි. පා: | ... | පටිලොම පාපනා, |
| ස. නි: | ... | සකවාදී නිග්ගහො, |
| ප. නි: | ... | පරවාදී නිග්ගහො, |
| ස. නිග: | ... | සකවාදී නිගමනං, |
| ප. නිග: | ... | පරවාදී නිගමනං, |
| ස. වි: | ... | සකවාදී විස්සජ්ජනා, |
| ප. වි: | ... | පරවාදී විස්සජ්ජනා. |

### පොත්ථක සඞ්කෙත

| | | |
|---|---|---|
| සී. මු: | ... | සීහළක්ඛර – මුද්දිත පොත්ථකං, |
| සයා: | ... | සයාමක්ඛර – මුද්දිත පොත්ථකං, |
| මජසං: | ... | මරම්මඡට්ඨසඞ්ගීතිපිටක – පොත්ථකං, |
| PTS. | .... | Pali Text Society Edition. |

අභිධම්මපිටකෙ

# කථාවත්ථුප්පකරණපාළියා

## තතියභාග – විසයසූචි


| විසයා | | | පිට්ඨඞ්කා |
|---|---|---|---|
| **එකාදසමො වග්ගො** | | | 2 – 48 |
| 1. තිස්සොපි අනුසයකථා | ... | ... | 2 – 18 |
| 2. ඤාණකථා | ... | ... | 20 – |
| 3. ඤාණං චිත්තවිප්පයුත්තන්තිකථා | ... | ... | 22 – 26 |
| 4 ඉදං දුක්ඛන්තිකථා | ... | ... | 28 – 32 |
| 5. ඉද්ධිබලකථා | ... | ... | 34 – 38 |
| 6. සමාධිකථා | ... | ... | 40 – 42 |
| 7. ධම්මට්ඨිතතාකථා | ... | ... | 44 – |
| 8. අනිච්චතාකථා | ... | ... | 46 – 48 |
| එකාදසමො වග්ගො නිට්ඨිතො. | | | |
| **ද්වාදසමො වග්ගො** | | | 50 – 88 |
| 1. සංවරො කම්මන්තිකථා | ... | ... | 50 – 54 |
| 2. කම්මකථා | ... | ... | 56 – 60 |
| 3. සද්දො විපාකොතිකථා | ... | ... | 62 – 64 |
| 4. සළායතනකථා | ... | ... | 66 – 68 |
| 5. සත්තක්ඛත්තුපරමකථා | ... | ... | 70 – 74 |
| 6 කොලංකොලකථා | ... | ... | 76 – |
| 7. එකබීජීකථා | ... | ... | 78 – |
| 8. ජීවිතා වොරොපනකථා | ... | ... | 80 – 82 |
| 9. දුග්ගතිකථා | ... | ... | 84 – 86 |
| 10. සත්තමභවිකකථා | ... | ... | 88 – |
| ද්වාදසමො වග්ගො නිට්ඨිතො. | | | |
| **තෙරසමො වග්ගො** | | | 90 – 128 |
| 1. කප්පට්ඨකථා | ... | ... | 90 – 92 |
| 2. කුසලපටිලාභකථා | ... | ... | 94 – |
| 3. අනන්තරාපයුත්තකථා | ... | ... | 96 – 98 |
| 4. නියතස්ස නියාමකථා | ... | ... | 100 – |
| 5. නීවුතකථා | ... | ... | 102 – 104 |
| 6. සම්මුඛීභූතකථා | ... | ... | 106 – 108 |
| 7. සමාපන්නො අස්සාදෙතිකථා | ... | ... | 110 – 112 |
| 8. අසාතරාගකථා | ... | ... | 114 – 116 |
| 9. ධම්මතණ්හා අබ්‍යාකතාතිකථා | ... | ... | 118 – 122 |
| 10. ධම්මතණ්හා න දුක්ඛසමුදයොතිකථා | | ... | 124 – 128 |
| තෙරසමො වග්ගො නිට්ඨිතො. | | | |

| විසයා | | | පිට්ඨඞ්කා |
|---|---|---|---|
| | **චුද්දසමො වග්ගො** | | **130 – 176** |
| 1. | කුසලාකුසලපටිසන්දහනකථා ... ... | | 130 – 136 |
| 2. | සළායතනුප්පත්තිකථා ... ... | | 138 – 140 |
| 3. | අනන්තරපච්චයකථා ... ... | | 142 – 150 |
| 4. | අරියරූපකථා ... ... | | 152 – |
| 5. | අඤ්ඤො අනුසයොතිකථා ... ... | | 154 – 158 |
| 6. | පරියුට්ඨානංචිත්තවිප්පයුත්තන්තිකථා ... | | 160 – |
| 7. | පරියාපන්නකථා ... ... | | 162 – 168 |
| 8. | අබ්‍යාකතකථා ... ... | | 170 – 174 |
| 9. | අපරියාපන්නකථා .... ... | | 176 – |

**චුද්දසමො වග්ගො නිට්ඨිතො.**

| | | | |
|---|---|---|---|
| | **පණ්ණරසමො වග්ගො** | | **178 – 224** |
| 1. | පච්චයකථා ... ... | | 178 – 184 |
| 2. | අඤ්ඤමඤ්ඤපච්චයකථා ... ... | | 186 – 188 |
| 3. | අද්ධාකථා .. ... | | 190 – 194 |
| 4. | ඛණ-ලය-මුහුත්තකථා ... ... | | 196 – |
| 5. | ආසවකථා ... ... | | 198 – |
| 6. | ජරාමරණකථා ... ... | | 200 – 202 |
| 7. | සඤ්ඤාවෙදයිතකථා ... ... | | 204 – |
| 8. | දුතියසඤ්ඤාවෙදයිතකථා ... ... | | 206 – |
| 9. | තතියසඤ්ඤාවෙදයිතකථා ... ... | | 208 – 212 |
| 10. | අසඤ්ඤසත්තුපිකකථා ... ... | | 214 – 216 |
| 11. | කම්මූපචයකථා ... ... | | 218 – 224 |

**පණ්ණරසමො වග්ගො නිට්ඨිතො.**

**තතියො පණ්ණාසකො**

| | | | |
|---|---|---|---|
| | **සොළසමො වග්ගො** | | **226 – 274** |
| 1. | නිග්ගහකථා ... ... | | 226 – 228 |
| 2. | පග්ගහකථා ... ... | | 230 – 232 |
| 3. | සුඛානුප්පදානකථා ... ... | | 234 – 236 |
| 4. | අධිගය්හමනසිකාර කථා ... ... | | 238 – 244 |
| 5. | රූපං හෙතූතිකථා ... ... | | 246 – 248 |
| 6. | රූපං සහෙතුකන්තිකථා ... ... | | 250 – 252 |
| 7. | රූපං කුසලාකුසලන්තිකථා ... ... | | 254 – 258 |
| 8. | රූපං විපාකොතිකථා ... ... | | 260 – 262 |
| 9. | රූපං රූපාවචරාරූපාවචරන්තිකථා ... | | 264 – 266 |
| 10. | රූපරාගො රූපධාතුපරියාපන්නො, අරූපරාගො අරූපධාතුපරියාපන්නොතිකථා ... | | 268 – 274 |

**සොළසමො වග්ගො නිට්ඨිතො.**

| විෂයං | | පිට්ඨඞ්කා |
|---|---|---|
| | **සත්තරසමො වග්ගො** | **276 – 320** |
| 1. | අත්ථි අරහතො පුඤ්ඤූපචයොති කථා ... | 276 – 278 |
| 2. | නත්ථි අරහතො අකාලමච්චූතිකථා ... | 280 – 282 |
| 3. | සබ්බමිදං කම්මතොතිකථා ... | 284 – 286 |
| 4. | ඉන්ද්‍රියබද්ධකථා ... | 288 – 290 |
| 5 | ඨපෙත්වා අරියමග්ගන්තිකථා ... | 292 – 294 |
| 6. | න වත්තබ්බං සඞ්ඝො දක්ඛිණං පටිග්ගණ්හාතීතිකථා | 296 – 298 |
| 7. | න වත්තබ්බං සඞ්ඝො දක්ඛිණං විසොධෙතීති කථා | 300 – 302 |
| 8. | න වත්තබ්බං සඞ්ඝො භුඤ්ජතීතිකථා ... | 304 – 306 |
| 9. | න වත්තබ්බං සඞ්ඝස්ස දින්නං මහප්ඵලන්තිකථා | 308 – 310 |
| 10. | න වත්තබ්බං බුද්ධස්ස දින්නං මහප්ඵලන්තිකථා | 312 – 314 |
| 11. | දක්ඛිණාවිසුද්ධි කථා ... | 316 – 320 |


**සත්තරසමො වග්ගො නිට්ඨිතො.**


| | | |
|---|---|---|
| | **අට්ඨාරසමො වග්ගො** | **322 – 368** |
| 1. | මනුස්සලොකකථා ... ... | 322 – 324 |
| 2. | ධම්මදෙසනාකථා ... ... | 326 – 328 |
| 3. | කරුණාකථා ... ... | 330 – 332 |
| 4. | ගන්ධජාතකථා ... ... | 334 – |
| 4. | එකමග්ගකථා ... ... | 336 – 340 |
| 6. | ඣානසඞ්කන්තිකථා ... ... | 342 – 350 |
| 7. | ඣානන්තරිකකථා ... ... | 352 – 358 |
| 8. | සමාපන්නො සද්දං සුණාතීතිකථා ... | 360 – 362 |
| 9. | චක්ඛුනා රූපං පස්සතීතිකථා ... | 364 – 368 |


**අට්ඨාරසමො වග්ගො නිට්ඨිතො.**


| | | |
|---|---|---|
| | **එකූනවීසතිමො වග්ගො** | **370 – 416** |
| 1. | කිලෙසජහනකථා ... ... | 370 – 374 |
| 2. | සුඤ්ඤතාකථා ... ... | 376 – 380 |
| 3. | සාමඤ්ඤඵලකථා ... ... | 382 – 384 |
| 4 | පත්තිකථා ... ... | 386 – 390 |
| 5. | තථතාකථා ... ... | 392 – 394 |
| 5. | කුසලකථා ... ... | 396 – 398 |
| 7. | අච්චන්තනියාමකථා ... ... | 400 – 408 |
| 8. | ඉන්ද්‍රියකථා ... ... | 410 – 416 |


**එකූනවීසතිමො වග්ගො නිට්ඨිතො.**

| විසයා | | | පිට්ඨඞ්කා |
|---|---|---|---|


**වීසතිමො වග්ගො** — 418 – 448

| | | | | |
|---|---|---|---|---|
| 1. | අසඤ්චිච්චකථා | ... | ... | 418 – 424 |
| 2. | ඤාණකථා | ... | ... | 426 – 428 |
| 3. | නිරයපාලකථා | ... | ... | 430 – 434 |
| 4. | තිරච්ඡානකථා | ... | ... | 436 – 438 |
| 5. | මග්ගකථා | ... | ... | 440 – 444 |
| 6. | ඤාණකථා | ... | ... | 446 – 448 |

වීසතිමො වග්ගො නිට්ඨිතො.

**එකවීසතිමො වග්ගො** — 450 – 472

| | | | | |
|---|---|---|---|---|
| 1. | සාසනකථා | ... | ... | 450 – 452 |
| 2. | අවිවිත්තකථා | ... | ... | 454 – |
| 3. | සඤ්ඤොජනකථා | ... | ... | 456 – |
| 4. | ඉද්ධිකථා | ... | ... | 458 – 460 |
| 5. | බුද්ධකථා | ... | ... | 462 – |
| 6. | සබ්බදිසාකථා | ... | ... | 464 – |
| 7. | ධම්මකථා | ... | ... | 466 – 468 |
| 8. | කම්මකථා | ... | ... | 470 – 472 |

එකවීසතිමො වග්ගො නිට්ඨිතො.

**ද්වාවීසතිමො වග්ගො** — 474 – 500

| | | | | |
|---|---|---|---|---|
| 1 | පරිනිබ්බානකථා | ... | ... | 474 – |
| 2. | කුසලචිත්තකථා | ... | ... | 476 – 478 |
| 3. | ආනෙඤ්ජකථා | ... | ... | 480 – 482 |
| 4. | ධම්මාභිසමයකථා | ... | ... | 484 – |
| 5. | තිස්සොපි කථා | ... | ... | 486 – |
| 8. | අබ්‍යාකතකථා | ... | ... | 488 – 490 |
| 9. | ආසෙවනපච්චයකථා | ... | ... | 492 – 496 |
| 10. | ඛණික කථා | .. | ... | 498 – 500 |

ද්වාවීසතිමො වග්ගො නිට්ඨිතො.

**තෙවීසතිමො වග්ගො** — 502 – 516

| | | | | |
|---|---|---|---|---|
| 1. | එකාධිප්පායකථා | ... | ... | 502 – |
| 2. | අරහන්තවණ්ණකථා | ... | ... | 504 – |
| 3. | ඉස්සරියකාමකාරිකාකථා | ... | ... | 506 – 510 |
| 4. | පතිරූපකථා | ... | ... | 512 – |
| 5. | අපරිනිප්ඵන්නකථා | ... | ... | 514 – 516 |

තෙවීසතිමො වග්ගො නිට්ඨිතො.

අභිධම්මපිටකෙ

# කථාවත්ථුප්පකරණං

තතියොභාගො

අභිධම්මපිටකෙ

# කථාවත්ථුප්පකරණං

## තතියො භාගො

නමො තස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස.

## එකාදසමො වග්ගො

### 11. 1.

### තිස්සොපි අනුසයකථා

1\. ස පුච්ඡා: අනුසයා අබ්‍යාකතා’ති.

ප. පටිඤ්ඤා: ආමන්තා

ස. අනුයොගො: විපාකාබ්‍යාකතා කිරියාබ්‍යාකතා, රූපං නිබ්බානං චක්ඛායතනං -පෙ- ඵොට්ඨබ්බායතනන්ති.

ප. පටික්ඛෙපො: න හෙවං වත්තබ්බෙ -පෙ-

2\. ස. පු: කාමරාගානුසයො අබ්‍යාකතො’ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: කාමරාගො කාමරාගපරියුට්ඨානං කාමරාග-සඤ්ඤොජනං කාමොඝො කාමයොගො කාමච්ඡන්දනීවරණං අබ්‍යාකතන්ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

3\. ස. පු: කාමරාගො කාමරාගපරියුට්ඨානං -පෙ- කාමච්ඡන්දනීවරණං අකුසලන්ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: කාමරාගානුසයො අකුසලො’ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

## අභිධර්මපිටකයෙහි

# කථාවස්තුප්‍රකරණය

## තෘතීය භාගය

### ඒ භගවත් අර්හත් සම්මාසම්බුද්ධරජාණන් වහන්සේට නමස්කාර වේවා.

### එකාදශ වර්ගය

**11. 1.**

### තිස්සොපි අනුසයකථා.

**[යම් හෙයෙකින් පෘථග්ජන තෙම කුශලාව්‍යාකෘත සිත් පවතිත් මැ 'සානුශයක' යි කියැයුතු වේ ද, එකෙණෙහි ඔහුගේ යම් හේතුයෙක් ඇද් ද, ඒ හේතුයෙන් අනුශය ධර්මයෝ සහේතුක නො වෙත්. ඒ චිත්තයෙන් සම්ප්‍රයුක්ත ද නො වෙත්. එහෙයින් ඒ ධර්මයෝ 'අව්‍යාකෘත යහ, අහේතුකයහ, චිත්තවිප්‍රයුක්තයහ' යි ලබ්ධි ගත් මහාසාංඝික- සම්මිතීය නිකාය වාසීන්ගේ වාද බිඳුනට 'තිස්සොපි අනුසයකථා' එයි.]**

**1**. ස. පුච්ඡා: අනුශයයෝ අව්‍යාකෘත වෙත් ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනුයොග: විපාකාව්‍යාකෘත වෙත් ද? ක්‍රියාව්‍යාකෘත වෙත් ද? රූප, නිර්වාණ, චක්ෂුරායතන ... ස්ප්‍රෂ්ටව්‍යායතන අව්‍යාකෘත වේ ද?

ප. පටික්කෙප: එසේ නො කියැයුතු යැ ...

**2** ස. පු: කාමරාගානුශය අව්‍යාකෘත වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: කාමරාගය කාමරාගපර්‍ය්‍යුත්ථානය කාමරාගසං- යෝජනය කාමෞඝය කාමයෝගය කාමච්ඡන්ද නීවරණය අව්‍යාකෘත වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

**3**. ස. පු: කාමරාගය කාමරාගපර්‍ය්‍යුත්ථානය ... කාමච්ඡන්ද- නීවරණය අකුශල වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: කාමරාගානුශය අකුශල වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

4. ස. පු: පටිඝානුසයො අබ්‍යාකතො'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: පටිඝං පටිඝපරියුට්ඨානං පටිඝසඤ්ඤොජනං අබ්‍යාකතන්ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

5. ස. පු: පටිඝං පටිඝපරියුට්ඨානං පටිඝසඤ්ඤොජනං අකුසලන්ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස අනු: පටිඝානුසයො අකුසලො'ති.

ප. පටි. න හෙවං වත්තබ්බෙ -පෙ-

6. ස. පු: මානානුසයො අබ්‍යාකතො'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: මානො මානපරියුට්ඨානං මානසඤ්ඤොජනං අබ්‍යාකතන්ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

7. ස. පු: මානො මානපරියුට්ඨානං මානසඤ්ඤොජනං අකුසලන්ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු. මානානුසයො අකුසලො'ති.

ප පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

8. ස. පු: දිට්ඨානුසයො අබ්‍යාකතො'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: දිට්ඨි දිට්ඨොඝො දිට්ඨියොගො දිට්ඨිපරියුට්ඨානං දිට්ඨිසඤ්ඤොජනං අබ්‍යාකතන්ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

9. ස. පු: දිට්ඨි දිට්ඨොඝො දිට්ඨියොගො දිට්ඨිපරියුට්ඨානං දිට්ඨිසඤ්ඤොජනං අකුසලන්ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: දිට්ඨානුසයො අකුසලො'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

4. ස. පු: ප්‍රතිඝානුශය අව්‍යාකෘත වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: ප්‍රතිඝය ප්‍රතිඝපර්‍යුත්ථානය ප්‍රතිඝසංයෝජනය අව්‍යාකෘත වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

5. ස. පු: ප්‍රතිඝය ප්‍රතිඝපර්‍යුත්ථානය ප්‍රතිඝසංයොජනය අකුශල වේ ද?

ස. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: ප්‍රතිඝානුශය අකුශල වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

6. ස. පු: මානානුශය අව්‍යකෘත වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: මානය මානපර්‍යුත්ථානය, මානසංයොජනය අව්‍යාකෘත වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

7. ස. පු: මානය, මානපර්‍යුත්ථානය, මානසංයොජනය අකුශල වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: මානානුශය අකුශල වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

8. ස. පු: දිට්ඨානුසය අව්‍යාකෘත වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: දෘෂ්ටි, දෘෂ්ටිඕඝ, දෘෂ්ටියොග, දෘෂ්ටිපර්‍යුත්ථාන, දෘෂ්ටිසංයොජන අව්‍යකෘත වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

9. ස. පු: දෘෂ්ටි, දෘෂ්ටිඕඝ, දෘෂ්ටියොග, දෘෂ්ටිපර්‍යුත්ථාන, දෘෂ්ටි සංයොජන අකුශල වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: දෘෂ්ටිඅනුශය අකුශල වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

10. ස. පු: විචිකිච්ඡානුසයො අබ්‍යාකතො'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: විචිකිච්ඡා විචිකිච්ඡාපරියුට්ඨානං විචිකිච්ඡාසඤ්ඤොජනං විචිකිච්ඡානීවරණං අබ්‍යාකතන්ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

11. ස. පු: විචිකිච්ඡා විචිකිච්ඡාපරියුට්ඨානං විචිකිච්ඡාසඤ්ඤොජනං විචිකිච්ඡානීවරණං අකුසලන්ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: විචිකිච්ඡානුසයො අකුසලො'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

12. ස. පු: භවරාගානුසයො අබ්‍යාකතො'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: භවරාගො භවරාගපරියුට්ඨානං භවරාගසඤ්ඤොජනං අබ්‍යාකතන්ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

13. ස. පු: භවරාගො භවරාගපරියුට්ඨානං භවරාගසඤ්ඤොජනං අකුසලන්ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: භවරාගානුසයො අකුසලො'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

14. ස. පු: අවිජ්ජානුසයො අබ්‍යාකතො'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: අවිජ්ජා අවිජ්ජොඝො අවිජ්ජායොගො අවිජ්ජාපරියුට්ඨානං අවිජ්ජාසඤ්ඤොජනං අවිජ්ජානීවරණං අබ්‍යාකතන්ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

15. ස. පු: අවිජ්ජා අවිජ්ජොඝො අවිජ්ජායොගො අවිජ්ජාපරියුට්ඨානං අවිජ්ජාසඤ්ඤොජනං අවිජ්ජානීවරණං අකුසලන්ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: අවිජ්ජානුසයො අකුසලො'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

10. ස. පු: විචිකිච්ඡානුශය අව්‍යාකෘත වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: විචිකිච්ඡා, විචිකිච්ඡාපර්‍යුට්ඨාන, විචිකිච්ඡාසං-යෝජන, විචිකිච්ඡානීවරණ අව්‍යාකෘත වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

11. ස. පු: විචිකිච්ඡා, විචිකිච්ඡාපර්‍යුට්ඨාන, විචිකිච්ඡාසං-යෝජන, විචිකිච්ඡා නීවරණ අකුශල වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: විචිකිච්ඡානුශය අකුශල වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

12. ස. පු: භවරාගානුශය අව්‍යාකෘත වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: භවරාගය, භවරාගපර්‍යුට්ඨානය, භවරාගසංයෝ-ජනය අව්‍යාකෘත වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ..

13. ස. පු: භවරාගය, භවරාගපර්‍යුට්ඨානය, භවරාගසංයෝ-ජනය අකුශල වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: භවරාගානුශය අකුශල වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

14. ස. පු: අවිද්‍යානුශය අව්‍යාකෘත වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: අවිද්‍යා, අවිද්‍යෞඝ, අවිද්‍යායෝග, අවිද්‍යාපර්‍යුට්ඨාන, අවිද්‍යාසංයෝජන, අවිද්‍යානීවරරණ අව්‍යාකෘත වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

15. ස. පු: අවිද්‍යා, අවිද්‍යෞඝ, අවිද්‍යායෝග, අවිද්‍යාපර්‍යුට්ඨාන, අවිද්‍යාසංයෝජන, අවිද්‍යානීවරණ අකුශල වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: අවිද්‍යානුශය අකුශල වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

**16.** ප. පු: න වත්තබ්බං: අනුසයා අබ්‍යාකතා'ති.

ස. පටිඤ්ඤා: ආමන්තා.

ප. අනු: ''පුථුජ්ජනො කුසලාබ්‍යාකතෙ චිත්තෙ වත්තමානෙ සානුසයො''ති වත්තබ්බො'ති

ස. පටිඤ්ඤා: ආමන්තා.

ප. අනු: කුසලා'කුසලා ධම්මා සම්මුඛීභාවං ආගච්ඡන්තී'ති.

ස. පටි: න හෙවං වත්තබ්බෙ –පෙ–

ප. ආ: තෙන හි අනුසයා අබ්‍යාකතා'ති.[1]

**17.** ප. පු: ''පුථුජ්ජනො කුසලාබ්‍යාකතෙ චිත්තෙ වත්තමානෙ සරාගො''ති වත්තබ්බො'ති.

ස. පටිඤ්ඤා: ආමන්තා.

ප. අනු: කුසලා'කුසලා ධම්මා සම්මුඛීභාවං ආගච්ඡන්ති'ති.

ස. පටි: න හෙවං වත්තබ්බෙ –පෙ–

ප. ආ: තෙන හි රාගො අබ්‍යාකතො'ති.

**18.** ස. පු: අනුසයා අහෙතුකා'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: රූපං නිබ්බානං චක්ඛායතනං -පෙ- ඵොට්ඨබ්බා-යතනන්ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ –පෙ–

**19.** ස. පු: කාමරාගානුසයො අහෙතුකො'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: කාමීරාගො කාමරාගපරියුට්ඨානං කාමරාග-සඤ්ඤොජනං කාමච්ඡන්දනීවරණං[2] අහෙතුකන්ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ–

**20.** ස. පු: කාමරාගො කාමරාගපරියුට්ඨානං -පෙ- කාමච්ඡන්දනීවරණං සහෙතුකන්ති.[3]

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: කාමරාගානුසයො සහෙතුකො'ති.

ප. පටි: න හෙවාං වත්තබ්බෙ –පෙ–

---

1. අනුසයො අබ්‍යාකතො'ති - සීමු. 2 කාමරාගනීවරණං - PTS.

3 අහෙතුකා'ති - සීමු

| | | |
|---|---|---|
| **16.** | ප. පු: | 'අනුශයයෝ අව්‍යාකෘත වෙති'යි නො කියයුතු වේ ද? |
| | ස. පටික්ඛෙප: | එසේ යැ. |
| | ප. අනු: | "පෘථග්ජන තෙම කුශල අව්‍යාකෘත චිත්තය පවත්නා කල්හි සානුශය වේ"යයි කියයුතු වේ ද? |
| | ස. පටික්ඛෙප: | එසේ යැ. |
| | ප. අනු: | කුශලාකුශල ධර්මයෝ සම්මුඛීභාවයට එත් ද? |
| | ස. පටි: | එසේ නො කියයුතු යැ ... |
| | ප. ආ: | එසේ වී නම් අනුශය ධර්මයෝ අව්‍යාකෘත වෙති. |
| **17.** | ප. පු: | "පෘථග්ජන තෙම කුසලාව්‍යාකෘත සිත පවත්නා කල්හි සරාග වේ"යයි කියයුතු වේ ද? |
| | ස. පටික්ඛෙප: | එසේ යැ. |
| | ප. අනු: | කුශලාකුශල ධර්මයෝ සම්මුඛීභාවයට එත් ද? |
| | ස. පටි: | එසේ නො කියයුතු යැ ... |
| | ප. ආ: | එකරුණින් රාගය අව්‍යාකෘත වෙයි. |
| **18.** | ස. පු: | අනුශයයෝ අහේතුක වෙත් ද? |
| | ප. පටික්ඛෙප: | එසේ යැ. |
| | ස. අනු: | රූපය නිර්වාණ චක්ෂුරායතන ... සප්‍රෂ්ටව්‍යායතන වේ ද? |
| | ප. පටි: | එසේ නො කියයුතු යැ ... |
| **19.** | ස. පු: | කාමරාගානුශය අහේතුක වේ ද? |
| | ප. පටික්ඛෙප: | එසේ යැ. |
| | ස. අනු: | කාමරාගය කාමරාගපර්‍ය්‍යුත්ථාන, කාමරාගසංයොජන, කාමච්ඡන්දනිවරණ අහේතුක වේ ද? |
| | ප. පටි: | එසේ නො කියයුතු යැ ... |
| **20.** | ස. පු: | කාමරාග, කාමරාගපර්‍ය්‍යුත්ථාන ... කාමච්ඡන්ද-නිවරණ සහේතුක වේ ද? |
| | ප. පටික්ඛෙප: | එසේ යැ. |
| | ස. අනු: | කාමරාගානුශය සහෙතුක වේ ද? |
| | ප. පටි: | එසේ නො කියයුතු යැ ... |

**21.** ස. පු: පටිඝානුසයො -පෙ- මානානුසයො -පෙ- දිට්ඨානුසයො -පෙ- විචිකිච්ඡානුසයො -පෙ- භවරාගානුසයො -පෙ- අවිජ්ජානුසයො අහෙතුකො'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: අවිජ්ජා අවිජ්ජොඝො අවිජ්ජායොගො අවිජ්ජාපරියුට්ඨානං අවිජ්ජාසඤ්ඤොජනං අවිජ්ජානීවරණං අහෙතුකන්ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

**22.** ස. පු: අවිජ්ජා අවිජ්ජොඝො -පෙ- අවිජ්ජානීවරණං සහෙතුකන්ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: අවිජ්ජානුසයො සහෙතුකො'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

**23.** ප. පු: න වත්තබ්බං 'අනුසයා අහෙතුකා'ති[1]

ස. පටිඤ්ඤා: ආමන්තා.

ප. අනු: 'පුථුජ්ජනො කුසලාබ්‍යාකතෙ චිත්තෙ වත්තමානෙ සානුසයො'ති වත්තබ්බො'ති.

ස. පටිඤ්ඤා: ආමන්තා.

ප. අනු: අනුසයා තෙන හෙතුනා සහෙතුකා'ති.

ස. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

ප. ආ: තෙන හි අනුසයා අහෙතුකා'ති.

**24.** ප. පු: 'පුථුජ්ජනො කුසලාබ්‍යාකතෙ චිත්තෙ වත්තමානෙ සරාගො'ති වත්තබ්බො'ති.

ස. පටිඤ්ඤා: ආමන්තා.

ප. අනු: රාගො තෙන හෙතුනා සහෙතුකො'ති.

ස. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

ප ආ: තෙන හි රාගො අහෙතුකො'ති.

**25.** ස. පු: අනුසයා චිත්තවිප්පයුත්තා'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: රූපං නිබ්බානං චක්ඛායතනං -පෙ- ඵොට්ඨබ්බායතනන්ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

1. අනුසයො අහෙතුකො'ති - සීමු

21. ස. පු: ප්‍රතිඝානුශය ... මානානුශය ... දෘෂ්ට්‍යනුශය ... විචිකිත්සානුශය ... භවරාගානුශය ... අවිද්‍යානුශය අහෙතුක වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: අවිද්‍යා, අවිද්‍යාඔඝ, අවිද්‍යායෝග, අවිද්‍යාපර්‍යවස්ථාන, අවිද්‍යාසංයෝජන, අවිද්‍යානීවරණ අහේතුක වේ ද?

ප. පටි. එසේ නො කියැයුතු යැ ...

22. ස. පු: අවිද්‍යා, අවිද්‍යාඔඝ, ... අවිද්‍යා නීවරණ සහෙතුක වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: අවිද්‍යානුශය සහේතුක වේ ද?

ප. පටි: එසේ නො කියැ යුතු යැ ...

23. ප. පු: 'අනුශයයෝ අහේතුක වෙති'යි නො කියැයුතු වේ ද?

ස. පටිඤ්ඤා: එසේ යැ.

ප. අනු: 'පෘථග්ජන තෙම කුශලාව්‍යාකෘත චිත්තය පවත්නා කල්හි සානුශය වේ' යයි කියැයුතු වේ ද?

ස. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: අනුශයයෝ ඒ හේතුවින් සහේතුක වෙත් ද?

ස. පටි: එසේ නො කියැයුතු යැ ...

ප. අා: එකරුණින් අනුශයයෝ අහේතුක වෙති.

24. ප. පු: 'පෘථග්ජන තෙම කුශලාව්‍යාකෘත සිත පවත්නා කල්හි සරාග වේ' යයි කියයුතු වේ ද?

ස. පටිඤ්ඤා: එසේ යැ.

ප. අනු: රාගය ඒ හේතුවින් සහේතුක වේ ද?

ස. පටි: එසේ නො කියැයුතු යැ ...

ප. අා: එ කරුණින් රාගය අහේතුක වෙයි.

25. ස. පු: අනුශයයෝ චිත්තවිප්‍රයුක්ත වෙත් ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: රූපය, නිර්වාණ, චක්ෂුරායතන ... සප්‍රෂ්ටව්‍යායතන වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

26 ස. පු: කාමරාගානුසයො චිත්තවිප්පයුත්තො'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: කාමරාගො කාමරාගපරියුට්ඨානං කාමරාගසඤ්ඤොජනං කාමොඝො කාමයොගො කාමච්ඡන්දනීවරණං චිත්තවිප්පයුත්තන්ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

27. ස. පු: කාමරාගො -පෙ- කාමච්ඡන්දනීවරණං චිත්තවිප්පයුත්තන්ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: කාමරාගානුසයො චිත්තවිප්පයුත්තො'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

28. ස. පු: කාමරාගානුසයො චිත්තවිප්පයුත්තො'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: කතමක්ඛන්ධපරියාපන්නො'ති.

ප. වි: සඞ්ඛාරක්ඛන්ධපරියාපන්නො'ති.

ස. අනු: සඞ්ඛාරක්ඛන්ධො චිත්තවිප්පයුත්තො'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

29. ස. පු: සඞ්ඛාරක්ඛන්ධො චිත්තවිප්පයුත්තො'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: වෙදනාක්ඛන්ධො සඤ්ඤාක්ඛන්ධො චිත්තවිප්පයුත්තො'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

30. ස. පු: කාමරාගානුසයො සඞ්ඛාරක්ඛන්ධපරියාපන්නො චිත්තවිප්පයුත්තො'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: කාමරාගො සඞ්ඛාරක්ඛන්ධපරියාපන්නො චිත්තවිප්පයුත්තො'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

31. ස. පු: කාමරාගො සඞ්ඛාරක්ඛන්ධපරියාපන්නො චිත්තසම්පයුත්තො'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: කාමරාගානුසයො සඞ්ඛාරක්ඛන්ධපරියාපන්නො චිත්තසම්පයුත්තො'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

26. ස. පු: කාමරාගානුශය චිත්තවිප්‍රයුක්ත වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: කාමරාගය කාමරාගපර්‍ය්‍යවස්ථානය කාමරාගසංයෝජනය කාමඕඝය කාමයෝගය කාමච්ඡන්දනීවරණය චිත්තවිප්‍රයුක්ත වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

27. ස. පු: කාමරාගය ... කාමච්ඡන්දනීවරණය චිත්තවිප්‍රයුක්ත වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: කාමරාගානුශය චිත්තවිප්‍රයුක්ත වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

28. ස. පු. කාමරාගානුශය චිත්තවිප්‍රයුක්ත වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ,

ස. අනු: කවර ස්කන්ධයෙක පර්‍ය්‍යාපන්න වේ ද?

ප. වි: සංස්කාරස්කන්ධයෙහි පර්‍ය්‍යාපන්න වෙයි.

ස. අනු: සංස්කාරස්කන්ධය චිත්තවිප්‍රයුක්ත වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

29. ස. පු: සංස්කාරස්කන්ධය චිත්තවිප්‍රයුක්ත වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: වේදනාස්කන්ධය සංඥාස්කන්ධය චිත්තවිප්‍රයුක්ත වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

30. ස. පු: කාමරාගානුශය සංස්කාරස්කන්ධපර්‍ය්‍යාපන්න වූයේ චිත්තවිප්‍රයුක්ත වූයේ වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: කාමරාගය සංස්කාරස්කන්ධපර්‍ය්‍යාපන්න වූයේ චිත්තවිප්‍රයුක්ත වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

31. ස. පු: කාමරාගය සංස්කාරස්කන්ධපර්‍ය්‍යාපන්න වූයේ චිත්තසම්ප්‍රයුක්ත වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: කාමරාගානුශය සංස්කාරස්කන්ධපර්‍ය්‍යාපන්න වූයේ චිත්තසම්ප්‍රයුක්ත වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

32. ස. පු: කාමරාගානුසයො සඞ්ඛාරක්ඛන්ධපරියාපන්නො චිත්තවිප්පයුත්තො, කාමරාගො සඞ්ඛාරක්ඛන්ධපරියාපන්නො චිත්තසම්පයුත්තො'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: සඞ්ඛාරක්ඛන්ධො එකදෙසො චිත්තසම්පයුත්තො එකදෙසො චිත්තවිප්පයුත්තො'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

33. ස. පු: සඞ්ඛාරක්ඛන්ධො එකදෙසො චිත්තසම්පයුත්තො එකදෙසො චිත්තවිප්පයුත්තො'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: වෙදනාක්ඛන්ධො සඤ්ඤාක්ඛන්ධො[1] එකදෙසො චිත්තසම්පයුත්තො එකදෙසො චිත්තවිප්පයුත්තො'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

34. ස පු: පටිඝානුසයො මානානුසයො දිට්ඨානුසයො විචිකිච්ඡානුසයො භවරාගානුසයො අවිජ්ජානුසයො චිත්තවිප්පයුත්තො'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: අවිජ්ජා අවිජ්ජොඝො අවිජ්ජායොගො -පෙ- අවිජ්ජානීවරණං චිත්තවිප්පයුත්තන්ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

35. ස. පු: අවිජ්ජා අවිජ්ජොඝො අවිජ්ජායොගො -පෙ- අවිජ්ජානීවරණං චිත්තසම්පයුත්තන්ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: අවිජ්ජානුසයො චිත්තසම්පයුත්තො'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

36. ස. පු: අවිජ්ජානුසයො චිත්තවිප්පයුත්තො'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: කතමක්ඛන්ධපරියාපන්නො'ති.

ප. වි: සඞ්ඛාරක්ඛන්ධපරියාපන්නො'ති.

ස. අනු: සඞ්ඛාරක්ඛන්ධො චිත්තවිප්පයුත්තො'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

---

1. විඤ්ඤාණක්ඛන්ධො - PTS.

32. ස. පු: කාමරාගානුශය සංස්කාරස්කන්ධපර්‍යාපන්න වූයේ චිත්තවිප්‍රයුක්ත වෙයි. කාමරාගය සංස්කාරස්කන්ධ පර්‍යාපන්න වූයේ චිත්තසම්ප්‍රයුක්ත වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: සංස්කාරස්කන්ධය ඒකදෙශ වැ චිත්තසම්ප්‍රයුක්ත වූයේ ඒකදෙශ වැ චිත්තවිප්‍රයුක්ත වූයේ වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

33. ස. පු: සංස්කාරස්කන්ධය එකදෙශ වැ චිත්තසම්ප්‍රයුක්ත වූයේ එකදෙශ වැ චිත්තවිප්‍රයුක්ත වූයේ වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: වෙදනාස්කන්ධය, සංඥස්කන්ධය ඒකදේශ වැ චිත්තසම්ප්‍රයුක්ත වූයේ ඒකදේශ වැ චිත්තවිප්‍රයුක්ත වූයේ වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

34. ස. පු: ප්‍රතිඝානුශය, මානානුශය දෘෂ්ටිඅනුශය, විචිකිත්සානුශය, භවරාගානුශය, අවිද්‍යානුශය චිත්තවිප්‍රයුක්ත වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: අවිද්‍යා, අවිද්‍යාඔඝ, අවිද්‍යා යොග ... අවිද්‍යා නීවරණ චිත්තවිප්‍රයුක්ත වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

35. ස. පු: අවිද්‍යා, අවිද්‍යා ඔඝ, අවිද්‍යායොග ... අවිද්‍යානීවරණ චිත්තසම්ප්‍රයුක්ත වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස අනු: අවිද්‍යානුශය චිත්තසම්ප්‍රයුක්ත වේ ද?

ප පටි: එසේ නො කියැයුතු යැ ...

36. ස. පු: අවිද්‍යානුශය චිත්තවිප්‍රයුක්ත වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: කවර ස්කන්ධයෙකැ ඇතුළත් වේ ද?

ප. වි: සංස්කාරස්කන්ධයෙහි ඇතුළත් වෙයි.

ස අනු: සංස්කාරස්කන්ධය චිත්තවිප්‍රයුක්ත වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

37. ස. පු: සඞ්ඛාරක්ඛන්ධො චිත්තවිප්පයුත්තො'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: වේදනාක්ඛන්ධො සඤ්ඤාක්ඛන්ධො චිත්තවිප්පයුත්තො'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

38. ස. පු: අවිජ්ජානුසයො සඞ්ඛාරක්ඛන්ධපරියාපන්නො චිත්තවිප්පයුත්තො'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: අවිජ්ජා සඞ්ඛාරක්ඛන්ධපරියාපන්නා චිත්තවිප්පයුත්තා'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

39. ස. පු: අවිජ්ජා සඞ්ඛාරක්ඛන්ධපරියාපන්නා චිත්තසම්පයුත්තා'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: අවිජ්ජානුසයො සඞ්ඛාරක්ඛන්ධපරියාපන්නො චිත්තසම්පයුත්තා'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

40 ස. පු: අවිජ්ජානුසයො සඞ්ඛාරක්ඛන්ධපරියාපන්නො චිත්තවිප්පයුත්තො, අවිජ්ජා සඞ්ඛාරක්ඛන්ධපරියාපන්නා චිත්තසම්පයුත්තා'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: සඞ්ඛාරක්ඛන්ධො එකදෙසො චිත්තසම්පයුත්තො, එකදෙසො චිත්තවිප්පයුත්තො'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

41 ස. පු: සඞ්ඛාරක්ඛන්ධො එකදෙසො චිත්තසම්පයුත්තො එකදෙසො චිත්තවිප්පයුත්තො'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: වේදනාක්ඛන්ධො සඤ්ඤාක්ඛන්ධො එකදෙසො චිත්තසම්පයුත්තො එකදෙසො චිත්තවිප්පයුත්තො'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

**37.** ස. පු: සංස්කාරස්කන්ධය චිත්තවිප්‍රයුක්ත වේ ද?

ප. පටිඥාස: එසේ යැ.

ස. අනු: වේදනාස්කන්ධය සංඥාස්කන්ධය චිත්තවිප්‍රයුක්ත වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

**38.** ස. පු: අවිද්‍යානුශය සංස්කාරස්කන්ධපර්‍යාපන්න වූයේ චිත්තවිප්‍රයුක්ත වේ ද?

ප. පටිඥාස: එසේ යැ.

ස. අනු: අවිද්‍යා සංස්කාරස්කන්ධපර්‍යාපන්න වූවා චිත්තවිප්‍රයුක්ත වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

**39.** ස. පු: අවිද්‍යා සංස්කාරස්කන්ධපර්‍යාපන්න වූවා චිත්තසම්ප්‍රයුක්ත වේ ද?

ප. පටිඥාස: එසේ යැ.

ස. අනු: අවිද්‍යානුශය සංස්කාරස්කන්ධපර්‍යාපන්න වූයේ චිත්තසම්ප්‍රයුක්ත වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

**40.** ස. පු: අවිද්‍යානුශය සංස්කාරස්කන්ධපර්‍යාපන්න වූයේ චිත්තවිප්‍රයුක්ත යැ, අවිද්‍යා සංස්කාරස්කන්ධපර්‍යාපන්න වූවා චිත්තසම්ප්‍රයුක්ත වේ ද?

ප. පටිඥාස: එසේ යැ.

ස. අනු: සංස්කාරස්කන්ධය ඒකදේශ වැ චිත්තසම්ප්‍රයුක්ත වූයේ ඒකදේශ වැ චිත්තවිප්‍රයුක්ත වූයේ වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

**41.** ස. පු: සංස්කාරස්කන්ධය ඒකදේශ වැ චිත්තසම්ප්‍රයුක්ත වූයේ ඒකදේශ වැ චිත්තවිප්‍රයුක්ත වූයේ වේ ද?

ප. පටිඥාස: එසේ යැ.

ස. අනු: වේදනාස්කන්ධය සංඥාස්කන්ධය ඒකදෙශ වැ චිත්ත සම්ප්‍රයුක්ත වූයේ ඒකදේශ වැ චිත්තවිප්‍රයුක්ත වූයේ වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ. ...

42. ප. පු: න වත්තබ්බං 'අනුසයා චිත්තවිප්පයුත්තා'ති.

ස. පටිඤ්ඤා: ආමන්තා.

ප. අනු: පුථුජ්ජනො කුසලාබ්‍යාකතෙ චිත්තෙ වත්තමානෙ සානුසයො'ති වත්තබ්බො'ති.

ස. පටිඤ්ඤා: ආමන්තා.

ප. අනු: අනුසයා තෙන චිත්තෙන සම්පයුත්තා'ති.

ස. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

ප. ආ: තෙන හි අනුසයා චිත්තවිප්පයුත්ත'ති.

43. ප. පු: 'පුථුජ්ජනො කුසලාබ්‍යාකතෙ චිත්තෙ වත්තමානෙ සරාගො'ති වත්තබ්බොති.

ස. පටිඤ්ඤා: ආමන්තා.

ප. අනු: රාගො තෙන චිත්තෙන සම්පයුත්තො'ති.

ස. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

ප. ආ: තෙන හි රාගො චිත්තවිප්පයුත්තො'ති.

තිස්සො'පි අනුසයකථා නිට්ඨිතා.

42. ප. පු: 'අනුශයධර්මයෝ චිත්තවිප්‍රයුක්තයහ'යි නො කියැයුතු වේ ද?

ස. පටිඤ්ඤා: එසේ යැ.

ප. අනු: පෘථග්ජන තෙමේ කුශලාව්‍යාකෘත චිත්තය පවතිත් මැ සානුශය වේ යයි කියැයුතු වේ ද?

ස. පටිඤ්ඤා: එසේ යැ.

ප. අනු: අනුශයයෝ ඒ චිත්තය හා සම්ප්‍රයුක්ත වෙත් ද?

ස. පටි: එසේ නො කියැයුතු යැ ...

ප. ආ: එකරුණින් අනුශයයෝ චිත්තවිප්‍රයුක්ත වෙති.

43. ප. පු: පෘථග්ජනයා කුශලාව්‍යාකෘත චිත්තය පවතිත් මැ 'සරාග' යයි කියැයුතු වේ ද?

ස. පටිඤ්ඤා: එසේ යැ.

ප. අනු: රාගය ඒ චිත්තයෙන් සම්ප්‍රයුක්ත වේ ද?

ස. පටි: එසේ නො කියැයුතු යැ ...

ප. ආ: ඒ කරුණින් රාගය චිත්තවිප්‍රයුක්ත වෙයි.

තිස්සෝ'පි අනුසයකථා නිමි.

## 11. 2.

# ඤාණකථා

1. ස. පු: අඤ්ඤාණෙ විගතෙ ඤාණවිප්පයුත්තෙ චිත්තෙ වත්තමානෙ න වත්තබ්බං "ඤාණී"ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: රාගෙ විගතෙ න වත්තබ්බං: වීතරාගො'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

2. ස. පු: අඤ්ඤාණෙ විගතෙ ඤාණවිප්පයුත්තෙ චිත්තෙ වත්තමානෙ න වත්තබ්බං "ඤාණී"ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: දොසෙ විගතෙ -පෙ- මොහෙ විගතෙ -පෙ- කිලෙසෙ විගතෙ න වත්තබ්බං: නික්කිලෙසො'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

3. ස. පු: රාගෙ විගතෙ වත්තබ්බං: වීතරාගො'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: අඤ්ඤාණෙ විගතෙ ඤාණවිප්පයුත්තෙ චිත්තෙ වත්තමනෙ වත්තබ්බං: ඤාණී'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

4. ස. පු: දොසෙ විගතෙ -පෙ- මොහෙ විගතෙ -පෙ- කිලෙසෙ විගතෙ වත්තබ්බං: නික්කිලෙසො'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: අඤ්ඤාණෙ විගතෙ ඤාණවිප්පයුත්තෙ චිත්තෙ වත්තමානෙ වත්තබ්බං: ඤාණී'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

5. ප. පු: අඤ්ඤාණෙ විගතෙ ඤාණවිප්පයුත්තෙ චිත්තෙ වත්තමානෙ වත්තබ්බං: ඤාණී'ති.

ස. පටිඤ්ඤා: ආමන්තා.

ප. අනු: අතීතෙන ඤාණෙන ඤාණී, නිරුද්ධෙන විගතෙන පටිප්පස්සද්ධෙන ඤාණෙන ඤාණී'ති.

ස. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

**ඤාණකථා නිට්ඨිතා**

## 11. 2.

## ඤාණකථා.

[මාර්ගඥානයෙන් අඥානය විගත කල්හිදු චක්ෂුර්විඥානාදි වශයෙන් ඥානවිප්‍රයුක්ත චිත්තය ඇති කලැ ඒ මාර්ගචිත්තය නැත්තේ වේ ද, එහෙයින් 'ඤාණී' යයි නො කියැයුතු වෙයි යන මහාසඞ්ඝිකයන්ගේ වාද බිඳුනට 'ඤාණකථා' එයි.]

**1.** ස. පු: අඥානය විගත කලැ ඥානවිප්‍රයුක්තචිත්තය පවතිත් මැ 'ඥානී' යයි නො කියැයුතු වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: රාගය විගත කලැ 'වීතරාග' යයි නො කියැයුතු වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

**2.** ස. පු: අඥානය විගත කලැ ඥානවිප්‍රයුක්තචිත්තය පවතිත් මැ 'ඥානී' යයි නො කියැයුතු වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: ද්වේෂය විගත කලැ ... මෝහය විගත කලැ ... ක්ලේශ විගත කලැ 'නිෂ්ක්ලේශ' යයි නො කියැ-යුතු වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

**3.** ස. පු: රාගය විගත වත් මැ 'වීතරාග' යයි කියැයුතු වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: අඥානය විගත වත් මැ ඥානවිප්‍රයුක්තචිත්තය ඇති කලැ 'ඥානී' යයි කියැයුතු වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

**4.** ස. පු: ද්වේෂය විගත වත් මැ ... මෝහය විගත වත් මැ ... ක්ලේශ විගත වත් මැ 'නිෂ්ක්ලේශ' යයි කියැයුතු වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: අඥානය විගත වත් මැ ඥානවිප්‍රයුක්තචිත්තය ඇති කලැ 'ඥානී' යයි කියැයුතු වේ ද?

ප. පටි. එසේ නො කියැයුතු යැ ...

**5.** ප. පු: අඥානය විගත වත් මැ ඥානවිප්‍රයුක්තචිත්තය ඇති කලැ 'ඥානී' යයි කියැයුතු වේ ද?

ස. පටිඤ්ඤා: එසේ යැ.

ප. අනු: අතීත වූ ඥානයෙන් 'ඥානී' වේ ද? නිරුද්ධ වූ විගත වූ සන්හිඳීගිය ඥානයෙන් 'ඥානී' වේ ද?

ස. පටි: එසේ නො කියැයුතු යැ ...

ඤාණකථා නිමි.

11. 3.

## ඤාණං චිත්තවිප්පයුත්තන්තිකථා.

1. ස. පු: ඤාණං චිත්තවිප්පයුත්තන්ති.
ප. පටිඤ්ඤා: ආමන්තා.
ස. අනු: රූපං නිබ්බානං.
ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

2. ස. පු: ඤාණං චිත්තවිප්පයුත්තන්ති.
ප. පටිඤ්ඤා: ආමන්තා.
ස. අනු: පඤ්ඤා පඤ්ඤින්ද්‍රියං පඤ්ඤාබලං සම්මාදිට්ඨි ධම්මවිචයසම්බොජ්ඣඞ්ගො චිත්තවිප්පයුත්තො'ති.
ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

3. ස. පු: පඤ්ඤා පඤ්ඤින්ද්‍රියං පඤ්ඤාබලං සම්මාදිට්ඨි ධම්මවිචයසම්බොජ්ඣඞ්ගො චිත්තසම්පයුත්තො'ති.
ප. පටිඤ්ඤා: ආමන්තා.
ස. අනු: ඤාණං චිත්තසම්පයුත්තන්ති.
ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

4. ස. පු: ඤාණං චිත්තවිප්පයුත්තන්ති.
ප. පටිඤ්ඤා: ආමන්තා.
ස. අනු: කතමක්ඛන්ධපරියාපන්නන්ති.
ප. පි: සඞ්ඛාරක්ඛන්ධපරියාපන්නන්ති.
ස. අනු: සඞ්ඛාරක්ඛන්ධො චිත්තවිප්පයුත්තො'ති.
ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

5. ස. පු: සඞ්ඛාරක්ඛන්ධො චිත්තවිප්පයුත්තො'ති.
ප. පටිඤ්ඤා: ආමන්තා.
ස. අනු: වෙදනාක්ඛන්ධො, සඤ්ඤාක්ඛන්ධො චිත්තවිප්පයුත්තො'ති.
ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

## 11. 3.

## ඤාණං චිත්තවිප්පයුත්තන්තිකථා.

[චක්ඛුර්විඥානාදියෙන් සමන්විත අහිත් තමන් ලැබූ මාර්ගඥානය නිසා 'ඥානී'යයි කියනුලැබුව ද ඔබගේ ඒ මාර්ගඥානය ඒ චිත්තය හා සම්ප්‍රයුක්ත නො වනුයෙන් ඥානය චිත්තවිප්‍රයුක්ත ය'යි ලබ්ධි ගත් පූර්වශෛලීය නිකායවාසීන්ගේ වාද බඳුනට 'ඤාණං චිත්තවිප්පයුත්තන්ති' කථා එයි.]

1. ස. පු: ඥානය චිත්තවිප්‍රයුක්ත වේ ද?

ප. පටිඤ්ඤ: එසේ යැ.

ස. අනු: රූපය වේ ද, නිර්වාණය වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

2. ස. පු: ඥානය චිත්තවිප්‍රයුක්ත වේ ද?

ප. පටිඤ්ඤ: එසේ යැ.

ස. අනු: ප්‍රඥා, ප්‍රඥෙන්ද්‍රිය, ප්‍රඥාබල, සම්‍යග්දෘෂ්ටි, ධර්මවිචය-සම්බොධ්‍යඞ්ග චිත්තවිප්‍රයුක්ත වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

3. ස. පු: ප්‍රඥා, ප්‍රඥෙන්ද්‍රිය, ප්‍රඥාබල, සම්‍යග්දෘෂ්ටි, ධර්මවිචය-සම්බොධ්‍යඞ්ග චිත්තසම්ප්‍රයුක්ත වේ ද?

ප. පටිඤ්ඤ: එසේ යැ.

ස. අනු: ඥානය චිත්තසම්ප්‍රයුක්ත වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

4. ස. පු: ඥානය චිත්තවිප්‍රයුක්ත වේ ද?

ප. පටිඤ්ඤ: එසේ යැ.

ස. අනු: කවර ස්කන්ධයෙකැ ඇතුළත් වේ ද?

ප. වි: සංස්කාරස්කන්ධයෙහි ඇතුළත් වෙයි.

ස. අනු. සංස්කාරස්කන්ධය චිත්තවිප්‍රයුක්ත වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

5. ස. පු: සංස්කාරස්කන්ධය චිත්තවිප්‍රයුක්ත වේ ද?

ප. පටිඤ්ඤ: එසේ යැ.

ස. අනු: වෙදනාස්කන්ධ සංඥාස්කන්ධ චිත්තවිප්‍රයුක්ත වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

**6.** ස. පු: ඤාණං සඞ්ඛාරක්ඛන්ධපරියාපන්නං චිත්තවිප්පයුත්තන්ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: පඤ්ඤා සඞ්ඛාරක්ඛන්ධපරියාපන්නා චිත්තවිප්පයුත්තා'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

**7.** ස. පු: පඤ්ඤා සඞ්ඛාරක්ඛන්ධපරියාපන්නා චිත්තවිප්පයුත්තා'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: ඤාණං සඞ්ඛාරක්ඛන්ධපරියාපන්නං චිත්තසම්පයුත්තන්ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

**8.** ස. පු: ඤාණං සඞ්ඛාරක්ඛන්ධපරියාපන්නං චිත්තවිප්පයුත්තං, පඤ්ඤා සඞ්ඛාරක්ඛන්ධපරියාපන්නා චිත්තසම්පයුත්තා'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: සඞ්ඛාරක්ඛන්ධො එකදෙසො චිත්තසම්පයුත්තො, එකදෙසො චිත්තවිප්පයුත්තො'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

**9.** ස. පු: සඞ්ඛාරක්ඛන්ධො එකදෙසො චිත්තසම්පයුත්තො එකදෙසො චිත්තවිප්පයුත්තො'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: වෙදනාක්ඛන්ධො, සඤ්ඤාක්ඛන්ධො එකදෙසො චිත්තසම්පයුත්තො එකදෙසො චිත්තවිප්පයුත්තො'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

**10.** ප. පු: න වත්තබ්බං ඤාණං චිත්තවිප්පයුත්ත'න්ති.

ස. පටිඤ්ඤා: ආමන්තා.

ප. අනු: "අරහා චක්ඛුවිඤ්ඤාණසමඞ්ගී ඤාණී'ති වත්තබ්බො"ති.

ස. පටිඤ්ඤා: ආමන්තා.

ප. අනු: ඤාණං තෙන චිත්තෙන සම්පයුත්ත'න්ති.

ස. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

ප. පා: තෙන හි ඤාණං චිත්තවිප්පයුත්තන්ති.

6. ස. පු: ඥානය සංස්කාරස්කන්ධපර්‍යාපන්න වූයේ චිත්ත-විප්‍රයුක්ත වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: ප්‍රඥ සංස්කාරස්කන්ධපර්‍යාපන්න වූවා චිත්තවිප්‍ර-යුක්ත වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

7. ස. පු. ප්‍රඥ සංස්කාරස්කන්ධපර්‍යාපන්න වූවා චිත්ත-විප්‍රයුක්ත වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: ඥානය සංස්කාරස්කන්ධපර්‍යාපන්න වූයේ චිත්ත-සම්ප්‍රයුක්ත වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

8. ස. පු: ඥානය සංස්කාරස්කන්ධපර්‍යාපන්න වැ චිත්තවිප්‍ර-යුක්ත වෙයි. ප්‍රඥ සංස්කාරස්කන්ධපර්‍යාපන්න වැ චිත්තසම්ප්‍රයුක්ත වේ ද?

ප. පටි: එසේ යැ.

ස. අනු: සංස්කාරස්කන්ධය ඒකදේශ වැ චිත්තසම්ප්‍රයුක්ත වූයේ ඒකදේශ වැ චිත්තවිප්‍රයුක්ත වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ..

9. ස. පු: සංස්කාරස්කන්ධය ඒකදේශ වැ චිත්තසම්ප්‍රයුක්ත වූයේ ඒකදේශ වැ චිත්තවිප්‍රයුක්ත වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: වෙදනාස්කන්ධය සංඥස්කන්ධය ඒකදේශ වැ චිත්තසම්ප්‍රයුක්ත වූයේ ඒකදෙශ වැ චිත්තවිප්‍රයුක්ත වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

10. ප. පු: 'ඥානය චිත්තවිප්‍රයුක්ත යැ'යි නො කියැයුතු වේ ද?

ස. පටිඤ්ඤා: එසේ යැ.

ප. අනු: රහත් චක්ෂුර්විඥන සමන්‍වාගත වැ 'ඥානී' යයි කිවයුතු වේ ද?

ස. පටිඤ්ඤා: එසේ යැ.

ප. අනු: ඥානය ඒ සිතින් සම්ප්‍රයුක්ත වේ ද?

ස. පටි: එසේ නො කියැයුතු යැ ...

ප. පා: එකරුණින් 'ඥානය චිත්තවිප්‍රයුක්ත වෙයි.'

11\. ප. පු: අරහා චක්ඛුවිඤ්ඤාණසමඞ්ගී පඤ්ඤවා'ති වත්තබ්බො'ති.

ස. පටිඤ්ඤා: ආමන්තා.

ප. අනු: පඤ්ඤා තෙන චිත්තෙන සම්පයුත්තා'ති.

ස. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

ප. පා: තෙන හි පඤ්ඤා චිත්තවිප්පයුත්තා'ති.

**ඤාණං චිත්තවිප්පයුත්තන්ති කථා නිට්ඨිතා.**

| | | |
|---|---|---|
| 11 | ප. පු: | රහත් චක්ෂුර්විඥානසමඞ්ගාගත වූයේ ප්‍රඥාවත් යැයි කියැයුතු වේ ද? |
| | ස. පටිඤ්ඤා: | එසේ යැ. |
| | ප. අනු: | ප්‍රඥාව ඒ චිත්තයෙන් සම්ප්‍රයුක්ත වේ ද? |
| | ස. පටි: | එසේ නො කියැයුතු යැ ... |
| | ප. පා. | එකරුණින් ප්‍රඥාව චිත්තවිප්‍රයුක්ත වෙයි. |

**ඤාණං චිත්තවිප්පයුත්තන්ති කථා නිමි**

## 11. 4

# ඉදං දුක්ඛන්තිකථා.

**1.** ස. පු: ඉදං දුක්ඛන්ති වාචං භාසතො 'ඉදං දුක්ඛ'න්ති ඤාණං පවත්තතී'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා:

ස. අනු: අයං සමුදයො'ති[1] වාචං භාසතො 'අයං සමුදයො'ති ඤාණං පවත්තතී'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

**2.** ස පු: ඉදං දුක්ඛන්ති වාචං භාසතො 'ඉදං දුක්ඛ'න්ති ඤාණං පවත්තතී'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: අයං නිරොධො'ති[2] වාචං භසතො 'අයං නිරොධො'ති[2] ඤාණං පවත්තතී'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

**3.** ස. පු: ඉදං දුක්ඛන්ති වාචං භාසතො 'ඉදං දුක්ඛ'න්ති ඤාණං පවත්තතී'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු. අයං මග්ගො'ති වාචං භාසතො 'අයං මග්ගො'ති ඤාණං පවත්තතී'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

**4.** ස. පු: අයං සමුදයො'ති වාචං භාසතො න ච 'අයං සමුදයො'ති ඤාණං පවත්තතී'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: ඉදං දුක්ඛන්ති වාචං භාසතො න ච 'ඉදං දුක්ඛ'න්ති ඤාණං පවත්තතී'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

**5.** ස. පු: අයං නිරොධො'ති[1] වාචං භාසතො න ච 'අයං නිරොධො'ති ඤාණං පවත්තතී'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: ඉදං දුක්ඛන්ති වාචං භාසතො න ච 'ඉදං දුක්ඛ'න්ති ඤාණං පවත්තතී'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

---

1. දුක්ඛසමුදයොති - සීමු, මජසං 2. දුක්ඛනිරොධොති - සීමු, මජසං.

1, අයං නිරොධොති අයං මග්ගො'ති - මජසං.

## 11. 4.

# ඉද දුක්ඛන්තිකථා

[යෝගාවචර ලෝකෝත්තරමාර්ගක්ෂණයෙහි දී 'මේ දුක්ඛ'යි බස් බෙණෙයි. එයින් බහුම 'මේ දුක්ඛ'යි ඥානය ඇත යන ලබ්ධි ගත් අන්ධකයන්ගේ වාද බිඳුනම 'ඉදං දුක්ඛන්ති කථා' එයි.]

1. ස. පු: 'මේ දුක්ඛ'යි බස් බණන යොගාවචරයාහට 'මේ දුක්ඛ'යි ඥානය ඇද්ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: 'මේ සමුදය යැ'යි බස් බණන යොගාවචරයාහට 'මේ සමුදය යැ'යි ඥානය ඇද්ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

2. ස. පු: 'මේ දුක්ඛ'යි බස් බණන යොගාවචරයාහට 'මේ දුක්ඛ'යි ඥානය ඇද්ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: 'මේ නිරොධ යැ'යි බස් බණන යොගාවචරයාහට 'මේ නිරොධ යැ'යි ඥානය ඇද්ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

3. ස. පු: 'මේ දුක්ඛ'යි බස් බණන යෝගාවචරයාහට 'මේ දුක්ඛ'යි ඥානය ඇද්ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: 'මේ මාර්ග යැ'යි බස් බණන යෝගාවචරයාහට 'මේ මාර්ග යැ'යි ඥානය ඇද්ද?

ප. පටි; එසේ නො කියැයුතු යැ ...

4. ස. පු: 'මේ සමුදය යැ'යි බස් බණන යෝගාවචරයාහට 'මේ සමුදය නො වෙති'යි ඥානය ඇද්ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: 'මේ දුක්ඛ'යි බස් බණන යෝගාවචරයාහට 'මේ දුඃඛ නො වෙති'යි ඥානය ඇද්ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

5. ස. පු: 'මේ නිරොධ යැ'යි බස් බණනුවහට 'මේ නිරොධ නො වෙති'යි ඥානය පවත්නේ වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: 'මේ දුක්ඛ'යි බස් බණනුවහට 'මේ දුක් නො වෙති'යි ඥානය පවත්නේ වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

6. ස. පු: අයං මග්ගොති වාචං භාසතො න ච 'අයං මග්ගො'ති ඤාණං පවත්තතී'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: ඉදං දුක්ඛන්ති වාචං භාසතො 'ඉදං දුක්ඛ'න්ති ඤාණං පවත්තතී'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

7. ස. පු: ඉදං දුක්ඛන්ති වාචං භාසතො 'ඉදං දුක්ඛ'න්ති ඤාණං පවත්තතී'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: රූපං අනිච්චන්ති වාචං භාසතො 'රූපං අනිච්ච'න්ති ඤාණං පවත්තතී'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

8. ස. පු: ඉදං දුක්ඛන්ති වාචං භාසතො 'ඉදං දුක්ඛ'න්ති ඤාණං පවත්තතී'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: වෙදනා -පෙ- සඤ්ඤා -පෙ- සඞ්ඛාරා -පෙ- විඤ්ඤාණං අනිච්චන්ති වාචං භාසතො 'විඤ්ඤාණං අනිච්ච'න්ති ඤාණං පවත්තතී'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

9. ස. පු: ඉදං දුක්ඛන්ති වාචං භාසතො 'ඉදං දුක්ඛ'න්ති ඤාණං පවත්තතී'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: රූපං අනත්තා'ති වාචං භාසතො 'රූපං අනත්තා'ති ඤාණං පවත්තතී'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

10. ස. පු: ඉදං දුක්ඛන්ති වාචං භාසතො 'ඉදං දුක්ඛ'න්ති ඤාණං පවත්තතී'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: වෙදනා -පෙ- සඤ්ඤා -පෙ- සඞ්ඛාරා -පෙ- විඤ්ඤාණං අනත්තා'ති වාචං භාසතො 'විඤ්ඤාණං අනත්තා'ති ඤාණං පවත්තතී'ති

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

6. ස. පු: 'මේ මාර්ගී යෑ' යි බස් බණනුවහට 'මේ මාර්ගී නො වෙති'යි ඥානය පවත්නේ වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යෑ.

ස. අනු: 'මේ දුක්ඛැ'යි බස් බණනුවහට 'මේ දුක්ඛැ'යි ඥානය පවත්නේ වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යෑ ...

7. ස. පු: 'මේ දුක්ඛැ'යි බස් බණනුවහට 'මේ දුක්ඛැ'යි ඥානය පවත්නේ වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යෑ.

ස. අනු: 'රූපය අනිත්‍ය යෑ'යි බස් බණනුවහට 'රූපය අනිත්‍ය යෑ'යි ඥානය පවත්නේ වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යෑ ...

8. ස. පු: 'මේ දුක්ඛැ'යි බස් බණනුවහට 'මේ දුක්ඛැ'යි ඥානය පවත්නේ වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යෑ

ස. අනු: 'වේදනා ... සංඥා ... සංස්කාරයෝ ... විඥානය අනිත්‍ය යෑ'යි බස් බණනුවහට 'විඥානය අනිත්‍ය යෑ'යි ඥානය පවත්නේ වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යෑ ...

9. ස. පු: 'මේ දුක්ඛැ'යි බස් බණනුවහට 'මේ දුක්ඛැ'යි ඥානය පවත්නේ වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යෑ.

ස. අනු: 'රූපය අනාත්ම යෑ'යි බස් බණනුවහට 'රූපය අනාත්ම යෑ'යි ඥානය පවත්නේ වේ ද?

ප පටි: එසේ නො කියැයුතු යෑ ...

10. ස. පු: 'මේ දුක්ඛැ'යි බස් බණනුවහට 'මේ දුක්ඛැ'යි ඥානය පවත්නේ වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යෑ.

ස. අනු: 'වේදනා ... සංඥා ... සංස්කාරයෝ ... විඥානය අනාත්ම යෑ'යි බස් බණනුවහට 'විඥානය අනාත්ම යෑ'යි ඥානය පවත්නේ වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යෑ ...

**11.** ස. පු: රූපං අනිච්චන්ති වාචං භාසතො ‘න ච රූපං අනිච්චන්ති’ ඤාණං පවත්තතී’ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: ඉදං දුක්ඛන්ති වාචං භාසතො ‘න ච ඉදං දුක්ඛ’න්ති ඤාණං පවත්තතී’ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ –පෙ–

**12.** ස. පු: වෙදනා –පෙ– සඤ්ඤා –පෙ– සඞ්ඛාරා –පෙ– විඤ්ඤාණං අනිච්චන්ති වාචං භාසතො ‘න ච විඤ්ඤාණං අනිච්චන්ති’ ඤාණං පවත්තතී’ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: ඉදං දුක්ඛන්ති වාචං භාසතො ‘න ච ඉදං දුක්ඛන්ති’ ඤාණං පවත්තතී’ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ –පෙ–

**13.** ස. පු: රූපං අනත්තා’ති වාචං භාසතො ‘න ච රූපං අනත්තා’ති’ ඤාණං පවත්තතී’ති.

ප. පටිඤ්ඤා. ආමන්තා.

ස. අනු: ඉදං දුක්ඛන්ති වාචං භාසතො ‘න ච ඉදං දුක්ඛන්ති’ ඤාණං පවත්තතී’ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ –පෙ–

**14.** ස. පු: වෙදනා –පෙ– සඤ්ඤා –පෙ– සඞ්ඛාරා –පෙ– විඤ්ඤාණං අනත්තා’ති වාචං භාසතො න ච විඤ්ඤාණං අනත්තා’ති’ ඤාණං පවත්තතී’ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: ඉදං දුක්ඛන්ති වාචං භාසතො න ච ඉදං දුක්ඛන්ති ඤාණං පවත්තතී’ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ –පෙ–

**15.** ස. පු: ඉදං දුක්ඛන්ති වාචං භාසතො ඉදං දුක්ඛන්ති ඤාණං පවත්තතී’ති

ප. පටිඤ්ඤා: ආමන්තා

ස. අනු: ‘ඉ’ ඉති ච[1] ‘දං’ ඉති ච ‘දු’ ඉති ච[2] ‘ඛං’ ඉති ච[3] ඤාණං පවත්තතී’ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ –පෙ–

ඉදං දුක්ඛන්ති කථා නිට්ඨිතා.

---

1. ඊති ච - සභ, PTS, ඉතී, ච - සීමු, මජසං.
2. දුති ච - සභා, PTS
3. ඛන්ති, ච - සීමු.

**11.** ස. පු: 'රූපය අනිත්‍ය යැ'යි බස් බණනුවහට 'රූපය අනිත්‍ය නො වෙති'යි ඥනය පවත්නේ වේ ද?

ප. පටිඤ්ඤකයා: එසේ යැ.

ස. අනු: 'මේ දුක'යි බස් බණනුවහට 'මේ දුක් නො වෙති'යි ඥනය පවත්නේ වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

**12.** ස. පු: 'වේදනා ... සංඥා ... සංස්කාරයෝ ... විඥනය අනිත්‍ය යැ'යි බස් බණනුවහට 'විඥනය අනිත්‍ය නො වෙති'යි ඥනය පවත්නේ වේ ද?

ප. පටිඤ්ඤකයා: එසේ යැ.

ස. අනු: 'මේ දුක'යි බස් බණනුවහට 'මේ දුක් නො වෙති'යි ඥනය පවත්නේ වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

**13.** ස. පු: 'රූපය අනාත්ම යැ'යි බස් බණනුවහට 'රූපය අනාත්ම නො වෙති'යි ඥනය පවත්නේ වේ ද?

ප. පටිඤ්ඤකයා: එසේ යැ.

ස. අනු: 'මේ දුක'යි බස් බණනුවහට 'මේ දුක් නො වෙති'යි ඥනය පවත්නේ වේ ද?

ප. පටි: එසේ නොකියැයුතු යැ ...

**14.** ස. පු: 'වේදනා ... සංඥා ... සංස්කාරයෝ ... විඥනය අනාත්ම යැ'යි බස් බණනුවහට 'විඥනය අනාත්ම නො වෙති'යි ඥනය පවත්නේ වේ ද?

ප. පටිඤ්ඤකයා: එසේ යැ,

ස. අනු: 'මේ දුක'යි බස් බණනුවහට 'මේ දුක් නො වෙති'යි ඥනය පවත්නේ වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

**15** ස. පු: 'මේ දුක'යි බස් බණනුවහට 'මේ දුක'යි ඥනය පවත්නේ වේ ද?

ප. පටිඤ්ඤකයා: එසේ යැ.

ස. අනු: 'ඉ' යයි ද, 'දං' යයි ද, 'දු' යයි ද, 'ඛං' යයි දැයි ඥනය පවත්නේ වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

**ඉදං දුක්ඛන්ති කථා නිමි.**

## 11. 5

# ඉද්ධිබලකථා

1. ස. පු: ඉද්ධිබලෙන සමන්නාගතො කප්පං තිට්ඨෙය්‍යාති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: ඉද්ධිමයිකො සො ආයු, ඉද්ධිමයිකා සා ගති, ඉද්ධිමයිකො සො අත්තභාවපටිලාභො'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

2. ස. පු: ඉද්ධිබලෙන සමන්නාගතො කප්පං තිට්ඨෙය්‍යාති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: අතීතං කප්පං තිට්ඨෙය්‍ය, අනාගතං කප්පං තිට්ඨෙය්‍යා'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

3. ස. පු: ඉද්ධිබලෙන සමන්නාගතො කප්පං තිට්ඨෙය්‍යා'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: ද්වෙ කප්පෙ තිට්ඨෙය්‍ය, තයො කප්පෙ තිට්ඨෙය්‍ය, චත්තාරො කප්පෙ තිට්ඨෙය්‍යා'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

4. ස. පු: ඉද්ධිබලෙන සමන්නාගතො කප්පං තිට්ඨෙය්‍යා'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: සති ජීවිතෙ ජීවිතාවසෙසෙ තිට්ඨෙය්‍ය, අසති ජීවිතෙ ජීවිතාවසෙසෙ තිට්ඨෙය්‍යා'ති.

ප. පටිඤ්ඤා: සති ජීවිතෙ ජීවිතාවසෙසෙ තිට්ඨෙය්‍යා'ති.

අනු: ඨ: හඤ්චි සති ජීවිතෙ ජීවිතාවසෙසෙ තිට්ඨෙය්‍ය,

අනු. පා: නො ච වත රෙ වත්තබ්බෙ "ඉද්ධිබලෙන සමන්නාගතො කප්පං තිට්ඨෙය්‍යා"ති.

අසති ජීවිතෙ ජීවිතාවසෙසෙ තිට්ඨෙය්‍ය,[1] මතො තිට්ඨෙය්‍ය, කාලං කතො තිට්ඨෙය්‍යා'ති [2]

---

1. තිට්ඨෙය්‍යා'ති - සිමු, මජසං, PTS, සයා
2. න හෙවං වත්තබ්බෙ - සිමු, මජසං, PTS, සයා, අභිසං

## 11. 5.

# ඉද්ධිබලකථා

[සෘද්ධිපාදභාවනානෘශංසයාගේ අනීය නුනුවණින් ශෙන සෘද්ධි-බලයෙන් සමන්‍ථාගත වූයේ කපක් සිටුනේ යෑ යි මහාසඞ්ඝික නිකාය වංසින් සෙයින් ලබ්ධි ගත්තවුන්ගේ වාද බිඳුනට ඉද්ධිබලකථා එයි.]

1. ස. පු: සෘද්ධිබලයෙන් සමන්‍ථාගත වූයේ (මහ) කපක් සිටුනේ වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: ඒ ආයු සෘද්ධිමය වේ ද, ඒ ගති සෘද්ධිමය වේ ද, ඒ ආත්මභාවප්‍රතිලාභ සෘද්ධිමය වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ..

2. ස. පු: සෘද්ධිබලයෙන් සමන්‍ථාගත වූයේ කපක් සිටුනේ වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ

ස. අනු: අතීත කල්පයක් සිටුනේ ද, අනාගත කල්පයක් සිටුනේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

3. ස. පු: සෘද්ධිබලයෙන් සමන්‍ථාගත වූයේ කපක් සිටුනේ වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: දෙකපක් සිටුනේ වේ ද, තුන්කපක් සිටුනේ වේ ද, සතරකපක් සිටුනේ වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

4. ස. පු: සෘද්ධිබලයෙන් සමන්‍ථාගත වූයේ කපක් සිටුනේ වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: ජීවිතය ඇති කල්හි ජීවිතාවශේෂයෙහි සිටුනේ ද, ජීවිතය නැති කල්හි ජීවිතාවශේෂයෙහි සිටුනේ ද?

ප. පටිඤ්ඤා: ජීවිතය ඇති කල්හි ජීවිතාවශේෂයෙහි සිටුනේ යැ.

අනු. ඨ: ඉදින් දිවි ඇති කල්හි ජීවිතාවශේෂයෙහි සිටුනේ නම්,

අනු. පා: භවත 'සෘද්ධිබලයෙන් සමන්‍ථාගත වූයේ කපක් සිටුනේ යැ'යි නො කියැයුතු මැ යැ.

දිවි නැති කල්හි ජීවිතාවශේෂයෙහි සිටුනේ නම්, මළේ සිටුනේ යැ, කළුරිය කෙළේ සිටුනේ යි.

5. ස. පු: ඉද්ධිබලෙන සමන්නාගතො කප්පං තිට්ඨෙය්‍යා'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: උප්පන්නො ඵස්සො මා නිරුජ්ඣී'ති ලබ්භා ඉද්ධියා පග්ගහෙතුන්ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

ස. අනු: උප්පන්නා වෙදනා -පෙ- උප්පන්නා සඤ්ඤා -පෙ- උප්පන්නා චෙතනා -පෙ- උප්පන්නං චිත්තං -පෙ- උප්පන්නා සද්ධා -පෙ- උප්පන්නං විරියං -පෙ- උප්පන්නා සති -පෙ- උප්පන්නො සමාධි, -පෙ- උප්පන්නා පඤ්ඤා මා නිරුජ්ඣී'ති ලබ්භා ඉද්ධියා පග්ගහෙතුන්ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

6. ස. පු: ඉද්ධිබලෙන සමන්නාගතො කප්පං තිට්ඨෙය්‍යා'ති

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: රූපං නිච්චං හොතූ'ති ලබ්භා ඉද්ධියා පග්ගහෙතුන්ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

ස. අනු: වෙදනා -පෙ- සඤ්ඤා -පෙ- සඞ්ඛාරා -පෙ- විඤ්ඤාණං නිච්චං හොතූ'ති ලබ්භා ඉද්ධියා පග්ගහෙතුන්ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

7. ස. පු: ඉද්ධිබලෙන සමන්නාගතො කප්පං තිට්ඨෙය්‍යා'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: ජාතිධම්මා සත්තා මා ජායිංසූ'ති ලබ්භා ඉද්ධියා පග්ගහෙතුන්ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

ස. අනු: ජරාධම්මා සත්තා මා ජීයිංසූ'ති[1] -පෙ- ව්‍යාධිධම්මා සත්තා මා ව්‍යාධියිංසූ'ති -පෙ- මරණධම්මා සත්තා මා මීයිංසූ'ති ලබ්භා ඉද්ධියා පග්ගහෙතුන්ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

---

1. ජිරිංසූ'ති - මජසං, PTS.

5. ස. පු: සෘද්ධිබලයෙන් සමන්‍වාගත වූයේ කපක් සිටුනේ වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: උපන් ස්පර්ශය 'නගමක් නිරුද්ධ වේවා'යි සෘද්ධියෙන් ප්‍රග්‍රහ කරන්නට (අල්ලා නවතා ගන්නට) හැකි වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

ස. අනු: උපන් වේදනා... උපන් සංඥා උපන් චේතනා... උපන් සිත.. උපන් ශ්‍රද්ධා... උපන් වීර්‍ය්‍යය.. උපන් ස්මෘතිය ... උපන් සමාධිය ... උපන් ප්‍රඥාව නගමක් නිරුද්ධ වේවයි සෘද්ධියෙන් ප්‍රග්‍රහ කරන්නට (අල්ලාගන්නට) ලැබේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

6. ස. පු: සෘද්ධිබලයෙන් සමන්‍වාගත වූයේ කපක් සිටුනේ වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: 'රූපය නිත්‍ය වේවා'යි සෘද්ධියෙන් ප්‍රග්‍රහ කරන්-නට (අනිත්‍යබව නවතා ලන්නට) ලැබේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

ස. අනු: 'වේදනා ... සංඥා...සංස්කාරයෝ... විඥානය නිත්‍ය වේවා'යි සෘද්ධියෙන් ප්‍රග්‍රහ කරන්නට ලැබේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

7. ස. පු: සෘද්ධිබලයෙන් සමන්‍වාගත වූයේ කපක් සිටුනේ වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: 'ජාතිස්වභාවය ඇති සත්ත්වයෝ නගමක් උපදිත්-වා'යි සෘද්ධිබලයෙන් ප්‍රග්‍රහ කරන්නට ලැබේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

ස. අනු: 'ජරාස්වභාව ඇති සත්ත්වයෝ නගමක් දිරත්වා'යි... 'ව්‍යාධිස්වභාව ඇති සත්ත්වයෝ නගමක් ව්‍යාධිත වෙත්වයි ... මරණස්වභාව ඇති සත්ත්වයෝ නගමක් මියෙත්වා'යි සෘද්ධිබලයෙන් ප්‍රග්‍රහ කරන්නට ලැබේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

8. ප. පු: න වත්තබ්බං ඉද්ධිබලෙන සමන්නාගතො කප්පං තිට්ඨෙය්‍යා'ති.

ස. පටිඤ්ඤා: ආමන්තා.

ප. අනු: නනු වුත්තං භගවතා "යස්ස කස්සචි ආනන්ද චත්තාරො ඉද්ධිපාදා භාවිතා බහුලීකතා යානීකතා වත්ථුකතා අනුට්ඨිතා පරිචිතා සුසමාරද්ධා සො ආකඞ්ඛමානො[1] කප්පං වා තිට්ඨෙය්‍ය කප්පාවසෙසං වා"ති[a] අත්ථෙව සුත්තන්තො'ති.

ස. පටිඤ්ඤා: ආමන්තා.

ප. ආ: තෙන හි ඉද්ධිබලෙන සමන්නාගතො කප්පං තිට්ඨෙය්‍යා'ති.

9. ස. පු: ඉද්ධිබලෙන සමන්නාගතො කප්පං තිට්ඨෙය්‍යා'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: නනු වුත්තං භගවතා "චතුන්නං භික්ඛවෙ ධම්මානං නත්ථි කොචි පාටිභොගො සමණො වා බ්‍රාහ්මණො වා දෙවො වා මාරො වා බ්‍රහ්මා වා කොචි වා ලොකස්මිං. කතමෙසං චතුන්නං: ජරාධම්මො මා ජීරී'ති නත්ථි කොචි පාටිභොගො සමණො වා බ්‍රාහ්මණො වා දෙවො වා මාරො වා බ්‍රහ්මා වා කොචි වා ලොකස්මිං. ව්‍යාධිධම්මො මා ව්‍යාධියී'ති -පෙ- මරණධම්මො මා මීයී'ති -පෙ- යානි ඛො පන තානි පුබ්බෙ කතානි පාපකානි කම්මානි සංකිලෙසිකානි පොනොභවිකානි[2] සදරානි[3] දුක්ඛවිපාකානි ආයතිං ජාති ජරා මරණියානි, තෙසං විපාකො මා නිබ්බත්තී'ති නත්ථි කොචි පාටිභොගො සමණො වා බ්‍රාහ්මණො වා දෙවො වා මාරො වා බ්‍රහ්මා වා කොචි වා ලොකස්මිං. ඉමෙසං ඛො භික්ඛවෙ චතුන්නං ධම්මානං නත්ථි කොචි පාටිභොගො සමණො වා බ්‍රාහ්මණො වා දෙවො වා මාරො වා බ්‍රහ්මා වා කොචි වා ලොකස්මි"න්ති[b] අත්ථෙ'ව සුත්තන්තො'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. ආ: තෙන හි න වත්තබ්බං 'ඉද්ධිබලෙන සමන්නාගතො කප්පං තිට්ඨෙය්‍යා'ති.

ඉද්ධිබලකථා නිට්ඨිතා.

---

1 අකඞ්ඛමානො සො ආනන්ද - PTS

a. දීඝනිකාය-මහාපරිනිබ්බානසුත්ත, ඉද්ධිපාදසංයුත්ත-චාපාලවග්ග - චෙතියසුත්ත, උදානපාළි.

2. පොනොබ්භවිකානි - මජසං.

3. සදරානි - මජසං

චතුක්කඞ්ගුත්තර - පාටිභොගසුත්ත

8. ප. පු: 'ඍද්ධිබලයෙන් සමන්නාගත වූයේ කපක් සිටුනේ යැ'යි නො කියැයුතු වේ ද?

ස. පටිඤ්ඤා: එසේ යැ.

ප. අනු: භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරන ලද මැ නු: "ආනන්දය, යම් කිසිවක්හු විසින් සතර ඍද්ධි-පාදයෝ භාවිත වෙත් ද, බහුලීකෘත වෙත් ද, යෙදූ යානයක් මෙන් කරන ලද වෙත් ද, ප්‍රතිෂ්ඨා කරන ලද වෙත් ද, අධිෂ්ඨිත වෙත්ද, පරිචිත වෙත්ද, මනා-කොට ප්‍රගුණ කරන ලද වෙත් ද, හේ කැමැතියේ කල්පයක් හෝ කල්පාවශෙෂයක් හෝ සිටුනේ යැ"යි වදාළ සූත්‍රාන්තයෙක් ඇත්තේ මැ නු?

ස. පටිඤ්ඤා: එසේ යැ.

ප. ආ: එකරුණින් ඍද්ධිබලයෙන් සමන්නාගත වූයේ කපක් සිටුනේ යැ.

9. ස පු: ඍද්ධිබලයෙන් සමන්නාගත වූයේ කපක් සිටුනේ වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරන ලද මැ නු: "මහණෙනි, සතරධර්ම කෙනකුන්ට-ශ්‍රමණ වේවයි බ්‍රාහ්මණ වේවයි දෙව වේවයි මාර වේවයි බ්‍රහ්ම වේවයි ලෝකයෙහි අනෙකෙක් වේවයි ඇපවන කිසිවෙක් නැත. කවර සතර දෙනකුනට යත්: 'ජරාස්වභාව ඇතියේ නහමක් දිරාව'යි කියා මහණ හෝ බමුණු හෝ දෙව් හෝ මර හෝ බඹ හෝ ලොව අන් කිසිවෙක් හෝ ඇපවන කිසිවෙක් නැත 'ව්‍යාධිස්වභාව ඇතියේ නහමක් ව්‍යාධිත වේව'යි ... 'මරණස්වභාව ඇතියේ නහමක් මියේව'යි ... සංක්ලේශයට හිත වූ පුනර්භවයට වැටෙන නිස්සාර දුඃඛවිපාක ඇති අනාගතයෙහි ජාති ජරා මරණයට හිත පෙර කළ යම් පාපකර්මයෝ ඇද්ද, උන්ගේ විපාක නහමක් උපදීව'යි කියා ශ්‍රමණ හෝ බ්‍රාහ්මණ හෝ දේව හෝ මාර හෝ බ්‍රහ්ම හෝ ලෝකයෙහි අන් කිසිවෙක් හෝ ඇපවන කිසිවෙක් නැත. මහණෙනි, මේ සතර ධර්මයනට ඇපවන ශ්‍රමණ හෝ යැ බ්‍රාහ්මණ හෝ යැ දේව හෝ යැ මාර හෝ යැ බ්‍රහ්ම හෝ යැ ලෝකයෙහි අන් කිසිවෙක් හෝ නැති"යි වදාළ සූත්‍රාන්තයෙක් ඇත්තේ මැ නු?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. ආ: එකරුණින් ඍද්ධිබලයෙන් සමන්නාගත වූයේ කපක් සිටුනේ යයි නො කියැයුතු යැ.

ඍද්ධිබලකථා නිමි

## 11. 6.

# සමාධිකථා

1. ස. පු: චිත්තසන්තති සමාධී'ති.
ප. පටිඤ්ඤා: ආමන්තා.
ස. අනු: අතීතා චිත්තසන්තති සමාධී'ති.
ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

2. ස. පු: චිත්තසන්තති සමාධී'ති.
ප. පටිඤ්ඤා: ආමන්තා.
ස. අනු: අනාගතා චිත්තසන්තති සමාධී'ති.
ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

3. ස. පු: චිත්තසන්තති සමාධී'ති.
ප. පටිඤ්ඤා: ආමන්තා.[1]
ස. අනු: නනු අතීතං නිරුද්ධං අනාගතං අජාතන්ති.
ප. පටිඤ්ඤා: ආමන්තා.
අනු. ඨ: හඤ්චි අතීතං නිරුද්ධං අනාගතං අජාතං,
අනු. පා: නො ච වත රෙ වත්තබ්බෙ: "චිත්තසන්තති සමාධී"ති.

4. ප. පු: එකචිත්තක්ඛණිකො සමාධී'ති.
ස. පටිඤ්ඤා: ආමන්තා.
ප. අනු: චක්ඛුවිඤ්ඤාණසමඞ්ගී සමාපන්නො'ති.
ස. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-
ප. අනු: සොතවිඤ්ඤාණසමඞ්ගී -පෙ- ඝානවිඤ්ඤාණසමඞ්ගී -පෙ- ජිව්හාවිඤ්ඤාණසමඞ්ගී -පෙ- කායවිඤ්ඤාණසමඞ්ගී -පෙ- අකුසලචිත්තසමඞ්ගී -පෙ- රාගසහගතං -පෙ- දොසසහගතං -පෙ- මොහසහගතං -පෙ- අනොත්තප්ප සහගතං චිත්තසමඞ්ගී සමාපන්නො'ති.
ස. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

1 චිත්තසන්තති -පෙ- ආමන්තා- PTS. ඌනං

## 11. 6.

## සමාධිකථා.

**[එකචිත්තක්ෂණයෙහි උපන් ඒකාග්‍රතාව සමාධානාර්ථයෙන් ‘සමාධි වෙති’යි නො ගෙන චිත්තසන්තතිය සමාධි නම්’යි ලබ්ධි ගත් සර්වාස්තිවාද උත්තරාපථක නිකායවාසීන් ගේ ලබ්ධි බිඳුනට සමාධිකථා එයි.]**

**1.** ස. පු: චිත්තසන්තති සමාධි වේ ද?

ප. පටික්ඛෙප: එසේ යැ.

ස. අනු: අතීත චිත්තසන්තති සමාධි වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

**2.** ස. පු: චිත්තසන්තති සමාධි වේ ද?

ප. පටික්ඛෙප: එසේ යැ.

ස. අනු: අනාගත චිත්තසන්තති සමාධි වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

**3.** ස. පු: චිත්තසන්තති සමාධි වේ ද?

ප. පටික්ඛෙප: එසේ යැ.

ස. අනු: අතීතය නිරුද්ධ වූයේ අනාගතය නූපන්නේ නො?

ප. පටික්ඛෙප: එසේ යැ.

අනු. ඨ: ඉදින් අතීතය නිරුද්ධ වී නම් අනාගතය නූපන්නේ වී නම්,

අනු. පා: භවත "චිත්තසන්තති සමාධි වේ" යයි නො කියැයුතු මැ යැ.

**4.** ප. පු: සමාධි එකචිත්තක්ෂණික වේ ද?

ස. පටික්ඛෙප: එසේ යැ.

ප. අනු: චක්ෂුර්විඥානසමඞ්ගී වූයේ සමාපන්න (සමාහිත) වේ ද?

ස. පටි: එසේ නො කියැයුතු යැ ...

ප. අනු: ශ්‍රෝත්‍රවිඥානසමඞ්ගි වූයේ ... ඝ්‍රාණවිඥානසමඞ්ගී වූයේ . ජිහ්වාවිඥානසමඞ්ගී වූයේ ... කාය විඥාන සමඞ්ගී වූයේ අකුසලචිත්තසමඞ්ගී වූයේ ... රාග- සහගත ... ද්වේෂසහගත මොහසහගත ... අනපත්‍රපාසහගත චිත්තසමඞ්ගී වූයේ සමාපන්න වේ ද?

ස. පටි: එසේ නො කියැයුතු යැ ...

5. ස. පු: චිත්තසන්තති සමාධී'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: අකුසලචිත්තසන්තති සමාධී'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

ස. අනු: රාගසහගතා -පෙ- දොසසහගතා -පෙ- මොහසහගතා -පෙ- අනොත්තප්පසහගතා චිත්තසන්තති සමාධී'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

6. ප. පු: න වත්තබ්බං 'චිත්තසන්තති සමාධී'ති.

ස. පටිඤ්ඤා: ආමන්තා.

ප. අනු: නනු වුත්තං භගවතා: "අහං ඛො ආවුසො නිගණ්ඨා[1] පහොමි අනිඤ්ජමානො[2] කායෙන, අභාසමානො වාචං, සත්ත රත්තින්දිවානි එකන්තසුඛපටිසංවෙදී විහරිතු"න්ති[a] අත්ථෙ'ව සුත්තන්තො'ති.

ස. පටිඤ්ඤා: ආමන්තා.

ප. ආ: තෙන හි 'චිත්තසන්තති සමාධී'ති.

සමාධිකථා නිට්ඨිතා.

1. නිගණ්ඨ - සීමු, - PTS.
2. අනිච්චමානො - සීමු.
a. මජ්ඣිමනිකාය - චූළදුක්ඛක්ඛන්ධසුත්ත.

5. ස. පු: චිත්තසන්තති සමාධි වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: අකුශලචිත්තසන්තති සමාධි වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ..

ස. අනු: රාගසහගත ... ද්වේෂසහගත ... මෝහසහගත ... අනපත්‍රපාසහගත චිත්තසන්තති සමාධි වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

6. ප. පු: ‘චිත්තසන්තති සමාධි වෙති’යි නො කියැයුතු වේ ද?

ස. පටිඤ්ඤා: එසේ යැ.

ප. අනු: භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරන ලද මැ නු: “ඇවැත්නි නිගණ්ඨයෙනි, මම වනාහි කයින් නො සැලෙනුයෙම්, බස් නො බණනුයෙම්, සත් දවරැයක් මුළුල්ලෙහි ඒකාන්තසුඛ විඳිනුයෙම් වාස කරන්නට පොහොසත්මි”යි වදාළ සූත්‍රාන්තයෙක් ඇත්තේ මැ නු?

ස. පටිඤ්ඤා: එසේ යැ.

ප. ආ: එකරුණින් ‘චිත්තසන්තති සමාධි වෙයි.’

සමාධිකථා නිමි.

## 11. 7.

## ධම්මට්ඨිතතාකථා

1. ස. පු: ධම්මට්ඨිතතා පරිනිප්ඵන්නා'ති.
ප. පටිඤ්ඤා: ආමන්තා.
ස. අනු: තාය ඨිතතා පරිනිප්ඵන්නා'ති.
ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

2. ස. පු: තාය ඨිතතා පරිනිප්ඵන්නා'ති.
ප පටිඤ්ඤා: ආමන්තා.
ස. අනු: තාය තායෙ'ව නත්ථි දුක්ඛස්ස අන්තකිරියා, නත්ථි වට්ටුපච්ඡෙදො, නත්ථි අනුපාදා පරිනිබ්බානන්ති.
ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

3. ස. පු: රූපස්ස ඨිතතා පරිනිප්ඵන්නා'ති.
ප. පටිඤ්ඤා: ආමන්තා.
ස. අනු: තාය ඨිතතා පරිනිප්ඵන්නා'ති.
ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

4. ස. පු: තාය ඨිතතා පරිනිප්ඵන්නා'ති.
ප. පටිඤ්ඤා: ආමන්තා.
ස. අනු: තාය තායෙ'ව නත්ථි දුක්ඛස්ස අන්තකිරියා, නත්ථි වට්ටුපච්ඡෙදො, නත්ථි අනුපාදා පරිනිබ්බානන්ති.
ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

5. ස. පු: වෙදනාය ඨිතතා -පෙ- සඤ්ඤාය ඨිතතා -පෙ- සඞ්ඛාරානං ඨිතතා -පෙ- විඤ්ඤාණස්ස ඨිතතා පරිනිප්ඵන්නා'ති.
ප. පටිඤ්ඤා: ආමන්තා.
ස. අනු: තාය ඨිතතා පරිනිප්ඵන්නා'ති.
ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

6. ස. පු: තාය ඨිතතා පරිනිප්ඵන්නා'ති.
ප. පටිඤ්ඤා: ආමන්තා.
ස. අනු: තාය තායෙ'ව නත්ථි දුක්ඛස්ස අන්තකිරියා, නත්ථි වට්ටුපච්ඡෙදො, නත්ථි අනුපාදා පරිනිබ්බානන්ති.
ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

**ධම්මට්ඨිතතාකථා නිට්ඨිතා.**

## 11. 7.

# ධම්මට්ඨිතතාකථා

["ඨිතාව සා ධාතු" යන වචනය නිසා ප්‍රතීත්‍යසමුත්පාද සඞ්ඛ්‍යාත ධර්මස්ථිතතාව ද අවිද්‍යාදිය මෙන් පරිනිෂ්පන්න වේ යි ලබ්ධි ගත් අන්ධකනිකායවාසීන්ගේ වාද බිඳුනට ධර්මස්ථිතතාකථා එයි]

1. ස. පු: ධර්මස්ථිතතාව පරිනිෂ්පන්න (හෙතුසමුත්පන්න) වේ ද?
ප. පටිඤ්ඤා: එසේ යැ.
ස. අනු: ඒ පරිනිෂ්පන්න ස්ථිතතාවට (අවිද්‍යාදිය හැර තදන්‍ය) පරිනිෂ්පන්නස්ථිතතායෙක් ඇද්ද?
ප. පටි: එසේ නො කියැයුතු යැ ...

2. ස. පු: (තොප කියන) ඒ ස්ථිතතාවට තදන්‍ය පරිනිෂ්පන්න ස්ථිතතායෙක් ඇද්ද?
ප. පටිඤ්ඤා: එසේ යැ.
ස. අනු: ඒ ඒ හේතුපරිනිෂ්පන්නස්ථිතතායෙන් මැ (මෙසේ හෙතුපරම්පරාව නො සිඳෙන කල්හි) දුඃඛයාගේ අන්තකිරියාවෙක් නැද්ද, වට සිඳීමෙක් නැද්ද, අනුපාද පරිනිර්වාණයෙක් නැද්ද?
ප. පටි: එසේ නො කියැයුතු යැ ...

3 ස. පු: රූපයාගේ ස්ථිතතාව පරිනිෂ්පන්න ද?
ප. පටිඤ්ඤා: එසේ යැ.
ස. අනු: ඒ ස්ථිතතාවට පරිනිෂ්පන්න ස්ථිතතායෙක් ඇද්ද?
ප. පටි: එසේ නො කියැයුතු යැ ...

4. ස. පු: ඒ ස්ථිතතාවට පරිනිෂ්පන්න ස්ථිතතාවෙක් ඇද්ද?
ප. පටිඤ්ඤා: එසේ යැ.
ස. අනු: ඒ ඒ පරිනිෂ්පස්ථිතතායෙන් මැ දුඃඛයාගේ අන්ත-කිරියායෙක් නැද්ද, වට සිඳීමෙක් නැද්ද, අනුපාද පරිනිර්වාණයෙක් නැද්ද?
ප. පටි: එසේ නො කියැයුතු යැ ...

5. ස. පු: වේදනාවට පරිනිෂ්පන්න ස්ථිතතායෙක්... සංඥාවට පරිනිෂ්පන්න ස්ථිතතායෙක් .. සංස්කාරයනට පරිනිෂ්පන්න ස්ථිතායෙක්.. විඥානයට පරිනිෂ්පන්න ස්ථිතතායෙක් ඇද්ද?
ප. පටිඤ්ඤා: එසේ යැ.
ස. අනු: එයට පරිනිෂ්පන්න ස්ථිතතා ඇද්ද?
ප. පටි: එසේ නො කියැයුතු යැ ...

6. ස. පු: එයට පරිනිෂ්පන්නස්ථිතතායෙක් ඇද්ද?
ප. පටිඤ්ඤා: එසේ යැ.
ස. අනු: එයින් එයින් මැ දුඃඛයාගේ අන්තකිරියායෙක් නැද්ද, වට සිඳීමෙක් නැද්ද, අනුපාද පරිනිර්වාණ-යෙක් නැද්ද?
ප. පටි: එසේ නො කියැයුතු යැ ...

ධම්මට්ඨිතතාකථා නිමි.

## 11. 8.

# අනිච්චතා කථා

1. ස. පු: අනිච්චතා පරිනිප්ඵන්නා'ති.
ප. පටිඤ්ඤා: ආමන්තා.
ස. අනු: තාය අනිච්චතාය අනිච්චතා පරිනිප්ඵන්නා'ති.
ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

2. ස. පු: තාය අනිච්චතාය තාය අනිච්චතා පරිනිප්ඵන්නා'ති.
ප. පටිඤ්ඤා: ආමන්තා.
ස. අනු: තාය තායෙ'ව නත්ථි දුක්ඛස්ස අන්තකිරියා නත්ථි වට්ටූපච්ඡෙදො, නත්ථි අනුපාදා පරිනිබ්බානන්ති.
ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

3. ස. පු: ජරා පරිනිප්ඵන්නා'ති.
ප. පටිඤ්ඤා: ආමන්තා.
ස. අනු: තාය ජරාය ජරා පරිනිප්ඵන්නා'ති.
ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

4. ස. පු: තාය ජරාය ජරා පරිනිප්ඵන්නා'ති.
ප. පටිඤ්ඤා: ආමන්තා.
ස. අනු: තාය තායෙ'ව නත්ථි දුක්ඛස්ස අන්තකිරියා, නත්ථි වට්ටූපච්ඡෙදො, නත්ථි අනුපාදා පරිනිබ්බානන්ති.
ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

5. ස. පු: මරණං පරිනිප්ඵන්නන්ති.
ප. පටිඤ්ඤා: ආමන්තා.
ස. අනු: තස්ස මරණස්ස මරණං පරිනිප්ඵන්නන්ති.
ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

6. ස. පු: තස්ස මරණස්ස මරණං පරිනිප්ඵන්නන්ති.
ප. පටිඤ්ඤා: ආමන්තා.
ස. අනු: තස්ස තස්සෙව නත්ථි දුක්ඛස්ස අන්තකිරියා, නත්ථි වට්ටූපච්ඡෙදො, නත්ථි අනුපාදා පරිනිබ්බානන්ති.
ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

## 11. 8

# අනිච්චතාකථා

[අනිත්‍ය වූ රූපාදීන්ගේ අනිත්‍යතා ද රූපාදීන් සෙයින් පරිනිෂ්පන්නය'යි අන්ධකනිකායවාසීන් සෙයින් ලබ්ධි ඇති අන්‍යවාදීන්ගේ වාද බිඳුනම 'අනිච්චතාකථා' එයි.]

1. ස. පු: අනිත්‍යතාව පරිනිෂ්පන්න (හෙතුසමුප්පන්න) වේද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: ඒ අනිත්‍යතාවට තදන්‍ය පරිනිෂ්පන්න අනිත්‍යතා ඇද්ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

2 ස පු: ඒ අනිත්‍යතාවට ද තදන්‍ය අනිත්‍යතාවට ද පරිනිෂ්පන්න අනිත්‍යතා ඇද්ද?

ප. පටිඤ්ඤා. එසේ යැ.

ස. අනු: ඒ ඒ (පරිනිෂ්පන්න) අනිත්‍යතායෙහි මැ දුඃඛයාගේ අන්තකිරියායෙක් නැද්ද, වට සිඳිමෙක් නැද්ද, අනුපාදපරිනිර්‍වාණයෙක් නැද්ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ..

3. ස. පු: ජරාව පරිනිෂ්පන්න වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: ඒ ජරාවට තදන්‍ය පරිනිෂ්පන්න ජරා ඇද්ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

4. ස. පු: ඒ ජරාවට තදන්‍ය පරිනිෂ්පන්න ජරා ඇද්ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: එසින් එසින් මැ දුඃඛයාගේ අන්තකිරියායෙක් නැද්ද, වට සිඳිමෙක් නැද්ද, අනුපාද පරිනිර්‍වාණයෙක් නැද්ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ

5. ස. පු: මරණය පරිනිෂ්පන්න වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: ඒ මරණයට තදන්‍ය පරිනිෂ්පන්න මරණ ඇද්ද?

ප පටි: එසේ නො කියැයුතු යැ ...

6. ස. පු: ඒ මරණයට තදන්‍ය පරිනිෂ්පන්න මරණ ඇද්ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: එසින් එසින් මැ දුඃඛයාගේ අන්තකිරියායෙක් නැද්ද වට සිඳිමෙක් නැද්ද, අනුපාද පරිනිර්‍වාණයෙක් නැද්ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

7. ස. පු: රූපං පරිනිප්ඵන්නං. රූපස්ස අනිච්චතා අත්ථී'ති.
ප. පටිඤ්ඤා: ආමන්තා.
ස. අනු: අනිච්චතා පරිනිප්ඵන්නා. අනිච්චතාය අනිච්චතා අත්ථී'ති.
ප. පටි: න හේවං වත්තබ්බේ -පෙ-

8. ස. පු: රූපං පරිනිප්ඵන්නං. රූපස්ස ජරා අත්ථී'ති.
ප. පටිඤ්ඤා: ආමන්තා.
ස. අනු: ජරා පරිනිප්ඵන්නා, ජරාය ජරා අත්ථී'ති.
ප. පටි: න හේවං වත්තබ්බේ -පෙ-

9. ස. පු: රූපං පරිනිප්ඵන්නං. රූපස්ස භෙදො අත්ථි, අන්තරධානං අත්ථී'ති.
ප. පටිඤ්ඤා: ආමන්තා.
ස. අනු: මරණං පරිනිප්ඵන්නං. මරණස්ස භෙදො අත්ථි, අන්තරධානං අත්ථී'ති.
ප. පටි: න හේවං වත්තබ්බේ -පෙ-

10. ස. පු: වේදනා -පෙ- සඤ්ඤා -පෙ- සඞ්ඛාරා -පෙ- විඤ්ඤාණං පරිනිප්ඵන්නං. විඤ්ඤාණස්ස අනිච්චතා අත්ථී'ති.
ප. පටිඤ්ඤා. ආමන්තා.
ස. අනු: අනිච්චතා පරිනිප්ඵන්නා. අනිච්චතාය අනිච්චතා අත්ථී'ති.
ප. පටි: න හේවං වත්තබ්බේ -පෙ-

11. ස. පු: විඤ්ඤාණං පරිනිප්ඵන්නං. විඤ්ඤාණස්ස ජරා අත්ථී'ති.
ප. පටිඤ්ඤා: ආමන්තා.
ස. අනු. ජරා පරිනිප්ඵන්නා. ජරාය ජරා අත්ථී'ති.
ප. පටි: න හේවං වත්තබ්බේ -පෙ-

12. ස. පු: විඤ්ඤාණං පරිනිප්ඵන්නං. විඤ්ඤාණස්ස භෙදො අත්ථි, අන්තරධානං අත්ථී'ති.
ප. පටිඤ්ඤා: ආමන්තා.
ස. අනු: මරණං පරිනිප්ඵන්නං. මරණස්ස භෙදො අත්ථි, අන්තරධානං අත්ථී'ති.
ප. පටි: න හේවං වත්තබ්බේ -පෙ-

අනිච්චතාකථා නිට්ඨිතා.

එකාදසමො වග්ගො නිට්ඨිතො.

තස්ස උද්දානං

අනුසයා අබ්‍යාකතා අහෙතුකා චිත්තවිප්පයුත්තා
ඤාණෙ විගතෙ ඤාණී ඤාණං චිත්තවිප්පයුත්තං
යත්ථ සද්දෙ ඤාණං පවත්තති
ඉද්ධිබලෙන සමන්නාගතො කප්පං තිට්ඨෙය්‍ය
චිත්තසන්තති සමාධි ධම්මට්ඨිතතා අනිච්චතා'ති.

7. ස. පු. රූපය පරිනිෂ්පන්න වෙයි. රූපයට අනිත්‍යතා ඇද්ද?
ප. පටිඤ්ඤා: එසේ යැ.
ස. අනු: අනිත්‍යතා පරිනිෂ්පන්න වෙයි. අනිත්‍යතාවට අනිත්‍යතා ඇද්ද?
ප. පටි: එසේ නො කියැයුතු යැ ...

8. ස. පු. රූපය පරිනිෂ්පන්න යැ. රූපයට ජරා ඇද්ද?
ප. පටිඤ්ඤා: එසේ යැ.
ස. අනු: ජරාව පරිනිෂ්පන්න වෙයි. ජරාවට ජරා ඇද්ද?
ප. පටි: එසේ නො කියැයුතු යැ ...

9. ස. පු: රූපය පරිනිෂ්පන්න වෙයි. රූපයාගේ බිඳීමෙක් ඇද්ද, අතුරුදහනෙක් ඇද්ද?
ප. පටිඤ්ඤා: එසේ යැ.
ස. අනු: මරණය පරිනිෂ්පන්න වෙයි. මරණයට බිඳීමෙක් ඇද්ද, අතුරුදහනෙක් ඇදද?
ප. පටි: එසේ නො කියැයුතු යැ ...

10. ස. පු: වේදනා ... සංඥා ... සංස්කාර ... විඥාන පරිනිෂ්පන්න වෙයි. විඥානයට අනිත්‍යතා ඇද්ද?
ප. පටිඤ්ඤා: එසේ යැ.
ස. අනු. අනිත්‍යතාව පරිනිෂ්පන්න වෙයි. අනිත්‍යතාවට අනිත්‍යතා ඇද්ද?
ප. පටි: එසේ නො කියැයුතු යැ ...

11. ස. පු: විඥානය පරිනිෂ්පන්න යැ. විඥානයට ජරා ඇද්ද?
ප: පටිඤ්ඤා. එසේ යැ.
ස. අනු. ජරාව පරිනිෂ්පන්න යැ. ජරාවට ජරා ඇද්ද?
ප. පටි: එසේ නො කියැයුතු යැ ...

12. ස. පු: විඥානය පරිනිෂ්පන්න යැ. විඥානයාගේ බිඳීමෙක් ඇද්ද, අතුරුදහනෙක් ඇද්ද?
ප. පටිඤ්ඤා: එසේ යැ.
ස. අනු: මරණය පරිනිෂ්පන්න වෙයි. මරණයට බිඳීමෙක් ඇද්ද, අතුරුදහනෙක් ඇද්ද?
ප. පටි: එසේ නො කියැයුතු යැ ...

**අනිච්චතාකථා නිමි.**

**එකොළොස් වන වග නිමි.**

**එහි උද්දානය:**

අනුසයකථා යැ, ඤාණකථා යැ, ඤාණං චිත්තවිප්පයුත්තන්තිකථා යැ, ඉදං දුක්ඛන්තිකථා යැ, ඉද්ධිබලකථා යැ, සමාධිකථා යැ, ධම්මට්ඨිතතා කථා යැ, අනිච්චකථා යි.

# ද්වාදසමො වග්ගො

## 12. 1.

## සංවරො කම්මන්තිකථා

1\. ස. පු: සංවරො කම්මන්ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: චක්ඛුන්ද්‍රියසංවරො චක්ඛුකම්මන්ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

ස. අනු: සොතින්ද්‍රියසංවරො -පෙ- ඝානින්ද්‍රියසංවරො -පෙ- ජිව්හින්ද්‍රියසංවරො -පෙ- කායින්ද්‍රියසංවරො කායකම්මන්ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

2\. ස. පු: කායින්ද්‍රියසංවරො කායකම්මන්ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: චක්ඛුන්ද්‍රියසංවරො චක්ඛුකම්මන්ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

3\. ස. පු. කායින්ද්‍රියසංවරො කායකම්මන්ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: සොතින්ද්‍රියසංවරො -පෙ- ඝානින්ද්‍රියසංවරො -පෙ- ජිව්හින්ද්‍රියසංවරො ජිව්හාකම්මන්ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

ස. අනු: මනින්ද්‍රියසංවරො මනොකම්මන්ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

4\. ස. පු: මනින්ද්‍රියසංවරො මනොකම්මන්ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: චක්ඛුන්ද්‍රියසංවරො චක්ඛුකම්මන්ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

## ද්වාදශ වර්ගය

### 12. 1.

### සංවරෝ කම්මන්තිකථා

**["චක්ඛුනා රූපං දිස්වා නිමිත්තග්ගාහී හොති, න නිමිත්තග්ගාහී හොති" යන සූත්‍ර වරදවා ගෙන 'සංවරයත් අසංවරයත් කර්ම වෙති' යි මහාසඞ්ඝික නිකායවාසීන් සෙයින් ලබ්ධි ගත්තවුන්ගේ වාද බිඳුනට සංවරෝ කම්මන්තිකථා එයි.]**

1. ස. පු: සංවරය කර්ම වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: චක්ඛුරින්ද්‍රියසංවරය චක්ෂුඃකර්ම වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

ස. අනු: ශ්‍රොත්‍රෙන්ද්‍රියසංවරය ... ඝ්‍රාණෙන්ද්‍රියසංවරය ... ජිහ්වෙන්ද්‍රියසංවරය .. කායෙන්ද්‍රියසංවරය කාය-කර්ම වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

2. ස. පු: කායෙන්ද්‍රියසංවරය කායකර්ම වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: චක්ඛුරින්ද්‍රියසංවරය චක්ෂුඃකර්ම වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ..

3. ස. පු. කායෙන්ද්‍රියසංවරය කායකර්ම වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: ශ්‍රොත්‍රෙන්ද්‍රියසංවරය ... ඝ්‍රාණෙන්ද්‍රියසංවරය ... ජිහ්වෙන්ද්‍රියසංවරය ජිහ්වාකර්ම වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

ස. අනු: මනින්ද්‍රියසංවරය මනඃකර්ම වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

4. ස. පු: මනින්ද්‍රියසංවරය මනඃකර්ම වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: චක්ඛුරින්ද්‍රියසංවරය චක්ෂුඃකර්ම වේ ද?

ප පටි: එසේ නො කියැයුතු යැ ...

5\. ස. පු: මනින්ද්‍රියසංවරො මනොකම්මන්ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: සොතින්ද්‍රියසංවරො -පෙ- ඝානින්ද්‍රියසංවරො -පෙ- ජිව්හින්ද්‍රියසංවරො -පෙ- කායින්ද්‍රියසංවරො කායකම්මන්ති.

ප. පටි. න හෙවං වත්තබ්බෙ -පෙ-

6\. ස. පු. අසංවරො කම්මන්ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: චක්ඛුන්ද්‍රියඅසංවරො චක්ඛුකම්මන්ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

ස. අනු: සොතින්ද්‍රියඅසංවරො -පෙ- ඝානින්ද්‍රියඅසංවරො -පෙ- ජිව්හින්ද්‍රියඅසංවරො -පෙ- කායින්ද්‍රියඅසංවරො කායකම්මන්ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

7\. ස. පු. කායින්ද්‍රියඅසංවරො කායකම්මන්ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: චක්ඛුන්ද්‍රියඅසංවරො චක්ඛුකම්මන්ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

8\. ස. පු: කායින්ද්‍රියඅසංවරො කායකම්මන්ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: සොතින්ද්‍රියඅසංවරො -පෙ- ඝානින්ද්‍රියඅසංවරො -පෙ- ජිව්හින්ද්‍රියඅසංවරො ජිව්හාකම්මන්ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

ස. අනු: මනින්ද්‍රියඅසංවරො මනොකම්මන්ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

9\. ස. පු: මනින්ද්‍රියඅසංවරො මනොකම්මන්ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: චක්ඛුන්ද්‍රියඅසංවරො චක්ඛුකම්මන්ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

5. ස. පු: මනින්ද්‍රියසංවරය මනඃකම් වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: ශ්‍රොත්‍රෙන්ද්‍රියසංවරය ... ඝ්‍රාණෙන්ද්‍රියසංවරය ... ජිහ්වෙන්ද්‍රියසංවරය ... කායෙන්ද්‍රියසංවරය කායකම් වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

6. ස. පු: අසංවරය කම් වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: චක්ෂුරින්ද්‍රියඅසංවරය චක්ෂුඃකම් වේ ද?

ප පටි: එසේ නො කියැයුතු යැ ...

ස. අනු: ශ්‍රොත්‍රෙන්ද්‍රියඅසංවරය ... ඝ්‍රාණෙන්ද්‍රියඅසංවරය ... ජිහ්වෙන්ද්‍රියඅසංවරය ... කායෙන්ද්‍රියඅසංවරය කායකම් වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

7. ස. පු: කායෙන්ද්‍රියඅසංවරය කායකම් වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: චක්ෂුරින්ද්‍රියඅසංවරය චක්ෂුඃකම් වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

8. ස. පු: කායෙන්ද්‍රියඅසංවරය කායකම් වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: ශ්‍රොත්‍රෙන්ද්‍රියඅසංවරය ... ඝ්‍රාණෙන්ද්‍රියඅසංවරය .. ජිහ්වෙන්ද්‍රියඅසංවරය ජිහ්වාකම් වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

ස. අනු: මනින්ද්‍රියඅසංවරය මනඃකම් වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

9. ස. පු: මනින්ද්‍රියඅසංවරය මනඃකම් වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: චක්ෂුරින්ද්‍රියඅසංවරය චක්ෂුඃකම් වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

10. ස. පු: චක්ඛින්ද්‍රිය අසංවරො මනොකම්මන්ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: සොතින්ද්‍රිය අසංවරො -පෙ- ඝානින්ද්‍රිය අසංවරො -පෙ- ජිව්හින්ද්‍රියඅසංවරො -පෙ- කායින්ද්‍රියඅසංවරො කායකම්මන්ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

11. ප. පු: න වත්තබ්බං සංවරො'පි අසංවරො'පි කම්මන්ති.

ස. පටිඤ්ඤා: ආමන්තා.

ප. අනු: නනු වුත්තං භගවතා: "ඉධ භික්ඛවෙ භික්ඛු චක්ඛුනා රූපං දිස්වා නිමිත්තග්ගාහී හොති -පෙ- න නිමිත්තග්ගාහී හොති. සොතෙන සද්දං සුත්වා -පෙ- මනසා ධම්මං විඤ්ඤාය නිමිත්තග්ගාහී හොති -පෙ- න නිමිත්තග්ගාහී හොති"ති[a] අත්ථෙව සුත්තන්තො'ති.

ස. පටිඤ්ඤා: ආමන්තා.

ප. අා: තෙන හි "සංවරො'පි අසංවරො'පි කම්මන්ති.

සංවරො කම්මන්තිකථා නිට්ඨිතා.

a මජ්ඣිමනිකාය, මූලපණ්ණාසක - මහාගොපාලකසුත්ත.

10\. ස. පු: මනින්ද්‍රිය අසංවරය මනඃකර්ම වේ ද?

ප. පටික්ඛෙප: එසේ යැ.

ස. අනු: ශ්‍රොත්‍රෙන්ද්‍රිය අසංවරය ... ඝ්‍රාණෙන්ද්‍රිය අසංවරය .. ජිහ්වෙන්ද්‍රිය අසංවරය ... කායෙන්ද්‍රිය අසංවරය කායකර්ම වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

11\. ප. පු: "සංවරයත් අසංවරයත් කර්ම වෙති'යි නො කියැයුතු වේ ද?

ස. පටික්ඛෙප: එසේ යැ.

ප. අනු: භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරනලද මැ නු: "මහණෙනි, මෙසස්නෙහි මහණ ඇසින් රූපයක් දැක නිමිති ගන්නේ වෙයි ... නිමිති නො ගන්නේ වෙයි. කනින් ශබ්දයක් අසා ... මනසින් ධර්මාලම්බනයක් දැන නිමිති ගන්නේ වෙයි ... නිමිති නො ගන්නේ වේ"යයි වදාළ සූත්‍රාන්තයෙක් ඇත්තේ මැ නු?

ස. පටික්ඛෙප: එසේ යැ.

ප. ආ: එකරුණින් සංවරයත් අසංවරයත් කර්ම වෙයි. (ද්වාරසංවරය-අසංවරය) මිස කර්මභාවය නො කියන හෙයින් අසාධක යි.)

සංවරො කම්මන්තිකථා නිමි.

12. 2.

## කම්මකථා.

1. ස. පු: සබ්බං කම්මං සවිපාකන්ති.
ප. පටිඤ්ඤා: ආමන්තා.
ස. අනු: සබ්බා චේතනා සවිපාකා'ති.
ප. පටි: න හේවං වත්තබ්බේ -පෙ-

2. ස. පු: සබ්බා චේතනා සවිපාකා'ති
ප. පටිඤ්ඤා: ආමන්තා.
ස. අනු: විපාකාබ්‍යාකතා චේතනා සවිපාකා'ති.
ප. පටි: න හේවං වත්තබ්බේ -පෙ-

3. ස. පු: සබ්බා චේතනා සවිපාකා'ති.
ප. පටිඤ්ඤා: ආමන්තා.
ස. අනු: කිරියාබ්‍යාකතා චේතනා සවිපාකා'ති.
ප. පටි: න හේවං වත්තබ්බේ -පෙ-

4. ස. පු: සබ්බා චේතනා සවිපාකා'ති.
ප. පටිඤ්ඤා: ආමන්තා.
ස. අනු: කාමාවචරා විපාකාබ්‍යාකතා චේතනා සවිපාකා'ති.
ප. පටි: න හේවං වත්තබ්බේ -පෙ-

5. ස. පු: සබ්බා චේතනා සවිපාකා'ති.
ප. පටිඤ්ඤා: ආමන්තා.
ස. අනු: රූපාවචරා අරූපාවචරා අපරියාපන්නා විපාකා-බ්‍යාකතා චේතනා සවිපාකා'ති.
ප. පටි: න හේවං වත්තබ්බේ -පෙ-

6. ස. පු: සබ්බා චේතනා සවිපාකා'ති.
ප. පටිඤ්ඤා: ආමන්තා.
ස. අනු: කාමාවචරා කිරියාබ්‍යාකතා චේතනා සවිපාකා'ති.
ප. පටි: න හේවං වත්තබ්බේ -පෙ-

## 12. 2.

## කම්මකථා.

**["නාහං භික්ඛවෙ සඤ්චෙතනිකානං කම්මානං කතානං" ආදි සූත්‍රපද නිසා 'හැම කර්ම සවිපාක වෙති'යි මහාසඞ්ඝික නිකායවාසීන් සෙයින් ලබධි ගත්තවුන්ගේ වාද බිඳුනට කර්මකථා එයි.]**

1. ස පු: හැම කර්ම සවිපාක වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: හැම චේතනා සවිපාක වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ... (අව්‍යාකෘත සඳහා ප්‍රතික්ෂිප්ත යි)

2. ස. පු: හැම චේතනා සවිපාක වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: විපාකඅව්‍යාකෘතචේතනා සවිපාක වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

3. ස. පු: හැම චේතනා සවිපාක වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: ක්‍රියාව්‍යාකෘතචේතනා සවිපාක වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

4. ස. පු: හැම චේතනා සවිපාක වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: කාමාවචර විපාකාව්‍යාකෘත චේතනා සවිපාක වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

5. ස. පු: හැම චේතනා සවිපාක වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: රූපාවචර අරූපාවචර අපර්‍යාපන්න විපාකාව්‍යා-කෘත චේතනා සවිපාක වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

6. ස. පු: හැම චේතනා සවිපාක වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: කාමාවචර ක්‍රියාව්‍යාකෘත චේතනා සවිපාක වේ ද?

ප. පටිඤ්ඤා: එසේ නො කියැයුතු යැ ...

7. ස. පු: සබ්බා චේතනා සවිපාකාති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: රූපාවචරා අරූපාවචරා කිරියාබ්‍යාකතා චේතනා සවිපාකාති'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ.

ස. අනු: විපාකාබ්‍යාකතා චේතනා අවිපාකා'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

අනු. ඨ: හඤ්චි විපාකාබ්‍යාකතා චේතනා අවිපාකා,

අනු. පා: නො ච වත රෙ වත්තබ්බෙ "සබ්බා චේතනා සවිපාකා"ති.

ස. අනු. කිරියාබ්‍යාකතා චේතනා අවිපාකා'ති.

ප. පටි: ආමන්තා.

අනු. ඨ: හඤ්චි කිරියාබ්‍යාකතා චේතනා අවිපාකා,

අනු. පා: නො ච වත රෙ වත්තබ්බෙ "සබ්බා චේතනා සවිපාකා"ති.

ස. අනු: කාමාවචරා රූපාවචරා අරූපාවචරා අපරියාපන්නා විපාකාබ්‍යාකතා චේතනා අවිපාකාති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

අනු. ඨ: හඤ්චි අපරියාපන්නා විපාකාබ්‍යාකතා චේතනා අවිපාකා,

අනු. පා: නො ච වත රෙ වත්තබ්බෙ "සබ්බා චේතනා සවිපාකා"ති.

ස. අනු: කාමාවචරා රූපාවචරා අරූපාවචරා කිරියාබ්‍යාකතා චේතනා අවිපාකා'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

අනු. ඨ: හඤ්චි අරූපාවචරා කිරියාබ්‍යාකතා චේතනා අවිපාකා,

අනු. පා: නො ච වත රෙ වත්තබ්බෙ "සබ්බා චේතනා සවිපාකා"ති.

7. ස. පු: හැම චේතනා සවිපාක වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ,

ස. අනු: රූපාවචර අරූපාවචර ක්‍රියාව්‍යාකෘත චේතනා සවිපාක වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ.

ස. අනු: විපාකාව්‍යාකෘත චේතනා අවිපාක වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

අනු. ඨ: ඉදින් විපාකාව්‍යාකෘත චේතනා අවිපාක වේ නම්,

අනු. පා: හවත, "හැම චේතනා සවිපාක වෙති"යි. නො කියැයුතු මැ යැ,

ස. අනු: ක්‍රියාව්‍යාකෘත චේතනා අවිපාක වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

අනු. ඨ: ඉදින් ක්‍රියාව්‍යාකෘත චේතනා අවිපාක වේ නම්,

අනු. පා: හවත "හැම චේතනා සවිපාක වෙති"යි නො කියැයුතු මැ යැ.

ස. අනු: කාමාවචර රූපාවචර අරූපාවචර අපයඨාපන්න විපාක අව්‍යාකෘත චේතනා අවිපාක වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

අනු. ඨ: ඉදින් අපයඨාපන්න විපාක අව්‍යාකෘත චේතනා අවිපාක වී නම්,

අනු. පා: හවත "හැම චේතනා සවිපාක වෙති"යි නො කියැයුතු මැ යැ.

ස. අනු: කාමාවචර රූපාවචර අරූපාවචර ක්‍රියා අව්‍යාකෘත චේතනා අවිපාක වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

අනු. ඨ: ඉදින් අරූපාවචර ක්‍රියා අව්‍යාකෘත චේතනා අවිපාක වී නම්,

අනු. පා: හවත "හැම චේතනා සවිපාක වෙති'යි නො කියැයුතු මැ යැ.

8. ප. පු: න වත්තබ්බං සබ්බං කම්මං සවිපාකන්ති.

ස. පටිඤ්ඤා: ආමන්තා.

ප. අනු: නනු වුත්තං භගවතා: "නාහං භික්ඛවෙ සඤ්චෙතනිකානං කම්මානං කතානං උපචිතානං අප්පටිසංවිදිත්වා බ්‍යන්තීභාවං වදාමි. තඤ්ච ඛො දිට්ඨෙ වා ධම්මෙ උපපජ්ජෙ වා අපරෙ වා පරියායෙ"ති[1] අත්ථෙ'ව සුත්තන්තො'ති.

ස. පටිඤ්ඤා: ආමන්තා.

ප. ආ: තෙන හි "සබ්බං කම්මං සවිපාක"න්ති.

කම්මකථා නිට්ඨිතා.

---

1. දසකඞ්ගුත්තර - පඨමසඤ්චෙතනිකසුත්ත

8\. ප. පු: 'හැම කර්ම සවිපාක වෙති'යි නො කියැයුතු වේ ද?

ස. පරිඥෙය්‍ය: එසේ යැ.

ප. අනු: භාග්‍යවතුන් විසින් වදාරනලද මැ නු: මහණෙනි, කරනලද රැස් කරනලද සඤ්චෙතනික කර්මයන්ගේ විපාක නො විඳ (ඒ කර්මයන්ගේ) විගතාන්තභාවය මම නො කියමි. එ ද මේ අත් බැව්හි හෝ දෙ වැනි අත්බැව්හි හෝ අපරපර්‍ය්‍යායෙහි හෝ වේයයි වදාළ සූත්‍රාන්තයෙක් ඇත්තේ මැ නු?

ස. පරිඥෙය්‍ය: එසේ යැ.

ප. අ: එකරුණින් 'හැම කර්ම සවිපාක වෙයි. ("නාහං භික්ඛවෙ" යනාදි සූත්‍රය ප්‍රත්‍යය ඇතිවත් මැ දෘෂ්ටධර්මාදි විපාකප්‍රතිසංවෙදනය සඳහා වදාරන ලද යැ. එහෙයින් අසාධක වෙයි.)

**කර්මකථා නිමි.**

## 12. 3.

# සද්ධා විපාකොතිකථා

1. ස. පු: සද්ධා විපාකො'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: සුඛවෙදනීයො දුක්ඛවෙදනීයො අදුක්ඛමසුඛවෙද-නීයො, සුඛාය වෙදනාය සම්පයුත්තො දුක්ඛාය වෙදනාය සම්පයුත්තො අදුක්ඛමසුඛාය වෙදනාය සම්පයුත්තො, ඵස්සෙන සම්පයුත්තො වෙදනාය සම්පයුත්තො සඤ්ඤාය සම්පයුත්තො චෙතනාය සම්පයුත්තො චිත්තෙන සම්පයුත්තො සාරම්මණො. අත්ථි තස්ස ආවට්ටනා ආභොගො සමන්නාහාරො මනසිකාරො චෙතනා පත්ථනා පණිධී'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ[1] -පෙ-

ස. අනු: නනු න සුඛවෙදනීයො න දුක්ඛවෙදනීයො -පෙ- අනාරම්මණො. නත්ථි තස්ස ආවට්ටනා -පෙ- පණිධී'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

අනු. ඨ: හඤ්චි න සුඛවෙදනීයො -පෙ- අනාරම්මණො. නත්ථි තස්ස ආවට්ටනා -පෙ- පණිධි,

අනු. පා: නො ච වත රෙ වත්තබ්බෙ 'සද්ධා විපාකො'ති.

2. ස. පු: එසො විපාකො, එසො සුඛවෙදනීයො -පෙ- සාරම්මණො. අත්ථි තස්ස ආවට්ටනා-පෙ- පණිධී'ති,

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: සද්ධා විපාකො, සද්ධා සුඛවෙදනීයො -පෙ- සාරම්මණො. අත්ථි තස්ස ආවට්ටනා -පෙ- පණිධී'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

1. ආමන්තා - PTS.

12. 3

## සද්දො විපාකොතිකථා

["සො තස්ස කම්මස්ස කතත්තා උපචිතත්තා උස්සන්නත්තා විපුලත්තා බ්‍රහ්මස්සරො හොති" ආදි සූත්‍ර කුනුවණින් ගෙන "ශබ්දය විපාක වෙති"යි මහාසාඞ්ඝිකයන් සෙයින් ලබ්ධි ගත්තවුන්ගේ වාද බිඳුනට 'සද්දො විපාකො'ති කථා එයි.]

1. ස පු: ශබ්දය විපාක වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: (ශබ්දය) සුඛවේදනීය වේ ද? දුඃඛවෙදනීය, අදුඃඛාසුඛවෙදනීය, සුඛවෙදනා හා සම්ප්‍රයුක්ත, දුඃඛවෙදනා හා සම්ප්‍රයුක්ත, අදුඃඛාසුඛවෙදනා හා සම්ප්‍රයුක්ත, ස්පර්ශය හා සම්ප්‍රයුක්ත, වේදනාව හා සම්ප්‍රයුක්ත, සංඥාව හා සම්ප්‍රයුක්ත, චේතනාව හා සම්ප්‍රයුක්ත, චිත්තය හා සම්ප්‍රයුක්ත වේ ද? සාලම්බන වේ ද? එයට ආවර්තනා ආභොග සමන්වාහාර මනස්කාර චේතනා ප්‍රාර්ථනා ප්‍රණිධි ඇද්ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

ස. අනු: සුඛවේදනීය නො වනුයේ දුඃඛවෙදනීය නො වනුයේ ... අනාලම්බන වනුයේ නො? එයට ආවර්තනා ... ප්‍රණිධි නැත්තේ මැ නො?

ප. පටිඤ්ඤා: එසේ යැ.

අනු. ඨ: ඉදින් සුඛවේදනීය නො වී නම් ... අනාලම්බන වී නම්, එයට ආවර්තනා ... ප්‍රණිධි නැත් නම්,

අනු. පා: හවත, 'ශබ්දය විපාක වෙයි'යි නො කියැයුතු මැ යැ.

2. ස. පු: ස්පර්ශය විපාක වෙයි. ස්පර්ශය සුඛවේදනීය ... සාලම්බන වේ ද? එයට ආවර්තනා ... ප්‍රණිධි ඇද්ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: (තොප මතයෙහි) ශබ්දය විපාක වෙයි. ශබ්දය සුඛවේදනීය ... සාලම්බන වේ ද? එයට ආවර්තනා ... ප්‍රණිධි ඇද්ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

3. ස. පු: සද්දො විපාකො, සද්දො න සුඛවෙදනීයො -පෙ- අනාරම්මණො. නත්ථි තස්ස ආවට්ටනා -පෙ- පණිධී'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: එසෙසො විපාකො, එසෙසො න සුඛවෙදනීයො න දුක්ඛවෙදනීයො -පෙ- අනාරම්මණො. නත්ථි තස්ස ආවට්ටනා -පෙ- පණිධී'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

4. ප. පු: න වත්තබ්බං 'සද්දො විපාකො'ති.

ස. පටිඤ්ඤා: ආමන්තා.

ප. අනු: නනු වුත්තං භගවතා: "සො තස්ස කම්මස්ස කතත්තා උපචිතත්තා උස්සන්නත්තා විපුලත්තා බ්‍රහ්මස්සරො හොති කරවීකභාණී"ති.[a] අත්ථෙව සුත්තන්තො'ති.

ස. පටිඤ්ඤා: ආමන්තා.

ප. ආ: තෙන හි 'සද්දො විපාකො'ති.

**සද්දො විපාකොතිකථා නිට්ඨිතා.**

a දීඝනිකාය - ලක්ඛණසුත්ත

| | |
|---|---|
| 3. ස. පු: | (තොප මතයෙහි) ශබ්දය විපාක වෙයි. ශබ්දය සුඛවේදනීය නො වනුයේ ... අනාලම්බන වනුයේ වේ ද? එයට ආවතීනා ... ප්‍රණිධි නැද්ද? |
| ප. පටික්ඛෙප: | එසේ යැ. |
| ස. අනු: | ස්පර්ශය විපාක වෙයි. ස්පර්ශය සුඛවේදනීය නො වනුයේ දුඃඛවේදනීය නො වනුයේ .... අනාලම්බන වනුයේ වේ ද? එයට ආවතීනා ... ප්‍රණිධි නැද්ද? |
| ප. පටි: | එසේ නො කියැයුතු යැ ... |
| 4. ප. පු: | 'ශබ්දය විපාක වේය'යි නො කියැයුතු වේ ද? |
| ස. පටික්ඛෙප: | එසේ යැ. |
| ප. අනු: | භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරනලද මැ නු? 'හේ එ කම් කල බැවින් රැස්කල බැවින් උත්සන්න බැවින් විපුල බැවින් කුරවිකෙවිල්ලනට බඳු වචන ඇතියේ බ්‍රහ්මස්වර වේ' යයි වදාල සූත්‍රාන්තයෙක් ඇත්තේ මැ නු? |
| ස. පටික්ඛෙප: | එසේ යැ. |
| ප. අා: | එ කරුණින් 'ශබ්දය විපාක' වෙයි. |

සද්දෝ විපාකෝතිකථා නිමි.

12. 4

# සළායතනකථා

1. ස. පු: චක්ඛායතනං විපාකො'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: සුඛවේදනියං දුක්ඛවේදනියං -පෙ- සාරම්මණං. අත්ථි තස්ස ආවට්ටනා -පෙ- පණිධී'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

ස. අනු: නනු න සුඛවේදනියං -පෙ- අනාරම්මණං. නත්ථි තස්ස ආවට්ටනා -පෙ- පණිධී'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

අනු. ඨ: හඤ්චි න සුඛවේදනියං -පෙ- අනාරම්මණං. නත්ථි තස්ස ආවට්ටනා -පෙ- පණිධි,

අනු. පා: නො ච වත රෙ වත්තබ්බෙ: 'චක්ඛායතනං විපාකො'ති.

2. ස. පු: එසො විපාකො, එසො සුඛවේදනියො -පෙ- සාරම්මණො. අත්ථි තස්ස ආවට්ටනා-පෙ- පණිධී'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා

ස. අනු: චක්ඛායතනං විපාකො, චක්ඛායතනං සුඛවේද- නියං-පෙ- සාරම්මණං. අත්ථි තස්ස ආවට්ටනා-පෙ- පණිධී'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

3. ස. පු: චක්ඛායතනං විපාකො, චක්ඛායතනං න සුඛවේද- නියං -පෙ- අනාරම්මණං. නත්ථි තස්ස ආවට්ටනා -පෙ- පණිධී'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: එසො විපාකො, එසො න සුඛවේදනියො -පෙ- අනාරම්මණො. නත්ථි තස්ස ආවට්ටනා -පෙ- පණිධී'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

## 12. 4.

# සළායතනකථා

[යම් හෙයෙකින් කර්‍මය කළ බැවින් ෂඩායතනය උපන්නේ වේ ද, එහෙයින් 'ෂඩායතනය විපාක වේය'යි මහාසාංඝිකයන් සෙයින් ලබ්ධි ගත්තවුන්ගේ වාදය බිඳුනට 'සළායතනකථා' එයි.]

1. ස. පු: චක්ඛුරායතනය විපාක වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: (චක්ඛුරායතනය) සුඛවේදනීය දුඃඛවේදනීය ... සාලම්බන වේ ද? එයට ආවර්ත්තනා ... ප්‍රණිධි ඇද්ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

ස. අනු: සුඛවේදනීය නො වනුයේ .. අනාලම්බන වනුයේ නො? එයට ආවර්ත්තනා ... ප්‍රණිධි නැත්තේ නො?

ප. පටිඤ්ඤා: එසේ යැ.

අනු. ඨ: ඉදින් සුඛවේදනීය නො වේ නම් ... අනාලම්බන වේ නම්, එයට ආවර්ත්තනා .. ප්‍රණිධි නැත් නම්,

අනු. පා: භවත 'චක්ඛුරායතන විපාක වේය'යි නො කියැයුතු මැ යැ.

2. ස. පු: ස්පර්‍ශය විපාක වෙයි. ස්පර්‍ශය සුඛවේදනීය ... සාලම්බන වේ ද, එයට ආවර්ත්තනා ... ප්‍රණිධි ඇද්ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: (තොප මතයෙහි) චක්ඛුරායතන විපාක වෙයි, චක්ඛුරායතනය සුඛවේදනීය වේ ද .. සාලම්බන වේ ද, එයට ආවර්ත්තනා .. ප්‍රණිධි ඇද්ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

3. ස. පු: චක්ඛුරායතනය විපාක වෙයි. චක්ඛුරායතනය සුඛවේදනීය නො වනුයේ ... අනාලම්බන වනුයේ වේ ද? එයට ආවර්ත්තනා ... ප්‍රණිධි නැද්ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: ස්පර්‍ශය විපාක වෙයි. ස්පර්‍ශය සුඛවේදනීය නො වනුයේ වේ ද, ... අනාලම්බන වේ ද? එයට ආවර්ත්තනා ... ප්‍රණිධි නැද්ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

4. ස. පු: සොතායතනං -පෙ- ඝානායතනං -පෙ- ජිව්හායතනං -පෙ- කායායතනං විපාකො'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: සුඛවෙදනියං දුක්ඛවෙදනියං -පෙ- සාරම්මණං, අත්ථි තස්ස ආවට්ටනා -පෙ- පණිධී'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

ස. අනු: නනු සුඛවෙදනියං -පෙ- අනාරම්මණං. නත්ථි තස්ස ආවට්ටනා -පෙ- පණිධී'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

අනු. ඨා: හඤ්චි න සුඛවෙදනියං -පෙ- අනාරම්මණං. නත්ථි තස්ස ආවට්ටනා -පෙ- පණිධි,

අනු. පා: නො ච වත රෙ වත්තබ්බෙ "කායායතනං විපාකො"ති.

5. ස. පු: එසෙසො විපාකො, එසෙසො සුඛවෙදනියො -පෙ- සාරම්මණො. අත්ථි තස්ස ආවට්ටනා -පෙ- පණිධී'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: කායායතනං විපාකො, කායායතනං සුඛවෙදනියං -පෙ- සාරම්මණං. අත්ථි තස්ස ආවට්ටනා -පෙ- පණිධී'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

6 ස. පු: කායායතනං විපාකො, කායායතනං න සුඛවෙදනියං -පෙ- අනාරම්මණං. නත්ථි තස්ස ආවට්ටනා -පෙ- පණිධී'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: එසෙසො විපාකො, එසෙසො න සුඛවෙදනියො -පෙ- අනාරම්මණො, නත්ථි තස්ස ආවට්ටනා -පෙ- පණිධී'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

7. ප. පු: න වත්තබ්බං සළායතනං විපාකො'ති.

ස. පටිඤ්ඤා: ආමන්තා.

ප. අනු: නනු සළායතනං කම්මස්ස කතත්තා උප්පන්නන්ති.

ස. පටිඤ්ඤා: ආමන්තා.

අනු. ඨා: හඤ්චි සළායතනං කම්මස්ස කතත්තා උප්පන්නං,

අනු. පා: තෙන වත රෙ වත්තබ්බෙ "සළායතනං විපකො"ති.

**සළායතන කථා නිට්ඨිතා.**

| | |
|---|---|
| 4. ස. පු: | ශ්‍රොත්‍රායතනය ... ඝ්‍රාණායතනය ... ජිහ්වායතනය ... කායායතනය විපාක වේ ද? |
| ප. පටිඤ්ඤා: | එසේ යැ. |
| ස. අනු: | (කායායතනය) සුඛවේදනීය දුඃඛවේදනීය ... සාලම්බන වේ ද, එයට ආවර්ජනා ... ප්‍රණිධි ඇද්ද? |
| ප. පටි: | එසේ නො කියැයුතු යැ ... |
| ස. අනු: | සුඛවේදනීය නො ... අනාලම්බන නො, එයට ආවර්ජනා ... ප්‍රණිධි නැත් නු? |
| ප. පටිඤ්ඤා: | එසේ යැ. |
| අනු. ඨ: | ඉදින් සුඛවේදනීය නො වී නම් .. අනාලම්බන වී නම්, එයට අවර්ජනා . . ප්‍රණිධි නැත් නම්, |
| අනු. පා: | භවත 'කායායතන විපාක වේය'යි නො කියැයුතු මැ යැ. |
| 5. ස. පු: | ස්පර්ශය විපාක වෙයි. ස්පර්ශය සුඛවේදනීය වේ ද ... සාලම්බන වේ ද, එයට ආවර්ජනා ... ප්‍රණිධි ඇද්ද? |
| ප. පටිඤ්ඤා: | එසේ යැ. |
| ස. අනු: | (තොප මතයෙහි) කායායතනය විපාක වෙයි, කායායතනය සුඛවේදනීය වේ ද, සාලම්බන වේ ද? එයට ආවර්ජනා ... ප්‍රණිධි ඇද්ද? |
| ප. පටි: | එසේ නො කියැයුතු යැ ... |
| 6. ස. පු: | (තොප මතයෙහි) කායායතනය විපාක වෙයි, කායායතනය සුඛවේදනීය නො වේ ද ... අනාලම්බන වේ ද, එයට ආවර්ජනා ... ප්‍රණිධි නැද්ද? |
| ප. පටිඤ්ඤා: | එසේ යැ. |
| ස. අනු: | ස්පර්ශය විපාක වෙයි. ස්පර්ශය සුඛවේදනීය නො වේ ද, ... අනාලම්බන වේ ද, එයට ආවර්ජනා ... ප්‍රණිධි නැද්ද? |
| ප. පටි: | එසේ නො කියැයුතු යැ ... |
| 7. ප. පු: | 'සළායතනය විපාක වේය'යි නො කියැයුතු වේ ද? |
| ස. පටිඤ්ඤා: | එසේ යැ. |
| ප. අනු: | සළායතනය කර්මය කළ බැවින් උපන්නේ නො? |
| ස. පටිඤ්ඤා: | එසේ යැ. |
| අනු. ඨ: | ඉදින් සළායතනය කර්මය කළ බැවින් උපන්නේ වී නම්, |
| අනු. පා: | භවත එකරුණින් "සළායතනය විපාක වේය"යි කියැයුතු මැ යැ. (මනායතනය විපාක වෙයි. සෙස්ස හුදෙක් කම්මසමුට්ඨානය විපාක නො වේ. එයින් අසාධකයි. |

සළායතනකථා නිමි.

12. 5.

## සත්තක්ඛත්තුපරමකථා

1. ස. පු: සත්තක්ඛත්තුපරමො පුග්ගලො සත්තක්ඛත්තුපරමතා නියතො'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු. මාතා ජීවිතා වොරොපිතා, පිතා ජීවිතා වොරොපිතො, අරහා ජීවිතා වොරොපිතො, දුට්ඨෙන චිත්තෙන තථාගතස්ස ලොහිතං උප්පාදිතං, සඞ්ඝො භින්නො'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

2. ස. පු: සත්තක්ඛත්තුපරමො පුග්ගලො සත්තක්ඛත්තුපරමතානියතො'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: අභබ්බො අන්තරා ධම්මං අභිසමෙතුන්ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

3. ස. පු: අභබ්බො අන්තරා ධම්මං අභිසමෙතුන්ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු. මාතා ජීවිතා වොරොපිතා, පිතා ජීවිතා වොරොපිතො, අරහා ජීවිතා වොරොපිතො, දුට්ඨෙන චිත්තෙන තථාගතස්ස ලොහිතං උප්පාදිතං, සඞ්ඝො භින්නො'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

4. ස. පු: සත්තක්ඛත්තුපරමො පුග්ගලො සත්තක්ඛත්තුපරමතානියතො'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: අත්ථි සො නියාමො යෙන නියාමෙන[1] සත්තක්ඛත්තුපරමො පුග්ගලො සත්තක්ඛත්තුපරමතානියතො'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

---

1 අත්ථි සො නියමො යෙන නියමෙන - සිමු.
අත්ථි සො නියමො යෙන නියමෙන - මජසං

## 12. 5.

# සත්තක්ඛත්තුපරමකථා

['සත්තක්ඛත්තුපරම' යනු නුනුවණින් ගෙන සත්තක්ඛත්තුපරම සෝතාපන්නපුද්ගල සත්තක්ඛත්තුපරමතායෙන් නියත යැයි (සත්වරක්ම ඉපද පිරිනිවේ යයි) උත්තරාපථකයන් සෙයින් ලබ්ධි ගත්තවුන්ගේ වාද බිඳුනම 'සත්තක්ඛත්තුපරමකථා' එයි.]

1. ස. පු: සත්තක්ඛත්තුපරම පුද්ගල සත්තක්ඛත්තුපරමතා-යෙන් නියත වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යෑ.

ස. අනු: (ඔබ විසින්) මව දිවියෙන් ගලවන ලද වේ ද, පියා දිවියෙන් ගලවන ලද වේ ද, රහත් දිවියෙන් ගලවනලද වේ ද, දුෂ්ට සිතින් තථාගතයන් වහන්සේගේ සිරිරින් ලෙහෙ සලනලද වේ ද, සඞ්ඝයා බිඳුනාලද වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යෑ ... (මේ මිච්ඡත්තනියාමය ඔහුට නැත.)

2. ස. පු: සත්තක්ඛත්තුපරම පුද්ගල සත්තක්ඛත්තුපරමතා-යෙන් නියත වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යෑ.

ස. අනු: සත්වර අතර ධර්මය අභිසමය කරන්නට අභව්‍ය වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යෑ ...

3. ස. පු: අතර ධර්මය අභිසමය කරන්නට අභව්‍ය වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යෑ.

ස. අනු: (සත්තක්ඛත්තුපරම විසින්) මව දිවියෙන් ගලවන-ලද වේ ද, පියා දිවියෙන් ගලවන ලද වේ ද, රහත් දිවියෙන් ගලවනලද වේ ද, දුෂ්ට සිතින් තථාගත-යන් වහන්සේගේ සිරිරින් ලෙහෙ සලනලද වේ ද, සඞ්ඝයා බිඳුනාලද වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යෑ ... (මේ අභව්‍ය කරුණු ඔහුට නැත.)

4 ස. පු: සත්තක්ඛත්තුපරම පුද්ගල සත්තක්ඛත්තුපරමතා-යෙන් නියත වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යෑ.

ස. අනු: යම් නියාමයෙකින් සත්තක්ඛත්තුපරම පුද්ගල සත්තක්ඛත්තුපරමතායෙන් නියත වේ නම් එබඳු (සම්මත්ත) නියාමයෙක් (ඔහුට) ඇද්ද?

ප. පටි: එසේ නො කියැයුතු යෑ ...

ස. අනු: අත්ථි තෙ සතිපට්ඨානා -පෙ- සම්මප්පධානා -පෙ- ඉද්ධිපාදා -පෙ- ඉන්ද්‍රියා -පෙ- බලා -පෙ- තෙ බොජ්ඣඞ්ගා යෙහි බොජ්ඣඞ්ගෙහි සත්තක්ඛත්තු-පරමො පුග්ගලො සත්තක්ඛත්තුපරමතානියතො’ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

5. ස. පු: නත්ථි සො නියාමො යෙන නියාමෙන සත්තක්ඛත්තුපරමො පුග්ගලො සත්තක්ඛත්තු-පරමතානියතො’ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

අනු. ඨ: හඤ්චි නත්ථි සො නියාමො යෙන නියාමෙන සත්තක්ඛත්තුපරමො පුග්ගලො සත්තක්ඛත්තු-පරමතා නියතො,

අනු. පා: නො ච වත රෙ වත්තබ්බෙ "සත්තක්ඛත්තුපරමො පුග්ගලො සත්තක්ඛත්තුපරමතානියතො"ති.

6. ස. පු: නත්ථි තෙ සතිපට්ඨානා -පෙ- තෙ බොජ්ඣඞ්ගා යෙහි බොජ්ඣඞ්ගෙහි සත්තක්ඛත්තුපරමො පුග්ග-ලො සත්තක්ඛත්තුපරමතානියතො"ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

අනු. ඨ: හඤ්චි නත්ථි තෙ බොජ්ඣඞ්ගා යෙහි බොජ්ඣඞ්ගෙහි සත්තක්ඛත්තුපරමො පුග්ගලො සත්තක්ඛත්තු-පරමතානියතො,

අනු. පා: නො ච වත රෙ වත්තබ්බෙ "සත්තක්ඛත්තු-පරමො පුග්ගලො සත්තක්ඛත්තුපරමතානිය-තො"ති.

7. ස. පු: සත්තක්ඛත්තුපරමො පුග්ගලො සත්තක්ඛත්තු-පරමතානියතො’ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: සකදාගාමිනියාමෙනා’ති.[1]

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

ස. අනු: අනාගාමිනියාමෙනා’ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

1. නියාමෙනාති - සීමු, මජසං.

ස. අනු: ඒ සතිපට්ඨානයෝ ... සම්මප්පධානයෝ ... ඍද්ධි-පාදයෝ ... ඉන්ද්‍රියයෝ ... බලයෝ ... යම් බොධ්‍යඞ්ග කෙනකුන්ගෙන් සත්තක්ඛත්තුපරම පුද්ගල සත්තක්ඛත්තුපරමතායෙන් නියත වේ නම්. ඒ බොධ්‍යඞ්ගයෝ ඇද් ද? (සතිපට්ඨානාදි යම් මාර්ගධර්ම නියාමයෙක් (ඔහුට) ඇද් ද?)

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

5. ස. පු: යම් නියාමයෙකින් සත්තක්ඛත්තු පරම පුද්ගල සත්තක්ඛත්තු පරමතායෙන් නියත වේ නම් එබඳු නියාමයෙක් නැද්ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

අනු: ඨ: ඉදින් යම් නියාමයෙකින් සත්තක්ඛත්තුපරම පුද්ගල සත්තක්ඛත්තුපරමතායෙන් නියත වේ නම් එබඳු නියාමයෙක් නැත් නම්,

අනු. පා: භවත, සත්තක්ඛත්තුපරම පුද්ගල සත්තක්ඛත්තු පරමතායෙන් නියත වේය'යි නො කියැයුතු මැ යැ.

6. ස. අනු: ඒ සතිපට්ඨානයෝ ... යම් බොධ්‍යඞ්ගයෙකින් සත්තක්ඛත්තුපරම පුද්ගල සත්තක්ඛත්තුපරමතා-යෙන් නියත වේ නම් ඒ බොධ්‍යඞ්ගයෝ නැද්ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

අනු. ඨ: ඉදින් යම් බොධ්‍යඞ්ගයෙකින් සත්තක්ඛත්තුපරම පුද්ගල සත්තක්ඛත්තුපරමතායෙන් නියත වේ නම්, ඒ බොධ්‍යඞ්ගයෝ නැත් නම්,

අනු. පා: භවත සත්තක්ඛත්තුපරම පුද්ගල සත්තක්ඛත්තු-පරමතායෙන් නියත වේය'යි නො කියැයුතු මැ යැ.

7. ස. පු: සත්තක්ඛත්තුපරම පුද්ගල සත්තක්ඛත්තුපරමතා-යෙන් නියත වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: සකෘදාගාමිනියාමයෙන් වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

ස. අනු: අනාගාමිනියාමයෙන් වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

ස. අනු. අරහත්තනියාමේනා'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

ස. අනු: කතමේන නියාමේනා'ති.

ප. පටිඤ්ඤා: සොතාපත්තිනියාමෙනා'ති.

8. ස. පු: සත්තක්ඛත්තුපරමො පුග්ගලො සත්තක්ඛත්තු-පරමතානියතො'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: යෙ කෙචි සොතාපත්තිනියාමං ඔක්කමන්ති සබ්බෙ තෙ සත්තක්ඛත්තුපරමතානියතො'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ - පෙ-

9. ප. පු: න වත්තබ්බං "සත්තක්ඛත්තුපරමො පුග්ගලො සත්තක්ඛත්තුපරමතානියතො'ති.

ස. පටිඤ්ඤා: ආමන්තා.

ප. අනු: නනු සො සත්තක්ඛත්තුපරමො'ති.

ස. පටිඤ්ඤා: ආමන්තා.

අනු. ඨ: හඤ්චි සො සත්තක්ඛත්තුපරමො,

අනු. පා: තෙන වත රෙ වත්තබ්බෙ "සත්තක්ඛත්තුපරමො පුග්ගලො සත්තක්ඛත්තුපරමතානියතො''ති.

සත්තක්ඛත්තුපරමකථා නිට්ඨිතා.

ස. අනු: අගීතත්වනියාමයෙන් වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

ස. අනු: කවර නියාමයෙකින් වේ ද?

ප. පටි: ශ්‍රෝතාපත්තිනියාමයෙන් මැ වෙයි.

8. ස. පු: සත්තක්ඛත්තුපරම පුද්ගල සත්තක්ඛත්තුපරමතා-යෙන් මැ නියත වේ ද?

ප: පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: යම් කිසි කෙනෙක් ශ්‍රොතාපත්තිනියාමයට බසිත් නම් එ හැම සත්තක්ඛත්තුපරමතායෙන් නියත වෙත් ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ. ..

9. ප. පු: 'සත්තක්ඛත්තුපරම පුද්ගල සත්තක්ඛත්තුපරමතා නියත වේය'යි නො කියයුතු වේද?

ස. පටිඤ්ඤා: එසේ යැ.

ප. අනු: හෙ සත්තක්ඛත්තුපරම නො?

ස. පටි: එසේ යැ.

අනු. ඨ: ඉදින් හෙ සත්තක්ඛත්තුපරම වේ නම්,

අනු. පා: හවත, එ කරුණින් 'සත්තක්ඛත්තුපරම පුද්ගල සත්තක්ඛත්තුපරමතානියත වේ' ය යි කියයුතු මැ යැ.

(භාග්‍යවතුන් වහන්සේ 'සත්තක්ඛත්තුපරම' යනු සොතාපන්නයා සත්වරකට වඩා නූපදින බව කියනු සඳහා මිස භවනියමයක් සඳහා නො වදාළ හෙයින් සාධක නොවේ.)

සත්තක්ඛත්තුපරමකථා නිමි.

## 12. 6.

# කොලංකොලකථා

1. ප. පු: න වත්තබ්බං: කොලංකොලො පුග්ගලො කොලං-කොලතායනියතො'ති.

ස. පටිඤ්ඤා: ආමන්තා.

ප. අනු: නනු සො කොලංකොලො'ති.

ස. පටිඤ්ඤා: ආමන්තා.

අනු. ඨ: හඤ්චි සො කොලංකොලො,

අනු. පා තෙන වත රෙ වත්තබ්බෙ "කොලංකොලො පුග්ගලො කොලංකොලතායනියතො'ති.

කොලංකොලකථා නිට්ඨිතා.

12. 6.

# කොලංකොලකථා

[මෙහි නිදානය සත්තක්ඛත්තුපරමකථායෙහි මෙනි.]

1. ප. පු. ‘කොලංකොල පුද්ගල කොලංකොලතායෙන් නියත වේය’යි නො කියැයුතු වේ ද?

ස. පටික්ෂෙප: එසේ යැ.

ප. අනු: හෙ කොලංකොල නො?

ස. පටික්ෂෙප: එසේ යැ.

අනු. ඨ: ඉදින් හෙ කොලංකොල වී නම්,

අනු. පා: හවත, එකරුණින් ‘කොලංකොල පුද්ගල කොලංකොලතායෙන් නියත වේය’යි කියැයුතු මැ යැ.

කොලංකොලකථා නිමි.

12. 7.

# එකබීජිකථා

1\. ප. පු: න වත්තබ්බං "එකබීජි පුග්ගලො එකබීජිතා-නියතො"ති.

ස. පටික්ඛෙපො: ආමන්තා.

ප. අනු: නනු සො එකබීජි'ති.

ස. පටික්ඛෙපො: ආමන්තා.

අනු. ඨ: හඤ්චි සො එකබීජි,

අනු. පා: තෙන වත රෙ වත්තබ්බෙ "එකබීජි පුග්ගලො එකබීජිතානියතො"ති.

එකබීජිකථා නිට්ඨිතා.

12. 7.

# ඒකබීජීකථා

[මෙහි නිදානය ද සත්තක්ඛත්තුපරමකථා යෙ මෙනි.]

1. ප. පු: 'ඒකබීජී' පුද්ගල ඒකබීජිතායෙන් නියත වේය'යි නො කියැයුතු වේ දැ?

ස. පටික්ඛෙප: එසේ යැ.

ප. අනු: හෙ ඒකබීජී නො?

ස. පටික්ඛෙප: එසේ යැ.

අනු. ඨ: ඉදින් හෙ ඒකබීජී වේ නම්,

අනු. පා: භවත, එකරුණින් 'ඒකබීජී පුද්ගල ඒකබීජිතායෙන් නියත වේය'යි කියැයුතු මැ යැ.

ඒකබීජීකථා නිමි.

12. 8

## ජීවිතාවොරොපනකථා.

1\. ස. පු: දිට්ඨිසම්පන්නො පුග්ගලො සඤ්චිච්ච පාණං ජීවිතා වොරොපෙය්‍යා'ති.

ප. පටික්ඛෙ. ආමන්තා.

ස. අනු: දිට්ඨිසම්පන්නො පුග්ගලො සඤ්චිච්ච මාතරං ජීවිතා වොරොපෙය්‍ය -පෙ- පිතරං ජීවිතා වොරොපෙය්‍ය -පෙ- අරහන්තං ජීවිතා වොරොපෙය්‍ය -පෙ- දුට්ඨෙන චිත්තෙන තථාගතස්ස ලොහිතං උප්පාදෙය්‍ය -පෙ- සඞ්ඝං භින්දෙය්‍යා'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

2\. ස. පු: දිට්ඨිසම්පන්නො පුග්ගලො සඤ්චිච්ච පාණං ජීවිතා වොරොපෙය්‍යා'ති.

ප. පටික්ඛෙ: ආමන්තා.

ස. අනු: දිට්ඨිසම්පන්නො පුග්ගලො සත්ථරි අගාරවො'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

ස. අනු: ධම්මෙ -පෙ- සඞ්ඝෙ -පෙ- සික්ඛාය අගාරවො'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

ස අනු: නනු දිට්ඨිසම්පන්නො පුග්ගලො සත්ථරි සගාරවො'ති.

ප. පටික්ඛෙ: ආමන්තා.

අනු ඨ: හඤ්චි දිට්ඨිසම්පන්නො පුග්ගලො සත්ථරි සගාරවො,

අනු. පා. නො ච වත රෙ වත්තබ්බෙ: දිට්ඨිසම්පන්නො පුග්ගලො සඤ්චිච්ච පාණං ජීවිතා වොරොපෙය්‍යා'ති.

ස. අනු: නනු දිට්ඨිසම්පන්නො පුග්ගලො ධම්මෙ -පෙ- සඞ්ඝෙ -පෙ- සික්ඛාය සගාරවො'ති.

ප. පටික්ඛෙ: ආමන්තා.

## 12. 8.

# ජීවිතාවොරොපන කථා.

['ප්‍රාණවධය ද්වෙෂ සම්ප්‍රයුක්ත චිත්තයෙන් වෙයි. ද්වෙෂය ද දෘෂ්ටිසම්පන්නයාහට අප්‍රහීන යැ. ඒ හේතුවින් දෘෂ්ටිසම්පන්න පුද්ගල දැන දැන ප්‍රාණවධ කෙරේය'යි පූර්වශෛලීය අපරශෛලීය නිකායවාසීන් සෙයින් ලබ්ධි ගත්තවුන්ගේ වාද බිඳුනට ජීවිතාවොරොපනකථා එයි.]

1\. ස. පු: දෘෂ්ටිසම්පන්න (සොතාපන්න) පුද්ගල දැන දැන සතක්හු දිවි ගලවන්නේ වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස අනු: දෘෂ්ටිසම්පන්න පුද්ගල මව දිවි ගලවන්නේ වේ ද... පියා දිවි ගලවන්නේ වේ ද? ... රහත්හු දිවි ගලවන්නේ වේ ද ... දුෂ්ට සිතින් තථාගතයන් වහන්සේගේ ශරීරයෙහි ලෙහෙ සලන්නේ වේ ද? ... සඞ්ඝභෙද කරන්නේ වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

2\. ස. පු: දෘෂ්ටිසම්පන්න පුද්ගල දැන දැන සතක්හු දිවි ගලවන්නේ වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ. (සොතාපන්නයා පිළිබඳ අසථාන කරුණු හෙයින් ප්‍රතික්ෂිප්තයි.)

ස. අනු: දෘෂ්ටිසම්පන්න පුද්ගල බුදුන් කෙරෙහි අගෞරව ඇතියේ වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

ස. අනු: ධර්මය කෙරෙහි ... සඟුන් කෙරෙහි ... ශික්ෂායෙහි අගෞරව ඇතියේ වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

ස. අනු: දෘෂ්ටිසම්පන්න පුද්ගල බුදුන් කෙරෙහි ගෞරව සහිත වූයේ නො?

ප. පටිඤ්ඤා: එසේ යැ.

අනු. ඨ: ඉදින් දෘෂ්ටිසම්පන්න පුද්ගල බුදුන් කෙරෙහි ගෞරව සහිත වේ නම්,

අනු. පා: භවත 'දෘෂ්ටිසම්පන්න පුද්ගල දැන දැන සතක්හු දිවි ගලවන්නේ යැ' යනු නො කියැයුතු මැ යැ.

ස. අනු: දෘෂ්ටිසම්පන්න පුද්ගල ධර්මය කෙරෙහි ... සඟුන් කෙරෙහි ... ශික්ෂායෙහි ගෞරව සහිත වූයේ නො?

ප. පටිඤ්ඤා: එසේ යැ.

අනු. ථෙ: හඤ්චි දිට්ඨිසම්පන්නො පුග්ගලො සික්ඛාය සගාරවො,

අනු. පං: නො ච වත රෙ වත්තබ්බෙ "දිට්ඨිසම්පන්නො පුග්ගලො සඤ්චිච්ච පාණං ජීවිතා වොරොපෙය්‍යා"ති.

3. ස. පු: දිට්ඨිසම්පන්නො පුග්ගලො සත්ථරි අගාරවො'ති.

ස. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: දිට්ඨිසම්පන්නො පුග්ගලො බුද්ධථූපෙ ඔහදෙය්‍ය[1] ඔමුත්තෙය්‍ය නිට්ඨුභෙය්‍ය, බුද්ධථූපෙ අපබ්‍යාමතො[2] කරෙය්‍යා'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

4. ස. පු: දිට්ඨිසම්පන්නො පුග්ගලො සඤ්චිච්ච පාණං ජීවිතා වොරොපෙය්‍යා'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: නනු වුත්තං භගවතා "සෙය්‍යථා'පි භික්ඛවෙ මහාසමුද්දො ඨිතධම්මො වෙලං නාතිවත්තති, එවමෙව ඛො භික්ඛවෙ යං මයා සාවකානං සික්ඛාපදං පඤ්ඤත්තං, තං මම සාවකා ජීවිතහෙතු'පි නාතික්කමන්ති"ති[a] අත්ථෙව සුත්තන්තො'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. ආ: තෙන හි න වත්තබ්බං: දිට්ඨිසම්පන්නො පුග්ගලො සඤ්චිච්ච පාණං ජීවිතා වොරොපෙය්‍යා'ති.

ජීවිතා වොරොපන කථා නිට්ඨිතා.

1 ඔහනෙය්‍ය - සීමු ඔදහෙය්‍ය - අට්ඨකථා.
2. අපබ්‍යාමකතො - සීමු
a අට්ඨකඞ්ගුත්තර - මහාවග්ග.

| | |
|---|---|
| අනු. ඨ: | ඉදින් දෘෂ්ටිසම්පන්න පුද්ගල ශික්ෂායෙහි ගෞරව සහිත වේ නම්, |
| අනු. පා: | හවත 'දෘෂ්ටිසම්පන්න පුද්ගල දැන දැන සතක්හු දිවි ගලවන්නේ යැ' යනු නො කියැයුතු මැ යැ. |

| | |
|---|---|
| 3. ස. පු: | දෘෂ්ටිසම්පන්න පුද්ගල බුදුන් කෙරෙහි අගෞරව සහිත වේ ද? |
| ප. පටිඤ්ඤා: | එසේ යැ. (අසති අම්නසිකාර වශයෙන් අගෞරව සහිත වියහැකි හෙයින් ප්‍රතිඥතයි.) |
| ස. අනු: | දෘෂ්ටිසම්පන්න පුද්ගල බුද්ධස්තූපයෙහි මල– මූ– සෙම් බැහීම්කිස කරන්නේ වේ ද? බුද්ධස්තූපයෙහි අප්‍රදක්ෂිණා කරන්නේ වේ ද? |
| ප. පටි: | එසේ නො කියැයුතු යැ ... (දැන දැන නොකරන හෙයින් ප්‍රතික්ෂිප්තයි.) |

| | |
|---|---|
| 4. ස. පු: | දෘෂ්ටිසම්පන්න පුද්ගල දැන දැන සතක්හු දිවි ගලවන්නේ වේ ද? |
| ප. පටිඤ්ඤා: | එසේ යැ. |
| ස. අනු: | භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරනලද මැ නු: "මහණෙනි, යම්සේ මහාසමුද්‍රය ස්ථිතස්වභාව ඇත්තේ වෙරළ නො ඉක්මපවන්නේ වේ ද, එසෙයින් මැ මහණෙනි, මා විසින් ශ්‍රාවකයනට යම් ශික්ෂාපදයෙක් පනවනලද වේ ද, එය මාගේ ශ්‍රාවකයෝ ජීවිතහේතුවිතුදු නො ඉක්මෙති"යි වදාළ සූත්‍රාන්තයෙක් ඇත්තේ මැ නු? |
| ප. පටිඤ්ඤා: | එසේ යැ. |
| ස. අා: | එකරුණින් 'දෘෂ්ටිසම්පන්න පුද්ගල දැන දැන සතක්හු දිවි ගලවන්නේ යැ'යි නො කියැයුතු මැ යැ. |

ජීවිතාවොරොපනකථා නිමි.

## 12. 9.

# දුග්ගතිකථා.

1. ස. පු: දිට්ඨිසම්පන්නස්ස පුග්ගලස්ස පහීනා දුග්ගතී'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: දිට්ඨිසම්පන්නො පුග්ගලො ආපායිකෙ රූපෙ රජ්ජෙය්‍යා'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

අනු. ඨ: හඤ්චි දිට්ඨිසම්පන්නො පුග්ගලො ආපායිකෙ රූපෙ රජ්ජෙය්‍ය,

අනු. පා: නො ච වත රෙ වත්තබ්බෙ "දිට්ඨිසම්පන්නස්ස පුග්ගලස්ස පහීනා දුග්ගතී"ති.

2. ස. පු: දිට්ඨිසම්පන්නස්ස පුග්ගලස්ස පහීනා දුග්ගතී'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: දිට්ඨිසම්පන්නො පුග්ගලො ආපායිකෙ සද්දෙ -පෙ- ගන්ධෙ-පෙ-රසෙ-පෙ-ඵොට්ඨබ්බෙ රජ්ජෙය්‍ය-පෙ- අමනුස්සිත්ථියා තිරච්ඡානගතිත්ථියා නාගකඤ්ඤාය මෙථුනං ධම්මං පටිසෙවෙය්‍ය, අජෙළකං[1] පටිග්ගණ්හෙය්‍ය,[2] කුක්කුටසූකරං[3] පටිග්ගණ්හෙය්‍ය, හත්ථිගවාස්සවළවං[4] පටිග්ගණ්හෙය්‍ය[2], තිත්තිරවට්ටකං මොරකපිඤ්ජලං පටිග්ගණ්හෙය්‍යා'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

අනු. ඨ: හඤ්චි දිට්ඨිසම්පන්නො පුග්ගලො -පෙ- තිත්තිරවට්ටකං මොරකපිඤ්ජලං පටිග්ගණ්හෙය්‍ය,[2]

අනු. පා: නො ච වත රෙ වත්තබ්බෙ "දිට්ඨිසම්පන්නස්ස පුග්ගලස්ස පහීනා දුග්ගතී"ති.

3. ස. පු: දිට්ඨිසම්පන්නස්ස පුග්ගලස්ස පහීනා දුග්ගති, දිට්ඨිසම්පන්නො පුග්ගලො ආපායිකෙ රූපෙ රජ්ජෙය්‍යා'ති.

ප. පටිඤ්ඤා: අමන්තා.

ස. අනු: අරහතො පහීනා දුග්ගති, අරහා ආපායිකෙ රූපෙ රජ්ජෙය්‍යා'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

---

1. අජෙලකං - සීමු.
2. පටිගණ්හෙය්‍ය - සීමු, මජසං, ස්‍යා, PTS
3. කුක්කුල සූකරං - PTS.
4. හත්ථිගවාස්සවලවං - සීමු.

## 12. 9.

# දුග්ගතිකථා.

[දුගීතිය හා දුගීතිසත්ත්වයන්ගේ රූපාදිය අරමුණු කොට ඇති තෘෂ්ණාව හා දෙක මෑ දුගීති විසින් ගෙන නැවත ඒ විභාග නො කොට – ඒ වෙන වෙන නො ගෙන අවිශේෂයෙන් 'දෘෂ්ටිසම්පන්න පුද්ගලයාහට දුගීති ප්‍රහීණ' යැයි උත්තරාපථක නිකායවාසීන් සෙයින් වාද ගත්තවුන්ගේ ඒ වාද බිඳුනම දුගීතිකථා එයි.]

1. ස. පු: දෘෂ්ටිසම්පන්න පුද්ගලයාහට දුගීති ප්‍රහීණ වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: දෘෂ්ටිසම්පන්න පුද්ගල ආපායික රූපයෙහි ඇලේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

අනු. ඨ: ඉදින් දෘෂ්ටිසම්පන්න පුද්ගල ආපායික රූපයෙහි ඇලේ නම්,

අනු. පා: හවත 'දෘෂ්ටිසම්පන්න පුද්ගලහට දුගීති ප්‍රහීණ' යැයි නො කියැයුතු මැ යැ.

2. ස. පු: දෘෂ්ටිසම්පන්න පුද්ගලයාහට දුගීති ප්‍රහීණ වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: දෘෂ්ටිසම්පන්න පුද්ගල ආපායික ශබ්දයන් ... ගන්ධයන් ... රසයන් ... ස්ප්‍රෂ්ටව්‍යයන් කෙරෙහි ඇලේ ද ..., අමනුෂ්‍ය ස්ත්‍රිය හා සමග, තිරිසන්ගිය ස්ත්‍රිය හා සමග, නාගකන්‍යාව හා සමග මෛථුන්දම් සෙවුනේ වේ ද? එළුතිරෙළුවන් පිළිගන්නේ වේ ද, කුකුළුහූරන් පිළිගන්නේ වේ ද, ඇත් අශ් වෙළඹුන් පිළිගන්නේ, තිත්වටු වටුවන් පිළිගන්නේ වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

අනු. ඨ: ඉදින් දෘෂ්ටිසම්පන්න පුද්ගල ... තිත්වටු වටු මයුරකපිඤ්ජර පිළිගන්නේ වේ නම්,

අනු. පා: හවත, 'දෘෂ්ටිසම්පන්න පුද්ගලයා හට දුගීති ප්‍රහීණ යැ'යි නො කියැයුතු මැ යැ.

3. ස. පු: දෘෂ්ටිසම්පන්න පුද්ගලයාහට (තොප මතයෙහි) දුගීති ප්‍රහීණ යැ. දෘෂ්ටිසම්පන්න පුද්ගල ආපායික රූපයෙහි ඇලේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: රහත්හට දුගීති ප්‍රහීණ යැ. රහත් ආපායික රූපයෙහි ඇලේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

4. ස. පු: දිට්ඨිසම්පන්නස්ස පුග්ගලස්ස පහීනා දුග්ගති, දිට්ඨි- සම්පන්නො පුග්ගලො ආපායිකෙ සද්දෙ -පෙ- ගන්ධෙ-පෙ- රසෙ-පෙ- ඵොට්ඨබ්බෙ-පෙ- තිත්තිර- වට්ටකං මොරකපිඤ්ජලං[1] පටිග්ගණ්හෙය්‍යා'ති.

ප. පටික්ඛෙපො: ආමන්තා.

ස. අනු: අරහතො පහීනා දුග්ගති, අරහා -පෙ- තිත්තිර- වට්ටකං මොරකපිඤ්ජලං[1] පටිග්ගණ්හෙය්‍යා'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

5. ස. පු: අරහතො පහීනා දුග්ගති, න ච අරහා ආපායිකෙ රූපෙ රජ්ජෙය්‍යා'ති.

ප. පටික්ඛෙපො: ආමන්තා.

ස. අනු: දිට්ඨිසම්පන්නස්ස පුග්ගලස්ස පහීනා දුග්ගති, න ච දිට්ඨිසම්පන්නො පුග්ගලො ආපායිකෙ රූපෙ රජ්ජෙය්‍යා'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

6. ස. පු: අරහතො පහීනා දුග්ගති, න ච අරහා ආපායිකෙ සද්දෙ -පෙ- ගන්ධෙ -පෙ- රසෙ -පෙ- ඵොට්ඨබ්බෙ රජ්ජෙය්‍ය, අමනුස්සිත්ථියා තිරච්ඡානගතිත්ථියා නාගකඤ්ඤාය මෙථුනං ධම්මං පටිසෙවෙය්‍ය, අජෙළකං පටිග්ගණ්හෙය්‍ය, කුක්කුටසූකරං පටිග්ගණ්හෙය්‍ය, හත්ථිගවාස්සවළවං පටිග්ගණ්හෙය්‍ය තිත්තිරවට්ටකං මොරකපිඤ්ජලං පටිග්ගණ්හෙය්‍යා'ති.

ප. පටික්ඛෙපො: ආමන්තා.

ස. අනු: දිට්ඨිසම්පන්නස්ස පුග්ගලස්ස පහීනා දුග්ගති, න ච දිට්ඨිසම්පන්නො පුග්ගලො -පෙ- තිත්තිරවට්ටකං මොරකපිඤ්ජලං පටිග්ගණ්හෙය්‍යා'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

7. ප. පු: න වත්තබ්බං "දිට්ඨිසම්පන්නස්ස පුග්ගලස්ස පහීනා දුග්ගතී"ති.

ස. පටික්ඛෙපො: ආමන්තා.

ප. අනු: දිට්ඨිසම්පන්නො පුග්ගලො නිරයං උපපජ්ජෙය්‍ය -පෙ- තිරච්ඡානයොනිං උපපජ්ජෙය්‍ය -පෙ- පෙත්තිවිසයං[2] උපපජ්ජෙය්‍යා'ති.

ස. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

ප. ආ: තෙනහි "දිට්ඨිසම්පන්නස්ස පුග්ගලස්ස පහීනා දුග්ගතී"ති.

දුග්ගතිකථා නිට්ඨිතා.

---

1. තිත්තිරවට්ටකමොරකපිඤ්ජලං - PTS
   " " කපිඤ්ජරං - මජසං
   " " කපිඤ්ජලං - සතා
2. පෙත්තිවිසයං - සීමු, සතා, PTS.

4. ස. පු: දෘෂ්ටිසම්පන්න පුද්ගලයාහට දුගීති ප්‍රහීණ යෑ. දෘෂ්ටිසම්පන්න පුද්ගල ආපායික ශබ්දයෙහි ... ගන්ධයෙහි ... රසයෙහි ... ස්ප්‍රෂ්ටව්‍යයෙහි ඇලේ ද ... තිත්වටුවටු මයුරකපිඤ්ජර පිළිගන්නේ වේ ද?

ප. පඤ්ඤ: එසේ යෑ.

ස. අනු: රහත්හට දුගීති ප්‍රහීණ යෑ. රහත් තිත්වටුවටුවත් මයුරකපිඤ්ජරයත් පිළිගන්නේ වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යෑ ...

5. ස. පු: රහත්හට දුගීති ප්‍රහීණ යෑ. රහත් ආපායික රූපයෙහි නො ඇලෙන්නේ වේ ද?

ප. පටිඤ්ඤ: එසේ යෑ.

ස. අනු: දෘෂ්ටිසම්පන්න පුද්ගලයාහට දුගීති ප්‍රහීණ යෑ. දෘෂ්ටිසම්පන්න පුද්ගල අපායික රූපයෙහි නො ඇලෙන්නේ වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යෑ ...

6. ස. පු: රහත්හට දුගීති ප්‍රහීණ යෑ. රහත් අපායික ශබ්දයෙහි ... ගන්ධයෙහි ... රසයෙහි ... ස්ප්‍රෂ්ටව්‍යයෙහි නො ඇලෙන්නේ වේ ද? නො මිනිස් මාගමක හා තිරිසන්ගිය මාගමක හා නාමෙණෙවියක හා ද මෙවුන්දම් නො සෙවුනේ වේ ද? එළු බැටළු නො පිළිගන්නේ වේ ද? කුකුළුහූරු නො පිළිගන්නේ වේ ද? ඇත්ගවඅස්වළඹුන් නො පිළිගන්නේ වේ ද? ... තිත්වටුවටුවත් මයුරකපිඤ්ජර නො පිළිගන්නේ වේ ද?

ප. පටිඤ්ඤ: එසේ යෑ.

ස. අනු: දෘෂ්ටිසම්පන්න පුද්ගලයාහට දුගීති ප්‍රහීණ යෑ. දෘෂ්ටිසම්පන්න පුද්ගල ... තිත්වටුවටුවත් මයුරකපිඤ්ජර නො පිළිගන්නේ වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යෑ ...

7. ප. පු: 'දෘෂ්ටිසම්පන්න පුද්ගලයාහට දුගීති ප්‍රහීණ යෑ'යි නො කියයුතු වේ ද?

ස. පටිඤ්ඤ: එසේ යෑ.

ප. අනු: දෘෂ්ටිසම්පන්න පුද්ගල නිරයට එළඹෙන්නේ වේ ද ... තිරිසන් යොනට එළැඹෙන්නේ වේ ද ... ප්‍රේතවිෂයට එළඹෙන්නේ වේ ද?

ස. පටි: එසේ නො කියැයුතු යෑ ...

ප. ආ: එකරුණින් දෘෂ්ටිසම්පන්න පුද්ගලයාහට දුගීති ප්‍රහීණ වෙයි. (මෙයින් දුගීතිප්‍රහාණය හෝ දුගීතිගාමිතෘෂ්ණාප්‍රහාණය දක්වූයේ වෙයි. දුගීතිසත්ත්වයන්ගේ රූපාදිය කෙරෙහිවූ තෘෂ්ණාප්‍රහාණය නොවේ. එහෙයින් අසාධකයි.)

දුගීතිකථා නිමි.

## 12. 10.

# සත්තමභවිකකථා.

1 ප. පු: න වත්තබ්බං: සත්තමභවිකස්ස පුග්ගලස්ස පහීනා දුග්ගතී'ති.

ස. පටිඤ්ඤා: ආමන්තා.

ප. අනු: සත්තමභවිකො පුග්ගලො නිරයං උපපජ්ජෙය්‍ය, තිරච්ඡානයොනිං උපපජ්ජෙය්‍ය, පෙත්තිවිසයං. උපපජ්ජෙය්‍යා'ති.

ස. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

ප. ආ: තෙන හි සත්තමභවිකස්ස පුග්ගලස්ස පහීනා දුග්ගතී'ති.

සත්තමභවිකකථා නිට්ඨිතා.

ද්වාදසමො වග්ගො නිට්ඨිතො.

තස්ස උද්දානං:

සංවරො කම්මං තථෙව අසංවරො සබ්බං කම්මං සවිපාකං
සද්දො විපාකො සළායතනං විපාකො සත්තක්ඛත්තුපරමො පුග්ගලො
සත්තක්ඛත්තුපරමතා නියතො කොලංකොලො පුග්ගලො
කොලංකොලතානියතො එකබීජී පුග්ගලො එකබීජිතානියතො
දිට්ඨිසම්පන්නො පුග්ගලො සඤ්චිච්ච පාණං ජීවිතා වොරොපෙය්‍ය
දිට්ඨිසම්පන්නස්ස පුග්ගලස්ස පහීනා දුග්ගති තථෙව සත්තමභවිකස්සා'ති.

## 12. 10.

# සත්තමභවිකකථා.

[මෙහි නිදානය ද දුග්ගතිකථායෙහි මෙනි.]

1. ප. පු: 'සත්තමභවික (සෝතාපන්න) පුද්ගලයාට දුගීති ප්‍රහීණ' යැ යි නො කියැයුතු වේ ද?

ස. පටිඤ්ඤා: එසේ යැ.

ප. අනු: සත්තමභවික පුද්ගල නිරයට එළඹෙන්නේ වේ ද? තිරශ්චීන යෝනියට එළඹෙන්නේ වේ ද? ප්‍රේත විෂයයට එළඹෙන්නේ වේ ද?

ස. පු: එසේ නො කියැයුතු යැ ...

ප අා: එකරුණින් සත්තමභවික පුද්ගලයාහට දුගීති ප්‍රහීණ වෙයි.

සත්තමභවිකකථා නිමි.

ද්වාදශවග්ග නිමි.

එහි උද්දාන:

සංවරො කම්මන්ති කථා යැ, කම්මකථා යැ, සද්දො විපාකො'ති කථා යැ, සළායතනකථා යැ, සත්තක්ඛත්තුපරමකථා යැ, කොලංකොලකථා යැ, එකබීජිකථා යැ, ජීවිතා වොරොපනකථා යැ, දුග්ගතිකථා යැ, සත්තම-භවිකකථා යි.

# තෙරසමො වග්ගො.

### 13. 1.

## කප්පට්ඨකථා.

1. ස. පු: කප්පට්ඨො කප්පං තිට්ඨෙය්‍යා’ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: කප්පො ච සණ්ඨාති, බුද්ධො ච ලොකෙ උප්පජ්ජතී’ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

2. ස. පු: කප්පට්ඨො කප්පං තිට්ඨෙය්‍යා’ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: කප්පො ච සණ්ඨාති, සඞ්ඝො ච භිජ්ජතී’ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

3. ස. පු: කප්පට්ඨො කප්පං තිට්ඨෙය්‍යා’ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: කප්පො ච සණ්ඨාති, කප්පට්ඨො ච කප්පට්ඨියං කම්මං කරොතී’ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

4. ස. පු: කප්පට්ඨො කප්පං තිට්ඨෙය්‍යා’ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: කප්පො ච සණ්ඨාති, කප්පට්ඨො ච පුග්ගලො, කාලං කරොතී’ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

5. ස. පු: කප්පට්ඨො කප්පං තිට්ඨෙය්‍යා’ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස අනු: අතීතං කප්පං තිට්ඨෙය්‍ය, අනාගතං කප්පං තිට්ඨෙය්‍යා’ති.

ප. පටි. න හෙවං වත්තබ්බෙ -පෙ-

# තෙළස්වනවග

## 13. 1.

## කප්පට්ඨකථා.

["සඞ්ඝං සමග්ගං භෙත්වාන කප්පං නිරයම්හි පච්චති" යනු ගෙන සඞ්ඝභේදක කපක් පුරා නිරයෙහි සිටුනේ'යි රාජගිරිකයන් සෙයින් ලබ්ධි ගතුවන්ගේ මෑද බිඳුනම කප්පට්ඨකථා එයි.]

1\. ස පු: කල්පස්ථයා (සම්පූර්ණ මහා) කපක් සිටුනේ වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: කල්පයක් සිටුනේ වේ ද? බුදුහු ද ලොවැ උපදනාහු වෙත් ද? (සඞ්ඝභෙදය බුදුන් ඇති කලැමැ වන බව හැඟමි.)

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

2\. ස. පු: කල්පස්ථයා කල්පයක් සිටුනේ වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: කපත් හටගනී. ඒ හා මැ සඞ්ඝයාත් බිඳේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

3\. ස. පු: කල්පස්ථයා කපක් සිටුනේ වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: කප හටගන්නා හා මැ කල්පස්ථයා කල්පස්ථායි නම් කෙරේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ. ...

4\. ස. පු: කල්පස්ථයා කපක් සිටුනේ වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස අනු: කල්පය හටගන්නා හා මැ කල්පස්ථ පුද්ගලයා කලුරිය කෙරේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ. ...

5\. ස පු: කල්පස්ථයා කපක් සිටුනේ වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: අතීතකල්පය සිටුනේ වේ ද? අනාගතකල්පය සිටුනේ වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

6. ස. පු: කප්පට්ඨො කප්පං තිට්ඨෙය්‍යා'ති.
ප. පටිඤ්ඤා: ආමන්තා.
ස. අනු: ද්වෙ කප්පෙ තිට්ඨෙය්‍ය, තයො කප්පෙ තිට්ඨෙය්‍ය, චත්තාරො කප්පෙ තිට්ඨෙය්‍යා'ති.
ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

7. ස. පු: කප්පට්ඨො කප්පං තිට්ඨෙය්‍යා'ති.
ප. පටිඤ්ඤා: ආමන්තා.
ස. අනු: කප්පට්ඨො කප්පෙ ඣායන්තෙ කත්ථ ගච්ඡතී'ති.
ප. පටිඤ්ඤා: අඤ්ඤං ලොකධාතුං ගච්ඡතී'ති.
ස. අනු. මතො ගච්ඡති, වෙහාසං ගච්ඡතී'ති.
ප. පටිඤ්ඤා: මතො ගච්ඡතී'ති.
ස. අනු: කප්පට්ඨියං කම්මං අපරාපරියවෙපක්කන්ති.[1]
ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

8. ස. පු: වෙහාසං ගච්ඡතී'ති.
ප. පටිඤ්ඤා: ආමන්තා.
ස. අනු: කප්පට්ඨො ඉද්ධිමා'ති.
ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

9. ස. පු. කප්පට්ඨො ඉද්ධිමා'ති.
ප. පටිඤ්ඤා: ආමන්තා.
ස. අනු: කප්පට්ඨෙන ඡන්දිද්ධිපාදො භාවිතො විරියිද්ධිපාදො භාවිතො චිත්තිද්ධිපාදො භාවිතො වීමංසිද්ධිපාදො භාවිතො'ති.
ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

10. ප. පු: න වත්තබ්බං 'කප්පට්ඨො කප්පං තිට්ඨෙය්‍යා'ති.
ස. පටිඤ්ඤා· ආමන්තා.
ප. අනු: නනු වුත්තං භගවතා

"ආපායිකො නෙරයිකො
කප්පට්ඨො සඞ්ඝභෙදකො,
වග්ගරතො අධම්මට්ඨො
යොගක්ඛෙමතො[2] ධංසති.
සඞ්ඝං සමග්ගං භෙත්වාන[3]
කප්පං නිරයම්හි පච්චතී"ති.[a]

අත්ථෙව සුත්තන්තො'ති.
ස. පටිඤ්ඤා: ආමන්තා.
ප. ආ: තෙන හි "කප්පට්ඨො කප්පං තිට්ඨෙය්‍යා"ති.

කප්පට්ඨකථා නිට්ඨිතා

---

1. අපරාපරියං වෙ පක්කන්ති-PTS 2 යොගක්ඛෙමතො පධංසති - මජසං, සතා.
3. භින්දිත්වාන - සීමු, භින්දිත්වා - මජසං. a. දසකඞ්ගුත්තර - උපාලිවග්ග

6. ස. පු: කල්පස්ථයා කපක් සිටුනේ වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: දෙකපක් සිටුනේ වේ ද? තෙකපක් සිටුනේ වේ ද? සිවුකපක් සිටුනේ වේ ද?

ප පටි: එසේ නො කියැයුතු යැ ...

7. ස. පු: කල්පස්ථයා කපක් සිටුනේ වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: කල්පස්ථයා කප දන කලැ කොහි යේ ද?

ප. පටිඤ්ඤා: අන්‍ය ලෝකධාතුවකට යෙයි.

ස. අනු: මළේ යේ ද, නොහොත් අහසින් යේ ද?

ප. පටි: මළේ යෙයි.

ස. අනු: කල්පස්ථායි කර්මය අපරාපරිය වේදනීය වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

8 ස. පු: අහසට යේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: කල්පස්ථයා සෘද්ධිමත් වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...(භාවනාමය සෘද්ධි නැති හෙයින් ප්‍රතික්ෂිප්තයි.)

9. ස. පු: කල්පස්ථයා සෘද්ධිමත් වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ. (ජාතිසෘද්ධි ඇතියි ප්‍රතිඥතයි.)

ස. අනු: කල්පස්ථයා මිසින් ඡන්දිද්ධිපාද භාවිත වේ ද, විරියිද්ධිපාද භාවිත වේ ද, චිත්තිද්ධිපාද භාවිත වේ ද, විමංසිද්ධිපාද භාවිත වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ... (ජාතිසෘද්ධි ඇති කල්හි සෘද්ධිපාදභාවනා කුමටැයි ප්‍රතික්ෂිප්තයි.)

10. ප. පු: 'කල්පස්ථයා කපක් සිටුනේ යැ'යි නො කියයුතු වේ ද?

ස. පටිඤ්ඤා: එසේ යැ.

ප. අනු: භාග්‍යවතුන් වහන්සේ මිසින් වදාරනලද මැ නු: "ආපායික වූ නෛරයික වූ කල්පස්ථායි වූ වගීරත වූ අධර්මිෂ්ඨ වූ සඞ්ඝභේදක පුද්ගලයා යොගක්ෂෙම-යෙන් පිරිහෙයි. සමඟ සඟුන් බිඳ කපක් දවස් නිරයෙහි පැසේ''යයි වදාළ සූත්‍රාන්තයෙක් ඇත්තේ මැ නු?

ස. පටිඤ්ඤා: එසේ යැ.

ප. ආ: එකරුණින් කල්පස්ථයා කපක් සිටුනේ යැ. (කල්-පය අසූවට බෙදූ එයින් භාගයක් පමණ කල් නිරයෙහි සිටී. ඒ නිරයෙහි ආයුෂ්කල්පය සඳහා කියූයෙන් අසාධකය.)

කප්පට්ඨකථා නිමි.

## 13. 2.

# කුසලපටිලාභකථා.

1. ස. පු: කප්පට්ඨෝ කුසලං චිත්තං න පටිලභෙය්‍යා'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: කප්පට්ඨෝ දානං දදෙය්‍යා'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා

අනු. ඨ: හඤ්චි කප්පට්ඨෝ දානං දදෙය්‍ය,

අනු. පා: නො ච වත රෙ වත්තබ්බෙ "කප්පට්ඨෝ කුසලං චිත්තං න පටිලභෙය්‍යා"ති.

2. ස. පු. කප්පට්ඨෝ කුසලං චිත්තං න පටිලභෙය්‍යා'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: කප්පට්ඨෝ චීවරං දදෙය්‍ය -පෙ- පිණ්ඩපාතං දදෙය්‍ය -පෙ- සෙනාසනං දදෙය්‍ය -පෙ- ගිලාන-පච්චයභෙසජ්ජපරික්ඛාරං දදෙය්‍ය -පෙ- ඛාදනීයං දදෙය්‍ය -පෙ- භොජනීයං දදෙය්‍ය -පෙ- පානීයං දදෙය්‍ය -පෙ- චෙතියං වන්දෙය්‍ය -පෙ- චෙතියෙ මාලං ආරොපෙය්‍ය -පෙ- ගන්ධං ආරොපෙය්‍ය -පෙ- විලෙපනං ආරොපෙය්‍ය -පෙ- චෙතියං පදක්ඛිණං[1] කරෙය්‍යා'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

අනු. ඨ: හඤ්චි කප්පට්ඨෝ චෙතියං පදක්ඛිණං[1] කරෙය්‍ය,

අනු. පා: නො ච වත රෙ වත්තබ්බෙ "කප්පට්ඨෝ කුසලං චිත්තං න පටිලභෙය්‍යා"ති.

3. ප. පු: කප්පට්ඨෝ කුසලං චිත්තං පටිලභෙය්‍යා'ති.

ස. පටිඤ්ඤා: ආමන්තා.

ප. අනු: තතො වුට්ඨානං කුසලං චිත්තං පටිලභෙය්‍යා'ති.

ස. පටිඤ්ඤා: ආමන්තා.

ප. අනු: රූපාවචරං -පෙ- අරූපාවචරං -පෙ- ලොකුත්තරං කුසලං චිත්තං පටිලභෙය්‍යා'ති.

ස. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

කුසලපටිලාභකථා නිට්ඨිතා.

---

1. අභිදක්ඛිණං - සීමු, මජසං, සසා.

## 13. 2.

# කුසලපටිලාභකථා.

['කල්පස්ථයා කාමාවචර කුශලයක් මැ ලබා' යනු ස්වසමය යි. 'කුසල්සිත් නො ලබා' යයි උත්තරාපථකයන් සෙයින් ලබ්ධි ගත්තවුන්ගේ වාද බිඳුනම 'කුසලපටිලාභකථා' එයි.]

1\. ස. පු: කල්පස්ථයා කුශලචිත්තය නො ලබන්නේ වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: කල්පස්ථයා දන් දෙන්නේ වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

අනු. ඨා: ඉදින් කල්පස්ථයා දන් දෙන්නේ වේ නම්,

අනු. පා: හවත, කල්පස්ථයා කුශලචිත්තය නො ලබන්නේ යැ යනු නො කියැයුතු මැ යැ.

2\. ස පු: කල්පස්ථයා කුශලචිත්තය නො ලබන්නේ වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: කල්පස්ථයා සිවුරු දෙන්නේ ... පිඩුවා දෙන්නේ ... සෙනසුන් දෙන්නේ ... ගිලන්පසබෙහෙත්පිරිකර දෙන්නේ ... ඛාද්‍ය දෙන්නේ ... භොජ්‍ය දෙන්නේ ... පැන් දෙන්නේ ... සෑ වඳනේ ... සෑයෙහි මල් පළඳනේ ... සුවඳ නංවන්නේ ... විලෙවුන් රුවන්නේ ... සෑ පැදකුණු කරන්නේ වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

අනු. ඨා: ඉදින් කල්පස්ථයා සෑ පැදකුණු කරන්නේ වේ නම්,

අනු. පා: හවත 'කල්පස්ථයා කුශලචිත්තය නො-ලබන්නේ යැ' යනු නො කියැයුතු මැ යැ.

3\. ප. පු: කල්පස්ථයා කුශලචිත්තය ලබන්නේ වේ ද?

ස. පටිඤ්ඤා: එසේ යැ.

ප. අනු: එයින් උත්තාන කුශලචිත්තය ලබන්නේ වේ ද?

ස. පටිඤ්ඤා: එසේ යැ.

ප. අනු: රූපාවචර ... අරූපාවචර ... ලොකොත්තර-චිත්තය ලබන්නේ වේ ද?

ස. පටි: එසේ නො කියැයුතු යැ ...

කුශලපටිලාභකථා නිමි.

13. 3.

# අනන්තරාපයුත්තකථා.

1. ප. පු: අනන්තරාපයුත්තො පුග්ගලො සම්මත්තනියාමං ඔක්කමෙය්‍යා'ති.

ස. පටිඤ්ඤා: ආමන්තා.

ප. අනු: මිච්ඡත්තනියාමඤ්ච සම්මත්තනියාමඤ්ච උභො ඔක්කමෙය්‍යා'ති.

ස. පටි. න හෙවං වත්තබ්බෙ -පෙ-

2. ප. පු: අනන්තරාපයුත්තො පුග්ගලො සම්මත්තනියාමං ඔක්කමෙය්‍යා'ති.

ස. පටිඤ්ඤා: ආමන්තා.

ප. අනු: නනු තං කම්මං පයුත්තං කුක්කුච්චං උප්පාදිතං විප්පටිසාරියං ජනිතන්ති.

ස. පටිඤ්ඤා: ආමන්තා.

අනු. ඨ: හඤ්චි තං කම්මං පයුත්තං කුක්කුච්චං උප්පාදිතං විප්පටිසාරියං ජනිතං,

අනු. පා: නො ච වත රෙ වත්තබ්බෙ "අනන්තරාපයුත්තො පුග්ගලො සම්මත්තනියාමං ඔක්කමෙය්‍යා"ති.

3. ස. පු: අනන්තරාපයුත්තො පුග්ගලො අභබ්බො සම්මත්තනියාමං ඔක්කමිතුන්ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: මාතා ජීවිතා වොරොපිතා, පිතා ජීවිතා වොරොපිතො, අරහා ජීවිතා වොරොපිතො, දුට්ඨෙන චිත්තෙන තථාගතස්ස ලොහිතං උප්පාදිතං, සංඝො භින්නො'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

## 13. 3.

# අනන්තරාපයුත්තකථා.

["කාම්බූන් මරණින් අනන්තර වූ විපාකදායක වූ ආනන්තර්‍ය කර්මයක් පිණිස නියත ආණත්තියෙන් ඇණවුම් ලැබූවෙක් මාතුඝාතකාදි ඒ කම් කෙරේ නම්, ඇණවුම් කල තැනැත්තේ අපිසාධකචේතනා උපදවාලූයෙන් මිථ්‍යාත්වනියත වෙයි. සම්‍යක්ත්ව නියාමයට බැසගන්නට අභව්‍ය වෙයි. අනියතාණත්තියකින් ඇණවුම් ලැබූවෙක් ඒ කර්මය කෙරේ නම්, අණ කල තැනැත්තේ අපිසාධක-චේතනා නූපදවාලූයෙන් මිථ්‍යාත්වනියත නො වෙයි. සම්‍යක්ත්ව නියාමයට බැසගන්නට භව්‍ය වෙයි" යනු ස්වසමය යි. එතෙකුදු වුව අනියතාණත්තියෙන් අණ කල ද සම්‍යක්ත්වනියාමයට බැසගන්නට හේ අභව්‍ය වේ යයි උත්තරාපථකයන් සෙසින් ලබ්ධි ගත්තවුන්ගේ වාද බිඳුනට 'අනන්තරාපයුත්තකථා' එයි.]

1. ප. පු: අනන්තරාප්‍රයුක්ත පුද්ගලයා සම්‍යක්ත්වනියාමයට (ආර්‍යමාර්ගයට) බැසගන්නේ වේ ද?

ස. පටිඤ්ඤා: එසේ යැ.

ප. අනු: මිථ්‍යාත්වනියාම (ආනන්තර්‍යකර්ම) හා සම්‍යක්ත්ව-නියාම හා දෙකට මැ බැසගන්නේ වේ ද?

ස. පටි: එසේ නො කියැයුතු යැ ...

2. ප. පු: අනන්තරාප්‍රයුක්ත පුද්ගලයා සම්‍යක්ත්ව නියාමයට බැසගන්නේ වේ ද?

ස. පටිඤ්ඤා: එසේ යැ.

ප. අනු: ඒ ආනන්තර්‍යකර්මය ප්‍රයුක්ත නො වේ ද, කුකුස් උපදවනලද නො වේ ද, විපිළිසර උපදවනලද නො වේ ද?

ස. පටිඤ්ඤා: එසේ යැ.

අනු. ඨ: ඉදින් ඒ කර්මය ප්‍රයුක්ත නම්, කුකුස් උපදවන ලද නම්, විපිළිසර උපදවන ලද නම්,

අනු. පා: භවත, 'අනන්තරාප්‍රයුක්ත පුද්ගල සම්‍යක්ත්වනියා-මයට බැස ගන්නේ යැ' යනු නො කියැයුතු මැ යැ.

3. ස. පු: අනන්තරාප්‍රයුක්ත (අනියතාණත්තිකල) පුද්ගලයා සම්‍යක්ත්වනියාමයට බැසගන්නට අභව්‍ය වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: (ඔහු විසින්) මවු දිවි තොර කරන ලදු ද, පියේ දිවි තොර කරන ලද්දේ ද, රහත් දිවි තොර කරන ලද්දේද, දුෂ්ට චිත්තයෙන් තථාගතයන් වහන්සේගේ සිරුරෙහි ලෙහෙ සලන ලද්දේ ද, සඞ්ඝයා බිඳින ලද ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

4. ස. පු: අනන්තරාපයුත්තො පුග්ගලො තං කම්මං පටිසංහරිත්වා කුක්කුච්චං පටිවිනොදෙත්වා විප්පටිසාරියං පටිවිනෙත්වා[1] අභබ්බො සම්මත්තනියාමං ඔක්කමිතුන්ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: මාතා ජීවිතා වොරොපිතා පිතා ජීවිතා වොරොපිතො -පෙ- සඞ්ඝො භින්නො'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

5. ස. පු: අනන්තරාපයුත්තො පුග්ගලො තං කම්මං පටිසංහරිත්වා කුක්කුච්චං පටිවිනොදෙත්වා විප්පටිසාරියං පටිවිනෙත්වා[1] අභබ්බො සම්මත්තනියාමං ඔක්කමිතුන්ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: නනු තං කම්මං පටිසංහතං[2] කුක්කුච්චං පටිවිනොදිතං විප්පටිසාරියං පටිවිනීතන්ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

අනු. ථ: හඤ්චි තං කම්මං පටිසංහතං[2] කුක්කුච්චං පටිවිනොදිතං විප්පටිසාරියං පටිවිනීතං,

අනු. පා: නො ච වත රෙ වත්තබ්බෙ "අනන්තරාපයුත්තො පුග්ගලො තං කම්මං පටිසංහරිත්වා කුක්කුච්චං පටිවිනොදෙත්වා විප්පටිසාරියං පටිවිනෙත්වා අභබ්බො සම්මත්තනියාමං ඔක්කමිතු"න්ති.

6. ප. පු: අනන්තරාපයුත්තො පුග්ගලො සම්මත්තනියාමං ඔක්කමෙය්‍යා'ති.

ස. පටිඤ්ඤා: ආමන්තා.

ප. අනු: නනු තං කම්මං පයුත්තො ආසී'ති.

ස. පටිඤ්ඤා: ආමන්තා.

අනු. ථ: හඤ්චි තං කම්මං පයුත්තො ආසි,[2]

අනු. පා: නො ච වත රෙ වත්තබ්බෙ "අනන්තරාපයුත්තො පුග්ගලො සම්මත්තනියාමං ඔක්කමෙය්‍යා"ති.

අනන්තරාපයුත්තකථා නිට්ඨිතා.

1. පටිවිනොදෙත්වා - සීමු, PTS.
2. පටිසංහටං - මජසං, සහ

4. ස. පු: අනන්තරාප්‍රයුක්ත පුද්ගලයා ඒ අනියතාණත්ති-කර්මය හකුළුවා කුකුස් දුරු කොට විපිළිසර බැහැර කොට සම්‍යක්ත්වනියාමයට බැසගන්නට අභව්‍ය වේ ද?

ප. පටික්ඛෙප: එසේ යැ.

ස. අනු: (ඔහු විසින්) මව දිවි තොර කරනලදු ද? පියේ දිවි තොර කරන ලද්දේ ද ... සඞ්ඝයා බිඳින ලද්දේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

5. ස. පු: අනන්තරාප්‍රයුක්ත පුද්ගලයා ඒ කර්මය හකුළුවා කුකුස් දුරු කොට විපිළිසර බැහැර කොට සම්‍යක්ත්වනියාමයට බැසගන්නට අභව්‍ය වේ ද?

ප. පටික්ඛෙප: එසේ යැ.

ස. අනු: ඒ කර්මය හකුළුවන ලද්දේ නො වේ ද? කුකුස දුරු කරන ලද්දේ නො වේ ද, විපිළිසර බැහැර කරන ලද්දේ නො වේ ද?

ප. පටික්ඛෙප: එසේ ය.

අනු. ඨා: ඉදින් ඒ කර්මය හකුළුවනලද වේ නම්, කුකුස් දුරු කරන ලද වේ නම්, විපිළිසර බැහැර කරන ලද වේ නම්,

අනු. පා: භවත 'අනන්තරාප්‍රයුක්ත පුද්ගලයා ඒ කර්මය හකුළුවා කුකුස් දුරු කොට විපිළිසර බැහැර කොට සම්‍යක්ත්වනියාමයට බැසගන්නට අභව්‍ය වෙයි' යනු නො කියැයුතු මැ යැ.

6. ප. පු: අනන්තරාප්‍රයුක්ත පුද්ගලයා සම්‍යක්ත්වනියාමයට බැසගන්නේ වේ ද?

ස. පටික්ඛෙප: එසේ යැ.

ප. අනු: ඒ ආනන්තර්‍යය කර්මය ප්‍රයුක්ත වූයේ නො?

ස පටික්ඛෙප: එසේ යැ.

අනු. ඨා: ඉදින් ඒ කර්මය ප්‍රයුක්ත වී නම්,

අනු. පා: භවත, 'අනන්තරාප්‍රයුක්ත පුද්ගලයා සම්‍යක්ත්ව-නියාමයට බැසගන්නේ යැ' යනු නො කියැයුතු මැ යැ.

අනන්තරාපයුත්තකථා නිමි.

## 13. 4.

# නියතස්ස නියාමකථා.

1. ස. පු: නියතො නියාමං ඔක්කමතී'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: මිච්ඡත්තනියතො සම්මත්තනියාමං ඔක්කමති, සම්මත්තනියතො මිච්ඡත්තනියාමං ඔක්කමතී'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

2. ස. පු: නියතො නියාමං ඔක්කමතී'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: පුබ්බෙ මග්ගං භාවෙත්වා පච්ඡා නියාමං ඔක්කමතී'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

ස. අනු: පුබ්බෙ සොතාපත්තිමග්ගං භාවෙත්වා පච්ඡා සොතාපත්තිනියාමං ඔක්කමතී'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

ස. අනු: පුබ්බෙ සකදාගාමිමග්ගං -පෙ- අනාගාමිමග්ගං -පෙ- අරහත්තමග්ගං භාවෙත්වා පච්ඡා අරහත්තනියාමං ඔක්කමතී'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

ස. අනු: පුබ්බෙ සතිපට්ඨානං -පෙ- සම්මප්පධානං -පෙ- ඉද්ධිපාදං -පෙ- ඉන්ද්‍රියං -පෙ- බලං -පෙ- බොජ්ඣඞ්ගං භාවෙත්වා පච්ඡා නියාමං ඔක්කමතී'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

3. ප. පු: න වත්තබ්බං නියතො නියාමං ඔක්කමතී'ති.

ස. පටිඤ්ඤා: ආමන්තා.

ප. අනු: භබ්බො බොධිසත්තො තාය ජාතියා ධම්මං නාභිසමෙතුන්ති.

ස. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

ප. ආ: තෙන හි "නියතො නියාමං ඔක්කමතී"ති.

**නියතස්ස නියාමකථා නිට්ඨිතා.**

## 13. 4.

# නියතස්ස නියාමකථා.

[නියාමය දෙපරිදි වෙයි. එහි ආනන්තර්‍ය්‍ය කර්‍මය මිථ්‍යාත්වනියාම වෙයි. ආර්‍ය්‍යමාර්‍ගය සම්‍යක්ත්වනියාමය වෙයි. මේ නියාමධර්‍ම දෙක හැර අන්‍ය නියාමයෙක් නැත. සියලු ත්‍රෛභූමකධර්‍මයෝ අනියතයහ. එයින් යුක්ත වූයේත් අනියත ම වෙයි. බුදුවරුන් විසින් තමන්ගේ ඥානබලයෙන් 'මේ සත්ත්වයා අනාගතයෙහි බුදු වෙති'යි ව්‍යාකෘත වූ බෝධිසත්ත්ව තෙමේ අත්‍යන්ත පින් ඇති හෙයින් නියත'යයි කියනු ලැබේ. මේ ව්‍යවහාර මාත්‍රය ගෙන 'පශ්චිමභවික බෝධිසත්ත්වයා ධර්‍මාභිසමයට භව්‍යය'යි යන අදහසින් 'නියත වූයේ ආර්‍ය්‍යමාර්‍ගී නියාමයට බැස ගන්නේ වේ ය'යි පූර්‍වශෛලීය අපරශෛලීය නිකායවාසීන් සෙයින් ලබ්ධි ගත්තවුන්ගේ වාද බිඳුනම 'නියතස්ස නියාමකථා' එයි ]

1. ස. පු: නියත වූ සත්ත්වයා නියාමයට බැසගන්නේ වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: මිථ්‍යාත්වනියත සත්ත්වයා සම්‍යක්ත්වනියාමයට බැස ගන්නේ වේ ද? සම්‍යක්ත්වනියත සත්ත්වයා මිථ්‍යාත්වනියාමයට බැසගන්නේ වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

2. ස. පු: නියත සත්ත්වයා නියාමයට බැසගන්නේ වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: පෙර මාර්‍ගය භවා පසු වැ නියාමයට බැසගන්නේ වේ ද?

ප. පු: එසේ නො කියැයුතු යැ. ...

ස. අනු: පෙර ශ්‍රොතාපත්ති මාර්‍ගී භවා පසු වැ ශ්‍රොතාපත්ති නියාමයට බැසගන්නේ වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

ස. අනු: පෙර සෙදගැමි මග ... අනාගැමි මග ... රහත්මග භවා පසු වැ අග්‍රත්වනියාමයට බැසගන්නේ වේ ද?

ප. පු: එසේ නො කියැයුතු යැ ..

ස. අනු: පෙර සතිපට්ඨාන ... සම්‍යක්ප්‍රධාන ... ඍද්ධිපාද ... ඉන්ද්‍රිය ... බල ... බොධ්‍යඞ්ග භවා පසු වැ නියාමයට බැසගන්නේ වේ ද?

ප. පටි: එසේ නොකියැ යුතු යැ ...

3. ප. පු: 'නියත සත්ත්වයා නියාමයට බැසගන්නේ ය'යි නො කියැයුතු වේ ද?

ස. පටිඤ්ඤා: එසේ යැ.

ප. අනු: බොධිසත්ත්ව තෙමේ ඒ ජාතියෙහි ධර්‍මාභිසමයට භව්‍ය නොවන්නේ වේ ද?

ස. පටි: එසේ නො කියැයුතු යැ ...

ප. ආ. එහෙයින් නියතසත්ත්වයා නියාමධර්‍මයට බැස-ගන්නේ යැ.

නියතස්ස නියාමකථා නිමි.

13. 5.

# නිවුතකථා

1. ස. පු: නිවුතො නීවරණං ජහතී'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා

ස. අනු: රත්තො රාගං ජහති දුට්ඨො දොසං ජහති මූළ්හො මොහං ජහති කිලිට්ඨො කිලෙසෙ ජහතී'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

ස. අනු: රාගෙන රාගං ජහති, දොසෙන දොසං ජහති මොහෙන මොහං ජහති, කිලෙසෙහි කිලෙසෙ ජහතී'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

2. ස. පු: රාගො චිත්තසම්පයුත්තො, විරාගො චිත්තසම්පයුත්තො'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: ද්වින්නං ඵස්සානං -පෙ- ද්වින්නං චිත්තානං සමොධානං හොතී'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

3. ස. පු: රාගො අකුසලො, විරාගො කුසලො'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: කුසලාකුසලා සාවජ්ජානවජ්ජා හීනප්පණීතා කණ්හසුක්කසප්පටිභාගා ධම්මා සම්මුඛීභාවං ආගච්ඡන්තී'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

4. ස. පු: කුසලාකුසලා සාවජ්ජානවජ්ජා හීනප්පණීතා කණ්හසුක්කසප්පටිභාගා ධම්මා සම්මුඛීභාවං ආගච්ඡන්තී'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

## 13. 5.

# නිවුතකථා.

['ශුද්ධපුද්ගලයාහට ශුද්ධිකෘත්‍ය නැති බැවින් නීවරණයෙන් නිවෘත වූයේ (වෙළුණු පුද්ගලයා) නීවරණ දුරු කෙරේ' යයි උත්තරාපථකයන් සෙයින් ලබ්ධි ගත්තවුන්ගේ වාද බිඳුනම 'නිවුතකථා' එයි ]

1\. ස. පු: නීවරණයෙන් නිවෘත වූයේ නීවරණ හැරපියන්නේ වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: රක්ත වූයේ රාගය හැරපියා ද? දුෂ්ට වූයේ ද්වෙෂය හැරපියා ද? මූඪ වූයේ මොහය හැරපියා ද? ක්ලිෂ්ට වූයේ ක්ලෙශ හැරපියා ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

ස. අනු: රාගයෙන් රාගය හැරපියා ද? ද්වෙෂයෙන් ද්වෙෂය හැරපියා ද? මොහයෙන් මොහය හැරපියා ද? ක්ලේශයෙන් ක්ලේශය හැරපියා ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ....

2\. ස. පු: රාගය චිත්තසම්ප්‍රයුක්ත වේ ද? මාර්ගය චිත්තසම්ප්‍රයුක්ත වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: ස්පර්ශයන් දෙදෙනකුන්ගේ .. චිත්තයන් දෙදෙනකුන්ගේ සමවධාන වේ ද?

ප පටි: එසේ නො කියැයුතු යැ ....

3\. ස. පු: රාගය අකුශල වේ ද? මාර්ගය කුශල වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: කුශලාකුශල, සාවද්‍යානවද්‍ය, හීනප්‍රණීත, කෘෂ්ණශුක්ලසප්‍රතිභාග ධර්මයෝ සම්මුඛීභාවයට එද් ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ. ...

4\. ස. පු: කුශලාකුශල, සාවද්‍යානවද්‍ය, හීනප්‍රණීත, කෘෂ්ණශුක්ලසප්‍රතිභාග ධර්මයෝ සම්මුඛීභාවයට එත් ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: නනු වුත්තං භගවතා "චත්තාරිමානි භික්ඛවෙ සුවිදූරවිදූරානි කතමානි චත්තාරි: නභඤ්ච භික්ඛවෙ පථවී ච ඉදං පඨමං සුවිදූරවිදූරං -පෙ- තස්මා සතං ධම්මො අසබ්භි ආරකා'ති.a අත්ථෙව සුත්තන්තො'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. ආ: තෙන හි න වත්තබ්බං "කුසලාකුසලා -පෙ- සම්මුඛීභාවං ආගච්ඡන්තී"ති.

5. ස. පු: නිවුතො නීවරණා ජහතී'ති

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: නනු වුත්තං භගවතා "සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ ආසවානං ඛයඤාණාය චිත්තං අභිනින්නාමෙතී"ති.b අත්ථෙ'ව සුත්තන්තො'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. ආ: තෙන හි න වත්තබ්බං "නිවුතො නීවරණා ජහතී"ති.

6 ප. පු: න වත්තබ්බං නිවුතො නීවරණං ජහතී'ති.

ස. පටිඤ්ඤා: ආමන්තා.

ප. අනු: නනු වුත්තං භගවතා "තස්ස එවං ජානතො එවං පස්සතො කාමාසවා'පි චිත්තං විමුච්චති -පෙ- අවිජ්ජාසවා'පි චිත්තං විමුච්චතී"ති.c අත්ථෙව සුත්තන්තො'ති.

ස. පටිඤ්ඤා: ආමන්තා.

ප. ආ: තෙන හි නිවුතො නීවරණං ජහතී"ති.

නිවුතකථා නිට්ඨිතා

---

a. චතුක්කඞ්ගුත්තර - රොහිතස්සවග්ග

b c. දීඝනිකාය - සාමඤ්ඤඵලසුත්ත.

ස. අනු: භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරනලද මැ නු, "මහණෙනි, මේ සුවිදූරවිදූරයෝ සතර දෙනෙකි. කවර සතර දෙනෙක යත්: මහණෙනි, අහසත් පොළොවත් යන මේදෙක පළමු වන සුවිදූර විදූරය යි. ... එහෙයින් සත්පුරුෂයන්ගේ ධර්මය අසත්පුරුෂයන් කෙරෙන් දුරු වේ" යයි වදාළ සූත්‍රාන්තයෙක් ඇත්තේ මැ නො?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. ආ: එකරුණින් 'කුශලාකුශල ... ධර්මයෝ සම්මුඛීභාවයට එති'යි නො කියැයුතු මැ යැ,

5. ස. පු: නිවෘත වූයේ නීවරණ හැරපියන්නේ වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරන ලද මැ නු: "හේ මෙසේ සමාහිත සිත පරිශුද්ධ වූ කල්හි පර්‍යවදාත වූ කල්හි අනඞ්ගණ වූ කල්හි විගතොපක්ලේශ වූ කල්හි මෘදු වූ කල්හි කර්මණ්‍ය වූ කල්හි ස්ථිතිප්‍රාප්ත කල්හි අකම්ප්‍යභාවයට පැමිණි කල්හි ආශ්‍රවක්ෂයඥානය පිණිස සිත නමන්නේ යැ"යි වදාළ සූත්‍රාන්තයෙක් ඇත්තේ මැ නො?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. ආ: එකරුණින් 'නිවෘත වූයේ නීවරණ හැරපියා'යි නො කියැයුතු මැ යැ.

6. ප. පු: 'නිවෘත වූයේ නීවරණ හැරපියන්නේ වේ" යයි නො කියැයුතු වේ ද?

ස. පටිඤ්ඤා: එසේ යැ

ප. අනු: භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරනලද මැ නු: "මෙසේ දන්නා මෙසේ දක්නා ඔහට කාමාශ්‍රවයෙනුදු සිත මිදෙයි ... අවිද්‍යාශ්‍රවයෙනුදු සිත මිදේ" යයි වදාළ සූත්‍රාන්තයෙක් ඇත්තේ මැ නු.

ස. පටිඤ්ඤා: එසේ යැ.

ප. ආ: එකරුණින් නිවෘත වූයේ නීවරණ හැරපියන්නේ වෙයි.

(සූත්‍රපාඨයෙන් දක්වෙන්නේ ආශ්‍රවක්ෂය මිස නිවෘතයාගේ නීවරණ හැරලීමෙක් නොවේ. එහෙයින් අසාධකයි.)

**නිවුතකථා නිමි.**

## 13. 6.

# සම්මුඛීභූතකථා.

1\. ස. පු: සම්මුඛීභූතො සඤ්ඤොජනං ජහතී'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: රත්තො රාගං ජහති, දුට්ඨො දොසං ජහති, මූළ්හො මොහං ජහති, කිලිට්ඨො කිලෙසෙ ජහතී'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

ස. අනු: රාගෙන රාගං ජහති, දොසෙන දොසං ජහති මොහෙන මොහං ජහති, කිලෙසෙහි කිලෙසෙ ජහතී'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

2\. ස. පු: රාගො චිත්තසම්පයුත්තො, මග්ගො චිත්තසම්පයුත්තො'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස අනු: ද්වින්නං ඵස්සානං -පෙ- ද්වින්නං චිත්තානං සමොධානං හොතී'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

3 ස. පු: රාගො අකුසලො, මග්ගො කුසලො'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: කුසලාකුසලා සාවජ්ජානවජ්ජා හීනප්පණීතා කණ්හසුක්කසප්පටිභාගා ධම්මා සම්මුඛීභාවං ආගච්ඡන්තී'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

4\. ස. පු: කුසලාකුසලා -පෙ- සම්මුඛීභාවං ආගච්ඡන්තී'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

## 13. 6.

# සම්මුඛීභූතකථා

[මෙහි නිදානය ද නිවුතකථායෙහි මෙනි.]

| | |
|---|---|
| 1. ස. පු: | (සංයොජනයන්ගේ) සම්මුඛීභාවයට පැමිණියේ සංයොජන හැරපියන්නේ වේ ද? |
| ප. පටික්ඛෙපය: | එසේ යැ |
| ස. අනු: | රක්ත වූයේ රාගය හැරපියා ද? දුෂ්ට වූයේ ද්වේෂය හැරපියා ද? මූඪ වූයේ මෝහය හැරපියා ද? ක්ලිෂ්ට වූයේ ක්ලෙශයන් හැරපියා ද? |
| ප. පටි: | එසේ නො කියැයුතු යැ ... |
| ස. අනු: | රාගයෙන් රාගය හැරපියා ද? ද්වේෂයෙන් ද්වේෂය හැරපියා ද? මෝහයෙන් මෝහය හැරපියා ද? ක්ලේශයෙන් ක්ලේශයන් හැරපියා ද? |
| ප. පටි: | එසේ නො කියැයුතු යැ ... |
| 2. ස. පු: | රාගය චිත්තසම්ප්‍රයුක්ත යැ. මාර්ගය චිත්ත-සම්ප්‍රයුක්ත වේ ද? |
| ප. පටික්ඛෙපය: | එසේ යැ. |
| ස. අනු: | ස්පර්ශයන් දෙදෙනකුන්ගේ .. චිත්තයන් දෙදෙන-කුන්ගේ සමවධාන වේ ද? |
| ප. පටි: | එසේ නො කියැයුතු යැ ... |
| 3. ස. පු: | රාගය අකුශල යැ, මාර්ගය කුශල වේ ද? |
| ප. පටික්ඛෙපය: | එසේ යැ. |
| ස. අනු: | කුශලාකුශල වූ සාවද්‍යානවද්‍ය වූ හීනප්‍රණීත වූ කෘෂ්ණශුක්ලසප්‍රතිභාග වූ ධර්මයෝ සම්මුඛීභාවයට පැමිණෙත් ද? |
| ප. පටි: | එසේ නො කියැයුතු යැ ... |
| 4. ස. පු: | කුශලාකුශල වූ ... ධර්මයෝ සම්මුඛීභාවයට පැමිණෙත් ද? |
| ප. පටික්ඛෙපය: | එසේ යැ. |

ස. අනු: නනු වුත්තං භගවතා "චත්තාරිමානි භික්ඛවෙ සුවිදූරවිදූරානි. කතමානි චත්තාරි: නභඤ්ච භික්ඛවෙ පඨවී ච, ඉදං පඨමං සුවිදූරවිදූරං -පෙ- තස්මා සතං ධම්මො අසබ්භි ආරකා"ති.a අත්ථෙව සුත්තන්තො'ති

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. ආ: තෙන හි වත්තබ්බං "කුසලාකුසලා -පෙ- සම්මුඛීභාවං ආගච්ඡන්තී"ති.

5. ස. පු: සම්මුඛීභූතො සඤ්ඤොජනං ජහතී'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු. නනු වුත්තං භගවතා "සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ -පෙ- ආසවානං ඛයඤාණාය චිත්තං අභිනින්නාමෙතී"ති.b අත්ථෙව සුත්තන්තො'ති.

ප. පටි: ආමන්තා.

ස. ආ: තෙන හි න වත්තබ්බං "සම්මුඛීභූතො සඤ්ඤොජනං ජහතී'ති.

6. ප. පු: න වත්තබ්බං "සම්මුඛීභූතො සඤ්ඤොජනං ජහතී"ති.

ස. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: නනු වුත්තං භගවතා: තස්ස එවං ජානතො එවං පස්සතො කාමාසවා'පි චිත්තං විමුච්චති -පෙ- අවිජ්ජාසවා'පි චිත්තං විමුච්චතී"ති.c අත්ථෙ'ව සුත්තන්තො'ති.

ස. පටි: ආමන්තා.

ප. ආ: තෙන හි සම්මුඛීභූතො සඤ්ඤොජනං ජහතී"ති.

සම්මුඛීභූතකථා නිට්ඨිතා.

---

a. චතුක්කඞ්ගුත්තර - රොහිතස්සවග්ග

b. දීඝනිකාය සාමඤ්ඤඵලසුත්ත.

c. දීඝනිකාය - සාමඤ්ඤඵලසුත්ත.

ස. අනු: භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරන ලද මැනු: "මහණෙනි, මේ සුවිදූරවිදූරස්ථානයෝ සතර දෙනෙකි. කවර සතර දෙනෙක යත්: මහණෙනි, අහස හා පොළොව හා මේ පළමු වන සුවිදූර-. විදූරස්ථාන යි ... එහෙයින් සත්පුරුෂයන්ගේ ධර්මය අසත්පුරුෂයන් කෙරෙන් දුරු යැ"යි වදාළ සූත්‍රාන්තයෙක් ඇත්තේ මැනු?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අා: එකරුණින් 'කුශලාකුශල වූ ... ධර්මයෝ සම්මුඛි-භාවයට එති'යි නො කියැයුතු යැ ...

5. ස පු: සංයෝජනයන්ගේ සම්මුඛිභාවයට පැමිණියේ සංයෝජන හැරපියා ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරනලද මැ නු:

"හේ මෙසේ සමාහිත චිත්තය පරිශුද්ධ වත් මැ ... ආස්‍රවක්ෂයඥානය පිණිස චිත්තය නතු කෙරෙයි"යි වදාළ සූත්‍රාන්තයෙක් ඇත්තේ මැ නු?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අා: එකරුණින් 'සම්මුඛිභූත වූයේ සංයෝජන හරනේ යැ' යනු නො කියැ යුතු යැ.

6. ප. පු: 'සම්මුඛිභූත වූයේ සංයෝජන හරනේ යැ' යනු නො කියැයුතු වේ ද?

ස. පටිඤ්ඤා: එසේ යැ.

ප. අනු: භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරනලද මැ නු:

"මෙසේ දන්නා මෙසේ දක්නා ඔහුගේ සිත කාමාස්‍රව කෙරෙනුදු මිදෙයි ... අවිද්‍යාස්‍රව කෙරෙනුදු මිදේ"යයි වදාළ සූත්‍රාන්තයෙක් ඇත්තේ මැ නු?

ස. පටි: එසේ යැ.

ප. අා: එකරුණින් සම්මුඛිභූත වූයේ සංයෝජන හරනේ යැ.

සම්මුඛිභූතකථා නිමි.

13. 7.

## සමාපන්නො අස්සාදෙතිකථා.

1. ස. පු: සමාපන්නො අස්සාදෙති, ඣානනිකන්ති ඣානාරම්මණා'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: තං ඣානං තස්ස ඣානස්ස ආරම්මණන්ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

2. ස. පු: තං ඣානං තස්ස ඣානස්ස ආරම්මණන්ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: තෙන ඵස්සෙන තං ඵස්සං ඵුසති, තාය වෙදනාය තං වෙදනං වෙදෙති, තාය සඤ්ඤාය තං සඤ්ඤං ජානාති, තාය චෙතනාය තං චෙතනං චෙතෙති, තෙන චිත්තෙන තං චිත්තං චින්තෙති, තෙන විතක්කෙන තං විතක්කං විතක්කෙති, තෙන විචාරෙන තං විචාරං විචාරෙති, තාය පීතියා තං පීතිං පියායති, තාය සතියා තං සතිං සරති, තාය පඤ්ඤාය තං පඤ්ඤං පජානාතී'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

3. ස. පු: ඣානනිකන්ති චිත්තසම්පයුත්තා, ඣානං චිත්තසම්පයුත්තන්ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: ද්වින්නං ඵස්සානං -පෙ- ද්වින්නං චිත්තානං සමොධානං හොතී'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

4. ස. පු: ඣානනිකන්ති අකුසලං, ඣානං කුසලන්ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: කුසලාකුසලා සාවජ්ජානවජ්ජා හීනප්පණීතා කණ්හසුක්කසප්පටිභාගා ධම්මා සම්මුඛීභාවං ආගච්ඡන්තී'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

## 13. 7.

# සමාපන්නො අස්සාදෙති කථා.

[‘පඨමං ඣානං උපසම්පජ්ජ විහරති. සො තදස්සාදෙති- ප්‍රථමධ්‍යාන උපයා වාස කෙරෙයි. ඒ ධ්‍යානලාභී පුද්ගල එය ආස්වාද කෙරෙයි’ යනාදි වචන නිසා ‘සමවන්නේ ආස්වාද කෙරේ යයි ද, ඔහුගේ ඒ ධ්‍යානනිකාන්තිය ධ්‍යානාලම්බන වේ’ යයි ද අන්ධක නිකායවාසීන් සෙයින් ලබ්ධි ගත්තවුන්ගේ වාද බිඳුනම ‘සමාපන්නො අස්සාදෙති’ කථා එයි.]

1. ස. පු: සමවත්නේ ආස්වාද කෙරෙයි. ඒ ධ්‍යානනිකාන්තිය (ධ්‍යානාශාව) ධ්‍යානාලම්බන වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: ඒ ධ්‍යානය ඒ ධ්‍යානයට ආලම්බන වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

2. ස. පු: ඒ ධ්‍යානය ඒ ධ්‍යානයට ආලම්බන වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: ඒ ස්පර්ශයෙන් ඒ ස්පර්ශය ස්පර්ශ කෙරේ ද? ඒ වේදනායෙන් ඒ වේදනාව විඳුනේ වේ ද? ඒ සංඥයෙන් ඒ සංඥව දන්නේ වේ ද? ඒ චේතනායෙන් ඒ චේතනාව සිතා ද? ඒ චිත්තයෙන් ඒ චිත්තය චින්තන කෙරේ ද? ඒ විතර්කයෙන් ඒ විතර්කය තර්කණ කෙරේ ද? ඒ විචාරයෙන් ඒ විචාරය විචාරනා කෙරේ ද? ඒ ප්‍රීතියෙන් ඒ ප්‍රීතිය පියායනා කෙරේ ද? ඒ සමාධියෙන් ඒ සමාධිය සමරණ කෙරේ ද? ඒ ප්‍රඥයෙන් ඒ ප්‍රඥව දනී ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

3. ස. පු: ධ්‍යානනිකාන්තිය චිත්තසම්ප්‍රයුක්ත වේ ද, ධ්‍යානය චිත්තසම්ප්‍රයුක්ත වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: ස්පර්ශයන් දෙදෙනකුන්ගේ ... චිත්තයන් දෙදෙන-කුන්ගේ සමවධාන වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ..

4. ස. පු: ධ්‍යානනිකාන්තිය අකුශල යි. ධ්‍යානය කුශල වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: කුශලාකුශල වූ සාවද්‍යානවද්‍ය වූ හීනප්‍රණීත වූ කෘෂ්ණශුක්ල සප්‍රතිභාග වූ ධර්මයෝ සම්මුඛී භාව-යට එත් ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

5. ස. පු: කුසලාකුසලා සාවජ්ජානවජ්ජා හීනප්පණීතා කණ්හසුක්කසප්පටිභාගා ධම්මා සම්මුඛීභාවං ආගච්ඡන්තී'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: නනු වුත්තං භගවතා "චත්තාරිමානි භික්ඛවෙ සුවිදූරවිදූරානි. කතමානි චත්තාරි: නභඤ්ච භික්ඛවෙ පඨවී ච, ඉදං පඨමං සුවිදූර විදූරං -පෙ- තස්මා සතං ධම්මො අසබ්භි ආරකා"ති[1] අත්ථෙ'ව සුත්තන්තො'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. ආ: තෙන හි න වත්තබ්බං: කුසලාකුසලං සාවජ්ජානවජ්ජා හීනප්පණීතා කණ්හසුක්කසප්පටිභාගා ධම්මා සම්මුඛීභාවං ආගච්ඡන්තී'ති.

6. ප. පු: න වත්තබ්බං "සමාපන්නො අස්සාදෙති. ඣානනිකන්ති ඣානාරම්මණා"ති.

ස. පටිඤ්ඤා: ආමන්තා.

ප. අනු: නනු වුත්තං භගවතා "ඉධ භික්ඛවෙ භික්ඛු විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමං-ඣානං උපසම්පජ්ජ විහරති. සො තං අස්සාදෙති. තං නිකාමෙති. තෙන ච විත්තිං ආපජ්ජති. විතක්කවිචාරානං වූපසමා -පෙ- දුතියං ඣානං -පෙ- තතියං ඣානං -පෙ- චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති. සො තං අස්සාදෙති. තං නිකාමෙති. තෙන ච විත්තිං ආපජ්ජතී"ති[2] අත්ථෙ'ව සුත්තන්තො'ති.

ස. පටිඤ්ඤා: ආමන්තා.

ප. ආ: තෙන හි "සමාපන්නො අස්සාදෙති, ඣානනිකන්ති ඣානාරම්මණා"ති.

සමාපන්නො අස්සාදෙතිකථා නිට්ඨිතා.

---

1. චතුක්කඞ්ගුත්තර - රොහිතස්සවග්ග.

5. ස. පු: කුශලාකුශල වූ සාවද්‍යානවද්‍ය වූ හීනප්‍රණීත වූ කෘෂ්ණශුක්ල සප්‍රතිභාග වූ ධර්මයෝ සම්මුඛීභාවයට එත් ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරනලද මැ නු:

"මහණෙනි, මේ සුවිදූරවිදූරස්ථානයෝ සතර දෙනෙකි. කවර සතර දෙනෙක යත්: මහණෙනි, අහස හා පොළොව හා මේ පලමු වන සුවිදූරවිදූර ස්ථාන යි ... එහෙයින් සත්පුරුෂයන්ගේ ධර්මය අසත්පුරුෂයන් කෙරෙන් දුරු වෙයි"යි වදාළ සූත්‍රාන්තයෙක් ඇත්තේ මැ නු?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අ: එකරුණින් 'කුශලාකුශල වූ සාවද්‍යානවද්‍ය වූ හීනප්‍රණීත වූ කෘෂ්ණශුක්ලප්‍රතිභාග වූ ධර්මයෝ සම්මුඛීභාවයට එති'යි නො කියැයුතු මැ යැ.

6. ප. පු: 'සම්වත්තේ ආස්වාද කෙරෙයි. ඒ ධ්‍යානනිකාන්තිය ධ්‍යානාලම්බන වෙයි' යනු නො කියැයුතු වේ ද?

ස පටිඤ්ඤා: එසේ යැ.

ප. අනු: භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරන ලද මැ නු:

"මහණෙනි, මේ සස්නෙහි මහණ කාමයෙන් වෙන් වැ මැ අකුසල්දහමින් වෙන් වැ සවිතර්ක සවිචාර විවේකජ ප්‍රීතිසුඛ ඇති ප්‍රථමධ්‍යාන උපයා වාස කෙරෙයි. හේ ඒ දැහැන ආස්වාද කෙරෙයි. ඒ දැහැන කැමැති වෙයි. එයිනුදු ප්‍රීතියට පැමිණෙයි. විතර්කවිචාරයන්ගේ ව්‍යුපශමයෙන් ... ද්විතීයධ්‍යාන ... තෘතීයධ්‍යාන ... චතුර්ථධ්‍යාන උපයා වාස කෙරෙයි. හේ එය ආස්වාද කෙරෙයි. හේ ඒ කැමැති වෙයි. එයිනුදු ප්‍රීතියට පැමිණේ'යි වදාළ සූත්‍රාන්තයෙක් ඇත්තේ මැ නු?

ස. පටිඤ්ඤා: එසේ යැ.

ප. අ: එකරුණින් සමවත්තේ ආස්වාද කෙරෙයි ඒ ධ්‍යානනිකාන්තිය ධ්‍යානාලම්බන වෙයි.

(ධ්‍යානලාභියා ධ්‍යානයෙන් නැගීසිට ධ්‍යානාස්වාද කෙරෙයි. සම්වත්තුල ධ්‍යානනිකාන්තිය ධ්‍යානාලම්බන නොවෙයි. එහෙයින් අසාධකයි.)

සම්පයෝගකථා අස්සාදෙතිකථා නිමි.

## 13. 8.

# අසාතරාගකථා

1. ස. පු: අත්ථි අසාතරාගො'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: දුක්ඛාභිනන්දිනො සත්තා අත්ථි කෙචි දුක්ඛං පත්ථෙන්ති පිහෙන්ති එසන්ති ගවෙසන්ති පරියෙසන්ති, දුක්ඛං අජ්ඣොසාය තිට්ඨන්තී'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ.

ස. අනු: නනු සුඛාභිනන්දිනො සත්තා අත්ථි කෙචි සුඛං පත්ථෙන්ති පිහෙන්ති එසන්ති ගවෙසන්ති පරියෙසන්ති, සුඛං අජ්ඣොසාය තිට්ඨන්ති'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

අනු. ඨ: හඤ්චි සුඛාභිනන්දිනො සත්තා අත්ථි කෙචි සුඛං පත්ථෙන්ති පිහෙන්ති එසන්ති ගවෙසන්ති පරියෙසන්ති, සුඛං අජ්ඣොසාය තිට්ඨන්ති,

අනු. පා: නො ච වත රෙ වත්තබ්බෙ: අත්ථි අසාතරාගො'ති.[1]

2. ස. පු: අත්ථි අසාතරාගො'ති.[1]

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: දුක්ඛාය වෙදනාය රාගානුසයො අනුසෙති, සුඛාය වෙදනාය පටිඝානුසයො අනුසෙතී'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ.

ස. අනු: නනු සුඛාය වෙදනාය රාගානුසයො අනුසෙති, දුක්ඛාය වෙදනාය පටිඝානුසයො අනුසෙතී'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

---

1. අසාතරාගොති - සිමු.

## 13. 8.

# අසාතරාගකථා.

[‘යං කිඤ්චි වෙදනං වෙදියති සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා, සො තං වෙදනං අභිනන්දති අභිවදති - සුඛ වේවයි දුඃඛ වේවයි අදුඃඛාසුඛ වේවයි යම් මැ වේදනාවක් විඳුනේ වේ ද, හේ ඒ වේදනාව අභිනන්දන කෙරෙයි. එයම ස්තුති කෙරෙයි’ යන සූත්‍රපාඨයෙහි දෘෂ්ටි අභිනන්දන වශයෙන් වදාල ‘අභිනන්දති’ යන වචනය ගෙන දුඃඛ වේදනාව පිළිබඳවත් රාගාස්වාද වශයෙන් අභිනන්දනයෙක් ඇත්තු යි අසාතරාගය පිළිගත් උත්තරාපථකයන්ගේ වාද බිඳුනාම ‘අසාතරාග කථා’ එයි ]

1\. ස. පු: අසාතරාගය (දුඃඛවේදනායෙහි මේ වේදනා මට ඇත් නම් මැනැවැයි රජ්ජනායෙක්) ඇද්ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: දුක පතන කැමැති වන සොයන ගවේෂණය කරණ පර්‍යේෂණ කරණ, දුකෙහි බැස සිටුනා දුක අභිනන්දනා කරන යම් මැ සත්ත්ව කෙනෙක් ඇද්ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

ස. අනු: සුව පතන කැමැති වන එෂණා ගවේෂණා පර්‍යේෂණා කරන සුවයෙහි බැස සිටුනා සුවය අභිනන්දනා කරන යම් මැ සත්ත්ව කෙනෙක් ඇත්තාහු නො?

ප. පටිඤ්ඤා: එසේ යැ.

අනු. ඨ: ඉදින් සුව පතන කැමැති වන එෂණා ගවේෂණා පර්‍යේෂණා කරන සුඛයෙහි බැසසිටුනා සුඛය අභිනන්දනා කරන යම් මැ සත්ත්ව කෙනෙක් ඇත්තාහු නම්,

අනු. පා: භවත, ‘අසාතරාගයෙක් ඇත’ යනු නො කියායුතු මැ යැ.

2\. ස. පු: අසාතරාගයෙක් ඇද්ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: (තොප මතයෙහි,) දුඃඛවේදනායෙහි රාගානුශය ලුහුබඳී, සුඛවේදනායෙහි ප්‍රතිඝානුශය ලුහුබඳනේ වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ.

ස. අනු: සුඛවේදනායෙහි රාගානුශය ලුහුබඳනේ දුඃඛ-වේදනායෙහි ප්‍රතිඝානුශය ලුහුබඳනේ නො වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

අනු. ඨ: යඤ්ච සුඛාය වේදනාය රාගානුසයෝ අනුසෙති, දුක්ඛාය වේදනාය පටිඝානුසයෝ අනුසෙති,

අනු. පා: තේන ච වත රේ වත්තබ්බේ "අත්ථි අසාතරාගෝ"ති.

8\. ප. පු: න වත්තබ්බං "අත්ථි අසාතරාගෝ"ති.

ස. පටිඤ්ඤා: ආමන්තා.

ප. අනු: නනු වුත්තං භගවතා "සෝ එවං අනුරෝධ-විරෝධං සමාපන්නෝ යං කිඤ්චි වේදනං වේදියති.[1] සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා, සෝ තං වේදනං අභිනන්දති අභිවදති අජ්ඣෝසාය තිට්ඨතී"ති[2] අත්ථේව සුත්තන්තෝ'ති.

ස. පටිඤ්ඤා: ආමන්තා.

ප. ආ: තේන හි 'අත්ථි අසාතරාගෝ'ති.

අසාතරාගකථා නිට්ඨිතා.

---

1. වේදයති - මජසං.
2. මජ්ඣිමනිකාය මූලපණ්ණාස - මහාතණ්හාසඞ්ඛයසුත්ත.

අනු. ථෙ: ඉදින් සුඛවේදනායෙහි රාගානුශය ලුහුබඳතේ වේ නම්, දුඃඛවේදනායෙහි ප්‍රතිඝානුශය ලුහුබඳතේ වේ නම්,

අනු. පා: භවත, 'අසාතරාගයෙක් ඇත,' යනු නො කියැයුතු මැ යෑ.

8. ප. පු: 'අසාතරාගයෙක් ඇත' යනු නො කියැයුතු වේ දෑ?

ස. පටිඤ්ඤා: එසේ යෑ.

ප. අනු: භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරන ලද මැ නු? "හේ මෙසේ අනුරොධවිරොධයට පැමිණියේ සුඛ වේවයි දුඃඛ වේවයි අදුඃඛාසුඛ වේවයි යම් මැ වේදනාවක් විඳුතේ වේ ද, හේ ඒ වෙදනාව අභිනන්දන කෙරෙයි, බෙණෙයි, බැසගෙන සිටී" යයි වදාළ සූත්‍රාන්තයෙක් ඇත්තේ මැ නු?

ස. පටිඤ්ඤා: එසේ යෑ.

පටි. ආ: එකරුණින් 'අසාතරාගයෙක් ඇත'.

(දිට්ඨිමඤ්ඤනා වසයෙන් දුඃඛවෙදනා අභිනන්දන කෙරෙයි. එය අසාතරාගයට සාධක නො වේ.)

අසාතරාගකථා නිමි.

13. 9.

## ධම්මතණ්හා අබ්‍යාකතාති කථා.

1. ස. පු: ධම්මතණ්හා අබ්‍යාකතා'ති.
ප. පටිඤ්ඤා: ආමන්තා.
ස. අනු: විපාකාබ්‍යාකතා කිරියාබ්‍යාකතා, රූපං නිබ්බානං චක්ඛායතනං -පෙ- ඵොට්ඨබ්බායතන'න්ති.
ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

2. ස. පු: ධම්මතණ්හා අබ්‍යාකතා'ති.
ප. පටිඤ්ඤා: ආමන්තා.
ස. අනු: රූපතණ්හා අබ්‍යාකතා'ති.
ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

3. ස. පු: ධම්මතණ්හා අබ්‍යාකතා'ති.
ප. පටිඤ්ඤා: ආමන්තා.
ස. අනු: සද්දතණ්හා -පෙ- ගන්ධතණ්හා -පෙ- රසතණ්හා -පෙ- ඵොට්ඨබ්බතණ්හා අබ්‍යාකතා'ති.
ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

4. ස. පු: රූපතණ්හා අකුසලා'ති.
ප. පටිඤ්ඤා: ආමන්තා.
ස. අනු: ධම්මතණ්හා අකුසලා'ති.
ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

5. ස. පු: සද්දතණ්හා -පෙ- ඵොට්ඨබ්බතණ්හා අකුසලා'ති
ප. පටිඤ්ඤා: ආමන්තා.
ස. අනු: ධම්මතණ්හා අකුසලා'ති.
ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

6. ස. පු: ධම්මතණ්හා අබ්‍යාකතා'ති.
ප. පටිඤ්ඤා: ආමන්තා.

## 13. 9.

# ධම්මතණ්හා අබ්‍යාකතාතිකථා.

['රූපාදි සවදරුම් තෘෂ්ණා කෙරෙහි හැමට පසු තෘෂ්ණාව යම් හෙයෙකින් 'ධම්මතණ්හා' යි කියන ලද ද, එහෙයින් 'ධර්මතෘෂ්ණාව අව්‍යාකෘතය'යි පූර්වශෛලීය නිකායවාසීන් සෙසින් ලබ්ධි ගත්තවුන්ගේ වාද බිඳුනට 'ධම්මතණ්හා අබ්‍යාකතාති කථා' එයි.]

1. ස. පු: ධර්මතෘෂ්ණා (මනොද්වාරයෙන් සිතවන් අරමුණු කෙරෙහි තෘෂ්ණාව) අව්‍යාකෘත වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: විපාකයෝ අව්‍යාකෘත වෙති, ක්‍රියා අව්‍යාකෘත යැ, රූපය නිර්වාණය චක්ෂුරායතනය ... සප්‍රෂ්ටව්‍යායතනය අව්‍යාකෘත වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

2. ස. පු: ධර්මතෘෂ්ණා අව්‍යාකෘත වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: රූපතෘෂ්ණා අව්‍යාකෘත වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

3. ස. පු: ධර්මතෘෂ්ණා අව්‍යාකෘත වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: ශබ්දතෘෂ්ණා ... ගන්ධතෘෂ්ණා ... රසතෘෂ්ණා සප්‍රෂ්ටව්‍යතෘෂ්ණා අව්‍යාකෘත වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

4. ස. පු: රූපතෘෂ්ණා අකුශල වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: ධර්මතෘෂ්ණා අකුශල වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ. ...

5. ස. පු: ශබ්දතෘෂ්ණා ... සප්‍රෂ්ටව්‍යතෘෂ්ණා අකුශල වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: ධර්මතෘෂ්ණා අකුශල වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

6. ස. පු: ධර්මතෘෂ්ණා අව්‍යාකෘත වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: නනු තණ්හා අකුසලා වුත්තා භගවතා'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. ඨ: හඤ්චි තණ්හා අකුසලා වුත්තා භගවතා,

ස. පා: නො ච වත රෙ, වත්තබ්බෙ ධම්මතණ්හා අබ්‍යාකතා'ති.

7. ස. පු: ධම්මතණ්හා අබ්‍යාකතා'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: නනු ලොභො අකුසලො වුත්තො භගවතා, ධම්මතණ්හා ලොභො'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. ඨ: හඤ්චි ලොභො අකුසලො වුත්තො භගවතා, ධම්මතණ්හා ලොභො,

අනු. පා: නො ච වත රෙ, වත්තබ්බෙ 'ධම්මතණ්හා අබ්‍යාකතා'ති.

8. ස. පු: ධම්මතණ්හා ලොභො අබ්‍යාකතො'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: රූපතණ්හා ලොභො අබ්‍යාකතො'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

9. ස. පු: ධම්මතණ්හා ලොභො අබ්‍යාකතො'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: සද්දතණ්හා -පෙ- ගන්ධතණ්හා -පෙ- රසතණ්හා -පෙ- ඵොට්ඨබ්බතණ්හා ලොභො අකුසලො'ති

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

10. ස. පු: සද්දතණ්හා -පෙ- ඵොට්ඨබ්බතණ්හා ලොභො අකුසලො'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: ධම්මතණ්හා ලොභො අකුසලො'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

ස. අනු: භාග්‍යවතුන් වහන්සේ විසින් තෘෂ්ණා අකුශල යයි වදාරනලද නොහ?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. ඨ: ඉදින් භාග්‍යවතුන් වහන්සේ විසින් තෘෂ්ණා අකුශල යයි වදාරනලද නම්,

ස. පා: හවත 'ධර්මතෘෂ්ණා අව්‍යාකෘත වේ ය'යි නො කියැයුතු මැ යැ.

7. ස. පු: ධර්මතෘෂ්ණා අව්‍යාකෘත වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ:

ස. අනු: භාග්‍යවතුන් වහන්සේ විසින් 'ලෝභය අකුශල යයි වදාරනලද නො, ධර්මතෘෂ්ණා ලොභ වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. ඨ: ඉදින් භාග්‍යවතුන් වහන්සේ විසින් ලොභය අකුශල යයි වදාරනලද වේ නම්, ධර්මතෘෂ්ණාත් ලොභ වේ නම්,

අනු. පා: හවත "ධර්මතෘෂ්ණා අව්‍යාකෘත වේ ය'යි නො කියැයුතු මැ යැ.

8. ස. පු: ධර්මතෘෂ්ණාව ලෝභ වූයේ අව්‍යාකෘත වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: රූපතෘෂ්ණාව ලෝභ වූයේ අව්‍යාකෘත වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

9 ස. පු. ධර්මතෘෂ්ණා ලෝභ වූයේ අව්‍යාකෘත වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: ශබ්දතෘෂ්ණා ... ගන්ධතෘෂ්ණා .. රසතෘෂ්ණා ... ස්ප්‍රෂ්ටව්‍යතෘෂ්ණා ලොභ වූයේ අව්‍යාකෘත වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

10. ස. පු: ශබ්දතෘෂ්ණා ... ස්ප්‍රෂ්ටව්‍යතෘෂ්ණා ලොභ වූයේ අකුශල වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: ධර්මතෘෂ්ණා ලෝභ වූයේ අකුශල වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

**11.** ස. පු: ධම්මතණ්හා අබ්‍යාකතා'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: නනු වුත්තං භගවතා: "යායං තණ්හා පොනොභවිකා[1] නන්දිරාගසහගතා තත්‍රතත්‍රාභිනන්දිනී සෙය්‍යථීදං: කාමතණ්හා භවතණ්හා විභවතණ්හා"ති[2] අත්ථෙව සුත්තන්තො'ති.

ප. පටිඤ්ඤා. ආමන්තා.

ස. ආ: තෙන හි න වත්තබ්බං "ධම්මතණ්හා අබ්‍යාකතා"ති

**12.** ප. පු: න වත්තබ්බං "ධම්මතණ්හා අබ්‍යාකතා"ති.

ස. පටිඤ්ඤා: ආමන්තා.

ප. අනු: නනු සා ධම්මතණ්හා'ති.

ස. පටිඤ්ඤා: ආමන්තා.

අනු. ඨ: හඤ්චි සා ධම්මතණ්හා,

අනු. පා: තෙන වත රෙ වත්තබ්බෙ "ධම්මතණ්හා අබ්‍යාකතා"ති.

**ධම්මතණ්හා අබ්‍යාකතාතිකථා නිට්ඨිතා.**

---

1. පොනොබ්භවිකා - මජසං
2. දීඝනිකාය - මහාසතිපට්ඨානසුත්ත,

11. ස. පු: ධර්මතෘෂ්ණා අව්‍යාකෘත වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරනලද මැ නු: "පුනර්භවය පිණිස වැටෙන නන්දිරාග සහගත වූ ඒ ඒ ගතියෙහි අභිනන්දනය කරන යම් තෘෂ්ණාවෙක් ඇද්ද, ඔහු නම් කාමතෘෂ්ණා යැ භවතෘෂ්ණා යැ විභවතෘෂ්ණා යැ" යි වදාළ සූත්‍රාන්තයෙක් ඇත්තේ මැ නු?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අ: එකරුණින් "ධර්මතෘෂ්ණා අව්‍යාකෘත යැ'යි නො කියැයුතු යැ.

12. ප. පු: 'ධර්මතෘෂ්ණාව අව්‍යාකෘත යැ'යි නො කියැයුතු වේ ද?

ස. පටිඤ්ඤා: එසේ යැ.

ප. අනු: ඕ ධර්මතෘෂ්ණා නො?

ස. පටිඤ්ඤා: එසේ යැ.

අනු. ඨ: ඉදින් ඕ ධර්මතෘෂ්ණා වේ නම්,

අනු. පා: හවත, එකරුණින් 'ධර්මතෘෂ්ණා අව්‍යාකෘත යැ'යි කියැයුතු මැ යැ.

('තනු සා ධම්මතණ්හා' යන පදයෙන් ධර්මාලම්බන තිසා පවත්නා තෘෂ්ණාව කියැ වේ. අව්‍යාකෘතභාවය නො වේ. එහෙයින් අසාධකයි.)

ධම්මතණ්හා අබ්‍යාකතාතිකථා නිමි.

## 18. 10

# ධම්මතණ්හා න දුක්ඛසමුදයොතිකථා

1\. ස. පු: ධම්මතණ්හා න දුක්ඛසමුදයො'ති.
ප. පටිඤ්ඤා: ආමන්තා.
ස. අනු: රූපතණ්හා න දුක්ඛසමුදයො'ති.
ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

2\. ස. පු: ධම්මතණ්හා න දුක්ඛසමුදයො'ති.
ප. පටිඤ්ඤා: ආමන්තා.
ස. අනු: සද්දතණ්හා -පෙ- ගන්ධතණ්හා -පෙ- රසතණ්හා -පෙ- ඵොට්ඨබ්බතණ්හා න දුක්ඛසමුදයො'ති.
ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

3\. ස. පු: රූපතණ්හා දුක්ඛසමුදයො'ති.
ප. පටිඤ්ඤා: ආමන්තා.
ස අනු: ධම්මතණ්හා දුක්ඛසමුදයො'ති.
ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

4\. ස. පු: සද්දතණ්හා -පෙ- ගන්ධතණ්හා -පෙ- රසතණ්හා -පෙ- ඵොට්ඨබ්බතණ්හා දුක්ඛසමුදයො'ති.
ප. පටිඤ්ඤා: ආමන්තා.
ස. අනු: ධම්මතණ්හා දුක්ඛසමුදයො'ති.
ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

5\. ස. පු: ධම්මතණ්හා න දුක්ඛසමුදයො'ති?
ප. පටිඤ්ඤා: ආමන්තා.
ස. අනු: නනු තණ්හා දුක්ඛසමුදයො වුත්තා භගවතා'ති.
ප. පටිඤ්ඤා: ආමන්තා.
අනු. ඨ: හඤ්චි තණ්හා දුක්ඛසමුදයො වුත්තා භගවතා,
අනු. පාඃ නො ච වත රෙ වත්තබ්බෙ "ධම්මතණ්හා න දුක්ඛසමුදයො"ති.

13. 10.

## ධම්මතණ්හා න දුක්ඛසමුදයොති කථා.

[ධර්මතෘෂ්ණාව 'ධම්මතණ්හා' යයි කී හෙයින් එය දුක්ඛසමුදය නො වේ යයි පූර්වශෛලීයනිකාය වාසීන් සෙයින් ලබ්ධි ගත්තවුන්ගේ වාද බිඳිනට 'ධම්මතණ්හා න දුක්ඛසමුදයොති කථා' එයි.]

1 . ස. පු: ධර්මතෘෂ්ණාව දුඃඛසමුදය නො වනු වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: රූපතෘෂ්ණාව දුඃඛසමුදය නො වනු වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

2. ස. පු: ධර්මතෘෂ්ණාව දුඃඛසමුදය නො වනු වේ ද?

ප. පටි: එසේ යැ.

ස. අනු: ශබ්දතෘෂ්ණා ... ගන්ධතෘෂ්ණා ... රසතෘෂ්ණා ... ස්ප්‍රෂ්ටව්‍යතෘෂ්ණා දුඃඛසමුදය නො වනු වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

3. ස. පු: රූපතෘෂ්ණා දුඃඛසමුදය වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: ධර්මතෘෂ්ණා දුඃඛසමුදය වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

4 ස. පු: ශබ්දතෘෂ්ණා ... ගන්ධතෘෂ්ණා ... රසතෘෂ්ණා ... ස්ප්‍රෂ්ටව්‍යතෘෂ්ණා දුඃඛසමුදය වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: ධර්මතෘෂ්ණා දුඃඛසමුදය වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

5. ස. පු: ධර්මතෘෂ්ණාව දුඃඛසමුදය නො වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: භාග්‍යවතුන් වහන්සේ විසින් 'තෘෂ්ණාව දුඃඛ-සමුදය'යි. වදාරනලද නො?

ප. පටිඤ්ඤා: එසේ යැ.

අනු. ඨ: ඉදින් භාග්‍යවතුන් වහන්සේ විසින් 'තෘෂ්ණාව දුඃඛසමුදය'යි වදාරනලද වේ නම්,

අනු. පා: හවත, 'ධර්මතෘෂ්ණාව දුඃඛසමුදය නො වේ යැ'යි නො කියැයුතු මැ යැ.

6. ස. පු: ධම්මතණ්හා න දුක්ඛසමුදයො'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: නනු ලොභො දුක්ඛසමුදයො වුත්තො භගවතා, 'ධම්මතණ්හා ලොභො'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

අනු. ඨ: හඤ්චි ලොභො දුක්ඛසමුදයො වුත්තො භගවතා ධම්මතණ්හා ලොභො,

අනු. පා: නො ච වත රෙ වත්තබ්බෙ "ධම්මතණ්හා න දුක්ඛසමුදයො"ති.

7. ස. පු: ධම්මතණ්හා ලොභො න දුක්ඛසමුදයො'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: රූපතණ්හා ලොභො න දුක්ඛසමුදයො'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

8. ස. පු: ධම්මතණ්හා ලොභො න දුක්ඛසමුදයො'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: සද්දතණ්හා -පෙ- ගන්ධතණ්හා -පෙ- රසතණ්හා -පෙ- ඵොට්ඨබ්බතණ්හා ලොභො න දුක්ඛසමුදයො'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

9. ස පු: රූපතණ්හා ලොභො දුක්ඛසමුදයො'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: ධම්මතණ්හා ලොභො දුක්ඛසමුදයො'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

10. ස. පු: සද්දතණ්හා -පෙ- ඵොට්ඨබ්බතණ්හා ලොභො දුක්ඛසමුදයො'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: ධම්මතණ්හා ලොභො දුක්ඛසමුදයො'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

6\. ස. පු: ධර්මතෘෂ්ණාව දුඃඛසමුදය නො වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: භාග්‍යවතුන් වහන්සේ විසින් 'ලොභය දුඃඛසමුදය'යි වදාරනලද නො? ධර්මතෘෂ්ණාව ලොභ වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

අනු. ඨ: ඉදින් භාග්‍යවතුන් වහන්සේ විසින් 'ලොභය දුඃඛ සමුදය'යි වදාරනලද වේ නම්, ධර්මතෘෂ්ණාත් ලොභ වේ නම්,

අනු. පා: භවත 'ධර්මතෘෂ්ණාව දුඃඛසමුදය නො වේ යැ'යි නො කියැයුතු මැ යැ.

7\. ස. පු: ධර්මතෘෂ්ණාව ලෝභ වූයේ දුඃඛසමුදය නො වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: රූපතෘෂ්ණා ලෝභ වූයේ දුඃඛසමුදය නො වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

8\. ස. පු: ධර්මතෘෂ්ණා ලොභ වූයේ දුඃඛසමුදය නො වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: ශබ්දතෘෂ්ණා ... ගන්ධතෘෂ්ණා ... රස තෘෂ්ණා ... ස්ප්‍රෂ්ටව්‍යතෘෂ්ණා ලෝභ වූයේ දුඃඛසමුදය නො වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

9\. ස. පු: රූපතෘෂ්ණා ලෝභ වූයේ දුඃඛසමුදය වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: ධර්මතෘෂ්ණා ලෝභ වූයේ දුඃඛසමුදය වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

10\. ස. පු: ශබ්දතෘෂ්ණා... ස්ප්‍රෂ්ටව්‍යතෘෂ්ණා ලොභ වූයේ දුඃඛ-සමුදය වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: ධර්මතෘෂ්ණා ලෝභ වූයේ දුඃඛසමුය වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

11. ස. පු: ධම්මතණ්හා න දුක්ඛසමුදයෝ'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: නනු වුත්තං භගවතා "යා'යං තණ්හා පොනොභවිකා[1] නන්දිරාගසහගතා තත්‍ර තත්‍රාභිනන්දිනී සෙය්‍යථිදං: කාමතණ්හා භවතණ්හා විභවතණ්හා"ති[a] අත්ථේව සුත්තන්තෝ'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අා: තෙන හි න වත්තබ්බං "ධම්මතණ්හා න දුක්ඛසමුදයෝ"ති.

12. ප. පු: න වත්තබ්බං "ධම්මතණ්හා න දුක්ඛසමුදයෝ"ති

ස. පටිඤ්ඤා: ආමන්තා.

ප. අනු: නනු සා ධම්මතණ්හා'ති.

ස. පටිඤ්ඤා: ආමන්තා.

අනු. ඨ: හඤ්චි සා ධම්මතණ්හා,

අනු. පා: නො ච වත රෙ වත්තබ්බෙ "ධම්මතණ්හා දුක්ඛසමුදයෝ'ති.[2]

**ධම්මතණ්හා න දුක්ඛසමුදයෝති කථා නිට්ඨිතා.**

**තෙරසමො වග්ගො නිට්ඨිතො.**

**තස්සුද්දානං**

කප්පට්ඨො කප්පං තිට්ඨෙය්‍ය, කප්පට්ඨො කුසලං චිත්තං න පටිලභෙය්‍ය, අනන්තරාපයුත්තො පුග්ගලො සම්මත්තනියාමං ඔක්කමෙය්‍ය, නියතො නියාමං ඔක්කමති, නිවුතො නීවරණං ජහති, සම්මුඛීභූතො සඤ්ඤොජනං ජහති, ඣානනිකන්ති, අසාතරාගො, ධම්මතණ්හා අබ්‍යාකතා, ධම්මතණ්හා න දුක්ඛසමුදයො'ති.

1 පොනොබ්භවිකා, මජසං.
2. න දුක්ඛසමුදයොති - මජසං, සීමු.
a. දීඝනිකාය - මහාසතිපට්ඨානසුත්ත

11. ස පු: ධර්මතෘෂ්ණා දුඃඛසමුදය නො වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරන ලද මැ නු: "පුනර්භවය කරනසුලු වූ අභිනන්දන සඞ්ඛ්‍යාත නන්දිරාගයෙන් යුක්ත වූ ඒ ඒ ආත්මභාවයෙහි සතුටු වන යම් තෘෂ්ණාවක් ඇද්ද, ඔහු නම් කාමතෘෂ්ණා යැ භවතෘෂ්ණා යැ විභවතෘෂ්ණා යි" වදාල සූත්‍රාන්තයෙක් ඇත්තේ මැ නො?

ප. පටිඤ්ඤා: එසේ ය.

ස. ආ: එකරුණින් 'ධර්මතෘෂ්ණා දුඃඛසමුදය නො වේ යැ'යි නො කියැයුතු යැ.

12. ප. පු: 'ධර්මතෘෂ්ණා දුඃඛසමුදය නො වේ යැ'යි නො කියැයුතු වේ ද?

ස. පටිඤ්ඤා: එසේ යැ.

ප. අනු: හෝ ධර්මතෘෂ්ණා නො?

ස. පටිඤ්ඤා: එසේ යැ.

අනු. ඨ: ඉදින් හෝ ධර්මතෘෂ්ණා වේ නම්,

අනු. පා: හවත, ධර්මතෘෂ්ණා දුඃඛසමුදය වේ යැ'යි නො කියැයුතු යැ.

ධම්මතණ්හා න දුක්ඛසමුදයොතිකථා නිමි.

තෙලෙස් වන වග නිමියේ යි.

එහි උද්දානය:

කප්පට්ඨකථා යැ කුසලපටිලාභකථා යැ අනන්තරාපයුත්තකථා යැ නියතස්ස නියාමකථා යැ නිවුතකථා යැ සම්මුඛීභූතකථා යැ සමාපන්නො අස්සාදෙති කථා යැ අසාතරාගකථා යැ ධම්මතණ්හා අබ්‍යාකතාතිකථා යැ ධම්මතණ්හා න දුක්ඛසමුදයොති කථා යි.

# චුද්දසමො වග්ගො.

## 14. 1.

## කුසලාකුසල පටිසන්දහනකථා.

1. ස. පු: අකුසලමූලං පටිසන්දහති කුසලමූලන්ති,

ප. පටික්ඛෙපො: ආමන්තා.

ස. අනු: යා අකුසලස්ස උප්පාදාය ආවට්ටනා -පෙ- පණිධි, සාව[1] කුසලස්ස උප්පාදාය ආවට්ටනා -පෙ- පණිධී'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

2. ස. පු: අකුසලමූලං පටිසන්දහති කුසලමූලං, න වත්තබ්බං යා අකුසලස්ස උප්පාදාය ආවට්ටනා -පෙ- පණිධි, සාව කුසලස්ස උප්පාදාය ආවට්ටනා -පෙ- පණිධී'ති.

ප. පටික්ඛෙපො: ආමන්තා.

ස. අනු: කුසලං අනාවට්ටන්තස්ස[2] උප්පජ්ජති -පෙ- අපණිදහන්තස්ස[3] උප්පජ්ජතී'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

ස. අනු: කුසලං ආවට්ටන්තස්ස උප්පජ්ජති -පෙ- පණිදහන්තස්ස උප්පජ්ජතී'ති.

ප. පටික්ඛෙපො: ආමන්තා.

අනු. ඨ: හඤ්චි කුසලං ආවට්ටන්තස්ස උප්පජ්ජති -පෙ- පණිදහන්තස්ස උප්පජ්ජති,

අනු. පා: නො ච වත රෙ වත්තබ්බෙ "අකුසලමූලං පටිසන්දහති කුසලමූල"න්ති.

3. ස. පු: අකුසලමූලං පටිසන්දහති කුසලමූලන්ති.

ප. පටික්ඛෙපො: ආමන්තා.

ස. අනු: අකුසලං[4] අයොනිසො මනසිකරොතො උප්පජ්ජතී'ති.

ප. පටික්ඛෙපො: ආමන්තා.

1 සාව - සීමු.
2. අප්පණිදහන්තස්ස - මජසං
3. අනාවෙට්ටන්තස්ස - මජසං
4. අකුසලමූලං - මජසං.

# චුද්දසමවග්ග

## 14. 1.

## කුසලාකුසලපටිසන්‍ධහනකථා

[කුශලය අකුශලයට අනතුරු වැ හෝ අකුශලය කුශලයට අනතුරු වැ හෝ ඉපදීමක් නැති හෙයින් උනුන්ගේ අන්‍යෝන්‍ය ප්‍රතිසන්‍ධාන නො වේදැයි. එහෙත් 'එක් මැ වස්තුවෙහි රජ්ජන විරජ්ජන වශයෙන් කුශලාකුශලයන්ගේ ප්‍රතිසන්‍ධාන ඇතී'යි මහා සාඝිකයන් සෙයින් ලබ්ධි ගත්තාහු වෙද් ද ඔවුන්ගේ වාද බිඳුනට 'කුසලාකුසල පටිසන්‍ධහනකථා' එයි ]

1. ස. පු: අකුශලමූලය කුශලමූලය ප්‍රතිසන්‍ධාන (එකිනෙක ගැලපීම්) කෙරේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: අකුශලයාගේ උත්පාදය පිණිස යම් ආවර්ජනා-යෙක් ... ප්‍රණිධියෙක් ඇද්ද, ඕ මැ කුශලයාගේ උත්පාදය පිණිස ආවර්ජනා .. ප්‍රණිධි වේ ද,

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

2. ස. පු: අකුශලමූලය කුශලමූලය ප්‍රතිසන්‍ධාන කෙරේ ද, අකුශලයාගේ උත්පාදය පිණිස යම් ආවර්ජනා .. ප්‍රණිධි ඇද්ද, ඒ මැ කුශලයාගේ උත්පාදය පිණිස ආවර්ජනා ... ප්‍රණිධි වේ යයි නො කියැයුතු වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: කුශලය ආවර්ජනා නො කරන්නහුට උපදනේ වේ ද, .. ප්‍රණිධි නො කරන්නහුට උපදනේ වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

ස. අනු: කුශලය ආවර්ජනා කරන්නහුට උපදනේ වේ ද? ... ප්‍රණිධි කරන්නහුට උපදනේ වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ

අනු. ඨ: ඉදින් කුශලය ආවර්ජනා කරන්නහුට උපදනේ වේ නම් ... ප්‍රණිධි කරන්නහුට උපදනේ වේ නම්,

අනු. පා: හවත, 'අකුශලමූලය කුශලමූලය ප්‍රතිසන්‍ධාන කෙරේ'යයි නො කියැයුතු මැ යැ.

3. ස. පු: අකුශලමූලය කුශලමූලය ප්‍රතිසන්‍ධාන කෙරේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: අකුශලය අයෝනිසෝමනසිකාර කරන්නහුට උපදනේ වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: කුසලං අයොනිසො මනසිකරොතො උප්පජ්ජතී'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ - පෙ-

ස. අනු: නනු කුසලං යොනිසො මනසිකරොතො උප්පජ්ජතී'ති.

ප. පටික්ඛෙ: ආමන්තා.

අනු. ඨ: හඤ්චි කුසලං යොනිසො මනසිකරොතො උප්පජ්ජති.

අනු. පා: නො ච වත රෙ වත්තබ්බෙ: අකුසලමූලං පටිසන්දහති කුසලමූලන්ති.

4. ස. පු: අකුසලමූලං පටිසන්දහති කුසලමූලන්ති.

ප. පටික්ඛෙ: ආමන්තා.

ස. අනු: කාමසඤ්ඤාය අනන්තරා නෙක්ඛම්මසඤ්ඤා උප්පජ්ජති, බ්‍යාපාදසඤ්ඤාය අනන්තරා අබ්‍යාපාදසඤ්ඤා උප්පජ්ජති, විහිංසාසඤ්ඤාය අනන්තරා අවිහිංසාසඤ්ඤා උප්පජ්ජති, බ්‍යාපාදස්ස අනන්තරා මෙත්තා උප්පජ්ජති, අරතියා අනන්තරා මුදිතා උප්පජ්ජති, පටිඝස්ස[1] අනන්තරා උපෙක්ඛා උප්පජ්ජතී'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

5. ස. පු: කුසලමූලං පටිසන්දහති අකුසලමූලන්ති.

ප. පටික්ඛෙ: ආමන්තා.

ස. අනු: යා කුසලස්ස උප්පාදාය ආවට්ටනා -පෙ- පණිධි, සා'ව[2] අකුසලස්ස උප්පාදාය ආවට්ටනා -පෙ- පණිධී'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

6. ස. පු: කුසලමූලං පටිසන්දහති අකුසලමූලං, යා කුසලස්ස උප්පාදාය ආවට්ටනා -පෙ- පණිධි, සා'ව අකුසලස්ස උප්පාදාය ආවට්ටනා -පෙ- පණිධී'ති.

ප. පටි: ආමන්තා.

ස. අනු: අකුසලං අනාවට්ටන්තස්ස උප්පජ්ජති -පෙ- අපණිදහන්තස්ස උප්පජ්ජතී'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

---

1. පටිඝාය - සිමු.
2. සා ච - සිමු.

ස. අනු: කුශලය අයෝනිසෝමනසිකාර කරන්නහුට උපදනේ වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

ස අනු: කුශලය යෝනිසෝමනසිකාර කරන්නහුට උපදනේ නො?

ප. පටිඤ්ඤා: එසේ යැ.

අනු. ඨ: ඉදින් කුශලය යෝනිසෝමනසිකාර කරන්නහුට උපදනේ වේ නම්,

අනු. පා: හවත, අකුශලමූලය කුශලමූලය ප්‍රතිසන්ධාන කෙරේ'යයි නො කියැයුතු මැ යැ.

4. ස. පු: අකුශලමූලය 'කුශලමූලය ප්‍රතිසන්ධාන කෙරේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: කාමසංඥාවට අනතුරු වැ නිෂ්කාමසංඥාව උපදනේ වේ ද? ව්‍යාපාදසංඥාවට අනතුරු වැ අව්‍යාපාදසංඥාව උපදනේ වේ ද? විහිංසාසංඥාවට අනතුරුව අවිහිංසාසංඥාව උපදනේ වේ ද? ඛ්‍යාපාදයට අනතුරු වැ මෛත්‍රිය උපදනේ වේ ද? විහිංසාවට අනතුරු වැ කරුණාව උපදනේ වේ ද? අරතියට අනතුරු වැ මුදිතාව උපදනේ වේ ද? ප්‍රතිඝයට අනතුරු වැ උපෙක්ෂාව උපදනේ වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

5. ස. පු: කුශලමූලය අකුශලමූලය ප්‍රතිසන්ධාන කෙරේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: කුශලොත්පාදය පිණිස යම් ආවර්ජනායෙක් ... ප්‍රණිධියෙක් ඇද්ද? ඒ මැ අකුශලොත්පාදයට ආවර්ජනායෙක් ... ප්‍රණිධියෙක් වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

6. ස. පු: කුශලමූලය අකුශලමූලය ප්‍රතිසන්ධාන කෙරේ, කුශලොත්පාදය පිණිස යම් ආවර්ජනායෙක් ... ප්‍රණිධියෙක් ඇද්ද, ඒ මැ අකුශලොත්පාදයට ආවර්ජනා ... ප්‍රණිධි වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: අකුශලය ආවර්ජන නො කරන්නහුට උපදනේ වේ ද ... ප්‍රණිධාන නොකරන්නහුට උපදනේ වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

ස. අනු: නනු[1] අකුසලං ආවට්ටනතස්ස උප්පජ්ජති -පෙ- පණිදහනතස්ස උප්පජ්ජතී'ති.

ප. පටිසඛ්‍යු: ආමන්තා.

අනු. ඨ: හඤ්චි අකුසලං ආවට්ටනතස්ස උප්පජ්ජති -පෙ- පණිදහනතස්ස උප්පජ්ජති,

අනු. පා: නො ච වත රෙ වත්තබ්බෙ, "කුසලමූලං පටිසන්දහති අකුසලමූල"න්ති

7. ස. පු: කුසලමූලං පටිසන්දහති අකුසලමූලන්ති.

ප. පටිසඛ්‍යු: ආමන්තා.

ස. අනු: කුසලං යොනිසොමනසිකරොතො උප්පජ්ජතී'ති.

ප. පටිසඛ්‍යු: ආමන්තා.

ස. අනු: අකුසලං යොනිසොමනසිකරොතො උප්පජ්ජතී'ති

ප පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

ස අනු: නනු අකුසලං අයොනිසො මනසිකරොතො උප්පජ්ජතී'ති.

ප පටිසඛ්‍යු: ආමන්තා.

අනු. ඨ: හඤ්චි අකුසලං අයොනිසොමනසිකරොතො උප්පජ්ජති,

අනු. පා: නො ච වත රෙ වත්තබ්බෙ: කුසලමූලං පටිසන්දහති අකුසලමූලන්ති.

8. ස පු: කුසලමූලං පටිසන්දහති අකුසලමූලන්ති.

ප. පටිසඛ්‍යු: ආමන්තා.

ස අනු: නෙක්ඛම්මසඤ්ඤාය අනන්තරා කාමසඤ්ඤා උප්පජ්ජති, අබ්‍යාපාදසඤ්ඤාය අනන්තරා බ්‍යාපාදසඤ්ඤා උප්පජ්ජති, අවිහිංසාසඤ්ඤාය අනන්තරා විහිංසා සඤ්ඤා උප්පජ්ජති, මෙත්තාය අනන්තරා බ්‍යාපාදෙ උප්පජ්ජති, කරුණාය අනන්තරා විහිංසා උප්පජ්ජති, මුදිතාය අනන්තරා අරති උප්පජ්ජති, උපෙක්ඛාය අනන්තරා පටිඝං උප්පජ්ජතී'ති

ප පටි. න හෙවං වත්තබ්බෙ -පෙ-

1. නනු - PTS ඌනං

ස. අනු: අකුශලය ආවර්තනා කරන්නහුට උපදනේ ... ප්‍රණිධි කරන්නහුට උපදනේ වේ ද?

ප. පටිඤ්ඤා. එසේ යැ.

අනු. ඨ: ඉදින් අකුශලය ආවර්තනා කරන්නහුට උපදනේ වේ නම් ... ප්‍රණිධි කරන්නහුට උපදනේ වේ නම්,

අනු. පා: භවත, කුශලමූලය අකුශලමූල ප්‍රතිසන්ධාන කෙරේ, යයි නො කියැයුතු මැ යැ.

7\. ස. පු: කුශලමූලය අකුශලමූල ප්‍රතිසන්ධාන කෙරේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: කුශලය යොනිසොමනසිකාරයෙන් උපදනේ වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: අකුසලය යොනිසොමනසිකාරයෙන් උපදනේ වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ.

ස. අනු: අකුශලය අයොනිසොමනසිකාර කරන්නහුට උපදනේ නො?

ප. පටිඤ්ඤා: එසේ යැ.

අනු ඨ: ඉදින් අකුශලය අයොනිසොමනසිකාර කරන්නහුට උපදනේ වේ නම්,

අනු. පා: භවත, කුශලමූලය අකුශලමූල ප්‍රතිසන්ධාන කෙරේයයි නො කියැයුතු මැ යැ.

8\. ස. පු: කුශලමූලය අකුශලමූලය ප්‍රතිසන්ධාන කෙරේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: නිෂ්කාමසංඥාවට අනතුරු වැ කාමසංඥා උපදනේ වේ ද, අව්‍යාපාදසංඥාවට අනතුරු වැ ව්‍යාපාදසංඥා උපදනේ වේ ද, අවිහිංසාසංඥාවට අනතුරු වැ විහිංසාසංඥා උපදනේ වේ ද, මෛත්‍රියට අනතුරු වැ ව්‍යාපාදය උපදනේ වේ ද, කරුණාවට අනතුරු වැ විහිංසා උපදනේ වේ ද, මුදිතාවට අනතුරු වැ අරති උපදනේ වේ ද, උපෙක්ෂාවට අනතුරු වැ ප්‍රතිඝය උපදනේ වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

9 ප පු: න වත්තබ්බං අකුසලමූලං පටිසන්දහති කුසලමූලං, කුසලමූලං පටිසන්දහති අකුසලමූලන්ති

ස. පටිඤ්ඤා: ආමන්තා.

ප. අනු: නනු යස්මිඤ්ඤෙව වත්ථුස්මිං රජ්ජති, තස්මිඤ්ඤෙව වත්ථුස්මිං විරජ්ජති, යස්මිඤ්ඤෙව වත්ථුස්මිං විරජ්ජති තස්මිඤ්ඤෙව වත්ථුස්මිං රජ්ජතී'ති.

ස. පටිඤ්ඤා: ආමන්තා

අනු. ඨ: හඤ්චි යස්මිඤ්ඤෙව වත්ථුස්මිං විරජ්ජති තස්මිඤ්ඤෙව වත්ථුස්මිං රජ්ජති,[1]

අනු. පං: තෙන වත රෙ වත්තබ්බෙ "අකුසලමූලං පටිසන්දහති කුසලමූලං, කුසලමූලං පටිසන්දහති අකුසලමූල"න්ති.

කුසලාකුසලපටිසන්දහනකථා නිට්ඨිතා.

---

1. රජ්ජති - සිමු.

| | |
|---|---|
| 9. ප. පු: | 'අකුශලමූලය කුශලමූලය ප්‍රතිසන්‍ධාන කෙරෙයි, කුශලමූලය අකුශලමූලය ප්‍රතිසන්‍ධාන කෙරෙයි' යනු නො කියයුතු වේ ද? |
| ප. පටිඤ්ඤා: | එසේ යැ. |
| ප අනු: | යම් මැ වස්තුයෙකැ ඇලේ ද, එ මැ වස්තුයෙහි නො ඇලෙත්තේ, යම් මැ වස්තුයෙකැ නො ඇලේ ද, එ මැ වස්තුයෙහි ඇලෙත්තේ නො? |
| ස. පටිඤ්ඤා: | එසේ යැ. |
| අනු. ඨ: | ඉදින් යම් මැ වස්තුයෙකැ නො ඇලෙනුයේ එ මැ වස්තුයෙහි ඇලේ නම්, |
| අනු. පා: | භවත එකරුණින් 'අකුශලමූලය කුශලමූලය ප්‍රතිසන්‍ධාන කෙරෙයි, කුශලමූලය අකුශලමූලය ප්‍රතිසන්‍ධාන කෙරෙයි' යනු කියැයුතු මැ යැ. |
| | (මෙහි එක් මැ අරමුණෙහි රාගවිරාග උත්පත්තිය දක්විණ. කුසලාකුසල අනන්තරතා නො වේ. එහෙයින් අසාධකයි.) |

කුසලාකුසලපටිසන්‍ධනකථා නිමි.

## 14. 2.

# සළායතනුප්පත්තිකථා.

1. ස. පු: සළායතනං අපුබ්බං අචරිමං මාතුකුච්ඡිස්මිං සණ්ඨාතී'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: සබ්බඞ්ගපච්චඞ්ගා අහිනින්ද්‍රියො[1] මාතුකුච්ඡිස්මිං ඔක්කමතී'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

2. ස. පු: උපපත්තෙසියෙන චිත්තෙන චක්ඛායතනං සණ්ඨාතී'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: උපපත්තෙසියෙන චිත්තෙන හත්ථා සණ්ඨන්ති, පාදා සණ්ඨන්ති, සීසං සණ්ඨාති, කණ්ණා සණ්ඨාති, නාසිකා සණ්ඨාති, මුඛා සණ්ඨාති, දන්තා සණ්ඨන්තී'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

3. ස. පු: උපපත්තෙසියෙන චිත්තෙන සොතායතනං -පෙ- ඝානායතනං -පෙ- ජිව්හායතනං සණ්ඨාතී'ති.

ප. පටිඤ්ඤා. ආමන්තා.

ස. අනු: උපපත්තෙසියෙන චිත්තෙන හත්ථා සණ්ඨන්ති, පාදා සණ්ඨන්ති, සීසං සණ්ඨාති, කණ්ණා සණ්ඨාති, නාසිකා සණ්ඨාති, මුඛං සණ්ඨාති, දන්තා සණ්ඨන්තී'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

---
1. අහිනින්ද්‍රියො - සබ්බත්ථ.

### 14. 2.

## සළායතනුප්පත්තිකථා.

**[‘උපපත්තෙසිය – පිළිසඳ සිත සමඟ මැ ඔපපාතිකයනට ෂඩායතන උපදනේ යැ. ජරායුජ සත්ත්වයනට ප්‍රතිසන්ධික්‍ෂණයෙහි මනායතන කායායතන දෙදෙන මැ උපදනාහ. ආධ්‍යාත්මික ආයතනයන් කෙරෙහි ඉතිරි සතර ආයතන සත්සැත්තෑරැසෙහි උපදිති. ඔහු ද ඒ ප්‍රතිසන්ධිකර්මය හෝ අනෙක් කර්මයක් හෝ කළ හෙයිනැ’යි ස්වසමයෙහි වාද යි. එතෙකුදු වුව ‘එකකර්මසම්භවතාහෙතුයෙන් ශාඛාවිටපසම්පන්න වෘක්‍ෂාදීන්ගේ අඞ්කුරෝද්ගමනය සෙයින් මවුකුසැ ප්‍රතිසන්ධික්‍ෂණයෙහි දී මැ බීජමාත්‍ර ෂඩායතන ඇති’යි පූර්වශෛලීය නිකායාංශීන් සෙයින් ලබ්ධි ගත්තවුන්ගේ වාද බිඳුනට ‘සළායතනුප්පත්තිකථා’ එයි.]**

1. ස. පු: ෂඩායතනය පෙර පසු නො වැ මවුකුසැ පිහිටා ද?

ප. පරිසුද්ධ: එසේ යැ.

ස. අනු: හැම අඟපසඟ ඇති වැ අඩුනො ඉඳුරන් ඇති වැ මවුකුසැ සිටුනේ වේ ද?

ප. පරි: එසේ නො කියැයුතු යැ ...

2. ස. පු: උපපත්තෙසිය (ප්‍රතිසන්ධි) සිතින් චක්‍ෂුරායතනය පිහිටන්නේ වේ ද?

ප. පරිසුද්ධ: එසේ යැ.

ස. අනු: උපපත්තෙසිය සිතින් හස්තයෝ පිහිටත් ද, පාදයෝ පිහිටත් ද, ශීර්ෂය පිහිටා ද, කර්ණය පිහිටා ද, නාසිකාව පිහිටා ද, මුඛය පිහිටා ද, දන්තයෝ පිහිටත් ද?

ප. පරි: එසේ නො කියැයුතු යැ ...

3. ස. පු: උපපත්තෙසිය සිතින් ශ්‍රෝත්‍රායතනය ... ඝ්‍රාණා-යතනය ... ජිහ්වායතනය පිහිටන්නේ වේ ද?

ප. පරිසුද්ධ: එසේ යැ.

ස. අනු: උපපත්තෙසිය සිතින් හස්තයෝ පිහිටත් ද, පාදයෝ පිහිටත් ද, ශීර්ෂය පිහිටා ද, කර්ණය පිහිටා ද, නාසිකාව පිහිටා ද, මුඛය පිහිටා ද, දන්තයෝ පිහිටත් ද?

ප. පරි: එසේ නො කියැයුතු යැ ...

4. ප. පු: මාතුකුච්ඡිගතස්ස පච්ඡා චක්ඛායතනං උප්පජ්ජතී'ති.

ස. පටිඤ්ඤා: ආමන්තා.

ප. අනු: මාතුකුච්ඡිස්මිං චක්ඛුපටිලාභාය කම්මං කරොතී'ති.

ස. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

5. ප. පු: මාතුකුච්ඡිගතස්ස පච්ඡා සොතායතනං -පෙ- ඝානායතනං -පෙ- ජිව්හායතනං උප්පජ්ජතී'ති.

ස. පටිඤ්ඤා: ආමන්තා.

ප. අනු: මාතුකුච්ඡිස්මිං ජිව්හායතනපටිලාභය කම්මං කරොතී'ති.

ස. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

6. ප. පු: මාතුකුච්ඡිගතස්ස පච්ඡා කෙසා ලොමා නඛා දන්තා අට්ඨි උප්පජ්ජන්තී'ති.

ස. පටිඤ්ඤා: ආමන්තා.

ප. අනු: මාතුකුච්ඡිස්මිං අට්ඨිපටිලාභාය කම්මං කරොතී'ති.

ස. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

7. ස. පු: න වත්තබ්බං මාතුකුච්ඡිගතස්ස පච්ඡා කෙසා ලොමා නඛා දන්තා අට්ඨී උප්පජ්ජන්තී'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: නනු වුත්තං භගවතා.

"පඨමං කලලං හොති කලලා හොති අබ්බුදං
අබ්බුදා ජායතෙ පෙසි පෙසි නිබ්බත්තතී ඝනො
ඝනා පසාඛා ජායන්ති කෙසා ලොමා නඛා'පි ච.

යඤ්චස්ස භුඤ්ජතෙ[1]. මාතා අන්නං පානඤ්ච භොජනං
තෙන සො තත්ථ යාපෙති මාතුකුච්ඡිගතො නරො'ති" a
අත්ථෙ'ව සුත්තන්තො'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. ආ: තෙන හි "මාතුකුච්ඡිගතස්ස පච්ඡා කෙසා ලොමා නඛා දන්තා අට්ඨී උප්පජ්ජන්තී"ති.

සළායතනුප්පත්තිකථා නිට්ඨිතා.

---

1. භුඤ්ජති සීමු.

a සංයුත්තනිකාය - යක්ඛසංයුත්ත - ඉන්දකසුත්ත.

4. ප. පු: මාතෘකුක්ෂිගතයාහට පසු වැ චක්ෂුරායතන උපදනේ වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ප. අනු: මාතෘකුක්ෂියෙහි දී චක්ෂුෂ්ප්‍රතිලාභ පිණිස කම් කරන්නේ වේ ද?

ස. පටි: එසේ නො කියැයුතු යැ ...

5. ප. පු: මාතෘකුක්ෂිගතයාහට පසු වැ ශ්‍රොත්‍රායතන ... ඝ්‍රාණායතන ... ජිහ්වායතන උපදනේ වේ ද?

ස. පටිඤ්ඤා: එසේ යැ.

ප. අනු: මාතෘකුක්ෂියෙහි ජිහ්වායතනප්‍රතිලාභ පිණිස කම් කරන්නේ වේ ද?

ස. පටි: එසේ නො කියැයුතු යැ ...

6. ප. පු: මාතෘකුක්ෂිගතයාහට පසු වැ කෙස් ලොම් නිය දත් ඇට උපදනේ වේ ද?

ස. පටිඤ්ඤා: එසේ යැ.

ප. අනු: මාතෘකුක්ෂියෙහි දී අස්ථිප්‍රතිලාභ පිණිස කම් කරන්නේ වේ ද?

ස. පටි: එසේ නො කියැයුතු යැ ...

7. ස. පු: 'මාතෘකුක්ෂිගතයාහට පසු වැ කෙස් ලොම් නිය දත් ඇට උපදනේ යැ'යි කියැයුතු නො වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ

ස. අනු: භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරනලද මැ නු:

"පළමු වැ කලලරූපය වෙයි. කලලරූපයෙන් අර්බුද වෙයි. අර්බුදයෙන් පෙශි උපදී. පෙශියෙන් ඝන වෙයි. ඝනයෙන් ප්‍රශාඛයෝ ද කෙස් ලොම් නිය ද උපදිත්.

ඔහුගේ මව ආහාරපාන සඞ්ඛ්‍යාත යම් මැ බොජුනක් බුදී ද, ඒ මාතෘකුක්ෂිගත සත්ත්වයා එයින් යැපේ"යයි වදාළ සූත්‍රාන්තයෙක් ඇත්තේ මැ නු?

ප. පු: එසේ යැ.

ස. ආ: එකරුණින් 'මාතෘකුක්ෂිගතයාහට පසු වැ කෙස් ලොම් නිය දත් ඇට උපදනාහු වෙත්.

සළායතනුප්පත්තිකථා නිමි.

14. 8.

# අනන්තරපච්චයකථා

1. ස. පු: චක්ඛුවිඤ්ඤාණස්ස අනන්තරා සොතවිඤ්ඤාණං උප්පජ්ජතීති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: යා චක්ඛුවිඤ්ඤාණස්ස උප්පාදාය ආවට්ටනා -පෙ- පණිධි, සා'ව සොතවිඤ්ඤාණස්ස උප්පාදාය ආවට්ටනා -පෙ- පණිධී'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

2. ස. පු: චක්ඛුවිඤ්ඤාණස්ස අනන්තරා සොතවිඤ්ඤාණං උප්පජ්ජති,[1] න වත්තබ්බං 'යා චක්ඛුවිඤ්ඤාණස්ස උප්පාදාය ආවට්ටනා -පෙ- පණිධි, සා'ව' සොතවිඤ්ඤාණස්ස උප්පාදාය ආවට්ටනා -පෙ- පණිධී'තීති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: සොතවිඤ්ඤාණං අනාවට්ටන්තස්ස උප්පජ්ජති -පෙ- අප්පණිදහන්තස්ස උප්පජ්ජතී'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

ස. අනු: නනු සොතවිඤ්ඤාණං ආවට්ටන්තස්ස උප්පජ්ජති -පෙ- පණිදහන්තස්ස උප්පජ්ජතී'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

අනු. ඨ: හඤ්චි සොතවිඤ්ඤාණං ආවට්ටන්තස්ස උප්පජ්ජති -පෙ- පණිදහන්තස්ස උප්පජ්ජති,

අනු. පා: නො ච වත රෙ වත්තබ්බෙ "චක්ඛුවිඤ්ඤාණස්ස අනන්තරා සොතවිඤ්ඤාණං උප්පජ්ජතී"ති.

---

1 උප්පජ්ජතී'ති - සීමු, TPS.

## 14. 3.

# අනන්තරපච්චයකථා

[නෘත්‍යගීතාදියෙහි දී ඇති වන රූපදර්ශන ශබ්දශ්‍රවණාදීන්ගේ වහා සිදුවන පරිවර්තන දැක 'මේ විඥානයෝ උනුනට අනන්තර වැ උපදිති'යි උත්තරාපථකනිකායවාසීන් සෙයින් ලබ්ධි ගත්තවුන්ගේ වාද බිඳුනට 'අනන්තරපච්චයකථා' එයි.]

**1.** ස. පු: චක්ෂුර්විඥානයට අනතුරු වැ ශ්‍රොත්‍රවිඥානය උපදනේ වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: චක්ෂුර්විඥානයාගේ උත්පාදය පිණිස යම් ආවර්ජනායෙක් .. ප්‍රණිධියෙක් ඇද්ද, ඒ ආවර්ජනා… ප්‍රණිධි මැ ශ්‍රොත්‍රවිඥානයාගේ උත්පාදය පිණිස ආවර්ජනා … ප්‍රණිධි වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ …

**2.** ස. පු: (තොප මතයෙහි) චක්ෂුර්විඥානයට අනතුරු වැ ශ්‍රොත්‍රවිඥානය උපදනේ යැ. චක්ෂුර්විඥානයාගේ උත්පාදය පිණිස යම් ආවර්තනායෙක් … ප්‍රණිධි-යෙක් ඇද්ද ඒ මැ ශ්‍රොත්‍රවිඥානයාගේ උත්පාදය පිණිස ආවර්තනා … ප්‍රණිධි වෙති'යි නො කියැ-යුතු වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: ශ්‍රොත්‍රවිඥානය ආවර්තනා නො කරන්නහුට උපදනේ වේ ද? … ප්‍රණිධි නොකරන්නහුට උපදනේ වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ …

ස. අනු: ශ්‍රොත්‍රවිඥානය ආවර්තනා කරන්නහුට උපදනේ නො වේ ද? … ප්‍රණිධි කරන්නහුට උපදනේ නො වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

අනු. ඨ: ඉදින් ශ්‍රොත්‍රවිඥානය ආවර්තනා කරන්නහුට උපදනේ වේ නම්,… ප්‍රණිධි කරන්නහුට උපදනේ වේ නම්,

අනු. පා: හවත, චක්ෂුර්ඥානයට අනතුරු වැ ශ්‍රොත්‍රවිඥානය උපදනේ යැ'යි නො කියැයුතු මැ යැ.

3. ස. පු: චක්ඛුවිඤ්ඤාණස්ස අනන්තරා සොතවිඤ්ඤාණං උප්පජ්ජතී'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: චක්ඛුවිඤ්ඤාණං රූපනිමිත්තං මනසිකරොතො උප්පජ්ජතී'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: සොතවිඤ්ඤාණං රූපනිමිත්තං මනසිකරොතො උප්පජ්ජතී'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

4 ස. පු: චක්ඛුවිඤ්ඤාණං රූපාරම්මණඤ්ඤෙව න අඤ්ඤාරම්මණන්ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: සොතවිඤ්ඤාණං රූපාරම්මණඤ්ඤෙව න අඤ්ඤාරම්මණන්ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

5. ස. පු: චක්ඛුඤ්ච පටිච්ච රූපෙ ච උප්පජ්ජති චක්ඛුවිඤ්ඤාණන්ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: චක්ඛුඤ්ච පටිච්ච රූපෙ ච උප්පජ්ජති සොතවිඤ්ඤාණන්ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

6. ස. පු: චක්ඛුඤ්ච පටිච්ච රූපෙ ච උප්පජ්ජති සොතවිඤ්ඤාණන්ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: "චක්ඛුඤ්ච පටිච්ච රූපෙ ච උප්පජ්ජති සොතවිඤ්ඤාණන්ති" අත්ථෙ'ව සුත්තන්තො'ති.

ප. පටි: නත්ථි.

ස. අනු: "චක්ඛුඤ්ච පටිච්ච රූපෙ ච උප්පජ්ජති චක්ඛුවිඤ්ඤාණන්ති" අත්ථෙ'ව සුත්තන්තො'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

අනු ඨ: හඤ්චි "චක්ඛුඤ්ච පටිච්ච රූපෙ ච උප්පජ්ජති චක්ඛුවිඤ්ඤාණ"න්ති අත්ථෙ'ව සුත්තන්තො,

අනු පා: නො ච වත රෙ වත්තබ්බෙ "චක්ඛුඤ්ච පටිච්ච රූපෙ ච උප්පජ්ජති සොතවිඤ්ඤාණ"න්ති.

3. ස. පු: චක්ෂුර්විඥානයට අනතුරු ව ශ්‍රොත්‍රවිඥානය උපදනේ වේ ද?

ප. පටික්ඛෙපය: එසේ ය.

ස. අනු: චක්ෂුර්විඥානය රූපනිමිත්ත මෙනෙහි කරන්නාහට උපදනේ වේ ද?

ප. පටික්ඛෙපය: එසේ යැ.

ස. අනු. ශ්‍රොත්‍රවිඥානය රූපනිමිත්ත මෙනෙහි කරන්නාහට උපදනේ වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

4. ස. පු: චක්ෂුර්විඥානය රූපාලම්බන මැ වේද, අන්‍යාලම්බන නොවන්නේ නො වේ ද?

ප. පටික්ඛෙපය: එසේ යැ.

ස. අනු: ශ්‍රොත්‍රවිඥානය රූපාලම්බන මැ වේ ද, අන්‍යාලම්බන නො වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

5. ස. පු: චක්ෂුසත් රූපාලම්බනයතුත් නිසා චක්ෂුර්විඥානය උපදනේ වේ ද?

ප. පටික්ඛෙපය: එසේ යැ.

ස. අනු: චක්ෂුසත් රූපාලම්බනයතුත් නිසා ශ්‍රොතවිඥානය උපදනේ වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

6. ස. පු: චක්ෂුසත් රූපාලම්බනයතුත් නිසා චක්ෂුර්විඥානය උපදනේ වේ ද?

ප. පටික්ඛෙපය: එසේ යැ.

ස. අනු: "චක්ෂුසත් රූපාලම්බනයතුත් නිසා ශ්‍රොත්‍රවිඥානය උපදනේ වේ" යයි වදාල සූත්‍රාන්තයෙක් ඇත්තේ මැ වේ ද?

ප. පටි: නැති.

ස. අනු: "චක්ෂුසත් රූපාලම්බනයතුත් නිසා චක්ෂුර්විඥානය උපදනේ වේ" යයි වදාල සූත්‍රාන්තයෙක් ඇත්තේ මැ වේ ද?

ප. පටික්ඛෙපය: එසේ යැ.

අනු. ඨ: ඉදින් "චක්ෂුසත් රූපාලම්බනයතුත් නිසා චක්ෂුර්විඥානය උපදනේ වේ" යයි වදාල සූත්‍රාන්තයෙක් ඇත්තේ මැ වේ නම්,

අනු. පා: හවත, 'චක්ෂුසත් රූපාලම්බනයතුත් නිසා ශ්‍රොත්‍රවිඥානය උපදනේ වේ'' යයි නො කියැයුතු මැ යැ.

7. ස. පු: චක්ඛුවිඤ්ඤාණස්ස අනන්තරා සොතවිඤ්ඤාණං උප්පජ්ජතී'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා

ස. අනු: තඤ්ඤෙ'ව චක්ඛුවිඤ්ඤාණං තං සොතවිඤ්ඤාණන්ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

8. ස. පු: සොතවිඤ්ඤාණස්ස අනන්තරා ඝානවිඤ්ඤාණං උප්පජ්ජති, ඝානවිඤ්ඤාණස්ස අනන්තරා ජිව්හාවිඤ්ඤාණං උප්පජ්ජති, ජිව්හාවිඤ්ඤාණස්ස අනන්තරා කායවිඤ්ඤාණං උප්පජ්ජතී'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: යා ජිව්හාවිඤ්ඤාණස්ස උප්පාදාය ආවට්ටනා -පෙ- පණිධි සා'ව කායවිඤ්ඤාණස්ස උප්පාදාය ආවට්ටනා -පෙ- පණිධී'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

9. ස. පු: ජිව්හාවිඤ්ඤාණස්ස අනන්තරා කායවිඤ්ඤාණං උප්පජ්ජති, න වත්තබ්බං "යා ජිව්හාවිඤ්ඤාණස්ස උප්පාදාය ආවට්ටනා -පෙ- පණිධි, සා'ව කායවිඤ්ඤාණස්ස උප්පාදාය ආවට්ටනා -පෙ- පණිධී'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: කායවිඤ්ඤාණං අනාවට්ටන්තස්ස උප්පජ්ජති -පෙ- අප්පණිදහන්තස්ස උප්පජ්ජතී'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

ස. අනු: නනු කායවිඤ්ඤාණං ආවට්ටන්තස්ස උප්පජ්ජති -පෙ- පණිදහන්තස්ස උප්පජ්ජතී'ති

ප. පටිඤ්ඤා: ආමන්තා.

අනු. ඨ: හඤ්චි කායවිඤ්ඤාණං ආවට්ටන්තස්ස උප්පජ්ජති, -පෙ- පණිදහන්තස්ස උප්පජ්ජති,

අනු. පා: නො ච වත රෙ වත්තබ්බෙ "ජිව්හාවිඤ්ඤාණස්ස අනන්තරා කායවිඤ්ඤාණං උප්පජ්ජතී"ති.

10 ස. පු: ජිව්හාවිඤ්ඤාණස්ස අනන්තරා කායවිඤ්ඤාණං උප්පජ්ජතී'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

7. ස. පු: චක්ඛුර්විඥනයට අනතුරු ව ශ්‍රොත්‍රවිඥනය උපදනේ වේ ද?

ප. පටිඤ්ඤ: එසේ ය.

ස. අනු: එ මැ චක්ඛුර්විඥනය ඒ ශ්‍රොත්‍රවිඥන වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු ය ...

8. ස. පු: ශ්‍රොත්‍රවිඥනයට අනතුරු ව ඝ්‍රාණවිඥනය උපදනේ වේ ද? ඝ්‍රාණවිඥනයට අනතුරු ව ජිහ්වාවිඥනය උපදනේ වේ ද? ජිහ්වාවිඥනයට අනතුරු ව කායවිඥනය උපදනේ වේ ද?

ප. පටිඤ්ඤ: එසේ ය.

ස. අනු: ජිහ්වාවිඥනයාගේ උපැත්මට යම් ආවර්තනා–යෙක් ... ප්‍රණිධියෙක් ඇද්ද, ඒ මැ කායවිඥන–යාගේ උපැත්මට අවර්තනා ... ප්‍රණිධි වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු ය ...

9. ස. පු: ජිහ්වාවිඥනයට අනතුරු ව කායවිඥනය උපදී, ජිහ්වාවිඥනයාගේ උපැත්මට යම් ආවර්තනා–යෙක් ... ප්‍රණිධියෙක් ඇද්ද, ඒ මැ කායවිඥන–යාගේ උපැත්මට ආවර්තනා ... ප්‍රණිධි වේ ද?

ප. පටිඤ්ඤ: එසේ ය.

ස. අනු: කායවිඥනය ආවර්තනා නො කරන්නහුට උපදනේ වේ ද, ... ප්‍රණිධි නො කරන්නහුට උපදනේ වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු ය ...

ස. අනු: කායවිඥනය ආවර්තනා කරන්නහුට උපදනේ නො, ... ප්‍රණිධි කරන්නහුට උපදනේ නො?

ප. පටිඤ්ඤ: එසේ ය.

අනු. ඨ: ඉදින් කායවිඥනය ආවර්තනා කරන්නහුට උපදනේ වේ නම් ... ප්‍රණිධි කරන්නහුට උපදනේ වේ නම්,

අනු පා: හවත, 'ජිහ්වාවිඥනයට අනතුරු ව කායවිඥනය උපදනේ ය'යි නො කියැයුතු මැ ය.

10. ස. පු: ජිහ්වාවිඥනයට අනතුරු ව කායවිඥනය උපදනේ වේ ද?

ප. පටිඤ්ඤ. එසේ ය.

ස. අනු: ජිව්හාවිඤ්ඤාණං රසනිමිත්තං මනසිකරොතො උප්පජ්ජතී'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: කායවිඤ්ඤාණං රසනිමිත්තං මනසිකරොතො උප්පජ්ජතී'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

11. ස. පු: ජිව්හාවිඤ්ඤාණං රසාරම්මණඤ්ඤෙව න අඤ්ඤාරම්මණන්ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: කායවිඤ්ඤාණං රසාරම්මණඤ්ඤෙ'ව න අඤ්ඤාරම්මණන්ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

12. ස. පු: ජිව්හඤ්ච පටිච්ච රසෙ ච උප්පජ්ජති ජිව්හාවිඤ්ඤාණන්ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: ජිව්හඤ්ච පටිච්ච රසෙ ච උප්පජ්ජති කායවිඤ්ඤාණන්ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

13. ස. පු: ජිව්හඤ්ච පටිච්ච රසෙ ච උප්පජ්ජති කායවිඤ්ඤාණන්ති.

ප. පටිඤ්ඤා: ආමන්තා

ස. අනු: "ජිව්හඤ්ච පටිච්ච රසෙ ච උප්පජ්ජති කායවිඤ්ඤාණ"න්ති අත්ථෙ'ව සුත්තන්තො'ති.

ප. පටි: නත්ථි.

ස. අනු: "ජිව්හඤ්ච පටිච්ච රසෙ ච උප්පජ්ජති ජිව්හාවිඤ්ඤාණ"න්ති අත්ථෙ'ව සුත්තන්තො'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

අනු. ථෙ: හඤ්චි ජිව්හඤ්ච පටිච්ච රසෙ ච උප්පජ්ජති ජිව්හාවිඤ්ඤාණන්ති අත්ථෙ'ව සුත්තන්තො,[1].

අනු. පා: නො ච වත රෙ වත්තබ්බෙ "ජිව්හඤ්ච පටිච්ච රසෙ ච උප්පජ්ජති කායවිඤ්ඤාණ"න්ති.

1. සුත්තන්තො'ති - සිමු

ස. අනු: ජිහ්වාවිඥානය රසනිමිත්ත මෙනෙහි කරන්නාහට උපදනේ වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යෑ.

ස. අනු: කායවිඥානය රසනිමිත්ත මෙනෙහි කරන්නාහට උපදනේ වේ ද?

ප. පටික්ඛෙප: එසේ නො කියැයුතු යෑ ...

11. ස. පු: ජිහ්වාවිඥානය රසාලම්බන මැ වේ ද, අන්‍යාලම්බන නො වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යෑ.

ස. අනු: කායවිඥානය රසාලම්බන මැ වේ ද, අන්‍යාලම්බන නො වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යෑ ...

12. ස. පු: ජිහ්වාත් රසාලම්බනයත් නිසා ජිහ්වාවිඥානය උපදනේ වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යෑ.

ස. අනු: ජිහ්වාත් රසාලම්බනයත් නිසා කායවිඥානය උපදනේ වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යෑ ...

13. ස. පු: ජිහ්වාත් රසාලම්බනයත් නිසා කායවිඥානය උපදනේ වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යෑ.

ස. අනු: ජිහ්වාත් රසාලම්බනයත් නිසා කායවිඥානය උපදිති'යි වදාළ සූත්‍රාන්තයෙක් ඇත්තේ මැ වේ ද?

ප. පටි: නැත.

ස. අනු: ජිහ්වාත් රසාලම්බනයත් නිසා ජිහ්වාවිඥානය උපදිති'යි වදාළ සූත්‍රාන්තයෙක් ඇත්තේ මැ වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යෑ.

අනු. ඨ: ඉදින් ජිහ්වාත් රසාලම්බනයත් නිසා ජිහ්වා-විඥානය උපදිතියි වදාළ සූත්‍රාන්තයෙක් ඇත් නම්,

අනු. පා: හවත, 'ජිහ්වාත් රසාලම්බනයත් නිසා කාය-විඥානය උපදනේ වේ' යයි නො කියැයුතු මැ යෑ.

14. ස. පු: ජිව්හාවිඤ්ඤාණස්ස අනන්තරා කායවිඤ්ඤාණං උප්පජ්ජතී'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: තඤ්ඤෙ'ව ජිව්හාවිඤ්ඤාණං තං කාය-විඤ්ඤාණන්ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

15. ප. පු: න වත්තබ්බං පඤ්චවිඤ්ඤාණා අඤ්ඤමඤ්ඤස්ස සමනන්තරා උප්පජ්ජන්තී'ති.

ස. පටිඤ්ඤා: ආමන්තා.

ප. අනු: නනු අත්ථි කොචි නච්චති, ගායති, වාදෙති, රූපඤ්ච පස්සති, සද්දඤ්ච සුණාති, ගන්ධඤ්ච ඝායති, රසඤ්ච සායති, ඵොට්ඨබ්බඤ්ච ඵුසතී'ති.

ස. පටිඤ්ඤා: ආමන්තා.

අනු. ඨ: හඤ්චි අත්ථි කොචි නච්චති, ගායති, වාදෙති, රූපඤ්ච පස්සති, සද්දඤ්ච සුණාති, ගන්ධඤ්ච ඝායති රසඤ්ච සායති, ඵොට්ඨබ්බඤ්ච ඵුසති,

අනු. පා: තෙන වත රෙ වත්තබ්බෙ "පඤ්චවිඤ්ඤාණා අඤ්ඤමඤ්ඤස්ස සමනන්තරා උප්පජ්ජන්තී"ති.

අනන්තරපච්චයකථා නිට්ඨිතා.

14. ස. පු: ජිහ්වාවිඥානයට අනතුරු වැ කායවිඥානය උපදනේ වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: ඒ ජිහ්වාවිඥානය මැ ඒ කායවිඥානය වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

15. ප. පු: 'පඤ්චවිඥානයෝ උත්‍පනට සමනන්තර වැ උපදිති'යි යනු නො කියැයුතු වේ ද?

ස. පටිඤ්ඤා: එසේ යැ.

ප. අනු: නටන, ගයන, වයන, රූ ද දක්නා, හඬ ද අසන, ගඳ ද අසන, රස ද ආස්වාද කරන, ස්‍ප්‍රෂ්ටව්‍යය ද ස්පර්ශ කරන යමෙක් ඇත් නු?

ස. පටිඤ්ඤා: එසේ යැ.

අනු. ඨ: නටන, ගයන, වයන, රූ ද දක්නා, හඬ ද අසන, ගන්ධය ද ආඝ්‍රාණ කරන, රසය ද ආස්වාද කරන ස්‍ප්‍රෂ්ටව්‍යය ද ස්පර්ශ කරන යමෙක් ඇත් නම්,

අනු. පා: හවත, එකරුණින් පඤ්චවිඥානයෝ උත්‍පනට අනතුරු වැ උපදනාහ'යි කියැයුතු මැ යැ.

(මෙහි නච්චතිගායති ආදි වචන අරමුණු හමුවීමෙහි ක්‍ෂණික පරිවර්තනය නිසා වන විඥානයන්ගේ ව්‍යක්ෂිභාවය මුත් ඔවුන්ගේ අනන්තර පච්චය භාවය නො කියති. එහෙයින් අසාධකයි.)

අනන්තරපච්චයකථා නිමි.

## 14. 4.

# අරියරූපකථා.

1. ස. පු: අරියරූපං මහාභූතානං උපාදායා'ති.
ප. පටිඤ්ඤා: ආමන්තා.
ස. අනු: අරියරූපං කුසලන්ති.
ප. පටිඤ්ඤා: ආමන්තා.
ස. අනු: මහාභූතා කුසලා'ති.
ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

2. ස. පු: මහාභූතා අබ්‍යාකතා'ති.
ප. පටිඤ්ඤා: ආමන්තා.
ස. අනු: අරියරූපං අබ්‍යාකතන්ති.
ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

3. ස. පු: අරියරූපං මහාභූතානං උපාදායා'ති.
ප. පටිඤ්ඤා: ආමන්තා.
ස. අනු: අරියරූපං අනාසවං අසංයොජනියං[1] අගන්ථනීයං[2] අනොඝනීයං [3]අයොගනීයං[4] අනීවරණියං අපරාමට්ඨං අනුපාදානියං අසංකිලෙසිකන්ති.[5]
ප. පටිඤ්ඤා: ආමන්තා.
ස. අනු: මහාභූතා අනාසවා -පෙ- අසංකිලෙසිකා'ති.
ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

4. ස. පු: මහාභූතා සාසවා සංයොජනියා -පෙ- සංකිලෙසිකා'ති.
ප. පටිඤ්ඤා: ආමන්තා.
ස. අනු: අරියරූපං සාසවං සංයොජනියං -පෙ-සංකිලෙසිකන්ති.
ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

5. ප. පු: න වත්තබ්බං 'අරියරූපං මහාභූතානං උපාදායා'ති.
ස. පටිඤ්ඤා: ආමන්තා.
ප. අනු: නනු වුත්තං භගවතා: "යං කිඤ්චි භික්ඛවෙ රූපං චත්තාරි මහාභූතානි චතුන්නඤ්ච මහාභූතානං උපාදාය රූප''න්ති අත්ථෙව සුත්තන්තොති.
ස. පටිඤ්ඤා: ආමන්තා.
ප. ආ: තෙන හි "අරියරූපං මහාභූතානං උපාදායා''ති.[4]

අරියරූපකථා නිට්ඨිතා.

1. අසංයොජනීයං - PTS.
2. අගන්ථනියං සිමු, මජසං, සයා.
3. අනොඝනියං - සිමු, මජසං, සයා.
4. අයොගනියං - සිමු, මජසං, සයා.
5. අසංකිලෙසියන්ති - මජසං.

## 14. 4.

# අරියරූපකථා.

**[සම්මාවාචා යෑ සම්මාකම්මන්ත යෑ යන මේ අරියරූපය යි ගණිති. එ ද උපාදායරූප යයි උත්තරාපථකනිකායවාසීන් සෙයින් ලබ්ධි ගත්තවුන්ගේ වාද බිඳුනම 'අරියරූපකථා' එයි.]**

**1.** ස. පු: ආර්‍යයරූපය මහාභූතයන්ගේ උපාදායරූප වේ ද?
ප. පටිඤ්ඤා: එසේ යෑ.
ස. අනු: ආර්‍යයරූප කුශල වේ ද?
ප. පටිඤ්ඤා: එසේ යෑ.
ස. අනු: මහාභූතයෝ කුශල වෙත් ද?
ප. පටි: එසේ නො කියැයුතු යෑ ...

**2.** ස. පු: මහාභූතයෝ අව්‍යාකෘත වෙත් ද?
ප. පටිඤ්ඤා: එසේ යෑ.
ස. අනු: ආර්‍යයරූප අව්‍යාකෘත වේ ද?
ප. පටි: එසේ නො කියැයුතු යෑ ...

**3.** ස. පු: ආර්‍යයරූපය මහාභූතයන්ගේ උපාදායරූප වේ ද?
ප. පටිඤ්ඤා: එසේ යෑ.
ස. අනු: ආර්‍යයරූපය අනාස්‍රව, අසංයොජනීය, අග්‍රන්‍ථනීය, අනොඝනීය, අයොගනීය, අනීවරණීය, අපරාමෘෂ්ට, අනුපාදනීය අසාංක්ලෙශික වේ ද?
ප. පටිඤ්ඤා: එසේ යෑ.
ස. අනු: මහාභූතයෝ අනාස්‍රව ... අසාංක්ලෙශික වෙත් ද?
ප. පටි: එසේ නො කියැයුතු යෑ ...

**4.** ස. පු: මහාභූතයෝ සාස්‍රව සංයොජනීය ... සාංක්ලෙශික වෙත් ද?
ප. පටිඤ්ඤා: එසේ යෑ.
ස. අනු: ආර්‍යයරූපය සාස්‍රව, සංයොජනීය ... සාංක්ලෙශික වේ ද?
ප. පටි: එසේ නො කියැයුතු යෑ ...

**5.** ප. පු: 'ආර්‍යයරූපය මහාභූතයන්ගේ උපාදායරූප වෙති'යි නො කියැයුතු වේ ද?
ස. පටිඤ්ඤා: එසේ යෑ.
ප. අනු: භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරනලද මැ නු: "මහණෙනි, සතර මහාභූතයෝ යෑ සතර මහාභූතයන්ගේ උපාදායරූපයෝ යෑ'යි යම් මැ රූපයෙක් වේ" යයි වදාළ සූත්‍රාන්තයෙක් ඇත්තේ මැ නු?
ස. පටිඤ්ඤා: එසේ යෑ.
ප. ආ: එකරුණින් 'අරියරූපය මහාභූතයන්ගේ උපාදාය රූප' වෙයි. (ආර්‍යයරූපය අසිද්ධ හෙයින් අසාධකයි.)

අරියරූපකථා නිමි.

## 14. 5.

# අඤ්ඤෙ අනුසයොතිකථා.

1. ස. පු. අඤ්ඤො කාමරාගානුසයො අඤ්ඤං කාමරාග-පරියුට්ඨානන්ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: අඤ්ඤො කාමරාගො අඤ්ඤං කාමරාගපරියුට්ඨා-නන්ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ –පෙ–

2. ස. පු: සො'ව කාමරාගො තං කාමරාගපරියුට්ඨානන්ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: සො'ව කාමරාගානුසයො තං කාමරාගපරියුට්ඨා-නන්ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ –පෙ–

3. ස. පු: අඤ්ඤො පටිඝානුසයො අඤ්ඤං පටිඝපරියුට්ඨා-නන්ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: අඤ්ඤං පටිඝං අඤ්ඤං පටිඝපරියුට්ඨානන්ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ –පෙ–

4. ස. පු: තඤ්ඤෙව පටිඝං තං පටිඝපරියුට්ඨානන්ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: සො'ව පටිඝානුසයො තං පටිඝපරියුට්ඨානන්ති

ප. පටි: න හෙවං වත්තබ්බෙ –පෙ–

5. ස. පු: අඤ්ඤො මානානුසයො අඤ්ඤං මානපරියුට්ඨා-නන්ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: අඤ්ඤො මානො අඤ්ඤං මානපරියුට්ඨානන්ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ –පෙ–

## 14. 5.

# අඤ්ඤෙ අනුසයොතිකථා.

[යම් හෙයෙකින් පෘථග්ජනයා කුසලාව්‍යාකෘත චිත්තය පවත්නා කල්හි 'සානුශයයහ'යි කියයුතු වුව ද 'පර්‍ය්‍යුත්ථිතයහ'යි නො කියයුතු බැවින් 'අනුශය නම් අනෙකෙක, පර්‍ය්‍යුත්ථාන නම් අනෙකෙකැ'යි අන්ධකනිකායවාසීන් සෙයින් ලබ්ධි ගත්තවුන්ගේ වාද බිඳුනම 'අඤ්ඤෙ අනුසයොතිකථා' එයි.]

1 ස. පු: කාමරාගානුශය අනෙකෙක් වේ ද, කාමරාග-පර්‍ය්‍යුත්ථාන අනෙකෙක් වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: කාමරාග අනෙකෙක් වේ ද, කාමරාගපර්‍ය්‍යුත්ථාන අනෙකෙක් වේ ද? (පර්‍ය්‍යුත්ථාන නම් නැගිසිටීමයි)

ප. පටි: එසේ නො කියයුතු යැ. ...

2. ස. පු: ඒ කාමරාගය මැ ඒ කාමරාගපර්‍ය්‍යුත්ථානය වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: ඒ කාමරාගානුශය මැ ඒ කාමරාගපර්‍ය්‍යුත්ථාන වේද?

ප. පටි: එසේ නො කියයුතු යැ ...

3. ස. පු: ප්‍රතිඝානුශය, අනෙකෙක් වේ ද, ප්‍රතිඝපර්‍ය්‍යුත්ථාන අනෙකෙක් වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: ප්‍රතිඝය අනෙකෙක් වේ ද, ප්‍රතිඝපර්‍ය්‍යුත්ථානය අනෙකෙක් වේ ද?

ප. පටි: එසේ නො කියයුතු යැ ...

4. ස. පු: ඒ ප්‍රතිඝය මැ ඒ ප්‍රතිඝපර්‍ය්‍යුත්ථාන වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ

ස. අනු: ඒ ප්‍රතිඝානුශය මැ ඒ ප්‍රතිඝපර්‍ය්‍යුත්ථාන වේ ද?

ප. පටි: එසේ නො කියයුතු යැ ...

5. ස. පු: මානානුශය අනෙකෙක් වේ ද, මානපර්‍ය්‍යුත්ථාන අනෙකෙක් වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: මානය අනෙකෙක් වේ ද, මානපර්‍ය්‍යුත්ථාන අනෙකෙක් වේ ද?

ප. පටි: එසේ නො කියයුතු යැ ...

6\. ස. පු: සො'ව මානො තං මානපරියුට්ඨානන්ති·

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: සො'ව මානානුසයො තං මානපරියුට්ඨානන්ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ –පෙ–

7\. ස. පු: අඤ්ඤො දිට්ඨානුසයො අඤ්ඤං දිට්ඨිපරියුට්ඨානන්ති.

ප. පටිඤ්ඤා. ආමන්තා.

ස. අනු: අඤ්ඤා දිට්ඨි අඤ්ඤං දිට්ඨිපරියුට්ඨානන්ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ –පෙ–

8\. ස. පු: සා'ව දිට්ඨි තං දිට්ඨිපරියුට්ඨානන්ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස අනු: සො'ව දිට්ඨානුසයො තං දිට්ඨිපරියුට්ඨානන්ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ –පෙ–

9\. ස. පු: අඤ්ඤො විචිකිච්ඡානුසයො අඤ්ඤං විචිකිච්ඡාපරියුට්ඨානන්ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: අඤ්ඤා විචිකිච්ඡා අඤ්ඤං විචිකිච්ඡාපරියුට්ඨන්ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ –පෙ–

10\. ස. පු: සා'ව විචිකිච්ඡා තං විචිකිච්ඡාපරියුට්ඨානන්ති

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: සො'ව විචිකිච්ඡානුසයො තං විචිකිච්ඡාපරියුට්ඨානන්ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ –පෙ–

11\. ස. පු: අඤ්ඤො භවරාගානුසයො අඤ්ඤං භවරාගපරියුට්ඨානන්ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: අඤ්ඤො භවරාගො අඤ්ඤං භවරාගපරියුට්ඨානන්ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ –පෙ–

6. ස· පු: ඒ මානය මැ ඒ මානපර්‍යුත්ථාන වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: ඒ මානානුශය මැ ඒ මානපර්‍යුත්ථාන වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

7. ස. පු: දෘෂ්ටි අනුශය අනෙකෙක් වේ ද? දෘෂ්ටිපර්‍යුත්ථාන අනෙකෙක් වේ ද?

පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: දෘෂ්ටි අනෙකක් වේ ද? දෘෂ්ටිපර්‍යුත්ථාන අනෙකෙක් වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

8. ස. පු: ඒ දෘෂ්ටි මැ ඒ දෘෂ්ටිපර්‍යුත්ථාන වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: ඒ දෘෂ්ටි අනුශය මැ ඒ දෘෂ්ටිපර්‍යුත්ථාන වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

9. ස. පු: විචිකිත්සානුශය අනෙකෙක් වේ ද, විචිකිත්සා-පර්‍යුත්ථාන අනෙකෙක් වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: විචිකිත්සා අනෙකක් වේ ද, විචිකිත්සාපර්‍යුත්ථාන අනෙකෙක් වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

10. ස. පු: ඒ විචිකිත්සා මැ ඒ විචිකිත්සාපර්‍යුත්ථාන වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: ඒ විචිකිත්සානුශය මැ ඒ විචිකිත්සාපර්‍යුත්ථාන වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

11. ස. පු: භවරාගානුශය අනෙකෙක් වේ ද, භවරාග-පර්‍යුත්ථාන අනෙකෙක් වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: භවරාගය අනෙකෙක් වේ ද, භවරාගපර්‍යුත්ථාන අනෙකෙක් වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

12. ස. පු: සො'ව භවරාගො තං භවරාගපරියුට්ඨානන්ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: සො'ව භවරාගානුසයො තං භවරාගපරියුට්ඨානන්ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

13. ස. පු: අඤ්ඤො අවිජ්ජානුසයො, අඤ්ඤං අවිජ්ජාපරියුට්ඨානන්ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: අඤ්ඤා අවිජ්ජා, අඤ්ඤං අවිජ්ජාපරියුට්ඨානන්ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

14. ස. පු: සා'ව අවිජ්ජා තං අවිජ්ජාපරියුට්ඨානන්ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: සො'ව අවිජ්ජානුසයො තං අවිජ්ජාපරියුට්ඨානන්ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

15. ප. පු: න වත්තබ්බං අඤ්ඤො අනුසයො අඤ්ඤං පරියුට්ඨානන්ති.

ස. පටිඤ්ඤා: ආමන්තා.

ප. අනු: පුථුජ්ජනො කුසලාබ්‍යාකතෙ චිත්තෙ වත්තමානෙ සානුසයො'ති වත්තබ්බො'ති.

ස. පටිඤ්ඤා: ආමන්තා.

ප. අනු: පරියුට්ඨිතො'ති වත්තබ්බො'ති.

ස. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

ප. ආ: තෙන හි අඤ්ඤො අනුසයො, අඤ්ඤං පරියුට්ඨානන්ති.

16. ප. පු: කුසලාබ්‍යාකතෙ චිත්තෙ වත්තමානෙ සරාගො'ති වත්තබ්බො'ති.

ස. පටිඤ්ඤා: ආමන්තා.

ප. අනු: පරියුට්ඨිතො'ති වත්තබ්බො'ති.

ස. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

ප. ආ: තෙන හි අඤ්ඤො රාගො, අඤ්ඤං පරියුට්ඨානන්ති.

අඤ්ඤො අනුසයොතිකථා නිට්ඨිතා.

12. ස. පු: ඒ භවරාග මැ ඒ භවරාගානුශය වේ ද?

ප. පටික්ඛෙපු: එසේ යැ.

ස. අනු: ඒ භවරාගානුශය මැ ඒ භවරාගපර්‍ය්‍යුත්ථාන වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

13. ස. පු: අවිද්‍යානුශය අනෙකෙක් වේ ද? අවිද්‍යාපර්‍ය්‍යුත්ථාන අනෙකෙක් වේ ද?

ප. පටික්ඛෙපු: එසේ යැ.

ස. අනු: අවිද්‍යා අනෙකක් වෙ ද? අවිද්‍යාපර්‍ය්‍යුත්ථාන අනෙකෙක් වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

14. ස. පු: ඒ අවිද්‍යා මැ ඒ අවිද්‍යාපර්‍ය්‍යුත්ථාන වේ ද?

ප. පටික්ඛෙපු: එසේ යැ.

ස. අනු: ඒ අවිද්‍යානුශය මැ ඒ අවිද්‍යාපර්‍ය්‍යුත්ථාන වේ ද?

ප. පටි. එසේ නො කියැයුතු මැ යැ ...

15. ප. පු. ‘අනුශය අනෙකෙකැ, පර්‍ය්‍යුත්ථාන අනෙකෙකැ’යි නො කියැයුතු වේ ද?

ස. පටික්ඛෙපු: එසේ යැ.

ප. අනු: පෘථග්ජන කුශලාව්‍යාකෘත සිත පවත්නා කල්හි සානුශය වේ යැ’යි කියැයුතු වේ ද?

ස. පටික්ඛෙපු: එසේ යැ.

ප. අනු: ‘පර්‍ය්‍යුත්ථිත යැ’යි කියැයුතු වේ ද?

ස. පටි: එසේ නො කියැයුතු යැ ...

ප. අා: එ කරුණින් ‘අනුශය අනෙකෙකැ, පර්‍ය්‍යුත්ථාන අනෙකෙකි.

16. ප. පු: කුශලාව්‍යාකෘතචිත්තය පවත්නා කල්හි ‘සරාග’ යයි කියැයුතු වේ ද?

ස. පටික්ඛෙපු: එසේ යැ.

ප. අනු: ‘පර්‍ය්‍යුත්ථිත’යයි කියැයුතු වේ ද?

ස. පටි: එසේ නො කියැයුතු යැ ...

ප. අා: එකරුණින් රාගය අනෙකෙකැ, පර්‍ය්‍යුත්ථාන අනෙකෙකි.

(මෙයින් අප්‍රහීන බැවින් සානුසයයි කියයුතු බවද, නො උපන් හෙයින් පර්‍ය්‍යුත්ථිත යයි නො කියයුතු බවද දක්වේ. අනුශය පර්‍ය්‍යුත්ථානයන්ගේ අන්‍ය-තාව නො දක්‍වේ. එහෙයින් අසාධකයි.)

අඤ්ඤෙ අනුසයො’ති කථා නිමි.

## 14. 6.

# පරියුට්ඨානං චිත්තවිප්පයුත්තන්තිකථා.

1. ස. පු: පරියුට්ඨානං චිත්තවිප්පයුත්තන්ති.

ප. පටික්ඛෙ: ආමන්තා.

ස. අනු: රූපං නිබ්බානං චක්ඛායතනං -පෙ- ඵොට්ඨබ්බායතනන්ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

2. ස. පු: පරියුට්ඨානං චිත්තවිප්පයුත්තන්ති.

ප. පටික්ඛෙ: ආමන්තා.

ස. අනු: නත්ථි සරාගං චිත්තං, සදොසං චිත්තං, සමොහං චිත්තං -පෙ- අකුසලං චිත්තං, සංකිලිට්ඨං චිත්තන්ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

ස. අනු: නනු අත්ථි සරාගං චිත්තං, සදොසං චිත්තං, සමොහං චිත්තං, -පෙ- අකුසලං චිත්තං සංකිලිට්ඨං චිත්තන්ති.

ප. පටික්ඛෙ: ආමන්තා.

අනු. ඨ: හඤ්චි අත්ථි සරාගං චිත්තං, සදොසං චිත්තං, සමොහං චිත්තං -පෙ- අකුසලං චිත්තං සංකිලිට්ඨං චිත්තං,

අනු. පා: නො ච වත රෙ වත්තබ්බෙ 'පරියුට්ඨානං චිත්තවිප්පයුත්ත'න්ති.

පරියුට්ඨානං චිත්තවිප්පයුත්තන්තිකථා නිට්ඨිතා.

## 14. 6.

# පරියුට්ඨානං චිත්තවිප්පයුත්තන්ති කථා.

[අනිත්‍යාදි විසින් මෙනෙහි කරනුවහමත් රාගාදීහු උපදිත්නු'යි පර්‍යුත්ථානය චිත්තවිප්‍රයුක්ත යයි අන්ධකනිකායවාසීන් සෙයින් ලබ්ධි ගත්තවුන්ගේ වාද බිඳුනම 'පරියුට්ඨානං චිත්තවිප්පයුත්තන්ති කථං' එයි.]

1. ස. පු: පර්‍යුත්ථානය චිත්තවිප්‍රයුක්ත වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: රූප යැ නිර්වාණ යැ චක්ෂුරායතන යැ ... ස්ප්‍රෂ්ටව්‍යායතනය වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

2. ස. පු: පර්‍යුත්ථානය චිත්තවිප්‍රයුක්ත වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: සරාග චිත්තයෙක් සදෙස චිත්තයෙක් සමොහ චිත්තයෙක් ... අකුශල චිත්තයෙක් සංක්ලිෂ්ට චිත්තයෙක් නැද්ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

ස. අනු: සරාග චිත්තයෙක් සදෙස චිත්තයෙක් සමොහ චිත්තයෙක් ... අකුශල චිත්තයෙක් සංක්ලිෂ්ට චිත්තයෙක් ඇත්තේ නො වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

අනු. ඨ: ඉදින් සරාග චිත්තයෙක් සදෙස චිත්තයෙක් සමොහ චිත්තයෙක් ... අකුශල චිත්තයෙක් සංක්ලිෂ්ට චිත්තයෙක් ඇත් නම්,

අනු. පා: භවත, 'පර්‍යුත්ථානය චිත්තවිප්‍රයුක්ත යැ'යි නො කියැයුතු මැ යැ.

පරියුට්ඨානං චිත්තවිප්පයුත්තන්ති කථං නිමි.

## 14. 7.

# පරියාපන්නකථා.

1. ස. පු: රූපරාගො රූපධාතුං අනුසෙති, රූපධාතුපරියාපන්නො'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: සමාපත්තෙසියො උපපත්තෙසියො දිට්ඨධම්මසුඛවිහාරො, සමාපත්තෙසියෙන චිත්තෙන උපපත්තෙසියෙන චිත්තෙන දිට්ඨධම්මසුඛවිහාරෙන චිත්තෙන සහගතො සහජාතො සංසට්ඨො සම්පයුත්තො එකුප්පාදො එකනිරොධො එකවත්ථුකො එකාරම්මණො'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

ස. අනු: නනු න සමාපත්තෙසියො න උපපත්තෙසියො න දිට්ඨධම්මසුඛවිහාරො, න සමාපත්තෙසියෙන චිත්තෙන න උපපත්තෙසියෙන චිත්තෙන න දිට්ඨධම්මසුඛවිහාරෙන චිත්තෙන සහගතො සහජාතො සංසට්ඨො සම්පයුත්තො එකුප්පාදො එකනිරොධො එකවත්ථුකො එකාරම්මණො'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

අනු. ඨ: හඤ්චි න සමාපත්තෙසියො න උපපත්තෙසියො න දිට්ඨධම්මසුඛවිහාරො -පෙ- එකාරම්මණො,

අනු. පා: තෙන වත රෙ වත්තබ්බෙ: රූපරාගො රූපධාතුං අනුසෙති, රූපධාතු පරියාපන්නො'ති.

2. ස. පු: රූපරාගො රූපධාතුං අනුසෙති, රූපධාතුපරියාපන්නො'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: සද්දරාගො සද්දධාතුං අනුසෙති, සද්දධාතුපරියාපන්නො'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

## 14 7.

# පරියාපන්නකථා.

[‘යම් හෙයෙකින් කාමරාගය කාමචිත්ත සඞ්ඛ්‍යාත කාමධාතුව සහජාත වශයෙන් ලුහුබඳනේ කාමධාතුපර්‍යාපන්න වේ ද, එහෙයින් මැ රූපාරූපරාගයෝත් රූපාරූපධාතු ලුහුබඳනාහු රූපාරූපධාතු පර්‍යාපන්න වෙති’යි අන්ධකසම්මිතීයනිකායවාසීන් සෙයින් ලබ්ධි ගත්තවුන්ගේ වාද බිඳුනම ‘පරියාපන්න කථා’ එයි.]

1. ස. පු: රූපරාගය රූපධාතුයෙහි අනුශය වශයෙන් පවත්තේ වේ ද? රූපධාතු පර්‍යාපන්න වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: සමාපත්තෙසිය වූයේ උපපත්තෙසිය වූයේ දිට්ඨ-ධම්මසුඛවිහාර වූයේ, සමාපත්තෙසිය චිත්තය හා උපපත්තෙසිය චිත්තය හා දිට්ඨධම්මසුඛවිහාර චිත්තය හා සහගත වූයේ සහජාත වූයේ සංසෘෂ්ට වූයේ සම්ප්‍රයුක්ත වූයේ එකොත්පාද එකනිරොධ එකවස්තුක එකාලම්බන වූයේ වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

ස. අනු: සමාපත්තෙසිය නො වූයේ උපපත්තෙසිය නො වූයේ දිට්ඨධම්මසුඛවිහාර නො වූයේ, සමාපත්තෙ-සිය නො වන චිත්තය හා උපපත්තෙසිය නො වන චිත්තය හා දිට්ඨධම්මසුඛවිහාර නො වන චිත්තය හා සහගත වැ සහජාත වැ සංසෘෂ්ට වැ සම්ප්‍රයුක්ත වැ එකොත්පාද වැ එකනිරොධ වැ එකවස්තුක වැ එකාලම්බන වැ සිටුනේ නො වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

අනු. ඨ: ඉදින් සමාපත්තෙසිය නො වූයේ උපපත්තෙසිය නො වූයේ දිට්ඨධම්මසුඛවිහාර නො වූයේ ... එකාලම්බන නො වී නම්,

අනු. පා: භවත, රූපරාගය රූපධාතුව අනුශය වශයෙන් ගත්තේ, රූපධාතු පර්‍යාපන්න වේ යයි නො කියැයුතු මැ යැ.

2. ස. පු: රූපරාගය රූපධාතුයෙහි අනුශය වශයෙන් පවත්තේ වේ ද? රූපධාතු පර්‍යාපන්න වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: ශබ්දරාගය ශබ්දධාතුයෙහි අනුශය වශයෙන් පවත්තේ වේ ද? ශබ්දධාතු පර්‍යාපන්න වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

3. ස. පු: රූපරාගො රූපධාතුං අනුසෙති, රූපධාතුපරියාපන්නො'ති.

ප. පටික්ඛු: ආමන්තා.

ස. අනු: ගන්ධරාගො -පෙ- රසරාගො -පෙ- ඵොට්ඨබ්බරාගො ඵොට්ඨබ්බධාතුං අනුසෙති, ඵොට්ඨබ්බධාතු පරියාපන්නො'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

4. ස. පු: සද්දරාගො සද්දධාතුං අනුසෙති, න වත්තබ්බං සද්දධාතුපරියාපන්නො'ති.

ප. පටික්ඛු: ආමන්තා.

ස. අනු: රූපරාගො රූපධාතුං අනුසෙති, න වත්තබ්බං රූපධාතුපරියාපන්නො'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

5. ස. පු: ගන්ධරාගො -පෙ- රසරාගො -පෙ- ඵොට්ඨබ්බරාගො ඵොට්ඨබ්බධාතුං අනුසෙති, න වත්තබ්බං ඵොට්ඨබ්බධාතුපරියපන්නොති.

ප. පටික්ඛු: ආමන්තා.

ස. අනු: රූපරාගො රූපධාතුං අනුසෙති, න වත්තබ්බං: රූපධාතුපරියාපන්නො'ති.

ප පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

6 ස. පු: අරූපරාගො අරූපධාතුං අනුසෙති, අරූපධාතු පරියාපන්නො'ති.

ප. පටික්ඛු: ආමන්තා.

ස. අනු: සමාපත්තෙසියො උපපත්තෙසියො දිට්ඨධම්මසුඛවිහාරො, සමාපත්තෙසියෙන චිත්තෙන උපපත්තෙසියෙන චිත්තෙන දිට්ඨධම්මසුඛවිහාරෙන චිත්තෙන සහගතො සහජාතො සංසට්ඨො සම්පයුත්තො එකුප්පාදො එකනිරොධො එකවත්ථුකො එකාරම්මණො'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

3. ස. පු: රූපරාගය රූපධාතුයෙහි අනුශය වශයෙන් පවත්නේ වේ ද, රූපධාතු පර්‍යාපන්න වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: ගන්ධරාගය ... රසරාගය ... ස්ප්‍රෂ්ටව්‍යරාගය ස්ප්‍රෂ්ටව්‍යධාතුයෙහි අනුශය වශයෙන් පවත්නේ වේ ද, ස්ප්‍රෂ්ටව්‍යධාතු පර්‍යාපන්න වේ ද?

ප පටි: එසේ නො කියැයුතු යැ ...

4. ස. පු: ශබ්දරාගය ශබ්දධාතුයෙහි අනුශය වශයෙන් පවත්නේ වේ ද, ශබ්දධාතුපර්‍යාපන්න වේ යයි නො කියැයුතු වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: රූපරාගය රූපධාතුයෙහි අනුශය වශයෙන් පවත්නේ වේ ද, රූපධාතු පර්‍යාපන්න වේ යයි නො කියැයුතු වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

5. ස. පු: ගන්ධරාගය ... රසරාගය ... ස්ප්‍රෂ්ටව්‍යරාගය ස්ප්‍රෂ්ටව්‍යධාතුයෙහි අනුශය වශයෙන් පවත්නේ වේ ද, ස්ප්‍රෂ්ටව්‍යධාතු පර්‍යාපන්න වේ යයි නො කියැයුතු වේ ද?

ප. පටිඤ්ඤා: එසේ ය.

ස. අනු: රූපරාගය රූපධාතුයෙහි අනුශය වශයෙන් පවත්නේ වේ ද, රූපධාතු පර්‍යාපන්න වේ යයි නො කියැයුතු වේ ද?

ප. පටිඤ්ඤා: එසේ නො කියැයුතු යැ ...

6. ස. පු: අරූපරාගය අරූපධාතුයෙහි අනුශය වශයෙන් පවත්නේ වේ ද, අරූපධාතුපර්‍යාපන්න වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: සමාපත්තෙසිය වූයේ උපපත්තෙසිය වූයේ දෘෂ්ටධර්මසුඛවිහාර වූයේ, සමාපත්තෙසිය චිත්තය හා උපපත්තෙසියචිත්තය හා දෘෂ්ටධර්මසුඛවිහාරචිත්තය හා සහගත සහජාත සංසෘෂ්ට සම්ප්‍රයුක්ත එකොත්පාද එකනිරෝධ එකවස්තුක එකාලම්බන වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

ස. අනු: නනු න සමාපත්තෙසියො න උපපත්තෙසියො න දිට්ඨධම්මසුඛවිහාරෙ, න සමාපත්තෙසියෙන චිත්තෙන සහගතො -පෙ- එකාරම්මණො'ති.

ප පටිඤ්ඤා: ආමන්තා.

අනු. ඨ: හඤ්චි න සමාපත්තෙසියො න උපපත්තෙසියො -පෙ- එකාරම්මණො,

අනු. පා: නො ච වත රෙ වත්තබ්බෙ "අරූපරාගො අරූපධාතුං අනුසෙති, අරූපධාතුපරියාපන්නො"ති.

7. ස. පු: අරූපරාගො අරූපධාතුං අනුසෙති, අරූපධාතු පරියාපන්නො'ති

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: සද්දරාගො සද්දධාතුං අනුසෙති, සද්දධාතු පරියාපන්නො'ති

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

8. ස. පු: අරූපරාගො අරූපධාතුං අනුසෙති, අරූපධාතු පරියාපන්නො'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: ගන්ධරාගො -පෙ- රසරාගො -පෙ- ඵොට්ඨබ්බ රාගො ඵොට්ඨබ්බධාතුං අනුසෙති, ඵොට්ඨබ්බධාතු පරියාපන්නො'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

9. ස. පු: සද්දරාගො සද්දධාතුං අනුසෙති, න වත්තබ්බං: සද්දධාතුපරියාපන්නො'ති.

ප. පටිඤ්ඤා ආමන්තා.

ස. අනු: අරූපරාගො අරූපධාතුං අනුසෙති, න වත්තබ්බං: අරූපධාතුපරියාපන්නො'ති.

ප පටි: න හෙවං වත්තබ්බං -පෙ-

10. ස. පු: ගන්ධරාගො -පෙ- රසරාගො[1] -පෙ- ඵොට්ඨබ්බ රාගො ඵොට්ඨබ්බධාතුං අනුසෙති, න වත්තබ්බං ඵොට්ඨබ්බධාතුපරියාපන්නො'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

---

1 ගන්ධරාගො -පෙ- රසරාගො - PTS ඌනං

ස. අනු: සමාපත්තෙසිය නො වූයේ උපපත්තෙසිය නො වූයේ දෘෂ්ටධර්මසුඛවිහාර නො වූයේ, සමාපත්තෙසිය නො වූ සිත හා ... එකාලම්බන නො?

ප. පටිඤ්ඤා; එසේ ය.

අනු. ඨ. ඉදින් සමාපත්තෙසිය නො වූයේ උපපත්තෙසිය නො වූයේ ... එකාලම්බන වේ නම්,

අනු. පා: භවත, "අරූපරාගය අරූපධාතුයෙහි අනුශය වශයෙන් පවත්තේ යයි ද, අරූපධාතුපයාීපන්න වේ" යයි ද නො කියැයුතු මැ යැ.

7. ස. පු: අරූපරාගය අරූපධාතුයෙහි අනුශය වශයෙන් පවත්තේ වේ ද? අරූපධාතු පයාීපන්න වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: ශබ්දරාගය ශබ්දධාතුයෙහි අනුශය වශයෙන් පවත්තේ වේ ද? ශබ්දධාතුපයාීපන්න වේ ද?

ප. ටි: එසේ නො කියැයුතු යැ ...

8. ස. පු: අරූපරාගය අරූපධාතුයෙහි අනුශය වශයෙන් පවත්තේ වේ ද? අරූපධාතු පයාීපන්න වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: ගන්ධරාගය ... රසරාගය ... සප්‍රෂ්ටව්‍යරාගය සප්‍රෂ්ටව්‍යධාතුයෙහි අනුශය වශයෙන් පවත්තේ වේ ද? සප්‍රෂ්ටව්‍යධාතුපයාීපන්න වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

9. ස. පු: ශබ්දරාගය ශබ්දධාතුයෙහි අනුශය වශයෙන් පවත්තේ වේ ද? ශබ්දධාතුපයාීපන්න වේ යයි නො කියයුතු වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: අරූපරාගය අරූපධාතුයෙහි අනුශය වශයෙන් පවත්තේ වේ ද? අරූපධාතුපයාීපන්න වේ ය'යි නො කියැයුතු වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ..

10. ස. පු: ගන්ධරාගය ... රසරාගය ... සප්‍රෂ්ටව්‍යරාගය සප්‍රෂ්ටව්‍යධාතුයෙහි අනුශය වශයෙන් පවත්තේ වේ ද? සප්‍රෂ්ටධාතුපයාීපන්න වේ යයි නො කියැයුතු වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: අරූපරාගො අරූපධාතුං අනුසෙති, න වත්තබ්බං: අරූපධාතුපරියාපන්නො'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

11\. ප. පු: න වත්තබ්බං: රූපරාගො රූපධාතුං අනුසෙති, රූපධාතුපරියාපන්නො, අරූපරාගො අරූපධාතුං අනුසෙති, අරූපධාතු පරියාපන්නො'ති.

ස. පටිඤ්ඤා: ආමන්තා.

ප. අනු: නනු කාමරාගො කාමධාතුං අනුසෙති, කාමධාතු පරියාපන්නො'ති.

ස. පටිඤ්ඤා: අමන්තා.

අනු. ඨ: හඤ්චි කාමරාගො කාමධාතුං අනුසෙති, කාමධාතු පරියාපන්නො,

අනු. පා: තෙන වත රෙ වත්තබ්බෙ "රූපරාගො රූපධාතුං අනුසෙති, රූපධාතුපරියාපන්නො; අරූපරාගො අරූපධාතුං අනුසෙති, අරූපධාතුපරියාපන්නො'ති.

පරියාපන්නකථා නිට්ඨිතා.

1 කාමරාගො -පෙ- රූපරාගො - PTS ඌනං.

ස. අනු: අරූපරාගය අරූපධාතුයෙහි අනුශය වශයෙන් පවත්නේ වේ ද? අරූපධාතුපර්‍යාපන්න වේ යයි නො කියැයුතු වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

11. ප. පු: රූපරාගය රූපධාතුයෙහි අනුශය වශයෙන් පවත්නේ වේ යයි ද, රූපධාතුපර්‍යාපන්න වේ යයි ද, අරූපරාගය අරූපධාතුයෙහි අනුශය වශයෙන් පවත්නේ වේ යයි ද, අරූපධාතුපර්‍යාපන්න වේ යයි ද නො කියැයුතු වේ ද?

ස. පටිඤ්ඤා: එසේ යැ.

ප. අනු: කාමරාගය කාමධාතුයෙහි අනුශය වශයෙන් පවත්නේ කාමධාතුපර්‍යාපන්න නො?

ස. පටිඤ්ඤා: එසේ යැ.

අනු. ඨ: ඉදින් කාමරාගය කාමධාතුයෙහි අනුශය වශයෙන් පවත්නේ කාමධාතුපර්‍යාපන්න වී නම්,

අනු. පා: භවත, එකරුණින් 'රූපරාගය රූපධාතුයෙහි අනුශය වශයෙන් පවතී යයි ද, රූපධාතුපර්‍යාපන්න යයි ද, අරූපරාගය අරූපධාතුයෙහි අනුශය වශයෙන් පවතී යයි ද, අරූපධාතුපර්‍යාපන්න යයි ද කියයුතු මැ යැ.

පරියාපන්නකථා නිමි.

## 14. 8.

## අබ්‍යාකතකථා.

1. ස. පු: දිට්ඨිගතං අබ්‍යාකතන්ති.

ප. පටිඤ්ඤා. ආමන්තා.

ස. අනු: විපාකාබ්‍යාකතං කිරියාබ්‍යාකතං රූපං නිබ්බානං චක්ඛායතනං -පෙ- ඵොට්ඨබ්බායතනන්ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

2. ස. පු: දිට්ඨිගතං අබ්‍යාකතන්ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: දිට්ඨිගතසම්පයුත්තො ඵස්සො අබ්‍යාකතො'ති.

ප. පටි; න හෙවං වත්තබ්බෙ -පෙ-

3. ස. පු: දිට්ඨිගතං අබ්‍යාකතන්ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: දිට්ඨිගතසම්පයුත්තා වෙදනා -පෙ- සඤ්ඤා -පෙ- චෙතනා -පෙ- චිත්තං අබ්‍යාකතන්ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

4. ස පු: දිට්ඨිගතසම්පයුත්තො ඵස්සො අකුසලො'ති.

ප පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: දිට්ඨිගතං අකුසලන්ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

5. ස. පු: දිට්ඨිගතසම්පයුත්තා වෙදනා -පෙ- සඤ්ඤා -පෙ- චෙතනා -පෙ- චිත්තං අකුසලන්ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: දිට්ඨිගතං අකුසලන්ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

## 14 8

# අබ්‍යාකතකථා.

[විපාක ක්‍රියා රූප නිර්වාණ යන චතුර්විධ අව්‍යාකෘතය අවිපාක බැවින් 'අව්‍යාකෘත' යයි වදාරනලද යැ. "සස්සතො ලොකොති ඛො වච්ඡ අබ්‍යාකතමෙතං" ආදි තන්හි ශාශ්වතාදි භාවයෙන් නො වදාල බැවින් අව්‍යාකෘත නම් වෙයි. මේ භේදය නො සෙන පළමු අව්‍යාකෘතය මෙන් මෑ දෘෂ්ටිගතය 'අව්‍යාකෘත' යයි අඩක උත්තරාපථක නිකායවාසීන් සෙයින් ලබ්ධි ගතුවන්ගේ වාද බිඳුනම 'අබ්‍යාකතකථා' එයි.]

1. ස. පු: දෘෂ්ටිගතය අව්‍යාකෘත වේ ද?

ප. පටික්ඛෙප: එසේ යැ.

ස. අනු: විපාකාව්‍යාකෘත වේ ද? ක්‍රියාව්‍යාකෘත වේ ද? රූප වේ ද? නිර්වාණ වේ ද? චක්ෂුරායතන වේ ද? ... සප්‍රෂ්ටව්‍යායතන වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

2. ස. පු: දෘෂ්ටිගතය අව්‍යාකෘත වේ ද?

ප. පටික්ඛෙප: එසේ යැ.

ස. අනු: දෘෂ්ටිගතසම්ප්‍රයුක්ත වූ ස්පර්ශය අව්‍යාකෘත වේ ද?

ප පටි: එසේ නො කියැයුතු යැ ...

3. ස. පු: දෘෂ්ටිගතය අව්‍යාකෘත වේ ද?

ප. පටික්ඛෙප: එසේ යැ.

ස. අනු: දෘෂ්ටිගතසම්ප්‍රයුක්ත වේදනා ... සංඥා ... චෙතනා ... චිත්තය අව්‍යාකෘත වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

4 ස. පු: දෘෂ්ටිගතසම්ප්‍රයුක්ත ස්පර්ශය අකුශල වේ ද?

ප. පටික්ඛෙප: එසේ යැ.

ස. අනු: දෘෂ්ටිගතය අකුශල වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

5. ස. පු: දෘෂ්ටිගතසම්ප්‍රයුක්ත වේදනා ... සංඥා ... චෙතනා... චිත්තය අකුශල වේ ද?

ප. පටික්ඛෙප: එසේ යැ.

ස. අනු: දෘෂ්ටිගතය අකුශල වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

6\. ස. පු: දිට්ඨිගතං අබ්‍යාකතන්ති.

ප. පටික්ඛෙපො: ආමන්තා.

ස. අනු: අඵලං අවිපාකන්ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

ස. අනු: නනු සඵලං සවිපාකන්ති.

ප. පටික්ඛෙපො: ආමන්තා.

අනු. ඨ: හඤ්චි සඵලං සවිපාකං,

අනු. පා: නො ච වත රෙ වත්තබ්බෙ "දිට්ඨිගතං අබ්‍යාකත'න්ති.

7\. ස. පු: දිට්ඨිගතං අබ්‍යාකතන්ති.

ප. පටික්ඛෙපො: ආමන්තා.

ස. අනු: නනු මිච්ඡාදිට්ඨිපරමානි වජ්ජානි,[1] වුත්තානි භගවතා'ති,

ප. පටික්ඛෙපො: ආමන්තා.

අනු. ඨ: හඤ්චි "මිච්ඡාදිට්ඨිපරමානි වජ්ජානි.[1] වුත්තානි භගවතා,

අනු. පා: නො ච වත රෙ වත්තබ්බෙ: දිට්ඨිගතං අබ්‍යාකතන්ති.

8 ස. පු: දිට්ඨිගතං අබ්‍යාකතන්ති.

ප. පටික්ඛෙපො: ආමන්තා.

ස. අනු: නනු වුත්තං භගවතා: "මිච්ඡාදිට්ඨි ඛො වජ්ජ, අකුසලං[2] -පෙ- සම්මාදිට්ඨි කුසල[3]න්ති.[a] අත්ථෙව සුත්තන්තො'ති.

ප. පටික්ඛෙපො: ආමන්තා.

ස. ආ: තෙන හි න වත්තබ්බං "දිට්ඨිගතං අබ්‍යාකත"න්ති

9\. ස. පු: දිට්ඨිගතං අබ්‍යාකතන්ති.

ප. පටික්ඛෙපො: ආමන්තා.

---

1. පරමානි මහාසාවජ්ජානි - මජසං.
2. අකුසලා - සීමු, මජසං
3. කුසලා - සීමු, මජසං

a. මජ්ඣිමනිකාය - මහාවච්ඡගොත්තසුත්ත.

6. ස. පු: දෘෂ්ටිගතය අව්‍යාකෘත වේ ද?
ප. පටිඤ්ඤා: එසේ යැ.
ස. අනු: අඵල අවිපාක වේ ද?
ප. පටි: එසේ නො කියැයුතු යැ ...
ස. අනු: සඵල සවිපාක නො?
ප. පටිඤ්ඤා: එසේ යැ.
අනු. ඨ: ඉදින් සඵල සවිපාක වී නම්,
අනු. පා: හවත, 'දෘෂ්ටිගතය අව්‍යාකෘත වේ ය'යි නො කියැයුතු මැ යැ.

7. ස. පු: දෘෂ්ටියගතය අව්‍යාකෘත වේ ද?
ප. පටිඤ්ඤා: එසේ යැ.
ස. අනු: භාග්‍යවතුන් වහන්සේ විසින් 'වද්‍යයෝ මිථ්‍යාදෘෂ්ටිය පරම කොට ඇත්තාහ'යි වදාරනලද නො?
ප. පටිඤ්ඤා: එසේ යැ.
අනු. ඨ: ඉදින් භාග්‍යවතුන් වහන්සේ විසින්: 'වද්‍යයෝ මිථ්‍යාදෘෂ්ටිය පරම කොට ඇත්තාහ'යි වදාරනලද වී නම්,
අනු. පා: හවත, දෘෂ්ටිගතය අව්‍යාකෘත වේ ය'යි නො කියැයුතු මැ යැ.

8. ස. පු: දෘෂ්ටිගතය අව්‍යාකෘත වේ ද?
ප. පටිඤ්ඤා: එසේ යැ.
ස. අනු: භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරනලද මැ නු: "වච්ඡය, මිථ්‍යාදෘෂ්ටි අකුශල වෙයි ... සම්‍යග්දෘෂ්ටි කුශල වේ"යයි වදාළ සූත්‍රාන්තයෙක් ඇත්තේ මැ නො?
ප. පටිඤ්ඤා: එසේ යැ.
ස. ආ: එකරුණින් 'දෘෂ්ටිගතය අව්‍යාකෘත වේ ය'යි නො කියැයුතු යැ.

9. ප. පු: දෘෂ්ටිගතය අව්‍යාකෘත වේ ද?
ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: නනු වුත්තං භගවතා "මිච්ඡාදිට්ඨිකස්ස ඛො අහං පුණ්ණ ද්වින්නං ගතීනං අඤ්ඤතරං ගතිං වදාමි: නිරයං වා තිරච්ඡානයොනිං වා"ති[a] අත්ථෙව සුත්තන්තො'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. ආ: තෙන හි න වත්තබ්බං: දිට්ඨිගතං අබ්‍යාකතන්ති.

10. ප. පු: න වත්තබ්බං "දිට්ඨිගතං අබ්‍යාකත"න්ති.

ස. පටිඤ්ඤා: ආමන්තා

ප. අනු: නනු වුත්තං භගවතා "සස්සතො ලොකො'ති ඛො වච්ඡ, අබ්‍යාකතමෙතං. අසස්සතො ලොකො'ති ඛො වච්ඡ, අබ්‍යාකතමෙතං. අන්තවා ලොකො'ති ඛො වච්ඡ, අබ්‍යාකතමෙතං. අනන්තවා ලොකො'ති ඛො වච්ඡ, -පෙ- තං ජීවං තං සරීරන්ති ඛො වච්ඡ -පෙ- අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති ඛො වච්ඡ -පෙ- හොති තථාගතො පරම්මරණා'ති ඛො වච්ඡ -පෙ- න හොති තථාගතො පරම්මරණා'ති ඛො වච්ඡ -පෙ- හොති ච න ච හොති තථාගතො පරම්මරණා'ති ඛො වච්ඡ -පෙ- නෙව හොති න න හොති තථාගතො පරම්මරණා'ති ඛො වච්ඡ, අබ්‍යාකතමෙත"න්ති[b] අත්ථෙව සුත්තන්තො'ති.

ස. පටිඤ්ඤා: ආමන්තා.

ප. ආ: තෙන හි "දිට්ඨිගතං අබ්‍යාකත"න්ති.

11. ස. පු: දිට්ඨිගතං අබ්‍යාකතන්ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: නනු වුත්තං භගවතා "මිච්ඡාදිට්ඨිකස්ස භික්ඛවෙ පුරිසපුග්ගලස්ස යඤ්චෙව කායකම්මං යථාදිට්ඨි සමත්තං සමාදින්නං, යඤ්ච වචීකම්මං -පෙ- යඤ්ච මනොකම්මං -පෙ- යා ච චෙතනා, යා ච පත්ථනා, යො ච පණිධි, යෙ ච සඞ්ඛාරා, සබ්බෙ තෙ ධම්මා අනිට්ඨාය අකන්තාය අමනාපාය අහිතාය දුක්ඛාය සංවත්තන්තී"ති[c] අත්ථෙව සුත්තන්තො'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. පා: තෙන හි න වත්තබ්බං "දිට්ඨිගතං අබ්‍යාකත"න්ති.

අබ්‍යාකතකථා නිට්ඨිතා.

---

a. මජ්ඣිමනිකාය - කුක්කුරවතියසුත්ත
b. සංයුත්තනිකාය -අබ්‍යාකතසංයුත්ත-මොග්ගල්ලානසුත්තං සමන්තාහරිතබ්බං.
c. එකකඞ්ගුත්තර - එකධම්මපාළි - දුතියවග්ග - 9 සුත්ත

ස. අනු: භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරනලද මැ නුඃ "පුණ්ණය, මම මිථ්‍යාදෘෂ්ටිකයාහට දෙගතින් අතුරින් එක්තරා ගතියක් කියමි: නිරය හෝ යැ තිරිසන්යොන හෝ යැ"යි වදාළ සූත්‍රාන්තයෙක් ඇත්තේ මැ නු?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අ‍ාඃ එකරුණින් 'දෘෂ්ටිගතය අව්‍යාකෘත වේ'යි නො කියයුතු යැ.

10. ප. පු: 'දෘෂ්ටිගතය අව්‍යාකෘත වේ'යි නො කියයුතු වේ ද?

ස. පටිඤ්ඤා: එසේ යැ.

ප. අනු: භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරනලද මැ නුඃ "වච්ඡය, 'ලොකය ශාශ්වත යැ' යන තෙල කරුණ මා විසින් අව්‍යාකෘත යැ. වච්ඡය, 'ලොකය අශාශ්වත යැ' යන තෙල කරුණ මා විසින් අව්‍යාකෘත යැ. වච්ඡය 'ලොකය අන්තවත් යැ' යන තෙල කරුණ මා විසින් අව්‍යාකෘතයැ. වච්ඡය 'ලොකය අනන්තවත් යැ' ... වච්ඡය 'එ මැ ජීව යැ එ මැ ශරීර යැ' ... වච්ඡය, 'ජීව අනෙකෙකැ, ශරීර අනෙකෙකි' ... වච්ඡය, සත්ත්වයා මරණින් මතු වෙයි' ... වච්ඡය, 'සත්ත්වයා මරණින් මතු නො වෙයි' ... වච්ඡය, 'සත්ත්වයා මරණින් මතු වන්නේත් නො ද වන්නේත් වෙයි' .. වච්ඡය සත්ත්වයා මරණින් මතු නො මැ වෙයි, නො වන්නේ නො වෙයි' යන තෙල කරුණ මා විසින් අව්‍යාකෘත යැ"යි වදාළ සූත්‍රාන්තයෙක් ඇත්තේ මැ නු ?

ස. පටිඤ්ඤා: එසේ යැ.

ප. අ‍ාඃ එකරුණින් දෘෂ්ටිගතය අව්‍යාකෘත වෙයි.

11. ස. පු: දෘෂ්ටිගතය අව්‍යාකෘත වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරනලද මැ නුඃ "මහණෙනි, මිථ්‍යාදෘෂ්ටික පුරුෂපුද්ගල විසින් ලබ්ධි ඇති සැටියෙන් සමාත්ත සමාදින්න යම් මැ කායකර්මයකුත් යම් මැ වාක්කර්මයකුත් ... යම් මැ මනඃකර්මයකුත් ... යම් මැ චෙතනාවකුත්, යම් මැ ප්‍රාර්ථනාවකුත්, යම් මැ ප්‍රණිධියෙකුත්, යම් මැ සංස්කාර කෙනෙකුත් ඇද්ද, එ හැම ධර්මයෝ අනිෂ්ට පිණිස අකාන්ත පිණිස අමනාප පිණිස අහිත පිණිස දුක් පිණිස පවතිත්"යයි වදාළ සූත්‍රාන්තයෙක් ඇත්තේ මැ නු?

ප. පටිඤ්ඤා: එසේ යැ

ස පාඃ එකරුණින් 'දෘෂ්ටිගතය අව්‍යාකෘත වේ'යි නො කියයුතු යැ.

අව්‍යාකෘතකථා නිමි.

## 14. 9.

# අපරියාපන්නකථා.

1. ස. පු: දිට්ඨිගතං අපරියාපන්න'න්ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: මග්ගො, ඵලං, නිබ්බානං, සොතාපත්තිමග්ගො, සොතාපත්තිඵලං, සකදාගාමිමග්ගො, සකදාගාමි-ඵලං, අනාගාමිමග්ගො, අනාගාමිඵලං, අරහත්තමග්ගො, අරහත්තඵලං, සතිපට්ඨානං, සම්මප්පධානං ඉද්ධිපාදො, ඉන්ද්‍රියං, බලං, බොජ්ඣඞ්ගො'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

2. ප. පු: න වත්තබ්බං දිට්ඨිගතං අපරියාපන්නන්ති.

ස. පටිඤ්ඤා: ආමන්තා.

ප. අනු: 'පුථුජ්ජනො කාමෙසු වීතරාගො'ති වත්තබ්බො'ති

ස. පටිඤ්ඤා: ආමන්තා.

ප. අනු: 'විගතදිට්ඨියො'ති වත්තබ්බො'ති.

ස. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

ප. පං: තෙන හි දිට්ඨිගතං අපරියාපන්නන්ති.

අපරියාපන්නකථා නිට්ඨිතා.

ඛුද්දසමො වග්ගො.

තස්සුද්දානං:

අකුසලමූලං පටිසන්දහති කුසලමූලං
කුසලමූලං පටිසන්දහති අකුසලමූලං
සළායතනං ඡ විඤ්ඤාණකායා
අරියරූපං මහාභූතානුපාදය
සෙවානුසයො තං පරියුට්ඨානං
යථාධාතු තණ්හාදවනුසෙති
දිට්ඨිගතං අබ්‍යාකතමපරියාපන්නන්ති.

## 14. 9.

# අපරියාපන්නකථා.

[යම් හෙයෙකින් පෘථග්ජන පුද්ගල ‘කාමයෙහි වීතරාගය’යි කියයුතු වේ ද, ‘විගතදෘෂ්ටිකය’යි නො කියයුතු වේ ද, එහෙයින් ‘දෘෂ්ටිය අපරියාපන්න යැ’යි පූර්වශෛලීයනිකායවාසීන් සෙයින් ලබ්ධි ගත්තවුන්ගේ වාද බිඳුනම ‘අපරියාපන්නකථා’ එයි.]

1. ස. පු: දෘෂ්ටිගතය අපරියාපන්න වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: මාර්ග වේ ද? ඵල වේ ද? නිර්වාණ වේ ද? ශ්‍රොතාපත්තිමාර්ග වේ ද? ශ්‍රොතාපත්තිඵල වේ ද? සකෘදාගාමිමාර්ග වේ ද? සකෘදාගාමිඵල වේ ද? අනාගාමිමාර්ග වේ ද? අනාගාමිඵල වේ ද? අර්හත්වමාර්ග වේ ද? අර්හත්වඵල වේ ද? ස්මෘතිප්‍රස්ථාන වේ ද? සම්‍යක්ප්‍රධාන වේ ද? සෘද්ධිපාද වේ ද? ඉන්ද්‍රිය වේ ද? බල වේ ද? බොධ්‍යඞ්ග වේ ද?

ප. පටි: එසේ නො කියයුතු යැ ...

2. ප. පු: ‘දෘෂ්ටිගතය අපර්‍යාපන්න වේය’යි නො කියයුතු වේ ද?

ස. පටිඤ්ඤා: එසේ යැ.

ප. අනු: පෘථග්ජන පුද්ගල ‘කාමයෙහි වීතරාගය’යි කියයුතු වේ ද?

ස. පටිඤ්ඤා: එසේ යැ.

ප. අනු: ‘විගතදෘෂ්ටිකය’යි කියයුතු වේ ද?

ස. පටි: එසේ නො කියයුතු යැ ...

ප. පා: එකරුණින් ‘දෘෂ්ටිගතය අපර්‍යාපන්න වෙයි.

අපරියාපන්නකථා නිමි.

තුදුස්වන වග සි.

**එහි උද්දානය:**

කුසලාකුසලපටිසන්දහනකථා යැ සළායතනුප්පත්තිකථා යැ අනන්තරපච්චයකථා යැ අරියරූපකථා යැ අඤ්ඤො අනුසයොති කථා යැ පරියුට්ඨානං චිත්තවිප්පයුත්තන්ති කථා යැ පරියාපන්නකථා යැ අබ්‍යාකත කථා යැ අපරියාපන්නකථා යි.

# පණ්ණරසමො වග්ගො.

## 15. 1.

## පච්චයකථා.

1. ස. පු: පච්චයතා වවත්ථිතා'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: නනු වීමංසා හෙතු, සො ච අධිපතී'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. ඨ: හඤ්චි වීමංසා හෙතු, සො ච අධිපති,

ස. පා: තෙන වත රෙ වත්තබ්බෙ "හෙතුපච්චයෙන පච්චයො, අධිපතිපච්චයෙන පච්චයො"ති.

2. ස. අනු: නනු ඡන්දාධිපති සහජාතානං ධම්මානං අධිපතී'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. ඨ: හඤ්චි ඡන්දාධිපති සහජාතානං ධම්මානං අධිපති,

ස. පා: තෙන වත රෙ වත්තබ්බෙ "අධිපතිපච්චයෙන පච්චයො, සහජාතපච්චයෙන පච්චයො"ති.

3. ස. අනු: නනු විරියාධිපති සහජාතානං ධම්මානං අධිපතී'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. ඨ: හඤ්චි විරියාධිපති සහජාතානං ධම්මානං අධිපති,

ස. පා: තෙන වත රෙ වත්තබ්බෙ "අධිපතිපච්චයෙන පච්චයො, සහජාතපච්චයෙන පච්චයො"ති.

## පසළොස්වන වග

### 15. 1.

### පච්චයකථා.

[යම් ධර්මයෙක් හෙතු ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ නම්, ඒ ධර්මය යම් ධර්මකෙනකුන්ට හේතුප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ ද, ඒ ධර්මයනට මෑ යම් හෙයෙකින් ආලම්බන අනන්තර සමනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය නො වේ ද, යම් ධර්මයෙක් ආලම්බන ප්‍රත්‍යයෙන් හෝ ප්‍රත්‍යය වේ නම්, ඒ ධර්මය යම් හෙයෙකින් ඔවුනට මෑ අනන්තර සමනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය නො වේ ද, එහෙයින් 'ප්‍රත්‍යය භාවය ව්‍යවස්ථාවත් (නියමයන් අනුව) වේ' යයි මහාසාංඝිකනිකායවංසීන් සෙයින් ලබ්ධි ගත්තවුන්ගේ වාදය බිඳුනට 'පච්චයකථා' එයි ]

1. ස. පු: ප්‍රත්‍යයභාවය ව්‍යවස්ථිත වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යෑ.

ස. අනු: විමංසා හෙතු නො, එ ද අධිපති නො?

ප. පටිඤ්ඤා: එසේ යෑ.

ස. ඨ: ඉදින් විමංසා හෙතු වේ නම්, එ ද අධිපති වේ නම්,

ස. පා: භවත එකරුණින් "හෙතුප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ යයි ද, අධිපති ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ" යයි ද කියැයුතු යෑ.

2. ස. අනු: ඡන්දාධිපති ධර්මය සහජාතධර්මයනට අධිපති වත්තේ නො?

ප. පටිඤ්ඤා: එසේ යෑ.

ස. ඨ: ඉදින් ඡන්දාධිපති ධර්මය සහජාත ධර්මයනට අධිපති වේ නම්,

ස. පා: භවත එකරුණින් 'අධිපතිප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙයි, සහජාත ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙයි' යනු කියැයුතු යෑ.

3. ස. අනු: වීර්‍ය්‍යාධිපති ධර්මය සහජාතධර්මයනට අධිපති වත්තේ නො?

ප. පටිඤ්ඤා: එසේ යෑ.

ස. ඨ: ඉදින් වීර්‍ය්‍යාධිපතිධර්මය සහජාතධර්මයනට අධිපති වේ නම්,

ස. පා: භවත එකරුණින් අධිපතිප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වූයේ සහජාතප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙයි' යනු කියැයුතු මෑ යෑ.

4. ස. අනු: නනු විරියාධිපති සහජාතානං ධම්මානං අධිපති, තං ච ඉන්ද්‍රියන්ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. ඨ. හඤ්චි විරියාධිපති සහජාතානං ධම්මානං අධිපති තං ච ඉන්ද්‍රියං,

ස. පා: තෙන වත රෙ වත්තබ්බෙ "අධිපතිපච්චයෙන පච්චයො, ඉන්ද්‍රියපච්චයෙන පච්චයො"ති.

5. ස. අනු: නනු විරියාධිපති සහජාතානං ධම්මානං අධිපති, තං ච මග්ගඞ්ගන්ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. ඨ: හඤ්චි විරියාධිපති සහජාතානං ධම්මානං අධිපති, තඤ්ච මග්ගඞ්ගං,

ස. පා: තෙන වත රෙ වත්තබ්බෙ "අධිපතිපච්චයෙන පච්චයො, මග්ගපච්චයෙන පච්චයො" ති

6. ස. අනු: නනු චිත්තාධිපති සහජාතානං ධම්මානං අධිපතී'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා

ස. ඨ: හඤ්චි චිත්තාධිපති සහජාතානං ධම්මානං අධිපති,

ස. පා: තෙන වත රෙ වත්තබ්බෙ "අධිපතිපච්චයෙන පච්චයො, සහජාතපච්චයෙන පච්චයො"ති.

7. ස. අනු. නනු චිත්තාධිපති සහජාතානං ධම්මානං අධිපති, සො ච ආහාරො'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. ඨ: හඤ්චි චිත්තාධිපති සහජාතානං ධම්මානං අධිපති, සො ච ආහාරො,

ස. පා: තෙන වත රෙ වත්තබ්බෙ "අධිපතිපච්චයෙන පච්චයො, ආහාරපච්චයෙන පච්චයො"ති.

8. ස. අනු: නනු චිත්තාධිපති සහජාතානං ධම්මානං අධිපති, තඤ්ච ඉන්ද්‍රියන්ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. ඨ: හඤ්චි චිත්තාධිපති සහජාතානං ධම්මානං අධිපති, තං ච ඉන්ද්‍රියං,

ස. අනු: තෙන වත රෙ වත්තබ්බෙ "අධිපතිපච්චයෙන පච්චයො, ඉන්ද්‍රියපච්චයෙන පච්චයො"ති

4. ස. අනු: වීර්‍ය්‍යාධිපතිධර්මය සහජාතධර්මයනට අධිපති වෙයි, එ ද ඉන්ද්‍රිය වන්නේ නො වේ ද?

ප. පටික්ඛෙපය: එසේ යැ.

ස. ඨ: ඉදින් වීර්‍ය්‍යාධිපතිධර්මය සහජාතධර්මයනට අධිපති වන්නේ එ ද ඉන්ද්‍රිය වේ නම්,

ස. පා: හවත එකරුණින් 'අධිපතිප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වූයේ ඉන්ද්‍රියප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වේ ය'යි කියැයුතු මැ යැ.

5. ස. අනු: වීර්‍ය්‍යාධිපතිධර්මය සහජාතධර්මයනට අධිපති වෙයි, එ ද මාර්‍ගාඞ්ග වන්නේ නො වේ ද?

ප. පටික්ඛෙපය: එසේ යැ.

ස. ඨ: ඉදින් වීර්‍ය්‍යාධිපතිධර්මය සහජාතධර්මයනට අධිපති වන්නේ එ ද මාර්‍ගාඞ්ග වේ නම්,

ස. පා: හවත, එකරුණින් 'අධිපතිප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වූයේ මාර්‍ගප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වේ' යයි කියැයුතු මැ යැ.

6. ස. අනු: චිත්තාධිපතිධර්මය සහජාතධර්මයනට අධිපති වන්නේ නො?

ප. පටික්ඛෙපය: එසේ යැ.

ස. ඨ: ඉදින් චිත්තාධිපතිධර්මය සහජාතධර්මයනට අධිපති වේ නම්,

ස. පා: හවත එකරුණින් 'අධිපතිප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වූයේ සහජාතප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වේ' යයි කියැයුතු මැ යැ.

7. ස. අනු: චිත්තාධිපතිධර්මය සහජාතධර්මයනට අධිපති වෙයි· එ ද ආහාර වන්නේ නො වේ ද?

ප. පටික්ඛෙපය එසේ යැ.

ස. ඨ. ඉදින් චිත්තාධිපතිධර්මය සහජාතධර්මයනට අධිපති, වන්නේ එ ද ආහාර වේ නම්,

ස. පා: හවත එකරුණින් 'අධිපතිප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වූයේ ආහාර ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වේ' යයි කියැයුතු මැ යැ,

8. ස. අනු: චිත්තාධිපතිධර්මය සහජාතධර්මයනට අධිපති වෙයි. එ ද ඉන්ද්‍රිය වන්නේ නො වේ ද?

ප. පටික්ඛෙපය: එසේ යැ.

ස. ඨ: ඉදින් චිත්තාධිපති ධර්මය සහජාතධර්මයනට අධිපති වන්නේ එ ද ඉන්ද්‍රිය වේ නම්,

ස. පා: හවත එකරුණින් 'අධිපති ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වූයේ ඉන්ද්‍රියප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වේ' යයි කියැයුතු මැ යැ.

9. ස. අනු: විමංසාධිපති සහජාතානං ධම්මානං අධිපතී'ති.

ප. පටික්ඛෙපො: ආමන්තා.

ස. ඨ: හඤ්චි විමංසාධිපති සහජාතානං ධම්මානං අධිපති,

ස. පා: තෙන වත රෙ වත්තබ්බෙ "අධිපතිපච්චයෙන පච්චයො, සහජාතපච්චයෙන පච්චයො"ති.

10. ස. අනු: නනු විමංසාධිපති සහජාතානං ධම්මානං අධිපති, තං ච ඉන්ද්‍රියන්ති.

ප. පටික්ඛෙපො: ආමන්තා.

ස. ඨ: හඤ්චි විමංසාධිපති සහජාතානං ධම්මානං අධිපති, තං ච ඉන්ද්‍රියං,

ස. පා: තෙන වත රෙ වත්තබ්බෙ "අධිපතිපච්චයෙන පච්චයො, ඉන්ද්‍රියපච්චයෙන පච්චයො"ති.

11. ස. අනු: නනු විමංසාධිපති සහජාතානං ධම්මානං අධිපති, තං ච මග්ගඞ්ගන්ති.

ප. පටික්ඛෙපො: ආමන්තා.

ස. ඨ: හඤ්චි විමංසාධිපති සහජාතානං ධම්මානං අධිපති, තං ච මග්ගඞ්ගං,

ස. පා: තෙන වත රෙ වත්තබ්බෙ "අධිපතිපච්චයෙන පච්චයො, මග්ගපච්චයෙන පච්චයො"ති.

12. ස. අනු: නනු අරියං ධම්මං ගරුං කත්වා උප්පජ්ජති පච්චවෙක්ඛණා, තං චාරම්මණන්ති.

ප. පටික්ඛෙපො: ආමන්තා.

ස. ඨ: හඤ්චි අරියං ධම්මං ගරුං කත්වා උප්පජ්ජති පච්චවෙක්ඛණා, තං චාරම්මණං,

ස. පා: තෙන වත රෙ වත්තබ්බෙ "අධිපතිපච්චයෙන පච්චයො, ආරම්මණපච්චයෙන පච්චයො"ති.

13. ස. අනු: නනු පුරිමා පුරිමා කුසලා ධම්මා පච්ඡිමානං පච්ඡිමානං කුසලානං ධම්මානං අනන්තරපච්ච- යෙන පච්චයො, සා ච ආසෙවනා'ති.

ප. පටික්ඛෙපො: ආමන්තා.

9. ස. අනු: වීමංසාධිපති ධර්මය සහජාතධර්මයනට අධිපති වන්නේ නො වේ ද?

ප. පටික්ඛෙපා: එසේ යැ.

ස. ඨ: ඉදින් වීමංසාධිපති ධර්මය සහජාතධර්මයනට අධිපති වේ නම්,

ස. පා: භවත එකරුණින් ‘අධිපතිප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වූයේ සහජාතප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ’ යයි කියැයුතු මැ යැ.

10. ස. අනු: වීමංසාධිපති ධර්මය සහජාතධර්මයනට අධිපති වූයේ එ ද ඉන්ද්‍රිය වන්නේ නො වේ ද?

ප. පටික්ඛෙපා: එසේ යැ.

ස. ඨ: ඉදින් වීමංසාධිපති ධර්මය සහජාතධර්මයනට අධිපති වූ යේ . එ ද ඉන්ද්‍රිය වේ නම්,

ස. පා: භවත එකරුණින් ‘අධිපතිප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වූයේ ඉන්ද්‍රිය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ’යයි කියැයුතු මැ යැ.

11. ස. අනු: වීමංසාධිපති ධර්මය සහජාතධර්මයනට අධිපති වූයේ එ ද මාර්ගාඞ්ග වන්නේ නො වේ ද?

ප. පටික්ඛෙපා: එසේ යැ.

ස. ඨ: ඉදින් වීමංසාධිපති ධර්මය සහජාතධර්මයන්ට අධිපති වූයේ එ ද මාර්ගාඞ්ග වේ නම්,

ස. පා: භවත එකරුණින් ‘අධිපතිප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වූයේ මාර්ගප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ’යයි කියයුතු මැ යැ.

12. ස. අනු: ආර්‍ය්‍යධර්මය ගරුකොට ප්‍රත්‍යවේක්‍ෂණා උපදනේ නො? එ ද අරමුණු නො?

ප. පටික්ඛෙපා: එසේ යැ.

ස. ඨ: ඉදින් අර්‍ය්‍යධර්මය ගරු කොට ප්‍රත්‍යවේක්‍ෂණා උපදනේ වේ නම්, එ ද අරමුණු වේ නම්,

ස. පා: භවත එකරුණින් ‘අධිපතිප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වූයේ ආලම්බනප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ’ යයි කියයුතු මැ යැ.

13. ස. අනු: පුරිම පුරිම කුශලධර්මයෝ පශ්චිම පශ්චිම කුශල ධර්මයනට අනන්තරප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය නො? එ ද ආසෙවනා නො?

ප. පටික්ඛෙපා: එසේ යැ.

ස. ථා: හඤ්චි පුරිමා පුරිමා කුසලා ධම්මා පච්ඡිමානං පච්ඡිමානං කුසලානං ධම්මානං අනන්තරපච්චයෙන පච්චයො, සා ච ආසෙවනා.

ස. පා: තෙන වත රෙ වත්තබ්බෙ "අනන්තරපච්චයෙන පච්චයො ආසෙවනපච්චයෙන පච්චයො"ති.

14. ස. පු: නනු පුරිමා පුරිමා අකුසලා ධම්මා පච්ඡිමානං පච්ඡිමානං අකුසලානං ධම්මානං අනන්තරපච්චයෙන පච්චයො, සා ච ආසෙවනා'ති.

ප. පටි: ආමන්තා.

ස. ථා: හඤ්චි පුරිමා පුරිමා අකුසලා ධම්මා පච්ඡිමානං පච්ඡිමානං අකුසලානං ධම්මානං අනන්තරපච්චයෙන පච්චයො, සා ච ආසෙවනා,

ස. පා: තෙන වත රෙ වත්තබ්බෙ "අනන්තරපච්චයෙන පච්චයො, ආසෙවනපච්චයෙන පච්චයො"ති

15. ස. පු: නනු පුරිමා පුරිමා කිරියාබ්‍යාකතා ධම්මා පච්ඡිමානං පච්ඡිමානං කිරියාබ්‍යාකතානං ධම්මානං අනන්තරපච්චයෙන පච්චයො, සා ච ආසෙවනාති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. ථා: හඤ්චි පුරිමා පුරිමා කිරියාබ්‍යාකතා ධම්මා පච්ඡිමානං පච්ඡිමානං කිරියාබ්‍යාකතානං ධම්මානං අනන්තරපච්චයෙන පච්චයො, සා ච ආසෙවනා,

ස. පා: තෙන වත රෙ වත්තබ්බෙ "අනන්තරපච්චයෙන පච්චයො, ආසෙවනපච්චයෙන පච්චයො"ති.

16. ප: පු: න වත්තබ්බං පච්චයතා වවත්ථිතා'ති.

ස. පටිඤ්ඤා: ආමන්තා.

ප. අනු: හෙතුපච්චයෙන පච්චයො හොති, ආරම්මණපච්චයෙන පච්චයො හොති, අනන්තරපච්චයෙන පච්චයො හොති, සමනන්තරපච්චයෙන පච්චයො හොතී'ති.

ස. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

ස. පා: තෙන හි[1] පච්චයතා වවත්ථිතා'ති

පච්චයකථා[2] නිට්ඨිතා.

---

1. තෙන හි න වත්තබ්බං - සීමු, සතං,
2 පච්චයතාකථා - මජසං, සතං,

ස. ථ: ඉදින් පුරිම පුරිම කුශලධර්මයෝ පශ්චිම පශ්චිම කුශලධර්මයනට අනන්තරප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙත් නම්, එ ද ආසෙවනා වේ නම්,

ස. පා: භවත එකරුණින් 'අනන්තරප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වූයේ ආසේවනා ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ'යයි කියයුතු මැ යැ.

14. ස. පු: පුරිම පුරිම අකුශල ධර්මයෝ පශ්චිම පශ්චිම අකුශල ධර්මයනට අනන්තරප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය නො? එ ද ආසෙවනා නො?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. ථ: ඉදින් පුරිම පුරිම අකුශල ධර්මයෝ පශ්චිම පශ්චිම අකුශල ධර්මයනට අනන්තරප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය නම්, ආසෙවනාද වේ නම්,

ස. පා: භවත එකරුණින් 'අනන්තරප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වූයේ, ආසෙවනාප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වූයේ යයි කියයුතු මැ යැ.

15. ස. පු: පුරිම පුරිම ක්‍රියාව්‍යාකෘතධර්මයෝ පශ්චිම පශ්චිම ක්‍රියාව්‍යාකෘත ධර්මයනට අනන්තරප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය නො? එ ද ආසෙවනා නො?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. ථ. ඉදින් පුරිම පුරිම ක්‍රියාව්‍යාකෘත ධර්මයෝ පශ්චිම පශ්චිම ක්‍රියාව්‍යාකෘතධර්මයනට අනන්තර ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය නම්, එ ද ආසේවනා නම්,

ස. පා: භවත එකරුණින් 'අනන්තරප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වූයේ, ආසෙවනා ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ' යයි කියයුතු මැ යැ.

16. ප. පු: 'ප්‍රත්‍යයතාව ව්‍යවස්ථාවත්' යයි නො කියයුතු වේ ද?

ස. පටිඤ්ඤා: එසේ යැ.

ප. අනු: හේතු ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වන්නේ, අලම්බනප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වන්නේ, අනන්තරප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වන්නේ, සමනන්තරප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වන්නේ වේ ද?

ස. පටි: එසේ නො කියයුතු යැ ...

ප. පා: එකරුණින් ප්‍රත්‍යයතාව ව්‍යවස්ථාවත් (නියමයත් අනුගත) වේ.

ප්‍රත්‍යයකථා නිමි.

## 15. 2.

# අඤ්ඤමඤ්ඤපච්චයකථා.

1. ස. පු: අවිජ්ජාපච්චයාපි සඞ්ඛාරා, න වත්තබ්බං 'සඞ්ඛාරපච්චයාපි අවිජ්ජා'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: නනු අවිජ්ජා සඞ්ඛාරෙන සහජාතා'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. ඨ: හඤ්චි අවිජ්ජා සඞ්ඛාරෙන සහජාතා,

ස. පා: තෙන වත රෙ වත්තබ්බෙ "අවිජ්ජාපච්චයාපි සඞ්ඛාරා, සඞ්ඛාරපච්චයාපි අවිජ්ජා"ති.

2. ස. පු: තණ්හාපච්චයා උපාදානං, න වත්තබ්බං උපාදානපච්චයාපි තණ්හා'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: නනු තණ්හා උපාදානෙන සහජාතා'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. ඨ: හඤ්චි තණ්හා උපාදානෙන සහජාතා,

ස. පා: තෙන වත රෙ වත්තබ්බෙ "තණ්හාපච්චයාපි උපාදානං, උපාදානපච්චයාපි තණ්හා"ති.

## 15. 2.

# අඤ්ඤමඤ්ඤපච්චයකථා.

[යමකුගේ සමයෙහි 'අවිද්‍යාප්‍රත්‍යයෙන් සංස්කාරයෝ වෙති' යන මෙතෙක් මැ ඇද්ද, 'සංස්කාරප්‍රත්‍යයෙනුදු අවිද්‍යා ඇත' යනු නැද්ද, ඔහු අවිද්‍යාව සංස්කාරයනට ප්‍රත්‍යය වෙයි, වැළිත් සංස්කාරයෝ අවිද්‍යාවට ප්‍රත්‍යය නො වෙති'යි මහාසාංඝිකනිකායවාසීන් සෙයින් ලබ්ධිගත්තාහු වෙත් ද, ඔවුන් සඳහා අවිද්‍යාව සංස්කාරාදීනට අන්‍යොන්‍යප්‍රත්‍යයතායෙන් ප්‍රත්‍යය වන බව දක්වන්නට 'අඤ්ඤමඤ්ඤපච්චයකථා' එයි.]

1. ස. පු: අවිද්‍යාප්‍රත්‍යයෙනුදු සංස්කාරයෝ වෙති සංස්කාරයන් ප්‍රත්‍යය කොට ද අවිද්‍යා ඇතියි නො කියැයුතු වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: අවිද්‍යා සංස්කාරයන් හා සහජාත නො වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. ඨ: ඉදින් අවිද්‍යා සංස්කාර හා සහජාත වේ නම්,

ස. පා: භවත, එකරුණින් අවිද්‍යා ප්‍රත්‍යය කොට ඇති සංස්කාරයෝ ඇත, සංස්කාර ප්‍රත්‍යය කොට ගත් අවිද්‍යා ඇතියි' කියැයුතු මැ යැ.

2. ස. පු: තෘෂ්ණාප්‍රත්‍යයෙනුදු උපාදාන වෙයි, උපාදාන-ප්‍රත්‍යයෙනුදු තෘෂ්ණා වේ යයි නො කියැයුතු වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: තෘෂ්ණාව උපාදානය හා සහජාත නො?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. ඨ: ඉදින් තෘෂ්ණාව උපාදානය හා සහජාත වේ නම්,

ස. පා: භවත එකරුණින් 'තෘෂ්ණා ප්‍රත්‍යයෙනුදු උපාදාන වෙයි, උපාදානප්‍රත්‍යයෙනුදු තෘෂ්ණා වේ'යයි කියැයුතු මැ යැ.

3. ප. පු: "ජරාමරණපච්චයා භික්ඛවේ, ජාති, ජාතිපච්චයා භවෝ"ති අත්ථේව සුත්තන්තෝ'ති

ස. පටි: නත්ථි.

ප. නිග: තේන හි "අවිජ්ජාපච්චයාපි සඞ්ඛාරා, න වත්තබ්බං, සඞ්ඛාරපච්චයාපි අවිජ්ජා'ති. තණ්හාපච්චයාපි උපාදානං, න වත්තබ්බං උපාදානපච්චයාපි තණ්හා"ති.

4. ස. පු: "විඤ්ඤාණපච්චයා භික්ඛවේ නාමරූපං, නාමරූපපච්චයාපි විඤ්ඤාණ"න්ති[a] අත්ථේව සුත්තන්තෝ'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. නිග: තේන හි අවිජ්ජාපච්චයාපි සඞ්ඛාරා, සඞ්ඛාරපච්චයාපි අවිජ්ජා, තණ්හාපච්චයාපි උපාදානං උපාදානපච්චයාපි තණ්හා'ති.

අඤ්ඤමඤ්ඤපච්චයකථා නිට්ඨිතා.

a. දීඝනිකාය-මහානිදාන සුත්තං

3. ප. පු: 'මහණෙනි, ජරාමරණප්‍රත්‍යයෙන් ජාති වෙයි, ජාතිප්‍රත්‍යයෙන් භව වේ'යයි වදාළ සූත්‍රාන්තයෙක් ඇත්තේ මැ වේ ද?

ස. පටි: නැත.

ප. නිග: එකරුණින් "අවිද්‍යාප්‍රත්‍යයෙනුදු සංස්කාරයෝ වෙති. සංස්කාරප්‍රත්‍යයෙනුදු අවිද්‍යා වේ'යයි නො කියැයුතු යැ. තෘෂ්ණා ප්‍රත්‍යයෙනුදු උපාදාන වෙයි, උපාදාන ප්‍රත්‍යයෙනුදු තෘෂ්ණා වේ" යයි නො කියැයුතු යැ.

4. ස. පු: "මහණෙනි, විඥානප්‍රත්‍යයෙන් නාමරූප වෙයි, නාමරූපප්‍රත්‍යයෙනුදු විඥාන වේ"යයි වදාළ සූත්‍රාන්තයෙක් ඇත්තේ මැ වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. නිග: එකරුණින් අවිද්‍යාප්‍රත්‍යයෙනුදු සංස්කාරයෝ වෙති. සංස්කාර ප්‍රත්‍යයෙනුදු අවිද්‍යා වෙයි. තෘෂ්ණාප්‍රත්‍යයෙනුදු උපාදාන වෙයි. උපාදානප්‍රත්‍යයෙනුදු තෘෂ්ණා වෙයි.

අඤ්ඤමඤ්ඤපච්චයකථා නිමි.

## 15. 3.

# අද්ධාකථා

1. ස. පු: අද්ධා පරිනිප්ඵන්නො'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: රූපන්ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

ස. අනු: වෙදනා -පෙ- සඤ්ඤා -පෙ- සඞ්ඛාරා -පෙ- විඤ්ඤාණන්ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

2. ස. පු: අතීතො අද්ධා පරිනිප්ඵන්නො'ති,

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: රූපන්ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

ස. අනු: වෙදනා -පෙ- සඤ්ඤා -පෙ- සඞ්ඛාරා -පෙ- විඤ්ඤාණන්ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

3. ස. පු: අනාගතො අද්ධා පරිනිප්ඵන්නො'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: රූපන්ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

ස. අනු: වෙදනා -පෙ- සඤ්ඤා -පෙ- සඞ්ඛාරා -පෙ- විඤ්ඤාණන්ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

4. ස. පු: පච්චුප්පන්නො අද්ධා පරිනිප්ඵන්නොති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: රූපන්ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

ස. අනු: වෙදනා -පෙ- සඤ්ඤා -පෙ- සඞ්ඛාරා -පෙ- විඤ්ඤාණන්ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

## 15. 3.

# අද්ධාකථා

["තීණිමානි භික්ඛවෙ කථාවත්ථූනි" යන සූත්‍රපාඨ වරදවා ගෙන 'පරිනිෂ්පන්න වූ අධ්ව සඞ්ඛ්‍යාත කාලයෙක් ඇතැ'යි ලබ්ධි ගත්තාහු ඇත. කාලප්‍රඥප්තිමාත්‍රය මිස 'අද්ධා' නම් කිසි පරිනිෂ්පන්නාර්ථයෙක් නැත, රූපාදි ස්කන්ධයෝ මැ පරිනිෂ්පන්නයහ'යි දක්වන්නට 'අද්ධාකථා' එයි.]

1. ස. පු: කාලය පරිනිෂ්පන්න (හෙතුප්‍රත්‍යයෙන් උපන්නේ) වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ

ස. අනු: රූපය වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

ස. අනු: වේදනා ... සංඥා ... සංස්කාර ... විඥාන වේ ද?

ස. පටි: එසේ නො කියැයුතු යැ ...

2. ස. පු: අතීතකාලය පරිනිෂ්පන්න වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: රූපය වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

ස. අනු: වේදනා ... සංඥා ... සංස්කාර ... විඥාන වේ ද?

ප. පටි. එසේ නො කියැයුතු යැ ...

3. ස. පු: අනාගතකාලය පරිනිෂ්පන්න වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: රූපය වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

ස. අනු: වේදනා ... සංඥා ... සංස්කාර ... විඥාන වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

4. ස. පු: වර්තමානකාලය පරිනිෂ්පන්න වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: රූපය වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

ස. අනු: වේදනා සංඥා .. සංස්කාර ... විඥාන වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

5. ස. පු: අතීතා රූපා වේදනා සඤ්ඤා සඞ්ඛාරා විඤ්ඤාණං අතීතො අද්ධා'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: අතීතා පඤ්චද්ධාති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

6. ස. පු: අනාගතා රූපා වේදනා සඤ්ඤා සඞ්ඛාරා විඤ්ඤාණං අනාගතො අද්ධාති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: අනාගතා පඤ්චද්ධා'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

7. ස. පු: පච්චුප්පන්නා රූපා වේදනා සඤ්ඤා සඞ්ඛාරා විඤ්ඤාණං පච්චුප්පන්නො අද්ධා'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: පච්චුප්පන්නා පඤ්චද්ධා'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

8. ස. පු: අතීතා පඤ්චක්ඛන්ධා අතීතො අද්ධා, අනාගතා පඤ්චක්ඛන්ධා අනාගතො අද්ධා, පච්චුප්පන්නා පඤ්චක්ඛන්ධා පච්චුප්පන්නො අද්ධාති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: පණ්ණරසද්ධා'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

9. ස. පු: අතීතානි ද්වාදසායතනානි අතීතො අද්ධා, අනාගතානි ද්වාදසායතනානි අනාගතො අද්ධා, පච්චුප්පන්නානි ද්වාදසායතනානි පච්චුප්පන්නො අද්ධා'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: ඡත්තිංස අද්ධා'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

10. ස. පු: අතීතා අට්ඨාරස ධාතුයො අතීතො අද්ධා, අනාගතා අට්ඨාරස ධාතුයො අනාගතො අද්ධා, පච්චුප්පන්නා අට්ඨාරස ධාතුයො පච්චුප්පන්නො අද්ධා'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: චතුපඤ්ඤාසද්ධාති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

5. ස. පු: අතීත වූ රූප වේදනා සංඥා සංස්කාර විඥාන යන මේ අතීතකාලය වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: අතීතයෝ පඤ්චවිධ වෙත් ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ. ...

6. ස. පු: අනාගත වූ රූප වේදනා සංඥා සංස්කාර විඥාන යන මේ අනාගතකාල වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: අනාගතයෝ පඤ්චවිධ වෙත් ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

7. ස. පු: ප්‍රත්‍යුත්පන්න රූප වේදනා සංඥා සංස්කාර විඥාන යන මේ ප්‍රත්‍යුත්පන්නකාලය වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: ප්‍රත්‍යුත්පන්නයෝ පඤ්චවිධ වෙත් ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

8. ස. පු: අතීතපඤ්චස්කන්ධ අතීතකාලය වේ ද? අනාගත පඤ්චස්කන්ධ අනාගතකාලය වේ ද? ප්‍රත්‍යුත්පන්න පඤ්චස්කන්ධ ප්‍රත්‍යුත්පන්නකාලය වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: පසළොස් කාලයෙක් ඇද්ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ..

9. ස. පු: අතීත ද්වාදශායතන අතීතකාලය වේ ද? අනාගත ද්වාදශායතන අනාගතකාලය වේ ද? ප්‍රත්‍යුත්පන්න ද්වාදශාතන ප්‍රත්‍යුත්පන්නකාලය වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ

ස. අනු: සතිස් කාලයෙක් ඇද්ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

10. ස. පු: අතීත අෂ්ටාදශධාතු අතීතකාලය වේ ද? අනාගත අෂ්ටාදශධාතු අනාගතකාලය වේ ද? ප්‍රත්‍යුත්පන්න අෂ්ටාදශධාතු ප්‍රත්‍යුත්පන්න කාලය වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: සියුපනස් කාලයෙක් වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

11. ස. පු. අතීතානි බාවීසතින්ද්‍රියානි අතීතො අද්ධා, අනාගතානි බාවීසතින්ද්‍රියානි අනාගතො අද්ධා, පච්චුප්පන්නානි බාවීසතින්ද්‍රියානි පච්චුප්පන්නො අද්ධා'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: ඡසට්ඨි අද්ධාති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

12. ප. පු: න වත්තබ්බං අද්ධා පරිනිප්ඵන්නො'ති

ස. පටිඤ්ඤා: ආමන්තා.

ප. අනු. නනු වුත්තං භගවතා: "තීණිමානි භික්ඛවෙ කථාවත්ථූනි. කතමානි තීණි: අතීතං වා භික්ඛවෙ, අද්ධානං ආරබ්භ කථං කථෙය්‍ය: එවං අහොසි අතීතමද්ධානන්ති.[1] අනාගතං වා භික්ඛවෙ, අද්ධානං ආරබ්භ කථං කථෙය්‍ය: එවං භවිස්සති අනාගතමද්ධානන්ති[2]. එතරහි වා භික්ඛවෙ, පච්චුප්පන්නං අද්ධානං ආරබ්භ කථං කථෙය්‍ය: එවං හොති එතරහි පච්චුප්පන්නන්ති. ඉමානි ඛො භික්ඛවෙ, තීණි කථාවත්ථූනී''ති[a] අත්ථෙව සුත්තන්තො'ති.

ස. පටිඤ්ඤා: ආමන්තා.

ප. පා: තෙන හි අද්ධා පරිනිප්ඵන්නො'ති.

අද්ධාකථා නිට්ඨිතා.

---

1. අතීතං අද්ධානන්ති - සිමු, PTS.
2. අනාගතං අද්ධානන්ති - සිමු, PTS.
a. තිකඞ්ගුත්තර - මහාවග්ග.

11. ස. පු: අතීත වූ දෙවිසි ඉන්ද්‍රිය අතීතකාලය වේ ද? අනාගත දෙවිසි ඉන්ද්‍රිය අනාගතකාලය වේ ද? ප්‍රත්‍යුත්පන්න දෙවිසි ඉන්ද්‍රිය ප්‍රත්‍යුත්පන්නකාලය වේ ද?

ප පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: සසැට කාලයෙක් වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

12 ප. පු: 'කාලය පරිනිෂ්පන්න වේති'යි නො කියැයුතු වේ ද?

ස. පටිඤ්ඤා: එසේ යැ.

ප. අනු: භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරනලද මැ නු: "මහණෙනි, මේ කථාවස්තූහු තිදෙනෙක් වෙති. කවර තිදෙනෙකැ යත්: මහණෙනි, අතීතකාලය හෝ ඇරබ 'අතීතකාලය මෙසේ වී'යයි කථා කරන්නේ යැ. මහණෙනි, අනාගතකාලය හෝ ඇරබ 'අනාගතකාලය මෙසේ වන්නේ යැ'යි කථා කරන්නේ යැ. මහණෙනි, දැන් ප්‍රත්‍යුත්පන්න කාලය හෝ ඇරබ 'දැන් ප්‍රත්‍යුත්පන්නකාලය මෙසේ වේ'යයි කථා කරන්නේයැ. මහණෙනි, මොහු තුන් කථාවස්තූහු වෙති"යි වදාළ සූත්‍රාන්තයෙක් ඇත්තේ මැ නු?

ස. පටිඤ්ඤා: එසේ යැ.

ප. පා: එකරුණින් කාලය පරිනිෂ්පන්න වෙයි.

අද්ධාකථා නිමි.

## 15. 4.

# ඛණ-ලය-මුහුත්තකථා.

1\. ස. පු: ඛණො පරිනිප්ඵන්නො -පෙ- ලයො පරිනිප්ඵන්නො -පෙ- මුහුත්තං පරිනිප්ඵන්නන්ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: රූපන්ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

ස. අනු: වෙදනා -පෙ- සඤ්ඤා -පෙ- සඞ්ඛාරා -පෙ- විඤ්ඤාණන්ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

2\. ප. පු: න වත්තබ්බං මුහුත්තං පරිනිප්ඵන්නන්ති.

ස. පටිඤ්ඤා: ආමන්තා.

ප. අනු: නනු වුත්තං භගවතා: "තීණිමානි භික්ඛවෙ, කථාවත්ථූනි. කතමානි තීණි: අතීතං වා භික්ඛවෙ, අද්ධානං ආරබ්භ කථං කථෙය්‍ය: එවං අහොසි අතීතමද්ධානන්ති. අනාගතං වා භික්ඛවෙ අද්ධානං ආරබ්භ කථං කථෙය්‍ය: එවං භවිස්සති අනාගතමද්ධානන්ති. එතරහි වා පච්චුප්පන්නං අද්ධානං ආරබ්භ කථං කථෙය්‍ය: එවං හොති එතරහි පච්චුප්පන්නන්ති ඉමානි ඛො භික්ඛවෙ, තීණි කථාවත්ථූනී'ති[1] අත්ථෙව සුත්තන්තො'ති.

ස. පටිඤ්ඤා: ආමන්තා.

ප. පා: තෙන හි මුහුත්තං පරිනිප්ඵන්නන්ති.

ඛණ-ලය-මුහුත්තකථා නිට්ඨිතා.

---

1\. තිකඞ්ගුත්තර - මහාවග්ග.

## 15. 4.

# ඛණ-ලය-මුහුත්තකථා.

[මෙහි ද නිදානය අද්ධා කථායෙහි මෙනි.]

1. ස. පු: ක්ෂණකාලය පරිනිෂ්පන්න වේ ද ... ලය කාලය පරිනිෂ්පන්න වේ ද ... මුහුර්තකාලය පරිනිෂ්පන්න වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යෑ.

ස. අනු: රූපය වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යෑ...

ස. අනු: වේදනා ... සංඥ .. සංස්කාර ... විඥන වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යෑ ...

2. ප. පු: 'මුහුර්තකාලය පරිනිෂ්පන්න යෑ'යි නො කියැයුතු වේ ද?

ස. පටිඤ්ඤා: එසේ යෑ.

ප. අනු: භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරනලද මැ නු: "මහණෙනි, මේ කථාවස්තූහු තුන් දෙනෙක් වෙති. කවර තුන් දෙනෙකැ යත්: මහණෙනි, 'අතීත-කාලය මෙසේ වී යැ'යි අතීතකාලය අරභයා හෝ කථා කරන්නේ යැ. මහණෙනි, 'අනාගතකාලය මෙසේ වන්නේ ය'යි අනාගතකාලය අරභයා හෝ කථා කරන්නේ යැ. මහණෙනි, 'දැන් ප්‍රත්‍යුත්පන්නය මෙසේ වේ' යයි දැන් ප්‍රත්‍යුත්පන්න කාලය අරභයා හෝ කථා කරන්නේ යැ. මහණෙනි, මේ කථාවස්තූහු තුන් දෙනෙක් ඇති"යි වදාළ සූත්‍රාන්තයෙක් ඇත්තේ මැ නු?

ස. පටිඤ්ඤා: එසේ යෑ.

ප. පා: එකරුණින් මුහුර්තකාලය පරිනිෂ්පන්න වෙයි.

ඛණ-ලය-මුහුත්තකථා නිමි.

15. 5.

# ආසවකථා

1. ස. පු: චත්තාරෝ ආසවා අනාසවා'ති.

ස. පටි: ආමන්තා

ස. අනු: මග්ගො -පෙ- ඵලං -පෙ- නිබ්බානං -පෙ- සොතාපත්තිමග්ගො -පෙ- සොතාපත්තිඵලං -පෙ- බොජ්ඣඞ්ගො'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

2. ප පු: න වත්තබ්බං: චත්තාරෝ ආසවා අනාසවා'ති.

ස. පටික්ඛෙපො: ආමන්තා

ප. අනු: අත්ථෙකච්චෙ ආසවා යෙහි ආසවෙහි තෙ ආසවා සාසවා හොන්ති'ති.

ස. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

ප. නිග: තෙන හි චත්තාරෝ ආසවා අනාසවා'ති.

ආසවකථා නිට්ඨිතා.

## 15. 5.

## ආසවකථා.

[යම් හෙයෙකින් චතුරාශ්‍රවයන් සාශ්‍රව කළ හෙත චතුරාශ්‍රවයන්ම වැනි අන්‍ය ආශ්‍රව කෙනෙක් නැද්ද, එහෙයින් 'චතුරාශ්‍රවයෝ අනාශ්‍රවයහ'යි හේතුවාද නිකායවාසීන් සෙයින් ලබ්ධි ගත්තවුනගේ වාද බිඳුනම 'ආසවකථා' එයි]

1. ස. පු: චතුරාශ්‍රවයෝ අනාශ්‍රව වෙත් ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: මාර්ගය ... ඵලය... නිර්වාණය ... ශ්‍රොතාපත්ති-මාර්ගය ... ශ්‍රොතාපත්තිඵලය ... බොධ්‍යඞ්ගය වේ ද?

(එ කල්හි ඒ අනාශ්‍රවයන් මාර්ගඵලාදිය වැනි වියයුතුයයි චොදනා පිණිස අසන ලදී.)

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

2. ප. පු: 'චතුරාශ්‍රවයෝ අනාශ්‍රවයහ'යි නො කියැයුතු වේ ද?

ස. පටිඤ්ඤා: එසේ යැ.

ප. අනු: යම් ආශ්‍රව කෙනකුන් කරණ කොට ඒ ආශ්‍රවයෝ සාශ්‍රව වෙත් ද, එබඳු වූ අන්‍ය ආශ්‍රවයෝත් ඇද්ද?

ස. පටි: එසේ නො කියැයුතු යැ ...

ප. නිග: එකරුණින් චතුරාශ්‍රවයෝ අනාශ්‍රව වෙති.

ආසවකථා නිමි.

15 6.

## ජරාමරණකථා.

1\. ස පු: ලොකුත්තරානං ධම්මානං ජරාමරණං ලොකුත්තරන්ති.

ප. පටික්ඛෙ: ආමන්තා.

ස. අනු: මග්ගො ඵලං නිබ්බානං සොතාපත්තිමග්ගො -පෙ- සොතාපත්තිඵලං -පෙ- බොජ්ඣඞ්ගො'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

ස. අනු: සොතාපත්තිමග්ගස්ස ජරාමරණං සොතාපත්ති මග්ගො'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

2\. ස. පු: සොතාපත්තිමග්ගස්ස ජරාමරණං සොතාපත්තිමග්ගොති.

ප. පටික්ඛෙ: ආමන්තා.

ස. අනු: සොතාපත්තිඵලස්ස ජරාමරණං සොතාපත්තිඵලන්ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

ස. අනු: සකදාගාමිමග්ගස්ස -පෙ- සකදාගාමිඵලස්ස -පෙ- අනාගාමිමග්ගස්ස -පෙ අනාගාමිඵලස්ස -පෙ- අරහත්තමග්ගස්ස ජරාමරණං අරහත්තමග්ගො'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

## 15. 6.

# ජරාමරණකථා.

[ජරාමරණ නම අපරිනිෂ්පන්න බැවින් ලෞකික යැ හෝ ලෝකෝත්තර යැ හෝ කියැයුතු නො වෙයි. "ලොකියා ධම්මා, ලොකුත්තරා ධම්මා" යන දුකයෙහි දු ජරාමරණ ලෞකිය පදයෙහි හෝ ලෝකුත්තර පදයෙහි හෝ නො දක්වන ලදි. එහි මේ ලක්‍ෂණ නො හෙන ලෝකෝත්තර ධර්මයන්ගේ ජරාමරණ ලෝකෝත්තර යයි මහාසාංඝිකයන් සෙයින් ලබ්ධි ගත්තවුන්ගේ වාද බිඳුනම 'ජරාමරණකථා' එයි.]

1. ස. පු: ලෝකෝත්තරධර්මයන්ගේ ජරාමරණ ලෝකෝත්තර වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: මාර්ග, ඵල, නිර්වාණ, ශ්‍රෝතාපත්තිමාර්ග ... ශ්‍රෝතාපත්තිඵල ... බෝධ්‍යඞ්ග වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

ස. අනු: ශ්‍රෝතාපත්තිමාර්ගයාගේ ජරාමරණ ශ්‍රෝතාපත්ති මාර්ග වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ..

2. ස. පු: ශ්‍රෝතාපත්තිමාර්ගයාගේ ජරාමරණ ශ්‍රෝතාපත්ති මාර්ග වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස අනු: ශ්‍රෝතාපත්තිඵලයාගේ ජරාමරණ ශ්‍රෝතාපත්තිඵල වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

ස. අනු: සකෘදාගාමිමාර්ගයාගේ ... සකෘදාගාමිඵලයාගේ ... අනාගාමිමාර්ගයාගේ ... අනාගාමිඵලයාගේ ... අර්හත්ත්වමාර්ගයාගේ ජරාමරණ අර්හත්ත්වමාර්ග වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

3. ස. පු: අරහත්තමග්ගස්ස ජරාමරණං අරහත්තමග්ගො'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: අරහත්තඵලස්ස ජරාමරණං අරහත්තඵලන්ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

ස. අනු: සතිපට්ඨානානං -පෙ- සම්මප්පධානානං -පෙ- ඉද්ධිපාදානං -පෙ- ඉන්ද්‍රියානං -පෙ- බලානං -පෙ- බොජ්ඣඞ්ගානං ජරාමරණං බොජ්ඣඞ්ගො'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

4. ප. පු: න වත්තබ්බං ලොකුත්තරානං ධම්මානං ජරාමරණං ලොකුත්තරන්ති.

ස. පටිඤ්ඤා: ආමන්තා.

ප. අනු: ලොකියන්ති.

ස. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

ප. පා: තෙන හි ලොකුත්තරන්ති.

ජරාමරණකථා නිට්ඨිතා.

3\. ස. පු: අභිඥාවමාගීයාගේ ජරාමරණ අභිඥාවමාගී වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: අභිඥාවඵලයාගේ ජරාමරණ අභිඥාවඵල වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

ස. අනු: සමාතිප්‍රස්ථානයන්ගේ ... සම්‍යක්ප්‍රධානයන්ගේ .. ඍද්ධිපාදයන්ගේ ... ඉන්ද්‍රියයන්ගේ ... බල-යන්ගේ ... බොධ්‍යඞ්ගයන්ගේ ජරාමරණ බොධ්‍යඞ්ග වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

4\. ප. පු: ලොකොත්තර ධර්මයන්ගේ ජරාමරණ ලොකො-ත්තර යයි නො කියයුතු වේ ද?

ස. පටිඤ්ඤා: එසේ යැ.

ප. අනු: ලෞකික වේ ද?

ස. පටි: එසේ නො කියැයුතු යැ ...

ප. පා: එකරුණින් ලොකොත්තර වේ.

ජරාමරණකථා නිමි.

## 15. 7.

# සඤ්ඤාවෙදයිතකථා.

1. ස. පු: සඤ්ඤාවෙදයිතනිරොධසමාපත්ති ලොකුත්තරාති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: මග්ගො -පෙ- ඵලං -පෙ- නිබ්බානං -පෙ- සොතාපත්තිමග්ගො -පෙ- සොතාපත්තිඵලං -පෙ- බොජ්ඣඞ්ගො'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

2. ප. පු: න වත්තබ්බං සඤ්ඤාවෙදයිතනිරොධසමාපත්ති ලොකුත්තරා'ති.

ස. පටිඤ්ඤා: ආමන්තා.

ප. අනු: ලොකියා'ති.

ස. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

ප. පා: තෙන හි ලොකුත්තරාති.

සඤ්ඤාවෙදයිතකථා නිට්ඨිතා.

## 15. 7.

# සඤ්ඤාවෙදයිතකථා.

[සඤ්ඤාවෙදයිත නිරොධසමාපත්ති නම් කිසි (භාව) ධර්මයෙක් නො වෙයි. ඒ සතර අරූපස්කන්ධයන්ගේ නිරොධ යි. එ හෙයින් ඒ ලෞකික හෝ ලොකොත්තර හෝ නො වෙයි. යම් හෙයෙකින් ලෞකික නො වේ ද, එහෙයින් ලොකොත්තර වේතියි හෙතුවාදනිකායවාසීන් සෙයින් ලබ්ධි ගත්තවුන්ගේ වාද බිඳුනට 'සඤ්ඤාවෙදයිතකථා' එයි.]

1. ස. පු: සංඥාවෙදයිතනිරොධසමාපත්ති ලෝකෝත්තර වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: මාර්ග ... ඵල ... නිර්වාණ .. ශ්‍රෝතාපත්තිමාර්ග ... ශ්‍රෝතාපත්තිඵල ... බොධ්‍යඞ්ග වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

2. ප. පු: සංඥාවෙදයිතනිරොධසමාපත්ති ලෝකෝත්තර වේතියි නො කියැයුතු වේ ද?

ස. පටිඤ්ඤා: එසේ යැ.

ප. අනු: ලෞකික වේ ද?

ස. පටි: එසේ නො කියැයුතු යැ ...

ප. පා: එකරුණින් ලෝකෝත්තර වෙයි.

සඤ්ඤාවෙදයිතකථා නිමි.

15. 8.

# දුතියසඤ්ඤාවෙදයිතකථා

1. ස. පු: සඤ්ඤාවෙදයිතනිරොධසමාපත්ති ලොකියා’ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: රූපන්ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

ස. අනු: වෙදනා -පෙ- සඤ්ඤා -පෙ- සඞ්ඛාරා -පෙ- විඤ්ඤාණන්ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

ස. අනු: කාමාවචරාති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

ස. අනු: රූපාවචරා’ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

ස. අනු: අරූපාවචරා’ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

2. ප. පු: න වත්තබ්බං සඤ්ඤාවෙදයිතනිරොධසමාපත්ති ලොකියා’ති.

ස. පටිඤ්ඤා: ආමන්තා.

ප. අනු: ලොකුත්තරා’ති.

ස. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

ප. පා: තෙන හි ලොකියා’ති.

දුතියසඤ්ඤාවෙදයිතකථා නිට්ඨිතා.

15. 8.

## දුතියසඤ්ඤාවෙදයිතකථා

1. ස. පු: සංඥාවෙදයිතනිරොධසමාපත්ති ලෞකික වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: රූප වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

ස. අනු: වෙදනා ... සංඥා ... සංස්කාර ... විඥාන වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ . .

ස. අනු: කාමාවචර වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

ස. අනු: රූපාවචර වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

ස. අනු: අරූපාවචර වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

2. ප. පු: ‘සංඥාවෙදයිතනිරොධසමාපත්ති ලෞකික වෙති’යි නො කියැයුතු වේ ද?

ස. පටිඤ්ඤා: එසේ යැ.

ප. අනු: ලෝකොත්තර වේ ද?

ස. පටිඤ්ඤා: එසේ නොකියැයුතු යැ ...

ප. ප.: එකරුණින් ලෞකික වෙයි.

දුතියසඤ්ඤාවෙදයිතකථා නිමි.

15. 9.

## තතියසඤ්ඤාවේදයිතකථා

1. ස. පු: සඤ්ඤාවේදයිතනිරෝධං සමාපන්නො[1] කාලං කරෙය්‍යාති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: අත්ථි සඤ්ඤාවේදයිතනිරෝධං සමාපන්නස්ස.[1] මාරණන්තියො[2] ඵස්සො, මාරණන්තියා[3] වේදනා, මාරණන්තියා සඤ්ඤා, මාරණන්තියා චේතනා, මාරණන්තියං චිත්තන්ති

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

2. ස. පු. නත්ථි සඤ්ඤාවේදයිතනිරෝධං සමාපන්නස්ස,[1] මාරණන්තියො[2] ඵස්සො, මාරණන්තියා වේදනා, මාරණන්තියා සඤ්ඤා, මාරණන්තියා චේතනා, මාරණන්තියං[3] චිත්තන්ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. ඨ: හඤ්චි නත්ථි සඤ්ඤාවේදයිතනිරෝධං සමාපන්නස්ස මාරණන්තියො ඵස්සො, මාරණන්තියා වේදනා, මාරණන්තියා සඤ්ඤා, මාරණන්තියා චේතනා, මාරණන්තියං චිත්තං,

ස. පා: නො ච වත රෙ වත්තබ්බෙ 'සඤ්ඤාවේදයිතනිරෝධං සමාපන්නො කාලං කරෙය්‍යා'ති.

3. ස. පු. සඤ්ඤාවේදයිතනිරෝධං සමාපන්නො කාලං කරෙය්‍යා'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: අත්ථි සඤ්ඤාවේදයිතනිරෝධං සමාපන්නස්ස ඵස්සො වේදනා සඤ්ඤා චේතනා චිත්තන්ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

4. ස. පු: නත්ථි සඤ්ඤාවේදයිතනිරෝධං සමාපන්නස්ස ඵස්සො වේදනා සඤ්ඤා චේතනා චිත්තන්ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: අඵස්සකස්ස කාලකිරියා[4] ආවේදකස්ස කාලකිරියා -පෙ- අචිත්තකස්ස කාලකිරියා'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

---

1 නිරෝධසමාපන්නස්ස - PTS.
2. මරණන්තියො - සිමු, PTS
3. මරණන්තියං - සිමු, PTS.
4. කාලං කිරියා - මජසං,

## 15 9.

## තතියසඤ්ඤාවෙදයිතකථා

['අසුවලං මැරෙනපියචි ඇත්තේ යැ. අසුවලං නො මැරෙනපියචි ඇත්තේ යැ'යි මරණධම්මතායෙහි නියමයක් නැති හෙයින් සංඥාවෙදයිතනිරොධයට සමවන්නේ ද කලුරිය කරන්නේ යැ'යි රාජගිරිකයන් සෙයින් ලබ්ධි ගත්තවුන්ගේ වාද බිඳුනට 'තතියසඤ්ඤාවෙදයිතකථං' එයි.]

1. ස. පු: සංඥාවේදයිතනිරෝධයට සමවත්තේ කලුරිය කරන්නේ වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: සංඥාවේදයිතනිරෝධයට සමවත්නහුට මාරණාන්තිකස්පර්ශ, මාරණාන්තික වේදනා, මාරණාන්තික සංඥා, මාරණාන්තිකචේතනා, මාරණාන්තිකචිත්ත ඇද්ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

2. ස. පු: සංඥාවේදයිතනිරෝධයට සමවත්නහුට මාරණාන්තික ස්පර්ශ, මාරණාන්තික වේදනා, මාරණාන්තික සංඥා මාරණාන්තික චේතනා, මාරණාන්තික චිත්ත නැද්ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. ඨ ඉදින් සංඥාවේදයිතනිරෝධයට සමවත්නහුට මාරණාන්තිකස්පර්ශ, මාරණාන්තික වේදනා, මාරණාන්තික සංඥා, මාරණාන්තික චේතනා, මාරණාන්තික චිත්ත නැත් නම්,

ස. පා: හවත, "සංඥාවේදයිතනිරෝධයට සමවත්තේ කලුරිය කරන්නේ වේ" යයි නො කියැයුතු මැ යැ.

3. ස. පු: සංඥාවේදයිතනිරෝධයට සමවත්තේ කලුරිය කරන්නේ වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: සංඥාවේදයිතනිරෝධයට සමවත්නහුට ස්පර්ශ, වේදනා, සංඥා, චේතනා, චිත්ත ඇද්ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ..

4. ස. පු: සංඥාවේදයිතනිරෝධයට සමවත්නහුට ස්පර්ශ, වේදනා, සංඥා, චේතනා, චිත්ත නැද්ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: ස්පර්ශ නොකරනුවහට කාලක්‍රියා වේ ද, අවේදකයාහට කාලක්‍රියා වේ ද, ... අචිත්තකයාහට කාලක්‍රියා වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

ස. අනු: නනු සඵස්සකස්ස කාලකිරියා -පෙ- සවිතක්කස්ස කාලකිරියා'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා

ස. ඡ: හඤ්චි සඵස්සකස්ස කාලකිරියා-පෙ- සවිතක්කස්ස කාලකිරියා,

ස. පා: නො ච වත රෙ වත්තබ්බෙ "සඤ්ඤාවෙදයිතනිරොධං සමාපන්නො කාලං කරෙය්‍යා"ති.

5. ස. පු: සඤ්ඤාවෙදයිතනිරොධං සමාපන්නො කාලං කරෙය්‍යා'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: සඤ්ඤාවෙදයිතනිරොධං සමාපන්නස්ස කායෙ විසං කමෙය්‍ය, සත්ථං කමෙය්‍ය, අග්ගි.[1] කමෙය්‍යා'ති.

ප පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

6. ස. පු: සඤ්ඤාවෙදයිතනිරොධං සමාපන්නස්ස කායෙ විසං කමෙය්‍ය, සත්ථං කමෙය්‍ය, අග්ගි[1]. කමෙය්‍යා'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. ඡ: හඤ්චි සඤ්ඤාවෙදයිතනිරොධං සමාපන්නස්ස කායෙ විසං කමෙය්‍ය, සත්ථං කමෙය්‍ය, අග්ගි කමෙය්‍ය,

ස. පා: නො ච වත රෙ[2]. වත්තබ්බෙ "සඤ්ඤාවෙදයිත නිරොධං සමාපන්නො කාලං කරෙය්‍යා"ති.

7. ස. පු: සඤ්ඤාවෙදයිතනිරොධං සමාපන්නො කාලං කරෙය්‍යා'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: සංඤාවෙදයිතනිරොධං සමාපන්නස්ස කායෙ විසං කමෙය්‍ය, සත්ථං කමෙය්‍ය, අග්ගි.[1] කමෙය්‍යා'ති,

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: න නිරොධං සමාපන්නො'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

8. ප. පු: සඤ්ඤාවෙදයිතනිරොධං සමාපන්නො න කාලං කරෙය්‍යා'ති.

ස. පටිඤ්ඤා: ආමන්තා.

---

1. අග්ගිං - සීමු.
2. නො ච වත රෙ - සයා

| | |
|---|---|
| ස. අනු: | සසපශීකයාහට කාලක්‍රියා නො, ... සවිතතකයා–හට කාලක්‍රියා නො? |
| ප. පටිඤ්ඤා: | එසේ යැ. |
| ස. ඨ: | ඉදින් සසපශීකයාහට කාලක්‍රියා වේ නම් ... සවිතතකයාටට කාලක්‍රියා වේ නම්, |
| ස. පා: | හවත "සංඥාවේදයිතනිරෝධයට සමවත්තේ කළුරිය කරත්තේ වේ" යයි නො කියැයුතු මැ යැ. |

| | | |
|---|---|---|
| 5. | ස. පු: | සංඥාවේදයිතනිරෝධයට සමවත්තේ කළුරිය කරත්තේ වේ ද? |
| | ප. පටිඤ්ඤා: | එසේ යැ. |
| | ස. අනු: | සංඥාවේදයිතනිරෝධයට සමවත්තහුගේ කයෙහි විෂ වදනේ වේ ද? ශස්ත්‍ර වදනේ වේ ද? අගනි වදනේ වේ ද? |
| | ප. පටි: | එසේ නො කියැයුතු යැ ... |
| 6. | ස. පු: | සඤ්ඤාවේදයිතනිරෝධසමවත් සමවත්හුගේ කයෙහි විෂ වදනේ වේ ද? ශස්ත්‍ර වදනේ වේ ද? ගිනි වදනේ වේ ද? |
| | ප. පටිඤ්ඤා: | එසේ යැ. |
| | ස. ඨ: | ඉදින් සඤ්ඤාවේදයිතනිරෝධසමවත් සමවත්තහුගේ කයෙහි විෂ වදනේ වේ නම්, ශස්ත්‍ර වදනේ වේ නම්, ගිනි වදනේ වේ නම්, |
| | ස. පා: | හවත, 'සඤ්ඤාවේදයිතනිරෝධසමවත් සමවත්තේ කළුරිය කරත්තේ යැ' යනු නො කියැයුතු මැ යැ. |
| 7. | ස. පු: | සඤ්ඤාවේදයිතනිරෝධසමවත් සමවත්තේ කළු–රිය කරත්තේ වේ ද? |
| | ප. පටිඤ්ඤා: | එසේ යැ. |
| | ස. අනු: | සඤ්ඤාවේදයිතනිරෝධසමවත් සමවත්තහුගේ කයෙහි විෂ වදනේ වේ ද? ශස්ත්‍ර වදනේ වේ ද? ගිනි වදනේ වේ ද? |
| | ප. පටිඤ්ඤා: | එසේ යැ. |
| | ස. අනු: | හේ නිරෝධසමවත් සම වත්තේ නො වේ ද? |
| | ප. පටි: | එසේ නො කියැයුතු යැ ... |
| 8. | ප. පු: | සඤ්ඤාවේදයිතනිරෝධසමවත් සමවත්තේ කළු–රිය නො කරත්තේ වේ ද? |
| | ස. පටිඤ්ඤා: | එසේ යැ. |

ප. අනු: අත්ථි සො නියාමො යෙන නියාමෙන නියතො සඤ්ඤාවෙදයිතනිරොධං සමාපන්නො න කාලං කරෙය්‍යා'ති.

ස. පටි: නත්ථි.

ප. ඨ: හඤ්චි නත්ථි සො නියාමො යෙන නියාමෙන නියතො සඤ්ඤාවෙදයිතනිරොධං සමාපන්නො න කාලංකරෙය්‍ය,[1].

ප. පා: නො ච වත රෙ[2]. වත්තබ්බෙ "සඤ්ඤාවෙදයිත නිරොධං සමාපන්නො න කාලංකරෙය්‍යා"ති.

9. ස. පු: චක්ඛුවිඤ්ඤාණසමඞ්ගී න කාලංකරෙය්‍යා'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: අත්ථි සො නියාමො යෙන නියාමෙන නියතො චක්ඛුවිඤ්ඤාණසමඞ්ගී න කාලංකරෙය්‍යා'ති.

ප. පටි: නත්ථි.

ස. ඨ: හඤ්චි නත්ථි සො නියාමො යෙන නියාමෙන නියතො චක්ඛුවිඤ්ඤාණසමඞ්ගී න කාලංකරෙය්‍ය,

ස. පා: නො ච වත රෙ වත්තබ්බෙ "චක්ඛුවිඤ්ඤාණසමඞ්ගී න කාලංකරෙය්‍යා"ති,

තතියසඤ්ඤාවෙදයිතකථා නිට්ඨිතා.

---

1 කාලං කරෙය්‍ය - සීමු.

2. නො වත රෙ - ස්‍යා.

ප. අනු: යම් නියාමධර්මයෙකින් නියත වැ 'සඤ්ඤාවෙදයිත නිරොධ සමවත් සමවත්නේ කලුරිය නො කරන්නේ යැ' යන ඒ නියාමයෙක් ඇද්ද?

ස. පටි: නැත.

ප. ඨ: ඉදින් යම් නියාමයෙකින් නියත වැ 'සඤ්ඤාවේද-යිතනිරෝධ සමවත් සමවත්නේ කලුරිය නො කරන්නේ යැ' යන ඒ නියාමයෙක් නැත් නම්,

ප. පා: හවත, 'සඤ්ඤාවේදයිතනිරෝධසමවත් සමවත්නේ කලුරිය නො කරන්නේ යැ' යනු නො කියැයුතු මැ යැ.

9 ස. පු: චක්ෂුර්විඥානසමඞ්ගී පුද්ගල කලුරිය නො කරන්නේ වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: යම් නියාමයෙකින් නියත වැ 'චක්ෂුර්විඥාන-සමඞ්ගී පුද්ගල කලුරිය නො කරන්නේ යැ' යන ඒ නියමයෙක් ඇද්ද?

ප. පටි: නැත.

ස. ඨ: ඉදින් යම් නියාමයෙකින් නියත වැ 'චක්ෂුර්විඥාන-සමඞ්ගී පුද්ගල කලුරිය නො කරන්නේ යැ' යන ඒ නියමය නැත් නම්,

ස. පා: හවත, 'චක්ෂුර්විඥානසමඞ්ගී පුද්ගල කලුරිය නො කරන්නේ යැ' යනු නො කියැයුතු මැ යැ.

තතියසඤ්ඤාවෙදයිතකථා නිමි.

## 15. 10.

# අසඤ්ඤසත්තුපිකකථා

1. ස. පු: සඤ්ඤාවේදයිතනිරෝධසමාපත්ති අසඤ්ඤසත්තුපිකා'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: අත්ථි සඤ්ඤාවේදයිතනිරෝධං සමාපන්නස්ස අලෝභෝ කුසලමූලං, අදෝසෝ කුසලමූලං, අමෝහෝ කුසලමූලං, සද්ධා විරියං සති සමාධි පඤ්ඤා'ති·

ප. පටි: න හේවං වත්තබ්බේ -පෙ-

2. ස. පු: නත්ථි සඤ්ඤාවේදයිතනිරෝධං සමාපන්නස්ස අලෝභෝ කුසලමූලං, අදෝසෝ කුසලමූලං, අමෝහෝ කුසලමූලං සද්ධා -පෙ- පඤ්ඤා'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. ඨ: හඤ්චි නත්ථි සඤ්ඤාවේදයිතනිරෝධං සමාපන්නස්ස අලෝභෝ කුසලමූලං, ආදෝසෝ කුසලමූලං, අමෝහෝ කුසලමූලං, සද්ධා විරියං සති සමාධි පඤ්ඤා,

ස. පා: නෝ ච වත රේ වත්තබ්බේ "සඤ්ඤාවේදයිතනිරෝධසමාපත්ති අසඤ්ඤසත්තුපිකා"ති.

3. ස. පු: සඤ්ඤාවේදයිතනිරෝධසමාපත්ති අසඤ්ඤසත්තුපිකා'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: අත්ථි සඤ්ඤාවේදයිතනිරෝධං සමාපන්නස්ස ඵස්සෝ වේදනා සඤ්ඤා චේතනා චිත්තන්ති.

ප. පටි: න හේවං වත්තබ්බේ -පෙ-

## 15. 10.

# අසඤ්ඤසත්තුපිකකථා

[සඤ්ඤාවිරාග වශයෙන් පැවැති භාවනාව අසඤ්ඤසමාපත්ති ද, වෙයි, නිරොධසමාපත්ති ද වෙයි, සඤ්ඤාවෙදයිත නිරොධසමාපත්ති ද, වෙයි. මෙසේ සඤ්ඤාවෙදයිත නිරොධසමාපත්තීහු, ලෞකික-ලොකොත්තර වශයෙන් දෙදෙනෙකි. එහි ලෞකික වූවා පෘථග්ජනයා පිළිබඳ වැ 'අසඤ්ඤසත්තුපිකා' නම් වෙයි. ලොකොත්තර වූවා ආර්‍ය්‍යයනට වෙයි. එ ද 'නාසඤ්ඤසත්තුපිකා වෙයි. මේ විභාගය නො කොට නිර්විශෙෂයෙන් සඤ්ඤාවෙදයිත නිරොධසමාපත්තිය 'අසඤ්ඤසත්තුපිකා' නමුයි හෙතුවාදනිකාය වාසීන් සෙයින් ලබ්ධි ගත්තවුන්ගේ වාද බිඳුනම 'අසඤ්ඤසත්තුපිකා කථා' එයි.]

**1** ස පු: සඤ්ඤාවෙදයිතනිරොධසමාපත්තිය අසඤ්ඤ-සත්තුපික (අසංඥසත්වොත්පත්ති පිණිස) වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: සඤ්ඤාවෙදයිතනිරොධසමවත් සමවත්නහුට අලොභකුසලමූලය, අදොසකුසලමූලය, අමොහ-කුසලමූලය, ශ්‍රද්ධා වීර්‍ය්‍ය සමෘති සමාධි ප්‍රඥා ඇද්ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

**2.** ස. පු: සඤ්ඤාවෙදයිතනිරොධසමවත් සමවත්නහුට අලොභකුසලමූලය අදොසකුසලමූලය අමොහ-කුසලමූලය ශ්‍රද්ධා ... ප්‍රඥා නැද්ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. ඨ: ඉදින් සඤ්ඤාවෙදයිතනිරොධසමවත් සම-වත්නහුට අලෝභකුසලමූලය අදොසකුසලමූලය අමෝහකුසලමූලය ශ්‍රද්ධා වීර්‍ය්‍ය සමෘති සමාධි ප්‍රඥා නැත් නම්,

ස. පා: හවත, 'සඤ්ඤාවෙදයිතනිරොධසමාපත්තිය අස-ඤ්ඤසත්තුපිකා යැ' යනු නො කියැයුතු මැ යැ,

**3** ස. පු: සඤ්ඤාවෙදයිතනිරොධසමාපත්තිය අසඤ්ඤ සත්තුපිකා වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: සඤ්ඤාවෙදයිතනිරොධසමවත් සමවත්නහුට ස්පර්ශ වෙදනා සංඥා චෙතනා චිත්ත ඇද්ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

4\. ස. පු: නත්ථි සඤ්ඤාවෙදයිතනිරොධං සමාපන්නස්ස ඵස්සො වෙදනා සඤ්ඤා චෙතනා චිත්තන්ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස අනු: අඵස්සකස්ස මග්ගභාවනා -පෙ- අචිත්තකස්ස මග්ගභාවනා'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

ස. අනු: නනු සඵස්සකස්ස මග්ගභාවනා -පෙ- සචිත්තකස්ස මග්ගභාවනා'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. ඨ: හඤ්චි සඵස්සකස්ස මග්ගභාවනා -පෙ- සචිත්තකස්ස මග්ගභාවනා,

ස. පා: නො ච වත රෙ වත්තබ්බෙ සඤ්ඤාවෙදයිතනිරොධ සමාපත්ති අසඤ්ඤසත්තුපිකා'ති.

ස. පු: සඤ්ඤාවෙදයිතනිරොධසමාපත්ති අසඤ්ඤසත්තුපිකා'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා

ස. අනු: යෙ කෙචි සඤ්ඤාවෙදයිතනිරොධං සමාපජ්ජන්ති, සබ්බෙ තෙ අසඤ්ඤසත්තුපිකාති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

6\. ප. පු: න වත්තබ්බං සඤ්ඤාවෙදයිතනිරොධසමාපත්ති අසඤ්ඤසත්තුපිකා'ති.

ස. පටිඤ්ඤා: ආමන්තා.

ප. අනු: නනු ඉධාපි අසඤ්ඤී තත්‍රාපි අසඤ්ඤී'ති.

ස. පටිඤ්ඤා: ආමන්තා.

ප. ඨ: හඤ්චි ඉධාපි අසඤ්ඤී තත්‍රාපි අසඤ්ඤී,

ප පා: තෙන වත රෙ වත්තබ්බෙ "සඤ්ඤාවෙදයිත නිරොධසමාපත්ති අසඤ්ඤසත්තුපිකා"ති.

අසඤ්ඤසත්තුපිකකථා නිට්ඨිතා.

| | |
|---|---|
| **4.** ස. පු: | සඤ්ඤාවේදයිතනිරොධසමවත් සමවත්නාහුට ස්පර්ශ වේදනා සංඥා චේතනා චිත්ත නැද්ද? |
| ප. පටික්ඛෙපය: | එසේ යැ. |
| ස. අනු: | ස්පර්ශ නො කරනුවහට මාර්ගභාවනා ... අවිත්තක-යාහට මාර්ගභාවනා වේ ද? |
| ප. පටි: | එසේ නො කියැයුතු යැ ... |
| ස. අනු: | සස්පර්ශකයාහට මාර්ගභාවනා ... සවිත්තකයාහට මාර්ගභාවනා වෙයි නො? |
| ප. පටික්ඛෙපය: | එසේ යැ. |
| ස. ඨ: | ඉදින් සස්පර්ශකයාහට මාර්ගභාවනා වේ නම් ... සවිත්තකයාහට මාර්ගභාවනා වේ නම්, |
| ස. පා. | හවත, 'සඤ්ඤාවේදයිතනිරොධසමාපත්ති අසඤ්ඤ සත්තුපිකා යැ' යනු නො කියැයුතු මැ යැ. |
| **5.** ස. පු: | සඤ්ඤාවේදයිතනිරොධසමාපත්ති අසඤ්ඤසත්තු-පිකා වේ ද? |
| ප. පටික්ඛෙපය: | එසේ යැ. |
| ස. අනු: | යම් කිසි කෙනෙක් සඤ්ඤාවේදයිතනිරොධසමවත් සමවදනාහු වෙත් නම්, ඔහු හැම අසඤ්ඤසත්තුපිකා නම් වෙත් ද? |
| ප. පටි: | එසේ නො කියැයුතු යැ ... |
| **6.** ප. පු: | සඤ්ඤාවේදයිතනිරොධසමවත් 'අසඤ්ඤසත්තු-පිකා'යි නො කියැයුතු වේ ද? |
| ස. පටික්ඛෙපය: | එසේ යැ. |
| ප. අනු: | මෙහිදු අසංඥී නො? එහිදු අසංඥී නො? |
| ස. පටික්ඛෙපය: | එසේ යැ. |
| ප. ඨ: | ඉදින් මෙහිත් අසංඥී වේ නම්, එහිත් අසංඥී වේ නම්, |
| ප. පා: | හවත, එකරුණින් 'සඤ්ඤාවේදයිතනිරොධසමා-පත්තිය අසඤ්ඤසත්තුපිකා යැ'යි කියැයුතු මැ යැ. |

**අසඤ්ඤසත්තුපිකකථා නිමි.**

## 15. 11.

# කම්මූපචයකථා.

1. ස. පු: අඤ්ඤං කම්මං, අඤ්ඤො කම්මූපචයො’ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: අඤ්ඤො ඵස්සො, අඤ්ඤො ඵස්සූපචයො, අඤ්ඤා වෙදනා, අඤ්ඤො වෙදනූපචයො, අඤ්ඤා සඤ්ඤා, අඤ්ඤො සඤ්ඤූපචයො, අඤ්ඤා චෙතනා, අඤ්ඤො චෙතනූපචයො, අඤ්ඤං චිත්තං, අඤ්ඤො චිත්තූපචයො, අඤ්ඤා සද්ධා, අඤ්ඤො සද්ධූපචයො, අඤ්ඤං විරියං, අඤ්ඤො විරියූපචයො, අඤ්ඤා සති, අඤ්ඤො සතූපචයො, අඤ්ඤො සමාධි, අඤ්ඤො සමාධූපචයො, අඤ්ඤා පඤ්ඤා, අඤ්ඤො පඤ්ඤූපචයො, අඤ්ඤො රාගො, අඤ්ඤො රාගූපචයො -පෙ- අඤ්ඤං අනොත්තප්පං, අඤ්ඤො අනොත්තප්පූපචයො’ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

2. ස. පු: අඤ්ඤං කම්මං, අඤ්ඤො කම්මූපචයොති.

ප. පටිඤ්ඤා: ආමන්තා,

ස. අනු: කම්මූපචයො කම්මෙන සහජාතො’ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

3. ස. පු: කම්මූපචයො කම්මෙන සහජාතො’ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: කුසලෙන කම්මෙන සහජාතො කම්මූපචයො කුසලො’ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

## 15. 11.

# කම්මූපචයකථා.

[කර්මෝපචය වනාහි කර්මයෙන් අන්‍ය වූ චිත්තවිප්‍රයුක්ත වූ අව්‍යාකෘත වූ අනාලම්බන වූ එකෙක්යැයි අන්ධක සම්මිතීය නිකායවාසීන් සෙයින් ලබ්ධි ගත්තවුන්ගේ වාද බිඳුනම 'කම්මූපචය කථා' එයි]

1. ස. පු: කර්මය අනෙකෙක් වේ ද, කර්මෝපචය අනෙකෙක් වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: ස්පර්ශය අනෙකෙක් වේ ද, ස්පර්ශෝපචය අනෙකෙක් වේ ද, වේදනා අනෙකක් වේ ද, වේදනෝපචය අනෙකෙක් වේ ද, සංඥා අනෙකක් වේ ද, සංඥෝපචය අනෙකෙක් වේ ද, චේතනා අනෙකක් වේ ද, චේතනෝපචය අනෙකෙක් වේ ද, චිත්තය අනෙකෙක් වේ ද, චිත්තෝපචය අනෙකෙක් වේ ද, ශ්‍රද්ධා අනෙකක් වේ ද, ශ්‍රද්ධෝපචය අනෙකෙක් වේ ද, වීර්‍ය්‍යය අනෙකෙක් වේ ද, වීර්‍ය්‍යෝපචය අනෙකෙක් වේ ද, ස්මෘති අනෙකක් වේ ද, ස්මෘතිඋපචය අනෙකෙක් වේ ද, සමාධි අනෙකෙක් වේ ද, සමාධිඋපචය අනෙකෙක් වේ ද, ප්‍රඥා අනෙකක් වේ ද, ප්‍රඥෝපචය අනෙකෙක් වේ ද, රාගය අනෙකෙක් වේ ද, රාගෝපචය අනෙකෙක් වේ ද, අනොත්තප්පය අනෙකෙක් වේ ද, අනොත්තප්පඋපචය අනෙකෙක් වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

2. ස. පු: කර්මය අනෙකෙක් වේ ද, කර්මෝපචය අනෙකෙක් වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: කර්මෝපචය කර්මය හා සහජාත වේ ද,

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

3. ස. පු: කර්මෝපචය කර්මය හා සහජාත වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: කුශලකර්මය හා සහජාත වූ කර්මෝපචය කුශල වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ . .

4. ස. පු: කුසලෙන කම්මෙන සහජාතො කම්මූපචයො කුසලො’ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: සුඛාය වෙදනාය සම්පයුත්තෙන කම්මෙන සහජාතො කම්මූපචයො සුඛාය වෙදනාය සම්පයුත්තො’ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ

ස. අනු: දුක්ඛාය වෙදනාය -පෙ- අදුක්ඛමසුඛාය වෙදනාය සම්පයුත්තෙන කම්මෙන සහජාතො කම්මූපචයො අදුක්ඛමසුඛාය වෙදනාය සම්පයුත්තො’ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

5. ස. පු: කම්මූපචයො කම්මෙන සහජාතො’ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: අකුසලෙන කම්මෙන සහජාතො කම්මූපචයො අකුසලොති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

6. ස. පු: අකුසලෙන කම්මෙන සහජාතො කම්මූපචයො අකුසලොති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: සුඛාය වෙදනාය සම්පයුත්තෙන කම්මෙන සහජාතො කම්මූපචයො සුඛාය වෙදනාය සම්පයුත්තො’ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

ස. අනු: දුක්ඛාය වෙදනාය -පෙ- අදුක්ඛමසුඛාය වෙදනාය සම්පයුත්තෙන කම්මෙන සහජාතො කම්මූපචයො අදුක්ඛමසුඛාය වෙදනාය සම්පයුත්තො’ති.

ප පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

7. ස. පු: කම්මං චිත්තෙන සහජාතං, කම්මං සාරම්මණන්ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: කම්මූපචයො චිත්තෙන සහජාතො, කම්මූපචයො සරම්මණො’ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

8. ස. පු: කම්මූපචයො චිත්තෙන සහජාතො, කම්මූපචයො අනාරම්මණො’ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

4. ස. පු: කුශලකර්මය හා සහජාත වූ කර්මොපචය කුශල වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ. (චිත්තසම්ප්‍රයුක්තයා සඳහා පිළිනු යි.)

ස. අනු: සුඛවේදනාසම්ප්‍රයුක්තකර්මය හා සහජාත වූ කර්මොපචය සුඛවේදනාව හා සම්ප්‍රයුක්ත වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

ස. අනු: දුඃඛවේදනාසම්ප්‍රයුක්ත ... අදුඃඛාසුඛවේදනා සම්ප්‍රයුක්ත කර්මය හා සහජාත වූ කර්මොපචය අදුඃඛාසුඛවේදනාව හා සම්ප්‍රයුක්ත වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

5. ස. පු: කර්මොපචය කර්මය හා සහජාත වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: අකුශලකර්මයා හා සහජාත වූ කර්මොපචය අකුශල වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

6. ස. පු: අකුශලකර්මයා හා සහජාත වූ කර්මොපචය අකුශල වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: සුඛවේදනාසම්ප්‍රයුක්ත කර්මය හා සහජාත වූ කර්මොපචය සුඛවේදනාව හා සම්ප්‍රයුක්ත වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

ස. අනු: දුඃඛවේදනාසම්ප්‍රයුක්ත ... අදුඃඛාසුඛවේදනා-සම්ප්‍රයුක්තකර්මය හා සහජාත වූ කර්මොපචය අදුඃඛාසුඛවේදනාව හා සම්ප්‍රයුක්ත වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

7. ස. පු: කර්මය චිත්තය හා සහජාත වෙයි. කර්මය සාලම්බන වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: කර්මොපචය චිත්තය හා සහජාත වෙයි. කර්මොපචය සාලම්බන වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

8. ස. පු: කර්මොපචය චිත්තය හා සහජාත වෙයි. කර්මොපචය අනාලම්බන වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: කම්මං චෙතනාය සහජාතං, කම්මං අනාරම්මණන්ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

9. ස. පු: කම්මං චෙතනාය සහජාතං, චිත්තං භිජ්ජමානං කම්මං භිජ්ජතී'ති.

ප. පටික්ඛෙ. ආමන්තා.

ස. අනු: කම්මූපචයො චෙතනාය සහජාතො, චිත්තං භිජ්ජමානං කම්මූපචයො භිජ්ජතීති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

10. ස. පු: කම්මූපචයො චෙතනාය සහජාතො, චිත්තං භිජ්ජමානං කම්මූපචයො න භිජ්ජතීති,

ප. පටික්ඛෙ: ආමන්තා.

ස. අනු: කම්මං චෙතනාය සහජාතං, චිත්තං භිජ්ජමානං කම්මං න භිජ්ජතී'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

11. ස. පු: කම්මම්හි කම්මූපචයො'ති.

ප. පටි: ආමන්තා,

ස. අනු: තඤ්ඤෙව කම්මං සො කම්මූපචයො'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

12. ස. පු: කම්මම්හි කම්මූපචයො, කම්මූපචයතො විපාකො නිබ්බත්තතී'ති.

ප. පටික්ඛෙ: ආමන්තා.

ස. අනු: තඤ්ඤෙව කම්මං, සො කම්මූපචයො, සො කම්මවිපාකො'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

13. ස. පු: කම්මම්හි කම්මූපචයො, කම්මූපචයතො විපාකො නිබ්බත්තති, විපාකො සාරම්මණො'ති.

ප. පටික්ඛෙ: ආමන්තා.

ස. අනු: කම්මූපචයො සාරම්මණො'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

ස. අනු: කර්මය චිත්තය හා සහජාත වෙයි, කර්මය අනාලම්බන වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ..

9. ස. පු: කර්මය චිත්තය හා සහජාත වෙයි, චිත්තය බිඳෙන්නේ යැ, කර්මය බිඳේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: කර්මෝපචය චිත්තයා හා සහජාත වෙයි, චිත්තය භිද්‍යමාන යැ, කර්මෝපචය බිඳේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

10 ස. පු: කර්මෝපචය චිත්තය හා සහජාත වෙයි. චිත්තය භිද්‍යමාන යැ, එකල කර්මෝපචය නො බිඳේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: කර්මය චිත්තයා හා සහජාත වෙයි, චිත්තය භිද්‍යමාන කල්හි කර්මය නො බිඳේ ද?

ප . පටි: එසේ නො කියැයුතු යැ ...

11. ස. පු: කර්මය ඇති කල කර්මෝපචය වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු. ඒ කර්මය මැ ඒ කර්මෝපචය වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

12. ස. පු: කර්මය පිහිටි කල කර්මෝපචය වෙයි, කර්මෝපච-යෙන් විපාකය උපදනේ වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: ඒ කර්මය මැ ඒ කර්මෝපචය වූයේ ඒ කර්මවිපාකය වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

13. ස. පු: කර්මය ඇති කලැ කර්මෝපචය වෙයි, කර්මෝපච-යෙන් විපාකය උපදී. විපාකය සාලම්බන වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: කර්මෝපචය සාලම්බන වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

14. ස. පු: කම්මූපචයො අනාරම්මණො'ති

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: විපාකො අනාරම්මණො'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

15. ස. පු: අඤ්ඤං කම්මං, අඤ්ඤො කම්මූපචයො'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා,

ස. අනු: නනු වුත්තං භගවතා "ඉධ පුණ්ණ, එකච්චො සබ්‍යාපජ්ඣම්පි අබ්‍යාපජ්ඣම්පි කායසඞ්ඛාරං අභිසඞ්ඛරොති, සබ්‍යාපජ්ඣම්පි අබ්‍යාපජ්ඣම්පි වචීසඞ්ඛාරං -පෙ මනොසඞ්ඛාරං අභිසඞ්ඛරොති. සො සබ්‍යාපජ්ඣම්පි අබ්‍යාපජ්ඣම්පි කායසඞ්ඛාරං අභිසඞ්ඛරිත්වා සබ්‍යාපජ්ඣම්පි අබ්‍යපජ්ඣම්පි වචීසඞ්ඛාරං -පෙ- මනොසඞ්ඛාරං අභිසඞ්ඛරිත්වා සබ්‍යාපපජ්ඣම්පි අබ්‍යාපජ්ඣම්පි ලොකං උපපජ්ජති. තමෙනං සබ්‍යාපජ්ඣම්පි අබ්‍යාපජ්ඣම්පි ලොකං උපපන්නං සමානං සබ්‍යාපජ්ඣම්පි අබ්‍යාපජ්ඣම්පි ඵස්සා ඵුසන්ති. සො සබ්‍යාපජ්ඣෙහිපි අබ්‍යාපජ්ඣෙහිපි ඵස්සෙහි ඵුට්ඨො සමානො සබ්‍යාපජ්ඣම්පි අබ්‍යාපජ්ඣම්පි වෙදනං වෙදෙති වොකිණ්ණසුඛදුක්ඛං, සෙය්‍යථාපි මනුස්සා එකච්චෙ ච දෙවා එකච්චෙ ච විනිපාතිකා. ඉති ඛො පුණ්ණ, භූතා භූතස්ස උපපත්ති[1] හොති. යං කරොති තෙන උපපජ්ජති. උපපන්නමෙතං ඵස්සා ඵුසන්ති. එවම්පහං පුණ්ණ, කම්මදායාදා සත්තා'ති වදාමි"ති,[a] අත්ථෙව සුත්තන්තොති.

ප පටිඤ්ඤා: ආමන්තා.

ස. පා: තෙන හි න වත්තබ්බං "අඤ්ඤං කම්මං අඤ්ඤො කම්මූපචයො"ති,

කම්මූපචයකථා නිට්ඨිතා.

පණ්ණරසමො වග්ගො.

තස්සුද්දානං:

"පච්චයතා වවත්ථිතා පටිච්චසමුප්පාදො අද්ධා ච ඛණො ලයො මුහුත්තං
චත්තාරො ආසවා අනාසවා ලොකුත්තරානං ධම්මානං ජරාමරණං,
ලොකුත්තරා සඤ්ඤාවෙදයිතනිරොධසමාපත්ති,
ලොකියා සඤ්ඤාවෙදයිතනිරොධසමාපත්ති,
සඤ්ඤාවෙදයිතනිරොධං සමාපන්නො කාලං කරෙය්‍ය,
සෙව මග්ගො අසඤ්ඤසත්තුපපත්තියා,
අඤ්ඤං කම්මං අඤ්ඤො කම්මූපචයො"ති.

තතියො පණ්ණාසකො.

1. උපපත්ති - සිමු.
a. මජ්ඣිමනිකාය - මජ්ඣිමපණ්ණාස - කුක්කුරවතිකසුත්ත.

14. ස. පු: කම්මෝපචය අනාලම්බන වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: විපාකය අනාලම්බන වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

15. ස. පු: කර්මය අනෙකෙක් වේ ද, කම්මෝපචය අනෙකෙක් වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරන ලද මැ නු: "පුණ්ණය, මෙ සත්නෙහි කිසි මහණෙක් සදුඃඛ වූත් අදුඃඛ වූත් කායසංසකාර අභිසංසකරණ කෙරෙයි. සදුඃඛ වූත් අදුඃඛ වූත් වාක් සංසකාර ... මනසසංසකාර අභිසංසකරණ කෙරෙයි. හේ සදුඃඛ වූත් අදුඃඛ වූත් කායසංසකාර අභිංසසකරණ කොට සදුඃඛ වූත් අදුඃඛ වූත් වාක් සංසකාර ... මනසසංසකාර අභිසංසකරණ කොට සදුඃඛ වූ හෝ අදුඃඛ වූ හෝ ලොකයට පැමිණෙයි සදුඃඛ වූ හෝ අදුඃඛ වූ හෝ ලොකයට පැමිණි තුලුන් සදුඃඛ වූ ද අදුඃඛ වූ ද සපර්ශයෝ පහසිත්. හේ සදුංඛ වූ හෝ අදුඃඛ වූ හෝ සපර්ශයෙන් පහස්නා ලද්දේ සදුඃඛ වූ හෝ අදුඃඛ වූ හෝ ව්‍යවකිණි සුඛදුඃඛ ඇති වෙදනා විඳී මනුෂ්‍යයන් ඇතැම් දෙවියන් ඇතැම් විනිපාතිකයන් සෙයිනි. පුණ්ණය මෙසේ භූතයෙන් භූතයක්හුගේ උපපත්ති වෙයි. යමක් කෙරේ ද එයින් උපපත්ති වෙයි. සපර්ශයෝ උපපන්න වූ තුලුන් සපර්ශ කෙරෙත් පුණ්ණය, මම මෙසෙයිනුදු 'සත්වයෝ කර්ම-දායාදයහ'යි කියමි''යි වදාළ සූත්‍රාන්තයෙක් ඇත්තේ මැ නු?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. පා: එකරුණින් කර්මය අනෙකෙකැ, කම්මෝපචය අනෙකෙකැ'යි නො කියැයුතු යැ.

කම්මූපචය කථා නිමි.

පසළොස්වන වග.

**එහි උද්දානය:**

පච්චයකථා යැ, අඤ්ඤමඤ්ඤපච්චයකථා යැ, අද්ධාකථා යැ, ඛණ ලය මුහුත්තකථා යැ, ආසවකථා යැ, ජරාමරණකථා යැ, සඤ්ඤාවෙදයිතකථා යැ, දුතියසඤ්ඤාවෙදයිත කථා යැ, තතියසඤ්ඤාවෙදයිත කථා යැ, අසඤ්ඤ-සත්තූපික කථා යැ කම්මූපචයකථා යි.

තුන්වැනි පනස යි.

# සොළසමො වග්ගො.

## 16. 1.

## නිග්ගහකථා.

1. ස. පු: පරො පරස්ස චිත්තං නිග්ගණ්හාතී'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: පරො පරස්ස චිත්තං මා රජ්ජි, මා දුස්සි, මා මුය්හි මා කිලිස්සී'ති නිග්ගණ්හාතී'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

2. ස. පු: පරො පරස්ස චිත්තං නිග්ගණ්හාතී'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: පරො පරස්ස උප්පන්නො ඵස්සො මා නිරුජ්ඣී'ති නිග්ගණ්හාතී'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

ස. අනු: පරො පරස්ස උප්පන්නා වෙදනා -පෙ- උප්පන්නා සඤ්ඤා -පෙ- උප්පන්නා චෙතනා -පෙ- උප්පන්නං චිත්තං -පෙ- උප්පන්නා සද්ධා -පෙ- උප්පන්නං විරියං -පෙ- උප්පන්නා සති -පෙ- උප්පන්නො සමාධි -පෙ- උප්පන්නා පඤ්ඤා මා නිරුජ්ඣී'ති නිග්ගණ්හාතී'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

3. ස. පු: පරො පරස්ස චිත්තං නිග්ගණ්හාතී'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: පරො පරස්ස අත්ථාය රාගං පජහතී'ති -පෙ- දොසං පජහති -පෙ- අනොත්තප්පං පජහතී'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

4. ස. පු: පරො පරස්ස චිත්තං නිග්ගණ්හාතී'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: පරො පරස්ස අත්ථාය මග්ගං භාවෙති -පෙ- සතිපට්ඨානං භාවෙති -පෙ- බොජ්ඣඞ්ගං භාවෙතී'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

# සොළොස්වනවග.

## 16. 1.

## නිග්ගහ කථා.

['ලෝකයෙහි බලප්‍රාප්ත වූ ද වශීභූත වූ ද යම් කෙනෙක් ඇද්ද, ඉදින් බහු පරාගේ සිත වසඟ කොට නිගන්නට හෙවත් සංක්ලේශයෙන් වළහන්නට නො හැකි වෙත් නම්, උන්ගේ කිනම් බලප්‍රාප්තියෙක් ද? කවර වශීභාවයෙක් ද? එකාන්තයෙන් බහු බලප්‍රාප්තියෙනුත් වශීභාවයෙනුත් මෙරමාගේ සිත වසඟ කොට සංක්ලේශයෙන් වළහති'යි මහාසඞ්ඝිකනිකායවාසීන් සෙයින් ලබ්ධි ගත්තවුන්ගේ වාද බිඳුනට 'නිග්ගහ කථා' එයි.]

1. ස. පු: අනෙකෙක් අනෙකකුගේ සිත නිගත්තේ (වසඟ කරත්තේ) වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: අනෙකෙක් අනෙකකුගේ 'සිත නො ඇලේවයි දුෂ්‍ය නො වේවයි මුළා නො වේවයි කිලිටි නො වේව'යි මෙසේ නිගත්තේ වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

2. ස. පු: අනෙකෙක් අනෙකකුගේ සිත නිගත්තේ වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: අනෙකෙක් අනෙකකුට උපන් ස්පර්ශය 'නහමක් නිරුද්ධ වේව'යි මෙසේ නිගත්තේ වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

ස. අනු: අනෙකෙක් අනෙකකුට උපන් වේදනා .. උපන් සංඥා ... උපන් චේතනා ... උපන් සිත ... උපන් ශ්‍රද්ධා .. උපන් වීර්‍ය්‍ය ... උපන් ස්මෘති ... උපන් සමාධි ... උපන් ප්‍රඥා 'නහමක් නිරුද්ධ වේව'යි මෙසේ නිගත්තේ වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ..

3. ස. පු: අනෙකෙක් අනෙකකුගේ සිය නිගත්තේ වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: අනෙකෙක් අනෙකකු සඳහා රාගය ප්‍රහාණ කෙරේ ද ... ද්වේෂය ප්‍රහාණ කෙරේ ද? ... අනපත්‍රපා ප්‍රහාණ කෙරේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

4. ස. පු: අනෙකෙක් අනෙකකුගේ සිත නිගත්තේ වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: අනෙකෙක් අනෙකකුගේ අර්ථ පිණිස මාර්ගය භවා ද? ... සිව්වටත් භවා ද? ... බොධ්‍යඞ්ග භවා ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

5. ස. පු: පරො පරස්ස චිත්තං නිග්ගණ්හාතී'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: පරො පරස්ස අත්ථාය දුක්ඛං පරිජානාති, සමුදයං පජහති, නිරොධං සච්ඡිකරොති, මග්ගං භාවෙතී'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -ප-

6. ස. පු: පරො පරස්ස චිත්තං නිග්ගණ්හාතී'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: අඤ්ඤො අඤ්ඤස්ස කාරකො, පරං කතං සුඛං දුක්ඛං, අඤ්ඤො කරොති, අඤ්ඤො පටිසං-වෙදෙතී'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -ප-

7. ස. පු: පරො පරස්ස චිත්තං නිග්ගණ්හාතී'ති

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: නනු වුත්තං භගවතා:

"අත්තනා'ව කතං පාපං
අත්තනා සංකිලිස්සති.
අත්තනා අකතං පාපං
අත්තනා'ව විසුජ්ඣති.
සුද්ධි අසුද්ධි පච්චත්තං
නාඤ්ඤො අඤ්ඤං විසොධයෙ"ති[a].

අත්ථෙව සුත්තන්තො'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. පා: තෙන හි න වත්තබ්බං: "පරො පරස්ස චිත්තං නිග්ගණ්හාතී'ති.

8. ප. පු: න වත්තබ්බං පරො පරස්ස චිත්තං නිග්ගණ්හාතී'ති.

ස. පටිඤ්ඤා: ආමන්තා.

ප. අනු: නනු අත්ථි බලප්පත්තා, අත්ථි වසීභූතා'ති.

ස. පටිඤ්ඤා: ආමන්තා.

ප. ඨ: හඤ්චි අත්ථි බලප්පත්තා, අත්ථි වසීභූතා.

ප. පා: තෙන වත රෙ වත්තබ්බෙ "පරො පරස්ස චිත්තං නිග්ගණ්හාතී"ති.

නිග්ගහකථා නිට්ඨිතා.

---

a. ධම්මපද.

5. ස. පු: අනෙකෙක් අනෙකකුගේ සිත නිගත්තේ වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: අනෙකෙක් අනෙකකුගේ අර්ථය පිණිස දුඃඛය පරිඥා කෙරේ ද? සමුදය දුරු කෙරේ ද? නිරෝධය සාක්ෂාත් කෙරේ ද? මාර්ගය භවා ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

6 ස. පු: අනෙකෙක් අනෙකකුගේ සිත නිගත්තේ වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ

ස. අනු: අනෙකෙක් අනෙකකුට කාරක වේ ද? සුඛදුඃඛ පරකෘත වේ ද? අනෙකෙක් කෙරේ ද? අනෙකෙක් විඳුනේ වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

7. ස. පු: අනෙකෙක් අනෙකකුගේ සිත නිගත්තේ වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරනලද මැ නු: "තමා විසින් කළ පාපය තමා කෙලෙසන්නේ යැ. තමා විසින් නො කළ පාපය තමා මැ ශුද්ධ කරන්නේ යැ. ශුද්ධි අශුද්ධි දෙක තමා කෙරෙහි වෙයි. අනෙකෙක් අනෙකකු විශුද්ධ නො කරන්නේ යැ"යි වදාළ සූත්‍රාන්තයෙක් ඇත්තේ මැ නු?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. පා: එකරුණිනි 'අනෙකෙක් අනෙකකුගේ සිත නිගත්තේ යැ' යනු නො කියැයුතු මැ යැ.

8 ප. පු: 'අනෙකෙක් අනෙකකුගේ සිත නිගත්තේ යැ' යනු නො කියැයුතු වේ ද?

ස. පටිඤ්ඤා: එසේ යැ.

ප. අනු: බලප්‍රාප්තයෝ ඇත්තාහු නො? වශීභූතයෝ ඇත්තාහු නො?

ස. පටිඤ්ඤා: එසේ යැ.

ප. ඨ: ඉදින් බලප්‍රාප්තයෝ ඇත්තාහු නම්, වශීභූතයෝ ඇත්තාහු නම්,

ප. පා: භවත එකරුණිනි 'අනෙකෙක් අනෙකකුගේ සිත නිගත්තේ යැ' යනු කියැයුතු මැ යැ.

නිග්ගහකථා නිමි.

16. 2.

## පග්ගහ කථා.

1\. ස. පු: පරෝ පරස්ස චිත්තං පග්ගණ්හාතී'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා

ස. අනු: පරෝ පරස්ස චිත්තං මා රජ්ජි, මා දුස්සි, මා මුය්හි, මා කිලිස්සී'ති පග්ගණ්හාතී'ති.

ප. පටි: න හෙවං වත්තබ්බේ -පෙ-

2\. ස. පු: පරෝ පරස්ස චිත්තං පග්ගණ්හාතී'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: පරෝ පරස්ස අලෝභං කුසලමූලං ජනෙති, අදෝසං කුසලමූලං ජනෙති, අමෝහං කුසලමූලං ජනෙති, සද්ධං ජනෙති, විරියං ජනෙති, සතිං ජනෙති, සමාධිං ජනෙති, පඤ්ඤං ජනෙතී'ති.

ප. පටි: න හෙවං වත්තබ්බේ -පෙ-

3\. ස. පු: පරෝ පරස්ස චිත්තං පග්ගණ්හාතී'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: පරෝ පරස්ස උප්පන්නො ඵස්සො මා නිරුජ්ඣී'ති පග්ගණ්හාතී'ති.

ප. පටි: න හෙවං වත්තබ්බේ -පෙ-

ස. අනු: පරෝ පරස්ස උප්පන්නා වේදනා -පෙ- උප්පන්නා සඤ්ඤා -පෙ- උප්පන්නා චේතනා -පෙ- උප්පන්නං චිත්තං -පෙ- උප්පන්නා සද්ධා -පෙ- උප්පන්නං විරියං -පෙ- උප්පන්නා සති -පෙ- උප්පන්නො සමාධි -පෙ- උප්පන්නා පඤ්ඤා මා නිරුජ්ඣී'ති පග්ගණ්හාතී'ති.

ප. පටි: න හෙවං වත්තබ්බේ -පෙ-

4\. ස. පු: පරෝ පරස්ස චිත්තං පග්ගණ්හාතී'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: පරෝ පරස්ස අත්ථාය රාගං පජහති, දෝසං පජහති, මෝහං පජහති -පෙ- අනොත්තප්පං පජහතී'ති.

ප. පටි: න හෙවං වත්තබ්බේ -පෙ-

16 2.

## පග්ගහකථා

[මෙහි නිදානය ද නිග්ගහකථායෙහි මෙනි.]

| | |
|---|---|
| 1. ස. පු: | අනෙකෙක් අනෙකකුගේ සිත ප්‍රග්‍රහ (පාලනය) කරන්නේ වේ ද? |
| ප. පරිඤ්ඤා: | එසේ යැ |
| ස. අනු: | අනෙකෙක් අනෙකකුගේ සිත 'නොඇලේව යි දූෂ්‍ය නොවේව යි මූළ්‍හ නො වේව යි කිලිටි නො වේව'යි ප්‍රග්‍රහ කරන්නේ වේ ද? |
| ප. පටි: | එසේ නො කියැයුතු යැ ... |
| 2. ස. පු: | අනෙකෙක් අනෙකකුගේ සිත ප්‍රග්‍රහ කෙරේ ද? |
| ප. පරිඤ්ඤා: | එසේ යැ. |
| ස. අනු: | අනෙකෙක් අනෙකකුගේ අලොභකුසලමූලය උපදවා ද, අදොස කුසලමූලය උපදවා ද, අමොහ-කුසලමූලය උපදවා ද, ශ්‍රද්ධා උපදවා ද, වීර්‍ය්‍ය උපදවා ද, සමෘති උපදවා ද, සමාධි උපදවා ද, ප්‍රඥා උපදවා ද? |
| ප. පටි: | එසේ නො කියැයුතු යැ ... |
| 3. ස. පු: | අනෙකෙක් අනෙකකුගේ සිත ප්‍රග්‍රහ කරන්නේ වේ ද? |
| ප. පරිඤ්ඤා: | එසේ යැ. |
| ස. අනු: | අනෙකෙක් අනෙකකුට 'උපන් ස්පර්ශය 'නහමක් නිරුද්ධ වේව'යි ප්‍රග්‍රහ කරන්නේ වේ ද? |
| ප. පටි: | එසේ නො කියැයුතු යැ |
| ස. අනු: | අනෙකෙක් අනෙකකුට 'උපන් වේදනා . උපන් සංඥා ... උපන් චේතනා .. උපන් චිත්තය ... උපන් ශ්‍රද්ධාව... උපන් වීර්‍ය්‍යය... උපන් සමෘතිය... උපන් සමාධි...උපන් ප්‍රඥා'නහමක් නිරුද්ධ වේව'යි ප්‍රග්‍රහ කරන්නේ (වළහන්නේ) වේ ද? |
| ප. පටි: | එසේ නො කියැයුතු යැ ... |
| 4. ස පු: | අනෙකෙක් අනෙකකුගේ සිත ප්‍රග්‍රහ කරන්නේ වේ ද? |
| ප පරිඤ්ඤා: | එසේ යැ. |
| ස. අනු: | අනෙකෙක් අනෙකකුට අතීත පිණිස රාගය හැරපියා ද, ද්වේෂය හැරපියා ද, මොහය හැර-පියා ද, .. අනපත්‍රපා හැරපියා ද? |
| ප. පටි: | එසේ නො කියැයුතු යැ ... |

5. ස. පු: පරො පරස්ස චිත්තං පග්ගණ්හාතී'ති

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: පරො පරස්ස අත්ථාය මග්ගං භාවෙති -පෙ- සතිපට්ඨානං භාවෙති -පෙ- බොජ්ඣඞ්ගං භාවෙතී'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

6. ස. පු: පරො පරස්ස චිත්තං පග්ගණ්හාතී'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: පරො පරස්ස අත්ථාය දුක්ඛං පරිජානාති -පෙ- මග්ගං භාවෙතී'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

7. ස. පු: පරො පරස්ස චිත්තං පග්ගණ්හාතී'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: අඤ්ඤො අඤ්ඤස්ස කාරකො, පරං කතං සුඛං දුක්ඛං, අඤ්ඤො කරොති, අඤ්ඤො පටිසං- වෙදෙතී'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

8. ස. පු: පරො පරස්ස චිත්තං පග්ගණ්හාතී'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: නනු වුත්තං භගවතා:

"අත්තනාව කතං පාපං -පෙ- නාඤ්ඤො අඤ්ඤං විසොධයෙ"ති[a] අත්ථෙව සුත්තන්තොති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. පා: තෙන හි න වත්තබ්බං: පරො පරස්ස චිත්තං පග්ගණ්හාතී'ති.

9. ප. පු: න වත්තබ්බං පරො පරස්ස චිත්තං පග්ගණ්හා- තී'ති.

ස. පටිඤ්ඤා: ආමන්තා.

ප අනු: නනු අත්ථි බලප්පත්තා අත්ථි වසීභූතා'ති.

ස. පටිඤ්ඤා: ආමන්තා.

ප. ඨ: හඤ්චි අත්ථි බලප්පත්තා අත්ථි වසීභූතා,

ප. පා: තෙන වත රෙ වත්තබ්බෙ "පරො පරස්ස චිත්තං පග්ගණ්හා"ති.

**පග්ගහකථා නිට්ඨිතා.**

---

a ධම්මපද

5. ස. පු: අනෙකෙක් අනෙකකුගේ සිත ප්‍රග්‍රහ කෙරේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: අනෙකෙක් අනෙකකුගේ අර්‍ථ පිණිස මාර්ගය වඩා ද ... සතිපට්ඨාන වඩා ද, ... බොධ්‍යඞ්ග වඩා ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ . .

6. ස. පු: අනෙකෙක් අනෙකකුගේ සිත ප්‍රග්‍රහ කෙරේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: අනෙකෙක් අනෙකකුගේ අර්‍ථ පිණිස දුඃඛය පරිඥා කෙරේ ද, ... මාර්ගභාවනා කෙරේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

7. ස. පු: අනෙකෙක් අනෙකකුගේ සිත ප්‍රග්‍රහ කරන්නේ වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: අනෙකෙක් අනෙකකුට කාරක වේ ද? සුඛදුඃඛ පරකෘත වේ ද? අනෙකෙක් කරන්නේ වේ ද? අනෙකෙක් විඳුනේ වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

8. ස. පු: අනෙකෙක් අනෙකකුගේ සිත ප්‍රග්‍රහ කරන්නේ වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරනලද මැ නු: තමා මැ කළ පාපය ... අනෙකෙක් අනෙකකු විශුද්ධ නො කෙරේ"යයි වදාළ සූත්‍රාන්තයෙක් ඇත්තේ මැ නු.

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. පා: එකරුණින් "අනෙකෙක් අනෙකකුගේ සිත ප්‍රග්‍රහ කෙරේ" යයි නො කියැයුතු යැ.

9. ප. පු: අනෙකෙක් අනෙකකුගේ සිත ප්‍රග්‍රහ කෙරේ යයි නො කියැයුතු වේ ද?

ස. පටිඤ්ඤා: එසේ යැ.

ප. අනු. බලප්‍රාප්තයෝ ඇත්තාහු නො? වශීභූතයෝ ඇත්තාහු නො?

ස. පටිඤ්ඤා: එසේ යැ.

ප. ඨ: ඉදින් බලප්‍රාප්තයෝ ඇත්තාහු නම්, වශීභූතයෝ ඇත්තාහු නම්,

ප. පා: හවත එකරුණින් "අනෙකෙක් අනෙකකුගේ සිත ප්‍රග්‍රහ කෙරේ" යයි කියැයුතු මැ යැ.

පග්ගහකථා නිමි.

## 16. 3

# සුඛානුප්පදාන කථා

1\. ස. පු: පරො පරස්ස සුඛං අනුප්පදෙතී'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. පු: පරො පරස්ස දුක්ඛං අනුප්පදෙතී'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

2\. ස. පු: පරො පරස්ස දුක්ඛං අනුප්පදෙතීති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: පරො පරස්ස සුඛං අනුප්පදෙතීති

ප· පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

3\. ස. පු. පරො පරස්ස සුඛං අනුප්පදෙතීති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: පරො පරස්ස අත්තනො සුඛං අනුප්පදෙති, අඤ්ඤස්ස සුඛං අනුප්පදෙති, තස්ස සුඛං අනුප්පදෙතීති.

ප පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

4\. ස. පු: පරො පරස්ස නෙවත්තනො, න අඤ්ඤස්ස, න තස්ස සුඛං අනුප්පදෙතීති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. ඨ: හඤ්චි පරො පරස්ස නෙවත්තනො, න අඤ්ඤස්ස, න තස්ස සුඛං අනුප්පදෙති,

ස. පා: නො ච වත රෙ වත්තබ්බෙ "පරො පරස්ස සුඛං අනුප්පදෙතී"ති

5\. ස. පු: පරො පරස්ස සුඛං අනුප්පදෙතී'ති

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: අඤ්ඤො අඤ්ඤස්ස කාරකො, පරං කතං සුඛං දුක්ඛං, අඤ්ඤො කරොති, අඤ්ඤො පටිසං-වෙදෙතී'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

16. 3.

## සුඛානුප්පාදන කථා.

['එකකු අනෙකක්හට සුඛය දියහෙන්නේ යැයි ලබ්ධිගත් හෙතුවාදීන්ගේ වාද බිඳුනම 'සුඛානුප්පදානකථා' එයි.]

1. ස. පු: අනෙකෙක් අනෙකක්හට සුව දෙන්නේ වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: අනෙකෙක් අනෙකක්හට දුක් දෙන්නේ වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

2. ස. පු: අනෙකෙක් අනෙකක්හට දුක් දෙන්නේ වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: අනෙකෙක් අනෙකක්හට සුව දෙන්නේ වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

3. ස. පු: අනෙකෙක් අනෙකක්හට සුව දෙන්නේ වේ ද?

ප පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: අනෙකෙක් අනෙකක්හට තමාගේ සුව දෙන්නේ වේ ද, අනුන්ගේ සුව දෙන්නේ වේ ද, ඔහු මැ ගේ සුව දෙන්නේ වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

4. ස. පු: අනෙකක්හට තමාගේ සුඛය නො මැ දෙන්නේ වේ ද, අන්‍යයන්ගේ සුඛය නො මැ දෙන්නේ වේ ද, ඔහු මැ ගේ සුඛය නො මැ දෙන්නේ වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. ඨ: ඉදින් අනෙකෙක් අනෙකක්හට තමාගේ සුඛය නො මැ දෙන්නේ වේ නම්, අන්‍යයන්ගේ සුඛය නො මැ දෙන්නේ වේ නම්, ඔහු මැ ගේ සුඛය නො මැ දෙන්නේ වේ නම්,

ස. පා: භවත 'අනෙකෙක් අනෙකක්හට සුඛය දෙන්නේ වේ' යයි නො කියැයුතු මැ යැ.

5. ස. පු: අනෙකෙක් අනෙකෙක්හට සුඛය දෙන්නේ වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු. අනෙකෙක් අනෙකක්හට කාරක වේ ද, සුඛදුඃඛ. පරකෘත වේ ද, අනෙකෙක් කෙරේ ද, අනෙකෙක් විඳුනේ වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

6\. ප. පු: න වත්තබ්බං පරෝ පරස්ස සුඛං අනුප්පදේතී'ති.

ස. පටික්ඛෙපො: ආමන්තා.

ප. අනු: නනු ආයස්මා උදායී එතදවෝච:

"බහූනං[1] වත නෝ භගවා දුක්ඛධම්මානං අපහත්තා, බහූනං වත නෝ භගවා සුඛධම්මානං උපහත්තා, බහූනං[1] වත නෝ භගවා අකුසලානං ධම්මානං අපහත්තා, බහූනං[1] වත නෝ භගවා කුසලානං ධම්මානං උපහත්තා"ති.[a] අත්ථේව සුත්තන්තෝ'ති.

ස. පටික්ඛෙපො: ආමන්තා

ප. පා: තේන හි "පරෝ පරස්ස සුඛං අනුප්පදේතී"ති.

**සුඛානුප්පදානකථා නිට්ඨිතා.**

---

1 බහූනං - සීමු, මජසං.

a. මජ්ඣිමනිකාය - ලටුකිකෝපම සුත්තං

6. ප. පු: "අනෙකෙක් අනෙකක්හට සුඛය දෙන්නේ වේ" යයි නො කියැයුතු වේ ද?

ස. පරිසකුසූ: එසේ යැ.

ප. අනු: ආයුෂ්මත් උදායි තෙරණුවෝ තෙල වදාළාහු නො "භාග්‍යවතුන් වහන්සේ අපගේ බොහෝ වූ දුඃඛධර්මයන් බැහැර කරනසේක් මැ යැ. භාග්‍යවතුන් වහන්සේ අපට බොහෝ වූ සුඛධර්මයන් එළවන සේක් මැ යැ. භාග්‍යවතුන් වහන්සේ අපගේ බොහෝ වූ අකුශලධර්මයන් බැහැර කරන සේක් මැ යැ. භාග්‍යවතුන් වහන්සේ අපට බොහෝ කුශලධර්මයන් එළවන සේක් මැ යැ" යි වදළ සූත්‍රාන්තයෙක් ඇත්තේ මැ නු?

ස. පරිසකුසූ: එසේ යැ.

ප. පා: එකරුණින් 'අනෙකෙක් අනෙකක්හට සුඛය දෙන්නේ වේ.

සුඛානුප්පදාන කථා නිමි.

## 16. 4.

['දුඃඛය ඉන්ද්‍රියබද්ධ යැ අනින්ද්‍රිබද්ධයැයි. ද්විවිධ යි. ඉන්ද්‍රියබද්ධය දුකට වස්තු බැවින් දුඃඛ වෙයි. අනින්ද්‍රියබද්ධය උදයව්‍යයප්‍රතිපීඩනාර්ථයෙන් 'යමෙක් අනිත්‍ය වී නම් ඒ දුඃඛයැයි' සඞ්ගෘහීත බැවින් දුඃඛ වෙයි. මේ වෙනස නො ගෙන 'යම් දුඃඛයක්හුගේ පරිඥා පිණිස භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි බ්‍රහ්මචර්යයී වාස කරන්නේ නම්, ඒ ඉන්ද්‍රියබද්ධය මැ දුඃඛ වෙයි. අනෙකක් දුඃඛ නො වේ'යයි හේතුවාදින් සෙයින් ලබ්ධි ගත්තවුන්ගේ වාද බිඳුනම 'ඉන්ද්‍රියබද්ධකථා' එයි.]

**1.** ස. පු: ඉන්ද්‍රියබද්ධය මැ දුඃඛ වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: ඉන්ද්‍රියබද්ධය මැ අනිත්‍ය සංස්කෘත ප්‍රතීත්‍ය සමුත්පන්න වේ ද? ක්‍ෂයස්වභාව ව්‍යයස්වභාව විරාගස්වභාව නිරොධස්වභාව විපරිණාමස්වභාව ඇත්තේ වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

ස. අනු: අනින්ද්‍රියබද්ධය අනිත්‍ය සංස්කෘත ප්‍රතීත්‍ය- සමුත්පන්න නො? ක්‍ෂයස්වභාව ව්‍යයස්වභාව විරාගස්වභාව නිරොධස්වභාව විපරිණාමස්වභාව ඇත්තේ නො?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. ඨ: ඉදින් අනින්ද්‍රියබද්ධය අනිත්‍ය සංස්කෘත ප්‍රතීත්‍ය- සමුත්පන්න වී නම්, ක්‍ෂයස්වභාව ව්‍යයස්වභාව විරාගස්වභාව නිරොධස්වභාව විපරිණාමස්වභාව ඇත්තේ වී නම්,

ස. පා: හුවත, 'ඉන්ද්‍රියබද්ධය මැ දුඃඛ වෙති' නො කියැයුතු මැ යැ.

**2.** ස. පු: අනින්ද්‍රියබද්ධය අනිත්‍ය සංස්කෘත ප්‍රතීත්‍ය- සමුත්පන්න වේ ද? ක්‍ෂයස්වභාව ව්‍යයස්වභාව විරාගස්වභාව නිරොධස්වභාව විපරිණාමස්වභාව ඇත්තේ වේ ද? එ ද දුඃඛ නො වන්නේ වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: ඉන්ද්‍රියබද්ධය අනිත්‍ය සංස්කෘත ... විපරිණාම- ස්වභාව ඇත්තේ වේද? එ ද දුඃඛ නො වන්නේ වේද?

ප. පටිඤ්ඤා: එසේ නො කියැයුතු යැ ...

3. ස. පු: ඉන්ද්‍රියබද්ධං අනිච්චං සඞ්ඛතං -පෙ- විපරිණාමධම්මං, තඤ්ච දුක්ඛන්ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: අනින්ද්‍රියබද්ධං අනිච්චං සඞ්ඛතං -පෙ- විපරිණාමධම්මං, තඤ්ච දුක්ඛන්ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

4 ස. පු: ඉන්ද්‍රියබද්ධඤ්ඤෙව දුක්ඛන්ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: නනු "යදනිච්චං තං දුක්ඛං" වුත්තං භගවතා, අනින්ද්‍රියබද්ධං අනිච්චන්ති.

ප. පටිඤ්ඤා: ආමන්තා..

ස. ඨ: හඤ්චි "යදනිච්චං තං දුක්ඛං" වුත්තං භගවතා, අනින්ද්‍රියබද්ධං අනිච්චං,

ස· පා: තෙන ච වත රෙ වත්තබ්බෙ: ඉන්ද්‍රියබද්ධඤ්ඤෙව දුක්ඛන්ති.

5. ප. පු: න වත්තබ්බං ඉන්ද්‍රියබද්ධඤ්ඤෙව දුක්ඛන්ති.

ස. පටිඤ්ඤා: ආමන්තා.

ප. අනු: යථා ඉන්ද්‍රියබද්ධස්ස දුක්ඛස්ස පරිඤ්ඤාය භගවති බ්‍රහ්මචරියං වුස්සති, එවමෙවං අනින්ද්‍රියබද්ධස්ස දුක්ඛස්ස පරිඤ්ඤාය භගවති බ්‍රහ්මචරියං වුස්සතී'ති.

ස. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

ප. අනු: යථා ඉන්ද්‍රියබද්ධං දුක්ඛං පරිඤ්ඤාතං න පුන උප්පජ්ජති, එවමෙවං අනින්ද්‍රියබද්ධං දුක්ඛං පරිඤ්ඤාතං න පුන උප්පජ්ජතීති.

ස. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

ප. පා: තෙන හි "ඉන්ද්‍රියබද්ධඤ්ඤෙව දුක්ඛ"න්ති.

ඉන්ද්‍රියබද්ධකථා නිට්ඨිතා.

3 ස. පු: ඉන්ද්‍රියබද්ධය අනිත්‍ය සංස්කෘත ... විපරිණාම-ස්වභාව ඇත්තේ වේ ද, එ ද දුඃඛ වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: අනින්ද්‍රියබද්ධය අනිත්‍ය සංස්කෘත ... විපරිණාම-ස්වභාව ඇත්තේ වේ ද, එ ද දුඃඛ වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

4. ස. පු: ඉන්ද්‍රියබද්ධය මැ දුඃඛ වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: භාග්‍යවතුන් වහන්සේ විසින් "යමෙක් අනිත්‍ය වේ නම් ඒ දුක්‍ඛැ"යි වදාළ පරිදි අනින්ද්‍රියබද්ධය අනිත්‍ය නො?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. ඨ: ඉදින් "යමෙක් අනිත්‍ය වේ නම් ඒ දුක්‍ඛැ"යි භාග්‍යවතුන් වහන්සේ විසින් වදාළ පරිදි අනින්ද්‍රිය-බද්ධය අනිත්‍ය වී නම්,

ස. පා: හවත, 'ඉන්ද්‍රියබද්ධය මැ දුක්‍ඛැ'යි නො කියැයුතු මැ යැ.

5. ප. පු: 'ඉන්ද්‍රියබද්ධය මැ දුක්‍ඛැ'යි නො කියැයුතු වේ ද?

ස. පටිඤ්ඤා: එසේ යැ.

ප. අනු: යම්සේ ඉන්ද්‍රියබද්ධදුඃඛයාගේ පරිඥා පිණිස භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි බ්‍රහ්මචර්‍ය්‍යාවාස කරන්නේ වේ ද, එපරිදි මැ අනින්ද්‍රියබද්ධ දුඃඛයාගේ පරිඥා පිණිස භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි බ්‍රහ්මචර්‍ය්‍යාවාස කරන්නේ වේ ද?

ස. පටි: එසේ නො කියැයුතු යැ ...

ප. අනු: යම්සේ ඉන්ද්‍රියබද්ධදුඃඛය පරිඥා කරනලද්දේ වටාලා නූපදනේ වේ ද, එපරිදි මැ අනින්ද්‍රියබද්ධ-දුඃඛය පරිඥා කරනලද්දේ වටාලා නූපදනේ වේ ද?

ස. පටි: එසේ නො කියැයුතු යැ ...

ප. පා: එකරුණින් 'ඉන්ද්‍රියබද්ධය මැ' දුඃඛ වෙයි.

ඉන්ද්‍රියබද්ධකථා නිමි.

## 17. 5.

# ඨපෙත්වා අරියමග්ගන්ති කථා.

1. ස. පු: ඨපෙත්වා අරියමග්ගං අවසෙසා සඞ්ඛාරා දුක්ඛා'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: දුක්ඛසමුදයොපි දුක්ඛො'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

2. ස. පු: දුක්ඛසමුදයොපි දුක්ඛො'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: තීණෙව අරියසච්චානී'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

3. ස. පු: තීණෙව අරියසච්චානීති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: නනු චත්තාරි අරියසච්චානි වුත්තානි භගවතා: "දුක්ඛං දුක්ඛසමුදයො දුක්ඛනිරොධො දුක්ඛ-නිරොධගාමිනී පටිපදා"ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. ඨ: හඤ්චි චත්තාරි අරියසච්චානි වුත්තානි භගවතා: දුක්ඛං දුක්ඛසමුදයො දුක්ඛනිරොධො දුක්ඛ-නිරොධගාමිනී පටිපදා,

ස. පා: නො ච වත රෙ වත්තබ්බෙ: "තීණෙව අරිය-සච්චානී"ති.

4. ස. පු: දුක්ඛසමුදයො'පි දුක්ඛො'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. පු: කෙනට්ඨෙනාති.

ප. වි: අනිච්චට්ඨෙනාති.

ස. අනු: අරියමග්ගො අනිච්චො'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: අරියමග්ගො දුක්ඛො'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

## 17. 5.

# ඨපෙත්වා අරියමග්ගඞ්ගානි කථා.

['ආර්‍ය්‍යමාර්ගය දුඃඛනිරෝධගාමිනීප්‍රතිපදා යැයි කියනලද හෙයින් ආර්‍ය්‍යමාර්ගය තබා අවශෙෂ සංස්කාරයෝ දුඃඛයහ'යි හෙතුවාදීන් සෙයින් ලබ්ධි ගත්තවුන්ගේ වාද බිඳුනම 'ඨපෙත්වා අරියමග්ගඞ්ගානි කථා' එයි.]

1. ස. පු: ආර්‍ය්‍යමාර්ගය තබා අවශෙෂ සංස්කාරයෝ දුඃඛ වෙත් දැ?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: දුඃඛසමුදයත් දුඃඛ වේ දැ?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

2. ස. පු: දුඃඛසමුදයත් දුඃඛ වේ දැ?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: ආර්‍ය්‍යසත්‍යයෝ තිදෙනෙක් මැ වෙත් දැ?

ප. පටි: එසේ නො කියැයුතු යැ. ...

3. ස. පු: ආර්‍ය්‍යසත්‍යයෝ තිදෙනෙක් මැ වෙත් දැ?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: භාග්‍යවතුන් වහන්සේ විසින් "දුඃඛ යැ දුඃඛසමුදය යැ දුඃඛනිරෝධ යැ දුඃඛනිරෝධගාමිනීප්‍රතිපදා යැ"යි සතර සත්‍ය කෙනෙක් වදාරන ලද්දාහු නො?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. ඨ: ඉදින් භාග්‍යවතුන් වහන්සේ විසින් "දුඃඛ යැ දුඃඛසමුදය යැ දුඃඛනිරෝධ යැ දුඃඛනිරෝධගාමිනී-ප්‍රතිපදා යැ"යි සතර සත්‍ය කෙනෙක් මැ වදාරන ලද වෙත් නම්,

ස. පා: භවත, 'ආර්‍ය්‍යසත්‍යයෝ තිදෙනෙක් මැ වෙති' නො කියැයුතු මැ යැ.

4. ස. පු: දුඃඛසමුදයත් දුඃඛ වේ දැ?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. පු: කවර අරුතින් වේ දැ?

ප. වි: අනිත්‍යාර්ථයෙන් වෙයි.

ස. අනු: ආර්‍ය්‍යමාර්ගය අනිත්‍ය වේ දැ?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: ආර්‍ය්‍යමාර්ගය දුඃඛ වේ දැ?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

5. ස. පු: අරියමග්ගො අනිච්චො, සො ච න දුක්ඛොති.

ප. පටිඤ්ඤා: ආමන්තා

ස. අනු: දුක්ඛසමුදයො අනිච්චො, සො ච න දුක්ඛො,ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

6. ස. පු: දුක්ඛසමුදයො අනිච්චො, සො ච දුක්ඛො'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: අරියමග්ගො අනිච්චො, සො ච දුක්ඛො'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

7. ප. පු: න වත්තබ්බං ඨපෙත්වා අරියමග්ගං අවසෙසා සඞ්ඛාරා දුක්ඛා'ති.

ස. පටිඤ්ඤා: ආමන්තා.

ප. අනු: නනු සා දුක්ඛනිරොධගාමිනී පටිපදාති.

ස. පටිඤ්ඤා: ආමන්තා.

ප. ඨ: හඤ්චි සා දුක්ඛනිරොධගාමිනී පටිපදා,

ප. පා: තෙන වත රෙ වත්තබ්බෙ: "ඨපෙත්වා අරියමග්ගං අවසෙසා සඞ්ඛාරා දුක්ඛා"ති

ඨපෙත්වා අරියමග්ගන්ති කථා නිට්ඨිතා.

5. ස. පු අායර්‍යමාර්‍ගය අනිත්‍ය වේ ද, එ ද දුඃඛ නො වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: දුඃඛසමුදය අනිත්‍ය වේ ද, එ ද දුඃඛ නො වේ ද?

ප. පටි. එසේ නො කියැයුතු යැ ...

6. ස. පු: දුඃඛසමුදය අනිත්‍ය වේ ද, එ ද දුඃඛ වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: අායර්‍යමාර්‍ගය අනිත්‍ය වේ ද, එ ද දුඃඛ වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

7. ප. පු: 'අායර්‍යමාර්‍ගය තබා අවශෙෂ සංස්කාරයෝ දුඃඛයහ'යි නො කියැයුතු වේ ද?

ස. පටිඤ්ඤා: එසේ යැ.

ප. අනු: එ දුඃඛනිරොධගාමිනීප්‍රතිපද නො?

ස. පටිඤ්ඤා: එසේ යැ.

ප. ඨ: ඉදින් එ දුඃඛනිරොධගාමිනීප්‍රතිපද වූ නම්,

ප. පා: භවත, එකරුණින් 'අායර්‍යමාර්‍ගය තබා අවශෙෂ සංස්කාරයෝ දුඃඛයහ'යි කියැයුතු මැ යැ.

එපෙක්ඛා අරියමග්ගභාණි කථා නිමි.

## 17. 6.

# න වත්තබ්බං සඞ්ඝො දක්ඛිණං පතිගණ්හාතීති කථා.

1. ස. පු: න වත්තබ්බං සඞ්ඝො දක්ඛිණං පතිගණ්හාතීති.[1]

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: නනු සඞ්ඝො ආහුනෙය්‍යො පාහුනෙය්‍යො දක්ඛිණෙය්‍යො අඤ්ජලිකරණීයො අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්සා'ති.

ස. පටිඤ්ඤා: ආමන්තා.

ප. ඨ: හඤ්චි සඞ්ඝො ආහුනෙය්‍යො පාහුනෙය්‍යො දක්ඛිණෙය්‍යො අඤ්ජලිකරණීයො අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්ස,

ප. පා: තෙන වත රෙ වත්තබ්බෙ: 'සඞ්ඝො දක්ඛිණං පතිගණ්හාතීති[1].

2. ස. පු: න වත්තබ්බං 'සඞ්ඝො දක්ඛිණං පතිගණ්හාතී'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: නනු චත්තාරො පුරිසයුගා අට්ඨපුරිසපුග්ගලා දක්ඛිණෙය්‍යා වුත්තා භගවතාති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. ඨ: හඤ්චි චත්තාරො පුරිසයුගා අට්ඨපුරිසපුග්ගලා දක්ඛිණෙය්‍යා වුත්තා භගවතා.

ස. පා: තෙන වත රෙ වත්තබ්බෙ: "සඞ්ඝො දක්ඛිණං පතිගණ්හාතී"ති[1].

3 ස. පු: න වත්තබ්බං 'සඞ්ඝො දක්ඛිණං පතිගණ්හාතී'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: නනු අත්ථි කෙචි සඞ්ඝස්ස දානං දෙන්තීති.

ප. පටිඤ්ඤා: අමන්තා.

ස. ඨ: හඤ්චි අත්ථි කෙචි සඞ්ඝස්ස දක්ඛිණං දෙන්ති,

ස. පා: තෙන වත රෙ වත්තබ්බෙ: "සඞ්ඝො දක්ඛිණං පතිගණ්හාතී"ති.

---

1. පටිග්ගණ්හාතීති - සීමු, මජසං, සසං· පටිගණ්හාතීති - PTS

## 17. 6.

# න වත්තබ්බං සඞ්ඝො දක්ඛිණං පතිගණ්හාතීති කථා.

[පරමාර්ථ විසින් මාර්ගඵල මැ සඞ්ඝ වෙයි. මාර්ගඵලයෙන් අන්‍ය සඞ්ඝ නම් කිසිවෙක් නැත. මාර්ගඵලයෝ කිසිවක් නො පිළිගනිති. එහෙයින් සඞ්ඝයා දක්ෂිණාව පිළිගනිති නො කියැයුතු යැ'යි මහාශූන්‍යවාදීන් සෙයින් ලබ්ධි ගතුවන්ගේ වාදය බිඳුනට 'න වත්තබ්බං සඞ්ඝො දක්ඛිණං පතිගණ්හාතීති කථා' එයි.]

1. ස. පු: 'සඞ්ඝයා දක්ෂිණා පිළිගනිති' නො කියැයුතු වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: සඞ්ඝයා දුර සිට ගෙනවුත් පුදනට තිසි, ආදර බහුමාන පූර්වක වැ පුදනට තිසි, දක්ෂිණාවට (කර්ම-පල අදහා දෙන දනට) තිසි, ඇඳිලි බඳනට තිසි වූයේ ලොවට අනුත්තර පුණ්‍යක්ෂෙත්‍ර නො?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. ඨ: ඉදින් සඞ්ඝයා ආහුනෙය්‍යට තිසි, පාහුනෙය්‍යට තිසි, දක්ඛිණාවට තිසි, අඤ්ජලිකරණයට තිසි වූයේ ලොවට අනුත්තර පින්කෙත් වී නම්,

ස. පා: හවත, එකරුණින් 'සඞ්ඝයා දක්ෂිණා පිළිගනිති' කියැයුතු මැ යැ.

2. ස. පු: 'සඞ්ඝයා දක්ෂිණාව පිළිගනිති' නො කියැයුතු වේ ද,

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: භාග්‍යවතුන් වහන්සේ විසින් සතර පුරුෂයුග වූ අෂ්ටපුරුෂපුද්ගලයෝ දක්ෂිණාර්හයහ'යි වදාරන-ලද නො?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. ඨ: ඉදින් භාග්‍යවතුන් වහන්සේ විසින් 'සතර පුරුෂයුග වූ අෂ්ටපුරුෂපුද්ගලයෝ දක්ෂිණාර්හයහ'යි වදාරනලද නම්,

ස. පා: හවත, එකරුණින් සඞ්ඝයා දක්ෂිණා පිළිගනිති කියැයුතු මැ වෙයි.

3. ස. පු: 'සඞ්ඝයා දක්ෂිණාව පිළිගනිති'යි නො කියැයුතු වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: සඞ්ඝයාට දන්දෙන කිසි කෙනෙක් ඇත් නො?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. ඨ: ඉදින් කිසි කෙනෙක් සඞ්ඝයාට දන් දෙන්නාහු ඇත් නම්,

ස. පා: හවත, එකරුණින් සඞ්ඝයා දක්ෂිණා පිළිගනිතියි කියැයුතු.

ස. අනු: නනු අත්ථි කෙචි සඞ්ඝස්ස චීවරං දෙන්ති -පෙ- පිණ්ඩපාතං දෙන්ති -පෙ- සෙනාසනං දෙන්ති -පෙ- ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරං දෙන්ති -පෙ- ඛාදනීයං දෙන්ති -පෙ- භොජනීයං දෙන්ති -පෙ- පානීයං දෙන්තී'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා

ස. ඨ. හඤ්චි අත්ථි කෙචි සඞ්ඝස්ස පානීයං දෙන්ති,

ස. පා: තෙන වත රෙ වත්තබ්බෙ: "සඞ්ඝො දක්ඛිණං පතිගණ්හාතී"ති.

4 ස. පු. න වත්තබ්බං සඞ්ඝො දක්ඛිණං පතිගණ්හාතීති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: නනු වුත්තං භගවතා:

"ආහුතිං[1] ජාතවෙදෙව
මහාමෙඝංව මෙදිනී[2].
සඞ්ඝො සමාධිසම්පන්නො
පතිගණ්හාති දක්ඛිණ"න්ති.

අත්ථෙව සුත්තන්තොති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. පා: තෙන හි "සඞ්ඝො දක්ඛිණං පතිගණ්හාතී"ති.

5. ප. පු: සඞ්ඝො දක්ඛිණං පතිගණ්හාතීති.

ස. පටිඤ්ඤා: ආමන්තා.

ප. අනු: මග්ගො පටිගණ්හාති, ඵලං පටිගණ්හාතීති.

ස. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

න වත්තබ්බං සඞ්ඝො දක්ඛිණං පතිගණ්හාතීති කථා නිට්ඨිතා.

1. ආහුති - සිමු, සයා. PTS.
2. මෙදනී - මජසං, සයා.

ස. අනු: සඞ්ඝයාට චීවර දෙන්නාහු .. පිණ්ඩපාත දෙන්නාහු ... ශයනාසන දෙන්නාහු .. ග්ලාන-ප්‍රත්‍යයභෛෂජ්‍යපරිෂ්කාර දෙන්නාහු ... ඛාදනීය දෙන්නාහු ... භොජනීය දෙන්නාහු ... පානීය දෙන්නාහු ඇත් නො?

ප. පටිඤ්ඤා: එසේ ය.

ස. ඨ: ඉදින් සඞ්ඝයාට පැන් දෙන කිසි කෙනෙක් ඇත් නම්,

ස. පා: භවත, එකරුණින් සඞ්ඝයා දක්ෂිණා පිළිගන්නේ යයි කියයුතු.

4. ස. පු: 'සඞ්ඝයා දක්ෂිණා පිළිගනිති'යි නො කියයුතු වේ ද?

ප. පටිඤ්ඤා: එසේ ය.

ස. අනු: භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරනලද නොඃ

"අග්නිය ආහුතිය (පිළිගන්නා) සෙයින්, පෘථිවිය මහාමෙඝය (පිළිගන්නා) සෙයින් සමාහිතසම්පන්න සඞ්ඝයා දක්ෂිණා පිළිගනිති"යි

වදාළ සූත්‍රාන්තයෙක් ඇත්තේ මැ නො?

ප. පටිඤ්ඤා: එසේ ය.

ස. පා: එකරුණින් සඞ්ඝයා දක්ෂිණා පිළිගන්නේ වේ.

5. ප. පු: සඞ්ඝයා දක්ෂිණා පිළිගන්නේ වේ ද?

ස. පටිඤ්ඤා: එසේ ය.

ප. අනු: මාර්ගය පිළිගන්නේ වේ ද, ඵලය පිළිගන්නේ වේ ද?

ස. පටි: එසේ නො කියයුතු ය ...

න වත්තබ්බං සඞ්ඝො දක්ඛිණං පතිගණ්හාතීති කථා නිමි.

17. 7.

## න වත්තබ්බං සඞ්ඝො දක්ඛිණං විසොධෙතීති කථා.

1. ස. පු: න වත්තබ්බං සඞ්ඝො දක්ඛිණං විසොධෙතීති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: නනු සඞ්ඝො ආහුනෙය්‍යො පාහුනෙය්‍යො දක්ඛිණෙය්‍යො අඤ්ජලිකරණීයො අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්සාති.

ස. පටිඤ්ඤා: ආමන්තා.

ස. ඨ: හඤ්චි සඞ්ඝො ආහුනෙය්‍යො -පෙ- අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්ස,

ස. පා: තෙන වත රෙ වත්තබ්බෙ "සඞ්ඝො දක්ඛිණං විසොධෙතී"ති.

2. ස. පු: න වත්තබ්බං සඞ්ඝො දක්ඛිණං විසොධෙතීති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: නනු චත්තාරො පුරිසයුගා අට්ඨපුරිසපුග්ගලා දක්ඛිණෙය්‍යා වුත්තා භගවතාති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. ඨ: හඤ්චි චත්තාරො පුරිසයුගා අට්ඨපුරිසපුග්ගලා දක්ඛිණෙය්‍යා වුත්තා භගවතා,

ස. පා: තෙන වත රෙ වත්තබ්බෙ "සඞ්ඝො දක්ඛිණං විසොධෙතී"ති.

3. ස. පු: න වත්තබ්බං සඞ්ඝො දක්ඛිණං විසොධෙතී'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

## 17. 7.

# න වත්තබ්බං සඞ්ඝො දක්ඛිණං විසොධෙතීති කථා.

[මාර්ගඵල මැ සඞ්ඝ නම් වෙයි. මාර්ගඵලයෝ දක්ෂිණා විශුද්ධ කරන්නට නො හැකි වෙති. එකරුණින් "සඞ්ඝයා දක්ෂිණා විශුද්ධ කෙරෙති නො කියයුතු යැ"යි වෛතුල්‍යවාදීන් සෙයින් ලබ්ධි ගත්තවුන්ගේ වාද බිඳුනට 'න වත්තබ්බං සඞ්ඝො දක්ඛිණං විසොධෙතීති කථා' එයි]

1. ස. පු: 'සඞ්ඝයා දක්ෂිණා විශුද්ධ කෙරෙති' නො කියයුතු වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: සඞ්ඝයා ආහුනෙයට තිසි, පාහුනෙයට තිසි, දක්ෂිණාවට තිසි, ඇඳිලි බැඳ වඳනාව තිසි වූයේ ලොවට අනුත්තර පුණ්‍යක්ෂෙත්‍ර නො?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. ඨ: ඉදින් සඞ්ඝයා ආහුනෙයට තිසි .. ලොවට අනුත්තර පුණ්‍යක්ෂෙත්‍ර වී නම්,

ස. පා: භවත, එකරුණින් 'සඞ්ඝයා දක්ෂිණා විශුද්ධ කෙරෙති' කියයුතු මැ යි.

2. ස. පු: 'සඞ්ඝයා දක්ෂිණා විශුද්ධ කෙරෙති' නො කියයුතු වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: 'සතර පුරුෂයුග වූ අෂ්ට ආර්‍ය්‍යපුද්ගලයෝ දක්ෂිණාර්හයහ'යි භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරනලද නො?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. ඨ: ඉදින් සතර පුරුෂයුග වූ අෂ්ට ආර්‍ය්‍යපුද්ගලයෝ දක්ෂිණාර්හයහ'යි භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරන ලද වී නම්,

ස. පා: භවත, එකරුණින් 'සඞ්ඝයා දක්ෂිණා විසුද්ධ කෙරෙති' කියයුතු මැ යැ.

3. ස. පු: 'සඞ්ඝයා දක්ෂිණා විශුද්ධ කෙරෙති' නො කියයුතු වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: නනු අත්ථි කෙචි සඞ්ඝස්ස දානං දත්වා දක්ඛිණං ආරාධෙන්තී'ති

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. ඨ: හඤ්චි 'අත්ථි කෙචි සඞ්ඝස්ස දානං දත්වා දක්ඛිණං ආරාධෙන්ති,

ස. පා: තෙන වත රෙ වත්තබ්බෙ "සඞ්ඝො දක්ඛිණං විසොධෙතී"ති.

ස. අනු: නනු අත්ථි කෙචි සඞ්ඝස්ස චීවරං දත්වා -පෙ- පිණ්ඩපාතං දත්වා -පෙ- සෙනාසනං දත්වා -පෙ- ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරං දත්වා -පෙ- ඛාදනීයං දත්වා -පෙ- භොජනීයං දත්වා -පෙ- පානීයං දත්වා දක්ඛිණං ආරාධෙන්තීති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. ඨ: හඤ්චි අත්ථි කෙචි සඞ්ඝස්ස පානීයං දත්වා දක්ඛිණං ආරාධෙන්ති,

ස. පා. තෙන වත රෙ වත්තබ්බෙ: "සඞ්ඝො දක්ඛිණං විසොධෙතී"ති.

4. ප. පු: සඞ්ඝො දක්ඛිණං විසොධෙතීති.

ස. පටිඤ්ඤා: ආමන්තා.

ප. අනු: මග්ගො විසොධෙති, ඵලං විසොධෙතීති.

ස. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

**න වත්තබ්බං සඞ්ඝො දක්ඛිණං විසොධෙතීති කථා නිට්ඨිතා.**

ස. අනු: සඟනට දත් දී දක්‍ෂිණාඵල සපයන කිසි කෙනෙක් ඇත් නො?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. ඨ: ඉදින් සඟනට දත් දී දක්‍ෂිණාඵල සපයන කිසි කෙනෙක් ඇත් නම්,

ස. පා: භවත, එකරුණින් 'සඞ්ඝයා දක්‍ෂිණාවිශුද්ධිය කෙරෙති'යි කියැයුතු මැ යැ.

ස. අනු: සඟනට සිවුරු දී ... පිඬුවා දී .. සෙනසුන් දී ... ගිලන්පසබෙහෙත්පිරිකර දී ... කැවිලි දී ... බොජුන් දී ... පැන් දී දක්‍ෂිණාඵල සපයන කිසි කෙනෙක් ඇත් නො?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. ඨ: ඉදින් සඟනට පානීය දී දක්‍ෂිණාඵල සපයන කිසි කෙනෙක් ඇත් නම්,

ස. පා. භවත, එකරුණින් 'සඞ්ඝයා දක්‍ෂිණා විශුද්ධ කෙරෙති' කියැයුතු මැ යැ.

4. ප. පු: සඞ්ඝයා දක්‍ෂිණා විශුද්ධ කරන්නේ වේ ද?
ස. පටිඤ්ඤා: එසේ යැ.

ප. අනු: මාර්ගය විශුද්ධ කරන්නේ වේ ද, ඵලය විශුද්ධ කරන්නේ වේ ද?

ස. පටි: එසේ නො කියැයුතු යැ ...

න වත්තබ්බං සඞ්ඝො දක්ඛිණං විසොධෙතීති කථා නිමි.

17. 8.

# න වත්තබ්බං සඞ්ඝො භුඤ්ජතීති කථා.

1. ස. පු: න වත්තබ්බං 'සඞ්ඝො භුඤ්ජති, පිවති, ඛාදති, සායතී'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: නනු අත්ථි කෙචි සඞ්ඝභත්තානි කරොන්ති, උද්දෙසභත්තානි කරොන්ති, යාගුපානානි කරොන්තී'ති,

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. ඨ: හඤ්චි අත්ථි කෙචි සඞ්ඝභත්තානි කරොන්ති, උද්දෙසභත්තානි කරොන්ති, යාගුපානානි කරොන්ති,

ස. පා: තෙන වත රෙ වත්තබ්බෙ "සඞ්ඝො භුඤ්ජති, පිවති, ඛාදති, සායතී'ති.

2. ස. පු: න වත්තබ්බං 'සඞ්ඝො භුඤ්ජති, පිවති ඛාදති, සායතී'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: නනු වුත්තං භගවතා "ගණභොජනං පරම්පරභොජනං අතිරිත්තභොජනං අනතිරිත්තභොජන"න්ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. ඨ: හඤ්චි වුත්තං භගවතා ගණභොජනං පරම්පරභොජනං අතිරිත්තභොජනං අනතිරිත්තභොජනං,

ස. පා: තෙන වත රෙ වත්තබ්බෙ "සඞ්ඝො භුඤ්ජති, පිවති, ඛාදති, සායතී"ති.

3. ස. පු: න වත්තබ්බං 'සඞ්ඝො භුඤ්ජති, පිවති ඛාදති සායතී'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

17. 8.

# න වත්තබ්බං සඞ්ඝො භුඤ්ජතීති කථා.

[මාර්ගඵලයෝ මැ සඞ්ඝ නම් වෙති. මාර්ගඵලයෝ කිසිවක් නො වළඳති. එසින් "සඞ්ඝයා භොජන පාන ඛාදන සායන කෙරෙති' නො කියැයුතු යැ"යි වෛතුල්‍යවාදීන් සෙයින් ලබ්ධි ගත්තවුන්ගේ වාද බිඳුනම 'න වත්තබ්බං සඞ්ඝො භුඤ්ජතීති කථා' එයි.]

1 ස. පු: සඞ්ඝ තෙම භෝජන පාන ඛාදන සායන කෙරෙයි' යනු නො කියැයුතු වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: සඟබත් කරන උදෙස්බත් කරන යාගුපාන (හුළුකැත් බීම) කරන කිසි කෙනෙක් ඇත් නො?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. ඨ: ඉදින් සඟබත් කරන උදෙස්බත් කරන යාගුපාන කරන කිසි කෙනෙක් ඇත් නම්,

ස. පා: හවත, එකරුණින් 'සඞ්ඝයා භොජන පාන ඛාදන සායන කෙරෙති' කියයුතු මැ යි.

2. ස. පු: 'සඞ්ඝයා භොජන පාන ඛාදන සායන කෙරෙති' නො කියැයුතු වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: භාග්‍යවතුන් වහන්සේ විසින්: "ගණභොජන යැ පරම්පරභොජන යැ අතිරිත්තභොජන යැ අනතිරිත්තභොජන යැ" යනු වදාරනලද නො?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. ඨ: ඉදින් භාග්‍යවතුන් වහන්සේ විසින්: "ගණභොජන යැ පරම්පරභොජන යැ අතිරිත්තභොජන යැ අනතිරිත්තභොජන යැ" යනු වදාරනලද වී නම්,

ස. පා: හවත, එකරුණින් "සඞ්ඝයා භොජන පාන ඛාදන සායන කෙරෙති" කියැයුතු මැ යි.

3. ස. පු: 'සඞ්ඝයා භොජන පාන ඛාදන සායන කෙරෙති' නො කියැයුතු ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: නනු අට්ඨපානානි වුත්තානි භගවතා: 'අම්බපානං ජම්බුපානං චොචපානං මොචපානං මධුපානං මුද්දිකපානං සාලූකපානං ඵාරුසකපානන්ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. ඨ: හඤ්චි අට්ඨපානානි වුත්තානි භගවතා: 'අම්බපානං ජම්බුපානං චොචපානං මොචපානං මධුපානං මුද්දිකපානං සාලූකපානං ඵාරුසකපානං,

ස. පා: තෙන වත රෙ වත්තබ්බෙ 'සඞ්ඝො භුඤ්ජති පිවති ඛාදති සායතී'ති.

4. ප. පු: සඞ්ඝො භුඤ්ජති පිවති ඛාදති සායතී'ති.

ස. පටිඤ්ඤා: ආමන්තා.

ප. අනු: මග්ගො භුඤ්ජති පිවති ඛාදති සායති, ඵලං භුඤ්ජති පිවති ඛාදති සායතී'ති.

ස. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

**න වත්තබ්බං සඞ්ඝො භුඤ්ජතීති කථා නිට්ඨිතා.**

ස. අනු: භාග්‍යවතුන් වහන්සේ විසින් (සඟුන් උදෙසා,) අඹපනු යැ දඹපනු යැ ඇටකෙසෙල්පනු යැ මස්කෙසෙල්පනු යැ දෑමිදිරසපනු යැ මිදිරසපනු යැ උපුල්පනු යැ බොරළුදමුනුපනු යැ යන අෂ්ටපානයෝ විදුරනලද්දහු නො?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. ඨ: ඉදින් භාග්‍යවතුන් වහන්සේ විසින්: (සඟුන්-උදෙසා) අඹපනු යැ දඹපනු යැ ඇටකෙසෙල් පනු යැ මස්කෙසෙල්පනු යැ දෑමිදිරසපනු යැ මිදිරසපනු යැ උපුල්පනු යැ බොරළුදමුනුපනු යැ යන අෂ්ටපානයෝ විදුරනලද්දහු වී නම්,

ස. පා: භවත, එකරුණින් 'සඞ්ඝයා භොජන පාන ඛාදන සායන කෙරෙති' කියැයුතු මැ යි.

4. ප. පු: 'සඞ්ඝයා භොජන පාන ඛාදන සායන කරන්නේ වේ ද?

ස. පටිඤ්ඤා: එසේ යැ.

ප අනු: මාර්ගය භොජන පාන ඛාදන සායන කෙරේ ද? ඵලය භොජන පාන ඛාදන සායන කෙරේ ද?

ස. පටි: එසේ නො කියයුතු යැ ...

න වත්තබ්බං සඞ්ඝො භුඤ්ජතීති කථා නිමි.

## 17. 9.

# න වත්තබ්බං සඞ්ඝස්ස දින්නං මහප්ඵලන්ති කථා.

1\. ස. පු: න වත්තබ්බං “සඞ්ඝස්ස දින්නං මහප්ඵල”න්ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: නනු සඞ්ඝො ආහුනෙය්‍යො පාහුනෙය්‍යො දක්ඛිණෙය්‍යො අඤ්ජලිකරණීයො අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්සා’ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. ඨ: හඤ්චි සඞ්ඝො ආහුනෙය්‍යො -පෙ- අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්ස,

ස. පා: තෙන වත රෙ වත්තබ්බෙ: “සඞ්ඝස්ස දින්නං මහප්ඵල”න්ති.

2\. ස. පු: න වත්තබ්බං ‘සඞ්ඝස්ස දින්නං මහප්ඵල’න්ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: නනු චත්තාරො පුරිසයුගා අට්ඨපුරිසපුග්ගලා දක්ඛිණෙය්‍යා වුත්තා භගවතා’ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. ඨ: හඤ්චි චත්තාරො පුරිසයුගා අට්ඨපුරිසපුග්ගලා දක්ඛිණෙය්‍යා වුත්තා භගවතා,

ස. පා: තෙන වත රෙ වත්තබ්බෙ “සඞ්ඝස්ස දින්නං මහප්ඵල”න්ති.

3\. ස. පු: න වත්තබ්බං ‘සඞ්ඝස්ස දින්නං මහප්ඵල’න්ති.

ප. පටිඤ්ඤා: අමන්තා

ස. අනු: නනු වුත්තං භගවතා “සඞ්ඝෙ ගොතමි, දෙහි, සඞ්ඝෙ තෙ දින්නෙ අහඤ්චෙව පූජිතො භවිස්සාමි, සඞ්ඝො චා”ති[1]. අත්ථෙව සුත්තන්තො’ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. පා: තෙන හි සඞ්ඝස්ස දින්නං මහප්ඵල’න්ති,

---

1\. මජ්ඣිමනිකාය - දක්ඛිණාවිභඞ්ගසුත්ත

## 17. 9.

# න වත්තබ්බං සඞ්ඝස්ස දින්නං මහප්ඵලන්ති කථා.

[“මාර්ගඵලයෝ මැ සඞ්ඝ නම් වෙති. මාර්ගඵලයනට කිසිවක් දිය නො හැක්ක. පිළිගන්නට ද නො හැක්ක. ඉන් කිසි උපකාරයෙක් මාර්ගඵලයනට නැත. එසින් මාර්ගඵලයනට දුන් දූය මහත්ඵල වෙති’ නො කියැයුතු යැ”යි වෛතුල්‍යවාදින් සෙසින් ලබ්ධි ගත්තවුන්ගේ වාද බිඳුනට ‘න වත්තබ්බං සඞ්ඝස්ස දින්නං මහප්ඵලන්ති කථා’ එයි.]

1. ස. පු: “සඟනට දුන් දූය මහත්ඵල වෙති’ නො කියැයුතු වේ ද?

ප. පරිඤ්ඤකූ: එසේ යැ.

ස. අනු: සඞ්ඝයා ආහුනනයට තිසි, පාහුනනයට තිසි, දක්ෂිණාවට තිසි, අඤ්ජලිකරණයට තිසි වූයේ ලොවට අනුත්තර පුණ්‍යක්ෂෙත්‍ර නො?

ප. පරිඤ්ඤකූ: එසේ යැ.

ස. ඨ: ඉදින් සඞ්ඝයා ආහුනනයට තිසි ... ලොවට අනුත්තර පුණ්‍යක්ෂෙත්‍ර වී නම්,

ස. පා: හවත, එකරුණින් සඟනට දුන් දූය මහත්ඵල වේ මැ යැ.

2. ස. පු: ‘සඟනට දුන් දූය මහත්ඵල වෙති’ නො කියැයුතු වේ ද?

ප. පරිඤ්ඤකූ: එසේ යැ.

ස. අනු: ‘සතර පුරුෂයුග වූ අෂ්ට ආර්යපුද්ගලයෝ දක්ෂිණාර්හයහ’යි භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරනලද නො?

ප. පරිඤ්ඤකූ: එසේ යැ.

ස. ඨ: ඉදින් ‘සතර පුරුෂයුග වූ අෂ්ට ආර්යපුද්ගලයෝ දක්ෂිණාර්හයහ’යි භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරනලද වේ නම්,

ස. පා: හවත, එකරුණින් ‘සඟනට දුන් දූය මහත්ඵල වෙති’ කියයුතු මැ යි.

3. ස. පු: ‘සඟනට දුන් දූය මහත්ඵල වෙති’ නො කියැයුතු වේ ද?

ප. පරිඤ්ඤකූ: එසේ යැ.

ස. අනු: භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරනලද මැ නු: “ගොතමිය, සඟනට දෙව, තොප විසින් සඟුන් කෙරෙහි දුන් කල්හි මම ද පුදනලදුයෙම් වෙමි, සඞ්ඝයා ද පුදනලද වේ”යයි වදාල සූත්‍රාන්තයෙක් ඇත්තේ මැ නු?

ප. පරිඤ්ඤකූ: එසේ යැ.

ස. පා: එකරුණින් සඟනට දුන් දූය මහත්ඵල වෙයි.

4 ස. පු: න වත්තබ්බං සඞ්ඝස්ස දින්නං මහප්ඵලන්ති.

ප. පටිඤ්ඤා: ආමන්තා

ස. අනු: නනු සක්කො දෙවානමින්දො භගවන්තං එතදවොච:

"යජමානානං[1] මනුස්සානං
පුඤ්ඤපෙඛාන[2] පාණිනං
කරොතං ඔපධිකං[3] පුඤ්ඤං
කත්ථ දින්නං මහප්ඵලන්ති

චත්තාරො ච පටිපන්නා
චත්තාරො ච ඵලෙ ඨිතා
එස සඞ්ඝො උජුභූතො
පඤ්ඤාසීලසමාහිතො.

යජමානානං[1] මනුස්සානං
පුඤ්ඤපෙඛාන[2] පාණිනං
කරොතං ඔපධිකං[3] පුඤ්ඤං
සඞ්ඝෙ දින්නං මහප්ඵලන්ති.[a]

එසො හි සඞ්ඝො විපුලො මහග්ගතො
එසප්පමෙය්‍යො උදධීව සාගරො
එතෙ හි සෙට්ඨා නරවීර සාවකා
පභඞ්කරා ධම්මමුදීරයන්ති.[4]

තෙසං සුදින්නං සුහුතං සුයිට්ඨං
යෙ සඞ්ඝමුද්දිස්ස දදන්ති දානං
සා දක්ඛිණා සඞ්ඝගතා පතිට්ඨිතා
මහප්ඵලා ලොකවිදූන[5] වණ්ණිතා.

එතාදිසං යඤ්ඤමනුස්සරන්තා
යෙ වෙදජාතා විහරන්ති ලොකෙ
විනෙය්‍ය මච්ඡෙරමලං සමූලං[6]
අනින්දිතා සග්ගමුපෙන්ති ඨාන"න්ති.

අත්ථෙව සුත්තන්තොති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. පා: තෙන හි සඞ්ඝස්ස දින්නං මහප්ඵලන්ති.

**න වත්තබ්බං සඞ්ඝස්ස දින්නං මහප්ඵලන්ති කථා නිට්ඨිතා**

1 යජමානං - සීමු, මජසං.
2 පුඤ්ඤපෙඛාන-සීමු,
3. ඔපචිතං - සීමු.
4. ධම්මං උදීරයන්ති - සීමු.
5. ලොකවිදූනං - සීමු,
6. සමාලං - PTS
a. සංයුත්තනිකාය - සක්ක සංයුත්ත.

4. ස. පු: 'සඟනට දුන් දෑය මහත්ඵල වේති' නො කියැයුතු වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: සක්දෙවිරජ භාග්‍යවතුන් වහන්සේට තෙල කියේ නො?

"යාග කරන මිනිසුන් විසින්, පින් ලබනු කැමැති ප්‍රාණීන් විසින්, උපධිසම්පත් පිණිස පින් කරනුවන් විසින් කොහි දෙනලද්ද මහත්ඵල වේ දැ?යි.

මගට පිළිපන්නාහු සතර දෙනෙක, ඵලයෙහි සිටියාහු සතර දෙනෙක, තෙල සඞ්ඝ තෙමේ, ඍජු වූයේ ප්‍රඥාශීල දෙකින් සමාහිත වෙයි.

යාග කරන මිනිසුන් විසින්, පින් කැමැති ප්‍රාණීන් විසින්, උපධි සම්පත් පිණිස පවත්නා පින් කරනුවන් විසින් සඟුන් කෙරෙහි දුන් දෑය මහත්ඵල වෙයි.

තෙල සඞ්ඝ තෙමේ විපුල වූයේ මහද්ගත වූයේ වෙයි. තෙල සඞ්ඝ තෙමේ උදධි සඞ්ඛ්‍යාත සාගරය සෙයින් අප්‍රමේය වෙයි. නරවීර ශ්‍රාවක වූ ලොව නැණින් එළි කරන තෙල ශ්‍රෙෂ්ඨ සඟහු දහම් වදරති.

යම් කෙනෙක් සඟුන් උදෙසා දන් දෙත් ද, ඔවුන් විසින් මොනොවට දෙන ලදි, මොනොවට පුදන ලදි, මොනොවට යාග කරන ලදී. සඞ්ඝගත වැ පිහිටි ඒ දක්ෂිණාව මහත්ඵල යයි බුදුන් විසින් වර්‍ණනා කරන ලදු.

මේ බඳු යාග සිහි කරන යම් කෙනෙක් උපන් තුෂ්ටි ඇති වැ ලොකයෙහි වාස කෙරෙත් ද, ඔහු මසුරුමල සමූල කොට උදුරාපියා අනින්දිත වැ ස්වර්ගභූමියට පැමිණෙති."යි වදාල සූත්‍රාන්තයෙක් ඇත්තේ මැ නො?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. පා: එකරුණින් සඟනට දුන් දෑය මහත්ඵල වෙයි.

න වත්තබ්බං සඞ්ඝස්ස දින්නං මහප්ඵලන්ති කථා නිමි.

## 17. 10.

# න වත්තබ්බං බුද්ධස්ස දින්නං මහප්ඵලන්ති කථා.

1. ස. පු: න වත්තබ්බං බුද්ධස්ස දින්නං මහප්ඵලන්ති.

ප. පටික්ඛෙපො: ආමන්තා.

ස. අනු: නනු භගවා ද්විපදානං[1]. අග්ගො, ද්විපදානං සෙට්ඨො, ද්විපදානං පමොක්ඛො, ද්විපදානං උත්තමො, ද්විපාදානං පවරො, අසමො අසමසමො අප්පටිසමො අප්පටිභාගො අප්පටිපුග්ගලො'ති.

ප. පටික්ඛෙපො: ආමන්තා.

ස. ඨ: හඤ්චි භගවා ද්විපදානං[1]. අග්ගො, ද්විපදානං සෙට්ඨො, ද්විපදානං පමොක්ඛො, ද්විපදානං උත්තමො, ද්විපදානං පවරො, අසමො අසමසමො අප්පටිසමො අප්පටිභාගො අප්පටිපුග්ගලො,

ස. පා: තෙන වත රෙ වත්තබ්බෙ "බුද්ධස්ස දින්නං මහප්ඵල"න්ති.

2. ස. පු: න වත්තබ්බං බුද්ධස්ස දින්නං මහප්ඵලන්ති.

ප. පටික්ඛෙපො: ආමන්තා.

ස. අනු: අත්ථි කොචි[2] බුද්ධෙන සමසමො සීලෙන සමාධිනා පඤ්ඤායා'ති.

ප. වි: නත්ථි.

ස. ඨ: හඤ්චි නත්ථි කොචි[2] බුද්ධෙන සමසමො සීලෙන සමාධිනා පඤ්ඤාය,

ස. පා: තෙන වත රෙ වත්තබ්බෙ "බුද්ධස්ස දින්නං මහප්ඵල"න්ති.

---

1. දිපදානං - PTS ප· අ,
2. කෙචි - සීමු, PTS

## 17. 10.

# න වත්තබ්බං බුද්ධස්ස දින්නං මහප්ඵලන්ති කථා.

["භාග්‍යවත් බුදුහු කිසිවක් නො වළඳති. ලෝකානුවර්තන පිණිස වළඳනුවන් සෙයින් තමන් දක්වති. දනය නිරුපකාර හෙයින් උන්වහන්සේ කෙරෙහි පුදන ලද්දේ මහත්ඵල නො වෙයි." යනුවෙන් මහා පුණ්‍යවාදීන් සෙයින් ලබ්ධි ගත්තවුන්ගේ වාද බිඳුනට 'න වත්තබ්බං බුද්ධස්ස දින්නං මහප්ඵලන්ති කථා' එයි.]

1\. ස. පු: 'බුදුන්ට දුන් දය මහත්ඵල වෙති' නො කියයුතු වේ ද?

ප. පටිඤ්ඤ: එසේ යෑ.

ස. අනු: භාග්‍යවතුන් වහන්සේ දෙපා ඇතියන් කෙරෙන් අග්‍ර නො? දෙපා ඇතියන් කෙරෙන් ශ්‍රෙෂ්ඨ නො? දෙපා ඇතියන් කෙරෙන් ප්‍රමුඛ නො? දෙපා ඇතියන් කෙරෙන් උත්තම නො? දෙපා ඇතියන් කෙරෙන් ප්‍රවර නො? අසම අසමසම අප්‍රතිසම අප්‍රතිභාග අප්‍රතිපුද්ගල නො?

ප. පටිඤ්ඤ: එසේ යෑ.

ස. ඨ: ඉදින් භාග්‍යවතුන් වහන්සේ දෙපා ඇතියන් කෙරෙන් අග්‍ර වූ නම්, දෙපා ඇතියන් කෙරෙන් ශ්‍රෙෂ්ඨ වූ නම්, දෙපා ඇතියන් කෙරෙන් ප්‍රමුඛ වූ නම්, දෙපා ඇතියන් කෙරෙන් උත්තම වූ නම්, දෙපා ඇතියන් කෙරෙන් ප්‍රවර වූ නම්, අසම අසමසම අප්‍රතිසම අප්‍රතිභාග අප්‍රතිපුද්ගල වූ නම්,

ස. පා. භවත, එකරුණින් බුදුන්ට දුන් දය මහත්ඵල වෙති' කියයුතු මැ යෑ.

2\. ස. පු: 'බුදුන්ට දුන් දය මහත්ඵල වෙති' නො කියයුතු වේ ද?

ප. පටිඤ්ඤ: එසේ යෑ.

ස. අනු: ශීලයෙන් සමාධියෙන් ප්‍රඥයෙන් බුදුරදුන් හා සමසම කිසිවෙක් ඇද්ද?

ප. වි: නැත.

ස. ඨ: ඉදින් ශීලයෙන් සමාධියෙන් ප්‍රඥයෙන් බුදුරදුන් හා සමසම කිසිවෙක් නැත් නම්,

ස. පා: භවත, එකරුණින් 'බුදුන්ට දුන් දය මහත්ඵල වෙති' කියයුතු මැ යෑ.

8\. ස. පු: න වත්තබ්බං 'බුද්ධස්ස දින්නං මහප්ඵල'න්ති

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: නනු වුත්තං භගවතා:

''නයිමස්මිං ලොකෙ පරස්මිං වා පන [1]
බුද්ධෙන සෙට්ඨො ච සමො ච විජ්ජති
යමාහුනෙය්‍යානං අග්ගතං ගතො
පුඤ්ඤත්ථිකානං විපුලඵලෙසින''න්ති.

අත්ථෙව සුත්තන්තොති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. පා: තෙන හි ''බුද්ධස්ස දින්නං මහප්ඵල''න්ති.

න වත්තබ්බං බුද්ධස්ස දින්නං මහප්ඵලන්ති කථා නිට්ඨිතා.

---

1\. පුන - සිමු.

8. ස. පු: 'බුදුන්ට දුන් දෑය මහත්ඵල වේති' නො කියැයුතු වේ ද?

ප. පටිඤ්ඤා එසේ ය.

ස. අනු: භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරනලද නො:

"විපුලඵල ඉලියන පුණ්‍යාර්ථී ජනයනට යම් සර්වඥ කෙනෙක් අන්නපානප්‍රතිග්‍රහණයට අගී වූවෝ ප්‍රතිග්‍රාහකයන් අතුරෙහි අග්‍රභාවයට ගියෝ ද, මෙලොව වවයි තදන්‍යලොකයෙක වේවයි ඒ සර්වඥයනට වඩා ශ්‍රේෂ්ඨ කෙනෙක් හෝ ඔබට සම කෙනෙක් හෝ නැතැ"යි වදාළ සූත්‍රාන්තයෙක් ඇත්තේ මැ නො?

ප. පටිඤ්ඤා: එසේ ය.

ස. පා: එකරුණින් බුදුන්ට දුන් දෑය මහත්ඵල වේ.

න වත්තබ්බං බුද්ධස්ස දින්නං මහප්ඵලන්ති කථා නිමි.

## 17. 11.

# දක්ඛිණාවිසුද්ධි කථා.

1\. ස. පු: දායකතො'ව දානං විසුජ්ඣති, නො පටිග්ගාහකතො'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: නනු අත්ථි කෙචි පටිග්ගාහකා ආහුනෙය්‍යා පාහුනෙය්‍යා දක්ඛිණෙය්‍යා අඤ්ජලිකරණීයා අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්සා'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. ඨ: හඤ්චි අත්ථි කෙචි පටිග්ගාහකා ආහුනෙය්‍යා පාහුනෙය්‍යා දක්ඛිණෙය්‍යා අඤ්ජලිකරණීයා අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්ස,

ස. පා: නො ච වත රෙ වත්තබ්බෙ "දායකතො'ව දානං විසුජ්ඣති, නො පටිග්ගාහකතො"ති

2 ස. පු: දායකතො'ව දානං විසුජ්ඣති නො පටිග්ගාහකතො'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: නනු චත්තාරො පුරිසයුගා අට්ඨපුරිසපුග්ගලා දක්ඛිණෙය්‍යා වුත්තා භගවතා'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. ඨ: හඤ්චි චත්තාරො පුරිසයුගා අට්ඨපුරිසපුග්ගලා දක්ඛිණෙය්‍යා වුත්තා භගවතා,

ස. පා: නො ච වත රෙ වත්තබ්බෙ "දායකතො'ව දානං විසුජ්ඣති, නො පටිග්ගාහකතො"ති.

## 17. 11.

# දක්ඛිණාවිසුද්ධි කථා

[“ඉදින් ප්‍රතිග්‍රාහක කෙරෙන් දක්ෂිණාවිශුද්ධි වේ නම්, මහත්ඵල වේ නම්, ‘දායකයා විසින් දන් දෙන ලද යැ, ප්‍රතිග්‍රාහකයා විසින් ඵල නිපයන ලදැ’යි අනෙකෙක් අනෙකක්හුගේ දානඵල නිපයනු වන්නේ යැ. සුඛදුඃඛ පරකෘත බවට පැමිණෙන්නේ යැ. අනෙකෙක් කම් කරන්නේ යැ. අනෙකෙක් විපාක විඳුනේ යි. එහෙයින් දායකයා කෙරෙන් මැ දානය විශුද්ධ වෙයි. ප්‍රතිග්‍රාහකයා කෙරෙන් විශුද්ධ නො වේ”යයි උත්තරාපථකයන් සෙයින් ලබ්ධි ගත්තවුන්ගේ වාද බිඳුනම ‘දක්ඛිණාවිසුද්ධිකථා’ එයි.]

1. ස. පු: දානය දායකයා කෙරෙන් මැ විශුද්ධ වේ ද? ප්‍රතිග්‍රාහකයා කෙරෙන් විශුද්ධ නො වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: ආහුනෙය්‍යට තිසි, පාහුනෙය්‍යට තිසි, දක්ෂිණාවට තිසි, අඤ්ජලිකරණයට තිසි, ලොවට අනුත්තර-පුණ්‍යක්ෂෙත්‍ර වූ කිසි ප්‍රතිග්‍රාහකයෙක් ඇත් නො?

ප. පටිඤ්ඤා එසේ යැ.

ස. ඨ: ඉදින් ආහුනෙය්‍යට තිසි පාහුනෙය්‍යට තිසි දක්ෂිණාවට තිසි අඤ්ජලිකරණයට තිසි ලොවට අනුත්තරපුණ්‍යක්ෂෙත්‍ර වූ කිසි ප්‍රතිග්‍රාහකයෙක් ඇත් නම්,

ස. පා: භවත “දායකයා කෙරෙත් මැ දානය විශුද්ධ වෙයි. ප්‍රතිග්‍රාහකයා කෙරෙත් විශුද්ධ නො වෙයි” යනු නො කියැයුතු මැ යැ.

2. ස. පු: දායකයා කෙරෙත් මැ දානය විශුද්ධ වේ ද? ප්‍රතිග්‍රාහකයා කෙරෙත් විශුද්ධ නො වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: ‘සතර පුරුෂයුග වූ අෂ්ටආර්‍ය්‍යපුද්ගලයෝ දක්ෂි-ණාර්හයහ’යි භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරන ලද නො?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. ඨ: ඉදින් ‘සතර පුරිස්යුග වූ අටඅරීපුගුල්හු දක්ෂිණාවට තිස්සහ’යි භාග්‍යවතුන් විසින් වදාරන ලද වී නම්,

ස. පා: භවත, “දායකයා කෙරෙත් මැ දානය විශුද්ධ වෙයි, ප්‍රතිග්‍රාහකයා කෙරෙත් විශුද්ධ නො වේ” යයි නො කියැයුතු මැ යැ.

3. ස පු: දායකතො’ව දානං විසුජ්ඣති, නො පටිග්ගාහකතො’ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: නනු අත්ථි කෙචි සොතාපන්නා දානං දත්වා දක්ඛිණං ආරාධෙන්තීති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. ඨ: හඤ්චි අත්ථි කෙචි සොතාපන්නා දානං දත්වා දක්ඛිණං ආරාධෙන්ති,

ස. පා: නො ච වත රෙ වත්තබ්බෙ "දායකතො’ව දානං විසුජ්ඣති, නො පටිග්ගාහකතො"ති.

ස. අනු: නනු අත්ථි කෙචි සකදාගාමිස්ස -පෙ- අනාගාමිස්ස -පෙ- අරහතො දානං දත්වා දක්ඛිණං ආරාධෙන්තී’ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. ඨ: හඤ්චි අත්ථි කෙචි අරහතො දානං දත්වා දක්ඛිණං ආරාධෙන්ති,

ස. පා: නො ච වත රෙ වත්තබ්බෙ "දායකතො’ව දානං විසුජ්ඣති. නො පටිග්ගාහකතො"ති

4. ප. පු: පටිග්ගාහකතො දානං විසුජ්ඣතීති·

ස. පටිඤ්ඤා: ආමන්තා.

ප. අනු: අඤ්ඤො අඤ්ඤස්ස කාරකො, පරකතං සුඛදුක්ඛං, අඤ්ඤො කරොති, අඤ්ඤො පටිසංවෙදෙතීති.

ස. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

ස පු: දායකතො’ව දානං විසුජ්ඣති, නො පටිග්ගාහකතො’ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

3. ස. පු: දායකයා කෙරෙන් මැ දානය විශුද්ධ වේ ද? ප්‍රතිග්‍රාහකයා කෙරෙන් විශුද්ධ නො වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: සොවන් පුඟුල් කෙරෙහි දන් දී දක්ෂිණා සපයන (අල්පමාත්‍ර දක්ෂිණායෙන්) මහත්ඵල උපයන කිසි කෙනෙක් ඇත් නො?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. ඨ: ඉදින් සොවන් පුඟුල් කෙරෙහි දන් දී දක්ෂිණා සපයන කිසි කෙනෙක් ඇත් නම්,

ස. පා: හවත, "දායකයා කෙරෙන් මැ දානය විශුද්ධ වෙයි, ප්‍රතිග්‍රාහකයා කෙරෙන් විශුද්ධ නො වෙයි" යනු නො කියැයුතු මැ යැ.

ස. අනු: සෙදගැමිහට... අනගැමිහට ... රහත්හට දන් දී දක්ෂිණා සපයන කිසි කෙනෙක් ඇත් නො?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. ඨ: ඉදින් රහත්හට දන් දී දක්ෂිණා සපයන කිසි කෙනෙක් ඇත් නම්,

ස. පා: හවත, "දායකයා කෙරෙන් මැ දානය විශුද්ධ වෙයි. ප්‍රතිග්‍රාහකයා කෙරෙන් විශුද්ධ නො වෙයි" යනු නො කියැයුතු මැ යැ.

4. ප. පු: ප්‍රතිග්‍රාහකයා කෙරෙන් දානය විශුද්ධ වේ ද?

ස. පටිඤ්ඤා: එසේ යැ.

ප. අනු: අනෙකෙක් අනෙකක්හට කාරක වේ ද? සුඛදුඃඛ පරකෘත වේ ද? අනෙකෙක් කරනුයේ අනෙකෙක් විඳුනේ වේ ද?

ස. පටි: එසේ නො කියැයුතු යැ ...

ස. පු: දායකයා කෙරෙන් මැ දානය විශුද්ධ වේ ද? ප්‍රතිග්‍රහකයා කෙරෙන් විශුද්ධ නො වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: නනු වුත්තං භගවතා: “චතස්සො ඛො ඉමා ආනන්ද, දක්ඛිණාවිසුද්ධියො, කතමා චතස්සො: අත්ථානන්ද, දක්ඛිණා දායකතො විසුජ්ඣති නො පටිග්ගාහකතො. අත්ථානන්ද දක්ඛිණා පටිග්ගා–හකතො විසුජ්ඣති නො දායකතො. අත්ථානන්ද දක්ඛිණා දායකතො චෙව විසුජ්ඣති පටිග්ගහකතො ච. අත්ථානන්ද දක්ඛිණා නෙව දායකතො විසුජ්ඣති නො පටිග්ගහකතො. ඉමා ඛො ආනන්ද, චතස්සො දක්ඛිණා විසුද්ධියො”ති[a]. අත්ථෙව සුත්තන්තොති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. පා: තෙන හි න වත්තබ්බං “දායකතො’ව දානං විසුජ්ඣති නො පටිග්ගාහකතො”ති.

දක්ඛිණාවිසුද්ධිකථා නිට්ඨිතා.

සත්තරසමො වග්ගො නිට්ඨිතො.

තස්සුද්දානං :

“අත්ථි අරහතො පුඤ්ඤූපචයො, නත්ථි අරහතො අකාලමච්චු, සබ්බමිදං කම්මතො, ඉන්ද්‍රියබද්ධඤ්ඤෙව දුක්ඛං, ඨපෙත්වාරියමග්ගං අවසෙසා සඞ්ඛාරා දුක්ඛා, සඞ්ඝො දක්ඛිණං පතිගණ්හාති, සඞ්ඝො දක්ඛිණං විසොධෙති, සඞ්ඝො භුඤ්ජති පිවති ඛාදති සායති, සඞ්ඝස්ස දින්නං මහප්ඵලං, න වත්තබ්බං බුද්ධස්ස දින්නං මහප්ඵලං, අත්ථිදානං විසුද්ධියා”ති.

[a] මජ්ඣිමනිකාය - දක්ඛිණාවිභඞ්ග සූත්ත.

ස. අනු: භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරනලද නො: "ආනන්දය, මේ දක්ෂිණා විශුද්ධීහු සතර දෙනෙක. කවර සතර දෙනෙක යත්: ආනන්දය, දායකයා කෙරෙත් විශුද්ධ වන ප්‍රතිග්‍රාහකයා කෙරෙත් විශුද්ධ නො වන දක්ෂිණායෙක් ඇත. ආනන්දය, ප්‍රතිග්‍රාහකයා කෙරෙත් විශුද්ධ වන දායකයා කෙරෙත් විශුද්ධ නො වන දක්ෂිණායෙක් ඇත. ආනන්දය, දායකයා කෙරෙහුදු ප්‍රතිග්‍රාහකයා කෙරෙහුදු විශුද්ධ වන දක්ෂිණායෙක් ඇත. ආනන්දය, දායකයා කෙරෙහුදු විශුද්ධ නො වන ප්‍රතිග්‍රාහකයා කෙරෙහුදු විශුද්ධ නො වන දක්ෂිණායෙක් ඇති. ආනන්දය, මොහු සතර දක්ෂිණාවිශුද්ධිහු වෙති"යි වදාළ සූත්‍රාන්තයෙක් ඇත්තේ මැ නු?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. පා: එකරුණින් "දායකයා කෙරෙත් මැ දානය විශුද්ධ වෙයි, ප්‍රතිග්‍රාහකයා කෙරෙත් විශුද්ධ නො වෙයි" යනු නො කියැයුතු මැ යැ.

දක්ෂිණාවිශුද්ධිකථා නිමි.

සතළොස් වැනි වග නිමි.

එහි උද්දානය:

අත්ථි අරහතො පුඤ්ඤූපචයොති කථා යැ, නත්ථි අරහතො අකාලමච්චූති කථා යැ, සබ්බමිදං කම්මතොති කථා යැ, ඉන්ද්‍රියබද්ධකථා යැ, ඨපෙත්වා අරියමග්ගන්ති කථා යැ, න වත්තබ්බං සඞ්ඝො දක්ඛිණං පතිගණ්හාතීති කථා යැ, න වත්තබ්බං සඞ්ඝො දක්ඛිණං විසොධෙතීති කථා යැ, න වත්තබ්බං සඞ්ඝො භුඤ්ජතීති කථා යැ, න වත්තබ්බං සඞ්ඝස්ස දින්නං මහප්ඵලන්ති කථා යැ, න වත්තබ්බං බුද්ධස්ස දින්නං මහප්ඵලන්ති කථා යැ, දක්ඛිණාවිසුද්ධිකථා යි.

# අට්ඨාරසමො වග්ගො.

## 18. 1.

## මනුස්සලොක කථා.

1. ස. පු: න වත්තබ්බං බුද්ධො භගවා මනුස්සලොකෙ අට්ඨාසී'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: නනු අත්ථි බුද්ධවුත්ථානි චෙතියානි ආරාමවිහාර-ගාමනිගමනගරානි රට්ඨානි ජනපදානී'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. ඨ: හඤ්චි අත්ථි බුද්ධවුත්ථානි චෙතියානි ආරමවිහාර-ගාමනිගමනගරානි රට්ඨානි ජනපදානි,

ස. පා: තෙන වත රෙ වත්තබ්බෙ "බුද්ධො භගවා මනුස්සලොකෙ අට්ඨාසී"ති.

2 ස. පු: න වත්තබ්බං "බුද්ධො භගවා මනුස්සලොකෙ අට්ඨාසී"ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: නනු භගවා ලුම්බිනියං ජාතො, බොධියා මූලෙ අභිසම්බුද්ධො, බාරාණසියං භගවතා ධම්මචක්කං පවත්තිතං, චාපාලෙ චෙතියෙ ආයුසඞ්ඛාරො ඔස්සට්ඨො, කුසිනාරායං භගවා පරිනිබ්බුතො'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. ඨ: හඤ්චි භගවා ලුම්බිනියා ජාතො -පෙ- කුසිනාරායං භගවා පරිනිබ්බුතො,

ස. පා: තෙන වත රෙ වත්තබ්බෙ "බුද්ධො භගවා මනුස්ස-ලොකෙ අට්ඨාසී"ති.

3. ස. පු: න වත්තබ්බං "බුද්ධො භගවා මනුස්සලොකෙ අට්ඨාසී"ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

# අෂ්ටාදශ වර්ගය.

## 18. 1.

## මනුස්සලොක කථා.

[වෛතුල්‍යවාදීහු අප බුදුහු තුසී දෙව්ලොව උපන්නාහු එහි මැ වසන්නාහු වත් මුත් මිනිස්ලොවට නො එන්නාහ'යි ද, නිර්මිතරූපමාත්‍රය මෙලොව දක්වන්නාහ'යි ද ලබ්ධි ගත්හ. උන්ගේ වාද බිඳුනට 'මනුස්සලොකකථා' එයි.]

1. ස. පු: 'භාග්‍යවත් බුදුරජහු මිනිස්ලොව සිටියහ'යි නො කියැයුතු වේ ද?

ප පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: බුදුන් වුසූ චෛත්‍යයෝ ආරාම විහාර ග්‍රාමනිගම-නගරයෝ රාෂ්ට්‍රයෝ ජනපදයෝ ඇත්තාහු නො වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. ඨ: ඉදින් බුදුන් වුසූ චෛත්‍ය ආරාම විහාර ග්‍රාම නිගම නගර රාෂ්ට්‍ර ජනපද ඇත් නම්,

ස. පා: හවත, එකරුණින් 'භාග්‍යවත් බුදුහු මිනිස්ලොව සිටියහ'යි කියැයුතු මැ යැ.

2 ස. පු: භාග්‍යවත් බුදුහු මිනිස්ලොව සිටියහ'යි නො කියැයුතු වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: බුදුහු ලුම්බිනි සල්වෙනෙහි උපන්නාහු නො වේ ද? බොධිමූලයෙහි අභිසම්බුද්ධ වූවාහු නො වේ ද, බරණැස දී බුදුන් විසින් දම්සක් පවත්-වන ලද නො වේ ද, චාපාල චෛත්‍යයෙහි දී ආයුසංස්කාර හරනලද නො වේ ද, බුදුහු කුසිනාරායෙහි දී පිරිනිවියාහු නො වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. ඨ: ඉදින් බුදුහු ලුම්බිනියෙහි උපන්නාහු නම් .. බුදුහු කුසිනාරායෙහි පිරිනිවියාහු නම්,

ස. පා හවත, එකරුණින් 'භාග්‍යවත් බුදුහු මිනිස්ලොව සිටියහ'යි කියැයුතු මැ යැ.

3. ස. පු: 'භාග්‍යවත් බුදුහු මිනිස්ලොව සිටියහ'යි නො කියැයුතු වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: නනු වුත්තං භගවතා "එකමිදාහං භික්ඛවෙ සමයං උක්කට්ඨායං විහරාමි සුභගවනෙ සාලරාජමූලෙ"ති[a] "එකමිදාහං භික්ඛවෙ සමයං උරුවෙලායං විහරාමි අජපාලෙ නිග්‍රොධෙ පඨමාභිසම්බුද්ධො"ති.[b] "එකමිදාහං භික්ඛවෙ සමයං රාජගහෙ විහරාමි වෙළුවනෙ කලන්දකනිවාපෙ"ති. "එකමිදාහං භික්ඛවෙ සමයං සාවත්ථියං විහරාමි ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ"ති. "එකමිදාහං භික්ඛවෙ සමයං වෙසාලියං විහරාමි මහාවනෙ කූටාගාරසාලාය"ති අත්ථෙව සුත්තන්තො'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. පා: තෙන හි බුද්ධො භගවා මනුස්සලොකෙ අට්ඨාසී'ති.

4. ප. පු: භගවා මනුස්සලොකෙ අට්ඨාසී'ති.

ස. පටිඤ්ඤා: ආමන්තා.

ප. අනු: නනු භගවා ලොකෙ ජාතො ලොකෙ සංවද්ධො[1] ලොකං අභිභුය්‍ය විහරති අනුපලිත්තො ලොකෙනා'ති.

ස. පටිඤ්ඤා: ආමන්තා.

ප. ඨ: හඤ්චි භගවා ලොකෙ ජාතො ලොකෙ සංවද්ධො[1] ලොකං අභිභුය්‍ය විහරති අනුපලිත්තො ලොකෙන,

ප. පා: තෙන වත රෙ වත්තබ්බෙ "බුද්ධො භගවා මනුස්සලොකෙ අට්ඨාසී"ති.

මනුස්සලොක කථා නිට්ඨිතා.

---

a දීඝනිකාය මහාවග්ග - මහාපදානසුත්ත.
b අඞ්ගුත්තර උරුවෙලවග්ග - පඨම උරුවෙලසුත්ත.
1 සම්බුද්ධො - සිමු.

ස. අනු: "මහණෙනි, මම එක් කලෙක උක්කට්ඨා නුවර සුභගවනයෙහි සාලරාජමූලයෙහි වාස කෙරෙමි"යි කියා ද "මහණෙනි, මම එක් කලෙක අභිසම්බුද්ධ වැ පළමු කොට උරුවෙල් දනව්යෙහි අජපල් නුගරුක් මුල වාස කෙරෙමි"යි කියා ද, "මහණෙනි, මම එක් කලෙක රජගහ නුවර වේළුවනයෙහි කලන්දක නිවාප නම් ආරාමයෙහි වාස කෙරෙමි"යි කියා ද, "මහණෙනි, මම එක් කලෙක සැවැත් නුවර ජේතවන නම් වූ අනේපිඬු සිටුහුගේ අරමැයි වාස කෙරෙමි"යි කියා ද, "මහණෙනි, මම එක් කලෙක විසාලා මහනුවර මහාවනයෙහි කූටාගාරශාලායෙහි වාස කෙරෙමි"යි කියා ද බුදුන් විසින් වදාරනලද සූත්‍රාන්ත ඇත් මැ නු?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. පා: එකරුණින් 'භාග්‍යවත් බුදුහු මිනිස්ලොව සිටියහු'යි.

4. ප. පු: භාග්‍යවත් බුදුහු මිනිස්ලොව සිටියාහු වේ ද?

ස. පටිඤ්ඤා: එසේ යැ.

ප. අනු: බුදුහු ලොකයෙහි ජාත වැ, ලොකයෙහි සංවර්ධිත වැ, ලොකය අභිභවා, ලොකය හා අනුපලිප්ත වැ, වාස කරන්නාහු නො වේ ද?

ස. පටිඤ්ඤා: එසේ යැ.

ප. ඨ: ඉදින් බුදුහු ලොකයෙහි ජාත වැ, ලොකයෙහි සංවර්ධිත වැ, ලොකය අභිභවා, ලොකය හා අනුපලිප්ත වැ, වාස කරන්නාහු වේ නම්,

ප. පා: හවත, 'භාග්‍යවත් බුදුහු මිනිස්ලොව සිටියහ'යි නො කියැයුතු මැ වෙයි.

මනුස්සලෝක කථා නිමි.

18. 2.

# ධම්මදෙසනා කථා.

1 ස. පු: න වත්තබ්බං "බුද්ධෙන භගවතා ධම්මො දෙසිතො"ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. පු: කෙන දෙසිතො'ති.

ප. වි: අභිනිම්මිතෙන දෙසිතො'ති.

ස. අනු: අභිනිම්මිතො ජිනො සත්ථා සම්මාසම්බුද්ධො සබ්බඤ්ඤූ සබ්බදස්සාවී ධම්මස්සාමී ධම්මපටිසරණො'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

2. ස. පු: න වත්තබ්බං "බුද්ධෙන භගවතා ධම්මො දෙසිතො"ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. පු: කෙන දෙසිතො'ති.

ප. වි: ආයස්මතා ආනන්දෙන දෙසිතො'ති.

ස. අනු: ආයස්මා ආනන්දො ජිනො සත්ථා සම්මාසම්බුද්ධො සබ්බඤ්ඤූ සබ්බදස්සාවී ධම්මස්සාමී ධම්මපටිසරණො"ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

3. ස. පු: න වත්තබ්බං "බුද්ධෙන භගවතා ධම්මො දෙසිතො"ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: නනු වුත්තං භගවතා "සංඛිත්තෙන'පි ඛො අහං සාරිපුත්ත ධම්මං දෙසෙය්‍යං, විත්ථාරෙන'පි ඛො අහං සාරිපුත්ත ධම්මං දෙසෙය්‍යං, සංඛිත්තවිත්ථාරෙන'පි ඛො අහං සාරිපුත්ත ධම්මං දෙසෙය්‍යං. අඤ්ඤාතාරො ච දුල්ලභා"ති [a] අත්ථෙ'ව සුත්තන්තො'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. පා: තෙන හි "බුද්ධෙන භගවතා ධම්මො දෙසිතො"ති.

---

a තිකඞ්ගුත්තර - දෙවදූතවග්ග.

## 18. 2.

# ධම්මදේසනා කථා.

**[“තුසීපුර වැඩවසන කරන භාග්‍යවත් බුදුහු දහම් දෙසන පිණිස නිර්මිත බුදුන් මිනිස්ලොවට එවූසේක. ආයුෂමත් අනඳ තෙරණුවන් විසින් ඔබගේ දහම පිළිගෙන මිනිස්ලොව දෙසනලදි. භාග්‍යවත් බුදුන් විසින් දහම් දෙසනලද නො වේ”යයි වෛතුල්‍යවාදීන් සෙයින් ලබ්ධි ගත්තවුන්ගේ වාද බිඳුනට ‘ධම්මදෙසනාකථා’ එයි.]**

| | |
|---|---|
| 1 ස. පු: | ‘භාග්‍යවත් බුදුන් විසින් දහම් දෙසනලද්ද’යි නො කියයුතු වේ ද? |
| ප. පටිඤ්ඤ. | එසේ යැ. |
| ස. පු: | කවරක්හු විසින් දෙසනලද වේ ද? |
| ප. වි: | නිර්මිත බුදුන් විසින් දෙසනලද වෙයි. |
| ස. අනු: | නිර්මිත බුදුහු ජින, ශාස්තෘ, සම්‍යක්සම්බුද්ධ, සර්වඥ, සර්වදර්ශී, ධර්මස්වාමී, ධර්මප්‍රතිසරණ වේ ද? |
| ප. පටි: | එසේ නො කියයුතු යැ ... |
| 2. ස. පු: | භාග්‍යවත් බුදුන් විසින් දහම් දෙසනලද්ද’යි නො කියයුතු වේ ද? |
| ප. පටිඤ්ඤ: | එසේ යැ. |
| ස. පු: | කවරක්හු විසින් දේසිත වේ ද? |
| ප. වි: | ආයුෂමත් අනඳ තෙරුන් විසින් දෙසිත වෙයි. |
| ස. අනු: | ආයුෂමත් අනඳ තෙරණුවෝ ජින, ශාස්තෘ, සම්‍යක්සම්බුද්ධ, සර්වඥ, සර්වදර්ශී, ධර්මස්වාමී, ධර්මප්‍රතිසරණ වේ ද? |
| ප. පටි: | එසේ නො කියයුතු යැ ... |
| 3. ස. පු: | ‘භාග්‍යවත් බුදුන් විසින් ධර්මය දෙශිත යැ’යි නො කියයුතු වේ ද? |
| ප. පටිඤ්ඤ: | එසේ යැ |
| ස. අනු: | භාග්‍යවතුන් විසින් වදාරනලද මැ නො: “ශාරිපුත්‍රය, මම සැකෙවිනිදු දහම් දෙසන්නෙමි, ශාරිපුත්‍රය, මම විතරිනුදු දහම් දෙසන්නෙමි, ශාරිපුත්‍රය, මම සකෙව්විතරිනුදු දහම් දෙසන්නෙමි. එතෙකුදු-වුවත් වටහනුවෝ දුර්ලභයහ”යි වදළ සූත්‍රාන්ත-යෙක් ඇත්තේ මැ නො? |
| ප. පටිඤ්ඤ: | එසේ යැ. |
| ස පා: | එකරුණින් ‘භාග්‍යවත් බුදුන් විසින් ධර්මය දේශිත වෙයි. |

4. ස. පු: න වත්තබ්බං “බුද්ධෙන භගවතා ධම්මො දෙසිතො”ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: නනු වුත්තං භගවතා “අභිඤ්ඤායාහං භික්ඛවෙ ධම්මං දෙසෙමි නො අනභිඤ්ඤාය. සනිදානාහං භික්ඛවෙ ධම්මං දෙසෙමි නො අනිදානං. සප්පාටිහාරියාහං භික්ඛවෙ ධම්මං දෙසෙමි නො අප්පාටිහාරියං. තස්ස[1] මය්හං භික්ඛවෙ අභිඤ්ඤාය ධම්මං දෙසයතො නො අනභිඤ්ඤාය, සනිදානං ධම්මං දෙසයතො නො අනිදානං, සප්පාටිහාරියං ධම්මං දෙසයතො නො අප්පාටිහාරියං, කරණීයො ඔවාදො, කරණීයා අනුසාසනී. අලඤ්ච පන වො භික්ඛවෙ තුට්ඨියා, අලං අත්තමනතාය, අලං සොමනස්සාය, ‘සම්මාසම්බුද්ධො භගවා, ස්වාක්ඛාතො[2] ධම්මො, සුපටිපන්නො[3] සඞ්ඝො’ති. ඉමස්මිඤ්ච පන වෙය්‍යාකරණස්මිං භඤ්ඤමානෙ දසසහස්සීලොකධාතු අකම්පිත්ථා’ති.[a] අත්ථෙව සුත්තන්තො’ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. පා: තෙන හි “බුද්ධෙන භගවතා ධම්මො දෙසිතො”ති

ධම්මදෙසනාකථා නිට්ඨිතා.

1 යස්මිස්ස - සිමු PTS
2. ස්වාඛ්‍යාතො - සිමු
3 සුප්පටිපන්නො - සිමු, මජසං.
a තිකඞ්ගුත්තර - භරණ්ඩුවග්ග

4. ස. පු: 'භාග්‍යවත් බුදුන් විසින් ධර්මය දේශිත වෙති' නො කියයුතු වේ ද?

ප. පරිසකය: එසේ යැ.

ස. අනු: භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරනලද මැ නො:

"මහණෙනි, මම අභිඥ පිණිස දහම් දෙසමි. අනභිඥ පිණිස නො දෙසමි. මහණෙනි, මම නිදාන සහිත කොට දහම් දෙසමි. නිදාන රහිත කොට නො දෙසමි. මහණෙනි, මම නෛර්‍යාණික කොට දහම් දෙසමි. අනෛර්‍යාණික කොට දහම් නො දෙසමි. මහණෙනි, අනභිඥ පිණිස නො වැ අභිඥ පිණිස දහම් දෙසන, අනිදාන කොට නො වැ සනිදාන කොට දහම් දෙසන, අනෛර්‍යාණික කොට නො වැ නෛර්‍යාණික කොට දහම් දෙසන මා විසින් අවවාද කටයුතු වෙයි. අනුශාසනා කටයුතු වෙයි. තවද මහණෙනි, තොපටත් 'බුදුහු සම්‍යක්සම්බුද්ධයහ, ධර්මය ස්වාඛ්‍යාත යැ, සඞ්ඝයා සුප්‍රතිපන්න යැ'යි තුෂ්ටියට නිස්සැ. සිය මනවඩනට නිස්සැ. සොම්නසට නිස්සැ. මේ වෛයාකරණ බණනුලබන කල්හි දශසහස්‍රිලෝක-ධාතුව වෙවුලී" යයි වදාළ සූත්‍රාන්තයෙක් ඇත්තේ මැ නො?

ප. පරිසකය: එසේ යැ.

ස. පා: එකරුණින් 'භාග්‍යවත් බුදුන් විසින් දහම් දෙසනලද. වෙයි.

ධම්මදේශනා කථා නිමි.

## 18. 3.

# කරුණා කථා.

1. ස. පු: නත්ථි "බුද්ධස්ස භගවතො කරුණා"ති.
ප. පටිඤ්ඤා: ආමන්තා.
ස අනු: නත්ථි "බුද්ධස්ස භගවතො මෙත්තා"ති.
ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

2 ස. පු: නත්ථි "බුද්ධස්ස භගවතො කරුණා"ති.
ප. පටිඤ්ඤා: ආමන්තා.
ස. අනු නත්ථි බුද්ධස්ස භගවතො මුදිතා -පෙ- උපෙක්ඛා'ති.
ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

3. ස. පු: අත්ථි බුද්ධස්ස භගවතො මෙත්තා'ති.
ප. පටිඤ්ඤා: ආමන්තා.
ස. අනු: අත්ථි බුද්ධස්ස භගවතො කරුණාති.
ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

4. ස. පු: අත්ථි බුද්ධස්ස භගවතො මුදිතා -පෙ- උපෙක්ඛා'ති.
ප. පටිඤ්ඤා. ආමන්තා
ස. අනු: අත්ථි බුද්ධස්ස භගවතො කරුණා'ති.
ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

5. ස. පු: නත්ථි බුද්ධස්ස භගවතො කරුණා'ති.
ප. පටිඤ්ඤා: ආමන්තා.
ස. අනු: "භගවා අකාරුණිකො'ති.
ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-
ස අනු: නනු භගවා කාරුණිකො ලොකහිතො ලොකානුකම්පකො ලොකත්ථචරො'ති.
ප. පටිඤ්ඤා: ආමන්තා.

18 3.

## කරුණා කථා.

[“ප්‍රිය වස්තූන්ගේ විපත්හි සරාගපුද්ගලයන්ගේ රාග වශයෙන් කරුණාප්‍රතිරූපක ප්‍රවෘත්ති දක රාගය මැ කරුණා නම් වෙයි. එ ද භාග්‍යවතුන් වහන්සේට නැත. එයින් භාග්‍යවත් බුදුන්ට කරුණා නැතැ”යි උත්තරාපථකයන් සෙයින් ලබ්ධි ගත්තවුන් ගේ වාද බිඳුනට ‘කරුණාකථා’ එයි]

1. ස. පු: භාග්‍යවත් බුදුන්ට ‘කරුණා’ නැද්ද?

ප. පටිසඛ්‍යා: එසේය.

ස. අනු: භාග්‍යවත් බුදුන්ට ‘මෛත්‍රී’ නැද්ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

2. ස. පු: භාග්‍යවත් බුදුන්ට ‘කරුණා’ නැද්ද?

ප. පටිසඛ්‍යා: එසේ යැ.

ස. අනු: භාග්‍යවත් බුදුන්ට ‘මුදිතා ... උපෙක්ෂා’ නැද්ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

3. ස. පු: භාග්‍යවත් බුදුන්ට ‘මෛත්‍රී’ ඇද්ද?

ප පටිසඛ්‍යා: එසේ යැ.

ස. අනු: භාග්‍යවත් බුදුන්ට ‘කරුණා’ ඇද්ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

4. ස. පු: භාග්‍යවත් බුදුන්ට ‘මුදිතා ... උපෙක්ෂා’ ඇද්ද?

ප. පටිසඛ්‍යා: එසේ යැ.

ස. අනු: භාග්‍යවත් බුදුන්ට ‘කරුණා’ ඇද්ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

5 ස. පු: භාග්‍යවත් බුදුන්ට ‘කරුණා’ නැද්ද?

ප. පටිසඛ්‍යා: එසේ යැ.

ස. අනු: භාග්‍යවත්හු අකාරුණික වෙත් ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

ස. අනු: භාග්‍යවත්හු කාරුණික වූවාහු ලොවට හිත වූවාහු ලොවට අනුකම්පා ඇත්තාහු ලොවට වැඩ කරන්නාහු නො?

ප. පටිසඛ්‍යා: එසේ යැ.

ස. ථ: හඤ්චි භගවා කාරුණිකො ලොකහිතො ලොකානුකම්පකො ලොකත්ථචරො,

ස. පා: නො ච වත රෙ වත්තබ්බෙ 'නත්ථි බුද්ධස්ස භගවතො කරුණා'ති.

6. ස. පු: නත්ථි බුද්ධස්ස භගවතො කරුණා'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: නනු භගවා මහාකරුණාසමාපත්තිං සමාපජ්ජී'ති

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. ඨ: හඤ්චි භගවා මහාකරුණාසමාපත්තිං සමාපජ්ජි,

ස. පා: නො ච වත රෙ වත්තබ්බෙ, 'නත්ථි බුද්ධස්ස භගවතො කරුණා'ති.

7. ප. පු: අත්ථි බුද්ධස්ස භගවතො කරුණා'ති.

ස. පටිඤ්ඤා: ආමන්තා.

ප. අනු: භගවා සරාගො'ති.

ස පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

ප. පා: තෙන හි 'නත්ථි බුද්ධස්ස භගවතො කරුණා'ති.

කරුණා කථා නිට්ඨිතා.

| | |
|---|---|
| ස. ඨ: | ඉදින් භාග්‍යවත්හු කාරුණික වූවාහු ලොවට හිත වූවාහු ලොවට අනුකම්පා ඇත්තාහු ලොවට වැඩ කරන්නාහු නම්, |
| ස. පා: | භවත, 'භාග්‍යවත් බුදුන්ට කරුණා නැතැ'යි නො කියැයුතු මැ යැ. |

| | |
|---|---|
| 6. ස. පු: | භාග්‍යවත් බුදුන්ට 'කරුණා' නැද්ද? |
| ප. පටිඤ්ඤා: | එසේ යැ. |
| ස. අනු: | භාග්‍යවත්හු මහකුලුණු සමවත් සමවත්හු නො? |
| ප. පටිඤ්ඤා: | එසේ යැ. |
| ස. ඨ: | ඉදින් භාග්‍යවත්හු මහකුලුණු සමවත් සමවත්හු නම්, |
| ස. පා: | භවත, භාග්‍යවත් බුදුන්ට කරුණා නැතැ'යි නො කියැයුතු මැ යැ. |

| | |
|---|---|
| 7. ප. පු: | භාග්‍යවත් බුදුන්ට කරුණා ඇද්ද? |
| ස. පටිඤ්ඤා: | එසේ යැ. |
| ප. අනු: | බුදුහු සරාග වෙත් ද? |
| ස. පටි: | එසේ නො කියැයුතු යැ ... |
| ප. පා: | එකරුණින් 'භාග්‍යවත් බුදුන්ට කරුණා නැති'. |

**කරුණා කථා නිමි.**

## 18 4.

# ගන්ධජාතකථා.

1. ස. පු: බුද්ධස්ස භගවතො උච්චාරපස්සාවො අතිවිය අඤ්ඤෙ ගන්ධජාතෙ අධිගණ්හාතී'ති [1]

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: භගවා ගන්ධභොජී'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

ස. අනු: නනු භගවා ඔදනකුම්මාසං භුඤ්ජතී'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා

ස. ඨ: හඤ්චි භගවා ඔදනකුම්මාසං භුඤ්ජති,

ස. පා: නො ච වත රෙ වත්තබ්බෙ "බුද්ධස්ස භගවතො උච්චාරපස්සාවො අතිවිය අඤ්ඤෙ ගන්ධජාතෙ අධිගණ්හාතී'ති.

2. ස. පු: බුද්ධස්ස භගවතො උච්චාරපස්සාවො අතිවිය අඤ්ඤෙ ගන්ධජාතෙ අධිගණ්හාතී'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: අත්ථි කෙචි බුද්ධස්ස භගවතො උච්චාරපස්සාවං නහායන්ති. [2] විලිම්පෙන්ති [3] උච්ඡාදෙන්ති. [4] පෙළාය පටිසාමෙන්ති. කරණ්ඩාය නික්ඛිපෙන්ති. [5] ආපණෙ පසාරෙන්ති. [6] තෙන ච ගන්ධෙන ගන්ධකරණීයං කරොන්තී'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

ගන්ධජාත කථා නිට්ඨිතා.

---

1 අධිගගණ්හාති - මජසං,
2. නහායන්ති - මජසං,
3 විලිම්පන්ති - මජසං,
4. උච්චාරෙන්ති - සිමු, PTS.
5. නික්ඛිපන්ති - මජසං.
6. පසාරෙන්ති - සිමු.

## 18. 4.

# ගන්ධජාත කථා.

[භාග්‍යවත් බුදුන් කෙරෙහි නුනුවණින් ගත් ප්‍රෙම වශයෙන් භාග්‍යවතුන්ගේ මලමූ අන්‍ය ගන්ධජාතයනට වඩා සුගන්ධතර යයි අන්ධක උත්තරාපථකනිකායවාසීන් සෙයින් ලබ්ධි ගත්තවුන්ගේ වාද බිඳුනට ‘ගන්ධජාතකථා’ එයි ]

1. ස. පු: භාග්‍යවත් බුදුන්ගේ මලමූ අතිශයින් අන්‍ය ගන්ධ–ජාතයන් මැඩගෙන සිටුනේ වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: භාග්‍යවතුන් වහන්සේ සුවඳදූය මැ වළඳනසේක් වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

ස. අනු: භාග්‍යවතුන් වහන්සේ බත් කොමු වළඳනසේක් නො ?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. ඨ: ඉදින් භාග්‍යවතුන් වහන්සේ බත් කොමු වළඳන සේක් නම්,

ස. පා: හවත, ‘භාග්‍යවත් බුදුන්ගේ මලමූ අතිශයින් අන්‍ය ගන්ධජාතයන් මැඩගෙන සිටුනේ වේ’යයි නො කියැයුතු මැ යැ.

2. ස. පු: භාග්‍යවත් බුදුන්ගේ මලමූ අතිශයින් අන්‍ය ගන්ධ–ජාතයන් මැඩගෙන සිටුනේ වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: භාග්‍යවත් බුදුන්ගේ මලමූ ස්නානය කරන, විලෙ–වුන් කොට ගන්නා, උච්ඡාදන කරන, මඤ්ජුසායෙහි ගොපනය කරන, කරඬුයෙහි බහාලන, අවන්හල්හි සුවඳදූ සේ එළවා තබන කිසි කෙනෙක් ඇද්ද? එ ගඳිනුදු ගඳකරණී කෙරෙත් ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ. ....

ගන්ධජාත කථා නිමි.

## 18. 5.

# එකමග්ග කථා

1\. ස. පු: එකෙන අරියමග්ගෙන චත්තාරි සාමඤ්ඤඵලානි සච්ඡිකරොතී'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: චතුන්නං ඵස්සානං -පෙ- චතුන්නං සඤ්ඤානං සමොධානං හොතී'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

2\. ස. පු: එකෙන අරියමග්ගෙන චත්තාරි සාමඤ්ඤඵලානි සච්ඡිකරොතී'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: සොතාපත්තිමග්ගෙනාති.[1]

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

ස. අනු: සකදාගාමි -පෙ- අනාගාමිමග්ගෙනාති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

ස. පු: කතමෙන මග්ගෙනාති

ප. පි: අරහත්තමග්ගෙනා'ති.

ස. අනු: අරහත්තමග්ගෙන සක්කායදිට්ඨිං විචිකිච්ඡං සීලබ්බතපරාමාසං ජහතී'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

3 ස. පු: අරහත්තමග්ගෙන සක්කායදිට්ඨිං විචිකිච්ඡං සීලබ්බතපරාමාසං ජහතී'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: නනු තිණ්ණං සඤ්ඤොජනානං පහානං සොතාපත්තිඵලං වුත්තං භගවතා'ති.

ප. පටි: ආමන්තා.

ස. ඨ: හඤ්චි තිණ්ණං සඤ්ඤොජනානං පහානං සොතාපත්තිඵලං වුත්තං භගවතා,

ස පා: නො ච වත රෙ වත්තබ්බෙ අරහත්තමග්ගෙන සක්කායදිට්ඨිං විචිකිච්ඡං සීලබ්බතපරාමාසං ජහතීති.

---

[1] මග්ගෙනාති - PTS

18. 5.

## එකමග්ග කථා

[“බුදුරදහු සෝවන් වැ සෙදගැමි මඟත් සෙදගැමි වැ අනාගැමි මඟත් අනාගැමි වැ රහත්මඟත් පසක් කළහ. එක් මැ රහත්මඟින් සතර ඵලයන් පසක් කළහ”යි බුදුන් කෙරෙහි නුනුවණින් කළ ප්‍රේම වශයෙන් අන්ධක උත්තරාපථක නිකායවාසීන් සෙයින් ලබ්ධි ගත්තවුන්ගේ වාද බිඳුනට ‘එකමග්ගකථා’ එයි.]

1. ස. පු: එක් ආයසීමාගීයෙන් සතර ශ්‍රාමණ්‍යඵලයන් පසක් කරන්නේ වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස අනු: සපගීයන් සතර දෙනකුන්ගේ සංඥවන් සතර දෙනකුන්ගේ සමවධාන වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

2. ස. පු: එක් අරිමඟින් සතර ශ්‍රාමණ්‍යඵලයන් පසක් කරන්නේ වේ ද?

ප පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු සොවත් මඟින් වේ ද?

ප. පටි: එසේ නො කියැ යුතු යැ...

ස අනු: සෙදගැමි ... අනාගැමිමඟින් වේ ද?

ප. පටි. එසේ නො කියැයුතු යැ ...

ස. පු: කවර මඟෙකින් (පසක් කරන්නේ) වේ ද?

ප. වි: රහත්මඟිනි.

ස. අනු: රහත්මඟින් සත්කායදෘෂ්ටිය විචිකිත්සාව ශීලව්‍රතපරාමර්ශය දුරු කරන්නේ වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

3. ස. පු: රහත්මඟින් සත්කායදෘෂ්ටිය විචිකිත්සාව ශීලව්‍රතපරාමර්ශය දුරු කරන්නේ වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: ‘තුන් සංයොජනයන්ගේ ප්‍රහාණය සොවත්ඵල යැ’යි භාග්‍යවතුන් විසින් වදරනලද නො?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. ඨ: ඉදින් ‘තුන් සංයොජනයන්ගේ ප්‍රහාණය සොවත්ඵල වෙති’ භාග්‍යවතුන් විසින් වදරනලද වී නම්,

ස. පා: භවත, ‘රහත්මඟින් සත්කායදෘෂ්ටිය විචිකිත්සාව ශීලව්‍රතපරාමර්ශය දුරු කෙරෙති’ නො කියැයුතු මැ යැ.

4. ස. පු: අරහත්තමග්ගෙන ඔළාරිකං කාමරාගං ඔළාරිකං බ්‍යාපාදං ජහතී'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

ස. පු: අරහත්තමග්ගෙන ඔළාරිකං කාමරාගං ඔළාරිකං බ්‍යාපාදං ජහතී'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: නනු කාමරාගබ්‍යාපාදානං තනුභාවං සකදාගාමි-ඵලං වුත්තං භගවතා'ති.

ප. පටිඤ්ඤා ආමන්තා.

ස. ඨ: හඤ්චි කාමරාගබ්‍යාපාදානං තනුභාවං සකදාගාමි-ඵලං වුත්තං භගවතා,

ස. පා: නො ච වත රෙ වත්තබ්බෙ 'අරහත්තමග්ගෙන ඔළාරිකං කාමරාගං ඔළාරිකං බ්‍යාපාදං ජහතී'ති.

5. ස. පු: අරහත්තමග්ගෙන අණුසහගතං කාමරාගං අණු-සහගතං බ්‍යාපාදං ජහතී'ති.

ප පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

ස. අනු: අරහත්තමග්ගෙන අණුසහගතං කාමරාගං අණු-සහගතං බ්‍යාපාදං ජහතී'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: නනු කාමරාගබ්‍යාපාදානං අනවසෙසප්පහානං අනාගාමිඵලං වුත්තං භගවතා'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. ඨ. හඤ්චි කාමරාගබ්‍යාපාදානං අනවසෙසප්පහානං අනාගාමිඵලං වුත්තං භගවතා,

ස. පා: නො ච වත රෙ වත්තබ්බෙ අරහත්තමග්ගෙන අණුසහගතං කාමරාගං අණුසහගතං බ්‍යාපාදං ජහතී'ති.

4. ස. පු: රහත්මගින් ඖදාරික කාමරාග ඖදාරික ව්‍යාපාද හැරපියත්තේ වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ

ස. පු: රහත්මගින් ඖදාරික කාමරාග ඖදාරික ව්‍යාපාද හැරපියා ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: 'කාමරාගව්‍යාපාදයන්ගේ තුනු බව සෙදගැමිඵල යැ'යි භාග්‍යවතුන් විසින් වදාරන ලද නො?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. ඨ: ඉදින් කාමරාගව්‍යාපාදයන්ගේ තනුභාවය සෙද-ගැමිඵලය'යි භාග්‍යවතුන් විසින් වදාරනලද වී නම්,

ස පා: භවත, "රහත්මගින් ඖදාරික කාමරාගය ඖදාරික ව්‍යාපාදය හැරපියති" නො කියැයුතු මැ යැ.

5. ස. පු: රහත්මගින් අණුසහගත කාමරාගය අණුසහගත ව්‍යාපාදය හැරපියත්තේ වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ

ස. අනු: රහත් මගින් අණුසහගත කාමරාගය අණුසහගත ව්‍යාපාදය හැරපියත්තේ වේ ද?

ප. පටි: එසේ යැ.

ස. අනු. 'කාමරාගව්‍යාපාදයන්ගේ නිරවශෙෂප්‍රහාණය අනගැමිඵල යැ'යි භාග්‍යවතුන් විසින් වදාරන ලද නො?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. ඨ ඉදින් 'කාමරාගව්‍යාපාදයන්ගේ නිරවශෙෂ ප්‍රහාණය අනගැමිඵල යැ'යි භාග්‍යවතුන් විසින් වදාරනලද වී නම්,

ස පා: භවත, "රහත්මගින් අණුසහගත කාමරාගය අණු-සහගත ව්‍යාපාදය හැරපියති" නො කියැයුතු මැ යැ.

6. ප. පු: න වත්තබ්බං එකෙන අරියමග්ගෙන චත්තාරි සාමඤ්ඤඵලානි සච්ඡිකරොතී'ති.

ස. පටිඤ්ඤා: ආමන්තා

ප. අනු: භගවතා සොතාපත්තිමග්ගො භාවිතො'ති

ස. පටිඤ්ඤා: ආමන්තා.

ප. අනු: භගවා සොතාපන්නො'ති

ස. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

ප. අනු. භගවතා සකදාගාමි -පෙ- අනාගාමිමග්ගො භාවිතො'ති.

ස. පටිඤ්ඤා: ආමන්තා.

ප. අනු: භගවා අනාගාමී'ති.

ස. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

7. ස. පු: භගවා එකෙන අරියමග්ගෙන චත්තාරි සාමඤ්ඤඵලානි සච්ඡිකරොති, සාවකා චතූහි අරියමග්ගෙහි චත්තාරිසාමඤ්ඤඵලානි සච්ඡිකරොන්තී'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: සාවකා බුද්ධස්ස භගවතො අදිට්ඨං දක්ඛන්ති[1] අනධිගතං අධිගච්ඡන්ති, අසච්ඡිකතං සච්ඡිකරොන්තී'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

එකමග්ගකථා නිට්ඨිතා

---

1 දස්සිනති - සිමු, PTS.

| | |
|---|---|
| 6. ප. පු: | 'එක් ආර්‍යමාර්ගයෙකින් සතර ශ්‍රාමණ්‍යඵලයන් ප්‍රත්‍යක්ෂ කෙරෙති' නො කියැයුතු වේ ද? |
| ස. පටිඤ්ඤා: | එසේ යැ. |
| ප. අනු: | භාග්‍යවතුන් වහන්සේ විසින් සොවන් මග භාවිත වේ ද? |
| ස. පටිඤ්ඤා: | එසේ යැ. |
| ප. අනු: | භාග්‍යවත්හු ශ්‍රොතාපන්න වෙත් ද? |
| ස. පටි: | එසේ නො කියැයුතු යැ ... |
| ප. අනු: | භාග්‍යවතුන් වහන්සේ විසින් සෙදගැමිමග ... අනගැමිමග භාවිත වේ ද? |
| ස. පටිඤ්ඤා: | එසේ යැ. |
| ප. අනු: | භාග්‍යවත්හු අනගැමි වෙත් ද? |
| ස. පටි: | එසේ නො කියැයුතු යැ ... |
| 7. ස. පු: | භාග්‍යවතුන් වහන්සේ එක් ආර්‍යමාර්ගයෙකින් සතර ශ්‍රාමණ්‍යඵලයන් ප්‍රත්‍යක්ෂ කරන්නාහු වෙත් ද, ශ්‍රාවකයෝ සතරමාර්ගයෙන් සතර ශ්‍රාමණ්‍යඵලයන් ප්‍රත්‍යක්ෂ කරන්නාහු වෙත් ද? |
| ප. පටිඤ්ඤා: | එසේයැ. |
| ස. අනු: | ශ්‍රාවකයෝ භාග්‍යවත් බුදුන් නො දක්නාලද්ද දක්නාහු වෙත් ද, අනධිගතය අධිගම කරන්නාහු වෙත් ද, අසාක්ෂාත්කෘතය සාක්ෂාත් කරන්නාහු වෙත් ද? |
| ප. පටි: | එසේ නො කියැයුතු යැ ... |

එකමග්ග කථා නිමි.

18. 6.

## ඣානසඞ්කන්ති කථා.

1. ස. පු: ඣානා ඣානං සඞ්කමතීති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: පඨමා ඣානා තතියං ඣානං සඞ්කමතීති

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

2. ස. පු. ඣානා ඣානං සඞ්කමතී'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: දුතියා ඣානා චතුත්ථං ඣානං සඞ්කමතී'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

3. ස. පු: පඨමා ඣානා දුතියං ඣානං සඞ්කමතී'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: යා පඨමස්ස ඣානස්ස උප්පාදාය ආවට්ටනා -පෙ- පණිධි, සා'ව දුතියස්ස ඣානස්ස උප්පාදාය ආවට්ටනා -පෙ- පණිධී'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

4. ස. පු: පඨමා ඣානා දුතියං ඣානං සඞ්කමති,[1] න වත්තබ්බං "යා පඨමස්ස ඣානස්ස උප්පාදාය ආවට්ටනා -පෙ- පණිධි, සා'ව දුතියස්ස ඣානස්ස උප්පාදාය ආවට්ටනා -පෙ- පණිධී'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: දුතියං ඣානං අනාවට්ටෙන්තස්ස උප්පජ්ජති-පෙ- අප්පණිදහන්තස්ස උප්පජ්ජතී'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

1. සඞ්කමතී'ති - සිමු., සසා

18 6.

## ඣානසඞ්කන්ති කථා

["ඉධ භික්ඛවෙ භික්ඛු විවිච්චෙව කාමෙහි පඨමං ඣානං උප-සම්පජ්ජ විහරති, විතක්කවිචාරානං වූපසමා දුතියං ඣානං ... තතියං ඣානං... චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති" යන මේ පිළිවෙළ දෙශනා නිසා ඒ ඒ ධ්‍යානයාගේ උපචාරප්‍රාප්ති රහිත වැ මැ ධ්‍යානයෙන් ධ්‍යානයට පැන යති"යි මහීශාසකයන් හා සමහර අන්ධකනිකායවාසීන් සෙයින් ලබ්ධි ගත්තවුන්ගේ වාද බිඳුනට 'ඣානසඞ්කන්තිකථා' එයි.]

1\. ස. පු: ධ්‍යානයෙන් ධ්‍යානයට සඞ්ක්‍රමණ කරන්නේ වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: ප්‍රථමධ්‍යානයෙන් තෘතියධ්‍යානයට සඞ්ක්‍රමණ කරන්නේ වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

2\. ස. පු: ධ්‍යානයෙන් ධ්‍යානයට සඞ්ක්‍රමණ කරන්නේ වේ ද,

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: ද්විතියධ්‍යානයෙන් චතුර්ථධ්‍යානයට සඞ්ක්‍රමණ කරන්නේ වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

3\. ස. පු: ප්‍රථමධ්‍යානයෙන් ද්විතීයධ්‍යානයට සඞ්ක්‍රමණ කරන්නේ වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: ප්‍රථමධ්‍යානය උපදනා පිණිස යම් ආවර්ජනායෙක්... ප්‍රණිධියෙක් ඇද්ද, එ මැ ද්විතීයධ්‍යානය උපදනා පිණිස ආවර්ජනා ... ප්‍රණිධි වේ ද?

ප. පටිඤ්ඤා: එසේ නො කියැයුතු යැ ..

4\. ස. පු: ප්‍රථමධ්‍යානයෙන් ද්විතීයධ්‍යානයට සඞ්ක්‍රමණ කරන්නේ වේ ද, ප්‍රථමධ්‍යානය උපදනා පිණිස යම් ආවර්ජනායෙක් ... ප්‍රණිධියෙක් ඇද්ද, එ මැ ද්විතීයධ්‍යානය උපදනා පිණිස ආවර්ජනා ... ප්‍රණිධි වෙති"යි නො නො කියැයුතු වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: ද්විතීයධ්‍යානය ආවර්ජනා නො කරන්නාහට උපදනේ වේ ද, ... ප්‍රණිධි නො කරන්නාහට උපදනේ වේ ද?

ප පටි: එසේ නො කියැයුතු යැ ...

ස. අනු: නනු දුතියං ඣානං ආවට්ටෙන්තස්ස උප්පජ්ජති -පෙ- පණිදහන්තස්ස උප්පජ්ජතී'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. ඨ: හඤ්චි දුතියං ඣානං ආවට්ටෙන්තස්ස උප්පජ්ජති -පෙ- පණිදහන්තස්ස උප්පජ්ජති,

ස. පා: නො ච වත රෙ වත්තබ්බෙ "පඨමා ඣානා දුතියං ඣානං සඞ්කමතී'ති.

5. ස. පු: පඨමා ඣානා දුතියං ඣානං සඞ්කමතී'ති

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: පඨමං ඣානං කාමෙ ආදීනවතො මනසි-කරොතො උප්පජ්ජතී'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: දුතියං ඣානං කාමෙ ආදීනවතො මනසිකරොතො උප්පජ්ජතී'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

6. ස පු: පඨමං ඣානං සවිතක්කං සවිචාරන්ති.

ප. පටිඤ්ඤා ආමන්තා.

ස. අනු: දුතියං ඣානං සවිතක්කං සවිචාරන්ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

ස. අනු: පඨමා ඣානා දුතියං ඣානං සඞ්කමතී'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: තඤ්ඤෙව පඨමං ඣානං තං දුතියං ඣානන්ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

7. ස. පු: දුතියා ඣානා තතියං ඣානං සඞ්කමතී'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: යා දුතියස්ස ඣානස්ස උප්පාදාය ආවට්ටනා[1] -පෙ- පණිධි, සා'ව තතියස්ස ඣානස්ස උප්පාදාය ආවට්ටනා -පෙ- පණිධී'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

1. ආවජ්ජනා - සභා

ස. අනු: ද්විතීයධ්‍යානය ආවර්ජනා කරන්නාහට උපදනේ නො ... ප්‍රණිධි කරන්නාහට උපදනේ නො?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. ඨ: ඉදින් ද්විතීය ධ්‍යානය ආවර්ජනා කරන්නාහට උපදනේ වේ නම් ... ප්‍රණිධි කරන්නාහට උපදනේ වේ නම්,

ස. පා: භවත, "ප්‍රථමධ්‍යානයෙන් ද්විතීයධ්‍යානයට සඞ්ක්‍රමණ කෙරෙති" නො කියැයුතු මැ යැ

5. ස පා: ප්‍රථමධ්‍යානයෙන් ද්විතීයධ්‍යානයට සඞ්ක්‍රමණ කරන්නේ වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: ප්‍රථමධ්‍යානය කාමයන් ආදීනව විසින් මෙනෙහි කරන්නාහට උපදනේ වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ

ස. අනු: ද්විතීයධ්‍යානය කාමයන් ආදීනව විසින් මෙනෙහි කරන්නාහට උපදනේ වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

6. ස. පු: ප්‍රථමධ්‍යානය සවිතර්ක සවිචාර වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: ද්විතීයධ්‍යානය සවිතර්කසවිචාර වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ....

ස. අනු: ප්‍රථමධ්‍යානයෙන් ද්විතීයධ්‍යානයට සඞ්ක්‍රමණ කරන්නේ වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ

ස. අනු: ඒ ප්‍රථමධ්‍යාන මැ ඒ ද්විතීයධ්‍යාන වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

7. ස. පු: ද්විතීයධ්‍යානයෙන් තෘතීයධ්‍යානයට සඞ්ක්‍රමණ කරන්නේ වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: ද්විතීයධ්‍යානය උපදනා පිණිස යම් අවර්ජනා-යෙක් ප්‍රණිධියෙක් ඇද්ද, එ මැ තෘතීයධ්‍යානය උපදනා පිණිස ආවර්ජනා ... ප්‍රණිධි වේ ද?

ප පටි: එසේ නො කියැයුතු යැ

8 ස. පු: දුතියා ඣානා තතියං ඣානං සඞ්කමති,[1] න වත්තබ්බං "යා දුතියස්ස ඣානස්ස උප්පාදාය ආවට්ටනා -පෙ- පණිධි, සා’ව තතියස්ස ඣානස්ස උප්පාදාය ආවට්ටනා -පෙ- පණිධී’ති

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: තතියං ඣානං අනාවට්ටෙන්තස්ස[2] උප්පජ්ජති–පෙ- අප්පණිදහන්තස්ස[3] උප්පජ්ජතී’ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

ස. අනු: නනු තතියං ඣානං ආවට්ටෙන්තස්ස උප්පජ්ජති -පෙ- පණිදහන්තස්ස උප්පජ්ජතී’ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. ඨ: හඤ්චි තතියං ඣානං ආවට්ටෙන්තස්ස උප්පජ්ජති -පෙ- පණිදහන්තස්ස උප්පජ්ජති,

ස. පා: නො ච වත රෙ වත්තබ්බෙ දුතියා ඣානා තතියං ඣානං සඞ්කමතී’ති.

9. ස. පු: දුතියා ඣානා තතියං ඣානං සඞ්කමතී’ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: දුතියං ඣානං විතක්කවිචාරෙ ආදීනවතො මනසිකරොතො උප්පජ්ජතී’ති

ප. පටිඤ්ඤා: ආමන්තා

ස. අනු: තතියං ඣානං විතක්කවිචාරෙ ආදීනවතො මනසිකරොතො උප්පජ්ජතීති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

10. ස. පු: දුතියං ඣානං සප්පීතිකන්ති

ප පටිඤ්ඤා: ආමන්තා

ස. අනු. තතියං ඣානං සප්පීතිකන්ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

11 ස. පු: දුතියා ඣානා තතියං ඣානං සඞ්කමතීති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

---

1 සඞ්කමතී’ති - සීමු, සයා. 2 අනාවට්ටන්තස්ස - සීමු. PTS අනාවජ්ජන්තස්ස සයා
3. අපණිදහන්තස්ස - සීමු.

| | |
|---|---|
| 8. ස පු: | ද්විතියධ්‍යානයෙන් තෘතියධ්‍යානයට සඞ්ක්‍රමණ කරන්නේ වේ ද, ද්විතියධ්‍යානය උපදනා පිණිස යම් ආවර්තනායෙක් ... ප්‍රණිධියෙක් ඇත් නම්, එ මැ තෘතියධ්‍යානය උපදනා පිණිස ආවර්තනා... ප්‍රණිධි වේ යයි නො කියැයුතු වේ ද? |
| ප. පටිඤ්ඤා: | එසේ යැ. |
| ස. අනු: | තෘතියධ්‍යානය ආවර්තනා නො කරන්නාහට උපදතේ වේ ද ... ප්‍රණිධි නො කරන්නාහට උපදතේ වේ ද? |
| ප. පටි: | එසේ නො කියැයුතු යැ ... |
| ස. අනු: | තෘතියධ්‍යානය ආවර්තනා කරන්නාහට උපදතේ නො ... ප්‍රණිධි කරන්නාහට උපදතේ නො? |
| ප. පටිඤ්ඤා: | එසේ යැ. |
| ස. ඨ: | ඉදින් තෘතියධ්‍යානය ආවර්තනා කරන්නාහට උපදතේ වේ නම්, ... ප්‍රණිධි කරන්නාහට උපදතේ වේ නම්, |
| ස. පා: | හවත, ද්විතියධ්‍යානයෙන් තෘතියධ්‍යානයට සඞ්ක්‍රමණ කරන්නේ වේ යයි නො කියැයුතු මැ යැ. |
| 9. ස. පු: | ද්විතියධ්‍යානයෙන් තෘතියධ්‍යානයට සඞ්ක්‍රමණ කරන්නේ වේ ද? |
| ප. පටිඤ්ඤා: | එසේ යැ. |
| ස. අනු: | ද්විතියධ්‍යානය විතර්කවිචාරයන් ආදීනව වශයෙන් මෙනෙහි කරන්නාහට උපදතේ වේ ද? |
| ප. පටිඤ්ඤා: | එසේ යැ. |
| ස. අනු. | තෘතියධ්‍යානය විතර්කවිචාරයන් ආදීනව වශයෙන් මෙනෙහි කරන්නාහට උපදතේ වේ ද? |
| ප. පටි: | එසේ නො කියැයුතු යැ ... |
| 10. ස. පු | ද්විතියධ්‍යාන සප්‍රීතික වේ ද? |
| ප. පටිඤ්ඤා: | එසේ යැ. |
| ස අනු | තෘතියධ්‍යාන සප්‍රීතික වේ ද? |
| ප. පටි: | එසේ නො කියැයුතු යැ ... |
| 11. ස. පු: | ද්විතියධ්‍යානයෙන් තෘතියධ්‍යානයට සඞ්ක්‍රමණ කරන්නේ වේ ද? |
| ප. පටිඤ්ඤා: | එසේ යැ. |

ස. අනු: තඤ්ඤෙව දුතියං ඣානං තං තතියං ඣානන්ති

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

12. ස. පු: තතියා ඣානා චතුත්ථං ඣානං සඞ්කමතී'ති

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: යා තතියස්ස ඣානස්ස උප්පාදාය ආවජ්ජනා -පෙ- පණිධි, සා'ව චතුත්ථස්ස ඣානස්ස උප්පාදාය ආවජ්ජනා -පෙ- පණිධීති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

13. ස. පු: තතියා ඣානා චතුත්ථං ඣානං සඞ්කමති, න වත්තබ්බං "යා තතියස්ස ඣානස්ස උප්පාදාය ආවජ්ජනා -පෙ- පණිධි, සා'ව චතුත්ථස්ස ඣානස්ස උප්පාදාය ආවජ්ජනා -පෙ- පණිධී'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: චතුත්ථං ඣානං අනාවජ්ජෙන්තස්ස උප්පජ්ජති -පෙ- අප්පණිදහන්තස්ස උප්පජ්ජතී'ති

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

ස. අනු: නනු චතුත්ථං ඣානං ආවජ්ජෙන්තස්ස උප්පජ්ජති -පෙ- පණිදහන්තස්ස උප්පජ්ජතී'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. ඨ: හඤ්චි චතුත්ථං ඣානං ආවජ්ජෙන්තස්ස උප්පජ්ජති -පෙ- පණිදහන්තස්ස උප්පජ්ජති,

ස. පා: නො ච වත රෙ වත්තබ්බෙ "තතියා ඣානා චතුත්ථං ඣානං සඞ්කමතී'ති

14. ස. පු: තතියා ඣානා චතුත්ථං ඣානං සඞ්කමතී'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: තතියං ඣානං පීතිං ආදීනවතො මනසිකරොතො උප්පජ්ජතී'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා

ස. අනු: චතුත්ථං ඣානං පීතිං ආදීනවතො මනසිකරොතො උප්පජ්ජතී'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

ස. අනු: ඒ ද්විතියධ්‍යාන මැ ඒ තෘතියධ්‍යාන වේ ද?

ප. පටිඤ්ඤා: එසේ නො කියැයුතු යැ ...

12. ස. පු: තෘතියධ්‍යානයෙන් චතුර්ථධ්‍යානයට සඞ්ක්‍රමණ කරන්නේ වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: තෘතියධ්‍යානය උපදනා පිණිස යම් අවර්ජනා-යෙක් ... ප්‍රණිධියෙක් ඇද්ද, ඒ මැ චතුර්ථධ්‍යානය උපදනා පිණිස ආවර්ජනා ... ප්‍රණිධි වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

13. ස. පු: තෘතියධ්‍යානයෙන් චතුර්ථධ්‍යානයට සඞ්ක්‍රමණ කරන්නේ වේ ද, 'තෘතියධ්‍යානය උපදනා පිණිස යම් ආවර්ජනායෙක් ... ප්‍රණිධියෙක් ඇද්ද, ඒ මැ චතුර්ථධ්‍යානය උපදනා පිණිස ආවර්ජනා ... ප්‍රණිධි වෙති' නො කියැයුතු වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: චතුර්ථධ්‍යානය ආවර්ජනා නො කරන්නාහට උපදනේ වේ ද ... ප්‍රණිධි නො කරන්නාහට උපදනේ වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

ස. අනු: චතුර්ථධ්‍යානය ආවර්ජනා කරන්නාහට උපදනේ නො ... ප්‍රණිධි කරන්නාහට උපදනේ නො?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. ඨ: ඉදින් චතුර්ථධ්‍යානය ආවර්ජනා කරන්නාහට උපදනේ වේ නම් ... ප්‍රණිධි කරන්නාහට උපදනේ වේ නම්,

ස. පා: භවත, 'තෘතියධ්‍යානයෙන් චතුර්ථධ්‍යානයට සඞ්ක්‍රමණ කරන්නේ වේ' යයි නො කියැයුතු මැ යැ.

14 ස. පු: තෘතියධ්‍යානයෙන් චතුර්ථධ්‍යානයට සඞ්ක්‍රමණ කරන්නේ වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: තෘතියධ්‍යානය ප්‍රීතිය ආදීනව විසින් මෙනෙහි කරන්නාහට උපදනේ වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: චතුර්ථධ්‍යානය ප්‍රීතිය ආදීනව විසින් මෙනෙහි කරන්නාහට උපදනේ වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

15. ස. පු: තතියං ඣානං සුඛසහගතන්ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: චතුත්ථං ඣානං සුඛසහගතන්ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

16. ස. පු: තතියා ඣානා චතුත්ථං ඣානං සඞ්කමතී'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: තඤ්ඤෙව තතියං ඣානං තං චතුත්ථං ඣානන්ති

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

17. ප. පු: න වත්තබ්බං "ඣානා ඣානං සඞ්කමතී'ති.

ස පටිඤ්ඤා: ආමන්තා.

ප. අනු: නනු වුත්තං භගවතා "ඉධ භික්ඛවෙ භික්ඛු විවිච්චෙව කාමෙහි [පඨමං ඣානං] -පෙ- චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරතී'ති. අත්ථෙව සුත්තන්තො'ති.

ස පටිඤ්ඤා: ආමන්තා.

ප පා: තෙන හි "ඣානා ඣානං සඞ්කමතී'ති

ඣානසඞ්කන්ති කථා නිට්ඨිතා.

**15** ස. පු: තෘතීයධ්‍යානය සුඛසහගත වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: චතුර්ථධ්‍යානය සුඛසහගත වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

**16**. ස. පු: තෘතීයධ්‍යානයෙන් චතුර්ථධ්‍යානයට සඞ්ක්‍රමණ කරන්නේ වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: ඒ තෘතීයධ්‍යානය මැ ඒ චතුර්ථධ්‍යාන වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

**17**. ප. පු: 'ධ්‍යානයෙන් ධ්‍යානයට සඞ්ක්‍රමණ වේ'යයි නො කියැයුතු වේ ද?

ස. පටිඤ්ඤා: එසේ යැ.

ප. අනු: භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරනලද මැ නු: "මහණෙනි, මේ සස්නෙහි මහණ කාමයෙන් වෙන් වැ මැ [ප්‍රථමධ්‍යානය] .. චතුර්ථධ්‍යානය උපයා වාස කෙරෙයි" වදාළ සූත්‍රාන්තයෙක් ඇත්තේ මැ නො?

ස. පටිඤ්ඤා: එසේ යැ.

ප. පා: එකරුණීත් 'ධ්‍යානයෙන් ධ්‍යානයට සඞ්ක්‍රමණ කෙරෙයි.

ධ්‍යානසඞ්ක්‍රාන්ති කථා නිමි.

18. 7.

## ඣානන්තරික කථා

1. ස. පු: අත්ථි ඣානන්තරිකා'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: අත්ථි ඵස්සන්තරිකා -පෙ- අත්ථි සඤ්ඤන්තරිකා'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

2. ස. පු: අත්ථි ඣානන්තරිකා'ති

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: දුතියස්ස ච ඣානස්ස තතියස්ස ච ඣානස්ස අන්තරෙ අත්ථි ඣානන්තරිකා'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

3. ස. පු: අත්ථි ඣානන්තරිකා'ති

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: තතියස්ස ච ඣානස්ස චතුත්ථස්ස ච ඣානස්ස අන්තරෙ අත්ථි ඣානන්තරිකා'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

4. ස. පු: දුතියස්ස ච ඣානස්ස තතියස්ස ච ඣානස්ස අන්තරෙ නත්ථි ඣානන්තරිකා'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. ඨ: හඤ්චි දුතියස්ස ච ඣානස්ස තතියස්ස ච ඣානස්ස අන්තරෙ නත්ථි ඣානන්තරිකා,

ස. පා: නො ච වත රෙ වත්තබ්බෙ "අත්ථි ඣානන්තරිකා'ති

5. ස. පු: තතියස්ස ච ඣානස්ස චතුත්ථස්ස ච ඣානස්ස අන්තරෙ නත්ථි ඣානන්තරිකා'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. ඨ: හඤ්චි තතියස්ස ච ඣානස්ස චතුත්ථස්ස ච ඣානස්ස අන්තරෙ නත්ථි ඣානන්තරිකා,

ස. පා: නො ච වත රෙ වත්තබ්බෙ "අත්ථි ඣානන්තරිකා' ති.

## 18. 7.

# ඣානන්තරික කථා.

[අවිතක්ක විචාරමාත්‍ර සමාධියට අවකාශ නො දුන "ප්‍රථමධ්‍යානය-ටත් ද්විතීයධ්‍යානයටත් අතුරෙහි ධ්‍යානානන්තරිකාවක් ඇතැ"යි සම්මිතිය හා සමහර අන්ධක නිකායවාසීන් සෙයින් ලබ්ධි ගත්තවුන්ගේ වාද බිඳුනට 'ඣානන්තරික කථා' එයි ]

1. ස. පු: ධ්‍යානානන්තරික (ධ්‍යානයට අතුරෙහි වූ) සමාධි-යෙක් ඇද්ද?

   ප. පටිඤ්ඤා: එසේ යැ.

   ස. අනු: ස්පර්ශානන්තරිකා ඇද්ද ... සංඥානන්තරිකා ඇද්ද?

   ප. පටි: එසේ නො කියැයුතු යැ ...

2. ස. පු: ධ්‍යානානන්තරික සමාධියෙක් ඇද්ද?

   ප. පටිඤ්ඤා: එසේ යැ.

   ස. අනු: ද්විතීයධ්‍යානයටත් තෘතීයධ්‍යානයටත් අතුරෙහි ධ්‍යානානන්තරික සමාධි ඇද්ද?

   ප. පටි: එසේ නො කියැයුතු යැ ...

3. ස. පු: ධ්‍යානානන්තරික සමාධියෙක් ඇද්ද?

   ප. පටිඤ්ඤා: එසේ යැ.

   ස. අනු: තෘතීයධ්‍යානයටත් චතුර්ථධ්‍යානයටත් අතුරෙහි ධ්‍යානානන්තරික සමාධියෙක් ඇද්ද?

   ප. පටි: එසේ නො කියැයුතු යැ ...

4. ස. පු: ද්විතීයධ්‍යානයටත් තෘතීයධ්‍යානයටත් අතුරෙහි ධ්‍යානානන්තරික සමාධියෙක් නැද්ද?

   ප. පටිඤ්ඤා: එසේ යැ.

   ස. ඨ: ඉදින් ද්විතීයධ්‍යානයටත් තෘතීයධ්‍යානයටත් අතුරෙහි ධ්‍යානානන්තරික සමාධියෙක් නැත් නම්,

   ස. පා: හවත, ධ්‍යානානන්තරික සමාධියෙක් ඇතැ'යි නො කියැයුතු මැ යැ.

5. ස. පු: තෘතීයධ්‍යානයටත් චතුර්ථධ්‍යානයටත් අතුරෙහි ධ්‍යානානන්තරික සමාධියෙක් නැද්ද?

   ප. පටිඤ්ඤා: එසේ යැ.

   ස. ඨ: ඉදින් තෘතීයධ්‍යානයටත් චතුර්ථධ්‍යානයටත් අතුරෙහි ධ්‍යානානන්තරික සමාධියෙක් නැත් නම්,

   ස. පා: හවත, 'ධ්‍යානානන්තරික සමාධියෙක් ඇතැ'යි නො කියැයුතු මැ යැ.

6. ස. පු: පඨමස්ස ච ඣානස්ස දුතියස්ස ච ඣානස්ස අනන්තරෙ අත්ථි ඣානන්තරිකා'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: දුතියස්ස ච ඣානස්ස තතියස්ස ච ඣානස්ස අනන්තරෙ අත්ථි ඣානන්තරිකා'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

7. ස. පු: පඨමස්ස ච ඣානස්ස දුතියස්ස ච ඣානස්ස අනන්තරෙ අත්ථි ඣානන්තරිකා'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: තතියස්ස ච ඣානස්ස චතුත්ථස්ස ච ඣානස්ස අනන්තරෙ අත්ථි ඣානන්තරිකා'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

8. ස. පු: දුතියස්ස ච ඣානස්ස තතියස්ස ච ඣානස්ස අනන්තරෙ නත්ථි ඣානන්තරිකා'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: පඨමස්ස ච ඣානස්ස දුතියස්ස ච ඣානස්ස අනන්තරෙ නත්ථි ඣානන්තරිකා'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

9. ස. පු: තතියස්ස ච ඣානස්ස චතුත්ථස්ස ච ඣානස්ස අනන්තරෙ නත්ථි ඣානන්තරිකා'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: පඨමස්ස ච ඣානස්ස දුතියස්ස ච ඣානස්ස අනන්තරෙ නත්ථි ඣානන්තරිකා'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

10 ස. පු: අවිතක්කො විචාරමත්තො සමාධි ඣානන්තරිකා'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: සවිතක්කො සවිචාරො සමාධි ඣානන්තරිකා'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

11. ස. පු: අවිතක්කො විචාරමත්තො සමාධි ඣානන්තරිකා'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: අවිතක්කො අවිචාරො සමාධි ඣානන්තරිකා'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

6. ස. පු: ප්‍රථමධ්‍යානයටත් ද්විතීයධ්‍යානයටත් අතුරෙහි ධ්‍යානාන්තරික සමාධියෙක් ඇද්ද?

ප. පරිසකුඛු: එසේ යැ.

ස. අනු: ද්විතීයධ්‍යානයටත් තෘතීයධ්‍යානයටත් අතුරෙහි ධ්‍යානාන්තරික සමාධියෙක් ඇද්ද?

ප. පරි: එසේ නො කියැයුතු යැ ...

7. ස. පු: ප්‍රථමධ්‍යානයටත් ද්විතීයධ්‍යානයටත් අතුරෙහි ධ්‍යානාන්තරික සමාධියෙක් ඇද්ද?

ප. පරිසකුඛු: එසේ යැ.

ස. අනු: තෘතීයධ්‍යානයටත් චතුර්ථධ්‍යානයටත් අතුරෙහි ධ්‍යානාන්තරික සමාධියෙක් ඇද්ද?

ප. පරි: එසේ නො කියැයුතු යැ ...

8. ස. පු: ද්විතීයධ්‍යානයටත් තෘතීයධ්‍යානයටත් අතුරෙහි ධ්‍යානාන්තරික සමාධියෙක් නැද්ද?

ප. පරිසකුඛු: එසේ යැ.

ස. අනු: ප්‍රථමධ්‍යානයටත් ද්විතීයධ්‍යානයටත් අතුරෙහි ධ්‍යානාන්තරික සමාධියෙක් නැද්ද?

ප. පරි: එසේ නො කියැයුතු යැ ...

9. ස. පු: තෘතීයධ්‍යානයටත් චතුර්ථධ්‍යානයටත් අතුරෙහි ධ්‍යානාන්තරික සමාධියෙක් නැද්ද?

ප. පරිසකුඛු: එසේ යැ.

ස. අනු: ප්‍රථමධ්‍යානයටත් ද්විතීයධ්‍යානයටත් අතුරෙහි ධ්‍යානාන්තරික සමාධියෙක් නැද්ද?

ප. පරි: එසේ නො කියැයුතු යැ ...

10. ස පු: අවිතර්කී විචාරමාත්‍ර සමාධිය ධ්‍යානාන්තරික වේ ද?

ප. පරිසකුඛු: එසේ යැ.

ස. අනු: සසවිතර්කී සවිචාරසමාධිය ධ්‍යානාන්තරික වේ ද?

ප. පරි: එසේ නො කියැයුතු යැ ...

11. ස. පු: අවිතර්කී විචාරමාත්‍ර සමාධිය ධ්‍යානාන්තරික වේ ද?

ප. පරිසකුඛු: එසේ යැ.

ස. අනු: අවිතර්කී අවිචාර සමාධිය ධ්‍යානාන්තරික වේ ද?

ප. පරි: එසේ නො කියැයුතු යැ ...

12. ස. පු: සවිතක්කො සවිචාරෙ සමාධි න ඣානන්තරිකා'ති.

ප. පටික්ඛෙ: ආමන්තා.

ස. අනු: අවිතක්කො විචාරමත්තො සමාධි න ඣානන්තරිකා'ති.

ප පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

13. ස. පු: අවිතක්කො අවිචාරො සමාධි න ඣානන්තරිකා'ති.

ප. පටික්ඛෙ: ආමන්තා.

ස අනු: අවිතක්කො විචාරමත්තො සමාධි න ඣානන්තරිකා'ති.

ප පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

14. ස. පු: ද්වින්නං ඣානානං පටුප්පන්නානං[1] අනන්තරෙ අවිතක්කො විචාරමත්තො සමාධී'ති.

ප පටික්ඛෙ: ආමන්තා.

ස. අනු: නනු අවිතක්ක විචාරමත්ත සමාධිම්හි වත්තමානෙ පඨමං ඣානං නිරුද්ධං, දුතියං ඣානං පටුප්පන්නන්ති.[2]

ප. පටික්ඛෙ: ආමන්තා.

ස. ඨ: හඤ්චි අවිතක්ක විචාරමත්ත සමාධිම්හි වත්තමානෙ පඨමං ඣානං නිරුද්ධං, දුතියං ඣානං පටුප්පන්නං,[2]

ස. පා: නො ච වත රෙ වත්තබ්බෙ "ද්වින්නං ඣානානං පටුප්පන්නානං අනන්තරෙ අවිතක්කො විචාරමත්තො සමාධි[3] ඣානන්තරිකා"ති.[4]

15. ප. පු: අවිතක්කො විචාරමත්තො සමාධි න ඣානන්තරිකා'ති.

ස. පටික්ඛෙ: ආමන්තා.

ප. අනු: අවිතක්කො විචාරමත්තො සමාධි පඨමං ඣානං -පෙ- දුතියං ඣානං -පෙ- තතියං ඣානං -පෙ- චතුත්ථං ඣානන්ති

ස. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

ප. ආ: තෙන හි "අවිතක්කො විචාරමත්තො සමාධි ඣානන්තරිකා"ති.

---

1. පටුප්පන්නානං - සීමු, PTS
2. අනුප්පන්නං - PTS පටුප්පන්නං - සීමු
3. සමාධිනි - PTS
4. ඣානන්තරිකා'ති - ඌනං

12. ස. පු: සවිතක්ක සවිචාර සමාධිය ධ්‍යානානන්තරික නො වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: අවිතක්ක විචාරමාත්‍ර සමාධිය ධ්‍යානානන්තරික නො වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

13. ස. පු: අවිතක්ක අවිචාර සමාධිය ධ්‍යානානන්තරික නො වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: අවිතක්ක විචාරමාත්‍ර සමාධිය ධ්‍යානානන්තරික නො වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

14. ස. පු: ප්‍රත්‍යුත්පන්න ධ්‍යාන දෙකක්හුගේ අතුරෙහි අවිතක්ක විචාරමාත්‍ර සමාධියෙක් වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: අවිතක්ක විචාරමාත්‍ර සමාධිය පවත්නා කල්හි ප්‍රථමධ්‍යානය නිරුද්ධ වූයේ ද්විතීයධ්‍යානය ප්‍රත්‍යුත්පන්න වූයේ නො?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. ඨ: ඉදින් අවිතක්ක විචාරමාත්‍ර සමාධිය පවත්නා කල්හි ප්‍රථමධ්‍යානය නිරුද්ධ වූයේ ද්විතීයධ්‍යානය ප්‍රත්‍යුත්පන්න වූයේ නම්,

ස. පා: හවත, ප්‍රත්‍යුත්පන්න ධ්‍යාන දෙකක්හුගේ අතුරෙහි අවිතක්ක විචාරමාත්‍ර සමාධි ධ්‍යානානන්තරික වෙති' නො කියැයුතු මැ යැ

15. ප. පු: අවිතක්ක විචාරමාත්‍ර සමාධිය ධ්‍යානානන්තරික නො වේ ද?

ස. පටිඤ්ඤා: එසේ යැ.

ප. අනු: අවිතක්ක විචාරමාත්‍ර සමාධිය ප්‍රථමධ්‍යාන ... ද්විතීය-ධ්‍යාන ... තෘතීයධ්‍යාන ... චතුර්ථධ්‍යාන වේ ද?

ස. පටි: එසේ නො කියැයුතු යැ ...

ප. ආ: එකරුණින් "අවිතක්කවිචාරමාත්‍රසමාධිය ධ්‍යා-නානන්තරික" වෙයි.

16. ස. පු: අවිතක්කො විචාරමත්තො සමාධි ඣානන්තරි-කා'ති.

ප. පටිඤ්ඤ: ආමන්තා.

ස. අනු: නනු තයො සමාධි වුත්තා භගවතා "සවිතක්කො සවිචාරො සමාධි, අවිතක්කො විචාරමත්තො සමාධි, අවිතක්කො අවිචාරො සමාධීති.

ප. පටිඤ්ඤ ආමන්තා.

ස. ඨ හඤ්චි තයො සමාධී වුත්තා භගවතා සවි-තක්කො -පෙ- [විචාරමත්තො -පෙ-] අවිචාරො සමාධි,

ස පා නො ච වත රෙ වත්තබ්බෙ "අවිතක්කො විචාර-මත්තො සමාධි ඣානන්තරිකා"ති.

ඣානන්තරික කථා නිට්ඨිතා

16\. ස. පු: අවිතර්ක විචාරමාත්‍ර සමාධිය ධ්‍යානාන්තරික වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: භාග්‍යවතුන් වහන්සේ විසින් තුන් සමාධි කෙනෙක් වදාරන ලදහු මැ නු: "සවිතර්ක සවිචාර-සමාධි යැ අවිතර්ක විචාරමාත්‍ර සමාධි යැ අවිතර්ක අවිචාරසමාධි යැ"යි

ප පටිඤ්ඤා: එසේ යැ.

ස. ඵ: ඉදින් භාග්‍යවතුන් වහන්සේ විසින් "සවිතර්ක ... [විචාරමාත්‍ර ...] අවිචාරසමාධි යැ"යි තුන් සමාධි කෙනෙක් වදාරන ලද්දහු වී නම්,

ස. පා හවත, "අවිතර්ක විචාරමාත්‍ර සමාධිය ධ්‍යානාන්තරික වෙති" නො කියැයුතු මැ යැ.

ධ්‍යානාන්තරික කථා නිමි.

18. 8.

## සමාපන්නො සද්දං සුණාතීති කථා.

1. ස. පු: සමාපන්නො සද්දං සුණාතී'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා

ස. අනු: සමාපන්නො චක්ඛුනා රූපං පස්සති -පෙ- සොතෙන -පෙ- ඝානෙන -පෙ- ජිව්හාය -පෙ- කායෙන ඵොට්ඨබ්බං ඵුසතී'ති.

ප පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

2 ස. පු: සමාපන්නො සද්දං සුණාතී'ති.

ප පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: සොතවිඤ්ඤාණසමඞ්ගී සමාපන්නො'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

ස අනු නනු සමාධි මනොවිඤ්ඤාණසමඞ්ගිස්සා'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. ඨ හඤ්චි සමාධි මනොවිඤ්ඤාණසමඞ්ගිස්ස,

ස පා: නො ච වත රෙ වත්තබ්බෙ "සමාපන්නො සද්දං සුණාතී"ති.

3. ස. පු: සමාධි මනොවිඤ්ඤාණසමඞ්ගිස්ස, සොතවිඤ්ඤාණසමඞ්ගී සද්දං සුණාතී'ති.

ප පටිඤ්ඤා: ආමන්තා.

ස ඨ. හඤ්චි සමාධි මනොවිඤ්ඤාණසමඞ්ගිස්ස, සොතවිඤ්ඤාණසමඞ්ගී සද්දං සුණාති,

ස පා. නො ච වත රෙ වත්තබ්බෙ "සමාපන්නො සද්දං සුණාතී"ති.

4 ස. පු: සමාධි මනොවිඤ්ඤාණසමඞ්ගිස්ස, සොතවිඤ්ඤාණසමඞ්ගී සද්දං සුණාතී'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

## 18. 8.

# සමාපන්නො සද්දං සුණාතීති කථා.

["ප්‍රථමධ්‍යානය ශබ්දකණ්ටක යැයි භාග්‍යවතුන් විසින් වදාරන ලද වෙයි. ඉදින් සමවත් සමවන්නේ ශබ්ද නො අසා නම් කිසෙසින් ශබ්දකණ්ටක (ශබ්ද බාධක) වන්නේ ද? එහෙයින් සමවත් සමවන්නේ ශබ්ද අසන්නේ වේ"යයි පූර්වශෛලීයයන් සෙසින් ලබ්ධි ඇත්තවුන්ගේ මැද බිඳුනම 'සමාපන්නො සද්දං සුණාතීති කථා' එයි.]

1. ස. පු: සමවත් සමවත්තේ ශබ්ද අසත්තේ වේ ද?

ප. පටිඤ්ඤ: එසේ යැ.

ස. අනු: සමවත් සමවත්තේ ඇසින් රූ දක්තේ වේ ද? .. කනින් ... නැහැයෙන් ... දිවින් ... කයින් පැහැසි පහස්තේ වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

2. ස. පු: සමවත් සමවත්තේ ශබ්දශ්‍රවණ කරත්තේ වේ ද?

ප. පටිඤ්ඤ: එසේ යැ.

ස. අනු: ශ්‍රොත්‍රවිඥානසමන්‍වාගත වූයේ සමාපන්න වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ . .

ස. අනු: සමාධි මනොවිඥානසමඞ්ගීහට නො?

ප. පටිඤ්ඤ: එසේ යැ.

ස. ඨ: ඉදින් මනොවිඥාන සමඞ්ගිපුද්ගලහට සමාධි වී නම්,

ස. පා: හවත, 'සමවත් සමවත්නාහු ශබ්දශ්‍රවණ කෙරෙති' නො කියැයුතු මැ යැ.

3. ස. පු: මනොවිඥානසමඞ්ගී පුද්ගලහට සමාධි වෙයි, ශ්‍රොත්‍රවිඥානසමඞ්ගී පුද්ගල ශබ්දශ්‍රවණ කරත්තේ වේ ද?

ප. පටිඤ්ඤ: එසේ යැ.

ස. ඨ: ඉදින් මනොවිඥානසමඞ්ගී පුද්ගලහට සමාධි වී නම්, ශ්‍රොත්‍රවිඥානසමඞ්ගී පුද්ගල ශබ්දශ්‍රවණ කරත්තේ වී නම්,

ස. පා: හවත, 'සමවත් සමවත්නාහු ශබ්දශ්‍රවණ කෙරෙති' නො කියැයුතු මැ යැ.

4. ස. පු: මනොවිඥානසමඞ්ගී පුද්ගලහට සමාධි වෙයි. ශ්‍රොත්‍රවිඥානසමඞ්ගී පුද්ගල ශබ්දශ්‍රවණ කරත්තේ වේ ද?

ප. පටිඤ්ඤ: එසේ යැ.

ස. අනු: ද්වින්නං ඵස්සානං -පෙ- ද්වින්නං චිත්තානං සමෝධානං හෝතී'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

5. ප. පු: න වත්තබ්බං සමාපන්නො සද්දං සුණාතී'ති.

ස. පටිඤ්ඤා: ආමන්තා.

ප. අනු: නනු පඨමස්ස ඣානස්ස සද්දො කණ්ටකො වුත්තො භගවතා'ති.

ස. පටිඤ්ඤා: ආමන්තා.

ප. ඨ: හඤ්චි පඨමස්ස ඣානස්ස සද්දො කණ්ටකො වුත්තො භගවතා,

ප. පා: තෙන වත රෙ වත්තබ්බෙ "සමාපන්නො සද්දං සුණාතී"ති.

6 ස. පු "පඨමස්ස ඣානස්ස සද්දො කණ්ටකො වුත්තො භගවතා'ති සමාපන්නො සද්දං සුණාතී"ති.

ප පටිඤ්ඤා· ආමන්තා

ස. අනු: දුතියස්ස ඣානස්ස විතක්කො විචාරො කණ්ටකො වුත්තො භගවතා, අත්ථි තස්ස විතක්කවිචාරා'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

7. ස. පු: "පඨමස්ස ඣානස්ස සද්දො කණ්ටකො වුත්තො භගවතා'ති සමාපන්නො සද්දං සුණාතී"ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: තතියස්ස ඣානස්ස පීති කණ්ටකො -පෙ- චතුත්ථස්ස ඣානස්ස අස්සාසපස්සාසා කණ්ටකො, ... ආකාසානඤ්චායතනං සමාපන්නස්ස රූපසඤ්ඤා කණ්ටකො ... විඤ්ඤාණඤ්චායතනං සමාපන්නස්ස ආකාසානඤ්චායතනසඤ්ඤා කණ්ටකො ... ආකිඤ්චඤ්ඤායතනං සමාපන්නස්ස විඤ්ඤාණඤ්චායතනසඤ්ඤා කණ්ටකො ... නෙවසඤ්ඤානාසඤ්ඤායතනං සමාපන්නස්ස ආකිඤ්චඤ්ඤායතනසඤ්ඤා කණ්ටකො... සඤ්ඤාවෙදයිතනිරොධං සමාපන්නස්ස සඤ්ඤා ච වෙදනා ච කණ්ටකො වුත්තො භගවතා, අත්ථි තස්ස සඤ්ඤා ච වෙදනා චා'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

**සමාපන්නො සද්දං සුණාතී'ති කථා නිට්ඨිතා.**

ස. අනු: ස්පර්ශයන් දෙදෙනකුන්ගේ .. චිත්තයන් දෙදෙනකුන්ගේ ... සමවධාන වේ ද?

ප. පටි: එසේ නො කියයුතු යැ ...

5. ප. පු: සමවත් පුහුල් ශබ්දශ්‍රවණ කෙරෙති' නො කියයුතු වේ ද?

ස. පටිඤ්ඤා: එසේ යැ.

ප. අනු: "ප්‍රථමධ්‍යානය ශබ්දකණ්ටක යැ'යි භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරන ලද නො?

ස. පටිඤ්ඤා: එසේ යැ.

ප. ඨ: ඉදින් 'ප්‍රථමධ්‍යානය ශබ්දකණ්ටක යැ'යි භාග්‍යවතුන් විසින් වදාරන ලද වී නම්,

ප. පා: භවත, එකරුණින් සමවත්තේ ශබ්දශ්‍රවණ කෙරෙයි' යනු කියයුතු මැ යැ

6 ස. පු: "ප්‍රථමධ්‍යානය ශබ්දකණ්ටක යැ'යි භාග්‍යවතුන් විසින් වදාරන ලදැ'යි කරුණු කොට සමාපන්න පුද්ගල ශබ්දශ්‍රවණ කරන්නේ වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: 'ද්විතීයධ්‍යානය විතර්කවිචාරකණ්ටක යැ'යි භාග්‍යවතුන් විසින් වදාරන ලද වෙයි. එයට (ද්විතීයධ්‍යානයට) විතර්කවිචාර ඇද්ද?

ප. පටි: එසේ නො කියයුතු යැ ...

7. ස. පු: 'ප්‍රථමධ්‍යනයට ශබ්දය කණ්ට යැ'යි භාග්‍යවතුන් විසින් වදාරනලදැ'යි කරුණු කොට සමවත් පුහුල් ශබ්දශ්‍රවණ කරන්නේ වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: තෘතීයධ්‍යානය ප්‍රීතිකණ්ටක යැ ... චතුර්ථධ්‍යානය ආශ්වාසප්‍රශ්වාස කණ්ටක යැ ... ආකාසානඤ්චායතන සමවත් සමවත් පුහුල්හට රූපසංඥ කණ්ටක යැ ... විඤ්ඤාණඤ්චායතන සමවත් පුහුල්හට ආකාසානඤ්චායතනසංඥ කණ්ටක යැ ... ආකිඤ්චඤ්ඤායතන සමවත් පුහුල්හට විඤ්ඤාණඤ්චායතනසංඥ කණ්ටක යැ .. නෙවසඤ්ඤානාසඤ්ඤායතන සමවත් පුහුල්හට ආකිඤ්චඤ්ඤායතනසංඥ කණ්ටක යැ .. සඤ්ඤාවෙදයිතනිරොධ සමවත් සමවත් පුහුල්හට සංඥ හා වෙදනා හා කණ්ටක යැ'යි භාග්‍යවතුන් විසින් වදාරනලද වෙයි. ඔහට සංඥත් වෙදනාත් ඇද්ද?

ප. පටි: එසේ නො කියයුතු යැ ...

සමාපන්නො සද්දං සුණාතී'ති කථා නිමි.

18. 9.

# චක්ඛුනා රූපං පස්සතීති කථා.

1 ස පු: චක්ඛුනා රූපං පස්සතීති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: රූපෙන රූපං පස්සතී'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

2. ස. පු: රූපෙන රූපං පස්සතී'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: රූපෙන රූපං පටිවිජානාතී'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

3. ස. පු: රූපෙන රූපං පටිවිජානාතී'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: රූපං මනොවිඤ්ඤාණන්ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

4. ස. පු: චක්ඛුනා රූපං පස්සතී'ති.

ප පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: අත්ථි චක්ඛුස්ස ආවට්ටනා - පෙ- පණිධී'ති.

ප පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

ස. අනු: හඤ්චි නත්ථි චක්ඛුස්ස ආවට්ටනා -පෙ- පණිධී'ති.

ප. පටිඤ්ඤා. ආමන්තා.

ස. ඨ: හඤ්චි නත්ථි චක්ඛුස්ස ආවට්ටනා -පෙ- පණිධි,

ස පා: නො ච වත රෙ වත්තබ්බෙ "චක්ඛුනා රූපං පස්සතී"ති.

18. 9.

## චක්ඛුනා රූපං පස්සතීති කථා

["චක්ඛුනා රූපං පස්සති - ඇසින් රූ දකී" යන වචන නිසා 'ප්‍රසාද චක්ෂුස ම රූප දක්නේ යැ'යි මහාසඞ්ඝිකයන් සෙයින් ලබ්ධි ගත්තවුන්ගේ වාද බිඳුනට 'චක්ඛුනා රූපං පස්සතීති කථා' එයි ]

1. ස. පු: ප්‍රසාද ඇසින් රූ දක්නේ වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: රුවින් රූ දක්නේ වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

2. ස. පු: රුවින් රූ දක්නේ වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ (චක්ෂුස් රූපය ගැන කළ ප්‍රතිඥා යි.)

ස. අනු: රුවින් රූ ප්‍රතිවිජානන කරන්නේ (දන්නේ) වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

3. ස පු: රුවින් රූ දන්නේ වේ ද?

ප පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: රූ මනොවිඥාන වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

4. ස. පු: ඇසින් රූප දක්නේ වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: චක්ෂුස්හුගේ ආවර්ජනායෙක් ... ප්‍රණිධියෙක් ඇද්ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ..

ස. අනු: චක්ෂුස්හුගේ ආවර්ජනායෙක් ... ප්‍රණිධියෙක් නැත් නු?

ප. පටිඤ්ඤා එසේ යැ.

ස. ඨ: ඉදින් චක්ෂුස්හුගේ ආවර්ජනායෙක් ... ප්‍රණිධියෙක් නැත් නම්,

ස. පා: භවත, 'ඇසින් රූප දක්නේ යැ'යි නො කියැයුතු මැ යැ.

5. ස. පු: සොතෙන සද්දං සුණාතී'ති -පෙ- ඝානෙන ගන්ධං ඝායතී'ති -පෙ- ජිව්හාය රසං සායතී'ති -පෙ- කායෙන පොට්ඨබ්බං ඵුසතී'ති.

ප. පටික්ඛෙප: ආමන්තා.

ස. අනු: රූපෙන රූපං ඵුසතී'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

6. ස. පු: රූපෙන රූපං ඵුසතී'ති.

ප. පටික්ඛෙප: ආමන්තා.

ස. අනු: රූපෙන රූපං පටිවිජානාතී'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

7. ස පු රූපෙන රූපං පටිවිජානාතී'ති.

ප. පටික්ඛෙප: ආමන්තා.

ස අනු: රූපං මනොවිඤ්ඤාණන්ති.

ප පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

8. ස පු: කායෙන ඵොට්ඨබ්බං ඵුසතී'ති

ප. පටික්ඛෙප ආමන්තා.

ස. අනු: අත්ථි කායස්ස ආවට්ටනා -පෙ- පණිධී'ති

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

ස. අනු: නනු අත්ථි කායස්ස ආවට්ටනා -පෙ- පණිධී'ති

ප. පටික්ඛෙප ආමන්තා.

ස. ඨ: හඤ්චි අත්ථි කායස්ස ආවට්ටනා -පෙ- පණිධි,

ස. පා: නො ච වත රෙ වත්තබ්බෙ "කායෙන ඵොට්ඨබ්බං ඵුසතී"ති.

5. ස. පු: කනින් හඬ අසන්නේ වේ ද? ... නැහැයෙන් ගඳ ආඝ්‍රාණ කරන්නේ වේ ද? ... දිවින් රස විඳින්නේ වේ ද? ... කයින් ස්ප්‍රෂ්ටව්‍ය ස්පර්ශ කරන්නේ වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: රූපයෙන් රූපය ස්පර්ශ කරන්නේ වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

6. ස. පු: රූවින් රූ පහස්නේ වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ

ස. අනු: රූවින් රූ දන්නේ වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

7. ස. පු: රූවින් රූ දන්නේ වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: රූපය මනොවිඥාන වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ..

8. ස. පු: කයින් පැහැසි පහස්නේ වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: කයට ආවර්තනායෙක් ... ප්‍රණිධියෙක් ඇද්ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

ස. අනු: කයට ආවර්තනායෙක් ... ප්‍රණිධියෙක් නැත් නු?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. ඨ: ඉදින් කයට ආවර්තනායෙක් ... ප්‍රණිධියෙක් නැත් නම්,

ස. පා: භවත, ‘කයින් පැහැසි පහස්නේ වේ’යයි නො කියැයුතු මැ යැ.

9. ප. පු: න වත්තබ්බං 'චක්ඛුනා රූපං පස්සති -පෙ- කායෙන ඵොට්ඨබ්බං ඵුසතී'ති.

ස. පටිඤ්ඤා: ආමන්තා.

ප. අනු: නනු වුත්තං භගවතා "ඉධ භික්ඛවෙ භික්ඛු චක්ඛුනා රූපං පස්සති -පෙ- කායෙන ඵොට්ඨබ්බං ඵුසතී'ති අත්ථෙ'ව සුත්තන්තො'ති.

ස. පටිඤ්ඤා: ආමන්තා.

ප. ආ: තෙන හි 'චක්ඛුනා රූපං පස්සති -පෙ- කායෙන ඵොට්ඨබ්බං ඵුසතී'ති.

චක්ඛුනා රූපං පස්සතී'ති කථා නිට්ඨිතා

අට්ඨාරසමො වග්ගො නිට්ඨිතො.

තස්ස උද්දානං.

බුද්ධො භගවා මනුස්සලොකෙ අට්ඨාසි, බුද්ධෙන භගවතා ධම්මො දෙසිතො, නත්ථි බුද්ධස්ස භගවතො කරුණා, බුද්ධස්ස භගවතො උච්චාරපස්සාවො අතිවිය අඤ්ඤෙ ගන්ධජාතෙ අධිගණ්හාති, එකෙන අරියමග්ගෙන චත්තාරි සාමඤ්ඤඵලානි සච්ඡිකරොති, ඣානා ඣානං සඞ්කමති, අත්ථි ඣානන්තරිකා, සමාපන්නො සද්දං සුණාති, චක්ඛුනා රූපං පස්සති -පෙ- කායෙන ඵොට්ඨබ්බං ඵුසති.

9. ප. පු: චක්ෂුසින් රූප දක්නේ යැ .. කයින් ස්ප්‍රෂ්ටව්‍ය ස්පර්ශ කරන්නේ යැ'යි නො කියැයුතු වේ ද?

ස. පටිඤ්ඤා: එසේ යැ.

ප. අනු: භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරන ලද නො: "මහණෙනි, මේ සස්නෙහි මහණ ඇසින් රූ දකී ... කයින් පැහැසි පහසී" යයි වදාළ සූත්‍රාන්ත-යෙක් ඇත්තේ මැ නො?

ස. පටිඤ්ඤා: එසේ යැ.

ප. ආ: එකරුණින් 'ඇසින් රූ දකී ... කයින් පැහැසි පහසි'.

චක්ඛුනා රූපං පස්සතීති කථා නිමි.

අටළොස්වැනි වග නිමි.

එහි උද්දානය:

මනුස්සලොකකථා යැ ධම්මදෙසනාකථා යැ කරුණාකථා යැ ගන්ධජාතකථා යැ එකමග්ගකථා යැ ඣානසඞ්කන්ති කථා යැ ඣානන්තරිකකථා යැ සමාපන්නො සද්දං සුණාතීතිකථා යැ චක්ඛුනා රූපං පස්සතී'තිකථා යි.

## එකූනවීසතිමො වග්ගො

### 19. 1.

### කිලෙසජහන කථා.

1. ස. පු: අතීතෙ කිලෙසෙ ජහතී'ති.
ප. පටිඤ්ඤා: ආමන්තා.
ස. අනු: නිරුද්ධං නිරොධෙති, විගතං විගමෙති, ඛීණං ඛෙපෙති, අත්ථඞ්ගතං අත්ථඞ්ගමෙති, අබ්භත්ථඞ්ගතං අබ්භත්ථඞ්ගමෙතීති.
ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

2. ස. පු: අතීතෙ කිලෙසෙ ජහතී'ති.
ප. පටිඤ්ඤා: ආමන්තා.
ස. අනු: නනු අතීතං නිරුද්ධන්ති.
ප. පටිඤ්ඤා: ආමන්තා.
ස. ඨ: හඤ්චි අතීතං නිරුද්ධං.
ස. පා: නො ච වත රෙ වත්තබ්බෙ "අතීතෙ කිලෙසෙ ජහතී"ති.

3. ස. පු. අතීතෙ කිලෙසෙ ජහතී'ති.
ප. පටිඤ්ඤා: ආමන්තා.
ස. අනු: නනු අතීතං නත්ථී'ති
ස. පටිඤ්ඤා: ආමන්තා.
ස. ඨ: හඤ්චි අතීතං නත්ථි,
ස. පා: නො ච වත රෙ වත්තබ්බෙ "අතීතෙ කිලෙසෙ ජහතී"ති.

4. ස. පු: අනාගතෙ කිලෙසෙ ජහතී'ති.
ප. පටිඤ්ඤා: ආමන්තා.

# එකුන් විසි වැනි වර්ගය.

## 19. 1.

## කිලෙසජහන කථා.

['ප්‍රහීණ ක්ලේශ ඇතියාහට අතීතක්ලේශයෝත් අනාගතක්ලේශයෝත් ප්‍රත්‍යුත්පන්නක්ලේශයෝත් ප්‍රහීණ වූවාහු මැ වෙති. එහෙයින් අතීතයෙහි දු අනාගතයෙහි දු ප්‍රත්‍යුත්පන්නයෙහි දු ක්ලේශක්‍ෂය කෙරෙති'යි සමහර උත්තරාපථකයන් සෙයින් ලබ්ධිගත්තවුන්ගේ වාද බිඳුනට 'කිලෙසජහන කථා' එයි ]

1 ස. පු: අතීත කෙලෙසුන් දුරු කරන්නේ වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: නිරුද්ධ කෙලෙස් නිරුද්ධ කෙරේ ද, විගත කෙලෙස් විගමන කෙරේ ද, ක්‍ෂීණ කෙලෙස් ක්‍ෂය කෙරේ ද, අස්තඞ්ගත කෙලෙස් අස්තඞ්ගමන කෙරේ ද, අභ්‍යස්තඞ්ගත කෙලෙස් අභ්‍යස්තඞ්ගමන කෙරේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

2 ස. පු: අතීත කෙලෙසුන් හැරපියන්නේ වේද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: අතීතය නිරුද්ධ වූයේ නො?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. ඨ: ඉදින් අතීතය නිරුද්ධ වී නම්,

ස. පා: හවත, 'අතීත කෙලෙසුන් හැරපියති' නො කියැයුතු මැ යැ.

3. ස. පු: අතීත කෙලෙසුන් හැරපියන්නේ වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: අතීතය නැත් නො?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. ඨ: ඉදින් අතීතය නැත් නම්,

ස. පා: හවත, "අතීත කෙලෙසුන් හැරපියති" නො කියැයුතු මැ යැ.

4. ස. පු: අනාගත කෙලෙසුන් හැරපියන්නේ වේද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: අජාතං අජනෙති, අසඤ්ජාතං අසඤ්ජනෙති, අනිබ්බත්තං අනිබ්බත්තෙතයි, අපාතුභූතං අපාතු-භාවෙතී'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ –පෙ-

5. ස. පු: අනාගතෙ කිලෙසෙ ජහතී'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: නනු අනාගතං අජාතනති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. ඨ: හඤ්චි අනාගතං අජාතං,

ස. පා: නො ච වත රෙ වත්තබ්බෙ "අනාගතෙ කිලෙසෙ ජහතී"ති.

6. ස. පු: අනාගතෙ කිලෙසෙ ජහතී'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: නනු අනාගතං නත්‍ථී'ති.

ස. පටිඤ්ඤා: ආමන්තා.

ස. ඨ: හඤ්චි අනාගතං නත්‍ථි,

ස. පා: නො ච වත රෙ වත්තබ්බෙ "අනාගතෙ කිලෙසෙ ජහතී"ති.

7. ස. පු: පච්චුප්පන්නෙ කිලෙසෙ ජහතී'ති.

ප. පටි: ආමන්තා.

ස. අනු: රත්තො රාගං ජහති, දුට්ඨො දොසං ජහති, මූළ්හො මොහං ජහති, කිලිට්ඨො කිලෙසෙ ජහතී'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

ස. අනු: රාගෙන රාගං ජහති, දොසෙන දොසං ජහති, මොහෙන මොහං ජහති, කිලෙසෙහි කිලෙසෙ ජහතී'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

8. ස. පු: රාගො චිත්තසම්පයුත්තො, මග්ගො චිත්තසම්ප-යුත්තො'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා

| | |
|---|---|
| ස. අනු: | නූපන්නේ නූපදනේ වේ ද? නො හටගත්තේ නො හටගන්නේ වේ ද? නො නිපන්නේ නිපන් නොවන්නේ වේ ද? නො පහළ වූයේ නො පහළ වන්නේ වේ ද? |
| ප පටි: | එසේ නො කියැ යුතු යැ ... |
| 5. ස. පු: | අනාගත කෙලෙසුන් හැරපියන්නේ වේ ද? |
| ප. පටිඤ්ඤ: | එසේ යැ. |
| ස. අනු: | අනාගතය අජාත නො? |
| ප. පටිඤ්ඤ: | එසේ යැ. |
| ස. ඨ: | ඉදින් අනාගතය අජාත වී නම්, |
| ස. පා: | හවත, 'අනාගත කෙලෙසුන් හැරපියති' නො කියැයුතු මැ යැ. |
| 6. ස. පු: | අනාගත කෙලෙසුන් හැරපියන්නේ වේ ද? |
| ප. පටිඤ්ඤ: | එසේ යැ. |
| ස. අනු: | අනාගතය නැත් නො? |
| ප. පටිඤ්ඤ: | එසේ යැ. |
| ස. ඨ: | ඉදින් අනාගතය නැත් නම්, |
| ස. පා: | හවත, 'අනාගත කෙලෙසුන් හැරපියති' නො කියැයුතු මැ යැ. |
| 7. ස. පු: | ප්‍රත්‍යුත්පන්න කෙලෙසුන් හැරපියන්නේ වේ ද? |
| ප. පටිඤ්ඤ: | එසේ යැ. |
| ස. අනු: | රක්ත වූයේ රාගය හැරපියා ද, දුෂ්ට වූයේ ද්වෙෂය හැරපියා ද, මූඪ වූයේ මොහය හැරපියා ද, ක්ලිෂ්ට වූයේ ක්ලෙශ හැරපියා ද? |
| ප. පටි: | එසේ නො කියැයුතු යැ ... |
| ස. අනු: | රාගයෙන් රාගය හැරපියා ද, ද්වෙෂයෙන් ද්වෙෂය හැරපියා ද, මොහයෙන් මොහය හැරපියා ද, ක්ලෙශයෙන් ක්ලෙශ හැරපියා ද? |
| ප. පටි: | එසේ නො කියැයුතු යැ ... |
| 8. ස. පු: | රාගය චිත්තසම්ප්‍රයුක්ත වේ ද, මාර්ගය චිත්ත-සම්ප්‍රයුක්ත වේ ද? |
| ප. පටිඤ්ඤ: | එසේ යැ. |

ස. අනු: ද්වින්නං ඵස්සානං -පෙ- ද්වින්නං චිත්තානං සමොධානං හොතී'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

9. ස. පු: රාගො අකුසලො, මග්ගො කුසලො'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: කුසලාකුසලා සාවජ්ජානවජ්ජා හීනප්පණීතා කණ්හසුක්කසප්පටිභාගා ධම්මා සම්මුඛීභාවං ආගච්ඡන්ති'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

10. ස. පු: කුසලාකුසලා සාවජ්ජානවජ්ජා හීනප්පණීතා කණ්හසුක්කසප්පටිභාගා ධම්මා සම්මුඛීභාවං ආගච්ඡන්තී'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: නනු වුත්තං භගවතා "චත්තාරිමානි භික්ඛවෙ සුවිදූරවිදූරානි, කතමානි චත්තාරි: නභඤ්ච භික්ඛවෙ පඨවී ච ඉදං පඨමං සුවිදූරවිදූරං -පෙ- තස්මා සතං ධම්මො අසබ්භි ආරකා"ති[a] අත්ථෙ'ව සුත්තන්තො'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. පා: තෙන හි න වත්තබ්බං 'කුසලාකුසලා -පෙ- සම්මුඛීභාවං ආගච්ඡන්ති'ති

11. ප. පු: න වත්තබ්බං අතීතෙ කිලෙසෙ ජහති, අනාගතෙ කිලෙසෙ ජහති, පච්චුප්පන්නෙ කිලෙසෙ ජහතී'ති.

ස පටිඤ්ඤා: ආමන්තා.

ප. අනු: නත්ථි කිලෙසෙ ජහතී'ති[1].

ස. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

ප. පා: තෙන හි "අතීතෙ කිලෙසෙ ජහති, අනාගතෙ කිලෙසෙ ජහති, පච්චුප්පන්නෙ කිලෙසෙ ජහතී'ති.

කිලෙසජහන කථා නිට්ඨිතා.

---

a චතුක්කඞ්ගුත්තර - රොහිතස්සවග්ග

1 කිලෙසජහනාති - PTS

ස අනු: සප්තයින් දෙදෙනකුන්ගේ ... චිත්තයන් දෙදෙනකුන්ගේ සමවධානා වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

9. ස. පු. රාගය අකුශල වේ ද, මාර්ගය කුශල වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: කුශලාකුශල, සාවද්‍යානවද්‍ය, හීනප්‍රණීත, කෘෂ්ණශුක්ලසප්‍රතිභාග ධර්මයෝ සම්මුඛීභාවයට එත් ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

10. ස. පු: කුශලාකුශල, සාවද්‍යානවද්‍ය, හීනප්‍රණීත, කෘෂ්ණශුක්ලසප්‍රතිභාග ධර්මයෝ සම්මුඛීභාවයට එත් ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරන ලද මැ නු: "මහණෙනි, මේ සුවිදූරවිදූරයෝ සතර දෙනෙකි. කවර සතර දෙනෙක යත්: මහණෙනි, අහස හා පොළොව හා මේ දෙක පළමු වන සුවිදූරවිදූර යැ ... එහෙයින් සත්පුරුෂයන්ගේ ධර්මය අසත්පුරුෂයන් කෙරෙන් දුරු වේ"යයි වදාළ සූත්‍රාන්තයෙක් ඇත්තේ මැ නො?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. පා: එකරුණින් 'කුශලාකුශල ... සම්මුඛීභාවයට එති' නො කියැයුතු යැ.

11 ප. පු: 'අතීත කෙලෙසුන් හැරපියයි, අනාගත කෙලෙසුන් හැරපියයි, ප්‍රත්‍යුත්පන්න කෙලෙසුන් හැරපියයි' යනු නො කියැයුතු වේ ද?

ස. පටිඤ්ඤා: එසේ යැ.

ප. අනු: කෙලශ ජහන නැත් ද?

ස. පටිඤ්ඤා: එසේ නො කියැයුතු යැ ...

ප. පා: එකරුණින් "අතීත කෙලෙසුන් හැරපියයි, අනාගත කෙලෙසුන් හැරපියයි, ප්‍රත්‍යුත්පන්න කෙලෙසුන් හැරපියයි".

කිලෙශ ජහන කථා නිමි.

19. 2.

## සුඤ්ඤතා කථා.

1\. ස. පු: සුඤ්ඤතා සඞ්ඛාරක්ඛන්ධපරියාපන්නා'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: අනිමිත්තං සඞ්ඛාරක්ඛන්ධපරියාපන්නන්ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

2\. ස. පු: සුඤ්ඤතා සඞ්ඛාරක්ඛන්ධපරියාපන්නා'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: අප්පණිහිතො සඞ්ඛාරක්ඛන්ධපරියාපන්නො'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

3\. ස. පු: අනිමිත්තං න වත්තබ්බං සඞ්ඛාරක්ඛන්ධපරියාපන්නන්ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: සුඤ්ඤතා න වත්තබ්බා සඞ්ඛාරක්ඛන්ධපරියාපන්නා'ති.

ප පටි. න හෙවං වත්තබ්බෙ -පෙ-

4\. ස. පු: අප්පණිහිතො න වත්තබ්බො සඞ්ඛාරක්ඛන්ධපරියාපන්නො'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: සුඤ්ඤතා න වත්තබ්බා සඞ්ඛාරක්ඛන්ධපරියාපන්නා'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

5\. ස පු: සුඤ්ඤතා සඞ්ඛාරක්ඛන්ධපරියාපන්නා'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: සඞ්ඛාරක්ඛන්ධො න අනිච්චො න සඞ්ඛතො න පටිච්චසමුප්පන්නො න ඛයධම්මො න වයධම්මො න විරාගධම්මො න නිරොධධම්මො න විපරිණාමධම්මො'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

## 19. 2.

## සුඤ්ඤතා කථා

[ශූන්‍යතාව 'ස්කන්ධයන්ගේ අනාත්මලක්ෂණ යැ, නිර්වාණ යැ'යි ද්විවිධයි. ඔවුනතුරෙහි අනාත්මලක්ෂණය එක් අයුරෙකින් සංස්කාරස්කන්ධපර්‍යාපන්න වෙයි නිර්වාණය අපර්‍යාපන්න මැ වෙයි. මේ වෙනස නො ගෙන 'ශූන්‍යතාව සංස්කාරස්කන්ධපර්‍යාපන්න වෙති'යි අන්ධකයන් සෙයින් ලබ්ධි ගත්තවුන්ගේ වාද බිඳුනම 'සුඤ්ඤතාකථා' එයි.]

1. ස. පු: ශූන්‍යතාව සංස්කාරස්කන්ධපර්‍යාපන්න වේ ද?
ප. පටිඤ්ඤා: එසේ යැ.
ස. අනු: අනිමිත්තය සංස්කාරස්කන්ධපර්‍යාපන්න වේ ද?
ප. පටි: එසේ නො කියැයුතු යැ ..

2. ස. පු: ශූන්‍යතාව සංස්කාරස්කන්ධපර්‍යාපන්න වේ ද?
ප. පටිඤ්ඤා: එසේ යැ.
ස. අනු: අප්‍රණිහිතය සංස්කාරස්කන්ධපර්‍යාපන්න වේ ද?
ප. පටි: එසේ නො කියැයුතු යැ ...

3. ස. පු: 'අනිමිත්තය සංස්කාරස්කන්ධපර්‍යාපන්න වෙති' නො කියැයුතු වේ ද?
ප. පටිඤ්ඤා: එසේ යැ.
ස. අනු: ශූන්‍යතාව සංස්කාරස්කන්ධපර්‍යාපන්න වෙති' නො කියැයුතු වේ ද?
ප. පටි: එසේ නො කියැයුතු යැ ...

4. ස. පු: 'අප්‍රණිහිතය සංස්කාරස්කන්ධපර්‍යාපන්න වෙති' නො කියැයුතු වේ ද?
ප. පටිඤ්ඤා: එසේ යැ.
ස. අනු: ශූන්‍යතාව ස සකාරස්කන්ධපර්‍යාපන්න වෙති' නො කියැයුතු වේ ද?
ප. පටි: එසේ නො කියැයුතු යැ ...

5. ස. පු: ශූන්‍යතාව සංස්කාරස්කන්ධපර්‍යාපන්න වේ ද?
ප. පටිඤ්ඤා: එසේ යැ.
ස. අනු: සංස්කාරස්කන්ධය අනිත්‍ය නො වත්තේ වේ ද, සංස්කෘත නො වත්තේ වේ ද, ප්‍රතීත්‍යසමුත්පන්න නො වත්තේ වේ ද, ක්ෂයස්වභාව නො වත්තේ වේ ද, ව්‍යයස්වභාව නො වත්තේ වේ ද, නිරෝධස්වභාව නො වත්තේ වේද, විපරිණාම ස්වභාව නො වත්තේ වේ ද?
ප. පටි: එසේ නො කියැයුතු යැ ...

ස. අනු: නනු සඞ්ඛාරක්ඛන්ධො අනිච්චො සඞ්ඛතො පටිච්චසමුප්පන්නො ඛයධම්මො වයධම්මො විරාගධම්මො නිරොධධම්මො විපරිණාමධම්මො’ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. ඨ: හඤ්චි සඞ්ඛාරක්ඛන්ධො අනිච්චො -පෙ- විපරිණාමධම්මො,

ස. පා: නො ච වත රෙ වත්තබ්බෙ “සුඤ්ඤතා සඞ්ඛාරක්ඛන්ධපරියාපන්නා’ති

6. ස. පු: රූපක්ඛන්ධස්ස සුඤ්ඤතා සඞ්ඛාරක්ඛන්ධපරියාපන්නා’ති

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: සඞ්ඛාරක්ඛන්ධස්ස සුඤ්ඤතා රූපක්ඛන්ධපරියාපන්නා’ති

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

7. ස. පු: වෙදනා -පෙ- සඤ්ඤා -පෙ- විඤ්ඤාණක්ඛන්ධස්ස සුඤ්ඤතා සඞ්ඛාරක්ඛන්ධපරියාපන්නා’ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: සඞ්ඛාරක්ඛන්ධස්ස සුඤ්ඤතා විඤ්ඤාණක්ඛන්ධපරියාපන්නාති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

8. ස. පු: සඞ්ඛාරක්ඛන්ධස්ස සුඤ්ඤතා න වත්තබ්බා රූපක්ඛන්ධපරියාපන්නා’ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: රූපක්ඛන්ධස්ස සුඤ්ඤතා න වත්තබ්බා “සඞ්ඛාරක්ඛන්ධපරියාපන්නා’ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

9. ස. පු: සඞ්ඛාරක්ඛන්ධස්ස සුඤ්ඤතා න වත්තබ්බා වෙදනා -පෙ- සඤ්ඤා -පෙ- විඤ්ඤාණක්ඛන්ධපරියාපන්නා’ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: විඤ්ඤාණක්ඛන්ධස්ස සුඤ්ඤතා න වත්තබ්බා සඞ්ඛාරක්ඛන්ධපරියාපන්නා’ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

ස. අනු: සංස්කාරස්කන්ධය අනිත්‍ය සංස්කෘත ප්‍රතීත්‍ය-සමුත්පන්න ක්ෂයස්වභාව ව්‍යයස්වභාව විරාග-ස්වභාව නිරෝධස්වභාව විපරිණාමස්වභාව ඇත්තේ නො?

ප. පටික්ඛේප: එසේ යැ.

ස. ඨ ඉදින් සංස්කාරස්කන්ධය අනිත්‍ය ... විපරිණාම-ස්වභාව ඇති වී නම්.

ස. පා භවත, 'ශූන්‍යතාව සංස්කාරස්කන්ධපර්‍ය්‍යාපන්න වේ' යයි නො කියැයුතු මැ යැ.

6. ස පු: රූපස්කන්ධයාගේ ශූන්‍යතාව සංස්කාරස්කන්ධපර්‍ය්‍යා-පන්න වේ ද?

ප. පටික්ඛේප: එසේ යැ.

ස අනු: සංස්කාරස්කන්ධයාගේ ශූන්‍යතාව රූපස්කන්ධපර්‍ය්‍යා-පන්න වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

7. ස. පු: වේදනා ... සංඥා ... විඥානස්කන්ධයාගේ ශූන්‍යතාව සංස්කාරස්කන්ධ පර්‍ය්‍යාපන්න වේ ද?

ප පටික්ඛේප: එසේ යැ.

ස. අනු: සංස්කාරස්කන්ධයාගේ ශූන්‍යතාව විඥානස්කන්ධ-පර්‍ය්‍යාපන්න වේ ද?

ප පටික්ඛේප එසේ නො කියැයුතු යැ ...

8. ස පු: සංස්කාරස්කන්ධයාගේ ශූන්‍යතාව රූපස්කන්ධ-පර්‍ය්‍යාපන්න වේ යයි නො කියැයුතු වේ ද?

ප. පටික්ඛේප: එසේ යැ.

ස අනු: රූපස්කන්ධයාගේ ශූන්‍යතාව 'සංස්කාරස්කන්ධ-පර්‍ය්‍යාපන්න වේ' යයි නො කියැයුතු වේ ද?

ප පටි: එසේ නො කියැයුතු යැ ...

9 ස පු: සංස්කාරස්කන්ධයාගේ ශූන්‍යතාව වේදනා ... සංඥා .. විඥානස්කන්ධපර්‍ය්‍යාපන්න වෙති' නො කියැයුතු වේ ද?

ප. පටික්ඛේප. එසේ යැ.

ස. අනු: 'විඥානස්කන්ධයාගේ ශූන්‍යතාව සංස්කාරස්කන්ධ-පර්‍ය්‍යාපන්න වෙති' නො කියැයුතු වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

10. ප. පු: න වත්තබ්බං සුඤ්ඤතා සඞ්ඛාරක්ඛන්ධපරියාපන්නා'ති.

ස. පටිඤ්ඤා: ආමන්තා.

ප. අනු: නනු වුත්තං භගවතා "සුඤ්ඤමිදං භික්ඛවෙ සඞ්ඛාරා අත්තෙන වා අත්තනියෙන වා"තිa අත්ථෙව සුත්තන්තො'ති.

ස. පටිඤ්ඤා: ආමන්තා.

ප. පා: තෙන හි "සුඤ්ඤතා සඞ්ඛාරක්ඛන්ධපරියාපන්නා"ති.

සුඤ්ඤතා කථා නිට්ඨිතා.

a මජ්ඣිමනිකාය -

10. ප. පු: 'ශූන්‍යතාව සංස්කාරස්කන්ධපර්‍යාපන්න වෙයි' යනු නො කියැයුතු වේ ද?

ස. පටිඤ්ඤා: එසේ යැ.

ප. අනු: භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරනලද මැ නු: "මහණෙනි, යම් සංස්කාර කෙනෙක් ඇද්ද, ආත්ම හෙයින් වේවයි ආත්මීය හෙයින් වේවයි මේ ශූන්‍ය වෙති' වදාළ සූත්‍රාන්තයෙක් ඇත්තේ මැ නො?

ස. පු. එසේ යැ.

ප. පා: එකරුණින් 'ශූන්‍යතාව සංස්කාරස්කන්ධපර්‍යාපන්න වෙයි'.

සුඤ්ඤතා කථා නිමි.

## 19. 3.

# සාමඤ්ඤඵල කථා

1. ස. පු: සාමඤ්ඤඵලං අසඞ්ඛතන්ති.
ප. පටිඤ්ඤා: ආමන්තා.
ස. අනු: නිබ්බානං තාණං ලෙණං සරණං පරායණං අච්චුතං අමතන්ති.
ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

2. ස. පු: සාමඤ්ඤඵලං අසඞ්ඛතං, නිබ්බානං අසඞ්ඛතන්ති.
ප. පටිඤ්ඤා: ආමන්තා.
ස. අනු: ද්වෙ අසඞ්ඛතානීති.
ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

3. ස. පු: ද්වෙ අසඞ්ඛතානී'ති.
ප. පටිඤ්ඤා: ආමන්තා.
ස. අනු: ද්වෙ තාණානි -පෙ- අනන්තරිකාවාති.
ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

4. ස. පු: සාමඤ්ඤඵලං අසඞ්ඛතන්ති.
ප. පටිඤ්ඤා: ආමන්තා.
ස. අනු: සාමඤ්ඤං සඞ්ඛතන්ති.
ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

5. ස. පු: සාමඤ්ඤං අසඞ්ඛතන්ති.
ප. පටිඤ්ඤා: ආමන්තා.
ස. අනු: සාමඤ්ඤඵලං අසඞ්ඛතන්ති.
ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

---

1. අනන්තරිකාමාති - PTS.

## 19 3.

# සාමඤ්ඤඵල කථා.

[මාර්ගවීථියෙහිදු ඵලසමාපත්තිවීථියෙහිදු ආර්යමාර්ගයාගේ විපාක-චිත්තය ශ්‍රාමණ්‍යඵල නමැයි ස්වසමයෙහි සනිටුහන් වෙයි. එසේ නොගෙන ක්ලේශප්‍රහාණයත් ඵලෝත්පත්තියත් ශ්‍රාමණ්‍ය ඵල වෙති'යි ද එහෙයින් අසංස්කෘත වෙති'ද පූර්වශෛලීයනිකායවාසීන් සෙයින් ලබ්ධි ගත්තවුන්ගේ වාද බිඳුනට 'සාමඤ්ඤඵල කථා' එයි.]

1\. ස. පු: ශ්‍රාමණ්‍යඵල අසංස්කෘත වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: නිර්වාණය ත්‍රාණ ලෙණ සරණ පරයණ අච්‍යුත වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

2\. ස පු: (තොප මතයෙහි) ශ්‍රාමණ්‍යඵල අසංස්කෘත වෙයි. නිර්වාණය අසංස්කෘත වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: අසංස්කෘතයෝ දෙදෙනෙක් වෙත් ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

3 ස. පු: අසංස්කෘතයෝ දෙදෙනෙක් වෙත් ද?

ප. පටි: එසේ යැ.

ස. අනු: ත්‍රාණයෝ දෙදෙනෙක් ඇද්ද ... අනන්තරිකාවෝ දෙදෙනෙක් ඇද්ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

4\. ස. පු: ශ්‍රාමණ්‍යඵල අසංස්කෘත වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: ශ්‍රාමණ්‍යය සංස්කෘත වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

5\. ස. පු: ශ්‍රාමණ්‍යය අසංස්කෘත වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස අනු: ශ්‍රමණ්‍යඵල අසංස්කෘත වේ ද?

ප. පටිː එසේ නො කියැයුතු යැ ...

| | |
|---|---|
| 6. ස. පු: | සොතාපත්තිඵලං අසඞ්ඛතන්ති. |
| ප. පටිඤ්ඤා: | ආමන්තා. |
| ස. අනු: | සොතාපත්තිමග්ගො අසඞ්ඛතො. |
| ප. පටි: | න හෙවං වත්තබ්බෙ -පෙ- |
| 7. ස. පු: | සොතාපත්තිමග්ගො සඞ්ඛතො'ති. |
| ප. පටිඤ්ඤා: | ආමන්තා. |
| ස. අනු: | සොතාපත්තිඵලං සඞ්ඛතන්ති. |
| ප. පටි: | න හෙවං වත්තබ්බෙ -පෙ- |
| 8. ස. පු: | සකදාගාමි -පෙ- අනාගාමි -පෙ- අරහත්තඵලං අසඞ්ඛතන්ති. |
| ප. පටිඤ්ඤා: | ආමන්තා. |
| ස. අනු: | අරහත්තමග්ගො අසඞ්ඛතො. |
| ප. පටි: | න හෙවං වත්තබ්බෙ -පෙ- |
| 9. ස. පු: | අරහත්තමග්ගො සඞ්ඛතො'ති. |
| ප. පටිඤ්ඤා: | ආමන්තා. |
| ස. අනු: | අරහත්තඵලං සඞ්ඛතන්ති. |
| ප. පටි: | න හෙවං වත්තබ්බෙ -පෙ- |
| 10. ස. පු: | සොතාපත්තිඵලං අසඞ්ඛතං, සකදාගාමි -පෙ- අනාගාමි -පෙ- අරහත්තඵලං අසඞ්ඛතං, නිබ්බානං අසඞ්ඛතන්ති. |
| ප. පටිඤ්ඤා: | ආමන්තා. |
| ස. අනු: | පඤ්ච අසඞ්ඛතානී'ති. |
| ප. පටි: | න හෙවං වත්තබ්බෙ -පෙ- |
| 11. ස. පු: | අසඞ්ඛතානී'ති. |
| ප. පටිඤ්ඤා: | ආමන්තා. |
| ස. අනු: | පඤ්ච තාණානි -පෙ- අන්තරිකා වා'ති. |
| ප. පටි: | න හෙවං වත්තබ්බෙ -පෙ- |

සාමඤ්ඤඵල කථා නිට්ඨිතා.

6. ස. පු: ශ්‍රොතාපත්තිඵලය අසංස්කෘත වේ ද?

ප. පටිඤ්ඤා එසේ යැ.

ස. අනු: ශ්‍රොතාපත්තිමාර්ගය අසංස්කෘත වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

7. ස. පු: ශ්‍රොතාපත්තිමාර්ගය සංස්කෘත වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස අනු: ශ්‍රොතාපත්තිඵල සංස්කෘත වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

8. ස. පු: සකෘදාගාමි... අනාගාමි... අර්හත්ත්වඵලය අසංස්කෘත වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: අර්හත්ත්වමාර්ගය අසංස්කෘත වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

9. ස. පු: අර්හත්ත්වමාර්ගය සංස්කෘත වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: අර්හත්ත්වඵල සංස්කෘත වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ,

10. ස. පු: ශ්‍රොතාපත්තිඵල අසංස්කෘත වේ ද, සකෘදාගාමි ... අනාගාමි ... අර්හත්ත්වඵල අසංස්කෘත වේ ද, නිර්වාණය අසංස්කෘත වේ ද?

ප පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: අසංස්කෘතයෝ පස්දෙනෙක් ඇද්ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

11. ස. පු: අසංස්කෘතයෝ පස්දෙනෙක් ඇද්ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: ත්‍රාණයෝ පස්දෙනෙක් ඇද්ද, ... අනන්තරිකාවෝ පස් දෙනෙක් ඇද්ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

සාමඤ්ඤඵල කථා නිමි.

## 19. 4.

# පත්ති කථා

1. ස. පු: පත්ති අසඞ්ඛතා'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: තාණං ලෙණං සරණං පරායනං අච්චුතං අම-තන්ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

2. ස. පු: පත්ති අසඞ්ඛතා, නිබ්බානං අසඞ්ඛතන්ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: ද්වෙ අසඞ්ඛතානී'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

3. ස. පු: ද්වෙ අසඞ්ඛතානී'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: ද්වෙ තාණානි -පෙ- [ද්වෙ] අන්තරිකා වා'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

4. ස. පු: චීවරස්ස පත්ති අසඞ්ඛතා'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: නිබ්බානං -පෙ- අමතන්ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

5. ස. පු: චීවරස්ස පත්ති අසඞ්ඛතා, නිබ්බානං අසඞ්ඛ-තන්ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: ද්වෙ අසඞ්ඛතානී'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

6. ස. පු: ද්වෙ අසඞ්ඛතානී'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: ද්වෙ තාණානි, -පෙ- [ද්වෙ] අන්තරිකා වා'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

## 19. 4.

## පත්තිකථා

[ප්‍රතිලාභය ප්‍රාප්ති නමු එ අසංස්කෘත වෙතියි පූර්වශෛලීයනිකායවංසින් සෙයින් ලබ්ධි ගත්තවුන්ගේ වාද බිඳුනම 'පත්ති කථා' එයි.]

1 ස. පු: ප්‍රාප්ති අසංස්කෘත වේ ද?
ප. පටිඤ්ඤ: එසේ යැ.
ස. අනු: ත්‍රාණ ලෙණ සරණ පරායණ අච්‍යුත අමෘත වේ ද?
ප. පටි: එසේ නො කියැයුතු යැ ...

2. ස. පු: ප්‍රාප්ති අසංස්කෘත වෙයි, නිර්වාණ අසංස්කෘත වේ ද?
ප. පටිඤ්ඤ: එසේ යැ.
ස. අනු: අසංස්කෘතයෝ දෙදෙනෙක් ඇද්ද?
ප. පටි: එසේ නො කියැයුතු යැ ...

3. ස. පු: අසංස්කෘතයෝ දෙදෙනෙක් ඇද්ද?
ප. පටිඤ්ඤ: එසේ යැ.
ස. අනු: ත්‍රාණයෝ දෙදෙනෙක් ඇද්ද, ... අනන්තරිකාවෝ දෙදෙනෙක් ඇද්ද?
ප. පටිඤ්ඤ: එසේ නො කියැයුතු යැ ...

4 ස. පු: චීවරයාගේ ප්‍රාප්තිය අසංස්කෘත වේ ද?
ප. පටිඤ්ඤ: එසේ යැ.
ස. අනු: නිර්වාණය ... අමෘත වේ ද?
ප. පටි: එසේ නො කියැයුතු යැ ...

5. ස. පු: චීවර ප්‍රාප්තිය අසංස්කෘත වෙයි, නිර්වාණය අසංස්කෘත වේ ද?
ප. පටිඤ්ඤ: එසේ යැ.
ස. අනු: අසංස්කෘතයෝ දෙදෙනෙක් ඇද්ද?
ප. පටි: එසේ නො කියැයුතු යැ ...

6. ස. පු: අසංස්කෘතයෝ දෙදෙනෙක් ඇද්ද?
ප. පටිඤ්ඤ: එසේ යැ.
ස. අනු: ත්‍රාණයෝ දෙදෙනෙක් ඇද්ද ... අනන්තරිකාවෝ දෙදෙනෙක් ඇද්ද?
ප. පටි: එසේ නො කියැයුතු යැ ...

7. ස. පු: පිණ්ඩපාතස්ස -පෙ- සෙනාසනස්ස -පෙ- ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරස්ස පත්ති අසඞ්ඛතා'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: නිබ්බානං -පෙ- අච්චුතං අමතන්ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

8. ස. පු: ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරස්ස පත්ති අසඞ්ඛතා, නිබ්බානං අසඞ්ඛතන්ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: ද්වෙ අසඞ්ඛතානී'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

9. ස. පු: ද්වෙ අසඞ්ඛතානී'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: ද්වෙ තාණානි -පෙ- [ද්වෙ] අන්තරිකා වා'ති.

ප පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

10. ස. පු: චීවරස්ස පත්ති අසඞ්ඛතා -පෙ- පිණ්ඩපාතස්ස -පෙ- සෙනාසනස්ස -පෙ- ගිලානපච්චයභෙසජ්ජ-පරික්ඛාරස්ස පත්ති අසඞ්ඛතා, නිබ්බානං අසඞ්ඛතන්ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: පඤ්ච අසඞ්ඛතානී'ති.

ප පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

11. ස. පු: පඤ්ච අසඞ්ඛතානී'ති.

ප පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: පඤ්ච තාණානි -පෙ- [පඤ්ච] අන්තරිකා වා'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

12. ස පු: පඨමස්ස ඣානස්ස පත්ති අසඞ්ඛතා (එවං සබ්බං විත්ථාරෙතබ්බං), දුතියස්ස ඣානස්ස -පෙ- තතියස්ස ඣානස්ස -පෙ- චතුත්ථස්ස ඣානස්ස-පෙ- ආකාසා-නඤ්චායතනස්ස -පෙ- විඤ්ඤාණඤ්චායතනස්ස -පෙ- ආකිඤ්චඤ්ඤායතනස්ස -පෙ- නෙවසඤ්ඤා-නාසඤ්ඤායතනස්ස -පෙ- සොතාපත්තිමග්ගස්ස -පෙ- සොතාපත්තිඵලස්ස -පෙ-සකදාගාමිමග්ගස්ස -පෙ- සකදාගාමිඵලස්ස -පෙ- අනාගාමිමග්ගස්ස -පෙ- අනාගාමිඵලස්ස -පෙ- අරහත්තමග්ගස්ස -පෙ- අරහත්තඵලස්ස පත්ති අසඞ්ඛතා'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

7. ස. පු: පිණ්ඩපාත .. ශයනාසන ... ග්ලානප්‍රත්‍යය භෛෂජ්‍යපරිෂ්කාර ප්‍රාප්ති අසංස්කෘත වේ ද?

ප පටිඤ්ඤා: එසේ යැ.

ස අනු: නිර්වාණය ... අච්‍යුතය අමෘතය වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

8 ස. පු: ග්ලානප්‍රත්‍යයභෛෂජ්‍යපරිෂ්කාර ප්‍රාප්ති අසංස්කෘත වෙයි. නිර්වාණය අසංස්කෘත වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: අසංස්කෘතයෝ දෙදෙනෙක් ඇද්ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

9. ස පු: අසංස්කෘතයෝ දෙදෙනෙක් ඇද්ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස අනු: ත්‍රාණයෝ දෙදෙනෙක් අනන්තරිකාවෝ දෙදෙනෙක් ඇද්ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ

10. ස. පු: චීවරප්‍රාප්තිය අසංස්කෘත වෙයි ... පිණ්ඩපාත ... ශයනාසන ... ග්ලානප්‍රත්‍යය භෛෂජ්‍යපරිෂ්කාරප්‍රාප්තිය අසංස්කෘත වෙයි. නිර්වාණය අසංස්කෘත වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: අසංස්කෘතයෝ පස් දෙනෙක් ඇද්ද?

ප පටි: එසේ නො කියැයුතු යැ ...

11. ස. පු. අසංස්කෘතයෝ පස් දෙනෙක් ඇද්ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: ත්‍රාණයෝ පස්දෙනෙක් ඇද්ද, ... අනන්තරිකාවෝ පස් දෙනෙක් ඇද්ද?

ප. පටිඤ්ඤා: එසේ නො කියැයුතු යැ...

12 ස පු: ප්‍රථමධ්‍යානයාගේ ප්‍රාප්තිය අසංස්කෘත වේ ද, ද්විතීයධ්‍යානයාගේ ... තෘතීයධ්‍යානයාගේ .. චතුර්ථධ්‍යානයාගේ ... ආකාසානඤ්චායතනයාගේ ... විඤ්ඤාණඤ්චායතනයාගේ ... ආකිඤ්චඤ්ඤායතනයාගේ ... නෙවසඤ්ඤානාසඤ්ඤායතනයාගේ ... ශ්‍රොතාපත්තිමාර්ගියාගේ ... ශ්‍රොතාපත්තිඵලයාගේ ... සකෘදගාමිමාර්ගියාගේ ... සකෘදගාමිඵලයාගේ ... අනාගාමිමාර්ගියාගේ ... අනාගාමිඵලයාගේ ... අර්හත්මාර්ගියාගේ .. අර්හත්ඵලයාගේ ප්‍රාප්තිය අසංකෘත වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: නිබ්බානං -පෙ- අච්චුතං අමතන්ති.

ප පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

13. ස පු: ද්වෙ අසඞ්ඛතානී'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස අනු: ද්වෙ තාණානි -පෙ- [ද්වෙ] අන්තරිකා වා'ති.

ප පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

14 ස. පු: සොතාපත්තිමග්ගස්ස පත්ති අසඞ්ඛතා, සොතා-පත්තිඵලස්ස පත්ති අසඞ්ඛතා -පෙ- අරහත්ත-මග්ගස්ස පත්ති අසඞ්ඛතා, අරහත්තඵලස්ස පත්ති අසඞ්ඛතා, නිබ්බානං අසඞ්ඛතන්ති.

ප පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: නව අසඞ්ඛතානී'ති

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

15 ස. පු: නව අසඞ්ඛතානී'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා

ස. අනු: නව තාණානි පෙ- [නව] අන්තරිකා වා'ති

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

16 ප පු: න වත්තබ්බං පත්ති අසඞ්ඛතා'ති.

ස. පටිඤ්ඤා: ආමන්තා.

ප. අනු: පත්ති රූපං[1] වෙදනා සඤ්ඤා සඞ්ඛාරා විඤ්ඤා-ණන්ති.

ස. පටි. න හෙවං වත්තබ්බෙ -පෙ-

ප. පා: තෙන හි "පත්ති අසඞ්ඛතා"ති.

**පත්ති කථා නිට්ඨිතා.**

---

1. රූපා - සීමු.

| | |
|---|---|
| ස. අනු: | නිර්‍වාණය .. අච්යුත අමෘත වේ ද? |
| ප. පටි: | එසේ නො කියැයුතු යැ ... |
| 13. ස. පු: | අසංස්කෘතයෝ දෙදෙනෙක් ඇද්ද? |
| ප. පටි: | එසේ යැ. |
| ස. අනු: | ත්‍රාණයෝ දෙදෙනෙක් ... අනන්තරිකාවෝ දෙදෙ-නෙක් ඇද්ද? |
| ප පටි: | එසේ නො කියැයුතු යැ ... |
| 14 ස. පු: | ශ්‍රොතාපත්තිමාර්ගප්‍රාප්තිය අසංස්කෘත වේ ද, ශ්‍රොතාපත්තිඵලප්‍රාප්තිය අසංස්කෘත වේ ද ... අර්හත්ත්වඵලප්‍රාප්තිය අසංස්කෘත වේ ද, නිර්‍වාණය අසංස්කෘත වේ ද? |
| ප. පටික්‍ෂේ: | එසේ යැ. |
| ස. අනු: | අසංස්කෘතයෝ නව දෙනෙක් ඇද්ද? |
| ප. පටි: | එසේ නො කියැයුතු යැ ... |
| 15. ස. පු: | අසංස්කෘතයෝ නව දෙනෙක් ඇද්ද? |
| ප. පටි: | එසේ යැ. |
| ස. අනු: | ත්‍රාණයෝ නවදෙනෙක් ... අනන්තරිකාවෝ නව-දෙනෙක් ඇද්ද? |
| ප. පටි: | එසේ නො කියැයුතු යැ .. |
| 16. ප. පු: | 'ප්‍රාප්ති අසංස්කෘත වෙති'යි නො කියැයුතු වේ ද? |
| ස. පටික්‍ෂේ: | එසේ යැ. |
| ප. අනු: | ප්‍රාප්තිය රූප, වේදනා, සංඥ, සංස්කාර, විඥන වේ ද? |
| ස. පු | එසේ නො කියැයුතු යැ ... |
| ප. පා: | එකරුණින් 'ප්‍රාප්තිය අසංස්කෘත' වේ. |

ප්‍රාප්ති කථා නිමි.

19. 5.

# තථතා කථා.

1. ස. පු: සබ්බධම්මානං තථතා අසඞ්ඛතා'ති.

ප. පටි: ආමන්තා.

ස. අනු: නිබ්බානං තාණං ලෙණං සරණං පරායනං අච්චුතං අමතන්ති

ප පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

2. ස පු: සබ්බධම්මානං තථතා අසඞ්ඛතා, නිබ්බානං අසඞ්ඛතන්ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: ද්වෙ අසඞ්ඛතානී'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

3. ස. පු: ද්වෙ අසඞ්ඛතානී'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස අනු: ද්වෙ තාණානි -පෙ- [ද්වෙ] අන්තරිකා වා'ති

ප පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

4. ස. පු: රූපස්ස රූපතා, නනු රූපතා අසඞ්ඛතා'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: නිබ්බානං -පෙ- අමතන්ති.

ප පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

5 ස පු: රූපස්ස රූපතා, නනු රූපතා අසඞ්ඛතා, නිබ්බානං අසඞ්ඛතන්ති.

ප. පටිඤ්ඤා: ආමන්තා

ස අනු: ද්වෙ අසඞ්ඛතානී'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

## 19. 5.

# තථතා කථා

[රූපාදි හැම ධර්‍මයන්ගේ රූපාදිභාව සඞ්ඛ්‍යාත තථතාවක් ඇද්ද, එ ද සංස්කෘත රූපාදීන්හි අපර්‍ය්‍යාපන්න බැවින් අසංස්කෘත යයි සමහර උත්තරාපථකයන් සෙයින් ලබ්ධි ගතුවන්ගේ වාද බිඳුනම 'තථතාකථා' එයි.]

1\. ස. පු: හැම ධර්‍මයන්ගේ තථතා අසංස්කෘත වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: නිර්‍වාණය ත්‍රාණය ලෙණය සරණය පරායණය අච්‍යුතය අමෘතය වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

2\. ස. පු: හැම දහමුන්ගේ තථතා අසංස්කෘත වේ ද? නිර්‍වාණය අසංස්කෘත වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: අසංස්කෘතයෝ දෙදෙනෙක් ඇද්ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

3\. ස. පු: අසංස්කෘතයෝ දෙදෙනෙක් ඇද්ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: ත්‍රාණයෝ දෙදෙනෙක් ... අන්තරිකාවෝ දෙදෙනෙක් ඇද්ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ..

4\. ස. පු: රූපයාගේ රූපත්වය ඇත, රූපත්වය අසංස්කෘත නො?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: නිර්‍වාණය ... අමෘතය වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

5\. ස. පු: රූපයාගේ රූපත්වය ඇත, රූපත්වය අසංස්කෘත නො? නිර්‍වාණය අසංස්කෘත නො?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: අසංස්කෘතයෝ දෙදෙනෙක් ඇද්ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

6. ස. පු: ද්වෙ අසඞ්ඛතානී'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: ද්වෙ තාණානි -පෙ- [ද්වෙ] අන්තරිකා වා'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

7. ස. පු: වෙදනාය වෙදනතා, තඤ්ච වෙදනතා -පෙ- සඤ්ඤාය සඤ්ඤතා, තඤ්ච සඤ්ඤතා -පෙ- සඞ්ඛාරානං සඞ්ඛාරතා, තඤ්ච සඞ්ඛාරතා -පෙ- විඤ්ඤාණස්ස විඤ්ඤාණතා, තඤ්ච විඤ්ඤාණතා අසඞ්ඛතා'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: නිබ්බානං -පෙ- අමතන්ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

8. ස. පු: රූපස්ස රූපතා, තඤ්ච රූපතා, -පෙ- විඤ්ඤාණස්ස විඤ්ඤාණතා, තඤ්ච විඤ්ඤාණතා අසඞ්ඛතා, නිබ්බානං අසඞ්ඛතන්ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: ඡ අසඞ්ඛතානී'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

9. ස. පු: ඡ අසඞ්ඛතානී'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: ඡ තාණානි -පෙ- [ඡ] අන්තරිකා වා'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

10. ප. පු: න වත්තබ්බං 'සබ්බධම්මානං තථතා අසඞ්ඛතා'ති.

ස. පටිඤ්ඤා: ආමන්තා.

ප. අනු: සබ්බධම්මානං තථතා රූපං[1] වෙදනා සඤ්ඤා සඞ්ඛාරා විඤ්ඤාණන්ති.

ස. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

ප. පා: තෙන හි "සබ්බධම්මානං තථතා අසඞ්ඛතා"ති.

තථතා කථා නිට්ඨිතා.

1 රූපා - සීමු.

6. ස. පු: අසංස්කෘතයෝ දෙදෙනෙක් ඇද්ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: ත්‍රාණයෝ දෙදෙනෙක් .. අනන්තරිකාවෝ දෙදෙනෙක් ඇද්ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

7. ස. පු: වේදනාවගේ වේදනාත්වය ඇත, වේදනාත්වය ... සංඥාවගේ සංඥාත්වය ඇත, සංඥාත්වය ... සංස්කාරයන්ගේ සංස්කාරත්වය ඇත, සංස්කාරත්වය ... විඥානයාගේ විඥානත්වය ඇත, විඥානත්වය අසංස්කෘත නො?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: නිර්වාණය ... අමෘතය වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

8. ස. පු: රූපයාගේ රූපත්වය ඇත, රූපත්වය ... විඥානයාගේ විඥානත්වය ඇත, විඥානත්වය අසංස්කෘත නො? නිර්වාණය අසංස්කෘත වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: අසංස්කෘතයෝ සදෙනෙක් ඇද්ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ..

9. ස. පු: අසංස්කෘතයෝ සදෙනෙක් ඇද්ද?

ප. පටිඤ්ඤා: එසේ යැ

ස. අනු: ත්‍රාණයෝ සදෙනෙක් ... අනන්තරිකාවෝ සදෙනෙක් ඇද්ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ . .

10. ප. පු: 'සර්වධර්මයන්ගේ තථතාව අසංස්කෘත වෙති'යි නො කියැයුතු වේ ද?

ස. පටිඤ්ඤා: එසේ යැ.

ප. අනු: සර්වධර්මයන්ගේ තථතාව රූප, වේදනා, සංඥා, සංස්කාර, විඥාන වේ ද?

ස. පටි: එසේ නො කියැයුතු ...

ප. පා: එකරුණින් 'සර්වධර්මයන්ගේ තථතාව අසංස්කෘත වේ.'

තථතා කථා නිමි.

## 19. 6.

# කුසල කථා

1. ස. පු: නිබ්බානධාතු කුසලා'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: සාරම්මණා, අත්ථි තාය ආවට්ටනා -පෙ- පණිධී'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

ස. අනු: නනු අනාරම්මණා, නත්ථි තාය ආවට්ටනා -පෙ- පණිධී'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. ඨ: හඤ්චි අනාරම්මණා, නත්ථි තාය ආවට්ටනා -පෙ- පණිධි,

ස. පා: නො ච වත රෙ වත්තබ්බෙ 'නිබ්බානධාතු කුසලා'ති.

2. ස. පු: අලොභො කුසලො සාරම්මණො, අත්ථි තස්ස ආවට්ටනා -පෙ- පණිධී'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස අනු: නිබ්බානධාතු කුසලා සාරම්මණා, අත්ථි තාය ආවට්ටනා -පෙ- පණිධී'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

3. ස. පු: අදොසො කුසලො -පෙ- අමොහො කුසලො -පෙ- සද්ධා -පෙ- විරියා -පෙ- සති -පෙ- සමාධි -පෙ- පඤ්ඤා කුසලා සාරම්මණා, අත්ථි තාය ආවට්ටනා -පෙ- පණිධී'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: නිබ්බානධාතු කුසලා සාරම්මණා, අත්ථි තාය ආවට්ටනා -පෙ- පණිධී'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

## 19. 6.

# කුසල කථා

[අනවද්‍ය ද කුශල යැ, ඉෂ්ටවිපාකපුණ්‍යය ද කුශල යැ, එහි ‘අනවද්‍ය’ යනු ක්ලේශවිප්‍රයුක්ත යන අර්ථ යි. මේ අර්ථය අකුසල් තබා හැම දහම් ඇසුරු කෙරෙයි. ‘ඉෂ්ටවිපාක’ යනු ඉෂ්ටඵල නිෂ්පාදක පුණ්‍යය යන අර්ථ යි. මේ අර්ථය කුශලත්‍රිකයෙහි එන ආදිපදය මැ ඇසුරු කෙරෙයි. මේ මාර්ගය නො ගෙන අනවද්‍යභාව මාත්‍රයෙන් මැ ‘නිවන කුශලැ’යි ලබ්ධි ගත්තෝ ඇත. අන්ධකනිකාය වාසීන් සෙයිනි. උනට ඉෂ්ටවිපාකාර්ථයෙන් නිර්වාණයාගේ කුශලභාව නැති සේ දක්වන්නට ‘කුශලකථා’ එයි ]

1 ස. පු: නිර්වාණධාතු කුශල වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: සාලම්බන වේ ද, එයට ආවර්තනා ... ප්‍රණිධි ඇද්ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

ස. අනු: අනාලම්බන නො එයට ආවර්තනා ... ප්‍රණිධි නැත් නො?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. නි: ඉදින් අනාලම්බන වේ නම්, එයට ආවර්තනා ... ප්‍රණිධි නැත් නම්,

ස. පා. හවත, ‘නිර්වාණධාතු කුසල වේ’යි නො කියැයුතු මැ යැ.

2. ස. පු: අලෝභය කුශල වේ ද, සාලම්බන වේ ද, එයට ආවර්තනා ... ප්‍රණිධි ඇද්ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: නිර්වාණධාතු කුශල වේ ද, සාලම්බන වේ ද, එයට ආවර්තනා ... ප්‍රණිධි ඇද්ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

3. ස. පු: අද්වේෂය කුශල ... අමෝහය කුශල ... ශ්‍රද්ධා ... වීර්‍ය ... ස්මෘති ... සමාධි ... ප්‍රඥා කුශල වේ ද, සාලම්බන වේ ද, එයට ආවර්තනා ... ප්‍රණිධි ඇද්ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: නිර්වාණධාතු කුශල වේ ද, සාලම්බන වේ ද, එයට ආවර්තනා ... ප්‍රණිධි ඇද්ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

**4.** ස. පු: නිබ්බානධාතු කුසලා අනාරම්මණා, නත්ථි තාය ආවට්ටනා -පෙ- පණිධී'ති.

ප පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: අලොභො කුසලො අනාරම්මණො, නත්ථි තස්ස ආවට්ටනා -පෙ- පණිධී'ති.

ප පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

**5.** ස. පු: නිබ්බානධාතු කුසලා අනාරම්මණා, නත්ථි තාය ආවට්ටනා -පෙ- පණිධී'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: අදොසො කුසලො -පෙ- අමොහො කුසලො -පෙ- සද්ධා -පෙ- විරියං -පෙ- සති -පෙ- සමාධි -පෙ- පඤ්ඤා කුසලා අනාරම්මණා, නත්ථි තාය ආවට්ටනා -පෙ- පණිධී'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

**6** ප. පු: න වත්තබ්බං නිබ්බානධාතු කුසලා'ති.

ස. පටිඤ්ඤා: ආමන්තා.

ප. අනු: නනු නිබ්බානධාතු අනවජ්ජා'ති.

ස. පටිඤ්ඤා: ආමන්තා.

ප. ඨා: හඤ්චි නිබ්බානධාතු අනවජ්ජා,

ප. පා: තෙන වත රෙ වත්තබ්බෙ "නිබ්බානධාතු කුසලා"ති.

කුසල කථා නිට්ඨිතා.

**4.** ස. පු: නිර්වාණධාතු කුසල අනාලම්බන වේ ද? එයට ආවර්තනා ... ප්‍රණිධි නැද්ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: අලෝභය කුශල අනාලම්බන වේ ද? එයට ආවර්තනා ... ප්‍රණිධි නැද්ද?

ප පටි: එසේ නො කියයුතු යැ ...

**5.** ස. පු: නිර්වාණධාතු කුශල අනාලම්බන වේ ද? එයට ආවර්තනා .. ප්‍රණිධි නැද්ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: අද්වේෂය කුශල ... අමෝහය කුශල ... ශ්‍රද්ධා ... වීර්‍ය්‍ය .. ස්මෘති ... සමාධි ... ප්‍රඥා කුශල අනාලම්බන වේ ද? එයට ආවර්තනා ... ප්‍රණිධි නැද්ද?

ප. පටි: එසේ නො කියයුතු යැ ...

**6.** ප. පු: 'නිර්වාණධාතු කුශල වෙති'යි නො කියයුතු වේ ද?

ස. පටිඤ්ඤා: එසේ යැ.

ප. අනු: නිර්වාණධාතු අනවද්‍ය නො?

ස. පටිඤ්ඤා: එසේ යැ.

ප. ඨ: ඉදින් නිර්වාණධාතු අනවද්‍ය වී නම්,

ප. පා: හවත, එකරුණින් 'නිර්වාණධාතු කුශල වෙති'යි කියයුතු මැ යැ.

කුශල කථා නිමි.

## 19. 7.

# අච්චන්තනියාම කථා.

1. ස. පු: අත්ථි පුථුජ්ජනස්ස අච්චන්තනියාමතා'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: මාතුඝාතකො අච්චන්තනියතො, පිතුඝාතකො -පෙ- අරහන්තඝාතකො -පෙ- රුහිරුප්පාදකො -පෙ- සඞ්ඝභෙදකො අච්චන්තනියතො'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

2. ස. පු: අත්ථි පුථුජ්ජනස්ස අච්චන්තනියාමතා'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: අච්චන්තනියතස්ස පුග්ගලස්ස විචිකිච්ඡා උප්පජ්ජෙය්‍යා'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. ඨ: හඤ්චි අච්චන්තනියතස්ස පුග්ගලස්ස විචිකිච්ඡා උප්පජ්ජෙය්‍ය,

ස. පා: තෙන වත රෙ වත්තබ්බෙ "අත්ථි පුථුජ්ජනස්ස අච්චන්තනියාමතා'ති.

3 ස. පු: අච්චන්තනියතස්ස පුග්ගලස්ස විචිකිච්ඡා නුප්පජ්ජෙය්‍යා'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: පහිනා'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

4. ස පු: පහිනා'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: සොතාපත්තිමග්ගෙනා'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

ස. අනු: සකදාගාමි -පෙ- අනාගාමි -පෙ- අරහත්ත-මග්ගෙනා'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

19. 7.

# අච්චන්තනියාම කථා.

["සකිං නිමුග්ගො නිමුග්ගො'ව හොති - වරක් ගැලුණේ ගැලුණේ මැ වේ" යන සූත්‍රපාඨ නිසා පෘථග්ජනහට අත්‍යන්තනියාමතා ඇතැ'යි සමහර උත්තරාපථකයන් සෙයින් ලබ්ධි ගත්තවුන්ගේ මැද බිඳුනම 'අච්චන්තනියාමකථා' එයි.]

1 ස. පු: පෘථග්ජනහට අත්‍යන්තනියාමතා ඇද්ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: මාතෘඝාතක අත්‍යන්තනියත (ඒකාන්ත නියමයෙන් එසේ) වේ ද, පිතෘඝාතක ... අරහන්තඝාතක ... රුධිරෝත්පාදක ... සඞ්ඝභේදක අත්‍යන්තනියත වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

2. ස. පු: පෘථග්ජනහට අත්‍යන්තනියාමතා ඇද්ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: අත්‍යන්තනියත පුද්ගලහට විචිකිත්සා උපදනේ වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස ඨ: ඉදින් අත්‍යන්තනියත පුද්ගලහට විචිකිත්සා උපදනේ වී නම්,

ස. පා: හවත, 'පෘථග්ජනහට අත්‍යන්තනියාමතා ඇතැ'යි නො කියැයුතු මැ යැ.

3. ස. පු: අත්‍යන්තනියත පුද්ගලහට විචිකිත්සා නූපදනේ වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: ප්‍රහීණ වේ ද?

ප පටි: එසේ නො කියැයුතු යැ ...

4. ස. පු: ප්‍රහීණ වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: ශ්‍රොතාපත්තිමාර්ගීයෙක් වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

ස. අනු: සකෘදාගාමී ... අනාගාමී ... අර්හත්මාර්ගීයෙක් වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

5. ස පු: කතමේන මග්ගේනා'ති.

ප වි: අකුසලේන මග්ගේනා'ති.

ස. අනු: අකුසලෝ මග්ගෝ නිය්‍යානිකෝ ඛයගාමී බෝධගාමී අනාසවෝ -පෙ- අසඞ්කිලේසිකෝ'ති.

ප. පටි: න හේවං වත්තබ්බේ -පෙ-

ස. අනු: නනු අකුසලෝ මග්ගෝ අනිය්‍යානිකෝ [-පෙ-] සඞ්කිලේසිකෝ'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. නි: හඤ්චි අකුසලෝ මග්ගෝ අනිය්‍යානිකෝ -පෙ- සඞ්කිලේසිකෝ,

ස. පා: නෝ ච වත රේ වත්තබ්බේ ''අච්චන්තනියතස්ස පුග්ගලස්ස විචිකිච්ඡා අකුසලේන මග්ගේන පහීනා'ති.

6. ස. පු: සස්සතදිට්ඨියා නියතස්ස පුග්ගලස්ස උච්ඡේදදිට්ඨි උප්පජ්ජේය්‍යාති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. නි: හඤ්චි සස්සතදිට්ඨියා නියතස්ස පුග්ගලස්ස උච්ඡේද-දිට්ඨි උප්පජ්ජේය්‍ය,

ස. පා: නෝ ච වත රේ වත්තබ්බේ "අත්ථි පුථුජ්ජනස්ස අච්චන්තනියාමතා"ති.

7. ස. පු: සස්සතදිට්ඨියා නියතස්ස පුග්ගලස්ස උච්ඡේදදිට්ඨි නුප්පජ්ජේය්‍යා'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: පහීනා'ති.

ප. පටි: න හේවං වත්තබ්බේ -පෙ-

8. ස. පු: පහීනා'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: සෝතාපත්තිමග්ගේනා'ති.

ප. පටි: න හේවං වත්තබ්බේ -පෙ-

ස. අනු: සකදාගාමිමග්ගේන -පෙ- අනාගාමිමග්ගේන -පෙ- අරහත්තමග්ගේනාති.

ප. පටි: න හේවං වත්තබ්බේ -පෙ-

| | | |
|---|---|---|
| 5. | ස. පු: | කවර මාර්ගයෙකින් වේ ද? |
| | ප. වි: | අකුශල මාර්ගයෙනි. |
| | ස. අනු: | අකුශල මාර්ගය නෛර්යාණික ක්‍ෂයගාමී බොධගාමී අනාස්‍රව ... අසාංකෙලශික වේ ද? |
| | ප. පටි: | එසේ නො කියැයුතු යැ ... |
| | ස. අනු: | අකුශල මාර්ගය අනෛර්යාණික ... සාංකෙලශික නො? |
| | ප. පටිඤ්ඤා: | එසේ යැ. |
| | ස. ඨ: | ඉදින් අකුශලමාර්ගය අනෛර්යාණික ... සාංකෙලශික වී නම්, |
| | ස. පා: | හවත, 'අත්‍යන්තනියත පුද්ගලහට විචිකිත්සා අකුශලමාර්ගයෙන් ප්‍රහීණ යැ'යි නො කියැයුතු මැ යැ. |
| 6. | ස. පු: | ශාශ්වතදෘෂ්ටියෙන් නියත පුද්ගලහට උච්ඡේදදෘෂ්ටි උපදනේ වේ ද? |
| | ප. පටිඤ්ඤා: | එසේ යැ. |
| | ස. ඨ: | ඉදින්, ශාශ්වතදෘෂ්ටියෙන් නියත පුද්ගලහට උච්ඡේදදෘෂ්ටි උපදනේ වේ නම්, |
| | ස. පා: | හවත, 'පෘථග්ජනහට අත්‍යන්තනියාමතා ඇතැ'යි නො කියැයුතු මැ යැ. |
| 7. | ස. පු: | ශාශ්වතදෘෂ්ටියෙන් නියත පුද්ගලහට උච්ඡේද දෘෂ්ටි නූපදනේ වේ ද? |
| | ප. පටිඤ්ඤා: | එසේ යැ. |
| | ස. අනු: | ප්‍රහීණ වේ ද? |
| | ප. පටි: | එසේ නො කියැයුතු යැ ... |
| 8. | ස. පු: | ප්‍රහීණ වේ ද? |
| | ප. පටිඤ්ඤා: | එසේ යැ. |
| | ස. අනු: | ශ්‍රොතාපත්තිමාර්ගයෙන් වේ ද? |
| | ප. පටි: | එසේ නො කියැයුතු යැ ... |
| | ස. අනු: | සකෘදගාමී මාර්ගයෙන් ... අනාගාමී මාර්ගයෙන් ... අර්හත්මාර්ගයෙන් වේ ද? |
| | ප. පටි: | එසේ නො කියැයුතු යැ ... |

9. ස. පු: කතමේන මග්ගේනා'ති.

ප. මි: අකුසලේන මග්ගේනා'ති.

ස. අනු: අකුසලෝ මග්ගෝ නියානිකෝ ඛයගාමී බෝධගාමී අනාසවෝ -පෙ- අසඞ්කිලෙසිකෝ'ති.

ප. පටි: න හෙවං වත්තබ්බේ -පෙ-

ස. අනු: නනු අකුසලෝ මග්ගෝ අනියානිකෝ -පෙ- සඞ්කිලෙසිකෝ'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස ඨ: හඤ්චි අකුසලෝ මග්ගෝ අනියානිකෝ -පෙ- සඞ්කිලෙසිකෝ,

ස. පා: නෝ ච වත රේ වත්තබ්බේ "සස්සතදිට්ඨියා නියතස්ස පුග්ගලස්ස උච්ඡේදදිට්ඨි අකුසලේන මග්ගේන පහීනා"ති.

10. ස. පු: උච්ඡේදදිට්ඨියා නියතස්ස පුග්ගලස්ස සස්සතදිට්ඨි උප්පජ්ජෙය්‍යා'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. ඨ: හඤ්චි උච්ඡේදදිට්ඨියා නියතස්ස පුග්ගලස්ස සස්සතදිට්ඨි උප්පජ්ජෙය්‍ය,

ස. පා: නෝ ච වත රේ වත්තබ්බේ "අත්ථි පුථුජ්ජනස්ස අච්චන්තනියාමතා"ති.

11. ස. පු: උච්ඡේදදිට්ඨියා නියතස්ස පුග්ගලස්ස සස්සතදිට්ඨි නුප්පජ්ජෙය්‍යාති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: පහීනා'ති.

ප. පටි: න හෙවං වත්තබ්බේ -පෙ-

12. ස. පු: පහීනා'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: සෝතාපත්තිමග්ගේනා'ති.

ප. පටි: න හෙවං වත්තබ්බේ -පෙ-

ස. අනු: සකදාගාමි මග්ගේන -පෙ- අනාගාමිමග්ගේන-පෙ- අරහත්තමග්ගේනා'ති.

ප. පටි: න හෙවං වත්තබ්බේ -පෙ-

9. ස. පු: කවර මාර්ගයෙකින් වේ ද?

ප. වි: අකුශලමාර්ගයෙනි.

ස. අනු: අකුශලමාර්ගය නෛර්‍ය්‍යාණික, ක්‍ෂයගාමි, බෝධ-ගාමි, අනාස්‍රව ... අසාංක්ලේශික වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

ස. අනු: අකුශලමාර්ගය අනෛර්‍ය්‍යාණික ... සාංක්ලේශික නො?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. ඨ: ඉදින් අකුශලමාර්ගය අනෛර්‍ය්‍යාණික ... සාංක්ලේ-ශික වී නම්,

ස. පා: හවත, 'ශාශ්වතදෘෂ්ටියෙන් නියත පුද්ගලහට උච්ඡේදදෘෂ්ටි අකුශලමාර්ගයෙන් ප්‍රහීණ වෙති'යි නො කියැයුතු මැ යැ.

10. ස. පු: උච්ඡේදදෘෂ්ටියෙන් නියත පුද්ගලහට ශාශ්වත-දෘෂ්ටි උපදනේ වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. ඨ: ඉදින් උච්ඡේද දෘෂ්ටියෙන් නියත පුද්ගලහට ශාශ්වතදෘෂ්ටි උපදනේ වී නම්,

ස. පා: හවත, "පෘථග්ජනහට අත්‍යන්තනියාමතා ඇතැ"යි නො කියැයුතු මැ යැ.

11. ස. පු: උච්ඡේදදෘෂ්ටියෙන් නියත පුද්ගලහට ශාශ්වත-දෘෂ්ටි නූපදනේ වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: ප්‍රහීණ වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ..

12. ස. පු: ප්‍රහීණ වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: ශ්‍රොතාපත්තිමාර්ගයෙන් වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

ස. අනු: සකෘදාගාමි මාර්ගයෙන් ... අනාගාමි මාර්ගයෙන් ... අර්හත්මාර්ගයෙන් වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ.

13. ස. පු: කතමේන මග්ගේනා'ති.

ප. වි: අකුසලේන මග්ගේනා'ති.

ස. අනු: අකුසලෝ මග්ගෝ අනියානිකෝ -පෙ- සඞ්කිලේසිකෝ,

ස. පා: නෝ ච වත රෙ වත්තබ්බෙ "උච්ඡේදදිට්ඨියා නියතස්ස පුග්ගලස්ස සස්සතදිට්ඨි අකුසලේන මග්ගේන පහීනා"ති.

14. ප. පු: න වත්තබ්බං "අත්ථි පුථුජ්ජනස්ස අච්චන්තනියාමතා"ති.

ස. පටිඤ්ඤා: ආමන්තා.

ප. අනු: නනු වුත්තං භගවතා "ඉධ භික්ඛවෙ එකච්චො පුග්ගලෝ සමන්නාගතෝ හෝති එකන්තකාළකෙහි අකුසලෙහි ධම්මෙහි, සෝ සකිං නිමුග්ගෝ නිමුග්ගෝ'ව හෝති"ති.[1] අත්ථේ'ව සුත්තන්තෝ'ති.

ස. පටිඤ්ඤා: ආමන්තා.

ප. පා: තෙන හි "අත්ථි පුථුජ්ජනස්ස අච්චන්තනියාමතා"ති.

15. ස. පු: වුත්තං භගවතා "ඉධ භික්ඛවෙ එකච්චො පුග්ගලෝ සමන්නාගතෝ හෝති එකන්තකාළකෙහි අකුසලෙහි ධම්මෙහි. සෝ සකිං නිමුග්ගෝ නිමුග්ගෝ'ව හෝති"ති.[1] කත්වා තෙන ච කාරණේන "අත්ථි පුථුජ්ජනස්ස අච්චන්තනියාමතා"ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: වුත්තං භගවතා "ඉධ භික්ඛවෙ එකච්චො පුග්ගලෝ උම්මුජ්ජිත්වා නිමුජ්ජති"ති.[1] අත්ථේ'ව සුත්තන්තෝ'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු. සබ්බකාලං උම්මුජ්ජිත්වා නිමුජ්ජතී'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

---

1. සත්තකඞ්ගුත්තර - උදකූපමසුත්ත

13. ස. පු: කවර මාර්ගයෙකින් වෙ ද?

ප. වි: අකුශල මාර්ගයෙනි.

ස. අනු: අකුශලමාර්ගය අනෛර්‍යාණික ... සාංක්ලෙශික වේ ද?

ස. පා: භවත, ‘උච්ඡේදදෘෂ්ටියෙන් නියත පුද්ගලහට ශාශ්වතදෘෂ්ටි අකුශලමාර්ගයෙන් ප්‍රහීණ වෙති’යි නො කියැයුතු මැ යැ.

14. ප. පු: ‘පෘථග්ජනහට අත්‍යන්තනියාමතා ඇතැ’යි නො කියැයුතු වේ ද?

ස. පටිඤ්ඤා: එසේ යැ.

ප. අනු: භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරනලද මැ නො:

“මහණෙනි, මෙලොව ඇතැම් පුද්ගලයෙක් එකාන්තයෙන් කෘෂ්ණ වූ අකුශලධර්මයෙන් (නියත මිථ්‍යාදෘෂ්ටියෙන්) සමන්වාගත වෙයි. හෙ වරක් භවයෙහි ගැලුණේ ගැලුණේ මැ වේ” යයි වදාළ සූත්‍රාන්තයෙක් ඇත්තේ මැ නො?

ස. පටිඤ්ඤා: එසේ යැ.

ප. පා: එකරුණින් ‘පෘථග්ජනහට අත්‍යන්තනියාමතා ඇත’.

15. ස. පු: භාග්‍යවතුන් විසින් වදාරනලද: “මහණෙනි, මෙලොව ඇතැම් පුද්ගලයෙක් එකාන්තයෙන් කෘෂ්ණ වූ අකුශලධර්මයෙන් සමන්වාගත වූයේ වෙයි. හෙ වරක් භවයෙහි ගැලුණේ ගැලුණේ මැ වෙයි” යනු කරුණු කොට එකරුණින් “පෘථග්ජනහට අත්‍යන්තනියාමතා” ඇද්ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: භාග්‍යවතුන් විසින් වදාරනලද: “මහණෙනි, මෙලොව ඇතැම් පුද්ගලයෙක් ශ්‍රද්ධාදීන් විසින් නැගී ගැලෙනුයේ වේ”යයි වදාළ සූත්‍රාන්තයෙක් ඇත්තේ මැ නො?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: හැම කල්හි නැගී ගැලෙනුයේ වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

16. ස. පු: වුත්තං භගවතා "ඉධ භික්ඛවෙ එකච්චො පුග්ගලො සමන්නාගතො හොති එකන්තකාළකෙහි අකුසලෙහි ධම්මෙහි. සො සකිං නිමුග්ගො නිමුග්ගො'ව හොතී"ති කත්වා තෙන ච කාරණෙන "අත්ථි පුථුජ්ජනස්ස අච්චන්තනියාමතා"ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: වුත්තං භගවතා "ඉධ භික්ඛවෙ එකච්චො පුග්ගලො උම්මුජ්ජිත්වා ඨිතො හොති, උම්මුජ්ජිත්වා විපස්සති, විලොකෙති, උම්මුජ්ජිත්වා පතරති, උම්මුජ්ජිත්වා පතිගාධප්පත්තො හොතී"ති.[1] අත්ථෙව සුත්තන්තො'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: "සබ්බකාලං උම්මුජ්ජිත්වා පතිගාධප්පත්තො හොතී"ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

අච්චන්තනියාම කථා නිට්ඨිතා.

[1] සත්තකඞ්ගුත්තර - උදකූපමසුත්ත

16. ස. පු: භාග්‍යවතුන් විසින් "මහණෙනි, මෙලොව ඇතැම් පුද්ගලයෙක් එකාන්තකෘෂ්ණ අකුශලධර්මයෙන් සමන්‍වාගත වෙයි. හෙ වරක් භවයෙහි ගැලුණේ ගැලුණේ මැ වෙයි වදාරන ලද"යි කරුණු කොට එකරුණින් "පෘථග්ජනහට අත්‍යන්තනියාමතා" ඇද්ද?

ප. පටිසඛා: එසේ යැ.

ස. අනු: භාග්‍යවතුන් විසින්, "මහණෙනි, මෙලොව ඇතැම් පුද්ගලයෙක් ශ්‍රද්ධාදීන් නැඟී සිටියේ වෙයි. (සෝවන් පුහුල්) නැඟී ගමන මාර්ගය බලනුයේ වෙයි. (සෙදගැමි පුහුල් කෙලශතනුභාව-යෙන්) නැඟී (අනගැමි බවට අභිමුව වැ යන්නේ වෙයි. (අනගැමි පුහුල්) නැඟී ප්‍රතිෂ්ඨාවට පැමිණියේ වේ"යයි වදාළ සූත්‍රාන්තයෙක් ඇත්තේ මැ නො?

ප. පටිසඛා: එසේ යැ.

ස. අනු: හැම කල්හි නැඟී ප්‍රතිෂ්ඨාප්‍රාප්ත වූයේ වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

අච්චන්තනියාම කථා නිමි.

19. 8

# ඉන්ද්‍රිය කථා.

1. ස. පු: නත්ථි ලොකියං සද්ධින්ද්‍රියන්ති.?

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: නත්ථි ලොකියා සද්ධා'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

2. ස. පු: නත්ථි ලොකියං විරියින්ද්‍රියං -පෙ- සතින්ද්‍රියං -පෙ- සමාධින්ද්‍රියං -පෙ- පඤ්ඤින්ද්‍රියන්ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: නත්ථි ලොකියා පඤ්ඤා'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

3. ස. පු: අත්ථි ලොකියා සද්ධා'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: අත්ථි ලොකියං සද්ධින්ද්‍රියන්ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

4. ස. පු: අත්ථි ලොකියං විරියං -පෙ- සති -පෙ- සමාධි -පෙ- පඤ්ඤා'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: අත්ථි ලොකියං පඤ්ඤින්ද්‍රියන්ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

5. ස. පු: අත්ථි ලොකියො මනො, අත්ථි ලොකියං මනින්ද්‍රියන්ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: අත්ථි ලොකියා සද්ධා, අත්ථි ලොකියං සද්ධින්ද්‍රියන්ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

6. ස. පු: අත්ථි ලොකියො මනො, අත්ථි ලොකියං මනින්ද්‍රියන්ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: අත්ථි ලොකියා පඤ්ඤා, අත්ථි ලොකියං පඤ්ඤින්ද්‍රියන්ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ පෙ-

## 19. 8.

# ඉන්ද්‍රිය කථා.

[ලෞකික ශ්‍රද්ධා ශ්‍රද්ධා මැ වෙයි. ඉන්ද්‍රිය නො වෙයි. එසේ මැ වීර්‍ය්‍ය ස්මෘති සමාධි ප්‍රඥාවෝත් වීර්‍ය්‍යාදීන් මැ මිස ඉන්ද්‍රිය නො වෙති'යි හෙතුවාද මහිංසාසකනිකායවාසීන් සෙයින් ලබ්ධි ගත්තවුන්ගේ වාද බිඳුනම 'ඉන්ද්‍රියකථා' එයි.]

1. ස. පු: ලෞකික ශ්‍රද්ධෙන්ද්‍රිය නැද්ද?

ප. පටිඤ්ඤ: එසේ යැ.

ස. අනු: ලෞකික ශ්‍රද්ධා නැද්ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

2. ස. පු: ලෞකික වීර්‍ය්‍යෙන්ද්‍රිය .. ස්මෘතීන්ද්‍රිය .. සමාධීන්ද්‍රිය ... ප්‍රඥෙන්ද්‍රිය නැද්ද?

ප. පටිඤ්ඤ: එසේ යැ.

ස. අනු: ලෞකික ප්‍රඥා නැද්ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

3. ස. පු: ලෞකික ශ්‍රද්ධා ඇද්ද?

ප. පටිඤ්ඤ: එසේ යැ.

ස. අනු: ලෞකික ශ්‍රද්ධෙන්ද්‍රිය ඇද්ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

4. ස. පු: ලෞකික වීර්‍ය්‍ය ... ස්මෘති ... සමාධි ... ප්‍රඥා ඇද්ද?

ප. පටිඤ්ඤ: එසේ යැ.

ස. අනු: ලෞකික ප්‍රඥෙන්ද්‍රිය ඇද්ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

5. ස. පු: ලෞකික මනස ඇද්ද, ලෞකික මනින්ද්‍රිය ඇද්ද?

ප. පටිඤ්ඤ එසේ යැ.

ස. අනු: ලෞකික ශ්‍රද්ධා ඇද්ද, ලෞකික ශ්‍රද්ධෙන්ද්‍රිය ඇද්ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

6. ස පු: ලෞකික මනස ඇද්ද, ලෞකික මනින්ද්‍රිය ඇද්ද?

ප. පටිඤ්ඤ: එසේ යැ.

ස. අනු: ලෞකික ප්‍රඥා ඇද්ද, ලෞකික ප්‍රඥෙන්ද්‍රිය ඇද්ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

7. ස. පු: අත්ථි ලොකියං සොමනස්සං, අත්ථි ලොකියං සොමනස්සින්ද්‍රියං, අත්ථි ලොකියං ජීවිතං, අත්ථි ලොකියං ජීවිතින්ද්‍රියන්ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: අත්ථි ලොකියා සද්ධා, අත්ථි ලොකියං සද්ධින්ද්‍රියන්ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

8. ස. පු: අත්ථි ලොකියං ජීවිතං, අත්ථි ලොකියං ජීවිතින්ද්‍රියන්ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: අත්ථි ලොකියා පඤ්ඤා, අත්ථි ලොකියං පඤ්ඤින්ද්‍රියන්ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

9. ස. අත්ථි ලොකියා සද්ධා, නත්ථි ලොකියං සද්ධින්ද්‍රියන්ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: අත්ථි ලොකියො මනො, නත්ථි ලොකියං මනින්ද්‍රියන්ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

10. ස. පු: අත්ථි ලොකියා පඤ්ඤා, නත්ථි ලොකියං පඤ්ඤින්ද්‍රියන්ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: අත්ථි ලොකියො මනො, නත්ථි ලොකියං මනින්ද්‍රියන්ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

11. ස. පු: අත්ථි ලොකියා සද්ධා, නත්ථි ලොකියං සද්ධින්ද්‍රියන්ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: අත්ථි ලොකියං සොමනස්සං, නත්ථි ලොකියං සොමනස්සින්ද්‍රියං, අත්ථි ලොකියං ජීවිතං, නත්ථි ලොකියං ජීවිතින්ද්‍රියන්ති.

ප. පටි. න හෙවං වත්තබ්බෙ -පෙ-

12. ස. පු: අත්ථි ලොකියා පඤ්ඤා, නත්ථි ලොකියං පඤ්ඤින්ද්‍රියන්ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

7. ස පු: ලෞකික සෞමනස්‍ය ඇද්ද, ලෞකික සෞමනස්‍යෙන්ද්‍රිය ඇද්ද, ලෞකික ජීවිත ඇද්ද, ලෞකික ජීවිතෙන්ද්‍රිය ඇද්ද?

ප. පටිඤ්ඤා: එසේ යෑ.

ස. අනු: ලෞකික ශ්‍රද්ධා ඇද්ද, ලෞකික ශ්‍රද්ධෙන්ද්‍රිය ඇද්ද?

ප. පටි: එසේ නො කියැයුතු යෑ ...

8. ස. පු: ලෞකික ජීවිත ඇද්ද, ලෞකික ජීවිතෙන්ද්‍රිය ඇද්ද?

ස. අනු: ලෞකිකප්‍රඥා ඇද්ද, ලෞකික ප්‍රඥෙන්ද්‍රිය ඇද්ද?

ප. පටි: එසේ නො කියැයුතු යෑ ...

9. ස. පු: ලෞකික ශ්‍රද්ධා ඇද්ද, ලෞකික ශ්‍රද්ධෙන්ද්‍රිය නැද්ද?

ප. පටිඤ්ඤා: එසේ යෑ.

ස. අනු: ලෞකික මනස ඇද්ද, ලෞකික මනින්ද්‍රිය නැද්ද?

ප. පටි: එසේ නො කියැයුතු යෑ ...

10. ස. පු: ලෞකික ප්‍රඥා ඇද්ද, ලෞකික ප්‍රඥෙන්ද්‍රිය නැද්ද?

ප. පටිඤ්ඤා: එසේ යෑ.

ස. අනු: ලෞකික මනස ඇද්ද, ලෞකික මනින්ද්‍රිය නැද්ද?

ප. පටි: එසේ නො කියැයුතු යෑ ...

11. ස. පු: ලෞකික ශ්‍රද්ධා ඇද්ද, ලෞකික ශ්‍රද්ධෙන්ද්‍රිය නැද්ද?

ප. පටිඤ්ඤා: එසේ යෑ.

ස. අනු: ලෞකික සෞමනස්‍ය ඇද්ද, ලෞකික සෞමනස්සින්ද්‍රිය නැද්ද, ලෞකික ජීවිත ඇද්ද, ලෞකික ජීවිතින්ද්‍රිය නැද්ද?

ප. පටි: එසේ නො කියැයුතු යෑ ..

12. ස. පු: ලෞකික ප්‍රඥා ඇද්ද, ලෞකික ප්‍රඥෙන්ද්‍රිය නැද්ද?

ප. පටිඤ්ඤා: එසේ යෑ.

ස. අනු: අත්ථි ලොකියො මනො, නත්ථි ලොකියං මනින්ද්‍රියන්ති -පෙ- අත්ථි ලොකියං ජීවිතං, නත්ථි ලොකියං ජීවිතින්ද්‍රියන්ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

13. ස. පු: අත්ථි ලොකුත්තරා සද්ධා, අත්ථි ලොකුත්තරං සද්ධින්ද්‍රියන්ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: අත්ථි ලොකියා සද්ධා, අත්ථි ලොකියං සද්ධින්ද්‍රියන්ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

14. ස. පු: අත්ථි ලොකුත්තරං විරියං -පෙ- අත්ථි ලොකුත්තරා පඤ්ඤා, අත්ථි ලොකුත්තරං පඤ්ඤින්ද්‍රියන්ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: අත්ථි ලොකියා පඤ්ඤා, අත්ථි ලොකියං පඤ්ඤින්ද්‍රියන්ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

15. ස. පු: අත්ථි ලොකියා සද්ධා, නත්ථි ලොකියං සද්ධින්ද්‍රියන්ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: අත්ථි ලොකුත්තරා සද්ධා, නත්ථි ලොකුත්තරං සද්ධින්ද්‍රියන්ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

16. ස. පු: අත්ථි ලොකියං විරියං -පෙ- අත්ථි ලොකියා පඤ්ඤා, නත්ථි ලොකියං පඤ්ඤින්ද්‍රියන්ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: අත්ථි ලොකුත්තරා පඤ්ඤා, නත්ථි ලොකුත්තරං පඤ්ඤින්ද්‍රියන්ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

17. ස. පු: නත්ථි ලොකියානි පඤ්චින්ද්‍රියානී'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: ලෞකික මනස් ඇද්ද, ලෞකික මනින්ද්‍රිය නැද්ද, ලෞකික ජීවිත ඇද්ද, ලෞකික ජීවිතින්ද්‍රිය නැද්ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

13. ස. පු: ලොකොත්තර ශ්‍රද්ධා ඇද්ද, ලොකොත්තර ශ්‍රද්ධෙන්ද්‍රිය ඇද්ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු. ලෞකික ශ්‍රද්ධා ඇද්ද, ලෞකික ශ්‍රද්ධෙන්ද්‍රිය ඇද්ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

14. ස. පු: ලෝකෝත්තර වියර්‍ය ඇද්ද, ... ලොකොත්තර ප්‍රඥා ඇද්ද, ලෝකොත්තර ප්‍රඥෙන්ද්‍රිය ඇද්ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: ලෞකික ප්‍රඥා ඇද්ද, ලෞකික ප්‍රඥෙන්ද්‍රිය ඇද්ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

15. ස. පු: ලෞකික ශ්‍රද්ධා ඇද්ද, ලෞකික ශ්‍රද්ධෙන්ද්‍රිය නැද්ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: ලෝකොත්තර ශ්‍රද්ධා ඇද්ද, ලොකොත්තර ශ්‍රද්ධෙන්ද්‍රිය නැද්ද?

ප. පටි: එසේ නො කියයුතු යැ.

16. ස. පු: ලෞකික වියර්‍ ඇද්ද, ... ලෞකික ප්‍රඥා ඇද්ද, ලෞකික ප්‍රඥෙන්ද්‍රිය නැද්ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: ලෝකෝත්තර ප්‍රඥා ඇද්ද, ලොකොත්තර ප්‍රඥෙන්ද්‍රිය නැද්ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

17. ස. පු: ලෞකික පඤ්චෙන්ද්‍රියයෝ නැද්ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: නනු වුත්තං භගවතා, "අද්දසං ඛො අහං භික්ඛවෙ බුද්ධචක්ඛුනා ලොකං ඔලොකෙන්තො සත්තෙ අප්පරජක්ඛෙ තික්ඛින්ද්‍රියෙ මුදින්ද්‍රියෙ ස්වාකාරෙ ද්වාකාරෙ සුවිඤ්ඤාපයෙ දුවිඤ්ඤාපයෙ අප්පෙකච්චෙ පරලොකවජ්ජභයදස්සාවිනො විහරන්තෙ"ති a අත්ථෙ'ව සුත්තන්තො'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. පා: තෙන හි "අත්ථි ලොකියානි පඤ්චින්ද්‍රියානී"ති.

ඉන්ද්‍රිය කථා නිට්ඨිතා.

එකූනවීසතිමො වග්ගො නිට්ඨිතො.

තස්සුද්දානං:

අතීතෙ කිලෙසෙ ජහති, අනාගතෙ කිලෙසෙ ජහති, පච්චුප්පන්නෙ කිලෙසෙ ජහති, සුඤ්ඤතා සඞ්ඛාරක්ඛන්ධපරියාපන්නා, සාමඤ්ඤඵලං අසඞ්ඛතං; පත්ති අසඞ්ඛතා, සබ්බධම්මානං තථතා අසඞ්ඛතා, නිබ්බානධාතු කුසලා, අත්ථි පුථුජ්ජනස්ස අච්චන්තනියාමතා, නත්ථි ලොකියානි පඤ්චින්ද්‍රියානී'ති.

a මජ්ඣිමනිකාය, මූලපණ්ණාසක - අරියපරියෙසන සුත්ත

ස. අනු: භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරනලද මැ නුඃ "මහණෙනි, මම බුදු ඇසින් ලොව බලනුයෙම් අල්පරජස්ක මහාරජස්ක තීක්ෂණෙන්ද්‍රිය මෘද්වින්ද්‍රිය ස්වාකාර ද්වාකාර සුවිඥෙය්‍ය දුර්විඥෙය්‍ය සත්ත්වයන් පරලොකවද්‍යයෙහි භය දක්මින් වෙසෙන ඇතැම් සත්ත්වයන් දිටිමි"යි වදාළ සූත්‍රාන්තයෙක් ඇත්තේ මැ නොවේ?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. පා: එකරුණින් "ලෞකික පඤ්චෙන්ද්‍රියයෝ ඇත."

ඉන්ද්‍රිය කථා නිමි.

එකුන්විසිවැනි වග නිමි.

**එහි උද්දානය:**

අතීත කිලෙසජහනකථා යැ අනාගත කිලෙසජහනකථා යැ පච්චුප්පන්න කිලෙසජහනකථා යැ සුඤ්ඤතාකථා යැ සාමඤ්ඤඵලකථා යැ ප්‍රාප්ති-කථා යැ තථතාකථා යැ කුසලකථා යැ අච්චන්තනියාමකථා යැ ඉන්ද්‍රියකථා යි.

# වීසතිමො වග්ගො

## 20. 1.

## අසඤ්චිච්චකථා.

1. ස. පු: "අසඤ්චිච්ච මාතරං ජීවිතා වොරොපෙත්වා ආනන්තරිකො හොති"ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: අසඤ්චිච්ච පාණං හන්ත්වා පාණාතිපාති හොතී'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

2. ස. පු: අසඤ්චිච්ච මාතරං ජීවිතා වොරොපෙත්වා ආනන්තරිකො හොතී'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: අසඤ්චිච්ච අදින්නං ආදියිත්වා -පෙ- මුසා භණිත්වා මුසාවාදී හොතී'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

3. ස. පු: අසඤ්චිච්ච පාණං හන්ත්වා පාණාතිපාතී න හොතී'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: අසඤ්චිච්ච මාතරං ජීවිතා වොරොපෙත්වා ආනන්තරිකො න හොතී'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ පෙ-

4. ස. පු: අසඤ්චිච්ච අදින්නං ආදියිත්වා -පෙ- මුසා භණිත්වා මුසාවාදී න හොතී'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: සඤ්චිච්ච මාතරං ජීවිතා වොරොපෙත්වා ආනන්ත-රිකො න හොතී'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

5. ස. පු: අසඤ්චිච්ච මාතරං ජීවිතා වොරොපෙත්වා ආනන්තරිකො හොතී'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

# විංශද් වර්ගය

## 20. 1.

## අසඤ්චිච්ච කථා

['ආනන්තර්‍ය්‍යවස්තූ ගරු බැරි වෙයි. එහෙයින් චේතනා නො කොට නමුදු ආනන්තර්‍ය්‍යවස්තු විකෝපන කල කල්හි ආනන්තරික වෙති'යි උත්තරාපථකයන් සෙයින් ලබ්ධි ගත්තවුන්ගේ වාද බිඳුනට අසඤ්චිච්චකථා' එයි]

1. ස. පු: නො දැන මව දිවියෙන් ගලවා ආනන්තරික වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: නො දැන (පර) පණ නසා පාණාතිපාති වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

2. ස. පු: නො දැන මව දිවියෙන් ගලවා ආනන්තරික වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: නො දැන නුදුන්නදය ගෙන ... මුසවා බැණ මුසාවාදී වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

3. ස. පු: නො දැන පණ නසා පාණාතිපාති නො වන්නේ වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: නො දැන මව දිවියෙන් ගලවා ආනන්තරික නො වන්නේ වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

4. ස. පු: නො දැන අදින්නාදාන කොට ... මුසවා බැණ මුසා-වාදී නො වන්නේ වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: දැන මව දිවියෙන් ගලවා ආනන්තරික නො වන්නේ වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

5. ස. පු: නො දැන මව දිවියෙන් ගලවා ආනන්තරික වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. පු: "අසඤ්චිච්ච මාතරං ජීවිතා වොරොපෙත්වා ආනන්තරිකො හොතී"ති අත්ථේ'ව සුත්තන්තො'ති.

ප. වි: නත්ථි.

ස. අනු: "සඤ්චිච්ච මාතරං ජීවිතා වොරොපෙත්වා ආනන්තරිකො හොතී'ති අත්ථේ'ව සුත්තන්තො'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. ඨ: හඤ්චි "සඤ්චිච්ච මාතරං ජීවිතා වොරොපෙත්වා ආනන්තරිකො හොතී'ති අත්ථේ'ව සුත්තන්තො,

ස. පා: නො ච වත රෙ වත්තබ්බෙ "අසඤ්චිච්ච මාතරං ජීවිතා වොරොපෙත්වා ආනන්තරිකො හොතී'ති.

6. ප. පු: න වත්තබ්බං "මාතුඝාතකො ආනන්තරිකො"ති.

ස. පටිඤ්ඤා: ආමන්තා.

ප. අනු: නනු මාතා ජීවිතා වොරොපිතා'ති.

ස. පටිඤ්ඤා: ආමන්තා.

ප. ඨ: හඤ්චි මාතා ජීවිතා වොරොපිතා,

ප. පා: තෙන වත රෙ වත්තබ්බෙ "මාතුඝාතකො ආනන්තරිකො"ති.

7. ප. පු: න වත්තබ්බං "පිතුඝාතකො ආනන්තරිකො'ති.

ස. පටිඤ්ඤා: ආමන්තා.

ප. අනු: නනු පිතා ජීවිතා වොරොපිතො'ති.

ස. පටිඤ්ඤා: ආමන්තා.

ප. ඨ: හඤ්චි පිතා ජීවිතා වොරොපිතො,

ප. පා: තෙන වත රෙ වත්තබ්බෙ "පිතුඝාතකො ආනන්තරිකො"ති.

8. ප. පු: න වත්තබ්බං "අරහන්තඝාතකො ආනන්තරිකො"ති.

ස. පටිඤ්ඤා: ආමන්තා.

ප. අනු: නනු අරහා ජීවිතා වෙරොපිතො'ති.

ස. පටිඤ්ඤා: ආමන්තා.

ප. ඨ: හඤ්චි අරහා ජීවිතා වොරොපිතො,

ප. පා: තෙන වත රෙ වත්තබ්බෙ "අරහන්තඝාතකො ආනන්තරිකො"ති.

| | |
|---|---|
| ස. පු: | "නො දැන මව දිවියෙන් ගලවා ආනන්තරික වෙති"යි වදාල සූත්‍රාන්තයෙක් ඇත්තේ මැ වේ ද? |
| ප. වි: | නැති. |
| ස. අනු: | "දැන මව දිවියෙන් ගලවා ආනන්තරික වෙයි"යි වදාල සූත්‍රාන්තයෙක් ඇත්තේ මැ වේ ද? |
| ප. පටිඤ්ඤා: | එසේ යැ. |
| ස. ඨ: | ඉදින් "දැන මව දිවියෙන් ගලවා ආනන්තරික වෙති"යි. සූත්‍රාන්තයෙක් ඇත්තේ මැ වී නම්, |
| ස. පා: | භවත, "නො දැන මව දිවියෙන් ගලවා ආනන්තරික වේ"යයි නො කියැයුතු මැ යැ. |
| 6. ප. පු: | "මාතෘඝාතක ආනන්තරික වෙති"යි නො කියැයුතු වේ ද? |
| ස. පටිඤ්ඤා: | එසේ යැ. |
| ප. අනු: | මව දිවියෙන් ගලවනලද නො.? |
| ස. පටිඤ්ඤා: | එසේ යැ. |
| ප. ඨ: | ඉදින් මව දිවියෙන් ගලවනලද වී නම්, |
| ප. පා: | භවත එකරුණින් "මාතෘඝාතක ආනන්තරික වෙති"යි කියැයුතු මැ යැ. |
| 7. ප. පු: | "පිතෘඝාතක ආනන්තරික වෙති"යි නො කියැයුතු වේ ද? |
| ස. පටිඤ්ඤා: | එසේ යැ. |
| ප. අනු: | පියා දිවියෙන් ගලවන ලද නො? |
| ස. පටිඤ්ඤා: | එසේ යැ. |
| ප. ඨ: | ඉදින් පියා දිවියෙන් ගලවනලද වී නම්, |
| ප. පා: | භවත එකරුණින් පිතෘඝාතක ආනන්තරික වෙති'යි කියැයුතු මැ යැ. |
| 8. ප. පු: | 'අරහන්තඝාතක ආනන්තරික වෙති'යි නො කියැයුතු වේ ද? |
| ස. පටිඤ්ඤා: | එසේ යැ. |
| ප. අනු: | රහත් දිවියෙන් ගලවනලද නො? |
| ස. පටිඤ්ඤා: | එසේ යැ. |
| ප. ඨ: | ඉදින් රහත් දිවියෙන් ගලවනලද වී නම්, |
| ප. පා: | භවත එකරුණින් 'අරහන්තඝාතක ආනන්තරික වෙති'යි කියැයුතු මැ යැ. |

9. ප. පු: න වත්තබ්බං "ලොහිතුප්පාදකො[1]. ආනන්තරිකො"ති"

ස. පටිඤ්ඤා: ආමන්තා.

ප. අනු: නනු තථාගතස්ස ලොහිතං උප්පාදිතන්ති.

ස. පටිඤ්ඤා: ආමන්තා.

ප. ඨ: හඤ්චි තථාගතස්ස ලොහිතං උප්පාදිතං,

ප. පා: තෙන න වත රෙ වත්තබ්බෙ "ලොහිතුප්පාදකො ආනන්තරිකො"ති.

10. ස. පු: "සඞ්ඝභෙදකො ආනන්තරිකො"ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: "සබ්බෙ සඞ්ඝභෙදකා ආනන්තරිකා"ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

11. ස. පු: සබ්බෙ සඞ්ඝභෙදකා ආනන්තරිකා'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: ධම්මසඤ්ඤී සඞ්ඝභෙදකො ආනන්තරිකො'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

12. ස. පු: ධම්මසඤ්ඤී සඞ්ඝභෙදකො ආනන්තරිකො'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: නනු වුත්තං භගවතා "අත්ථුපාලි සඞ්ඝභෙදකො ආපායිකො නෙරයිකො කප්පට්ඨො අතෙකිච්ඡො, අත්ථුපාලි සඞ්ඝභෙදකො න අපායිකො න නෙරයිකො න කප්පට්ඨො න අතෙකිච්ඡො"ති.[a] අත්ථෙ'ව සුත්තන්තො'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස පා: තෙන හි න වත්තබ්බං "ධම්මසඤ්ඤී සඞ්ඝභෙදකො ආනන්තරිකො"ති.

---

1 රුහිරුප්පාදකො - මජසං. ලොහිරුප්පාදකො - සීමු

a. චුල්ලවග්ගපාළි - සඞ්ඝභෙදක්ඛන්ධක.

9. ප. පු: 'ලෝහිතුප්පාදක ආනන්තරික වෙති'යි නො කියයුතු වේ ද?

ස. පටිඤ්ඤා: එසේ යැ.

ප. අනු: තථාගතයන් වහන්සේගේ ලෙහෙ උපදවනලද නො?

ස. පටිඤ්ඤා: එසේ යැ.

ප. ඨ: ඉදින් තථාගතයන් වහන්සේගේ ලෙහෙ උපදවන ලද වී නම්,

ප. පා: හවත, එකරුණින් 'ලෝහිතුප්පාදක ආනන්තරික වෙති'යි කියයුතු මැ යැ.

10. ස. පු: සඞ්ඝභේදක ආනන්තරික වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: හැම සඞ්ඝභේදකයෝ ආනන්තරික වෙත් ද?

ප. පටි: එසේ නො කියයුතු යැ. ..

11. ස. පු: හැම සඞ්ඝභේදකයෝ ආනන්තරික වෙත් ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: ධම්මසඤ්ඤී ඇති සඞ්ඝභේදක ආනන්තරික වේ ද?

ප. පටි: එසේ නො කියයුතු යැ ..

12. ස. පු: ධම්මසඤ්ඤී ඇති සඞ්ඝභේදක ආනන්තරික වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරනලද නො: "උපාලිය, අපායසංවත්තනික වූ නිරයසංවත්තනික වූ කල්පස්ථ වූ චිකිත්සා රහිත වූ සඞ්ඝභෙදකයෙක් ඇත. උපාලිය, අපායසංවත්තනික නො වූ නිරය-සංවත්තනික නො වූ කල්පස්ථ නො වූ චිකිත්සා රහිත නො වූ සඞ්ඝභෙදකයෙක් ඇතැ"යි වදාළ සූත්‍රාන්තයෙක් ඇත්තේ මැ නො?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. පා: එකරුණින් "ධම්මසඤ්ඤී ඇති සඞ්ඝභෙදක ආනන්තරික වෙති"යි නො කියයුතු යැ.

18 ප. පු: න වත්තබ්බං "ධම්මසඤ්ඤී සඞ්ඝභෙදකො ආනන්තරිකො"ති.

ස. පටිඤ්ඤා: ආමන්තා.

ප. අනු: නනු වුත්තං භගවතා:

"ආපායිකො නෙරයිකො
කප්පට්ඨො සඞ්ඝභෙදකො
වග්ගරතො අධම්මට්ඨො
යොගක්ඛෙමා පධංසති[1]
සඞ්ඝං සමග්ගං භෙත්වාන
කප්පං නිරයම්හි පච්චතී"ති[2]

අත්ථෙ'ව සුත්තන්තො'ති.

ස. පටිඤ්ඤා: ආමන්තා.

ප. පා: තෙන හි "සඞ්ඝභෙදකො ආනන්තරිකො"ති.

අසඤ්චිච්ච කථා නිට්ඨිතා.

1 යොගක්ඛෙමතො ධංසති-සීමු,

2 දසකඞ්ගුත්තර - පඨම ආනන්දසුත්ත

18 ප. පු: "ධම්සංඥ ඇති සඞ්ඝභේදක ආනන්තරික වෙති"යි නො කියැයුතු වේ ද?

ස. පටිඤ්ඤා: එසේ යැ.

ප. අනු: භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරනලද මැ නො:

"අපායසංවත්තික වූ නිරයසංවත්තික වූ කල්පස්ථ වූ වගීරත වූ අධර්මස්ථ වූ සඞ්ඝභෙදක නිවතින් පිරිහේ. සමග සඞ්ඝයා බිඳ කපක් මුළුල්ලෙහි නිරයෙහි පැසේ"යයි වදාළ සුත්‍රාන්තයෙක් ඇත්තේ මැ නො?

ස. පටිඤ්ඤා: එසේ යැ.

ප. පා: එකරුණින් 'සඞ්ඝභේදක ආනන්තරික වෙයි.

අසඤ්චිච්ච කථා නිමි.

## 20. 2.

# ඤාණ කථා

1. ස. පු: නත්ථි පුථුජ්ජනස්ස ඤාණන්ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: නත්ථි පුථුජ්ජනස්ස පඤ්ඤා පජානනා විචයො පවිචයො ධම්මවිචයො සල්ලක්ඛණා උපලක්ඛණා පච්චුපලක්ඛණා'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

ස. අනු: නනු අත්ථි පුථුජ්ජනස්ස පඤ්ඤා පජානනා විචයො -පෙ- පච්චුපලක්ඛණා'ති.

ප. පටිඤ්ඤා. ආමන්තා.

ස. ඨ: හඤ්චි අත්ථි පුථුජ්ජනස්ස පඤ්ඤා පජානනා විචයො -පෙ- පච්චුපලක්ඛණා.

ස. පා: නො ච වත රෙ වත්තබ්බෙ "නත්ථි පුථුජ්ජනස්ස ඤාණ"න්ති.

2. ස. පු: නත්ථි පුථුජ්ජනස්ස ඤාණන්ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: පුථුජ්ජනො පඨමං ඣානං සමාපජ්ජෙය්‍යා'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. ඨ: හඤ්චි පුථුජ්ජනො පඨමං ඣානං සමාපජ්ජෙය්‍ය,

ස. පා: නො ච වත රෙ වත්තබ්බෙ "නත්ථි පුථුජ්ජනස්ස ඤාණ"න්ති.

## 20. 2.

## ඤාණ කථා.

[ලෞකික ලෝකෝත්තර විසින් ඥානය ද්විවිධ වෙයි. සමාපත්ති ඥානයත් දානාදි වශයෙන් පවත්නා කම්ස්වකතා ඥානයත් ලෞකික වෙයි. සත්‍යපරිච්ඡේදක (සත්‍යය පිරිසිඳුනා) මාර්ගඥානයත් ඵලඥානයත් ලෝකෝත්තර වෙයි. මේ වෙනස නො ගෙන සත්‍යපරිච්ඡේදක ඥාන මැ ඥාන වෙයි. අන්‍ය ඥාන නැත. එහෙයින් පෘථග්ජනහට ඥාන නැතැයි හෙතුවාදීන් සෙයින් ලබ්ධි ගත්තවුන්ගේ වාද බිඳුනම ඤාණකථා එයි.]

1. ස. පු: පෘථග්ජනහට ඥාන නැද්ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: පෘථග්ජනහට ප්‍රඥා ප්‍රජානන විචය ප්‍රවිචය ධර්මවිචය සංලක්ෂණ උපලක්ෂණ ප්‍රත්‍යුපලක්ෂණ නැද්ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

ස. අනු. පෘථග්ජනහට ප්‍රඥා ප්‍රජානන විචය ... ප්‍රත්‍යුපලක්ෂණ ඇත් නො?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. ඨා: ඉදින් පෘථග්ජනහට ප්‍රඥා ප්‍රජානන විචය ... ප්‍රත්‍යුපලක්ෂණ ඇත් නම්,

ස. පා: භවත, 'පෘථග්ජනහට ඥාන නැතැ'යි නො කියැයුතු මැ යැ.

2 ස. පු: පෘථග්ජනහට ඥාන නැද්ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: පෘථග්ජන පුද්ගල ප්‍රථමධ්‍යානයට සමවදනේ වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. ඨා: ඉදින් පෘථග්ජන පුද්ගල ප්‍රථමධ්‍යානයට සමවදනේ නම්,

ස. පා: භවත, 'පෘථග්ජනහට ඥාන නැතැ'යි නො කියැයුතු මැ යැ.

3\. ස. පු: පුථුජ්ජනො දුතියං ඣානං -පෙ- තතියං ඣානං -පෙ- චතුත්ථං ඣානං -පෙ- ආකාසානඤ්චායතනං සමාපජ්ජෙය්‍ය, විඤ්ඤාණඤ්චායතනං -පෙ- ආකිඤ්චඤ්ඤායතනං -පෙ- නෙවසඤ්ඤානාසඤ්ඤායතනං සමාපජ්ජෙය්‍ය, පුථුජ්ජනො දානං දදෙය්‍ය -පෙ- චීවරං දදෙය්‍ය -පෙ- පිණ්ඩපාතං දදෙය්‍ය -පෙ- සෙනාසනං දදෙය්‍ය -පෙ- ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරං දදෙය්‍යා'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. ඨ: හඤ්චි පුථුජ්ජනො ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරං දදෙය්‍ය,

ස. පා: නො ච වත රෙ වත්තබ්බෙ "නත්ථි පුථුජ්ජනස්ස ඤාණ"න්ති.

4\. ප. පු: අත්ථි පුථුජ්ජනස්ස ඤාණන්ති.

ස පටිඤ්ඤා: ආමන්තා.

ප. අනු: පුථුජ්ජනො තෙන ඤාණෙන දුක්ඛං පරිජානාති, සමුදයං පජහති, නිරොධං සච්ඡිකරොති, මග්ගං භාවෙතී'ති.

ස. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

ඤාණ කථා නිට්ඨිතා.

3 ස. පු: පෘථග්ජන පුද්ගල ද්විතීයධ්‍යානයට .. තෘතීය ධ්‍යානයට ... චතුර්ථධ්‍යානයට ... ආකාසානඤ්චායතනයට සම්වදනේ වේ ද? විඤ්ඤාණඤ්චායතනයට ... ආකිඤ්චඤ්ඤායතනයට ... නෙවසඤ්ඤානාසඤ්ඤායතනයට සම්වදනේ වේ ද? පෘථග්ජන පුදගල දන් දෙන්නේ වේ ද, ... සිවුරු දෙන්නේ වේ ද, ... පිඬුවා දෙන්නේ වේ ද ... සෙනසුන් දෙන්නේ වේ ද, ගිලන්පස බෙහෙත් පිරිකර දෙන්නේ වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. ඨ: ඉදින්, පෘථග්ජන පුද්ගල ගිලන්පස බෙහෙත් පිරිකර දෙන්නේ වේ නම්,

ස. පා: හවත, 'පෘථග්ජන පුද්ගලහට ඥාන නැතැ'යි නො කියැයුතු මැ යැ.

4 ප. පු: පෘථග්ජනහට ඥාන ඇද්ද?

ස. පටිඤ්ඤා: එසේ යැ.

ප. අනු: පෘථග්ජන පුද්ගල ඒ ඥානයෙන් දුඃඛපරිඥාන කෙරේ ද, සමුදය දුරු කෙරේ ද, නිරෝධය ප්‍රත්‍යක්‍ෂ කෙරේ ද, මාර්ගය වඩන්නේ වේ ද?

ස. පටි: එසේ නො කියැයුතු යැ ...

ඤාණ කථා නිමි.

## 20. 3.

# නිරයපාල කථා.

1. ස. පු: නත්ථි නිරයෙසු නිරයපාලා'ති.
ප. පටිඤ්ඤා: ආමන්තා.
ස. අනු: නත්ථි නිරයෙසු කම්මකාරණා'ති.
ප. පටි: න හෙවං වත්තබ්බෙ –පෙ–

2. ස. පු: අත්ථි නිරයෙසු කම්මකාරණා'ති.
ප. පටිඤ්ඤා: ආමන්තා.
ස. අනු: අත්ථි නිරයෙසු නිරයපාලා'ති.
ප. පටි: න හෙවං වත්තබ්බෙ –පෙ–

3. ස. පු: අත්ථි මනුස්සෙසු කම්මකාරණා, අත්ථි ච කාරණිකා'ති.
ප. පටිඤ්ඤා. ආමන්තා.
ස. අනු: අත්ථි නිරයෙසු කම්මකාරණා, අත්ථි ච කාරණිකා'ති.
ප. පටි: න හෙවං වත්තබ්බෙ –පෙ–

4. ස. පු: අත්ථි නිරයෙසු කම්මකාරණා, නත්ථි ච කාරණිකා'ති.
ප පටිඤ්ඤා: ආමන්තා.
ස. අනු: අත්ථි මනුස්සෙසු කම්මකාරණා, නත්ථි ච කාරණිකා'ති.
ප. පටි: න හෙවං වත්තබ්බෙ –පෙ–

5. ප. පු: අත්ථි නිරයෙසු නිරයපාලා'ති.
ස. පටිඤ්ඤා: ආමන්තා.

20. 3.

## නිරයපාල කථා

['නිරයෙහි නිරයසංවත්තනික කර්ම මැ නිරයපාලරූප වශයෙන් වධ කෙරෙත් මිස නිරයපාල සත්ත්වයෝ නැතැ'යි අන්ධක නිකායවාසීන් සෙයින් ලබ්ධි ගත්තවුන්ගේ වාද බිඳුනම නිරයපාලකථා එයි.]

1 ස. පු: නිරයෙහි නිරයපාලකයෝ නැද්ද?

ප පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: නිරයෙහි කම්කටොලු නැද්ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

2. ස. පු: නිරයෙහි කම්කටොලු ඇද්ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: නිරයෙහි නිරුපල්ලෝ ඇද්ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

3. ස. පු: මිනිසුන් කෙරෙහි කම්කටොලු ඇද්ද, කම්කටොලු කරන්නෝත් ඇද්ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: නිරයෙහි කම්කටොලු ඇද්ද, කම්කටොලු කරන්නෝත් ඇද්ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

4. ස. පු: නිරයෙහි කම්කටොලු ඇද්ද, කම්කටොලු කරන්නෝ නැද්ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: මිනිසුන් කෙරෙහි කම්කටොලු ඇද්ද, කම්කටොලු කරන්නො නැද්ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ

5. ප. පු: නිරයෙහි නිරුපල්ලෝ ඇද්ද?

ස. පටිඤ්ඤා: එසේ යැ.

ප. අනු: නනු වුත්තං භගවතා:

"න වෙස්සභූ නො'පි ච පෙත්තිරාජා
සොමො යමො වෙස්සවණො ච රාජා
සකානි කම්මානි හනන්ති තත්ථ
ඉතො පණුන්නං පරලොකපත්තන්ති"

අත්ථෙ'ව සුත්තන්තො'ති.

ස. පටිඤ්ඤා. ආමන්තා.

ප. පා: තෙන හි නත්ථි නිරයෙසු නිරයපාලා'ති.

6. ස. පු: නත්ථි නිරයෙසු නිරයපාලා'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: නනු වුත්තං භගවතා: "තමෙනං භික්ඛවෙ නිරයපාලා පඤ්චවිධ බන්ධනං නාම කම්මකාරණං කාරෙන්ති; තත්තං අයොඛිලං හත්ථෙ ගමෙන්ති, තත්තං අයොඛිලං දුතියෙ හත්ථෙ ගමෙන්ති, තත්තං අයොඛිලං පාදෙ ගමෙන්ති, තත්තං අයොඛිලං දුතියෙ පාදෙ ගමෙන්ති, තත්තං අයොඛිලං මජ්ඣෙ උරස්මිං ගමෙන්ති. සො තත්ථ දුක්ඛා තිබ්බා කටුකා වෙදනා වෙදෙති, න ච තාව කාලං කරොති යාව.[1] න තං පාපං කම්මං.[2] බ්‍යන්තීහොති"ති [*] අත්ථෙ'ව සුත්තන්තො'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. පා: තෙ න හි අත්ථි නිරයෙසු නිරයපාලා'ති.

7. ස. පු: නත්ථි නිරයෙසු නිරයපාලා'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: නනු වුත්තං භගවතා: "තමෙනං භික්ඛවෙ නිරයපාලා සංවෙසෙත්වා කුඨාරීහි[3] තච්ඡන්ති. තමෙනං භික්ඛවෙ නිරයපාලා උද්ධපාදං.[4] අධොසිරං ගහෙත්වා වාසීහි තච්ඡන්ති. තමෙනං භික්ඛවෙ නිරයපාලා රථෙ යොජෙත්වා ආදිත්තාය පඨවියා සම්පජ්ජලිතාය සජොතිභූතාය සාරෙන්ති'පි පච්චාසාරෙන්තිපි -පෙ- තමෙනං භික්ඛවෙ නිරයපාලා මහන්තං අඞ්ගාරපබ්බතං ආදිත්තං සම්පජ්ජලිතං සජොතිභූතං ආරොපෙන්ති'පි ඔරොපෙන්ති'පි
-පෙ-

1 යාව ච - සිමු.
2 පාපකම්මං - සිමු, මජසං, සතා, PTS
3 කුඨාරීහි - සිමු, PTS.
4. උද්ධංපාදං - සිමු, මජසං, PTS
[*] මජ්ඣිමනිකාය, දෙවදූත සුත්ත.

ප. අනු: භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරනලද නොඃ

"මෙලොවින් හරනලද පරලොවට ගියහු එහි දී වෛශ්‍යාභූරජ ද නො නසයි. ප්‍රේතරජ ද නො නසයි. සෝම යැ යම යැ වෛශ්‍රවණරජ යැ යන මොහු ද නො නසති. (වැලිත්) ස්වකීය කර්මයෝ මැ නසති"යි. වදාළ සූත්‍රාන්තයෙක් ඇත්තේ මැ නොවේ?

සඃ පටිඤ්ඤා: එසේ යැ.

ප. පා: එකරුණින් නිරයෙහි නිරුපල්ලෝ නැත.

6. ස. පු: නිරයෙහි නිරුපල්ලෝ නැද්ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරනලද නොඃ

"මහණෙනි, තුලුහුට යමපල්හු පඤ්චවිධබන්ධන නම් කම්කටොලු කෙරෙති: රත්වූ යහුලක් අතෙක ගසති. රත්වූ යහුලක් දෙවන අතැ ගසති. රත්වූ යහුලක් පයෙකැ ගසති. රත්වූ යහුලක් දෙවන පයැ ගසති. රත්වූ යහුලක් උරමැද ගසති. හේ එහි දී තිව්‍ර වූ කටුක වූ දුක් වේදනා විඳී. ඒ පාපකර්ම ගෙවී අපගත නො වන තාක් කල් නො ද මියෙයි" වදාළ සූත්‍රාන්තයෙක් ඇත්තේ මැ නොවේ?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. පා: එකරුණින් නිරයෙහි නිරුපල්ලෝ ඇත.

7. ස. පු: නිරයෙහි යමපල්හු නැද්ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරනලද නොඃ

"මහණෙනි, යමපල්හු තුලුහු (යපොලොවැ) හොවා පොරොවින් සසිති. මහණෙනි, යමපල්හු තුලුහු පා උඩුබල්වා හිස කිඹ බල්වා තබා වැහැයෙන් සසිති. මහණෙනි, යමපල්හු තුලුහු රියෙහි යොදා ඇවිලගත් ගිනි සහිත ප්‍රජ්වලිත පෘථිවියෙහි ඔබමොබ ඇවිදුවත් ... මහණෙනි, යමපල්හු තුලුහු ඇවිලගත් ගිනි සහිත ප්‍රජ්වලිත වූ මහත් අඞ්ගාර පර්වතයට නංවති, බස්වති ...

තමෙනං භික්ඛවෙ නිරයපාලා උද්ධපාදං අධොසිරං ගහෙත්වා තත්තාය ලොහකුම්භියා පක්ඛිපන්ති ආදිත්තාය සම්පජ්ජලිතාය සජොතිභූතාය. සො තත්ථ ඵෙණුද්දෙහකං පච්චති. සො තත්ථ ඵෙණුද්දෙහකං පච්චමානො සකිම්පි උද්ධං ගච්ඡති. සකිම්පි අධොගච්ඡති. සකිම්පි තිරියං ගච්ඡති. සො තත්ථ තිබ්බා කටුකා වෙදනා වෙදෙති, න ච තාව කාලං කරොති යාව න තං පාපං කම්මං බ්‍යන්තී හොති. තමෙනං භික්ඛවෙ නිරයපාලා මහානිරයෙ පක්ඛිපන්ති. සො ඛො පන භික්ඛවෙ මහානිරයො:

"චතුක්කණ්ණො චතුද්වාරො
විභත්තො භාගසො මිතො
අයොපාකාරපරියන්තො අයසා පටිකුජ්ජිතො.

තස්ස අයොමයා භූමි ජලිතා තෙජසා යුතා
සමන්තා යොජනසතං ඵරිත්වා තිට්ඨති
සබ්බදා"ති.[1]

අත්ථෙව සුත්තන්තො'ති.

ප. පටිසුදූ: ආමන්තා.

ස. පා. තෙන හි අත්ථි නිරයෙසු නිරයපාලා'ති.

නිරයපාල කථා නිට්ඨිතා.

1. මජ්ඣිමනිකාය - උපරිපණ්ණාසක - දෙවදූත සුත්ත

මහණෙනි, යමපල්හු තුලුහු පා උඩුබැල්වා හිස බිම බල්වා ගෙන තප්ත වූ ආදීප්ත වූ ජ්‍යොතිර්භූත වූ සම්ප්‍රජ්වලිත වූ ලොහකුම්භියෙහි ප්‍රක්ෂෙප කෙරෙති. හෙ එහි පෙණ උදහ කොට පැසෙයි. හේ එහි පෙණ උදහ කොට පස්තේ වරක් උඩට යෙයි. වරක් යටට යෙයි. වරක් සරසට යෙයි. හේ එහි තිව්‍ර වූ කටුක වූ දුක් වේදනා විඳියි. ඒ පාප කර්‍ම අපගත නො වනතාක් කල් නො මියෙයි. මහණෙනි, යමපල්හු තුලුහු ගෙන මහානිරයෙහි බහාලති. මහණෙනි, ඒ මහානිරය වනාහි:

"සතරකන් ඇතියෙ යැ. සතර දොර ඇතියෙ යැ. කොටස් විසින් පමණ කොට බෙදන ලදුයෙ යැ. යපවුරින් පිරිකෙව් කරනලද්දෙ යැ. යපියනින් වසනලද්දේ යි.

එහි අයොමයභූමිය ජ්වලිත වූවා තෙදින් යුතු වූවා හාත්පසින් සියක් යොදුන් තැන හැම කල්හි පැතිර සිටී"යයි වදාළ සූත්‍රාන්තයෙක් ඇත්තේ මැ නො?

ප. පරවාදී: එසේ යැ.

ස. පා: එකරුණින් නිරයෙහි නිරයපාලකයෝ ඇත.

නිරයපාල කථා නිමි.

## 20. 4.

# තිරච්ඡාන කථා.

1. ස. පු: අත්ථි දේවෙසු තිරච්ඡානගතා'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: අත්ථි තිරච්ඡානගතෙසු දෙවා'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

2. ස. පු: අත්ථි දෙවෙසු තිරච්ඡානගතා'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: දෙවලොකො තිරච්ඡානයොනී'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

3. ස. පු: අත්ථි දෙවෙසු තිරච්ඡානගතා'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: අත්ථි තත්ථ කීටා පටඞ්ගා මකසා මක්ඛිකා අහී විච්ඡිකා සතපදී ගණ්ඩුප්පාදා'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

4. ප. පු: නත්ථි දෙවෙසු තිරච්ඡානගතා'ති.

ස. පටිඤ්ඤා: ආමන්තා

ප. අනු: නනු අත්ථි තත්ථ එරාවණො නාම හත්ථිනාගො, සහස්සයුත්තං දිබ්බං යානන්ති.

ස. පටිඤ්ඤා: ආමන්තා.

ප ථ: හඤ්චි අත්ථි තත්ථ එරාවණො නාම හත්ථිනාගො, සහස්සයුත්තං දිබ්බං යානං,

ප. පා· තෙන වත රෙ වත්තබ්බෙ 'අත්ථි දෙවෙසු තිරච්ඡානගතා''ති.

---

1. මජ්ඣිමනිකාය, උපරිපණ්ණාසක - දෙවදූත සුත්ත

## 20. 4.

# තිරච්ඡාන කථා.

[දෙවියන් කෙරෙහි ඓරාවණ ආදි දිව්‍යපුත්‍රයෝ හස්තිවර්ණ අශ්වවර්ණ විකුර්වණ කෙරෙති. එහි තිරිසන්ගතයෝ නැත. යම් කෙනකුන්ම තිරිසන්වතින් සිටි දිව්‍යපුත්‍රයන් දැක 'දෙව්ලොවැ තිරිසන්ගිය සත්ත්වයෝ ඇතැ'යි අන්ධකනිකායවංසිනම හෙයින් ලබ්ධි ඇත් ද උන්ගේ මත බිඳුනම 'තිරච්ඡානකථා' එයි.]

1. ස. පු: දෙව්ලොවැ තිරිසන්ගිය සත්ත්වයෝ ඇද්ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: තිරිසන්ගිය සත්ත්වයන් කෙරෙහි දෙවියෝ ඇද්ද?

ප. පටිඤ්ඤා: එසේ නො කියැයුතු යැ ...

2. ස. පු: දෙව්ලොවැ තිරිසන්ගිය සත්ත්වයෝ ඇද්ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: දෙව්ලෝ තිරිසන් යෝනි වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ. ...

3. ස. පු: දෙවියන් කෙරෙහි තිරිසන්ගතයෝ ඇද්ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: එහි කුරුමිණියෝ පළගැටියෝ මදුරුවෝ මැස්සෝ සපුහු නුහුසුවෝ සියපාහු ගඹිල්ලු ඇද්ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

4. ප. පු: දෙවියන් කෙරෙහි තිරශ්චීනගතයෝ නැද්ද?

ස. පටිඤ්ඤා: එසේ යැ.

ප. අනු: එහි ඓරාවණ නම් හස්තිරාජයෙක්, සහස්‍රයුක්ත දිව්‍යයානයෙක් ඇත් නො?

ස. පටිඤ්ඤා: එසේ යැ.

ප. ඨා: ඉදින් එහි ඓරාවණ නම් හස්තිරාජයෙක්, සහස්‍රයුක්ත දිව්‍යයානයෙක් ඇත් නම්,

ප. පා: හවත එකරුණින් "දෙවියන් කෙරෙහි තිශ්චිරන-ගතයෝ ඇත.

5. ස. පු: අත්ථි දෙවෙසු තිරච්ඡානගතා'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: අත්ථි තත්ථ හත්ථිබන්ධා අස්සබන්ධා යාවසිකා කාරණිකා භත්තකාරකා'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

ස. පා: තෙන හි "නත්ථි දෙවෙසු තිරච්ඡානගතා"ති.

තිරච්ඡාන කථා නිට්ඨිතා.

6\. ස. පු: දෙවියන් කෙරෙහි තිරශ්චීනගතයෝ ඇද්ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: එහි ඇත්ගොවුවෝ අස්ගොවුවෝ හස්ති ආදින්ට යව (තණාදිය) දෙන්නෝ හස්තිදමකාදි කම් කරන්නෝ හස්ති ආදින්ට බත් පිසන්නෝ ඇද්ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

ස. පා: එ කරුණින් ‘දෙවියන් කෙරෙහි තිරශ්චීනගතයෝ නැත.

තිරච්ඡාන කථා නිමි.

20. 5.

# මග්ගකථා.

1. ස. පු: පඤ්චඞ්ගිකො මග්ගො'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: නනු අට්ඨඞ්ගිකො මග්ගො වුත්තො භගවතා: සෙය්‍යථීදං සම්මාදිට්ඨි –පෙ– සම්මාසමාධී'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. ඨ: හඤ්චි අට්ඨඞ්ගිකො මග්ගො වුත්තො භගවතා: සෙය්‍යථීදං සම්මාදිට්ඨි –පෙ– සම්මාසමාධි.

ස පා: නො ච වත රෙ වත්තබ්බෙ "පඤ්චඞ්ගිකො මග්ගො"ති.

2. ස. පු: පඤ්චඞ්ගිකො මග්ගො'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: නනු වුත්තං භගවතා:

"මග්ගානට්ඨඞ්ගිකො[1] සෙට්ඨො
සච්චානං චතුරො පදා
විරාගො සෙට්ඨො ධම්මානං
ද්විපදානඤ්ච චක්ඛුමා"ති[2]

අත්ථෙ'ව සුත්තන්තො'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. ප: තෙන හි "අට්ඨඞ්ගිකො මග්ගො"ති.

3. ස. පු: සම්මාවාචා මග්ගඞ්ගං, සා ච න මග්ගො'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: සම්මාදිට්ඨි මග්ගඞ්ගං, සා ච න මග්ගො'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ –පෙ–

---

1. මග්ගානං අට්ඨඞ්ගිකො - මජසං.
2. ධම්මපදං.

## 20. 5.

# මග්ග කථා

["පුබ්බෙව ඛො පනස්ස කායකම්මං වචීකම්මං ආජීවො සුපරිසුද්ධො හොති – පළමු මැ ඔහුගේ කායකම් වාක්කම් ආජීව සුපරිශුද්ධ වෙයි" යන මේ සූත්‍රපාඨ ද, සම්‍යක් වචන කර්මාන්ත ආජීවයන්ගේ චිත්ත විප්‍රයුක්තතා ද නිසා නිෂ්පර්‍යායයෙන් මාර්ගය පඤ්චාඞ්ගික වෙති'යි මහිංසාසක නිකායවාසීන් සෙයින් ලබ්ධි ගත්තාහු ඇත. උන්ගේ වාද බිඳුනට 'මග්ගකථා' එයි ]

1. ස. පු: මාර්ගය පඤ්චාඞ්ගික වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: භාග්‍යවතුන් වහන්සේ විසින් අෂ්ටාඞ්ගිකමාර්ගය වදාරනලද නොවෙ: ඒ කෙසේ යැ යත්? "සම්‍යග්-දෘෂ්ටි ය ... සම්‍යක්සමාධි" යි වදාරනලද නො?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. ඨ: ඉදින් භාග්‍යවතුන් වහන්සේ විසින් අෂ්ටාඞ්ග-මාර්ගය වදාරනලද වී නම්, ඒ කෙසේ යැ යත්: 'සම්‍යක්දෘෂ්ටි යැ ... සම්‍යක් සමාධි'යි වදාරනලද වී නම්,

ස. පා: භවත මාර්ගය පඤ්චාඞ්ගික යයි නො කියැයුතු මැ යැ.

2. ස. පු: මාර්ගය පඤ්චාඞ්ගික වේ ද,

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරනලද නොවෙ:

"මාර්ගයන් අතුරින් අෂ්ටාඞ්ගමාර්ගය උතුම්. සත්‍ය-යන් අතුරින් (දුඃඛසත්‍යාදි) සතරපදයෝ උතුම්හ. ධර්මයන් අතුරින් විරාගය උතුම්. දෙපා ඇතියවුන් අතුරින් චක්ෂුෂ්මත් බුදුහු උතුම්හ" යි වදාළ සූත්‍රාන්තයෙක් ඇත්තේ මැ නො?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. පා: එකරුණින් මාර්ගය අෂ්ටාඞ්ග ඇති වෙයි.

3. ස. පු: සම්‍යග් වචනය මාර්ගාඞ්ග වෙයි, එ ද මාර්ග නො වන්නේ වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: සම්‍යග්දෘෂ්ටිය මාර්ගාඞ්ග වෙයි, එ ද මාර්ග නො වන්නේ වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

4. ස. පු: සම්මාවාචා මග්ගඞ්ගං, සා ච න මග්ගෝ'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: සම්මාසඞ්කප්පෝ -පෙ- සම්මාවායාමෝ -පෙ- සම්මාසති -පෙ- සම්මාසමාධි මග්ගඞ්ගං, සෝ ච න මග්ගෝ'ති.

ප. පටි: න හේවං වත්තබ්බේ -පෙ-

5. ස. පු: සම්මාකම්මන්තෝ -පෙ- සම්මා ආජීවෝ මග්ගඞ්ගං, සෝ ච න මග්ගෝ'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: සම්මාදිට්ඨි -පෙ- සම්මාසමාධි මග්ගඞ්ගං, සෝ ච න මග්ගෝ'ති.

ප. පටි: න හේවං වත්තබ්බේ -පෙ-

6. ස. පු: සම්මාදිට්ඨි මග්ගඞ්ගං, සා ච මග්ගෝ'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: සම්මාවාචා මග්ගඞ්ගං, සා ච මග්ගෝ'ති.

ප. පටි: න හේවං වත්තබ්බේ -පෙ-

7. ස පු: සම්මාදිට්ඨි මග්ගඞ්ගං, සා ච මග්ගෝ'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: සම්මාකම්මන්තෝ -පෙ- සම්මාආජීවෝ මග්ගඞ්ගං, සෝ ච මග්ගෝ'ති.

ප. පටි: න හේවං වත්තබ්බේ -පෙ-

8. ස. පු: සම්මාසඞ්කප්පෝ -පෙ- සම්මාවායාමෝ -පෙ- සම්මාසති -පෙ- සම්මාසමාධි මග්ගඞ්ගං, සෝ ච මග්ගෝ'ති.

ප. පටි: ආමන්තා.

ස. අනු: සම්මාවාචා -පෙ- සම්මාකම්මන්තෝ -පෙ- සම්මා ආජීවෝ මග්ගඞ්ගං, සෝ ච මග්ගෝ'ති.

ප. පටි: න හේවං වත්තබ්බේ -පෙ-

9. ප. පු: අරියෝ අට්ඨඞ්ගිකෝ මග්ගෝ'ති.

ස. පටිඤ්ඤා: ආමන්තා.

4. ස. පු: සම්‍යග්වචනය මාර්ගාඞ්ග වෙයි, එ ද මාර්ග නො වන්නේ වේ ද?

ප. පටිඤ්ඤා: එසේ ය.

ස. අ: සම්‍යක්සංකල්පය .. සම්‍යග්ව්‍යායාමය සම්‍යක්-ස්මෘතිය ... සම්‍යක්සමාධිය මාර්ගාඞ්ග වෙයි, එ ද මාර්ග නො වන්නේ වේ ද?

ප. පටි: එසේ නො කියැ යුතු යැ ...

5. ස. පු: සම්‍යක්කර්මාන්තය සම්‍යගාජීවය මාර්ගාඞ්ග වෙයි, එ ද මාර්ග නො වන්නේ වේ ද?

ප. පටිඤ්ඤා: එසේ ය.

ස. අනු: සම්‍යග්දෘෂ්ටිය ... සම්‍යක්සමාධිය මාර්ගාඞ්ග වෙයි, එ ද මාර්ග නො වන්නේ වේ ද?

ප. පටි: එසේ නො කියැ යුතු යැ ....

6. ස. පු: සම්‍යග්දෘෂ්ටි මාර්ගාඞ්ග වෙයි, එ ද මාර්ග වේ ද?

ප. පටිඤ්ඤා: එසේ ය.

ස. අනු: සම්‍යග්වචන මාර්ගාඞ්ග වෙයි, එ ද මාර්ග වේ ද?

ප පටි: එසේ නො කියැ යුතු යැ ...

7. ස. පු: සම්‍යග්දෘෂ්ටි මාර්ගාඞ්ග වෙයි, එ ද මාර්ග වේ ද?

ප. පටිඤ්ඤා: එසේ ය.

ස. අනු: සම්‍යක්කර්මාන්ත ... සම්‍යගාජීව මාර්ගාඞ්ග වෙයි එ ද මාර්ග වේ ද?

ප. පටි: එසේ නො කියැ යුතු යැ. ...

8. ස. පු: සම්‍යක්සංකල්ප ... සම්‍යග්ව්‍යායාම ... සම්‍යක්-ස්මෘති ... සම්‍යක්සමාධි මාර්ගාඞ්ග වෙයි, එ ද මාර්ග වේ ද?

ප. පටිඤ්ඤා: එසේ ය.

ස අනු: සම්‍යග්වචන ... සම්‍යක්කර්මාන්ත ... සම්‍යගාජීව මාර්ගාඞ්ග වෙයි, එ ද මාර්ග වේ ද?

ප. පටි: එසේ නො කියැ යුතු යැ ...

9. ප. පු: ආර්‍ය්‍යඅෂ්ටාඞ්ගික මාර්ග වේ ද?

ස. පටිඤ්ඤා: එසේ ය.

ප. අනු: නනු වුත්තං භගවතා "පුබ්බෙ'ව ඛො පනස්ස කායකම්මං වචීකම්මං ආජීවො සුපරිසුද්ධො හොති එවමස්සායං අරියො අට්ඨඞ්ගිකො මග්ගො භාවනා පාරිපූරිං ගච්ඡතී"ති.a අත්ථෙ'ව සුත්තන්තො'ති.

ස. පටිඤ්ඤා: ආමන්තා.

ප. පා: තෙන හි "පඤ්චඞ්ගිකො මග්ගො"ති

10. ස. පු: පඤ්චඞ්ගිකො මග්ගො'ති

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: නනු වුත්තං භගවතා: "යස්මිං ඛො සුභද්ද ධම්මවිනයෙ අරියො අට්ඨඞ්ගිකො මග්ගො න උපලබ්භති, සමණො'පි තත්ථ න උපලබ්භති, දුතියො'පි තත්ථ සමණො න උපලබ්භති, තතියොපි තත්ථ සමණො න උපලබ්භති, චතුත්ථො'පි තත්ථ සමණො න උපලබ්භති. යස්මිඤ්ච ඛො සුභද්ද ධම්මවිනයෙ අරියො අට්ඨඞ්ගිකො මග්ගො උපලබ්භති, සමණො'පි තත්ථ උපලබ්භති දුතියො'පි -පෙ- තතියො'පි -පෙ- චතුත්ථො'පි තත්ථ සමණො උපලබ්භති. ඉමස්මිං ඛො සුභද්ද ධම්මවිනයෙ අරියො අට්ඨඞ්ගිකො මග්ගො උපලබ්භති. ඉධෙව සුභද්ද සමණො, ඉධ දුතියො සමණො, ඉධ තතියො සමණො, ඉධ චතුත්ථො සමණො. සුඤ්ඤා පරප්පවාදා සමණෙහි අඤ්ඤෙ"තිb. අත්ථෙ'ව සුත්තන්තො'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. පා: තෙන හි "අට්ඨඞ්ගිකො මග්ගො"ති.

මග්ග කථා නිට්ඨිතා

a. මජ්ඣිමනිකාය - මහාසළායතනික සුත්ත.
b. දීඝනිකාය - මහාපරිනිබ්බාන සුත්ත.

ප. අනු: භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරනලද නොඃ "පළමු මැ ඔහට කායකම් වාක්කම් ආජීව සුපරිශුද්ධ වෙයි. මෙසේ ඔහට මේ ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගික මාර්ගය භාවනායෙන් පරිපූර්ණ බවට යේ" යයි වදාළ සූත්‍රාන්තයෙක් ඇත්තේ මැ වේ ද?

ස. පටිඤ්ඤා: එසේ යැ.

ප. පා: එකරුණින් පඤ්චාඞ්ගික මාර්ගය වේ.

10. ස. පු: පඤ්චාඞ්ගික මාර්ගය වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරනලද නො? සුභද්‍රය, යම් ධර්මවිනයෙකැ ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගික මාර්ගය නො ලැබේ ද, එහි ශ්‍රමණ ද නො ලැබෙයි. එහි ද්විතීය ශ්‍රමණ ද නො ලැබෙයි, එහි තෘතීය ශ්‍රමණ ද නො ලැබෙයි. එහි චතුර්ථ ශ්‍රමණ ද නො ලැබෙයි. සුභද්‍රය වැළිත් යම් ධර්මවිනයෙකැ ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගික මාර්ගය උපලබ්ධ වේ ද, එහි ශ්‍රමණ ද උපලබ්ධ වෙයි. එහි ද්විතීය ශ්‍රමණ ද උපලබ්ධ වෙයි. එහි තෘතීය .. එහි චතුර්ථ ශ්‍රමණ ද උපලබ්ධ වෙයි. සුභද්‍රය, මේ ධර්ම විනයෙහි ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගික මාර්ගය උපලබ්ධ වෙයි. සුභද්‍රය, ශ්‍රමණ (සෝවත්) මේ සස්නෙහි මැ වෙයි. ද්විතීය ශ්‍රමණ (සෙදගැමි) ද මෙහි මැ වෙයි. තෘතීය ශ්‍රමණ (අනාගැමි) ද මෙහි මැ වෙයි. චතුර්ථ ශ්‍රමණ (රහත්) ද මෙහි මැ වෙයි. අන්‍ය පර (දෙසැට මිසදිටු ගතුවන්ගේ) ප්‍රවාදයෝ ශ්‍රමණයන්ගෙන් ශූන්‍ය වෙති"යි වදාළ සූත්‍රාන්තයෙක් ඇත්තේ මැ නො?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. පා. එකරුණින් අෂ්ටාඞ්ගිකමාර්ග වෙයි.

මග්ග කථා නිමි.

## 20. 6.

## ඤාණ කථා.

1. ස. පු: ද්වාදසවත්ථුකං ඤාණං ලොකුත්තරන්ති.
ප. පටිඤ්ඤා: ආමන්තා.
ස. අනු: ද්වාදස ලොකුත්තරඤාණානී'ති.
ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

2. ස. පු: ද්වාදස ලොකුත්තරඤාණානී'ති.
ප. පටිඤ්ඤා: ආමන්තා.
ස. අනු: ද්වාදස සොතාපත්තිමග්ගා'ති.
ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

3. ස. පු: ද්වාදස සොතාපත්තිමග්ගා'ති.
ප. පටිඤ්ඤා: ආමන්තා.
ස. අනු: ද්වාදස සොතාපත්තිඵලානී'ති.
ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-
ස. අනු: ද්වාදස සකදාගාමී -පෙ- අනාගාමී -පෙ- අරහත්තමග්ගා'ති.
ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

4. ස. පු: ද්වාදස අරහත්තමග්ගා'ති.
ප. පටිඤ්ඤා: ආමන්තා.
ස. අනු: ද්වාදස අරහත්තඵලානී'ති.
ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

## 20. 6.

# ඤාණ කථා.

[ලෞකික ලෝකෝත්තර විසින් ඥානය ද්විවිධ යි. සමාපත්ති-ඥානයත් දානාදි වශයෙන් පැවැති කර්මස්වකෘත ඥානයත් ලෞකික වෙයි. සත්‍යය පිරිසිඳුනා මාර්ගඥානයත් ඵලඥානයත් ලෝකෝත්තර වෙයි. මේ වෙනස නො ගෙන 'සත්‍යය පිරිසිඳුනා ඥානය මැ ඥාන වෙයි, සෙසු ඥාන නැතැ'යි ද එහෙයින් මැ පෘථග්ජනහට ඥානය නැතැ'යි ද හේතුවාදීන් සෙයින් ලබ්ධි ගතුවන්ගේ වාද බිඳුනට 'ඤාණකථා' එයි.]

1. ස. පු: ද්වාදශවස්තුකඥානය ලෝකෝත්තර වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: ලෝකෝත්තරඥාන දෙලොසෙක් ඇද්ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

2. ස. පු: ලෝකෝත්තරඥාන දෙලොසෙක් ඇද්ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස අනු: සෝවාන් මාර්ග දෙලොසෙක් ඇද්ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

3. ස. පු: ශ්‍රොතාපත්තිමාර්ග දෙලොසෙක් ඇද්ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: ශ්‍රොතාපත්තිඵල දෙලොසෙක් ඇද්ද?

ප. පටිඤ්ඤා: එසේ නො කියැයුතු යැ ...

ස. අනු: සකෘදාගාමිමාර්ග දෙලොසෙක් ... අනාගාමි ... අර්හත්මාර්ග දෙලොසෙක් ඇද්ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

4. ස. පු: අර්හත්මාර්ග දෙලොසෙක් ඇද්ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: අර්හත්ඵල දෙලොසෙක් ඇද්ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ..

6\. ප. පු: න වත්තබ්බං ද්වාදසවත්ථුකං ඤාණං ලොකුත්තරන්ති.

ස. පටිඤ්ඤා: ආමන්තා.

ප. අනු: නනු වුත්තං භගවතා: "ඉදං දුක්ඛං අරියසච්චන්ති මෙ භික්ඛවෙ පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි ඤාණං උදපාදි විජ්ජා උදපාදි පඤ්ඤා උදපාදි අලොකො උදපාදි. තං ඛො පනිදං දුක්ඛං අරියසච්චං පරිඤ්ඤෙය්‍යන්ති මේ භික්ඛවෙ -පෙ- පරිඤ්ඤාතන්ති මෙ භික්ඛවෙ -පෙ- ඉදං දුක්ඛසමුදයො අරියසච්චන්ති මෙ භික්ඛවෙ -පෙ- තං ඛො පනිදං දුක්ඛසමුදයො අරියසච්චං පහාතබ්බන්ති මෙ භික්ඛවෙ -පෙ- පහීනන්ති මෙ භික්ඛවෙ-පෙ- ඉදං දුක්ඛනිරොධො[1] අරියසච්චන්ති මෙ භික්ඛවෙ -පෙ- තං ඛො පනිදං දුක්ඛනිරොධො[1] අරියසච්චං සච්ඡිකාතබ්බන්ති මෙ භික්ඛවෙ -පෙ- සච්ඡිකතන්ති මෙ භික්ඛවෙ -පෙ- ඉදං දුක්ඛනිරොධගාමිනීපටිපදා අරියසච්චන්ති මෙ භික්ඛවෙ -පෙ- තං ඛො පනිදං දුක්ඛනිරොධගාමිනීපටිපදා අරියසසච්චං භාවෙතබ්බන්ති මෙ භික්ඛවෙ -පෙ- භාවිතන්ති මෙ භික්ඛවෙ පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි -පෙ- ආලොකො උදපාදී"ති[2] අත්ථෙ'ව සුත්තන්තො'ති.

ස. පටිඤ්ඤා: ආමන්තා.

ප. පා: තෙන හි "ද්වාදසවත්ථුකං ඤාණං ලොකුත්තර"න්ති.

ඤාණ කථා නිට්ඨිතා.

වීසතිමො වග්ගො නිට්ඨිතො.

තස්සුද්දානං:

මාතුඝාතකො ආනන්තරිකො, පිතුඝාතකො ආනන්තරිකො, අරහන්තඝාතකො ආනන්තරිකො, ලොහිතුප්පාදකො ආනන්තරිකො, සඞ්ඝභෙදකො ආනන්තරිකො, නත්ථි පුථුජ්ජනස්ස ඤාණං, නත්ථි නිරයෙසු නිරයපාලා, අත්ථි දෙවෙසු තිරච්ඡානගතා, පඤ්චඞ්ගිකො මග්ගො, ද්වාදසවත්ථුකං ඤාණං ලොකුත්තරන්ති.

චතුත්ථො පණ්ණාසකො.

---

1. දුක්ඛනිරොධං - සීමු.
2. මහාවග්ගසංයුත්ත - ධම්මචක්කප්පවත්තනසුත්තං.

5 ප. පු: ද්වාදශවස්තුක ඥානය ලෝකෝත්තර වෙති යි නො කියයුතු වේ ද?

ස පටිඤ්ඤා: එසේ ය.

ප. අනු: භාග්‍යවතුන් විසින් වදාරන ලද නො:

"මහණෙනි, මේ (පඤ්චස්කන්ධය) දුඃඛාර්‍ය්‍යසත්‍ය යැයි පෙර නො ඇසූ දහම්හි මට චක්ෂුස පහළ වී. ඥානය පහළ වී. විද්‍යාව පහළ වී. ප්‍රඥාව පහළ වී. ආලෝකය පහළ වී. මහණෙනි, ඒ මේ දුඃඛාර්‍ය්‍යසත්‍යය පරිඥා කටයුතු යැ යි මට... මහණෙනි, පරිඥා කරනලද්දැ'යි මට ... මහණෙනි, මේ (තෘෂ්ණාව) දුඃඛසමුදයාර්‍ය්‍ය සත්‍ය යැ යි මට...මහණෙනි, ඒ මේ දුඃඛසමුදයාර්‍ය්‍ය-සත්‍යය ප්‍රහාතව්‍ය යැ යි මට .. මහණෙනි, මට ප්‍රහීණ යැ යි ... මහණෙනි, මේ දුඃඛනිරොධාර්‍ය්‍ය-සත්‍ය යැ යි මට ... මහණෙනි, ඒ මේ දුඃඛනිරො-ධාර්‍ය්‍යසත්‍යය සාක්ෂාත්කර්තව්‍ය යැ යි මට ... මහණෙනි, මා විසින් සාක්ෂාත්කෘත යැ යි ... මහණෙනි, මේ දුඃඛනිරොධගාමිනීප්‍රතිපදාර්‍ය්‍යසත්‍ය යැ යි මට ... මහණෙනි, ඒ මේ දුඃඛනිරොධ-ගාමිනීප්‍රතිපදාර්‍ය්‍ය සත්‍යය භාවිතව්‍ය යැයි මට ... මහණෙනි, මා විසින් භාවිත යැ යි පෙර නො ඇසූ දහම්හි චක්ෂුස පහළ වී...ආලොකය පහළ වී" යයි වදාළ සූත්‍රාන්තයෙක් ඇත්තේ මැ නො වේ ද?

ස. පටිඤ්ඤා: එසේ යැ.

ප. පා: එකරුණින් ද්වාදශවස්තුකඥානය ලෝකෝත්තර වේ.

ඤාණ කථා නිමි.

විංශද් වර්ගය නිමි.

එහි උද්දානය:

මාතෘඝාතක ආනන්තරික යැ පිතෘඝාතක ආනන්තරික යැ අරහන්ත-ඝාතක ආනන්තරික යැ ලොහිතුප්පාදක ආනන්තරික යැ සඞ්ඝභෙදක ආනන්තරික යැ යන අසඤ්චිච්චකථා යැ, නත්ථි පුථුජ්ජනස්ස ඤාණං යනුවෙන් දැක්වූ ඤාණකථා යැ, නත්ථි නිරයෙසු නිරයපාලා යනුවෙන් දැක්වූ නිරයපාලකථා යැ, අත්ථි දෙවෙසු තිරච්ඡානගතායි දක්වනලද තිරච්ඡානකථා යැ, පඤ්චඞ්ගිකො මග්ගොයි දක්වන ලද මග්ගකථා යැ, ද්වාදසවත්ථුකං ඤාණං යි දක්වන ලද ඤාණකථා'යි.

# එකවීසතිමො වග්ගො

## 21. 1.

## සාසන කථා

1. ස. පු: සාසනං නවං කතන්ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: සතිපට්ඨානං නවං කතන්ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

2. ස. පු: සාසනං නවං කතන්ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: සම්මප්පධානා -පෙ- ඉද්ධිපාදා -පෙ- ඉන්ද්‍රියා -පෙ- බලා -පෙ- බොජ්ඣඞ්ගා නවං කතා'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

ස. අනු: පුබ්බෙ අකුසලං පච්ඡා කුසලං කතන්ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

ස. අනු: පුබ්බෙ සාසවං -පෙ- සඤ්ඤොජනියං[1] -පෙ- ගන්ථනීයං[2] -පෙ- ඔඝනීයං[3] -පෙ- යොගනීයං[4] -පෙ- නීවරණීයං[5] -පෙ- පරාමට්ඨං -පෙ- උපාදානියං -පෙ- සංකිලෙසිකං.[6] පච්ඡා අසංකිලෙසිකං කතන්ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

3. ස. පු: අත්ථි කොචි තථාගතස්ස සාසනං නවං කරොතී'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: අත්ථි කොචි සතිපට්ඨානෙ නවං කරොතී'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -ප-

ස. අනු: අත්ථි කොචි සම්මප්පධානෙ -පෙ- ඉද්ධිපාදෙ -පෙ- ඉන්ද්‍රියෙ -පෙ- බලෙ -පෙ- බොජ්ඣඞ්ගෙ නවං කරොතී'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

---

1. සඤ්ඤොජනීයං - PTS.
2. ගන්ථනියං - සීමු, මජසං.
3. ඔඝනියං - සීමු, මජසං
4. යොගනියං - සීමු, මජසං.
5. නීවරණියං - PST.
6. සංකිලෙසියං - PTS. මජසං.

# එකවිංශද්වර්ගය

## 21. 1.

## සාසන කථා

**[සඞ්ගීතිත්‍රය සඳහා ශාසනය නවීකෘත යැ යි ද, තථාගත ශාසනය අළුත් කරන කිසිවෙක් ඇතැ යි ද, තථාගත ශාසනය අළුත් කරන්නට ලැබේ යැ යි ද සමහර උත්තරාපථකයන් සෙයින් ලබ්ධි ගත්තාහු ඇත. උන්ගේ වාද බිඳුනට 'සාසනකථා' එයි.]**.

1. ස. පු: ශාසනය නවීකෘත (අළුත් කරන ලද) වේ ද?

   ප. පටිඤ්ඤා: එසේ යැ.

   ස. අනු: සතිපට්ඨානය නවීකෘත වේ ද?

   ප. පටි: එසේ නො කියැයුතු යැ

2. ස. පු: ශාසනය නවීකෘත වේ ද?

   ප. පටිඤ්ඤා: එසේ යැ.

   ස. අනු: සම්‍යක් ප්‍රධානය ... ඍද්ධිපාද ... ඉන්ද්‍රිය ... බල ... බොධ්‍යඞ්ගයෝ නවීකෘත වෙත් ද?

   ප. පටි: එසේ නො කියැයුතු යැ ...

   ස. අනු: පළමු අකුශලය පසු වැ කුශල කරනලද ද?

   ප. පටි: එසේ නො කියැයුතු යැ ...

   ස. අනු: පළමු සාස්‍රවය ... සංයොජනීයය ... ග්‍රන්ථනීයය ... ඕඝනීයය ... යොගනීයය ... නීවරණීයය .... පරාමෘෂ්ටය ... උපාදානීයය ... සාංක්ලෙශිකය පසුව අසාංක්ලෙශික කරනලද වේ ද?

   ප. පටි: එසේ නො කියැයුතු යැ. ...

3. ස. පු: තථාගතයන්ගේ සස්න අළුත් කරන කිසිවෙක් ඇද්ද?

   ප: පටිඤ්ඤා: එසේ යැ.

   ස. අනු: සතිපට්ඨාන අළුත් කරන කිසිවෙක් ඇද්ද?

   ප. පටි: එසේ නො කියැයුතු යැ.

   ස. අනු: සම්‍යක්ප්‍රධාන ... ඍද්ධිපාද ... ඉන්ද්‍රිය ... බල ... බොධ්‍යඞ්ග අළුත් කරන කිසිවෙක් ඇද්ද?

   ප. පටිඃ එසේ නො කියැයුතු යැ ...

ස. අනු: අත්ථි කොචි පුබ්බේ අකුසලං පච්ඡා කුසලං කරොතී'ති.

ප. පටි: න හෙවං වත්තබ්බේ –පෙ–

ස. අනු: අත්ථි කොචි පුබ්බේ සාසවං –පෙ– සංකිලෙසිකං පච්ඡා අසංකිලෙසිකං කරොතී'ති.

ප. පටි: න හෙවං වත්තබ්බේ –පෙ–

4. ස. පු: ලබ්භා තථාගතස්ස සාසනං පුන නවං කාතුන්ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: ලබ්භා සතිපට්ඨානා පුන නවං කාතුන්ති.

ප. පටි: න හෙවං වත්තබ්බේ –පෙ–

ස. අනු: ලබ්භා සම්මප්පධානා –පෙ– ඉද්ධිපාදා –පෙ– ඉන්ද්‍රියා –පෙ– බලා –පෙ– බොජ්ඣඞ්ගා පුන නවං කාතුන්ති.

ප. පටි: න හෙවං වත්තබ්බේ –පෙ–

ස. අනු: ලබ්භා පුබ්බේ අකුසලං පච්ඡා කුසලං කාතුන්ති.

ප. පටි: න හෙවං වත්තබ්බේ –පෙ–

ස. අනු: ලබ්භා පුබ්බේ සාසවං –පෙ– සංකිලෙසිකං පච්ඡා අසංකිලෙසිකං කාතුන්ති.

ප. පටි: න හෙවං වත්තබ්බේ –පෙ–

සාසන කථා නිට්ඨිතා.

| | |
|---|---|
| ස. අනු: | පළමු අකුශලය පසුව කුශල කරන කිසිවෙක් ඇද්ද? |
| ප. පටි: | එසේ නො කියයුතු යැ ... |
| අනු: | පළමු සාශ්‍රවය ... සාංක්ලේශිකය පසු වැ අසාංක්ලේශික කරන කිසිවෙක් ඇද්ද? |
| ප. පටි: | එසේ නො කියයුතු යැ ... |
| 4. ස. පු: | තථාගතයන්ගේ සස්න යළි අළුත් කරන්නට ලැබේ ද? |
| ප පටිඤ්ඤා: | එසේ යැ. |
| ස. අනු: | සතිපට්ඨාන යළි අළුත් කරන්නට ලැබේද් ද? |
| ප. පටි: | එසේ නො කියයුතු යැ ... |
| ස. අනු: | සම්‍යක්ප්‍රධාන ... සෘද්ධිපාද ... ඉන්ද්‍රිය ... බල ... බොධ්‍යඞ්ගයෝ යළි අළුත් කරන්නට ලැබේද් ද? |
| ප. පටි: | එසේ නො කියයුතු යැ ... |
| ස අනු: | අකුශලය පසු වැ කුශල කරන්නට ලැබේ ද? |
| ප. පටි: | එසේ නො කියයුතු යැ .... |
| ස. අනු: | පළමු සාස්‍රවය ... සාංක්ලේශිකය පසු වැ අසාංක්ලේශික කරන්නට ලැබේ ද? |
| ප. පටි: | එසේ නො කියයුතු යැ ... |

සාසන කථා නිමි.

## 21. 2.

# අවිවිත්ත කථා

1. ස. පු: පුථුජ්ජනො තෙධාතුකෙහි ධම්මෙහි අවිවිත්තො'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: පුථුජ්ජනො තෙධාතුකෙහි ඵස්සෙහි -පෙ- තෙධාතුකාහි වෙදනාහි -පෙ- සඤ්ඤාහි -පෙ- චෙතනාහි -පෙ- චිත්තෙහි -පෙ- සද්ධාහි -පෙ- විරියෙහි -පෙ- සතිහි -පෙ- සමාධීහි -පෙ- තෙධාතුකාහි පඤ්ඤාහි අවිවිත්තො'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

2. ස. පු: පුථුජ්ජනො තෙධාතුකෙහි ධම්මෙහි අවිවිත්තො'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: යස්මිං ඛණෙ පුථුජ්ජනො චීවරං දෙති, තස්මිං ඛණෙ පඨමං ඣානං උපසම්පජ්ජ විහරති -පෙ- ආකාසානඤ්චායතනං උපසම්පජ්ජ විහරතී'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

ස. අනු: යස්මිං ඛණෙ පුථුජ්ජනො පිණ්ඩපාතං දෙති -පෙ- සෙනාසනං දෙති -පෙ- ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරං දෙති, තස්මිං ඛණෙ චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති -පෙ- නෙවසඤ්ඤානාසඤ්ඤායතනං උපසම්පජ්ජ විහරතී'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

3. ප. පු: න වත්තබ්බං පුථුජ්ජනො තෙධාතුකෙහි ධම්මෙහි අවිවිත්තො'ති.

ස. පටිඤ්ඤා: ආමන්තා.

ප. අනු: පුථුජ්ජනස්ස රූපධාතුඅරූපධාතුගං කම්මං පරිඤ්ඤාතන්ති.

ස. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

ප. පා: තෙන හි "පුථුජ්ජනො තෙධාතුකෙහි ධම්මෙහි අවිවිත්තො"ති.

අවිවිත්ත කථා නිට්ඨිතා.

21 2.

## අවිවිත්ත කථා

[යම් පුද්ගලයකුහට යම් ධර්මයෙක් ප්‍රත්‍යුත්පන්න වේද, හේ ඒ ධර්මයෙන් පමණක් අවිවිත්ත (යුක්ත) නම් වෙයි යනු ස්වසමයෙහි නිශ්චය වෙයි. පෘථග්ජන පුද්ගල විසින් ත්‍රෛධාතුකධර්ම අපරිඥාත (පිරිසිඳ නොදත්) හෙයින් එකක්ෂණයෙහි මැ හැම ත්‍රෛධාතුකධර්මයන්ගෙන් අවිවිත්තයයි උත්තරාපථකයන් සෙයින් ලබ්ධි ගත්තවුන්ගේ වාද බිඳුනම 'අවිවිත්ත කථා' එයි ]

1\. ස. පු: පෘථග්ජන පුද්ගල ත්‍රෛධාතුක ධර්මයෙන් අවි-විත්ත (යුක්ත) වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යෑ.

ස. අනු: පෘථග්ජන පුද්ගල ත්‍රෛධාතුක ස්පර්ශයෙන්... ත්‍රෛ-ධාතුක වේදනායෙන් ... සංඥායෙන් ... චේතනා-යෙන් ... චිත්තයෙන් .. ශ්‍රද්ධායෙන් .. වීර්‍ය්‍යයෙන් ... ස්මෘතියෙන් ... සමාධියෙන් ... ත්‍රෛධාතුක ප්‍රඥායෙන් (එක්වර) අවිවිත්ත වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යෑ ...

2\. ස. පු: පෘථග්ජන පුද්ගල ත්‍රෛධාතුකධර්මයෙන් අවිවිත්ත වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යෑ.

ස. අනු: යම් කලෙක පෘථග්ජන පුද්ගල සිවුරු දේ ද, එකල්හි ප්‍රථමධ්‍යානය උපයා වාස කෙරේ ද ... ආකාසානඤ්චායතනය උපයා වාස කෙරේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යෑ. ...

ස. අනු: යම් කලෙකැ පෘථග්ජන පුද්ගල පිඬුවා දේ ද ... සෙනසුන් දේ ද ... ගිලන්පස බෙහෙසත් පිරිකර දේ ද, එකල්හි චතුර්ථධ්‍යාන උපයා වාස කෙරේ ද... නෙවසඤ්ඤානාසඤ්ඤායතන උපයා වාස කෙරේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යෑ ...

3 ප. පු: පෘථග්ජන පුද්ගල ත්‍රෛධාතුකධර්මයෙන් අවිවිත්ත වෙති'යි නො කියැයුතු වේ ද?

ස. පටිඤ්ඤා: එසේ යෑ.

ප. අනු: පෘථග්ජන පුද්ගල විසින් රූපධාතුඅරූපධාතුග කර්මය පරිඥාත වේ ද?

ස. පටි: එසේ නො කියැයුතු යෑ ...

ප. පා: එකරුණිත් "පෘථග්ජන පුද්ගල ත්‍රෛධාතුක ධර්මයෙන් අවිවිත්ත" වෙයි.

අවිවිත්ත කථා නිමි.

## 21 3.

# සඤ්ඤොජන කථා

1. ස. පු: අත්ථි කිඤ්චි සඤ්ඤොජනං අප්පහාය අරහත්තප්පත්ති'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා

ස. අනු: අත්ථි කිඤ්චි සක්කායදිට්ඨිං අප්පහාය -පෙ- විචිකිච්ඡං අප්පහාය -පෙ- සීලබ්බතපරාමාසං අප්පහාය -පෙ- රාගං අප්පහාය -පෙ- දොසං අප්පහාය -පෙ- මොහං අප්පහාය -පෙ- අනොත්තප්පං අප්පහාය අරහත්තප්පත්ති'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

2. ස. පු: අත්ථි කිඤ්චි සඤ්ඤොජනං අප්පහාය අරහත්තප්පත්ති'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: අරහා සරාගො සදොසො සමොහො සමානො සමක්ඛො සපළාසො සඋපායාසො සකිලෙසො'ති

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

ස. අනු: නනු අරහා නිරාගො නිද්දොසො නිම්මොහො නිම්මානො නිම්මක්ඛො නිප්පළාසො නිරුපායාසො නික්කිලෙසො'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. ඨ: හඤ්චි අරහා නිරාගො -පෙ- නික්කිලෙසො,

ස. පා: නො ච වත රෙ වත්තබ්බෙ "අත්ථි කිඤ්චි සඤ්ඤොජනං අප්පහාය අරහත්තප්පත්ති"ති.

3 ප. පු: න වත්තබ්බං "අත්ථි කිඤ්චි සඤ්ඤොජනං අප්පහාය අරහත්තප්පත්ති"ති.

ස. පටිඤ්ඤා: ආමන්තා

ප. අනු: අරහා සබ්බං බුද්ධවිසයං ජානාති'ති.

ස. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

ප. පා: තෙන හි "අත්ථි කිඤ්චි සඤ්ඤොජනං අප්පහාය අරහත්තප්පත්ති"ති.

සඤ්ඤොජන කථා නිට්ඨිතා.

## 21. 3.

# සඤ්ඤොජන කථා

['රහත්හු හැම බුද්ධවිෂය නො දනිති. එහෙයින් ඔබ විසින් අවිද්‍යාවිචිකිත්සා ප්‍රහාණය නො කරනලද වනැ'යි හැඟුමින් කිසි සංයොජනයක් නො පියා අර්හත්ත්වප්‍රාප්තියෙක් ඇතැයි මහාසාංඝිකයන් සෙයින් ලබ්ධි ගත්තාහු ඇත. උන්ගේ වාද බිඳුනම 'සංයොජන කථා' එයි.]

1. ස. පු: කිසි සංයොජනයක් නො පියා අර්හත්ත්වප්‍රාප්තියෙක් ඇද්ද?

ප. පටික්ඛෙ: එසේ යැ.

ස. අනු: කිසි සත්කායදෘෂ්ටියක් නො පියා... විචිකිත්සාවක් නො පියා ... ශීලව්‍රතපරාමර්ශයක් නො පියා ... රාගයක් නො පියා ... ද්වේෂයක් නො පියා ... මෝහයක් නො පියා ... අනපත්‍රපාවක් නො පියා අර්හත්ත්වප්‍රාප්තියෙක් ඇද්ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

2. ස. පු: කිසි සංයොජනයක් නො පියා අර්හත්ත්වප්‍රාප්තියෙක් ඇද්ද?

ප. පටික්ඛෙ: එසේ යැ.

ස. අනු: රහත් රාග ඇතියේ ද්වේෂ ඇතියේ මෝහ ඇතියේ මාන ඇතියේ මකු වූයේ පලාස ඇතියේ උපායාස ඇතියේ කෙලෙස් ඇතියේ වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

ස. අනු: රහත් රාග නැතියේ ද්වේෂ නැතියේ මෝහ නැතියේ මාන නැතියේ මකුබව නැතියේ පලාස නැතියේ උපායාස නැතියේ කෙලශ නැතියේ නො?

ප. පටික්ඛෙ: එසේ යැ.

ස. ඨ: ඉදින් රහත් රාග නැතියේ ... කෙලශ නැතියේ වී නම්,

ස. පා: භවත, 'කිසි සංයොජනයක් නො පියා අර්හත්ත්වප්‍රාප්තියෙක් ඇතැ'යි නො කියැයුතු මැ යැ.

3. ප. පු: 'කිසි සංයොජනයක් නො පියා අර්හත්ත්වප්‍රාප්තියෙක් ඇතැ'යි නො කියැයුතු වේ ද?

ස. පටික්ඛෙ: එසේ යැ.

ප. අනු: රහත් හැම බුද්ධවිෂය දන්නේ වේ ද?

ස. පටි: එසේ නො කියැයුතු යැ ...

ප. පා: එකරුණින් "කිසි සංයොජනයක් නො පියා අර්හත්ත්වප්‍රාප්තියෙක් ඇත".

සංයොජන කථා නිමි.

## 21. 4.

# ඉද්ධි කථා

1. ස. පු: අත්ථි අධිප්පායඉද්ධි බුද්ධානං වා සාවකානං වා’ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: “නිච්චපණ්ණරුක්ඛා හොන්තූ”ති අත්ථි අධිප්පාය-ඉද්ධි බුද්ධානං වා සාවකානං වා’ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

ස. අනු: නිච්චපුප්ඵා රුක්ඛා හොන්තු -පෙ- නිච්චඵලිතා රුක්ඛා හොන්තු -පෙ- නිච්චං ජුණ්හං හොතු -පෙ- නිච්චං ඛෙමං හොතු -පෙ- නිච්චං සුභික්ඛං හොතු -පෙ- නිච්චං සුවත්ථි හොතූ”ති අත්ථි අධිප්පායඉද්ධි බුද්ධානං වා සාවකානං වා’ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

2 ස. පු: අත්ථි අධිප්පායඉද්ධි බුද්ධානං වා සාවකානං වා’ති.

ප. පටිඤ්ඤා. ආමන්තා.

ස. අනු: “උප්පන්නො ඵස්සො මා නිරුජ්ඣී”ති අත්ථි අධිප්පායඉද්ධි බුද්ධානං වා සාවකානං වා’ති.

ප පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

ස. අනු: උප්පන්නා වෙදනා -පෙ- සඤ්ඤා -පෙ- චෙතනා -පෙ- චිත්තං -පෙ- සද්ධා -පෙ- විරියං -පෙ- සති -පෙ- සමාධි -පෙ- පඤ්ඤා මා නිරුජ්ඣී”ති. අත්ථි අධිප්පායඉද්ධි බුද්ධානං වා සාවකානං වා’ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

3. ස. පු: අත්ථි අධිප්පායඉද්ධි බුද්ධානං වා සාවකානං වා’ති.

ප පටිඤ්ඤා: ආමන්තා.

## 21. 4.

# ඉද්ධි කථා

[සෘද්ධිය කිසි තැනෙක සමෘද්ධ වෙයි. කිසි තැනෙකැ සමෘද්ධ නො වෙයි. අනිත්‍යාදිය නිත්‍යාදිය කිරීම ඒකාන්තයෙන් සිද්ධ නො වෙයි. සභාගසන්තති පෙරළා විසභාග සන්තති කරණය හෝ සභාග-සන්තති චිරකල් පවත්වාලීම හෝ යම් කෙනකුන් සඳහා කරනු ලැබේ නම් ඔවුන්ගේ පුණ්‍යාදි කාරණ නිසා 'යක්ෂුන් සඳහා පැන් කිරි යී බවට පෙරළීම සෙයින් ද, මහාධාතු නිධානයෙහි පහන් ආදිය චිරස්ථාන ප්‍රවර්තනය සෙයින් ද සමෘද්ධ වෙයි යනු ස්වසමයෙහි සනිටුහනි. යම් හෙයකින් ආයුෂ්මත් පිළින්දවච්ඡ තෙරණුවෝ රජුගේ ප්‍රාසාදය රන්වෙච්චයි ඉටුහු ද එහෙයින් 'අධිප්පාය (අදහස ඉටුවන) සෘද්ධි ඇතැ'යි අන්ධක නිකායවාසීන් සෙයින් ලබ්ධිගත්තාහු ඇත. උන්ගේ වාද බිඳුනම 'ඉද්ධි කථා' එයි]

1. ස. පු: බුදුනට හෝ ශ්‍රාවකයනට හෝ අභිප්‍රායසෘද්ධි ඇද් ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: 'වෘක්ෂයෝ නිත්‍යපර්ණ ඇති වෙත්ව'යි බුදුනට හෝ ශ්‍රාවකයනට හෝ අභිප්‍රායසෘද්ධි ඇද් ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

ස. අනු: 'වෘක්ෂයෝ නිත්‍යපුෂ්ප ඇති වෙත්වයි ... වෘක්ෂයෝ නිත්‍යඵල ඇති වෙත්වයි ... නිත්‍යජ්‍යොත්ස්නා (සඳරැස්) ඇති වේවයි ... නිත්‍ය ක්ෂේම ඇති වේවයි ... නිත්‍යසුභික්ෂ වේවයි ... නිත්‍ය සවස්ති වේව'යි බුදුනට හෝ ශ්‍රාවකයනට හෝ අභිප්‍රායසෘද්ධි ඇත් ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

2. ස. පු: බුදුනට හෝ ශ්‍රාවකයනට හෝ අභිප්‍රායසෘද්ධි ඇද් ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

ස. අනු: 'උපන් වේදනා ... සංඥා ... චේතනා ... චිත්ත ... ශ්‍රද්ධා ... වීර්‍ය්‍ය ... සමෘති ... සමාධි ... ප්‍රඥා නහමක් නිරුද්ධ වේව'යි බුදුනට හෝ ශ්‍රාවකයනට හෝ අභිප්‍රායසෘද්ධි ඇද් ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

3. ස. පු: බුදුනට හෝ ශ්‍රාවකයනට හෝ අභිප්‍රායසෘද්ධි ඇද් ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: රූපං නිච්චං හොතූ'ති අත්ථි අධිප්පායඉද්ධි බුද්ධානං වා සාවකානං වා'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

ස. අනු: වේදනා -පෙ- සඤ්ඤා -පෙ- සඞ්ඛාරා -පෙ- විඤ්ඤාණං නිච්චං හොතූ'ති අත්ථි අධිප්පායඉද්ධි බුද්ධානං වා සාවකානං වා''ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

4. ස. පු: අත්ථි අධිප්පායඉද්ධි බුද්ධානං වා සාවකානංවා'ති

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: ජාතිධම්මා සත්තා මා ජායිංසූ'ති අත්ථි අධිප්පාය ඉද්ධි -පෙ- ජරාධම්මා සත්තා මා ජීයිංසූ'ති[1] -පෙ- ව්‍යාධිධම්මා සත්තා මා ව්‍යාධිංසූ'ති -පෙ- මරණ-ධම්මා සත්තා මා මියිංසූ'ති අත්ථි අධිප්පායඉද්ධි බුද්ධානං වා සාවකානං වා'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

5. ප. පු: න වත්තබ්බං අත්ථි අධිප්පායඉද්ධි බුද්ධානං වා සාවකානං වා'ති.

ස පටිඤ්ඤා: ආමන්තා.

ප. අනු: නනු ආයස්මා පිළින්දවච්ඡෙන රඤ්ඤෝ මාගධස්ස සෙනියස්ස බිම්බිසාරස්ස පාසාදං සුවණ්ණන්තෙවව අධිමුච්චි, සුවණ්ණො ච පන ආසී'ති.

ස. පටිඤ්ඤා: ආමන්තා.

ප ඨ. හඤ්චි ආයස්මා පිළින්දවච්ඡෙන රඤ්ඤෝ මාගධස්ස සෙනියස්ස බිම්බිසාරස්ස පාසාදං සුවණ්ණන්තෙවව අධිමුච්චි, සුවණ්ණො ච පන ආසි,

ප. පා: තෙන වත රෙ වත්තබ්බෙ "අත්ථි අධිප්පායඉද්ධි බුද්ධානං වා සාවකානං වා''ති

ඉද්ධි කථා නිට්ඨිතා.

1 මාජරිංසු - සීමු, PTS. මාජීරිංසූ'ති - මජසං.

| | |
|---|---|
| ස. අනු: | 'රූපය නිත්‍ය වේවා'යි බුදුනට හෝ ශ්‍රාවකයනට හෝ අභිප්‍රායසෘද්ධි ඇද්ද දැ? |
| ප. පටි: | එසේ නො කියැයුතු යැ ... |
| ස. අනු: | වේදනා ... සංඥා ... සංස්කාරයෝ ... විඥානය නිත්‍ය වේවා'යි බුදුනට හෝ ශ්‍රාවකයනට හෝ අභිප්‍රායසෘද්ධි ඇද්ද දැ? |
| ප. පටි: | එසේ නො කියැයුතු යැ ... |
| 4. ස. පු: | බුදුනට හෝ ශ්‍රාවකයනට හෝ අභිප්‍රායසෘද්ධි ඇද්ද දැ? |
| ප. පටිඥා: | එසේ යැ. |
| ස. අනු: | ජාතිස්වභාව ඇති සත්ත්වයෝ නහමක් උපදිත්වයි අභිප්‍රායසෘද්ධි ඇද්ද .... ජරාස්වභාව ඇති සත්ත්වයෝ නහමක් දිරත්වයි ... ව්‍යාධිස්වභාව ඇති සත්ත්වයෝ නහමක් ව්‍යාධි ඇති වෙත්වයි ... මරණස්වභාව ඇති සත්ත්වයෝ නහමක් මියෙත්වයි බුදුනට හෝ ශ්‍රාවකයනට හෝ අභිප්‍රායසෘද්ධි ඇද්ද දැ? |
| ප. පටි: | එසේ නො කියැයුතු යැ. |
| 5. ප. පු: | 'බුදුනට හෝ ශ්‍රාවකයනට හෝ අභිප්‍රායසෘද්ධි ඇතැ'යි නො කියැයුතු වේ දැ? |
| ස. පටිඥා: | එසේ යැ. |
| ප. අනු: | ආයුෂ්මත් පිළින්දවච්ඡ තෙරණුවෝ මගධේශ්වර සේනිය බිම්බිසාර රජුගේ පහය රන් වේවයි ඉටූහු නො, පහය ස්වර්ණ වී නො? |
| ස. පටිඥා | එසේ යැ. |
| ප. ඨ: | ඉදින් ආයුෂ්මත් පිළින්දවච්ඡ තෙරණුවෝ මගධේශ්වර සේනිය බිම්බිසාර රජුගේ 'පහය රන් වේවා'යි ඉටූසේක් වී නම්, පහයත් රන් වී නම්, |
| ප. පා: | භවත, එකරුණින් බුදුනට හෝ ශ්‍රාවකයනට හෝ අභිප්‍රායසෘද්ධි ඇත. |
| | (මෙහි රජුගේ පුණ්‍යමහිමයෙන් ද පහය රන් වූ හෙයින් සාධකය නො යෙදේ.) |

ඉද්ධි කථා නිමි.

## 21. 5.

# බුද්ධ කථා

1. ස. පු: අත්ථි බුද්ධානං බුද්ධෙහි හීනාතිරෙකතා'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: සතිපට්ඨානතො'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

ස. අනු: සම්මප්පධානතො -පෙ- ඉද්ධිපාදතො -පෙ- ඉන්ද්‍රියතො -පෙ- බලතො -පෙ- බොජ්ඣඞ්ගතො -පෙ- වසීභාවතො -පෙ- සබ්බඤ්ඤුතඤ්ඤාණ-දස්සනතො'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

බුද්ධ කථා නිට්ඨිතා.

21. 5.

# බුද්ධ කථා

[ඒ ඒ කාලයෙහි ශරීර ආයු ප්‍රභා ප්‍රමාණ නානාත්වය මිස සෙසු බුදුදහමින් බුදුවරුන්ගේ බුදුවරුන් කෙරෙන් හීනාතිරෙක බවෙක් නම් නැත. බුදුවරුන් කෙරෙහි අවිශෙෂයෙන් හීනාතිරෙකතා ඇතැයි අන්ධක නිකායවාසීන් මෙසින් ලබ්ධි ගත්තවුන්ගේ වාද බිඳුනම 'බුද්ධ කථා' එයි.]

1\. ස. පු: බුදුවරුන්ගේ බුදුවරුන් කෙරෙන් හීනාතිරෙකතා ඇද් ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: සතිපට්ඨාන හෙයින් ද?

ප. පටි: එසේ නො කියයුතු යැ ...

ස. අනු: සම්‍යක්ප්‍රධාන හෙයින් වේ ද.. සෘද්ධිපාද හෙයින්... ඉන්ද්‍රිය හෙයින්... බල හෙයින්... බොධ්‍යඞ්ග හෙයින් ... වශීභාව හෙයින් ... සර්වඥඥානදර්ශන හෙයින් වේ ද?

ප. පටි: එසේ නො කියයුතු යැ ...

බුද්ධ කථා නිමි.

## 21. 6.

# සබ්බදිසා කථා

1. ස. පු: සබ්බා දිසා බුද්ධා තිට්ඨන්තී'ති.

ස. පටිඤ්ඤා: ආමන්තා.

ප. අනු: පුරත්ථිමාය දිසාය බුද්ධො තිට්ඨන්තී'ති.[1]

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

2. ස. පු: පුරත්ථිමාය දිසාය බුද්ධො තිට්ඨන්තී'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස අනු: කින්නාමො සො භගවා, කිං ජච්චො, කිං ගොත්තො, කින්නාමා තස්ස භගවතො මාතා-පිතරො, කින්නාමං තස්ස භගවතො සාවකයුගං, කො නාමො තස්ස භගවතො උපට්ඨාකො, කිදිසං චීවරං ධාරෙති, කිදිසං පත්තං ධාරෙති, කතරස්මිං ගාමෙ වා නිගමෙ වා නගරෙ වා රට්ඨෙ වා ජනපදෙ වා'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

ස. අනු: දක්ඛිණාය දිසාය -පෙ- පච්ඡිමාය දිසාය -පෙ- උත්තරාය දිසාය -පෙ- හෙට්ඨිමාය දිසාය බුද්ධො තිට්ඨන්තී'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

3. ස. පු: හෙට්ඨිමාය දිසාය බුද්ධො තිට්ඨන්තී'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: කින්නාමො සො භගවා -පෙ- ජනපදෙ වා'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

ස. අනු: උපරිමාය දිසාය බුද්ධො තිට්ඨන්තී'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

4. ස. පු: උපරිමාය දිසාය බුද්ධො තිට්ඨන්තී'ති.

ප. පටිඤ්ඤා ආමන්තා.

ස. අනු: චාතුම්මහාරාජිකෙ තිට්ඨන්ති -පෙ- තාවතිංසෙ තිට්ඨන්ති -පෙ- යාමෙ තිට්ඨන්ති -පෙ- තුසිතෙ තිට්ඨන්ති -පෙ- නිම්මාණරතියා තිට්ඨන්ති -පෙ- පරනිම්මිත වසවත්තීයා තිට්ඨන්ති -පෙ- බ්‍රහ්මලොකෙ තිට්ඨන්තී'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

සබ්බදිසා කථා නිට්ඨිතා.

1. බුද්ධා තිට්ඨන්තී'ති PTS.

2. 1. 6.

## සබ්බදිසා කථා

['හැම දික්හි බුදුවරු සිටිති'යි මහාසාංඝිකනිකායවාසීන් සෙයින් ලබ්ධි ගත්තාහු ඇත. උන්ගේ වාද බිඳුනම සබ්බදිසා කථා' එයි.]

1. ස පු: හැම දික්හි බුදුවරු සිටිත් දැ?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: පෙරදිග බුදුහු සිටිත් දැ?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

2. ස. පු: පෙරදිගැ බුදුහු සිටිත් දැ?

ප. පටිඤ්ඤා: එසේ යැ

ස. අනු: ඒ බුදුහු කිනම්හ. කවර ජාති ඇතියහ. කවර ගොත්‍ර ඇතියහ. ඒ බුදුන්ගේ මාපියෝ කිනම්හ. ඒ බුදුන්ගේ ශ්‍රාවකයුගය කිනම් ඇතියේ යැ. ඒ බුදුන්ගේ උපස්ථායක කවරෙ යැ. ඒ බුදුහු කෙබඳු සිවුරු දරත් ද, කෙබඳු පාත්‍ර ධරත් ද, කවර ගමෙක හෝ නියම්ගමෙක හෝ නුවරෙක හෝ රටෙක හෝ ජනපදයෙක හෝ සිටිත් දැ?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

ස. අනු: දකුණුදිගැ ... පැලදිගැ ... උතුරුදිගැ ... යටදිගැ බුදුහු සිටිත් දැ?

ප. පටි: එසේ නො කියැයුතු යැ.

3. ස. පු: යට දෙස බුදුහු සිටිත් දැ?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: ඒ බුදුහු කිනම්හ ... කිනම් දනවියෙකැ හෝ සිටිත් දැ?

ප. පටි: එසේ නො කියැයුතු යැ ..

ස. අනු: උඩ දෙස බුදුහු සිටිත් දැ?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

4 ස. පු: උඩ දෙස බුදුහු සිටිත් දැ?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: සිවුමහරදයෙහි සිටිත් ද, ... තව්තිසැ සිටිත්ද, ... යාම දෙව්ලොවැ සිටිත් ද, ... තුසීපුර සිටිත් ද, ... නිම්මාණරති දෙව්ලොවැ සිටිත් ද, පරනිර්මිත වශවර්ති දෙව්ලොවැ සිටිත් ද ... බඹලොවැ සිටිත් දැ?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

සබ්බදිසා කථා නිමි.

## 21. 7.

# ධම්ම කථා

1. ස. පු: සබ්බෙ ධම්මා නියතා’ති.
ප. පටිඤ්ඤා: ආමන්තා.
ස. අනු: මිච්ඡත්තනියතා’ති.
ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-
ස. අනු: නත්ථි අනියතො රාසී’ති.
ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-
ස. අනු: නනු අත්ථි අනියතො රාසී’ති.
ප. පටිඤ්ඤා: ආමන්තා.
ස. ඨ: හඤ්චි අත්ථි අනියතො රාසි,
ස. පා: නො ච වත රෙ වත්තබ්බෙ “සබ්බෙ ධම්මා නියතා”ති.

2. ස. පු: සබ්බෙ ධම්මා නියතා’ති.
ප. පටිඤ්ඤා: ආමන්තා.
ස. අනු: නනු තයො රාසී වුත්තා භගවතා: මිච්ඡත්තනියතො රාසි, සම්මත්තනියතො රාසි, අනියතො රාසී’ති.
ප. පටිඤ්ඤා: ආමන්තා.
ස. ඨ: හඤ්චි තයො රාසී වුත්තා භගවතා: මිච්ඡත්ත නියතො රාසි, සම්මත්තනියතො රාසි, අනියතො රාසී’ති,
ස. පා: නො ච වත රෙ වත්තබ්බෙ “සබ්බෙ ධම්මා නියතා”ති.

3 ස. පු: රූපං රූපට්ඨෙන නියතන්ති.
ප. පටිඤ්ඤා: ආමන්තා.
ස. අනු: මිච්ඡත්තනියතන්ති.
ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

## 21. 7.

# ධම්ම කථා

[රූපාදිය රූපාදි ස්වභාවයෙන් නියත වෙයි. ස්වභාවය නො පියයි. එහෙයින් ‘හැම ධර්මයෝ නියතයහ’යි අන්ධක නිකායවාසීන්- සමහර උත්තරාපථකයන් සෙයින් ලබ්ධි ගත්තාහු ඇත. උන්ගේ වාද බිඳුනම ‘ධම්ම කථා’ එයි.]

1\. ස. පු: හැම දහම්හු නියත වෙත් ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: මිථ්‍යාත්ව වශයෙන් නියත වෙත් ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

ස. අනු: අනියත රාශියෙක් නැද්ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

ස. අනු: අනියත රාශියෙක් ඇත් නො?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. ඨ: ඉදින් අනියත රාශියෙක් ඇත් නම්,

ස. පා: භවත, ‘හැම දහම්හු නියත වෙති’යි නො කියැයුතු මැ යැ.

2\. ස. පු: හැම දහම්හු නියත වෙත් ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: භාග්‍යවතුන් වහන්සේ විසින්: මිථ්‍යාත්වනියතරාශි යැ සම්‍යක්ත්වනියතරාශි යැ අනියතරාශි යැ යි තුන් රාශියෙක් වදාරනලද නො?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. ඨ: ඉදින් භාග්‍යවතුන් වහන්සේ විසින්: මිථ්‍යාත්ව-නියතරාශි යැ සම්‍යක්ත්වනියතරාශි යැ අනියත-රාශි යැ යි තුන්රාශියෙක් වදාරන ලද වී නම්,

ස. පා: භවත, ‘හැම ධර්මයෝ නියතයහ’යි නො කියැයුතු මැ යැ.

3\. ස. පු: රූපය රූපස්වභාවයෙන් නියත වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: මිථ්‍යාත්වනියත වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

ස. අනු: සම්මත්තනියතන්ති

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

4\. ස. පු: වේදනා -පෙ- සඤ්ඤා -පෙ- සඞ්ඛාරා -පෙ- විඤ්ඤාණං විඤ්ඤාණට්ඨෙන නියතන්ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: මිච්ඡත්තනියතන්ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

ස. අනු: සම්මත්තනියතන්ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

5\. ප. පු: න වත්තබ්බං 'රූපං රූපට්ඨෙන නියතං -පෙ- වේදනා -පෙ- සඤ්ඤා -පෙ- සඞ්ඛාරා -පෙ- විඤ්ඤාණං විඤ්ඤාණට්ඨෙන නියත''න්ති.

ස. පටිඤ්ඤා: ආමන්තා.

ප. අනු: රූපං හොති, වේදනා හොති, සඤ්ඤා හොති, සඞ්ඛාරා හොන්ති, විඤ්ඤාණං හොති; වේදනා -පෙ- සඤ්ඤා -පෙ- සඞ්ඛාරා -පෙ- විඤ්ඤාණං -පෙ- රූපං හොති, වේදනා හොති, සඤ්ඤා හොති, සඞ්ඛාරා හොන්ති''ති.

ස. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

ප. පටි: තෙන හි රූපං රූපට්ඨෙන නියතං, වේදනා -පෙ- සඤ්ඤා -පෙ- සඞ්ඛාරා -පෙ- විඤ්ඤාණං විඤ්ඤාණට්ඨෙන නියතන්ති.

ධම්ම කථා නිට්ඨිතා.

ස. අනු: සම්‍යක්ත්වනියත වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

4. ස. පු: වේදනා ... සංඥා ... සංස්කාර ... විඥානය විඥාන ස්වභාවයෙන් නියත වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: මිථ්‍යාත්ව වශයෙන් නියත වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

ස. අනු: සම්‍යක්ත්ව වශයෙන් නියත වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

5. ප. පු: "රූපය රූප ස්වභාවයෙන් නියත වෙයි ... වේදනා සංඥා ... සංස්කාරයෝ ... විඥානය විඥානස්වභාවයෙන් නියත වේ"යයි නො කියැයුතු වේ ද?

ස. පටිඤ්ඤා: එසේ යැ.

ප. අනු: රූප වේ ද, වේදනා වේ ද, සංඥා වේ ද, සංස්කාර වෙත් ද, විඥාන වේ ද; වේදනා ... සංඥා ... සංස්කාර ... විඥාන ... රූප වේ ද? වේදනා වේ ද? සංඥා වේ ද? සංස්කාර වෙත් ද?

ස. පටි: එසේ නො කියැයුතු යැ ...

ප. පා: එකරුණින් රූපය රූපස්වභාවයෙන් නියත වෙයි. වේදනා ... සංඥා .. සංස්කාර ... විඥානය විඥානස්වරූපයෙන් නියත වේ.

ධම්ම කථා නිමි.

## 21. 8.

# කම්ම කථා

1. ස. පු: සබ්බෙ කම්මා නියතා'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: මිච්ඡත්තනියතා'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

ස. අනු: සම්මත්තනියතා'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

ස. අනු: නත්ථි අනියතො රාසී'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

ස. අනු: නනු අත්ථි අනියතො රාසී'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. ඨ: හඤ්චි අත්ථි අනියතො රාසි,

ස. පා: නො ච වත රෙ වත්තබ්බෙ "සබ්බෙ කම්මා නියතා"ති.

2. ස. පු: සබ්බෙ කම්මා නියතා'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: නනු තයො රාසී වුත්තා භගවතා: මිච්ඡත්ත නියතො රාසි, සම්මත්තනියතො රාසි, අනියතො රාසී'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. ඨ: හඤ්චි තයො රාසී වුත්තා භගවතා: මිච්ඡත්ත නියතො රාසි, සම්මත්තනියතො රාසි, අනියතො රාසි,

ස. පා: නො ච වත රෙ වත්තබ්බෙ "සබ්බෙ කම්මා නියතා"ති.

3. ස. පු: දිට්ඨධම්මවෙදනීයං කම්මං දිට්ඨධම්මවෙදනීයට්ඨෙන නියතන්ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: මිච්ඡත්ත නියතන්ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

21. 8.

## කම්ම කථා

[දිට්ඨධම්මවේදනීයාදි කර්ම දිට්ඨධම්මවේදනාදීන් නියත වන හෙයින් හැම කර්මයෝ (විපාක විසින්) නියතයහ'යි ලබ්ධි ගත්තාහු ඇත. අන්ධකනිකායවාසීන් හා ඇතැම් උත්තරාපථකයන් සෙයිනි. උන්ගේ වාද බිඳුනම 'කම්ම කථා' එයි.]

1. ස. පු: හැම කර්මයෝ විපාක විසින් නියත වෙත් ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: මිථ්‍යාත්ව වශයෙන් නියත වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ. ...

ස. අනු: සම්‍යක්ත්ව වශයෙන් නියත වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

ස. අනු: අනියත රාශියෙක් නැත්තේ වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

ස. අනු: අනියත රාශියෙක් ඇත්තේ නො?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. ඨ: ඉදින් අනියතරාශියෙක් ඇත් නම්,

ස. පා: හවත, 'හැම කර්මයෝ නියතයහ'යි නො කියැයුතු මැ යැ.

2. ස. පු: හැම කර්මයෝ නියත වෙත් ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: භාග්‍යවතුන් වහන්සේ විසින් 'මිථ්‍යාත්වනියතරාශි යැ, සම්‍යක්ත්වනියත රාශි යැ, අනියතරාශි යැ'යි තුන් රාශියෙක් වදාරනලද නො?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. ඨ: ඉදින්, භාග්‍යවතුන් වහන්සේ විසින්: 'මිථ්‍යාත්ව නියත රාශි යැ, සම්‍යක්ත්වනියත රාශි යැ, අනියත-රාශි යැ'යි තුන් රාශියෙක් වදාරනලද වී නම්,

ස. පා: හවත, 'හැම කර්මයෝ නියතයහ'යි නො කියැයුතු මැ යැ.

3. ස. පු: දිට්ඨධම්මවේදනීය කර්මය දිට්ඨධම්මවේදනීයත්ව-යෙන් නියත වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: මිථ්‍යාත්වනියත වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

ස. අනු: සම්මත්තනියතන්ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

4. ස. පු: උපපජ්ජවෙදනීයං කම්මං -පෙ- අපරාපරියවෙද-නීයං කම්මං අපරාපරියවෙදනීයත්තෙන නියතන්ති?

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: මිච්ඡත්තනියතන්ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

ස. අනු: සම්මත්තනියතන්ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

5. ප. පු: න වත්තබ්බං "දිට්ඨධම්මවෙදනීයං කම්මං දිට්ඨධම්මවෙදනීයත්තෙන නියතං, උපපජ්ජවෙදනීයං කම්මං -පෙ- අපරාපරියවෙදනීයං කම්මං අපරාපරිය-වෙදනීයත්තෙන නියතන්ති.

ස. පටිඤ්ඤා: ආමන්තා.

ප. අනු: දිට්ඨධම්මවෙදනීයං කම්මං උපපජ්ජවෙදනීයං හොති, අපරාපරියවෙදනීයං හොති -පෙ- උපපජ්ජවෙදනීයං කම්මං දිට්ඨධම්මවෙදනීයං හොති, අපරාපරියවෙදනීයං හොති -පෙ- අපරාපරියවෙදනීයං කම්මං දිට්ඨධම්මවෙදනීයං හොති, උපපජ්ජවෙදනීයං හොතී'ති.

ස. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

ප. පා: තෙන හි "දිට්ඨධම්මවෙදනීයං කම්මං දිට්ඨධම්ම-වෙදනීයත්තෙන නියතං, උපපජ්ජවෙදනීයං කම්මං -පෙ- අපරාපරියවෙදනීයං කම්මං අපරාපරිය වෙදනීයත්තෙන නියතන්ති.

කම්ම කථා නිට්ඨිතා.

එකවීසතිමො වග්ගො නිට්ඨිතො.

**තස්ස උද්දානං.**

සාසනං නවං කතං - අත්ථි කොචි තථාගතස්ස සාසනං නවං කරොති- ලබ්භා තථාගතස්ස සාසනං පුන නවං කාතුං, පුථුජ්ජනො තෙධාතුකෙසු ධම්මෙසු අභිවිතෙතා, අත්ථි කිඤ්චි සඤ්ඤොජනං අප්පහාය අරහත්තප්පත්ති, අත්ථි අධිප්පායිද්ධි බුද්ධානං වා සාවකානං වා, අත්ථි බුද්ධානං බුද්ධෙහි හීනාතිරෙකතා, සබ්බා දිසා බුද්ධා තිට්ඨන්ති, සබ්බෙ ධම්මා නියතා, සබ්බෙ කම්මා නියතා'ති.

ස. අනු: සම්‍යක්ත්වනියත වේ ද?

ප පටි: එසේ නො කියැයුතු යැ ...

4. ස. පු: උපපජ්ජවේදනීය කර්මය ... අපරාපරියවේදනීය කර්මය අපරාපරියවේදනීය ස්වභාවයෙන් නියත වේ ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: මිථ්‍යාත්වනියත වේ ද?

ප පටි: එසේ නො කියැයුතු යැ ...

ස. අනු: සම්‍යක්ත්වනියත වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

5. ප පු: දිට්ඨධම්මවේදනීය කර්මය දිට්ඨධම්මවේදනීය ස්වභාවයෙන් නියත වෙයි, උපපජ්ජවේදනීය කර්මය ... අපරාපරියවේදනීය කර්මය අපරාපරියවේදනීය ස්වභාවයෙන් නියත වේති' නො කියැයුතු වේ ද?

ස. පටිඤ්ඤා: එසේ යැ.

ප අනු: දිට්ඨධම්මවේදනීය කර්මය උපපජ්ජවේදනීය වේ ද? අපරාපරියවේදනීය වේ ද, ... උපපජ්ජවේදනීය කර්මය දිට්ඨධම්මවේදනීය වේ ද, අපරාපරියවේදනීය වේ ද, ... අපරාපරියවේදනීය කර්මය දිට්ඨධම්මවේදනීය වේ ද, උපපජ්ජවේදනීය වේ ද?

ස. පටි: එසේ නො කියැයුතු යැ ...

ප. පා: එකරුණින් දිට්ඨධම්මවේදනීය කර්මය දිට්ඨධම්මවේදනීය ස්වභාවයෙන් නියත වෙයි උපපජ්ජවේදනීය කර්මය ... අපරාපරියවේදනීය කර්මය අපරාපරියවේදනීය ස්වභාවයෙන් නියත වේ.

කම්ම කථා නිමි.

එකවිංශද්වර්ගය නිමි.

එහි උද්දානය:

සාසන කථා යැ අවිවිත්ත කථා යැ සඤ්ඤොජන කථා යැ ඉද්ධි කථා යැ බුද්ධ කථා යැ සබ්බදිසා කථා යැ ධම්ම කථා යැ කම්ම කථා යි.

# දවාවීසතිමො වග්ගො

## 22. 1.

## පරිනිබ්බාන කථා

1. ස. පු: අත්ථි කිඤ්චි සඤ්ඤොජනං අප්පහාය පරිනිබ්බා-නන්ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: අත්ථි කිඤ්චි සක්කායදිට්ඨිං අප්පහාය -පෙ- අනොත්තප්පං අප්පහාය පරිනිබ්බානන්ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

2. ස. පු: අත්ථි කිඤ්චි සඤ්ඤොජනං අප්පහාය පරිනිබ්බා-නන්ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: අරහා සරාගො -පෙ- සකිලෙසො'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

ස. අනු: නනු අරහා නිරාගො -පෙ- නික්කිලෙසො'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. ඨ: හඤ්චි අරහා නිරාගො ... නික්කිලෙසො,

ස. පා: තෙන ච වත රෙ වත්තබ්බෙ "අත්ථි කිඤ්චි සඤ්ඤොජනං අප්පහාය පරිනිබ්බාන"න්ති.

3. ප. පු: න වත්තබ්බං "අත්ථි කිඤ්චි සඤ්ඤොජනං අප්පහාය පරිනිබ්බාන"න්ති.

ස. පටිඤ්ඤා: ආමන්තා.

ප. අනු: අරහා සබ්බං බුද්ධවිසයං ජානාතී'ති.

ස. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

ප. පා: තෙන හි "අත්ථි කිඤ්චි සඤ්ඤොජනං අප්පහාය පරිනිබ්බාන"න්ති.

පරිනිබ්බාන කථා නිට්ඨිතා.

## ද්වාවිංශද්වර්ගය

### 22. 1.

## පරිනිබ්බාන කථා

[රහත්හු සර්වඥවිෂයයෙහි නො පුහුණු සංයෝජන ඇති වැ මැ පිරිනිවෙති. එහෙයින් කිසි සංයෝජනයක් නො පියා පිරිනිවීමෙක් ඇතැ'යි අන්ධකනිකායවාසීන් සෙයින් ලබ්ධි ගත්තවුන්ගේ වාද බිඳුනම 'පරිනිබ්බාන කථා' එයි.]

1. ස. පු: කිසි සංයෝජනයක් නො පියා පිරිනිවීමෙක් ඇත් ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: කිසි සත්කායදෘෂ්ටියක් නො පියා ... අනපත්‍රපාවක් නො පියා පිරිනිවීමෙක් ඇත් ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

2. ස. පු: කිසි සංයෝජනයක් නො පියා පිරිනිවීමෙක් ඇත් ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: රහත් සරාග ... සකෙලශ වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

ස. අනු: රහත් නිරාග ... නිකෙලශ නො?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. ඨ: ඉදින් රහත් නිරාග ... නිකෙලශ වී නම්,

ස. පා: භවත, 'කිසි සංයෝජනයක් නො පියා පිරිනිවීමෙක් ඇතැ'යි නො කියැයුතු මැ යැ.

3. ප. පු: 'කිසි සංයෝජනයක් නො පියා පිරිනිවීමෙක් ඇතැ'යි නො කියැයුතු වේ ද?

ස. පටිඤ්ඤා: එසේ යැ.

ප. අනු: රහත් හැම බුද්ධවිෂය දත්තේ වේ ද?

ස. පටි: එසේ නො කියැයුතු යැ ...

ප. පා: එකරුණින් 'කිසි සංයෝජනයක් නො පියා පිරිනිවීමෙක්' ඇත.

පරිනිබ්බාන කථා නිමි.

## 22. 2

# කුසලචිත්ත කථා

1. ස. පු: අරහා කුසලචිත්තො පරිනිබ්බායතී'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: අරහා පුඤ්ඤාභිසඞ්ඛාරං අභිසඞ්ඛරොන්තො,[1] ආනෙඤ්ජාභිසඞ්ඛාරං අභිසඞ්ඛරොන්තො, ගතිසංවත්තනියං කම්මං කරොන්තො, භවසංවත්තනියං කම්මං කරොන්තො, ඉස්සරියසංවත්තනියං කම්මං කරොන්තො, ආධිපච්චසංවත්තනියං[2] කම්මං කරොන්තො, මහාභොගසංවත්තනියං කම්මං කරොන්තො, මහාපරිවාරසංවත්තනියං කම්මං කරොන්තො, දෙවසොභග්ගියසංවත්තනියං කම්මං කරොන්තො, මනුස්සසොභග්ගියසංවත්තනියං කම්මං කරොන්තො පරිනිබ්බායතී'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

2. ස. පු: අරහා කුසලචිත්තො පරිනිබ්බායතී'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: අරහා ආචිනන්තො අපචිනන්තො පජහන්තො උපාදියන්තො[3] විසිනෙන්තො උස්සිනෙන්තො විධූපෙන්තො සන්ධූපෙන්තො පරිනිබ්බායතී''ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

ස. අනු: නනු අරහා නෙවාචිනාති න අපචිනාති අපචිනිත්වා ඨිතො'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. ඨ: හඤ්චි අරහා නෙවාචිනාති න අපචිනාති අපචිනිත්වා ඨිතො,

ස. පා. නො ච වත රෙ වත්තබ්බෙ "අරහා කුසලචිත්තො පරිනිබ්බායතී''ති.

---

1. අභිසංඛරොන්තො - සීමු.
2. අධිපච්චසංවත්තනියං - සීමු, මජසං, PTS.
3 උපාදියන්තො - සීමු.

22. 2.

## කුසලචිත්ත කථා

[රහත්හු සමාධිවිපුලතාවට පැමිණියාහු පිරිනිවෙන්නාහු දූ සමාධි සම්ප්‍රජන්‍යයෙන් යුක්ත වැ මැ පිරිනිවෙති. එහෙයින් රහත්හු 'කුශලචිත්ත ඇති වැ පිරිනිවෙති'යි අන්ධකනිකායවාසීන් සෙයින් ලබ්ධි ගත්තවුන්ගේ වාද බිඳුනම කුසලචිත්ත කථාව' එයි.]

1\. ස. පු: රහත්හු කුශල සිත් ඇති වැ පිරිනිවෙත් ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: රහත්හු පුණ්‍යාභිසංස්කාර රැස් කෙරෙමින්, ආනෙඤ්ජාභිසංස්කාර රැස් කෙරෙමින්, ගතිසංවර්තනික කම් කෙරෙමින්, භවසංවර්තනික කම් කෙරෙමින්, ඓශ්වර්‍ය්‍යසංවර්තනික කම් කෙරෙමින්, ආධිපත්‍යසංවර්තනික කම් කෙරෙමින්, මහාභොග සංවර්තනික කම් කෙරෙමින්, මහා පරිවාරසංවර්තනික කම් කෙරෙමින්, දෙවසෞභාග්‍යසංවර්තනික කම් කෙරෙමින්, මනුෂ්‍ය සෞභාග්‍යසංවර්තනික කම් කෙරෙමින්, පිරිනිවෙත් ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

2\. ස. පු: රහත්හු කුශල සිත් ඇති වැ පිරිනිවෙත් ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: රහත්හු (කුශලාකුශලවිපාක) රැස් කෙරෙමින් විධ්වංශන කෙරෙමින් (කෙලෙසුන්) දුරු කෙරෙමින් (තෘෂ්ණා – මාන – දෘෂ්ටි විසින්) උපාදන කෙරෙමින් (තෘෂ්ණාවශයෙන්) හිවමින් (මාන වශයෙන්) උත්කර්ෂණ කෙරෙමින් (කෙලෙස්ගිනි) නිවමින් දල්වමින් පිරිනිවෙත් ද?

ප පටි: එසේ නො කියැයුතු යැ ...

ස. අනු: රහත්හු (කුශලාකුශල විපාක) නො මැ රැස් කෙරෙති, විධ්වංශන නො කෙරෙති, විධ්වංශන කොට සිටියාහු නො?

ප පටිඤ්ඤා: එසේ යැ.

ස. ඨ: ඉදින් රහත්හු කුශලාකුශල විපාක නො මැ රැස් කෙරෙත් නම්, විධ්වංශන නො කෙරෙත් නම්, විධ්වංශන කොට සිටියාහු නම්,

ස පා: භවත, රහත්හු කුශලසිත් ඇති වැ පිරිනිවෙති'යි නො කියැයුතු මැ යැ.

3. ස. අනු: නනු අරහා නෙව පජහති න උපාදියති පජහිත්වා ඨිතො -පෙ- නෙව විසිනෙති න උස්සිනෙති විසිනෙත්වා ඨිතො -පෙ- නනු අරහා නෙව විධූපෙති න සංධූපෙති විධූපෙත්වා ඨිතො'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. ඨ: හඤ්චි අරහා නෙව විධූපෙති න සංධූපෙති විධූපෙත්වා ඨිතො,

ස. පා: නො ච වත රෙ වත්තබ්බෙ "අරහා කුසලචිත්තං පරිනිබ්බායතී"ති.

4. ප. පු: න වත්තබ්බං "අරහා කුසලචිත්තො පරිනිබ්බායතී"ති.

ස. පටිඤ්ඤා: ආමන්තා

ප. අනු: නනු අරහා උපට්ඨිතසති[1] සතො සම්පජානො පරිනිබ්බායතී'ති.

ස. පටිඤ්ඤා: ආමන්තා.

ප. ඨ: හඤ්චි අරහා උපට්ඨිතසති සතො සම්පජානො පරිනිබ්බායති,

ප. පා: තෙන වත[2] රෙ වත්තබ්බෙ "අරහා කුසලචිත්තො පරිනිබ්බායතී"ති.

කුසලචිත්ත කථා නිට්ඨිතා.

1 උපට්ඨිතස්සති - සිමු. මජසං

2. නො ච වත රෙ - සී.මු.

3. ස. අනු: රහත්හු (කෙලෙසුන්) නො මැ දුරු කෙරෙති, (තෘෂ්ණා - මාන - දෘෂ්ටි විසින්) උපාදාන නො කෙරෙති, (කෙලෙසුන්) දුරු කර සිටියාහු නො... (තෘෂ්ණා විසින්) නො මැ හිමෙති, (මාන විසින්) උත්කර්ෂණ නො කෙරෙති, (තෘෂ්ණා බන්ධන) දුරු කොට සිටියාහු ... රහත්හු (කෙලෙස් ගිනි) නො මැ නිවෙති, නො දල්වති, නිවා සිටියාහු නො?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. ඨ: ඉදින් රහත්හු විච්චුපන නො මැ කෙරෙත් නම් සංචුපන නො කෙරෙත් නම් විච්චුපන කොට සිටියාහු නම්,

ස. පා: භවත, රහත්හු කුසල්සිත් ඇති වැ පිරිනිවෙති'යි නො කියැයුතු මැ යැ.

4. ප. පු: 'රහත්හු කුසල්සිත් ඇති වැ පිරිනිවෙති' නො කියැයුතු වේ ද?

ස. පටිඤ්ඤා: එසේ යැ.

ප. අනු: රහත්හු එලැඹසිටි සිහි ඇත්තාහු සමාධි ඇත්තාහු සම්‍යග්ඥාන ඇත්තාහු පිරිනිවෙත්තාහු නො?

ස. පටිඤ්ඤා: එසේ යැ.

ප. ඨ: ඉදින් රහත්හු එලැඹසිටිසිහි ඇති වැ සමාහිතත් වැ සම්‍යග්ඥාන ඇති වැ පිරිනිවෙත්තාහු නම්,

ප. පා: එ කරුණින් භවත, රහත්හු කුසල්සිත් ඇති වැ පිරිනිවෙත්තාහ'යි කියැයුතු මැ යි.

**කුසලචිත්ත කථා නිමි.**

22. 3.

# ආනෙඤ්ජ කථා

1. ස. පු: අරහා ආනෙඤ්ජෙ ඨිතො පරිනිබ්බායතී'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: නනු අරහා පකතිචිත්තෙ ඨිතො පරිනිබ්බායතී'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. ඨ: හඤ්චි අරහා පකතිචිත්තෙ ඨිතො පරිනිබ්බායති,

ස. පා: නො ච වත රෙ වත්තබ්බෙ "අරහා ආනෙඤ්ජෙ ඨිතො පරිනිබ්බායතී"ති.

2. ස. පු: අරහා ආනෙඤ්ජෙ ඨිතො පරිනිබ්බායතී'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: අරහා කිරියමයෙ ඨිතො පරිනිබ්බායතී'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

ස. අනු: නනු අරහා විපාකචිත්තෙ ඨිතො පරිනිබ්බායතී'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. ඨ: හඤ්චි අරහා විපාකචිත්තෙ ඨිතො පරිනිබ්බායති,

ස. පා: නො ච වත රෙ වත්තබ්බෙ "අරහා ආනෙඤ්ජෙ ඨිතො පරිනිබ්බායතී"ති.

3. ස. පු: අරහා ආනෙඤ්ජෙ ඨිතො පරිනිබ්බායතී'ති.

ප.පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: අරහා කිරියාබ්‍යාකතෙ චිත්තෙ ඨිතො පරිනිබ්බායතී'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

ස. අනු: නනු අරහා විපාකාබ්‍යාකතෙ චිත්තෙ ඨිතො පරිනිබ්බායතී'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

## 22. 3.

# ආනෙඤ්ජ කථා

['බුදුහු චතුර්ථධ්‍යානයෙහි සිට පිරිනිවන් පෑහ' යනු සලකා රහත්හු ආනෙඤ්ජයෙහි සිට පිරිනිවෙති'යි සමහර උත්තරාපථකයන් සෙයින් ලබ්ධි ගත්තවුන්ගේ වාද බිඳුනම 'අනෙඤ්ජ කථා' එයි.]

1. ස. පු: රහතුන් වහන්සේ ආනෙඤ්ජයෙහි (අරූපාවචර ධ්‍යානයෙහි) සිට පිරිනිවෙත් ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: රහතුන් වහන්සේ ප්‍රකෘතිචිත්තයෙහි සිට පිරිනිවෙත් නො?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. ඨ: ඉදින් රහතුන් වහන්සේ ප්‍රකෘතිචිත්තයෙහි සිට පිරිනිවෙත් නම්,

ස. පා: හවත, 'රහතුන් වහන්සේ ආනෙඤ්ජයෙහි සිට පිරිනිවෙති'යි නො කියැයුතු මැ යැ.

2. ස. පු: රහත්හු ආනෙඤ්ජයෙහි සිට පිරිනිවෙත් ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: රහත්හු ක්‍රියාමය සිත්හි සිට පිරිනිවෙත් ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

ස. අනු: රහත්හු විපාකචිත්තයෙහි සිට පිරිනිවෙත් නො?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. ඨ: ඉදින් රහත්හු විපාකචිත්තයෙහි සිට පිරිනිවෙත් නම්,

ස. පා: හවත, රහත්හු ආනෙඤ්ජයෙහි සිට පිරිනිවෙති'යි නො කියැයුතු මැ යැ.

3. ස. පු: රහත්හු ආනෙඤ්ජයෙහි සිට පිරිනිවෙත් ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: රහත්හු ක්‍රියාව්‍යාකෘත සිත්හි සිට පිරිනිවෙත්ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

ස. අනු: රහත්හු විපාකාව්‍යාකෘත සිත්හි සිට පිරිනිවෙත් නො?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. ඨ හඤ්චි අරහා විපාකාබ්‍යාකතෙ චිත්තෙ ඨිතො පරිනිබ්බායති,

ස. පා: නො ච වත රෙ වත්තබ්බෙ "අරහා ආනෙඤ්ජ ඨිතො පරිනිබ්බායතී"ති.

4. ස. පු: අරහා ආනෙඤ්ජ ඨිතො පරිනිබ්බායතී'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා

ස. අනු: නනු භගවා චතුත්ථජ්ඣානා වුට්ඨහිත්වා සමනන්තරා පරිනිබ්බුතො'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. ඨ: හඤ්චි භගවා චතුත්ථජ්ඣානා වුට්ඨහිත්වා සමනන්තරා පරිනිබ්බුතො,

ස. පා: නො ච වත රෙ වත්තබ්බෙ "අරහා ආනෙඤ්ජ ඨිතො පරිනිබ්බායතී"ති.

ආනෙඤ්ජ කථා නිට්ඨිතා.

ස. ථ: ඉදින්, රහත්හු විපාකාව්‍යාකෘත සිත්හි සිට පිරිනිවෙත් නම්,

ස. පා: හවත, 'රහත්හු ආනෙඤ්ජයෙහි සිට පිරිනිවෙති'යි නො කියැයුතු මැ යැ.

4. ස. පු: රහත්හු ආනෙඤ්ජයෙහි සිට පිරිනිවෙත් ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: භාග්‍යවතුන් වහන්සේ චතුර්ථධ්‍යානයෙන් නැඟී සමනන්තර වැ පිරිනිවියාහු නො?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. ථ: ඉදින් බුදුහු චතුර්ථධ්‍යානයෙන් නැඟී සමනන්තර වැ පිරිනිවියේක් වී නම්,

ස. පා: හවත, 'රහත්හු ආනෙඤ්ජයෙහි සිට පිරිනිවෙති'යි නො කියැයුතු මැ යැ.

ආනෙඤ්ජ කථා නිමි.

## 22. 4.

# ධම්මාභිසමය කථා

1 ස පු: අත්ථි ගබ්භසෙය්‍යාය ධම්මාභිසමයො'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: අත්ථි ගබ්භසෙය්‍යාය ධම්මදෙසනා, ධම්මසවණං, ධම්මසාකච්ඡා, පරිපුච්ඡා, සීලසමාදානං, ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරතා, භොජනෙ මත්තඤ්ඤුතා, පුබ්බරත්තාපරරත්තං ජාගරියානුයොගො'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

ස අනු: නත්ථි ගබ්භසෙය්‍යාය ධම්මදෙසනා, ධම්මසවණං -පෙ-පුබ්බරත්තාපරරත්තං ජාගරියානුයොගො'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. ඨ: හඤ්චි නත්ථි ගබ්භසෙය්‍යාය ධම්මදෙසනා, ධම්මසවණං -පෙ- පුබ්බරත්තාපරරත්තං ජාගරියානුයොගො,

ස. පා: නො ච වත රෙ වත්තබ්බෙ "අත්ථි ගබ්භසෙය්‍යාය ධම්මාභිසමයො"ති.

2. ස. පු: අත්ථි ගබ්භසෙය්‍යාය ධම්මාභිසමයො'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: නනු ද්වෙ පච්චයා සම්මාදිට්ඨියා උප්පාදය.[1]

පරතො ච ඝොසො යොනිසො ච මනසිකාරො'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. ඨ: හඤ්චි ද්වෙ පච්චයා සම්මාදිට්ඨියා උප්පාදය.[1] පරතො ච ඝොසො යොනිසො ච මනසිකාරො,

ස. පා: නො ච වත රෙ වත්තබ්බෙ "අත්ථි ගබ්භසෙය්‍යාය ධම්මාභිසමයො"ති.

3. ස. පු: අත්ථි ගබ්භසෙය්‍යාය ධම්මාභිසමයො'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා

ස. අනු: සුත්තස්ස පමත්තස්ස මුට්ඨස්සතිස්ස අසම්පජානස්ස ධම්මාභිසමයො'ති.

ප පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

ධම්මාභිසමය කථා නිට්ඨිතා.

---

1 උපාදය - සීමු, PTS

## 22. 4.

# ධම්මාභිසමය කථා

[අතීතභවයෙහි ශ්‍රොතාපන්නයකු මව්කුසැ වැස නික්මෙන්නා දූත ගෘහිශය්‍යාවෙහි ධර්මාභිසමය (ලොකොත්තර ධර්මාවබොධය) ඇතැ'යි සමහර උත්තරාපථකයන් සෙයින් ලබ්ධි ගත්තවුන්ගේ වාද බිඳුනම 'ධම්මාභිසමය කථා' එයි ]

1\. ස. පු: ගෘහීශය්‍යාවෙහි (මව්කුසැ) ධර්මාභිසමය ඇද්ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: ගෘහීශය්‍යාවෙහි ධර්මදෙශනා, ධර්මශ්‍රවණ, ධර්මසාකච්ඡා, පරිපෘච්ඡා, ශීලසමාදාන, ඉන්ද්‍රියයන්හි ගුප්තද්වාරතා, භොජනයෙහි මාත්‍රඥතා, පූර්වරාත්‍ර අපරරාත්‍රයෙහි ජාගර්‍ය්‍යානුයොග ඇද්ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

ස අනු: ගෘහීශය්‍යාවෙහි ධර්මදෙශනා, ධර්මශ්‍රවණ ... පූර්වරාත්‍රාපරරාත්‍රයෙහි ජාගර්‍ය්‍යානුයොග නැත් ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. ඨ: ඉදින් ගෘහීශය්‍යාවෙහි ධර්මදෙශනා, ධර්මශ්‍රවණ ... පූර්වරාත්‍රාපරරාත්‍රයෙහි ජාගර්‍ය්‍යානුයොග නැත් නම්,

ස. පා: භවත, 'ගෘහීශය්‍යාවෙහි ධර්මාභිසමය ඇතැ'යි නො කියැයුතු මැ යැ.

2\. ස. පු: ගෘහීශය්‍යාවෙහි ධර්මාභිසමය ඇද්ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: සම්‍යග්දෘෂ්ටිහුගේ ඉපැත්මට පරතොඝොෂ යැ යොනිසොමනසිකාර යැ යි ප්‍රත්‍යයයෝ දෙදෙනෙක් ඇත්තාහු නො?

ප. පටිඤ්ඤා: එසේ යැ

ස ඨ: ඉදින් සම්‍යග්දෘෂ්ටිහුගේ ඉපැත්මට පරතොඝොෂ යැ යොනිසොමනසිකාර යැ යි ප්‍රත්‍යයයෝ දෙදෙනෙක් ඇත් නම්,

ස. පා: භවත, ගෘහීශය්‍යාවෙහි ධර්මාභිසමය ඇතැ'යි නො කියැයුතු මැ යැ.

3\. ස. පු: ගෘහීශය්‍යාවෙහි ධර්මාභිසමය ඇත් ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: සුප්තයාහට ප්‍රමත්තයාහට මුෂිතසමෘති ඇතියාහට සම්‍යක්ප්‍රඥ නැතියාහට ධර්මාභිසමය වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

ධම්මාභිසමය කථා නිමි,

## 22 5-7

# තිස්සෝපි කථා

1. ස. පු. අත්ථි ගබ්භසෙය්‍යාය අරහත්තප්පත්තී'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: සුත්තස්ස පමත්තස්ස මුට්ඨස්සතිස්ස[1] අසම්පජානස්ස අරහත්තප්පත්තී'ති

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

2. ස. පු අත්ථි සුපිනගතස්ස ධම්මාභිසමයෝ'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු සුත්තස්ස පමත්තස්ස මුට්ඨස්සතිස්ස[1] අසම්පජානස්ස ධම්මාභිසමයෝ'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

3. ස. පු: අත්ථි සුපිනගතස්ස අරහත්තප්පත්තී'ති

ප පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: සුත්තස්ස පමත්තස්ස මුට්ඨස්සතිස්ස[1] අසම්පජානස්ස ධම්මාභිසමයෝ'ති.

ප. පටි: න හෙවං වත්තබ්බෙ -පෙ-

තිස්සෝපි කථා නිට්ඨිතා.

---

. මුට්ඨසතිස්ස - සීමු - PTS

## 22 5 - 7.

## තිස්සොපි කථා.

[උපන් නො බෝ කල් ඇති ශ්‍රොතාපන්නයන්ගේ අර්හත්ත්වප්‍රාප්තිය ද, සුප්පවාසා උවැසියගේ සත්වැසි ගර්භය ද දැක ගර්භශය්‍යායෙහි අර්හත්ත්වප්‍රාප්ති ඇතැයි ද, ස්වප්නයෙහි ආකාශගමනාදිය දැක එහි 'ධර්මාභිසමයත් අර්හත්ත්වප්‍රාප්තියත් ඇත'යි ද උත්තරාපථකයන් සෙයින් ලබ්ධි ගත්තවුන්ගේ වාද බිඳුනම 'තිස්සොපි කථා' එයි.]

1. ස. පු: ගර්භශය්‍යායෙහි අර්හත්ත්වප්‍රාප්ති ඇද්ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: නිදසිටියාහට පමාවූවහුට මුළාසි ඇතියාහට සම්ප්‍රජන්‍ය නැතියාහට රහත්බව ලැබේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

2.. ස. පු: ස්වප්නගතයාහට ධර්මාභිසමය ඇද්ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: සුප්තයාහට ප්‍රමත්තයාහට මුෂිතසමෘති ඇතියාහට සම්ප්‍රජන්‍ය නැතියාහට ධර්මාභිසමය ඇද්ද?

ප. පු: එසේ නො කියැයුතු යැ ...

3. ස. පු: ස්වප්නගතයාහට අර්හත්ත්වප්‍රාප්ති ඇද්ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: සුප්තයාහට ප්‍රමත්තයාහට මුෂිතසමෘති ඇතියාහට සම්ප්‍රජන්‍ය නැතියාහට ධර්මාභිසමය වේ ද?

ප. පටි: එසේ නො කියැයුතු යැ ...

තිස්සොපි කථා නිමි.

22. 8.

# අබ්‍යාකත කථා

1. ස. පු: සබ්බං සුපිනගතස්ස චිත්තං අබ්‍යාකතන්ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: සුපිනන්තේන පාණං හනෙය්‍යා'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස ඨ: හඤ්චි සුපිනන්තේන පාණං හනෙය්‍ය,

ස. පා නො ච වත රෙ වත්තබ්බෙ "සබ්බං සුපිනගතස්ස චිත්තං අබ්‍යාකත"න්ති.

2 ස. පු: සුපිනන්තේන අදින්නං ආදියෙය්‍ය -පෙ- මුසා භණෙය්‍ය -පෙ- පිසුනං[1] භණෙය්‍ය -පෙ- ඵරුසං භණෙය්‍ය -පෙ- සම්ඵං පලපෙය්‍ය[2] -පෙ- සන්ධිං ඡින්දෙය්‍ය -පෙ- නිල්ලොපං හරෙය්‍ය -පෙ- ඒකාගාරිකං කරෙය්‍ය -පෙ- පරිපන්ථෙ තිට්ඨෙය්‍ය -පෙ- පරදාරං ගච්ඡෙය්‍ය -පෙ- ගාමඝාතකං කරෙය්‍ය -පෙ- නිගමඝාතකං කරෙය්‍ය -පෙ- සුපිනන්තේන මෙථුනං ධම්මං පටිසෙවෙය්‍ය -පෙ- සුපිනගතස්ස අසුචි මුච්චෙය්‍ය -පෙ- සුපිනන්තේන දානං දදෙය්‍ය -පෙ- චීවරං දදෙය්‍ය -පෙ- පිණ්ඩපාතං දදෙය්‍ය -පෙ- සෙනාසනං දදෙය්‍ය -පෙ- ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරං දදෙය්‍ය පෙ- ඛාදනීයං දදෙය්‍ය -පෙ- භොජනීයං දදෙය්‍ය -පෙ- පානීයං දදෙය්‍ය -පෙ- චෙතියං වන්දෙය්‍ය -පෙ- චෙතියෙ මාලං ආරොපෙය්‍ය-පෙ- ගන්ධං ආරොපෙය්‍ය-පෙ- විලෙපනං ආරොපෙය්‍ය පෙ චෙතියං අභිදක්ඛිණං කරෙය්‍යා'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස ඨ: හඤ්චි සුපිනන්තේන චෙතියං අභිදක්ඛිණං කරෙය්‍ය,

ස. පා: නො ච වත රෙ වත්තබ්බෙ "සබ්බං සුපිනගතස්ස චිත්තං අබ්‍යාකත"න්ති.

---

1. පිසුණං - සීමු.
2. සම්ඵං ඵලාපෙය්‍ය - සීමු, සම්ඵපලාපෙය්‍ය - PTS

22. 8.

## අබ්‍යාකත කථා

[“අචෙතනං භික්ඛවෙ චෙතනා, සං ච බො අබෙබොහාරිකා” යන වචන හෙයින් ස්වප්නගතයාගේ හැම චෙතනා අව්‍යාකෘත වෙති’යි සමහර උත්තරාපථකයන් සෙයින් ලබ්ධි ගත්තවුන්ගේ වාද බිඳුනම ‘අබ්‍යාකත කථා’ එයි.]

1\. ස. පු: ස්වප්නගතයාගේ හැම සිත් අව්‍යාකෘත වේ ද?

ප. පටික්ඛෙප: එසේ යැ.

ස. අනු: ස්වප්නයෙහි ප්‍රාණඝාත කරන්නේ වේ ද?

ප. පටික්ඛෙප: එසේ යැ.

ස. ඨ: ඉදින් ස්වප්නයෙහි ප්‍රාණඝාත කරන්නේ වී නම්,

ස. පා: භවත, ස්වප්නගතයාගේ හැම සිත් අව්‍යාකෘත වෙති’යි නො කියැයුතු මැ යැ.

2\. ස. පු: ස්වප්නයෙහි අයිනාදන් ගන්නේ වේ ද? ... මුසවා බණන්නේ වේ ද ... පිසුනුබස් කියන්නේ වේ ද... පරොස්බස් බණන්නේ වේ ද ... පලප් බණන්නේ වේ ද ... ගෘහසන්ධි සිඳනේ වේ ද ... ගම් වොලොගෙන යන්නේ වේ ද ... එක් ගෙයක් වොලොගන්නේ වේ ද ... කඩපලාසොරකමට මහමග සිටුනේ වේ ද ... පරඹුවන් කරා යන්නේ වේ ද ... ගම් නසනකම් කරනුයේ වේ ද ... නියම්ගම් නසන කම් කරනුයේ වේ ද ... ස්වප්නයෙහි මෛථුනධම් සෙවන කරන්නේ වේ ද ... ස්වප්නගතයාහට අසුචි (ශුක්‍ර) මිදෙන්නේ වේ ද ... ස්වප්නයෙහි දන් දෙන්නේ වේ ද ... සිවුරු දෙන්නේ වේ ද .. පිඬුවා දෙන්නේ වේ ද ... සෙනසුන් දෙන්නේ වේ ද ... ගිලන්පස බෙහෙත් පිරිකර දෙන්නේ වේ ද... ඛාද්‍ය දෙන්නේ වේ ද... බොජුන් දෙන්නේ වේ ද ... පැන් දෙන්නේ වේ ද ... සෑ වඳනේ වේ ද ... සෑයෙහි මාලා නඟන්නේ වේ ද ... ගඳ නඟන්නේ වේ ද .... විලෙවුන් නඟන්නේ වේ ද... සෑය පැදකුණු කරන්නේ වේ ද?

ප. පටික්ඛෙප: එසේ යැ.

ස. ඨ: ඉදින් ස්වප්නයෙහි චෛත්‍යය ප්‍රදක්ෂිණා කරන්නේ වී නම්,

ස. පා: භවත, ‘ස්වප්නගතයාගේ හැම සිත් අව්‍යාකෘත වෙති’යි නො කියැයුතු මැ යැ.

8. ප. පු: න වත්තබ්බං “සබ්බං සුපිනගතස්ස චිත්තං අබ්‍යාකත”න්ති.

ස. පටිඤ්ඤා: ආමන්තා.

ප. අනු: නනු සුපිනගතස්ස චිත්තං අබ්බොහාරියං වුත්තං භගවතා’ති.

ස. පටිඤ්ඤා: ආමන්තා.

ප. ඨ: හඤ්චි සුපිනගතස්ස චිත්තං අබ්බොහාරියං වුත්තං භගවතා,

ප. පා: තෙන[1] වත රෙ වත්තබ්බෙ “සබ්බං සුපිනගතස්ස චිත්තං අබ්‍යාකත”න්ති.

අබ්‍යාකත කථා නිට්ඨිතා

1 තො ච - සිමු,

8. ප. පු: සවපනාගතයාගේ හැම සිත් අව්‍යාකෘත වෙති'යි නො කියයුතු වේ ද?

ස. පටිඤ්ඤා: එසේ යැ.

ප. අනු: "සවපනාගතයාගේ සිත අව්‍යවහාරක යැ"යි භාග්‍යවතුන් විසින් වදාරනලද නො?

ස. පටිඤ්ඤා: එසේ යැ.

ප. ඨ: ඉදින් 'සවපනාගතයාගේ සිත අව්‍යවහාරක යැ'යි භාග්‍යවතුන් විසින් වදාරනලද වී නම්,

ප. පා: එකරුණින් හවත, 'සවපනාගතයාගේ හැම සිත් අව්‍යාකෘත වෙති'යි කියයුතු මැ යැ.

අව්‍යාකෘත කථා නිමි.

## 22. 9.

# ආසෙවනපච්චය කථා

1 ස. පු: නත්ථි කාචි ආසෙවනපච්චයතා'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: නනු වුත්තං භගවතා: "පාණාතිපාතො භික්ඛවෙ ආසෙවිතො භාවිතො බහුලීකතො නිරයසංවත්තනිකො තිරච්ඡානයොනිසංවත්තනිකො පෙත්තිවිසයසංවත්තනිකො, යො සබ්බලහුසො පාණාතිපාතස්ස විපාකො මනුස්සභූතස්ස අප්පායුකසංවත්තනිකො හොතී"ති [a]. අත්ථෙ'ව සුත්තන්තො'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. පා: තෙන හි "අත්ථි කාචි ආසෙවනපච්චයතා"ති.

2. ස. පු: නත්ථි කාචි ආසෙවනපච්චයතා'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. අනු: නනු වුත්තං භගවතා: "අදින්නාදානං භික්ඛවෙ අසෙවිතං භාවිතං බහුලීකතං නිරයසංවත්තනිකං තිරච්ඡානයොනිසංවත්තනිකං පෙත්තිවිසයසංවත්තනිකං, .යො සබ්බලහුසො අදින්නාදානස්ස විපාකො මනුස්සභූතස්ස භොගබ්‍යසනසංවත්තනිකො හොති -පෙ- යො සබ්බලහුසො කාමෙසු මිච්ඡාචාරස්ස විපාකො මනුස්සභූතස්ස සපත්තවෙරසංවත්තනිකො හොති-පෙ යො සබ්බලහුසො මුසාවාදස්ස විපාකො මනුස්සභූතස්ස අභූතබ්භක්ඛානසංවත්තනිකො[1] හොති -පෙ- යො සබ්බලහුසො පිසුණාය වාචාය විපාකො මනුස්සභූතස්ස මිත්තෙහි භෙදනසංවත්තනිකො හොති -පෙ- යො සබ්බලහුසො ඵරුසාය වාචාය විපාකො මනුස්සභූතස්ස අමනාපසද්දසංවත්තනිකො හොති -පෙ-

---

a අට්ඨකඞ්ගුත්තර - දුච්චරිතවිපාකසුත්ත
අබ්භූතබ්භක්ඛානසංවත්තනිකො - සිමු, PTS

## 22. 9.

# ආසෙවනපච්චය කථා

[සර්වධර්මයෝ ක්ෂණිකයහ, මොහොතකුදු සිට ආසෙවනප්‍රත්‍යය සෙවුනා කිසි ධර්මයක් නැත. එහෙයින් කිසි ආසෙවනප්‍රත්‍යයතාවයක් නැත. ආසෙවනප්‍රත්‍යය බැවින් උපන් කිසි ධර්මයෙක් නැතැ'යි සමහර උත්තරාපථකයන් සෙයින් ලබ්ධි ගත්තවුන්ගේ වාද බිඳුනම 'ආසෙවන පච්චය කථා' එයි.]

1. ස. පු: කිසි ආසෙවනප්‍රත්‍යයතාවයෙක් නැද්ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: භාග්‍යවතුන් විසින් වදාරනලද නො: "මහණෙනි, ප්‍රාණඝාතකර්මය ආසෙවන කරනලද්දේ භාවිත කරනලද්දේ බහුල කරනලද්දේ නිරය පිණිස පවත්තේ යැ. තිරිසන් යොන් පිණිස පවත්තේ යැ. ප්‍රේතවිෂය පිණිස පවත්තේ යි. ප්‍රාණඝාතයාගේ හැමට ලහු වූ යම් විපාකයෙක් ඇද්ද, හේ මනුෂ්‍ය වූවහුට අල්පායුෂ පිණිස පවත්තේ වේ"යයි වදාල සූත්‍රාන්තයෙක් ඇත්තේ මැ නො?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. පා: එකරුණින් කිසි ආසෙවනප්‍රත්‍යයතාවයෙක් ඇත.

2. ස. පු. කිසි ආසෙවනප්‍රත්‍යයතාවයෙක් නැද්ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: භාග්‍යවතුන් මහත්සේ විසින් වදාරනලද නො: "මහණෙනි, අදත්තාදානකර්මය ආසෙවන කරන ලද්දේ පුරුදු කරනලද්දේ පුනපුනා වඩනලද්දේ නිරය පිණිස පවත්තේ යැ. තිරිසන්යෝනි පිණිස පවත්තේ යැ. ප්‍රේතවිෂය පිණිස පවත්තේ යි. අදත්තාදානකර්මයාගේ හැමට ලහු යම් විපාකයෙක් ඇද්ද, ඒ මිනිස් වූවහුට භෝගව්‍යසන පිණිස පවත්තේ වෙයි ... කාමමිථ්‍යාචාරකර්මයාගේ හැමට ලහු යම් විපාකයෙක් ඇද්ද, ඒ මිනිස් වූවහුට සතුරුවෛර පිණිස වැටෙත්තේ වෙයි ... මෘෂාවාදකර්මයාගේ හැමට ලහු යම් විපාකයෙක් ඇද්ද, ඒ මිනිස් වූවහුට අභූතාඛ්‍යාන (බොරු චෝදනා) පිණිස වැටෙත්තේ වෙයි ... පිශුනවචන කර්මයාගේ හැමට ලහු යම් විපාකයෙක් ඇද්ද, ඒ මිනිස් වූවහුට මිතුරන් කෙරෙන් බිඳුනා පිණිස පවත්තේ වෙයි ... පරුෂවචනයාගේ හැමට ලහු යම් විපාකයෙක් ඇද්ද, ඒ මිනිස් වූවහුට අමනාපශබ්ද පිණිස පවත්තේ වෙයි ...

යො සබ්බලහුසො සම්ඵප්පලාපස්ස.[1] විපාකො මනුස්සභූතස්ස අනාදෙය්‍යවාචසංවත්තනිකො හොති. සුරාමෙරයපානං භික්ඛවෙ අසෙවිතං -පෙ- යො සබ්බලහුසො සුරාමෙරයපානස්ස විපාකො මනුස්සභූතස්ස උම්මත්තකසංවත්තනිකො හොතී''ති.[2] අත්ථෙ'ව සුත්තන්තො'ති.

ප. පටික්ඛෙපො: ආමන්තා.

ස. පා: තෙන හි අත්ථි කාචි ආසෙවනපච්චයතා'ති.

3. ස. පු: නත්ථි කාචි ආසෙවනපච්චයතා'ති.

ප. පටික්ඛෙපො: ආමන්තා.

ස. අනු: නනු වුත්තං භගවතා: ''මිච්ඡාදිට්ඨි භික්ඛවෙ ආසෙවිතා භාවිතා බහුලීකතා නිරයසංවත්තනිකා තිරච්ඡානයොනිසංවත්තනිකා පෙත්තිවිසයසංවත්තනිකා''ති. අත්ථෙ'ව සුත්තන්තො'ති.

ප. පටික්ඛෙපො: ආමන්තා.

ස. පා: තෙන හි ''අත්ථි කාචි ආසෙවනපච්චයතා''ති.

4. ස. පු: නත්ථි කාචි ආසෙවනපච්චයතා''ති.

ප. පටික්ඛෙපො: ආමන්තා.

ස. අනු: නනු වුත්තං භගවතා ''මිච්ඡාසංකප්පො -පෙ- මිච්ඡාසමාධි භික්ඛවෙ ආසෙවිතො භාවිතො -පෙ- පෙත්තිවිසයසංවත්තනිකො''ති අත්ථෙව සුත්තන්තො'ති.

ප. පටික්ඛෙපො: ආමන්තා.

ස. පා: තෙන හි අත්ථි කාචි ආසෙවනපච්චයතා'ති.

5. ස. පු: නත්ථි කාචි ආසෙවනපච්චයතා'ති.

ප. පටික්ඛෙපො: ආමන්තා.

---

1. සම්ඵප්පලාපස්ස - සීමු.
2. අඞ්ගුත්තර - දුච්චරිතවිපාකසුත්ත

සම්ඵප්‍රලාපයාගේ හැමට ලඝු යම් විපාකයෙක් ඇද්ද, ඒ මිනිස් වූවහුට අනාදෙය (නො පිළිගත-යුතු) වචන පිණිස පවත්තේ වෙයි. මහණෙනි, රහමෙරපානු ආසෙවන කරනලද්දේ ... සුරා-මෙරයපානකම්යාගේ යම් හැමට ලඝු විපාකයෙක් ඇද්ද, ඒ මිනිස් වූවහුට උමතුව පිණිස වැටෙත්තේ වේ'' යයි වදාල සූත්‍රාන්තයෙක් ඇත්තේ මැ නො?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. පා: එකරුණින් කිසි ආසෙවනප්‍රත්‍යයතායෙක් ඇත.

3. ස. පු. කිසි ආසෙවනප්‍රත්‍යයතායෙක් නැද්ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: භාග්‍යවතුන් විසින් වදාරනලද නො: ''මහණෙනි, මිථ්‍යාදෘෂ්ටි ආසෙවන කරනලද්දී භාවිත කරන ලද්දී බහුල කරනලද්දී නිරය පිණිස වැටෙත්නී තිරිසන්යොනට වැටෙත්නී ප්‍රෙතවිෂයට වැටෙත්නී වේ'' යයි වදාල සූත්‍රාන්තයෙක් ඇත්තේ මැ නො?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. පා: එකරුණින් කිසි ආසෙවනප්‍රත්‍යයතායෙක් ඇත.

4. ස. පු: කිසි ආසෙවනප්‍රත්‍යයතායෙක් නැද්ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. අනු: භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරනලද නො: ''මිථ්‍යාසංකල්ප ... මහණෙනි, මිථ්‍යාසමාධි ආසෙවන කරනලද්දේ භාවනා කරනලද්දේ ... ප්‍රෙතවිෂයට වැටෙත්තේ වේ''යයි වදාල සූත්‍රාන්ත-යෙක් ඇත්තේ මැ නො?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස. පා: එකරුණින් කිසි ආසෙවනප්‍රත්‍යයතායෙක් ඇත.

5. ස. පු: කිසි ආසෙවනප්‍රත්‍යයතායෙක් නැද්ද?

ප. පටිඤ්ඤා: එසේ යැ.

ස අනු: නනු වුත්තං භගවතා: "සම්මාදිට්ඨි භික්ඛවෙ ආසෙවිතා භාවිතා බහුලීකතා අමතොගධා හොති අමතපරායනා අමතපරියොසානා"ති. අත්ථෙ'ව සුත්තන්තො'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. පා: තෙන හි "අත්ථි කාචි ආසෙවනපච්චයතා"ති.

6. ස. පු: නත්ථි කාචි ආසෙවනපච්චයතා'ති.

ප. පටි: ආමන්තා.

ස. අනු: නනු වුත්තං භගවතා: සම්මාසංකප්පො භික්ඛවෙ ආසෙවිතො භාවිතො බහුලීකතො -පෙ- සම්මාසමාධි භික්ඛවෙ ආසෙවිතො භාවිතො බහුලීකතො අමතොගධො හොති අමතපරායනො අමතපරියොසානො''ති. අත්ථෙ'ව සුත්තන්තො'ති.

ප. පටිඤ්ඤා: ආමන්තා.

ස. පා: තෙන හි "අත්ථි කාචි ආසෙවනපච්චයතා"ති.

ආසෙවනපච්චය කථා නිට්ඨිතා.

